

ශ්‍රී මනමාග මහාකවි ප්‍රණීත

# ශිශුපාලවධ මහා කාව්‍යය



# ශිශුපාලවධ මහා කාව්‍යය.

## ශ්‍රී මනමාඝ මහාකවි ප්‍රණීතයි.

පඤ්චම සර්ගාන්ත ප්‍රථම භාගය.


පිංවත්තේ සද්ධර්මාකර පාරිවෙණික ශිෂ්‍ය

**රත්ගම ප්‍රඥාවංශ යති, කොස්ගොඩ ප්‍රඥාධීර යති**

මොහොට්ටිවත්තේ විමලධර්ම යති

යන ස්වාමීන් වහන්සේලා

— විසින් —


ආචාර්ය්‍යොපදෙශාශ්‍රයෙන් ලියනලද

**පද්‍යවහාසිනී නම් ව්‍යාඛ්‍යායෙන්**

සමුල්ලසිතයි.


මොහොට්ටිවත්තේ ශ්‍රී බෞද්ධ වාගීශ්වර

ඇම්. ඩී. ඇම්. ධර්මසේන,

බලපිටියේ රික්වැස්ට්උසාවියේ ලිපිකරු තැන්පත්

ජේ. ඇල්බට් ද සොයිසා

යන අප විසින්

පානදුරු යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

බු: ව: 2472.

ක්‍රි: ව: 1929.

# SISUPALAVADHA KAVYA.

of

# SRI MAGHA

WITH

## Padyawabhasini Vyakkhaya

- - by - -

**Ratgama Pragnawansa, Kosgoda Pragnadhira**

**and**

**Mohottiwatte Wimaladhrma**

Students of Saddharmakara Pirivena,

PINWATTA.

---

(PART 1)

---

Printed and Published by

Mohottiwatte Sri Bauddha wagiswara

**M. D. M. DHARMASENA**

and

**Mr. A. ALBERT De SOYZA**

of the Court of Request, Balapitiya.

AT THE

Panadura Printing Works, Panadura.

---

**B. E. 2472.**

**A. D. 1929.**

# FOREWORD.

**Sisupalawadha or Maghakaviya** is an immortal work of unsurpassing excellence. As the latter name implies, it is a marvellous classical creation of Magha, a contemporary and fellow-worker of Kalidasa, who adorned the court of king Bhojadeva of India. A superficial study of the poem exh bits such a wealth of beauty that the poet deserves to be salled the Milton of India, as his brother poet is popularly designated "the Indian Shakespeare" A critical survey of the work brings into view such heights of emotion, and depths of sentiment, that one is surprised, that one short period of time in the history of the literature of India could have produced such a peerless pair of intellectual giants.

The story treated in the work is partly mythical and partly historical. After the destruction of Ravanna by Rama, the former was reborn as King Sisupala and became a persecutor of even the Gods. The king of Gods unable to stand the treatment meted out to his subjects, sent Sri Narada to King Krishna exhorting him to wage a war against Sisupala, and promising heavenly assistance. At a bloody battle, Sisupala after prodigies of valour, was utterly defeated and slain.

Students in Oriental Colleges, both in India and Ceylon, generally used this as a text bosk, but, upto date, no Sinhalese paraphrase has been attempted. This was a great drawback to the Sinhalese student; to supply this want, the present translation has been prepared by Ratgama pragnawansa, Kosgoda Pragnadhira, and Mohottiwatte Wimaladhrma, students of Saaddharmakara Pirivena, Pinwatte, Panadura, with the aid of their Principal, Vibhavi B. Aggasiri Maha sthvira, and is now offered to the indulgent public.

M. D. M. Dharmasena.
A. Albert de Zoysa,
Publishers.

Mohottiwatte,
June, 1929



REV: VEBHAVI B. AGGASIRI MAHA THERO,
*Principal of*
SADDHARMAKARA PIRIVENA,
PINWATTA, PANADURA.

නමඃ ශ්‍රී ඝනාය.

---

# සව්‍යාඛ්‍යා ශිශුපාලවධ මහාකාව්‍ය

## ස්වරූපනිරූපණය.

"ශිශුපාලස්‍යවධඃ" ශිශුපාලවධඃ, තද්දීපකං කාව්‍යමපි ශිශුපාල වධම්, නාම, යනු ඉතා සැකෙවින් මේ මහාකාව්‍යය පිළිබඳවැ ප්‍රතීයමාන නිරුක්තිවචන හෙයින් ශිශුපාලයාගෙ හෙවත් චෙදී ජනපදධීශ්වර ශිශුපාල නම් මහරජුගෙ වධය (නැසීම) ශිශුපාල වධ නම්. තත් ප්‍රකාශකවූ කාව්‍යයද උපචාරාත් නාම හෙයින් එම නාමයෙන් නිර්දිෂ්ටයයි හැගේ.

ශ්‍රී මනාමාඝ මහාකවිහු විසින් රචනාකළ හෙයින් මාඝ කාව්‍යය කියාත්, ඉතා පුරාතන කාලයෙහි පටන් මීටම ව්‍යවහාරවූ නාමයෙකි. මේ මහා කාව්‍යය රචනාකළ කර්තෘ සම්බන්ධව විමසා බලන කාලැ ශ්‍රී ජම්බුද්වීපයෙහි සුප්‍රසිද්ධ කීර්ත්තිශ්‍රීන් විරාජමානවැ රාජ්‍යානුශාසනය කළාවූද, නෛකභාෂා ශාස්ත්‍රප්‍රවීණ පණ්ඩිතොත්තමයන්ට විශෙෂයෙන් නොයෙක් ගරු බුහුමන් සත්කාර කළාවූද, නෛකභාෂාශාස්ත්‍රප්‍රවීණ විචක්ෂණ බුද්ධිමත් ශ්‍රීමත් භොජ මහ රජතුමාණන්ගේ කාලයෙහි විජෘම්භමාණවූ ගූර්ජරදෙශොද්භූත ශ්‍රී දත්තකාභිධාන පඬිතුමාගෙ පුත්‍රරත්නයවූ ශ්‍රී මනාමාඝ පඬිතුමන් බැව් නොයෙක් කරුණුවලින් ස්ඵුටවෙයි. ඊට නිදර්ශන වශයෙන් ග්‍රන්ථසමාප්තියට අනතුරුව කවිවංශ වර්ණනායෙහි:–

1. සර්වාධිකාරී සුකෘතාධිකාරඃ
ශ්‍රී වර්මලාඛ්‍යස්‍ය බභූව රාඥඃ,
අසක්තදෘෂ්ටිර්විරජාඃ සදෛව
දෙවොපරඃ සුප්‍රභදෙවනාමා.

2. කාලෙමිතං තථ්‍ය මුදර්කපථ්‍යං
තථාගතස්‍යෙව 'ජනෛඃ සචෙතාඃ,
විනානුරොධාත් ස්වහිතෙච්ඡයෛව
මහීපතිර්යස්‍ය වචශ්චකාර.

3. තස්‍යාභවද් දත්තක ඉත්‍යුදාත්තඃ
ක්ෂමී මෘදුර්ධර්මපරස්තනූජඃ,
යං වීක්ෂ්‍ය වෛයාස'මජාතශත්‍රෝ
ර්වචොගුණග්‍රාහි ජනෛඃ ප්‍රතීයෙ.

4. සර්වේණ සර්වාශ්‍රය ඉත්‍යනින්ද්‍ය
මානන්දභාජා ජනිතං ජනෙන,
යශ්චද්විතීයං ස්වයමද්විතීයො
මුඛ්‍යඃ සතාං ගෞණමවාප නාම.

5. ශ්‍රී ශබ්දරම්‍ය කෘතසර්ග සමාප්ති ලක්ෂ්ම
ලක්ෂ්මීපතෙශ්චරිත කීර්තන මාත්‍රචාරු,
තස්‍යාත්මජඃ සුකවිකීර්ති දුරාශයාදඃ
කාව්‍යංව්‍යධත්ත ශිශුපාලවධාභිධානං.

යි දක්වනලද මෙම ශ්ලෝක පඤ්චකයෙන්, ශ්‍රී වර්මල නම්වූ නරපති හුගෙ රාජ සදෘශවූ නොහොත් දෙවියෙකු හා සමාන මහත් තෙජෝ බල පරාක්‍රමාන්විත සුප්‍රභදෙව නම් මහා සේනාපතියකු විසුබවත් ඔහට මහත් පින්තෙද ගුණැති, දත්තක නම් පුත්‍රරුවනක් වියසිද, එම දත්තක නමැත්තාහට මෙම ශ්‍රී මාඝ මහාකවි නම් පුත්‍රරත්න ප්‍රතිලාභය වී යසිද මොනවට ප්‍රකාශවෙයි.

මෙතුමාගෙ පාණ්ඩිත්‍යය ගැන ඉතා සංක්ෂෙප වශයෙන් සලකා බලනවිට සව්‍යාකරණ සංස්කෘතාදී භාෂාවන්හිද තර්කන්‍යාය ඡන්දෝලඞ්කාරාද්‍යනෙක ශාස්ත්‍රයන්හිද පාරප්‍රාප්ත මහා පණ්ඩිතරත්නයක් බැව් ස්වකීය රචනාවක්වූ මේ ශිශුපාලවධ මහාකාව්‍යයෙන්ම යස රහට සඵුට වෙයි. මේ ග්‍රන්ථයෙහි කාව්‍යශරීරය කුමක්දැයි පරීක්ෂා කරත්හොත් ශ්‍රී ජම්බුද්වීපයෙහි චක්‍රවර්තිශ්‍රීන් විරාජමානවැ රාජ්‍යානුශාසනය කළාවූ, දශරථරජුගෙ පුත්‍රරත්නයවූ ශ්‍රී රාම, ශ්‍රී නාරායන, ශ්‍රී කෘෂ්ණ යනාදී නාමාන්තර වලින් ප්‍රසිද්ධවූ ලක්ෂ්මීපතිහුගේ ශෞර්‍ය වීර්‍යවික්‍රමාධික්‍යය ගර්භකොට වීරචරිතය ප්‍රකාශකිරීම් වසයෙන් රචනාකරණ ලද්දකැයි ගම්‍යමාන වෙයි. මේ මහා කාව්‍යය වනාහි ඉතා පුරාණ කාලයෙහි පටන් නෛකදෙශීය පණ්ඩිතොත්තමයන් විසින් සාතිශය ගරුත්වයෙන් සම්භාවිතවූයේමයැ.

" තත්‍ර බෘහත්‍රය්‍යාම් නිඛිලමහාකාව්‍යලක්ෂණාක්‍රාන්තතයාති ප්‍රසන්න ගම්භීර තයාත්‍යුපයුක්ත ව්‍යාකරණ ප්‍රයොග ප්‍රාචුර්‍යේණාති වෘත්ත පාදකතයාච කවි මූර්ධන්‍ය මාඝ ප්‍රණීතං ශිශුපාලවධ කාව්‍යමෙව නායකායතෙ" යනාදීන් මහා මහොපාධ්‍යාය කොලාචල මල්ලිනාථසූරීන් විසින් විරචිතවූ 'සර්වංකෂා' නම් සංස්කෘත භාෂාමය

ව්‍යාඛ්‍යාත යෙහි සඞ්ගීත හෙයින් කිරාතාර්ජුනීය ශිශුපාලවධය නෛෂධීය චරිතය යන වෘහත්ත්‍රයී සඞ්ඛ්‍යාත මහා කාව්‍යත්‍රය අතුරෙහි මේ ශිශුපාලවධ මහාකාව්‍යයම සකල මහා කාව්‍යලක්ෂණාක්‍රාන්ත හෙයින්ද, අති ප්‍රසන්න ගම්භීරභාවය ඇති හෙයින්ද අතිශයින් උපයෝග කරණලද ව්‍යාකරණ ප්‍රයෝග බාහුල්‍යයෙන් යුක්තවූ. ශාතිශය ශබ්දව්‍යුත්පාදකත්වයෙන්ද සමලඞ්කෘත හෙයින් පණ්ඩිත ශිරෝමණි ශ්‍රී මාඝ කවි ප්‍රණීත ශිශුපාලවධ කාව්‍යයම ප්‍රධානවූ අති ශ්‍රේෂ්ඨ කාව්‍යයබැව් ප්‍රසිද්ධව වේමයැ.

මේ මහා කාව්‍ය නිර්මාණ කාලයගැණ විමසා බලනවිට අති පුරාණයෙහි දඹදිවැ මාලවනම් දේශයෙහි දැහැමින් රාජ්‍යානුශාසනයකල, ශ්‍රී භෝජදේව නම් රජුගේ රාජ්‍යකාලයබැව් ඉතා සැකෙවින් හැගේමැයි. ඇතැම් පඬිවරුන්ගේ මතය ක්‍රිස්තු වර්ෂයෙන් එකොළොස්වෙනි ශතවර්ෂයේ උත්තරභාගයෙහි යයිද ශර්මණ්‍යදේශ වාසී, ඝාලාච් නම් පඬිතුමාගේ මතය, ක්‍රිස්තු වර්ෂයෙන් දශවෙනි ශතවර්ෂාරම්භයෙහි යයිද, යාකෝබ් නම් පඬිතුමාගේ මතය නවෙනි ශතවර්ෂයේ මැදභාගයෙහි යයිද, යනාදි වශයෙන් කිපආකාරයෙකින් දක්වා තිබෙනබැව් විශේෂයෙන් සැලකිය යුතුයි.

වංශවීර්‍ය්‍යශ්‍රුතාදීනි වර්ණයිත්වාරිපෝ'රපි
තජ්ජයාන්නායකෝත්කර්ෂ වර්ණනංචධිනෝතිනඃ

යනාදින් මහා කාව්‍ය විෂයෙහි දර්ශිතව්‍ය කරුණුවලින් හා

ඉතිහාසකථෝද්භූත මිතරද්වා සදාශ්‍රයම්
චතුර්වර්ගඵලෝපෙතං චතුරෝදාත්තනායකම්

යනුවෙන් ප්‍රකාශිතවූ කාව්‍යාඞ්ගවලින්ද

නගරාර්ණවශෛලර්තු චන්ද්‍රාර්කෝදය වර්ණනෛඃ,
උද්‍යානසලිලක්‍රීඩා මධුපානරතෝත්සවෛඃ

යනාදීන් කියනලද යහපත් වර්ණනාවලින්ද

ශ්ලේෂඃ ප්‍රසාදඃ සමතා මාධුර්‍ය්‍යං සුකුමාරතා
අර්ථව්‍යක්තිරුදාරත්ව මෝජඃකාන්ති සමාධයඃ

යි නිර්දිෂ්ටවූ දශවිධ ශබ්දාලඞ්කාරයෙන් හා ස්වභාවෝක්ති වක්‍රෝක්ති සඞ්ඛ්‍යාත අර්ථාලඞ්කාර ජාතයෙන්ද,

මුක්තකං කුලකංකොෂඃ සඞ්ඝාතශ්චෙති තාදෘශඃ

යනාදී බන්ධන විශෙෂයෙන්ද සමුල්ලසිතවැ විඥයන්ට සාතිශය ප්‍රීතිප්‍රමොදජනක හෙයින් මෙය වර්ණනා විෂයාතික්‍රාන්තවැ පවත් නෝමයැ.

කාව්‍ය සම්බන්ධ සාතිශය වෛචිත්‍ර්‍යාන්විත මේ මහා කාව්‍යය ගරුත්වයෙන් පරිශීලනය කිරීමෙන් හෙවත් මොනවට දැන හැදෑරීමෙන් සියල්ලන්ට ඇතිවන්නාවූ ඓහිකපාරත්‍රික විපුල ප්‍රයෝජනයත් විවජ්ජන වර්ණනීය හෙයින් සියල්ලන් විසින් උද්ග්‍රහණ ධාරණයෙහි ප්‍රොත්සාහය වැඩිය යුතුබැව් සැලකිය යුතුයි.

කාලක පටන් මේ ග්‍රන්ථය අප පිංවත්තේ සද්ධර්මාකර පිරුවන්හි උසස් පන්තිවල ගිහිපැවිදි ශිෂ්‍යයන්ට පුහුණුකරවන්ට ප්‍රාරබ්ධවූ හෙයින් තත් පරිවෙණාධිපති ගෞරවාර්හ ශ්‍රී විශුද්ධාචාර්ය ධර්මකීර්ති ශ්‍රී පොහද්දරමුල්ලේ ඥානානන්දාභිධාන නායක ස්ථවිර පාදයන් වහන්සේ විසින් මේ මහා කාව්‍ය ග්‍රන්ථය සෛංහලීයාර්ථ ව්‍යාඛ්‍යානයකින් යුක්තකොට පළකරවීම බොහෝදෙනාට මහත් ප්‍රයෝජන පිණිස පවතින්නේයයි අනුමතකළ හෙයින් යථෝක්ත පිරුවන්හි ප්‍රධානාචාර්යධුරන්ධර ශෞ, බලපිටියේ විභාවී අග්ගසිරි මහාස්ථවිර පාදයන් වහන්සේගෙ උපදෙශාශ්‍රයෙන් සංස්කෘත භාෂාමය ව්‍යාඛ්‍යා කීපයක් හා තවත් ලිපිරාශියක් බලා යථෝක්ත මල්ලිනාථසූරීන් විසින් විරචිතවූ සර්වංකෂා නම් ටීකාව ප්‍රධානාශ්‍රය කොටගෙණ පද්‍යය මොනවට බබුළුවන අර්ථයෙන් පද්‍යාවභාසිනී නම් මෙම සෛංහලීයාර්ථ ව්‍යාඛ්‍යානය ලියනලදී. මීට සංස්කෘත භාෂායෙන්ම නොයෙක් පණ්ඩිතයන් විසින් ලියනලද ව්‍යාඛ්‍යා අටක් පමණ දැනට තිබෙත්.

අපගෙ මේ සත්කෘත්‍යයට ආධාරදීම් වශයෙන් මෙම පිරුවන්හි උපාචාර්ය ගෞරවාර්හ කොස්ගොඩ ඥානවිමල ස්ථවිරපාදයන් වහන්සේ විසින් පෘෆ් බැලීමාදියෙන් උපකාර කළබවත් කෘතඥතායෙන් සමරණය කරමහ.

මෙම ප්‍රථමභාගය කොළඹ මාලිගාකන්දෙ විද්‍යෝදය මහාවිද්‍යාලයාධිශ්වර අති ගෞරවාර්හ පණ්ඩිතාචාර්ය කහවේ ශ්‍රී සුමඞ්ගල රතනසාරාභිධාන නායක මාහිමියාණන් වහන්සේ විසින් සමාදරයෙන් පිළිගත් නමුදු අපගෙ ව්‍යාඛ්‍යායෙහි විද්‍යමානවූ අක්ෂරවින්‍යාසාදි ඇතැම් කරුණු උන්වහන්සේගේ අදහසට වෙනස්ව තිබෙනබැව් ප්‍රකාශ කෙළේයැ.

අපගේ මේ ව්‍යාඛ්‍යායෙහි ඒ ඒ තන්හිවූ ලකුණුවනාහි යම් යම් කරුණු සැකෙවින් දක්වීමට අපගේ අභිමතය පරිදි යොද තිබෙන බවත් මෙහි ටීකාගතනයින් විග්‍රහය දක්වන බොහෝ තන්හි වාක්‍ය පමණක් යොද ඉරිකැබලි දෙකක්ද, ඊටත්වඩා සැකෙවින් දතයුතු කරුණු දක්වීමට ඉරිකැබලි එකක්ද, ක්‍රියාකාරක පදසම්බන්ධයි යන තැන සංක්‍ෂෙපකොට- ක්‍රි- යි- යනුද, වැඩිවිස්තරයක් දක්විය යුතුතැන ( ) මෙබඳු බ්‍රකැට් එකක්තුළ යම් යම් වචන යෙදීමද යනාදිය මෙය පරිශීලනය කරණ භවතුන් විසින් විශෙෂයෙන් දතගත යුතු ලකුණුබැව් සලකනු මැනවි.

තවද මෙම ව්‍යාඛ්‍යානය සම්බන්ධ විස්තරයෙහි ඇතැම් ධාතූන් හා තදර්ථයන්ද ශබ්දසෝතාම මහානිධියෙහිදැක්වූ ක්‍රමයෙන් හා ඇතැම් ධාතූන් පිළිබඳ උපදෙශාක්‍ෂර අනුබන්ධඉත් සංඥ යනාදිය එම ධාතු ප්‍රකෘත්‍යවබොධය දුෂ්කරවන හෙයින් නොයෙදූ බවත් ප්‍රථම විතියාදී සඟී කිපක්‍ෂ කිරියකරු පදසබදෙහි අනද්‍යතනාතී ලබ්ධ යනු භූතාර්ථලබ්ධ කියාද, භූතාර්ථලබ්ධ යනු අනද්‍යතනාතීතලබ්ධ කියාද ඇතැම් ශ්ලොකවල හා ව්‍යාඛ්‍යායෙහිත් යම් යම් වචන යන්ගේ දිඝිත්වයද, බැඳියයුතු අකුරු නොබැඳී ඉතා ලංවී තිබෙන බවද ප්‍රමාද දෝෂත්වයෙන් සැලකිය යුතුයි.

මෙහි පූර්වාර්ධය වන සඟී දශය පළමුවරට පළකරවන්ට අදහස් කළ නුමුත් බොහෝ දෙනෙකුන්ගේ අයදුම නිසා මේ වරට සඟී පසකින් යුක්තවූ මේ පූර්වභාගය නිකුත්කරන්ට කරුණු සැලසුනු බවත් සැලකිය යුතුයි. ඉතිරි කොටස් නොපමාව පළකරවන්ට මුද්‍රණාරබ්ධව තිබෙත්.

අපගේ ප්‍රමාද භ්‍රමාදියෙන් හා වර්ණයොජකයන්ගෙ ප්‍රමාදයෙනුත් සඤ්ජාතවූ යම් යම් දෙෂ ස්ථාන මෙහි විද්‍යමානවන්ට හැක්කේ මැයි. ඊර්ෂ්‍යාපරවශනොවී සියලු භවතුන් විසින් සමාධිය භජනය කිරීමෙන් එබඳුතැන් ශුද්ධකොට දෙවන කලාපයෙහි පළකරවන විශෙෂ ශුද්ධියට ඇතුලත්කිරීම පිණිස ලියා එවනු මැනවි. ඉංග්‍රීසි සහ සිංහල සවිස්තර සංඥපනයත් දෙවන කලාපයෙහි පළකරවන් නෙමු. මේ පොත දැන ඉගෙණ භාවිතාකරණ භවතුන්ට ප්‍රයෝජන පිණිස ඉතා සැකෙවින් ශුද්ධිපත්‍රයක් ග්‍රන්ථාවසානයෙහි යොද තිබෙන බැවින් එය බලා ප්‍රයෝජන ගතයුතුයි.

මෙහිදී අපගෙ ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණයට අත්‍යන්තෝපකාරීවූ මෙම සඞ්ඝීංකර පරිවේණාධිපතිව වැඩසිට ස්වර්ගස්ථවීවදාළ අතිගරු පූජනීය සුගත සාසන ධ්වජ විනයාචාර්ය ශ්‍රී ශීලානන්දාභිධාන නායක මාහිමියාණන් වහන්සේ කෘතඥතායෙන් අනුස්මරණය කිරීමෙන් උන්වහන්සේට පුණ්‍යානුමෝදනා කරම්හ.

මෛබවට—රත්ගම රාජාරාමාධිපති ගරුකටයුතු සිරිසුදස්සන
මහාස්ථවිරපාදයන් වහන්සේගේ ශිෂ්‍ය
රත්ගම පඤ්ඤාවංස යති.

කොස්ගොඩ ගොඩපිටියේ සිරිනිවෙසාරාමාධිපති ගෞරවාර්හ
අමරපුර සිරිසද්ධම්මවංශ මහානිකායේ අනුනායක ධුර
ධර සිරිවිසුද්ධ අරියවංසපාල ගණාචරිය සිරිරතනාභි
ධාන මහාස්ථවිරපාදයන් වහන්සේගේ ශිෂ්‍ය
කොස්ගොඩ පඤ්ඤාධීර යති.

මොහොට්ටිවත්තේ අභිනවාරාමාධිපති ගරුකටයුතු
බලපිටියේ විභාවී අග්ගසිරි මහාස්ථවිරපාදයන්
වහන්සේගේ ශිෂ්‍ය
මොහොට්ටිවත්තේ විමලධම්ම යති.

ශ්‍රී ශුභ මස්තු.

## සව්‍යාඛ්‍යා ශිශුපාලවධ

# ශුද්ධි පත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ පාඨ. | ශුද්ධ පාඨ. |
|---|---|---|---|
| 2 | 33 | කතීා | කතීඃ |
| 3 | 16 | සත්‍රියාම් | සත්‍රියාම් |
| ,, | 32 | ත්වීෂාම්වයඃ | ත්විෂාම්වයඃ |
| ,, | 34 | විභාවීතාසෘතිම් | විභාවිතාසෘතිම් |
| 4 | 1 | ප්‍රථමඃ සර්ගඃ | ශිශුපාලවධෙ, |
| ,, | 11 | ඉත්‍යබොධි | ඉත්‍යබොධි |
| ,, | 14 | වීභාවිතා | විභාවිතා |
| 5 | 23 | වයත්වීෂා | වයත්විෂා |
| 6 | 13 | පිසඞ්ග | පිශඞ්ග |
| 9 | 11 | සෘතිමණ්ඩලාති | ශෘතිමණ්ඩලාති |
| ,, | 34 | අසඤ්ජතශව | අසඤ්ජතශව= |
| 15 | 11 | ප්‍රිඃ, ප්‍රියවූ | ප්‍රියඃ, ප්‍රියවූ; |
| ,, | 21 | අපෞහිලාෂමෙෂා, | අපෞහිලාෂ, එෂා– |
| 16 | 25 | ශ්‍රියං | ශ්‍රියං |
| ,, | 28 | ජම්බුජනිතා | ජම්බූජනිතා |
| 17 | 22 | අම්බසාම් | අම්භසාම් |
| ,, | 31 | සෘෂිත්වීෂඃ | සෘෂිත්විෂඃ |
| 18 | 18 | තෂ්‍ය | තස්‍ය |
| 19 | 28 | අප්‍රමානවූහ | අප්‍රමාණවූහ |
| ,, | 11 | භූතාච්ලුඞ් | අනද්‍යතනාතීතලඞ්– |
| ,, | 32 | භූතාච්ලුඞ් | අනද්‍යතනාතීතලඞ් |
| 25 | 11 | යසස්‍යාසාළදිතාතම– | යසස්‍යාසාවුදිතාතම– |
| 26 | 24 | මොක්ෂරෙවවා | මොක්ෂඑවවා |
| 28 | 28 | තස්‍යඃ | තස්‍යාඃ |
| 29 | 10 | අවාතාරඃ | අවාතරඃ |
| ,, | 25 | ගුරඃ | ගුරුඃ |
| 30 | 10 | නිෂපන්න | නිෂ්පන්න |
| 32 | 28 | බහෙම්‍යා | බහෙව්‍යා |
| 33 | 13 | සතෘහුගෙ | ශතෘහුගෙ |
| 34 | 13 | ඉන්ද්‍රයබද්ධවෛස්‍ය | ඉන්ද්‍රශබ්දවෛස්‍ය |

| පිට. | පෙල. | අශුද්ධ පාඨ. | ශුද්ධ පාඨ. |
|---|---|---|---|
| 37 | 7 | අක්‍ෂා | අක්‍ෂාරි |
| 38 | 7 | සිංහස්‍යෙවා | සිංහස්‍යෙයම් |
| ,, | 8 | මුග්ධතානනාඃ | මුග්ධක්‍ෂානනාඃ |
| ,, | 32 | 18 ශ්ලෝකඅෂ්ටාදශයකින් | ශ්ලෝකාෂ්ටාදශක කින් |
| 40 | 8 | රසෞඝඃ | රසෞඝා |
| ,, | 14 | ප්‍රාදුර්භූත් | ප්‍රාදුර්භූතාඃ |
| ,, | 15 | තාක්‍ෂ්‍යසුතාඃ | තාක්‍ෂ්‍යසුතා |
| ,, | 15 | ඥඃ | (ඥඃ) |
| ,, | 29 | රවුලෙක්තෙම | රවුළෙක්තෙම |
| 41 | 5 | සතාඃ | ශතාඃ |
| 42 | 16 | භූතාභිලුඩ් | අනාදෘතනාතීතලඞ් |
| ,, | 25 | දෙවසතෘහුගෙ | දෙවශතෘහුගෙ |
| 43 | 28 | විසර්පීතඃ | විසර්පිතඃ |
| 45 | 25 | නාසමීරසමීඃ | නාසමීඃඅසමීඃ |
| 48 | 24 | රවුලා | රවුළා |
| ,, | 25 | ශෙවා | සෙවා |
| 50 | 19 | තිවුනේද | තිවුණේද |
| ,, | 23 | වන්ද්‍යං | වන්ද්‍යඃ |
| 52 | 2 | හීවත් | හීවාන් |
| ,, | 3 | වනානතා | වනානතා |
| 53 | 7 | සතිලොචනං | සත්‍රිලොචනං |
| ,, | 20 | නලුවෙක් | නළුවෙක් |
| ,, | 26 | විපාදිතව්‍යාරිති | විපාදිතාව්‍යාඉති |
| 60 | 22 | (ගනඥඃ) | (ගණයඃ) |
| 61 | 6 | (යාති) | (යාති) |
| ,, | 29 | භූතාභිලුඩ් | අනාදෘතනාතීලඞ් |
| 62 | 2 | හටද්හිරු | හළ්ද්ගිරු– |

57 වෙනි පිටේ 6 වෙනි පෙලට, ඉති ශ්‍රී මාඝකෘතෞ ශිශුපාලවධෙ මහාකාව්‍යෙ ශ්‍රියඞ්කෙ, කෘෂ්ණනාරද සංභාෂණං නාම ප්‍රථමඃ සර්ගඃ, යනු යෙදිය යුතුයි.

57 වෙනි පිටේ 24 වෙනි පෙල අවසන්වූ තැනට, ශ්‍රීමත්මාඝ මහා කවිහු විසින් කරණලද ශිශුපාලවධ නම්ඇති, ශ්‍රී අඞ්කවූ, මහා කාව්‍යයෙහි, කෘෂ්ණනාරද සංභාෂණනම්වූ දෙවනසර්ගය, මෙතෙකින් සමාප්තයි (කියා පදනුක්‍රමයෙන් අර්ථක්‍රමය යෙදිය යුතුයි)

| පිට. | පෙළ. | අශුද්ධ පාඨ. | ශුද්ධ පාඨ. |
|---|---|---|---|
| 62 | 4 | ජීඹරෙ- | ජීඹරෙර්, |
| 63 | 9 | වතීස්‍යතෙත්ව, | වර්ත්ස්‍යතෙත්ව |
| 66 | 10 | ආශ්ලෙෂෙ | ආශ්ලෙෂ |
| ,, | 26 | ඇලුනාවූ | ඇළුණාවූ |
| ,, | 29 | සපුරත් | සප්පුරන්ත්‍යඃ= |
| 68 | 3 | ත්වීෂා- | ත්විෂා- |
| ,, | 24 | මෙවාවං | මෙවාවඃ |
| 73 | 5 | සෛංහිකොයො | සෛංහිකෙයො |
| ,, | 9 | උද්ධූසනති | උද්ධූනති |
| ,, | 11 | මාතරෙෂා- | මාතළෂා- |
| ,, | 27 | ආලසහාලම් | ආලපහාලම් |
| ,, | 32 | භූතා-ලුඞ් | අනද්‍යතනාතීතලඞ් |
| 76 | 32 | යං | යඃ |
| 77 | 26 | යොෂිතං | යොෂිතඃ |
| 79 | 27 | භක්ෂතෙ | භක්ෂණෙ |
| 83 | 34 | චන්ද්‍රමාං | චන්ද්‍රමාඃ |
| 83 | 19 | විජයාඃ | විජයඃ |
| ,, | 19 | සෙනායඃ | සෙනායාඃ |
| 86 | 11 | වතී-ලට්-ම, | ආශීඃ ප්‍රේරණලොට්-ආම්ප් |
| 87 | 15 | භූතාවී-ලුඞ්- | අනද්‍යතනාතීතලඞ්- |
| ,, | 12 | ආම්‍රේඩතෙ | ආම්‍රේඩණෙ |
| 91 | 34 | නිරාකුලඃ | නිරාකුලාඃ |
| 93 | 29 | ධජඃ | ඕජඃ |
| 94 | 6 | ඇතුලහ | ඇතුළත |
| 99 | 16 | වනසයි | වනසයිද |
| ,, | 17 | පහත් කොරෙයි | පහත්කොරෙයිද-හෙහොමෙයි |
| ,, | 27 | ඉති, මාවෙදි | ඉති නවම්, මාවෙදි |
| 101 | 29 | ඔබකාරා | නා කාර |
| 192- | 6 | යුධිෂ්ඨර | යුධිෂ්ඨිර |
| 104, | 28- | වතීලට් | භවිෂ්‍යත්- ලෘට් |
| ,, | ,, | එ, ප්‍රත්‍යයී, | ෂ්‍යෘ, ප්‍රත්‍යයී |
| 106 | 34 | පස්ශඃ | පස්පශඃ |
| 107 | 26 | ඇත්තාහු | ඇත්තාවූ |

| පිට. | පෙළ. | අශුද්ධ පාඨ. | ශුද්ධ පාඨ. |
|---|---|---|---|
| 109 | 17 | පලහැටිබව | පළහැටිබව |
| 110 | 2 | චක්ෂසප්ලයෙහි | චක්ෂුඃසප්ලයෙහි |
| 115 | 15 | උපමියතෙ | උපමීයත |
| ,, | 20 | ආතාම්,– | යාතාම්, |
| 119– | 2 | පියඃ | ප්‍රියඃ |
| 125 | 9 | ඝොෂාදද්භූතවුක්ෂුදිරෙ | ඝොෂාදද්භූතශ්‍රුක්ෂුදිරෙ |
| ,, | 11 | ආශකාතවීමෙන් | ආසකාතවීමෙන්, |
| 126 | 10 | රථෝඝෙසඃ, | රථෞඝෙසඃ |
| 130 | 25 | තානිව | තානීව |
| 137 | 22 | ජිෂිත් | ජිෂත් |
| 139 | 16 | විත්‍රෛඃසහ | විත්‍රෛඃසහ |
| 143, | 4 | ශ්‍රීනිර්මිත | ශ්‍රීනිර්මිති |
| ,, | 8 | යාමහවඤ්ජනස්‍ය | යාමහවජ්ජනස්‍ය |
| 144 | 13 | එල, නිෂ්පතෙනෟ | එළ, නිෂ්පතෙනෟ |
| 149 | 14 | රසමයඃ | රශමයඃ |
| 156, | 22 | හර්ෂිතා, | හෂිතා |
| 165, | 13, | සුරධිපෙ– | සුරාධිපෙ– |
| ,, | 14 | යෙ, ගසනී | යො, හසනි |
| 172, | 6 | සළුවිකතටාංශු– | සළුවිකතටාංශු– |
| 173 | 20 | මණිසානුරාශාඃ | මණිසානුරාගාඃ |
| 179, | 29, | ධූකාඃඤ්– | ධූ, හාඃඤ්– |
| 183 | 5, | නීලිසලිතිලස්‍ය | නීලීසලිලස්‍ය |
| 185 | 9 | අනුරොදතිව | අනුරොදිතීව |
| 187 | 8 | තාන් | තානි |
| 190 | 22 | අවනතගිති | අවනතශිති |
| ,, | 32 | තමන්ට, | තමන්ට– |
| 201 | 6, | ජලශාවටුලාග්‍රපාදං | ජනශාවටුලාග්‍රපාදං |
| ,, | 21, | අබහිතාම් | අභිහිතාම්, |
| 205, | 12, | වක්‍ෂවවාග්‍ර, | වක්‍ෂවවග්‍ර–. |

බලපිටියේ ආඳදෙල

රත්නගිරි වලව්වෙහි නිවැසි

ප්‍රාචීන ප්‍රතීචීන භාෂා ශාස්ත්‍ර ප්‍රවීණ

සත්කීර්ත්තිමත්

ජේ. පී., යූ. පී. ඇම්. උපාධිනාමධාරි

එච් ජේ. ඇම්. වික්‍රමරත්න

සේනානායක

නිතිඥ මැතිතුමාට

මෙම

සව්‍යාඛ්‍යා ශිශුපාලවධ මහාකාව්‍ය

ප්‍රථම භාගය

සමර්පණය කරණලදී.

H. J. M. WICKRAMARATNE SENANAYAKA, ESQ.,

J.P., U.P.M.,

PROCTOR S.C., BALAPITIYA.



සාමදාන විනිශ්චයකාර ධුරය සහ නිලනොලත්

පොලිස් මහෙස්ත්‍රාත් ධුරන්ධර

සත්කීර්තිමත්

## එච්. ජේ. ඇම්. වික්‍රමරත්න

**සේනානායක**

**ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ මැතිතුමා**

# ශිශුපාලවධම්.

1. ශ්‍රියඃ පතිඃ ශ්‍රීමති ශාසිතුංජග
ජ්ජගන්නිවාසො වසුදෙව සද්මනි
වසන්දදර්ශාව තරන්ත' මම්බරා
ද්ධිරණ්‍යගර්භාඞ්ගභුවං මුනිං හරිඃ.

---

**සම්‍යක්සම්බුද්ධායා'ර්හතෙ නමොස්තු.**

## පද්‍යවභාසිනී ව්‍යාඛ්‍යා.

**වයම්ප්‍රණම්‍ය සම්බුද්ධං ජගන්නාථං විමුක්තිදං**
**සද්ධර්මප්‍රවක්තාරං ශාක්‍යසිංහං මහාමුනිම්**
**ප්‍රඥාවංශො යතිශ්චෛව ප්‍රඥාධීරඃ සුසංයමී**
**යතිර්ව්විමලධර්මාඛ්‍ය ඉති සාධුගුණානුගාඃ**
**සද්ධර්මාකරවිඛ්‍යාත විද්‍යාශාලෙ'තිශොභනෙ**
**මුඛ්‍යාචාර්‍ය්‍යතො'රශ්‍රී නාම්න උපදෙශතඃ**
**පරිවෙණෙ'ධිපස්‍යා'ත්‍ර ශ්‍රීමතඃ සිතකීර්තිනඃ**
**ඥානානන්දසතීර්ථස්‍ය චා'නුමත්‍යා'ශ්‍රශිලිනඃ**
**ශිශුපාලවධස්‍ය'ස්‍යාං රම්‍යයා නිජභාෂයා**
**පද්‍යාවභාසිනීං නාම ව්‍යාඛ්‍යාං ලසච්ඡ්‍රීං විතනුමහෙ.**

(කුලකම්)

---

ආශීර්නමස්ක්‍රියාවස්තු නිර්දෙශොවාපි තන්මුඛම් යනාදීන් කාව්‍ය ශාස්ත්‍ර විෂයෙහි නිදර්ශිතාලාඞ්කාරික මතානුයායීව පරිශුද්ධවිප්‍රවංශිය විචජ්ජන ශිරොමණී ශ්‍රී දත්තකසූනු ශ්‍රී මනමාඝ මහාකවීනු ස්වාභිප්‍රෙත ශිශුපාලවධනම් ප්‍රශස්ත කාව්‍යරචනා කටැටියෝ ශිශුපාලවධයට මූල හෙතුභූත ශ්‍රී කෘෂ්ණගේ ශිමන්නාරද මුනි සන්දර්ශන සඞ්ඛ්‍යාත වස්තුව ශ්‍රී ශබ්ද ප්‍රයොග පූර්වකොට නිර්දෙශ කරණුවෝ ශ්‍රියඃ පතිඃ යනාදී මේ පද්‍යය ප්‍රථමකොට බන්ධනයකළහ.

**හරිඃ මුනිං දදර්ශ** යනු මෙහි ක්‍රියාකාරක පදසම්බන්ධයි– දදර්ශ යන දෘශිර් ප්‍රෙක්ෂණෙ ධාතු පරොක්ෂලිට් විභක්ති සකර්මක කර්තෘකාරක පරස්මෛපද ප්‍රථම පුරුෂෛකවචනාන්තාඛ්‍යාත ක්‍රියා පදයාහට හරිඃ යනු උක්ත කර්තෘයි මුනිම් යනු අනුක්ත කර්මයි.

2 ගතං තිරශ්චීන මනූරු සාරථෙඃ
ප්‍රසිද්ධ මූර්ධ්වජ්වලනං හවිර්භුජඃ
පතත්‍යධොධාම විසාරි සර්වතඃ
කිමෙතදිත්‍යාකුලමීක්ෂිතං ජනෛඃ

---

1. (පදාර්ථ) ශ්‍රියඃ, ශ්‍රීකාන්තාවගේ; පතිඃ, වල්ලභවූ; ජගන්නිවාසඃ, ජගදාධාරවූ හෙවත් ලෝකයාට නිවාසස්ථානවූ (කුක්ෂිස්ථසර්ව ලෝකය ඇත්තාවූ යීසේයි); (එසේද වුවත්) ජගත්, ලෝකයාට; ශාසිතුං, අනුශාසනය කරන්ට හෙවත් දුෂ්ටනිග්‍රහය හා ශිෂ්ටානුග්‍රහය කරන්ට (දුෂ්ටනිග්‍රහ ශිෂ්ටානුග්‍රහ දෙකින් ලෝකය හික්මවන්නට යී සේයි); ශ්‍රීමති, ශ්‍රීමත්වූ; වසුදෙව සද්මනි, වසුදෙව රූපීවූ කාශ්‍යප ඍෂිහුගෙ භවනයෙහි; වසන්, කෘෂ්ණරූපයෙන් වාසය කරන්නාවූ; හරිඃ, ශ්‍රීවිෂ්ණු තෙමේ; අම්බරාත්, අහසින් අවතරන්තාම් (ඉන්ද්‍රසන්දෙශ කථනය පිණිස භූලොකයට) බැසඑන්න වූ; හිරණ්‍යගර්භාඞ්ගභුවං, බ්‍රහ්මයාගෙ පුත්‍රවූ; මුනිම්, ශ්‍රී නාරදනම් ඍෂිහු; දදර්ශ, (කිසියම් දිනෙක) දුටුවේය; (මුක්තකබන්ධනයි)

මේ කාව්‍යයාගේ ප්‍රථම පද්‍යාරම්භයෙහි ශ්‍රියඃ පතිඃ යනාදීන් දෙවතාර්ථ ප්‍රකාශක ශ්‍රී ශබ්ද ප්‍රයොගය කළ හෙයින් අනිෂ්ට ගණදොෂ ප්‍රසඞ්ගාදිය භඞ්ගවිය.

තත්‍රාදෞ ශ්‍රීශබ්දප්‍රයොගාච්ඡ ගණාදිශුද්ධෙරභ්‍යුච්චයඃ (තදුක්තම්), දෙවතාවාචකාඃ ශබ්දායෙ ච භද්‍රාදිවාචකාඃ
සර්වෙතෙ නෛවනින්ද්‍යාඃ ස්‍යුල්ලිපිතො ගණතොපිවා,

යනු තල්ලක්ෂණයි— ජගතඃ නිවාසඃ ජගන්නිවාසො වසුශ්චාසෞ දෙවශ්චෙති වසුදෙවඃ වසුදෙවස්‍ය සද්ම වසුදෙව සද්ම– තස්මින්– හිරණ්‍යස්‍ය ගර්භඃ හිරණ්‍ය ගර්භඃ තස්‍ය අඞ්ගභුවඃ හිරණ්‍යගර්භාඞ්ගභුවඃ තම්– අථ වා තස්‍යාඞ්ගාදවයවාද්භවස්ඞ්ගාඛ්‍යාද්භවතීති හිරණ්‍යගර්භාඞ්ගභූඃ තම්– යනු මෙහි සමාසයි. සංසෘෂ්ටි අලඞ්කාරයි මුක්තකබන්ධනයි, මේ සර්ගයෙහි වංශස්ථනම් වෘත්තයි. (ජතෞජ්‍රෞ වංශස්ථමුදීරිතම් ජරෞ) යනු තල්ලක්ෂණයි.

මේ වනාහි වස්තු නිර්දේශ පූර්වක ග්‍රන්ථ රචනාවෙකි.

2. (අයං) **ධාම අධඃ පතති** යනුද **ජනෛඃ එතත් කිම් ඉති ආකුලං ඊක්ෂිතම්** (අභූත්) යනුද– මෙහි ක්‍රියාකාරක පදසම්බන්ධයි– පතති යනු පතඞ්ගතනෙ– ධාතු වර්තමානලට්– අක– කර්තෘ පර– ප්‍ර– එ– ආ– ක්‍රියා පදයි– ධාම යනු– තද්‍රූක්ත කර්තෘ පදයි– අධඃ යනු අව්‍යයි– (නොහොත්) ඇතැම් තැන– පතඞ්ග ධාතුව සකර්මක වන හෙයින්– අධඃ යනු අනුක්තකර්ම අව්‍යය පදයි.

3. චයත්විෂාමිත්‍ය වධාරිතං පුරා
තතඃ ශරීරීති විභාවිතාකෘතිම්
විභුර්විභක්තාවයවං පුමානිති
ක්‍රමාදමුං නාරද ඉත්‍ය' බොධිසඃ

---

2. අනූරුසාරථෙඃ, ඌරුරහිතයා සාරථිකොට ඇත්තහුගේ හෙවත් හිරුගේ(ඌරුරහිතයා නම් අරුණයායි සේයි); ගතම්, ගමන; තිරශ්චීනම්, තිර්‍ය්‍යග්භූත වෙයි හෙවත් සරසට පැමිණියේ වෙයි; හවිර්භුජඃ, වහ්නිහුගේ ඌර්ධ්වජ්වලනම් ඌර්ධ්වස්ඵුරණය හෙවත් මත්තට (උඩට)දැල්ලනැගීම; ප්‍රසිද්ධම්, (ලොකයෙහි) ප්‍රසිද්ධයි; සජිහඃ, හාත් පසින්; විසාරි, පැතිරෙන්නාවූ; (අයම්) ධාම, මේ රශ්මිතෙම; අධඃ පතති, යටට හෙවත් පහතට වැටෙයි; එතත් කිම් ඉති, සූර්‍ය්‍යාග්නි දෙකින් විසදෘශවූ ලක්ෂණඇති මේ බැබලීම කිමෙක්දැයි, ආකුලං, විස්මයෙන් අවුල්ව හෙවත් විස්මයෙන් සම්භ්‍රාන්තව; ජනෛඃ ඊක්ෂිතම්, ජනයන් විසින් බලනලදී.

තිරශ්චීනං තිර්‍ය්‍යග්භූතම්, විභාෂාඤ්චෙර දික් ස්ත්‍රියාම්; ඉති තිර්‍ය්‍යක්ශබ්දාදඤ්චත්‍යන්තාත්ප්‍රාතිපදිකාත්ස්වාර්ථෙ ඛප්‍රත්‍යයඃ– අවිද්‍යමානො ඌරුයස්‍යා සොනූරුඃ– ස සාරථිර්‍යස්‍යසඃ අනූරුසාරථිඃ තස්‍ය ඌර්ධ්වංජ්වලනම්– ඌර්ධ්වජ්වලනම්– යනුද සමාසයි මේ ශ්ලොකයෙහි ජනෛඃ ඊක්ෂිතම් යන තන්හි– ඊක්ෂිතම් යනු ඊක්ෂ දර්ශනාඞ්කන යොඃ යි සකර්මක ධාතුහු සොරෙන් ඇති කර්මය නොකියවි කල්හි–භාව යෙහි ක්තප්‍රත්‍යය වූතැතියි–ටීකාමතයි, ප්‍රසිද්ධෙරවි වක්ෂ්‍යතඃ කර්මනො කර්මිකා ක්‍රියා, යනු කී හෙයිනි කොවිත් කර්මණිකාන්තං කෘත්වා ඊක්ෂිතම් මුනිං දදර්ශෙති පූර්වේන යොජයන්ති යනුද ටීකායි අත්‍රොප මෙයස්‍ය මුනිධාම්නඃ සූර්‍ය්‍යාග්නිභ්‍යාං, මූපමානභ්‍යාං, මධඃප්‍රසරණ ධර්මේණාධික්‍ය වර්ණිතා ව්‍යතිරෙකඃ, තදුක්තං කාව්‍යප්‍රකාශෙ, උපමානාද්‍යන්‍යස්‍ය ව්‍යතිරෙකඃ ස එව සඃ– යනුද ටීකා ගතයි– මූක්තකබඞ්ධතයි ව්‍යතිරේකා ලඞ්කාරයි– විස්මයාකුලෙක්ෂණත්ව සංවර්ණිතායි.

ඉක්බිතිව- ඒ බැබලීම නාරදමුනියයි නිශ්චයකොට දැනගත් අයුරු දක්වයි.

3. විභුඃ, වස්තු තත්ත්වාවධාරණයෙහි සමර්ථවූ; සඃ, ඒ විෂ්ණුතෙම; පුරා, ප්‍රථමකොට; ත්විෂාම්චයඃ ඉති, තෙජඃ පුඤ්ජ මාත්‍රත්වයෙකැයි; අවධාරිතම්, (ලෝකයා විසින්) වෙසෙසින් නිශ්චයකරණ ලද්දවූ; තතඃ, ඊලඟට හෙවත් ඊට වඩා සමීපවූ කාලයෙහි; විභාවිතාකෘතිම්, විමසනලද සටහන්ඇති ඔහු; (එහෙයින්ම) ශරීරීඉති, ශරීර නොහොත් චේතනා ඇත්තෙකැයිද, තතඃ, තදනන්තරව විභක්තා

4. නවාන ධෝඃධො බෘහතඃ පයෝධරාන්
සමූඪකර්පූර පරාග පාණ්ඩුරම්
ක්ෂණං ක්ෂණෝත්ක්ෂිප්තා ගජේන්ද්‍රකෘත්තිනා
ස්ඵුටෝපමං භූති සිතෙන ශම්භුනා

---

වයවම්, වෙන්කොට හැඳිනගන්නාලද මුඛාදි අවයව ඇති; පුමාන් ඉති, (එහෙයින්ම) පුරුෂයෙකැයිද; ක්‍රමාත්, පූර්වෝක්ත සාමාන්‍ය ඥානවිශේෂඥාන පිළිවෙළින්; (අවධාරිතං, නිර්ණය කරණලද); අමුං, මොහු (නම්); නාරද ඉති, නාරද මුනියයි; අබෝධි, දැන ගත්තේය.

(**සඃ අමුං නාරද ඉත්‍යබෝධි,** යනු මෙහි-ක්‍රි-පද-සං=යි-අබෝධි, යනු- බුධ- ඥානේ ධාතු භූතා විලුඞ්- කර්තෘ- පර-ප්‍ර එ-ආ-ක්‍රි-යී- සඃ යනු තදුක්ත කර්තෘපදයි- අමුං යනු තදනුක්ත කර්මපදයි-

විභාවිතා විමෘෂ්ටා ආකෘතිඃ සංස්ථානං යස්‍යසඃ විභාවිතාකෘතිඃ- නම් විභක්තා (විවිච්‍ය) ගෘහීතා අවයවා මුඛාදයො යස්‍යාසෞ විභක්තාවයවඃ නම්- යනු සමාසයි.

'නාරදස්‍ය කර්මත්වෙපි නිපාතශබ්දනාභිහිතත්වාත්නවිතීයා තිඩා මුපසඞ්ඛ්‍යා නස්‍යාපලක්ෂණත්වාත් යථාහ, වාමනඃ, නිපාතෙනා භිහිතෙ කර්මණි නකර්මවිභක්තිඃ යනු ටීකා හෙයින් නාරදංයි විතීයා නොවන්නීය අත්‍ර විභාවිතාකෘතිම් විභක්තාවයව මිත්‍යාදිනා ආකෘති විභාවනාවයව විභාවනයොඃ පදාර්ථයොර්විශෙෂණ වෘත්‍යා ශරීරිත්වපුං ස්ත්වාවධාරණහෙතුත්වෙනොපන්‍යාසාත් පදාර්ථහෙතුකං කාව්‍ය ලිඞ්ග මලඞ්කාරඃ. 'හේතොර්වාක්‍යපදාර්ථත්වෙ කාව්‍යලිඞ්ගමුදාහෘතම්, ඉති ලක්ෂණාත් යි ටීකා හෙයින්- මෙහි කාව්‍ය ලිඞ්ගා ලඞ්කාරයි- මූකනාක බඬනයි.

ඉක්බිති ශ්ලෝක සතකින් නාරද මුනිහු වර්ණනය කෙරෙති.

4. (මේ නාරදමුනි කෙබඳුද යත්?) නවාන්, අලුත්වූ හෙවත් ඉතා නිල්වූ; (එකණෙහි රුස්වූ ජලය ඇතිවූ යී සේයි) බෘහතඃ, මහත්වූ; පයොධරාන්, මේඝයන්ට නොනොත් මෙඝයන්ගේ; අධොධඃ, සමීපවූ පහත් පෙදෙස්හි; සමූඪ, සිටියාවූ; සමූඪ, පුඤ්ජීකෘතවූ හෙවත් රුස්කරණලද; කර්පූරපරාග, කපුරු සුණුසේ; පාණ්ඩුරම්, ශුභ්‍රවර්ණවූ; ක්ෂණම්, (එහෙයින්) ඇසිල්ලක් හෙවත් මෙඝ සමීපාවස්ථානක්ෂණ යෙහි; ක්ෂණොත්ක්ෂිප්ත, තාණ්ඩවොත්සව සඞ්ඛ්‍යාත ක්ෂණයෙහි ඔස වනලද; (තාණ්ඩවොත්සවයන්හි මතුපිට දරන්නාවූ යී සේයි) ගජේන්ද්‍රකෘත්තිනා, හස්ති චර්මයක් ඇති; භූති සිතෙන, භස්මයෙන් ධවලීකෘතවූ; ශම්භුනා, ඊශ්වරයා හා; ස්ඵුටෝපමම්, ප්‍රකටෝපමා ඇත්

5. දධානමම්භොරුහකෙසරද්‍යුතී
ජටාඃ ශරච්චන්ද්‍ර මරීචිරොචිෂාම්
විපාකපිඞ්ගාස්තුහිනස්ථලීරුහො
ධරාධරෙන්ද්‍රං ව්‍රතතීතතීරිව

---

නාවූ; 'අමුං නාරද ඉති අබොධි' යනු 11 වෙනි ශ්ලෝකය දක්වා හැමතැන සම්බන්ධය කටයුතුයි. මොහු නාරදමුනියයි දූතගත්තේ ය යි සේයි.

කර්පූරස්‍ය පරාගඃ කර්පූරපරාගඃ සමූසඃ (පුෂ්පජීනානා) ශුභ්‍රාසෙව කර්පූරපරාගශ්චෙති සමූස කර්පූරපරාගඃ සමූස කර්පූරපරාග ඉවපාණ්ඩුරඃ= නම් ක්ෂණෙෂු උත්ක්ෂිප්තා ක්ෂණොත් ක්ෂිප්තා ගජානා මින්ද්‍රඃ ගජෙන්ද්‍රඃ ගජෙන්ද්‍රස්‍ය කෘත්තිඃ (චර්ම) ගජෙන්ද්‍ර කෘත්තිඃ ක්ෂණොත් ක්ෂිප්තා ගජෙන්ද්‍රකෘත්තිර්යේනාසෙව ක්ෂණොත් ක්ෂිප්තගජෙන්ද්‍රකෘත්තිඃ තෙන භූත්‍යා. සිතඃ ඉති සිතඃ තෙන= (ශම්භුනා) සදෘශ උපමා යස්‍යසඃ සදෘශොපමඃ නම් (සාපෙක්ෂත්වෙපි ගමකත්වාත් සමාසඃ) යනු කී හෙයින් සමාසයි.

මෙහි අධොධඃ යන්න ගැණ= 'උපර්‍ය්‍යධ්‍යධසඃ සාමීප්‍යෙ' ඉති ද්විර්භාවඃ යනු කී හෙයින් ද්විරුක්තයි.

(නවානන්ති කාණ්ඩෙගෙ විතීයා,) උභසර්වතසොඃ කාර්‍ය්‍යා ධිගුපර්‍ය්‍යා දිෂු ත්‍රිෂු, ඉත්‍යාදි වචනාත් යනුද ක්ෂණං යනු අත්‍යන්තසංයොග යෙහි විතීයා යයිද සදෘශපර්‍ය්‍යාය යොසත්‍රලොපමා ශබ්දයෙ.ඃ අතු ලොපමස්‍යාම් ඉති නිෂෙධාත් සාදෘශ්‍ය වාචිත්වෙ තෘතියෙත්‍යාහුඃ, කොවිදිමං ශ්ලොකං වයන්ෂාමිත්‍යතඃ ප්‍රාග්ලිඛිත්වා ව්‍යාචක්ෂතෙ= තෙෂාම්පුං ස්වභාවධාරණාත් ප්‍රාක්තෙජඃ පිණ්ඩමාත්‍රස්‍ය ශම්භුපමෙව විත්‍යං විනන්‍යම් යනුද පිකාවෙහි දක්වතලදි) උපමාලඞ්කාරයි.

5. අම්භොරුහකෙසරද්‍යුතීඃ, පියුම් රේණුමෙන් රන්වන් කාන්ති ඇති; ජටාඃ, දළමඬුලු; දධානම්, ධරන්නාවූ; ශරච්චන්ද්‍රමරීචි, සරා සඳරැස් සේ; රොචිෂම්, (ධවල) කාන්තිමත්වූ; විපාකපිඞ්ගාඃ, එහෙ සින්ම පරිනාමයෙන් හෙවත් මිහිකිරීමෙන් පිඟුවන්වූ (රන්වන්වූ); තුහිනස්ථලීරුහඃ, තුෂාරභූමින්හි හටගත්තාවූ; ව්‍රතතීතතීඃ, ලතා සමූහයන්; දධානං, ධරන්නාවූ; ධරාධරෙන්ද්‍රම්ඉව, හිමවත් පර්වතය මෙන් සිටියාවූ (මොහු නාරද මුනියයි දූතගත්තේය.)

(අම්භොරුහානාම් කෙසරාණි අම්භොරුහ කෙසරාණි තෙෂා මිව ද්‍යුතිර්‍යාසාම් තාඃ අම්භොරුහකෙසරද්‍යුතීඃ ශරදිචන්ද්‍රඃ ශර ච්චන්ද්‍රඃ ශරච්චන්ද්‍රස්‍යමරීචිඃ ශරච්චන්ද්‍රමරීචිඃ ශරච්චන්ද්‍රමරීචි රිව රොචි ර්‍යස්‍ය සඃ ශරච්චන්ද්‍ර මරීචිරොචිඃ නම්. විපාකෙන (පරිනාමේන)

6. පිශඞ්ගමෞඤ්ජීයුජ මර්ජුනච්ඡවිං
වසානමේණාජින මඤ්ජනද්‍යුති
සුවර්ණසූත්‍රාකලිතාධරාම්බරං
විඩම්බයන්තං ශිතිවාසසස්තනුම්

7. විහඞ්ග රාජාඞ්ග රුහෛරිවායතෛ
හිරණ්මයෝර්වීරුහවල්ලිතන්තුභිඃ
කෘතෝපවීතං හිමශුභ්‍රමුච්චකෛ
ඝනං ඝනාන්තේ තඩිතාං ගණෛරිව

---

පිඞ්ගාඃ විපාකපිඞ්ගාඃ තුහිනසප්ලයාම් (තුෂාරභූමෞ) රොහන්තීති තුහිනසප්ලීරුහඃ ධරාධරාණාමීන්ද්‍රඃ ධරාධරේන්ද්‍රඃ යනු සමාසයි උපමාලඞ්කාරයි) නැවතත් කෙබඳුවූ නාරද මුනිහුදයත්?

6. පිසඞ්ග, පිඟුවන්වූ හෙවත් රන්වන්වූ; මෞඤ්ජීයුජම්, මුදුතණ මය මෙවුල්දමින් යුක්තවූ; අර්ජුනච්ඡවිම්, ධවල කාන්ති ඇත්තාවූ; අඤ්ජනද්‍යුති, අඳුන්වන්වූ; එණාජිනම්, එණිමෘගචර්මයක් හෙවත් කලු මුවසමක්; වසානම්, හැඳගත්තාවූ; සුවර්ණසූත්‍රාකලිත, කනක මය පටියකින් බඳනාලද; අධරාම්බරං, යට හඳනා පිළීඇති; ශිතිවාසස සස්තනුම්, නීලාම්බරවූ රාමයාගේ ශරීරයට; විඩම්බයන්තං, විඩම්බ නය කරන්නාවූ හෙවත් අනුකාරීවූ (මොහු නාරද මුනියයි අවබොධ කොළේයි.)

(මුඤ්ජස්තෘණ විශෙෂඃ තන්මයී මෙඛලා මෞඤ්ජී පිශඞ්ගයා මෞඤ්ජ්‍යා යුජ්‍යත ඉති පිශඞ්ගමෞඤ්ජීයුක් තම්. අර්ජුනා ඡවිඃ යස්‍යසඃ අර්ජුන ච්ඡවිඃ තම් අඤ්ජනමිවද්‍යුතිර්‍යස්‍යතත් අඤ්ජනද්‍යුතිං තම් එණස්‍ය අජිනං එණාජිනම් සුවර්ණස්‍ය (තන්මයංවා) සූත්‍රං සුවර්ණසූත්‍රම් සුවර්ණ සූත්‍රෙන ආකලිතං අධරාම්බරං යස්‍යාඃ සා=තාම්-යනු සමාසයි උපමාලඞ්කාරයි.)

7. (නැවතත් කෙබඳුවූ මුනිහුද යත්?) විහඞ්ගරාජ, ගුරුළුන්ගේ අඞ්ගරුහෛඃ ඉව, රෝමයන් හා තුල්‍යවූ; ආයතෛඃ, දික්වූ; හිරණ්ම යොර්වීරුහ, සුවර්ණමය භූමියෙහි උපන්නාවූ; වල්ලිතන්තුභිඃ, ලතා වන්ගේ සූත්‍ර හා සදෘශ සුවර්ණමයවූ හුයින්; කෘතොපවීතම්, (ශොභා පිණිස) කරණලද යඥ සූත්‍ර ඇත්තාවූ; හිමශුභ්‍රං, තෙමේ පිනිමෙන් ශ්වෙතවර්ණවූ; ඝනාන්තෙ, මෙඝාවසානයෙහි හෙවත් ශරත්කාල යෙහි; තඩිතාංගණෛඃ, විද්‍යුල්ලතා සමූහයෙන් උපලක්ෂිතවූ; උච්ච කෛඃ, උස්වූ; ඝනම් ඉව, මෙඝයක් මෙන් (සිටියාවූ); (මොහුනාරද මුනියයි දූතගත්තෝ යයි සේයි) උපමාලඞ්කාරයි.

8. නිසර්ගචිත්‍රෝ, ජ්ජ්වලසූක්ෂ්මපක්ෂ්මණා
ලසද්බිසච්ඡේද සිතාඞ්ග සඞ්ගිනා
චකාසතං චාරු චමූරු චර්මණා
කුථේන නාගේන්ද්‍ර මිවේන්ද්‍ර වාහනම්.

---

විභඞ්ගානාම් රාජි විභඞ්ගරාජඃ තස්‍යාඞ්ගම් විභඞ්ග රාජ්‍යඞ්ගම්-තස්මින් රෝහන්තීති විභඞ්ග රාජඞ්ගරුහඃ (තෛඃ) හිරණ්‍යස්‍ය විකාරෝ හිරණ්මයී හිරණ්මයීව සා උර්වෙති හිරණ්මයෝර්වී තස්‍යාම් රෝහන්ති (රූඪාශ්චෙති) හිරණ්මයෝර්වීරුහාඃ වල්ලීනාම් තන්තවඃ වල්ලිතන්තවඃ හිරණ්මයෝර්වීරුහාශ්චතෙ වල්ලිතන්තවශ්චෙති හිරණ්මයෝර්වීරුහවල්ලිතන්තවඃ (තෛඃ) ක්‍ෂතම් උපවීතම් යේන (යස්‍යවා) සඃ ක්‍ෂතෝපවීතඃ තම්-හිමමිවශුභ්‍රඃ හිමශුභ්‍රඃ තම් ඝනාස්‍ය අන්තඃ ඝනාන්තඃ තස්මින් යනු මෙහි සමාසයි.

8. (නැවතත් කෙබඳුවූ මුනිහුද යත්?) නිසර්ග, ස්වභාවයෙන්ම; චිත්‍රෝජ්ජ්වල, විසිතුරුව (උසස්ව) දිලිසෙන්නාවූ; සූක්ෂ්ම පක්ෂ්මනා, සියුම් ලෝමයෙන්; ලසත්, බබලන්නාවූ; බිසච්ඡේද, මෘනාලඛණ්ඩයක් මෙන්; සිතාඞ්ග, ශ්වෙතවර්ණවූ ශරීරයෙහි; සඞ්ගිනා, ආශක්තවූ හෙවත් වලඳීතවූ; චාරු, මනොඥවූ; චමූරුචර්මණා, මෘගචර්මයක්වූ; කුථේන, පෘෂ්ඨාස්තරණයෙන් යුක්තවූ හෙවත් මුව සමකින් පිටෙහි ඇතිරීමෙන් යුක්තවූ; ඉන්ද්‍රවාහනම්, ශක්‍රයාගේ වාහනයවූ; නාගෙන්ද්‍රම්ඉව, ඓරාවතනම් හස්තිරාජයා මෙන්; චකාසතම්, බබලන්නාවූ (මොහු නාරද මුනියයි දැනගත්තේයයි සේයි)

චිත්‍රානි ච තානි උජ්ජ්වලානි චෙති චිත්‍රෝජ්ජ්වලානි සූක්ෂ්මානි ච තානි පක්ෂ්මානි චෙති සූක්ෂ්මපක්ෂ්මානි නිසර්ගාත් චිත්‍රෝජ්ජ්වලානි නිසර්ග චිත්‍රෝජ්ජ්වලානි නිසර්ග චිත්‍රෝජ්ජ්වලානි සූක්ෂ්ම පක්ෂ්මානි යස්‍යාසෞ නිසර්ග චිත්‍රෝජ්ජ්වල සූක්ෂ්මපක්ෂ්මා (තෙන) බිසස්‍ය බිසානාම්වා ඡෙදඃ බිසච්ඡේදඃ ලසංශ්චාසෞ බිසච්ඡේද ශ්චෙතිලසත් බිසච්ඡේදඃ සිතංශ්ච තත් අඞ්ගඤ්චෙති සිතාඞ්ගම් බිසච්ඡේදවත් සිතාඞ්ගම් බිසච්ඡේද සිතාඞ්ගම් සඞ්ගඃඅස්‍යාස්තීති සඞ්ගී බිසච්ඡේද සිතාඞ්ග සඞ්ගී බිසච්ඡේද සිතාඞ්ග සඞ්ගී (තෙන) චමූරොඃ (මෘගස්‍ය) චර්ම චමූරුචර්ම චාරුචතත් චමූරුචර්මචෙති චාරුචමූරුචර්ම (තෙන) නාගානාමින්ද්‍රඃ නාගෙන්ද්‍රඃ (තම්) ඉන්ද්‍රස්‍ය වාහනම් ඉන්ද්‍ර වාහනම් (තම්) යනු මෙහි සමාස ක්‍රමයි. මේ පද්‍යය උපමාලඞ්කාරයි.

9. අජස්‍ර මාස්ඵාලිත වල්ලකීගුණ
ක්‍ෂතොජ්වලාඞ්ගුෂ්ඨ නඛාංශුභින්නයා
පුරඃ ප්‍රවාලෛරිව පූරිතාර්ධයා
විභාන්ත මච්ඡස්ඵටිකාක්‍ෂමාලයා.

---

9. (තැවපත් කොබඳුවූ නාරද මුනිහුදයත්?) අජස්‍රම්, ප්‍රචුරත්‍ව යෙන් නොහොත් නිරන්තරයෙන්; ආස්ඵාලිත, තළතලද (යහපත් බව විමසනු පිණිස වක්කොට පහතට නමතලද ඇඟිලිලෙන් වීණා තන්ත්‍රි ස්ඵාටනය සඞ්ගීතශාස්ත්‍ර ප්‍රසිද්ධයි); වල්ලකීගුණක්‍ෂත, වීණා තන්ත්‍රින් සම්බන්ධ සංඝර්ෂණයෙන් (වෙණ තත් ගැටීමෙන් හෝ තැලී මෙනැයි සේයි; උජ්වල, උසස්ව බබලන්නාවූ; අඞ්ගුෂ්ඨනඛාංශු, මාප ටැඟිලි නියසැලුමෙන්; භින්නයා, මිශ්‍රවූ හෙවත් එයින් රක්තවර්ණවූ; පුරඃ, පුරොභාගයෙහි (ඉදිරියෙහි); ප්‍රවාලෛඃ, පබලුවලින්; පූරිතාර්ධයා, පුරණලද අඩක් ඇත්තාක් වැනිවූ හෙවත් පුරණලද අඩක් බඳුව සිටියාවූ; අච්ඡ, නිර්මලවූ; ස්ඵටිකාක්‍ෂමාලයා, ස්ඵටිකමයාක්‍ෂ මාලාවකින් හෙවත් පලිඟුවෙන් කරණලද ජපමාලාවකින්; විභාන්තම්, වෙසෙසින් බබලන්නාවූ (මොහු නාරද මුනි යයි අවබොධ කෙළේයි.)

(වල්ලක්‍යාඃ ගුණාඃ වල්ලකී ගුණාඃ ආස්ඵාලිතාශ්චතෙ වල්ලකී ගුණාශ්චෙති ආස්ඵාලිතවල්ලකීගුණාඃ ආස්ඵාලිතවල්ලකීගුණානාම් ක්‍ෂතඃ ආස්ඵාලිත වල්ලකී ගුණක්‍ෂතඃ තෙන උජ්වලඃ= අඞ්ගුෂ්ඨා ණාම් (අඞ්ගුෂ්ඨෞභුවා) නඛාඃ අඞ්ගුෂ්ඨනඛාඃ අඞ්ගුෂ්ඨ නඛානා මංශවඃ= අඞ්ගුෂ්ඨ නඛාංශුභිර්භින්නා- (තයා) අර්ධම් පූරිතෙති පූරි තාර්ධා (තයා) ස්ඵටිකානාමක්‍ෂමාලා ස්ඵටිකාක්‍ෂමාලා අච්ඡාචසා ස්ඵටිකාක්‍ෂමාලාචෙති= (තයා) යනු මෙහි සමාස ක්‍රමයි.

ප්‍රසිද්ධ ස්ඵටික ග්‍රහණා දෘෂෙමෝක්‍ෂාර්ථිත්වං ව්‍යජ්‍යතෙ 'ස්ඵටිකො මොක්‍ෂදඃ පරම්'ඉති මොක්‍ෂාර්ථිනාම් ස්ඵටිකාක්‍ෂ මාලාභිධානාත් යනු ටීකා හෙයින් මේ නාරද මුනිහුගෙ (පලිඟුමුවා) ජපමාලා ධාර ණය මොක්‍ෂාර්ථි භාවය හඟවයි සේයි අත්‍රනඛාංශු භින්නයෙති ස්වගු ණත්‍යාගෙනාන්‍යගුණස්වීකාරලක්‍ෂණඃ තද්ගුණාලඞ්කාරඃ උක්තඃ, තත්ගුණඃ ස්වගුණත්‍යාත්, ඉති යනුද ටීකා හෙයින් යමක්හුගේ ස්වකීය ගුණ පරිත්‍යාගයෙන් අන්‍ය ගුණ ප්‍රකාශ ලක්‍ෂණය වීනම් තත්ගුණාලඞ්කෘති යයි කියනලදි- නාරද මුනි වර්ණිතාමැයි.

10. රණද්භිරාඝට්ටනයා නභස්වතඃ
පෘථග්විභින්න ශෘතිමණ්ඩලෛඃ ස්වරෛඃ
ස්ඵුටීභවද්ග්‍රාම විශෙෂ මූර්ජනා
මවෙක්‍ෂ මාණං මහතීං මුහුර්මුහුඃ.

---

10. (නැවතත් කෙබඳු නාරද සෘෂිහුද යත් ?) නභස්වතඃ, වාත යාගේ; ආඝට්ටනයා, ආඝාතයෙන් හෙවත් හාත්පසින් හැපීමෙන්; පෘථක්, වෙන් වසයෙන් (අසඞ්කීර්ණව); රණද්භිඃ, නාදකරන්නාවූ; (ශෘතියට අනතුරුව ප්‍රවෘත්තවූ ස්නිග්ධානු නාදයෙන් යුක්තවූ යනු භාවයි) විභින්න, විශෙෂයෙන් භින්නවූ හෙවත් ව්‍යවස්ථිතවූ; ශෘති මණ්ඩලෛඃ, ශෘති සමූහ ඇති හෙවත් ස්වරාරම්භක අවයව සමූහ ඇති; ස්වරෛඃ, ස්වරයන්ගෙන් හෙවත් නාදවලින්; ස්ඵුටීභවත්, ප්‍රකටවන්නාවූ හෙවත් පැතිරෙන්නාවූ ග්‍රාම විශෙෂ; මූර්ජනාම්, ෂඞ්ජාදිස්වර සමූහ භෙද අතුරෙන් ස්වරයන්ගේ උස් පහත් ක්‍රම විශෙෂ ඇති හෙවත් ස්වර සමූහ විශෙෂයන්ගේ ආරොහාවරොහ ක්‍රම භෙද ඇති; මහතීම්, එනම් ස්වකීය වීණාව; මුහුර්මුහුඃ, ක්‍ෂණ ක්‍ෂණයෙහි; අවෙක්‍ෂමාණං, බලන්නාවූ (මොහු නාරද මුනියයි දැනගත්තේයි)

ශෘතීණාම් මණ්ඩලානි සෘතිමණ්ඩලානි විභින්නානි ශෘතිමණ්ඩලානි යෙෂාංතෙ විභින්න ශෘතිමණ්ඩලාඃ (තෛඃ) ග්‍රාමානාම් විශෙෂාඃ= ග්‍රාමවිශෙෂාණාම් මූර්ජනාඃ ග්‍රාමවිශෙෂ මූර්ජනාඃ ස්ඵුටීභවන්ත්‍යඃ ග්‍රාමවිශෙෂ මූර්ජනාඃ යස්‍යාම් සා–ස්ඵුටී=මූර්ජනා (තාම්) යනු මෙහි සමාස ක්‍රමයයි **ස්වභාවොක්ති අලඞ්කාරයි.**

මෙහි ශෘති සඞ්ඛ්‍යා නියමයද මෙසේ දක්වනලදි. කිසේය යත්?

චතුශ්චතුශ්චතුශ්චෛව ෂඞ්ජමධ්‍යම පඤ්චමාඃ
වෙ වෙනිෂාද ගාන්ධාරෞ ත්‍රිස්ත්‍රිස්සෘෂභධෛවතෞ
(වීණා සප්තස්වරනම්)

ශෘතිභ්‍යඃ ස්‍යුඃ ස්වරාඃ ෂඞ්ජර්ෂභගාන්ධාරමධ්‍යමාඃ
පඤ්චමො ධෛවතශ්චාථ නිෂාද ඉති සප්තතෙ
තෙෂාම් සඥඃ සරිගමපධනීත්‍යපරාමතාඃ (යනුයි)

**වීණා සප්තස්වර සම්බන්ධ ග්‍රාමසඞ්ඛ්‍යාත ලක්‍ෂණය නම්.**

යථා කුටුම්බිනඃ සර්වෙ– ප්‍යෙකීභූතා භවන්තිහි
තථාස්වරාණාම් සන්දොහො ග්‍රාමඉත්‍ය භිධීයතෙ
ෂඞ්ජග්‍රාමො භවෙදාදෞ මධ්‍යම ග්‍රාම එවච
ගාන්ධාරග්‍රාම ඉත්‍යෙතද් ග්‍රාමත්‍රය මුදාහෘතම් (ඉති)
(තථා)

11. නිවර්ත්‍ය සො නුව්‍රජතඃ කෘතානතී
නතීන්ද්‍රියඥාන නිධිර්නභඃසදඃ
සමාසදත්සාදිත දෛත්‍යසම්පදඃ
පදං මහෙන්ද්‍රාලය චාරුචක්‍රිණඃ.

---

නන්ද්‍යාවර්තෝථ ජීමූතඃ සුභද්‍රො ග්‍රාමකාස්ත්‍රයඃ
ෂඩ්ජමධ්‍යම ගාන්ධාරා ස්ත්‍රයාණාම් ජන්මහෙතවඃ (ඉති)
(මූර්ඡනා ලක්ෂණය නම්)

ක්‍රමාත් ස්වරාණාම් සප්තානා 'මාරොහශ්චා වරොහණම්
සාමූර්ඡේත්‍යුච්‍යතෙ ග්‍රාමස්ථා එතාඃ සප්ත සප්තච

යනාදීන් නිදර්ශිත විස්තර විභාගය ටීකාව බලා දත යුතුයි.

11. අතීන්ද්‍රියඥානනිධිඃ, ඉන්ද්‍රිය විෂයනොවූ අර්ථපරිඥානයෙහි නිධානයක් වැනිවූ හෙවත් සර්වාර්ථදර්ශීවූ; සඃ, ඒ නාරදනම් සෘෂීතෙම; කෘතානතීන්, කරණලද නමස්කාර ඇති; අනුව්‍රජතඃ, තමා අනුව යන්නාවූ; නභඃසදඃ, දෙවියන්; නිවර්ත්‍ය, නවතා; සාදිත, විධ්වංසනය කරණලද; දෛත්‍යසම්පදඃ, අසුරයන් සම්බන්ධ සම්පත්ඇති; චක්‍රිණඃ, ශ්‍රී කෘෂ්ණයාගේ; මහෙන්ද්‍රාලයචාරු, ශක්‍රභවනය මෙන් මනහරවූ; පදං, ස්ථානයට; සමාසදත්, පැමිණියේය.

**සඃ** (**නාරදමුනිඃ**) **චක්‍රිණඃ පදම් සමාසදත්** යනු මෙහි ක්‍රි–සං–යි සමාසදත්– සම් ආඞ් පූර්ව සද්ඍ ගතෞ යන සකර්මකධාතු භූතාර්ථලුඞ්–පර= ප්‍ර– ඒක– ආ– ක්‍රියාපදයානට සඃ යනු උක්තකර්තෘයි පදං යනු අනුක්තකර්මයි චක්‍රිණඃ යනු අනුක්ත සම්බන්ධයි.

කෘතා ආනතිර්යෛඃ, යෙන කෘතානතයඃ (තාන්) ඉන්ද්‍රියම'තික්‍රාන්තාඃ ඉති අතීන්ද්‍රියාඃ අතීන්ද්‍රියාණාම් ඥානම් අතීන්ද්‍රියඥානම් අතීන්ද්‍රිය ඥානස්‍ය නිධිඃ අතීන්ද්‍රියඥානනිධිඃ නභසි සීදන්ති ගච්ඡන්තී'ති නභඃ සදඃ දෛත්‍යානාම් සම්පදඃ දෛත්‍යසම්පදඃ සාදිතාඃ (විධ්වස්තීකෘතාඃ) දෛත්‍යසම්පදඃ යෙනාසෞ සාදිතදෛත්‍යසම්පද් (තස්‍ය) මහාංශ්චා සා'වින්ද්‍රශ්චෙති මහෙන්ද්‍රඃ මහෙන්ද්‍රස්‍ය ආලයඃ මහෙන්ද්‍රාලයඃ මහෙන්ද්‍රාලය වත්චාරු මහෙන්ද්‍රාලයචාරු (නම්) අත්‍ර නතීනතීපදඃ පදමිති ච වයො'ර්ව්‍යඤ්ජනයුග්මයො, රකාරද්වයාන්‍යා ඡේකානුප්‍රාසඃ අන්‍යත්‍ර වෘත්‍යනුප්‍රාස ඉත්‍යනයොඃ සංසෘෂ්ටිඃ– යනු ටීකාගතයි.– **සංසෘෂ්ටි අලංකාරයි.**

12. පතත්පතඞ්ගප්‍රතිම'ස්තපෝනිධිඃ
පුරෝ'ස්‍ය යාවන්න භුවි ව්‍යලීයත
ගිරේ'ස්තඩිත්වානි'ව තාව දු'ච්චකෛ
ර්ජවේන පීඨාදු'දතිෂ්ඨ,දච්‍යුතඃ

13. අථප්‍රයත්නෝ'න්නමිතා නමත්ඵණෛ
ර්ධෘතේ කථඤ්චිත්ඵණිනාං ගණෛර'ධඃ
න්‍යධායිෂාතාම'භිදේවකීසුතං
සුතේන ධාතුශ්චරණෞ භුවස්තලේ

---

12. **තපෝනිධිඃ අස්‍ය පුරෝභුවි යාවත් නව්‍යලීයත** යනුද- **අච්‍යුතඃ තාවත් පීඨාත් උදතිෂ්ඨත්** යනුද මෙහි ක්‍රි-සම්-සි. නව්‍යලීයත- යන- 'නඤ් විපූර්වලීඞ්ගතෞ ධාතු- ලඞ්විභක්ති- කර්තෘකාරක- ආත්ම= ප්‍ර-ඒ- ක්‍රියාපදයාහට තපෝනිධිඃ යනු උක්තකර්තෘයි අස්‍ය යනු අනුක්තසම්බන්ධයි පුරෝභුවි යනු අනුක්තාධාරයි යාවත් යනු- අනුක්තාපාදානඅව්‍යයි.

උදතිෂ්ඨත් යන- උත්පූර්ව ෂ්ඨාගතිනිවෘත්තෞ ධාතු භූතාපිලඞ් කර්තෘ= පර= ප්‍ර-ඒ- ක්‍රියාපදයාහට අච්‍යුතඃ යනු උක්තකර්තෘයි පීඨාත් යනු අනුක්තාපාදානයි තාවත් යනු අනුක්තාපාදානඅව්‍යයි.

පතත්, බස්නාවූ; පතඞ්ගප්‍රතිමඃ, සූර්යයාවැනිවූ; තපෝනිධිඃ' තපස්වීතෙම; අස්‍ය, ඒ ශ්‍රීකෘෂ්ණයාගේ; පුරෝභුවි, ඉදිරියෙහිවූ භූමි ප්‍රදේශයෙහි; යාවත්, යම්තාක්; නව්‍යලීයත, නොපිහිටියේද; තාවත්, එතාක්; අච්‍යුතඃ, ශ්‍රීකෘෂ්ණතෙම; ගිරේඃ, පර්වතයෙන්; තඩිත්වාන්ඉව, මේඝයක්මෙන්; උච්චකෛඃ, උස්වූ; පීඨාත්, ආසනයෙන්; උදතිෂ්ඨත් නැඟීසිටියේය. (මුනිචරණස්‍ය භූස්පර්ශාත්ප්‍රාගේව සමුත්ථිතවාන් යනු කී හෙයින් නාරදමුනිහුගෙ චරණය සම්බන්ධ භූමි ස්පර්ශයෙන් පළමුකොට නැඟීසිටියේය යනු භාවයි)

(පතච්චා'සෞ පතඞ්ගශ්චේති පතත්පතඞ්ගඃ පතත්පතඞ්ග (පතඞ්ගස්‍යවා) ප්‍රතිමා උපමානං යස්‍යසඃ පතත්පතඞ්ගප්‍රතිමඃ තපඃ නිධි'ර්‍යස්‍ය සඃ තපෝනිධිඃ යනු සමාසයි.)

පතත්පතඞ්ගඉත්‍යත්‍ර පතඞ්ගස්‍ය පතනා'සංභවා'දියම්භූතෝප මේත්‍යාචාර්‍යෛර්දණ්ඩිප්‍රභෘතයෝ බහවඃ අතඑවාප්‍රසිද්ධස්‍යා'පමාන ත්වායෝගා'දු'ත්ප්‍රේක්ෂත්‍යා'ද්භූතිකාලඞ්කාරිකාඃ සමේ වර්ණයන්ති යනු ටීකා හෙයින්- **උත්ප්‍රේක්ෂා** නොහොත් **අභූතෝපමාලඞ්කාරයි**

13. **අථ ධාතුඃ සුතේන භුවස්තලේ චරණෞ න්‍යධායිෂාතාම්** යනු ක්‍රි-සි. න්‍යධායිෂාතාම් යන- නිපූර්ව- ධාඤ්ධාරණපෝෂණයෝඃ

14. තමර්ඝ්‍යම'ර්ඝ්‍යාදිකයා'දිපූරුෂඃ
සපර්ය්‍යයා සාධු සපර්ය්‍ය'පූපුජත්
ගෘහානුපෙතුං ප්‍රණයාද'භිප්සවො
භවන්ති නාපුණ්‍යකෘතාම් මණීෂිණඃ

---

ධාතු භූතාර්ථලුඞ්- කර්ම- ආත්ම- ප්‍රථම- පුරුෂ ඒකවචනාන්තආඛ්‍යාත ක්‍රියාපදයාහට චරණෞ යනු උක්තකර්මයි- සුතෙන යනු අනුක්ත කර්තෘයි. (ධාතුඃ යනු අනුක්තසම්බන්ධයි අථ යනු අනන්තරාර්ථඅව්‍යයි)

අථ, ඉක්බිතිව හෙවත් ශ්‍රීකෘෂ්ණගෙ නැගීසිටීමට අනතුරුව; ධාතුඃ, මහබඹුගෙ; සුතෙන, පුත්‍රවූ නාරදමුනිහු විසින්; ප්‍රයතාන, උත්සාහයෙන්; උන්නාමිත, උඩට නමතලද නුමුත්; ආනමත්, (මුනිහුගේ පාතබනබරින්) පහතට නැමෙන්නාවූ; ඵණෛඃ, පෙණමඬුලුඇති; ඵණීනාම්, නාගයන්ගේ; ගණෛඃ, සමූහයන් විසින්; අධඃ, යට පෙදෙස්හි; කථඤ්චිත්, කෙසේ නුමුත්; (දුකසේ) ධෘතෙ, දරණලද් දවූ; (ස්ථාපිතවූ යී සේයි) භුවස්තලෙ, භූතලයෙහි; අභිදෙවකීසුතම්, දෙවකීපුත්‍රයා හෙවත් ශ්‍රීකෘෂ්ණයා අභිමුඛකොට; චරණෞ, පාදෙක න්‍යධාසිෂාතාම්, තබතලද්දේය (පිහිටුවනලද්දහ යී සේයි)

(ප්‍රයත්නෙන උන්නාමිතාඃ ප්‍රයත්නොන්නාමිතාඃ ප්‍රයත්නොන්නාමිතාඃ ආනමන්ත්‍යාඃ ඵණාඃ යෙෂාම් තෙ=(තෛඃ) දෙවක්‍යාඃ සුතඃ දෙවකීසුතඃ දෙවකීසුතම් අභි (ලක්ෂීකෘත්‍යෙති) අභිදෙවකීසුතම් ('ලක්ෂණෙනා'භිප්‍රතීආභිමුඛ්‍යෙ ඉත්‍යව්‍යයීභාවඃ') යනු කී හෙයින් සමාසයි.

(අත්‍ර ඵණානාම් නමනොන්නමන සම්බන්ධෙ'පි මුනිගෞරවාය තත් සම්බන්ධාභිධානාද'තිශයොක්තිභෙදඃ යනු ටීකාහෙයින් **අතිශයොක්ති අලඞ්කාරයි**- මූකන්කබන්ධනයි)

14. සඃ (ශ්‍රීකෘෂ්ණඃ) **තම් (නාරදම්) සපර්ය්‍යයා සාධු පරිඅපූපුජත් යනුද මණීෂිණඃ අභිප්සවඃ නභවන්ති** යනුද මෙහි ක්‍රි-සි= පරිඅපූපුජත් යන- පරිපූර්ව පූජපූජනෙධාතු භූතාර්ථලුඞ් කර්තෘ-පර- ප්‍ර-ඒ-ආ-ක්‍රියාපදයාහට- සඃ යනු උක්තකර්තෘයි තම් යනු අනුක්ත කර්මයි සපර්ය්‍යයා යනු අනුක්තකරණයි සාධු යනු ක්‍රියා විශෙෂණයි නභවන්ති යන භූසත්තායාම්ධාතු අකර්මක- කර්තෘ- වර්තමානලට්- ප්‍ර-බ-ආ-ක්‍රියාපදයාහට- මණීෂිණඃ යනු උක්තප්‍රකෘති කර්තෘයි අභිප්සවඃ යනු උක්තවිකෘති කර්තෘයි.

සඃ ආදිපුරුෂඃ, ඒ පුරාණ පුරුෂතෙම හෙවත් ශ්‍රීකෘෂ්ණතෙම; **අර්ඝ්‍යම්, පිදියයුතුවූ; තම්, ඒ නාරදමුනිහු; අර්ඝ්‍යාදිකයා, පූජා පිණිස ගතයුතු ද්‍රව්‍ය ආදිකොට ඇති; සපර්ය්‍යයා, පූජයෙන්; සාධු, මොනව**

15. නයාවදෙතාවු'දපශ්‍යදු'ත්ථිතෞ
ජනස්තුෂාරාඤ්ජනපර්වතාවිව
ස්වහස්තදත්තෙ මුනිමාසනෙ මුනි
ශ්චිරංතනස්තාව'දභින්‍යවීවිශත්.

---

වට; පරිඅපූපුජත්, පිදුවේය; මණීෂිණඃ, පණ්ඩිතයෝ; (සජ්ජනයෝ) අපුණ්‍යකෘතාම්, පින්නොකළවුන්ගෙ; ගෘහාන්, හෘහයන්තරා; ප්‍රණයාත්, සෙනහයෙන්; උපෙතුං, එලඹෙන්ට; අභීප්සවඃ නහවනති, මොනවට කැමැත්තෝ නොවෙති; (පින්කළවුන්ගේ ගෙවලටම යනු කැමැත්තෝ වෙති. එහෙයින් පූජ්‍යවූ සත්පුරුෂයෝ දුකසේ ලැබිය යුත්තාහ යී සේයි)

(ආදිශබ්දාසෞ පුරුෂශ්චෙති ආදිපූරුෂඃ, 'අන්‍යෙෂාම්පිදෘශ්‍යතෙ, ඉති වා දීර්ඝඃ පූජාමර්හතීත්‍ය'ර්ඝ්‍යඃ (තම්) අර්ඝාර්හං ද්‍රව්‍යම'ර්ඝ්‍යම් අර්ඝ්‍යමාදි ර්යස්‍යාඃ සා'ර්ඝාදිනා (තයා) පුණ්‍යම් අකෘතවන්තඃ ඉති අපුණ්‍යකෘතාඃ (තෙෂාම්) මනසඃ ඊෂිණඃ මනීෂිණඃ යනු විග්‍රහයි **ස්වභාවොක්ති** නොහොත් **උදාර ලඞ්කාරයි**- මුක්තකබන්ධනයි)

15. **ජනඃ යාවදෙතෞ නොදපශ්‍යත්** යනුද **මුනිඃ තාවත් මුනිමා'සනෙ අභින්‍යවීවිශත්** යනුද මෙහි- ක්‍රි-යි. නොදපශ්‍යත් යන තැද් පූර්වදෘශිර්- ප්‍රෙක්ෂණෙ ධාතු සක- කර්තෘ- භූතාර්ථලුඞ්- පර ප්‍ර- එ- ආ- ක්‍රියාපදයාහට ජනඃ යනු උක්තකර්තෘයි. එතෞ යනු අනුක්තකර්මයි යාවත් යනු, අනුක්තාපාදානාව්‍යයි- අභින්‍යවීවිශත් යන- අභි- නි- පූර්ව විශ්ප්‍රවෙශනෙ ධාතු භූතාර්ථලුඞ් කර්තෘ- පර- ප්‍ර- එ- ආඛ්‍යාත ප්‍රයොජ්‍ය ක්‍රියාපදයාහට- මුනිඃ යනු උක්තකර්තෘයි මුනිම් යනු අනුක්තකර්මයි ආසනෙ යනු අනුක්තාධාරයි තාවත් යනු අනුක්තාපාදානාව්‍යයි.

ජනඃ, ජනතෙම; උත්ථිතෞ, නැගීසිටියාවූ; එතෞ, ඒ නාරද මුනි ශ්‍රී කෘෂ්ණ යන දෙදෙන; තුෂාරාඤ්ජනපර්වතෞ ඉව, හිමාලය පර්වතය අඤ්ජනපර්වතය යන දෙකමෙන්; යාවත්, යම්තාක්; නොද පශ්‍යත්, දර්ශනය නොකෙළේද; තාවත්, ඒතාක් (එකණෙහි) චිරන්ත නඃ මුනිඃ, පුරාණ මුනි සඞ්ඛ්‍යාත ශ්‍රී කෘෂ්ණතෙම; ස්වහස්තදත්තෙ, ස්වකීය හස්ත යුගමයෙන් දෙනලද; ආසනෙ, අස්නෙහි; මුනිම්, නාරද ඍෂිහු; අභින්‍යවීවිශත්, (තමහට අභිමුඛකොට) නිෂිදනය කැරවීය.

(තුෂාරශ්ච අඤ්ජනශ්ච තුෂාරාඤ්ජනෞ ච තෞ පර්වතෞ චෙති තුෂාරාඤ්ජනපර්වතෞ ස්වස්‍ය(ආත්මනඃ)හස්තඃ ස්වහස්තඃ ස්වහස්තෙන

16. මහාමහානීලශිලාරුචඃ පුරෝ
නිෂෙදිවාන් කංසකෘෂඃ ස විෂ්ටරෙ
ශ්‍රිතෝදයාද්‍රේ'රභිසායමු'ච්චකෛ
රචූචුරච්චන්ද්‍රමසෝ'භිරාමතාම්

17. විධායතස්‍යා'පචිතිං ප්‍රසේදුෂඃ
ප්‍රකාමම'ප්‍රීයත යජ්වනාං ප්‍රියඃ
ග්‍රහීතුමාර්‍ය්‍යාන් පරිචර්‍ය්‍යයා මුහු
ර්මහානුභාවං හි නිතාන්තම'ර්ථිනඃ.

---

දධානං ස්වහස්තදත්තාම් (හසමින්) චිරම්භවශ්චිරන්තනඃ (කෘෂ්ණඃ) පුරා කිල භගවාන්බදරිකාරණ්‍යෙ නාරායණාවතාරෙණ තපසි ස්ථිත වාන් ඉති පුරාණාත්– යනු ටීකායි– **වස්තූපමා ලඞ්කාරයි** නාරද මුනි ශ්‍රීකෘෂ්ණ වර්ණිතායි මුක්තකබන්ධනයි.

16. සඃ (**නාරදමුනිඃ**) **චන්ද්‍රමසෝභිරාමතාම'චූචුරත්**– යනු මෙහි ක්‍රි–යි, අචූචුරත්' යන– චුරස්තෙයෙ ධාතු සක– කර්තෘ– භූතාර්ථ ලුඞ්– පර– ප්‍ර–එ–ආ–ක්‍රියා පදයාහට සඃ යනු උක්තකර්තෘයි අභිරාම තාම් යනු අනුක්තකර්මයි චන්ද්‍රමසඃ; යනු අනුක්තසම්බන්ධයි.

මහාමහානීලශිලාරුචඃ, (සිංහල විපයෙහි හටගත්) මහත්වූ ඉඳු නිල්මිණි කැලුම්වැනි කැලුම්ඇති; කංසකෘෂඃ, ශ්‍රී කෘෂ්ණයාගේ; පුරඃ, ඉදිරියෙහි; උච්චකෛඃ, උස්වූ; විෂ්ටරෙ, ආසනයෙහි; නිෂෙදිවාන්, නිෂීදනයකරන්නාවූ; සඃ, ඒ නාරද ඍෂිතෙම; අභිසායම්, සවස හෙවත් සායාහ්ණකාලාභිමුඛවූ; ශ්‍රිත, ඇසුරුකරණලද; උදයාද්‍රෙඃ, උදයපර්වතයඇති; චන්ද්‍රමසඃ, චන්ද්‍රයාගේ; අභිරාමතාම්, මනොඥභාවය; අචූචුරත්, පැහැරගත්තේය හෙවත් ශොභාවට පැමිණියේය.

(මහත්‍යා මහානීලශිලායාඃ රුගිවරුග් යස්‍ය සඃ මහාමහානීලශිලාරුග් (තස්‍ය) උදයශ්චා'සාවද්‍රිශ්චෙති උදයාද්‍රිඃ ශ්‍රිතඃ උදයාද්‍රිඃ යෙනාසෞ ශ්‍රිතොදයාද්‍රිඃ (තස්‍ය) අභිරාමස්‍ය භාවො' භිරාමතා (තාම්) යනු විග්‍රහවාක්‍යයි. නාරදමුනි ශ්‍රීකෘෂ්ණ දෙදෙනාගේ වර්ණිතායි) **උපමා ලඞ්කාරයි.**

17. **යජ්වනාම් ප්‍රියඃ ප්‍රකාම ම'ප්‍රීයත** යනුද **මහානුභාවාඃ ආර්‍ය්‍යාන් ග්‍රහීතුම් නිතාන්තමර්ථිනඃ භවන්ති** යනුද මෙහි ක්‍රි–යි, අප්‍රීයත– යන– ප්‍රීඤ්– ප්‍රීණනෙ– ධාතු– භූතාර්ථලුඞ්– කර්තෘ– ආත්ම– ප්‍ර– එ– ක්‍රියා පදයාහට– ප්‍රියඃ යනු උක්තකර්තෘයි යජ්වනාම් යනු අනුක්තසම්බන්ධයි.

18. අශෙෂතීර්ථො'පහෘතාඃ කමණ්ඩලො
ර්නිධාය පාණාවෘෂිණා 'භ්‍යුදීරිතාඃ
අඝෞඝවිධ්වංසවිධෞ පටීයසී
ර්නතෙන මූර්ධ්නා හරිරග්‍රහී'දපඃ.

---

ප්‍රකාමම්- යනු ක්‍රියාවිශෙෂණයි භවන්ති, යනු භූසත්තායාම් ධාතු-වතී-පර- ප්‍ර- එ- ආ- ක්‍රියාපදයාහට මහානුභාවාඃ යනු උක්ත ප්‍රකෘති කර්තෘයි අර්පිතඃ යනු උක්තවිකෘති කර්තෘයි ග්‍රහීතුම් යන පූර්ව ක්‍රියාපදයාහට මහානුභාවාඃ යනුම උක්තකර්තෘයි ආයජ්වාන් යනු අනුක්තකර්මයි, නිතාන්තම් යනු ක්‍රියාවිශෙෂණයි.

යජ්වනාම්, වේදෝක්තවිධියෙන් යාගකරන්නවුන්ට; ප්‍රියඃ, ප්‍රියවූ ශ්‍රීකෘෂ්ණතෙම හෙවත් යාගකාරුවන්ගේ වල්ලභවූ විෂ්ණුතෙම; ප්‍රසෙදුෂඃ, ප්‍රසන්නවූ; තස්‍ය, ඒ නාරදඍෂියාහට; අපචිතිං, පූජාව; විධාය, (විශෙෂයෙන්) කොට (කායාදි වාරත්‍රයෙන් තත්පරව කොට යි සේයි) ප්‍රකාමම්, කැමතිසේ හෙවත් අතිශයින්; අප්‍රියත, සතුටුවූයේය (මුනිපූදයෙන් ප්‍රීතියට හෙතුබැව්හි අර්ථාන්තරයක් පිහිටුවයි); හි ඒ එසේමැයි; මහානුභාවාඃ, මහත්වූ ආනුභාව ඇත්තෝ හෙවත් මහාත්මයෝ; ආයජ්වාන්, පිදියයුත්තන්; පරිචර්‍යයා, මෙහෙකිරීමෙන් හෙවත් පූජයෙන්; මුහුඃ, එකෙණෙහි (නිතර); ග්‍රහීතුම්, වසහකර ගන්ට; නිතාන්තම්, එකාන්තයෙන් (අතිශයින්); අර්පිනඃ, අභිලාෂ ඇත්තෝවෙති. (අර්ථො'භිලාෂමෙෂාම'ස්තීත්‍ය'ර්පිතඃ මහාත්මානුභාවඃ යෙෂාං තෙ මහානුභාවාඃ යනු විග්‍රහයි.) **ස්වභාවොක්ති මිශ්‍ර අර්ථාන්තරන්‍යාස අලඞ්කාරයි** මුක්තකබන්ධනයි.

18. **හරිඃ මූර්ධ්නා අපඃ අග්‍රහීත්**- යනු මෙහි ක්‍රි-යි. අග්‍රහීත් යන- ග්‍රහ උපාදානෙ ධාතු- භූතාර්ථලුඞ්- සක- කර්තෘ- පර- ප්‍ර- එක- ආ- ක්‍රියාපදයාහට හරිඃ යනු උක්තකර්තෘයි- අපඃ යනු අනුක්ත කර්මයි- මූර්ධ්නා යනු අනුක්තකරණයි.

ඍෂිණා, නාරද ඍෂිහු විසින්; අශෙෂතීර්ථොපහෘතාඃ, සකල තීර්ථස්ථානවලින් ගෙණෙනලද්දවූ; පාණෞ නිධාය (එසේම) ශ්‍රීහස්තයෙහි තබාගෙණ; කමණ්ඩලොඃ, කෙණ්ඩියෙන් නිකුත්කොට; අභ්‍යුදීරිතාඃ, ඉසිනලද්දවූ හෙවත් වත්කරණලද්දවූ; අඝෞඝ, පාප සමූහයන්ගේ; විධ්වංසවිධෞ, නැසීම් විධියෙහි; පටීයසීඃ, පටුතරවූ හෙවත් අතිශයින් පොහොසත්වූ; අපඃ, පැන්; හරිඃ, ශ්‍රීකෘෂ්ණතෙම නතෙන මූර්ධ්නා, නැමුනහිසින්; අග්‍රහීත්, පිළිගත්තේය.

19. ස සාඤ්ජනෙ යත්‍ර මුනෙ'රනුඥයා
නවාම්බුදශ්‍යාමවපුර්න්‍ය'වික්ෂත
ජිගාය ජම්බූජනිතශ්‍රියඃ ශ්‍රියම්
සුමෙරුශෘඞ්ගස්‍ය තදා තදාසනම්

---

(තශෙෂාණි අශෙෂාණි අශෙෂාණි ච තානි තීර්ථානි චෙති අශෙෂතීර්ථානි අශෙෂතීර්ථෙභ්‍යඃ උපහෘතාඃ අශෙෂ–හෘතාඃ– අඝානා'මෞඝාඃ (සමූහා) ශෙචති අඝෞඝාඃ අඝෞඝානාම් (පාපසමූහානාම්) විධ්වංසඃ අඝෞඝවිධ්වංසඃ අඝෞඝවිධ්වංසස්‍ය විධිඃ අඝෞඝවිධ්වංසවිධිඃ (තස්මින්) කර්මධාරය හෝ වියහැකියි. මේ සමාස ක්‍රමයි– **ස්වභාවොක්ති නාමාලඞ්කාරොදාහරණයි.**

19. **සඃ (නවාම්බුදශ්‍යාමවපුඃ) යත්‍ර න්‍යවික්ෂත** යනුද **තදාස නම් සුමෙරුශෘඞ්ගස්‍ය ශ්‍රියං ජිගාය**– යනුද මෙහි ක්‍රි–යි, න්‍යවික්ෂත යන– නිපූර්‍ව විශ්ප්‍රවෙශෙ ධාතු භූතාර්ථලුඞ්– කර්තෘ– ආත්ම– ප්‍ර–එ–ආ– ක්‍රියාපදයාහට සඃ නවාම්බුදශ්‍යාමවපුඃ යනු උක්තකර්තෘයි– යත්‍ර–යනු අනුක්තාධාරඅව්‍යයි ජිගාය යන ජි–ජයෙ ධාතු– පරොක්ෂලිට් සකර්තෘ– පර–ප්‍රථ–එ–ආ–ක්‍රියාපදයාහට තදාසනම් යනු උක්තකර්තෘයි– ශ්‍රියං යනු අනුක්තකර්මයි සුමෙරුශෘඞ්ගස්‍ය යනු අනුක්තසම්බන්ධයි.

නවාම්බුදශ්‍යාමවපුඃ, අභිනව මේඝයක්සේ සම්වන්සිරුරු ඇති; සඃ, ඒ ශ්‍රීකෘෂ්ණතෙම; මුනෙඃ, නාරද මුනිහුගේ; අනුඥයා, අනුමතියෙන්; සාඤ්ජනෙ, සවර්ණමයවූ; යත්‍ර, යම් ආසනයෙක්හි (ප්‍රටුවෙක්හි යි සේයි); න්‍යවික්ෂත, නිෂිදනයකොළේද; තදා, එකල්හි (විෂ්ණුහු උන් කල්හි) යයි සේයි; තදාසනම්, ඒ ආසනය; ජම්බුජනිතශ්‍රියඃ, නීලවර්ණවූ මාදම් ඵලයෙන් හටගත් ශ්‍රීඇති; සුමෙරුශෘඞ්ගස්‍ය, මහාමෙරුපර්වත කූටයාගෙ; ශ්‍රියං, ශෝභාව; ජිගාය, ජයගත්තේය හෙවත් අභිභව නය කොළේය.

නවශ්චාසාවම්බුදශ්චෙති නවාම්බුදඃ නවාම්බුද ඉව ශ්‍යාමඃ වපු'ර්‍යස්‍යාසෞ නවාම්බුදශ්‍යාමවපුඃ ජම්බුයා ජනිතා– ජම්බුජනිතා ජම්බුජනිතා ශ්‍රීර්'ය්‍යාසෞ ජම්බුජනිතශ්‍රීඃ (තස්‍ය) සු– ශොභනඃ මෙරුඃ සුමෙරුඃ සුමෙරොඃ ශෘඞ්ගම්– සුමෙරුශෘඞ්ගම්– (තස්‍ය) යනු සමාසයි **උප මානුප්‍රාසශබ්දාලඞ්කාරයකි**

20. ස තප්තකාර්තස්වරභාස්වරාම්බරඃ
කඨොරතාරාධිපලාඤ්ඡනච්ඡවිඃ
විදිද්‍යුතෙ වාඩවජාතවෙදසඃ
ශිඛාභිරාශ්ලිෂ්ට ඉවාම්භසාං නිධිඃ

21. රථාඞ්ගපාණෙඃ පටලෙන රොචිෂා
මෘෂිත්විෂඃ සංවලිතා විරෙජිරෙ
චලත්පලාශාන්තරගොචරාස්තරො
ස්තුෂාරමූර්තෙරිව නක්තමංශවඃ

---

20. **සඃ අම්භසාම් නිධිඃ ඉව විදිද්‍යුතෙ**- යනු මෙහි ක්‍රි- සි. විදිද්‍යුතෙ- යන විපූර්ව ද්‍යුතදෛ්‍යාතනෙ ධාතු වර්තමානලට්- අන- කර්තෘකාරක- ආත්ම- ප්‍ර ඒ- ක්‍රියාපදයාගට සඃ යනු උක්තකර්තෘයි නිධිඃ යනු උක්තකර්තෘ විශෙෂණයි- අම්භසාම් යනු අනුක්තසම්බන්ධයි ඉව යනු උපමාව්‍යයයි.

තප්ත, ගින්නෙන් තවනලද හෙවත් පුටපාකයෙන් ශුද්ධකරණලද; කාර්තස්වර, රත්‍රන්සේ; භාස්වර, බබලන්නාවූ; අම්බරඃ, වස්ත්‍ර ඇති හෙවත් පීතවස්ත්‍රධාරීවූ; කඨොරතාරාධිප, සම්පූර්ණ තාරපති හුනේ හෙවත් පූර්ණචන්ද්‍රයාගේ; ලාඤ්ඡනච්ඡවිඃ, ශසලපය සම්බන්ධිවූ කාන්තිවැනි කාන්ති ඇත්තාවූ හෙවත් නිල්වන් සිරුරු ඇත්තාවූ; සඃ, ඒ ශ්‍රීකෘෂ්ණතෙම; වාඩවජාතවෙදසඃ, වඩබාග්නිය සම්බන්ධ ශිඛාවලින් හෙවත් ගිනිදැල්වලින්; ආශ්ලිෂ්ට, හාත්පසින් පැතිරගන්නාලද; අම්බසාම් නිධිඃඉව, මහසයුරමෙන්; විදිද්‍යුතෙ, විශෙෂයෙන් බැබලුණේය.

(තප්තං ච තත් කාර්තස්වරඤ්චෙති තප්තකාර්තස්වරම් තද්වද්භාස්වරං (දීප්‍යමානම්) අම්බරං යස්‍ය සඃ තප්ත=ම්බරඃ තාරාණාමධිපඃ තාරාධිපඃ කඨොරශ්චාසෞ තාරාධිපශ්චෙති කඨොරතාරාධිපඃ කඨොරතාරාධිපස්‍ය ලාඤ්ඡනඃ කඨොර=නං තස්‍ය ඡවිරිව ඡවි'ර්යස්‍ය සඃ= ඡවිඃ උපමානපූර්වපදෙ බහුව්‍රීහි'රුත්තරපදලොපශ්ච වාඩවශ්චාසෞ ජාතවෙදශ්චෙති වාඩවජාතවෙදඃ තස්‍ය- යනු සමාසයි ශ්‍රීකෘෂ්ණ වර්ණනායි- **උපමා ලඞ්කාරයි**.

21. **ඍෂිත්විෂඃ අංශවඃ ඉව විරෙජිරෙ**- යනු මෙහි ක්‍රි-සි. විරෙජිරෙ යන විපූර්ව රාජෘදීප්තෞ ධාතු-අන-පරොක්ෂලිට්- කර්තෘ-ආත්ම ප්‍ර- ඒ- ආ- ක්‍රියාපදයාහට ඍෂිත්විෂඃ යනු උක්තකර්තෘයි නොහොත් විරෙජිරෙ යන නිරුක්සාහක ක්‍රියා පදයාහට උක්තකර්තෘයි අංශවඃ යනු උක්තකර්තෘහට උපමානවිශෙෂණයි ඉව යනු උපමාව්‍යයයි)

22. ප්‍රඵුල්ලතාපිච්ඡනිභෛර'භීෂුභිඃ
ශුභෛශ්ච සප්තච්ඡදපාංශුපාණ්ඩුභිඃ
පරස්පරේණ ච්ඡුරිතා'මලච්ඡවී
තදෛකවර්ණාවිව තෞ බභූවතුඃ

---

**රථාඞ්ගපාණේඃ,** රථාවයවවූ චක්‍රයහස්තයෙහි විද්‍යමාන හෙයින් චක්‍රපාණි යයි නම් ලද ශ්‍රී කෘෂ්ණයාගේ; රොචිෂාම්, රැස්කඳඹින් හෙවත් රශ්මීන් සම්බන්ධවූ; පටලෙන, සමූහය සමඟ; සංවලිතාඃ, එක්වූ හෙවත් වැලඳුනාවූ; සෘෂිත්විෂඃ, නාරදසෘෂිහුගේ කාන්තිහු; නක්තම්, රාත්‍රිකාලයෙහි; තරොඃ, වෘක්ෂයක්හුගේ; චලත්, සැලෙන්නාවූ; පලාශාන්තර, පත්‍රවිවරයන්; ගොචරාඃ, ගොදුරුකොට හෙවත් ආශ්‍රයකොට ඇත්තාවූ; තුෂාරමූර්තේඃ, (තුෂාරමූර්ති සංඛ්‍යාත) චන්ද්‍රයාගේ; අංශවඃ ඉව, රශ්මින්මෙන්; විරේජිරේ, බැබලූහ.

(රථස්‍යාඞ්ගම් රථාඞ්ගම් රථාඞ්ගම් (චක්‍රම්) පාණෞ යස්‍ය සඃ රථාඞ්ගපාණිඃ (තස්‍ය) සෘෂෙඃ ත්විෂඃ සෘෂිත්විෂඃ චලන්තශ්ච තෙ පලාශාශ්චෙති චලත්පලාශාඃ තෙෂාමන්තරාණි චලත්පලාශාන්තරාණි තානි (විවරානි) ගොචර ආශ්‍රයො යෙෂාම් තෙ චලත්=ගොචරාඃ (තෙ) තුෂාරඃ මූර්තිර්‍යස්‍යාසෞ තුෂාරමූර්තිඃ (තෂ්‍ය) නාරදමුනිවර්ණනායි **උපමාලංකාරයයි** මෙහි නක්තම් යනු සප්තම්‍යර්ථාව්‍යයයි.)

22. (**තදා තෞ ඒකවර්ණෞ ඉව බභූවතුඃ**– යනු මෙහි ක්‍රියාකාරක පදසම්බන්ධයි බභූවතුඃ යන භූසත්තායාම් ධාතු– පරොක්ෂ ලිට් අත– කර්තෘ– පර– ප්‍ර–වි– ආ– ක්‍රියා පදයාහට තෞ යනු උක්තකර්තෘයි ඒකවර්ණෞ යනු තදුපමාන උක්තකර්තෘ විශෙෂණයි ඉව යනු උපමාර්ථඅව්‍යයයි)

ප්‍රඵුල්ල, විකසිතවූ; තාපිච්ඡනිභෛඃ, තමලුමලක් හා සමානවූද; සප්තච්ඡද, රුක්අත්තන පුෂ්පයන්ගේ; පාංශුපාණ්ඩුභිඃ, රේණූන් මෙන් පඬුවන්වූද; ශුභෛඃ, ශොභනවූ; අභීෂුභිඃ, අන්‍යොන්‍ය රශ්මිවලින්; පරස්පරේණ, එකිනෙකින්; ඡුරිත, පැතිරගත්තාලද; අමලච්ඡවී, නිර්මලකාන්තිවයක් ඇති; තෞ, ඒ ශ්‍රීනාරද ශ්‍රීකෘෂ්ණ දෙදෙන; තදා, තත්කාලයෙහි; ඒකවර්ණෞ ඉව, එක් පැහැඇති දෙදෙනෙකුන් මෙන්; බභූවතුඃ, වූහ. (උභයප්‍රභාමෙලනා'දුභයොර'පිසර්වාඞ්ගිණො ගඞ්ගායමුනාසඞ්ගමඉව සප්ටිකෙන්ද්‍රනීලමණිප්‍රභාමෙලනප්‍රායඃ කශ්චිදේ'කොවර්ණඃ ප්‍රාදුර්භූව යනු ටීකායි) ගංගා යමුනා සඞ්ගමය මෙන් විෂ්ණුනාරදසඞ්ගමයෙන් ජනිත උභය කාන්ති එකතුවීමෙන් පලිඟු ඉඳුනිල්මිණි කාන්තිවයයාගේ එකතුවීම හා සමානවූ සර්වාඞ්ගව්‍යාප්ත යම්කිසි එක්වර්ණයෙක් පහළවිය යි සේයි.

23. යුගාන්තකාලප්‍රතිසංහෘතාත්මනො
ජගන්ති යස්‍යාම් සවිකාස'මාසත
තනෞ මමුස්ත'ත්‍ර න කෛටභද්විෂ
ස්තපොධනාභ්‍යාගමසම්භවා මුදඃ

---

(ප්‍රඵුල්ලතීති ප්‍රඵුල්ලම් ඵුල්ලවිකාශනෙ තාපිච්ඡස්‍ය (තමාලස්‍ය) පුෂ්පමිති තාපිච්ඡම් ප්‍රඵුල්ලංච තත් තාපිච්ඡඤ්චෙති ප්‍රඵුල්ලතාපිච්ඡම් තෙන නිභාඃ සදෘශාශ්චෙති ප්‍රඵුල්ලතාපිච්ඡනිභාඃ (තෛඃ) සප්තච්ඡදඃ (පර්ණානි පර්වෙෂු) යස්‍යාසෞ සප්තච්ඡදඃ තස්‍ය පුෂ්පාණි සප්තච්ඡදනි සප්තච්ඡදනාම් පාංශුවත් පාණ්ඩවඃ සප්තච්ඡදපාංශුපාණ්ඩවඃ (තෛඃ) පරශ්ච පරශ්ච පරඃපරම් (තෙන) ඡුරිතෙ' මලෙ ඡවී යයොරෙ'තෞ ඡුරිතාමලච්ඡවී එකඃ වර්ණඃ යයොරෙ'තෞ එකවර්ණෞ යනු විග්‍රහයි විෂ්ණුනාරද වර්ණනායි. **උත්ප්‍රෙක්ෂාලඞ්කාරයි** මුක්තකබන්ධනයි)

23. **ජගන්ති යස්‍යාම් තනෞ සවිකාසමාසත** යනුද **තත්‍ර තනෞ මුදඃ නමමුඃ** යනුද මෙහි ක්‍රියා ප- සං- යී- ආසත්- යත- ආශ උපවෙශනෙ ධාතු භූතාවිලුඞ් අන- කර්තෘ- ආත්ම- ප්‍ර- බ- ආ ක්‍රියාපදයාහට ජගන්ති යනු උක්තකර්තෘයි යස්‍යාම් (තනෞ) යනු අනුක්තාධාරයි සවිකාසම් යනු ක්‍රියාවිශෙෂණයි න මමුඃ යන නඤ් පූර්ව මාඞ්පරිමාණෙ ධාතු පරොක්ෂලිට්- කර්තෘ පර- ප්‍ර- බ- ආ- ක්‍රියා පදයාහට මුදඃ යනු උක්තකර්තෘයි තත්‍ර (තනෞ) යනු අනුක්තාධාරයි

යුගාන්තකාල, කල්පාන්තකාලයෙහි; ප්‍රතිසංහෘතාත්මනඃ, තමා කෙරෙහි උපසංහරණය කරණලද (හකුලුවාගන්නාලද) ජීවඇති; කෛටභද්විෂඃ, අසුරශත්‍රෘවූ ශ්‍රී කෘෂ්ණයාගෙ; යස්‍යාම්තනෞ, යම් ශරීරයෙක්හි; ජගන්ති, ලෝවැස්සෝ; සවිකාසම්, විස්තර සහිතව හෙවත් ඉඩ ඇතිව; ආසත, සිටියාහුද; තත්‍රතනෞ, එ ශ්‍රීකෘෂ්ණයාගේ ශරීරයෙහි; තපොධනාභ්‍යාගම, නාරද සෘෂිහුගේ ආගමනයෙන්; සම්භවාඃ, හටගත්තාවූ; මුදඃ, සන්තොෂයෝ; නමමුඃ, අතිරික්තවූහ. (අප්‍රමාණවූහ යි සේයි)

(යුගස්‍ය අන්තඃ යුගාන්තඃ යුගාන්තශ්චාසෞ කාලශ්චෙති යුගාන්තකාලඃ යුගාන්තකාලෙ ප්‍රතිසංහෘතාඃ ආත්මානො යෙනාසෞ=(තස්‍ය) විකාසෙන සහ වර්තත ඉති සවිකාසම් කෛටභස්‍ය විඩ් (හන්තාවා) කෛටභවිඩ් (තස්‍ය) තපඃ ධනම් යස්‍ය සඃ තපොධනඃ තපොධනස්‍ය ආගමඃ තපොධනාගමඃ තපොධනාගමෙන සම්භවන්තීති තපොධනාගමසංභවාඃ' ශ්‍රී කෘෂ්ණවර්ණනායි **අතිශයොක්ති අලඞ්කාරයි** මුක්තකයි)

24. නිදාඝධාමාන'මිවාධිදීධිතිං
මුදා විකාශං මුනිමභ්‍යු'පෙයුෂී
විලොචනෙ බිභ්‍රදධිශ්‍රිතශ්‍රිණී
ස පුණ්ඩරීකාක්‍ෂ ඉති ස්ඵුටො'භවත්

25. සිතං සිතිම්නා සුතරාං මුනෙ'ර්වපුර්
විසාරිභිඃ සෞධමිවා'ථලම්භයන්
ද්විජාවලිව්‍යාජනිශාකරාංශුභිඃ
ශුචිස්මිතාං වාච ම'වොචදච්‍යුතඃ

---

24. (**සඃ පුණ්ඩරීකාක්‍ෂඃ ස්ඵුටඃ අභවත්** යනු මෙහි ක්‍රි- යි, අභවත් යන භූසත්තායාම් ධාතු භූතා විලුඞ් කර්තෘ- පර- ප්‍ර- ඒ- ආ- ක්‍රියා පදයාහට සඃ (කෘෂ්ණඃ) යනු උක්ත ප්‍රකෘති කර්තෘයි ස්ඵුටඃ යනු උක්ත විකෘති කර්තෘයි)

නිදාඝධාමානම් ඉව, උෂ්ණරශ්මිඇත්තා හෙවත් සූර්‍ය්‍යයාවැනිවූ; මුනිම්, නාරදඍෂිහු; අධිදීධිතිම් අභි, අධික තේජස් ඇත්තෙකු කොට සලකා නොහොත්; අධිදීධිතිම්, තමහට වඩා අධිකවූ තේජස් ඇති; මුනිම් අභි, නාරද ඍෂිහු ලකුණුකොට හෙවත් නාරදමුනිහු කෙරෙහි; මුදා, සන්තුෂ්ටියෙන්; විකාශම්, ප්‍රබුද්ධවීමට; උපෙයුෂී, පැමිණියාවූ; අධිශ්‍රිතශ්‍රිණී, එහෙයින්ම අධිගතවූ ශොභාඇති; විලොචනෙ, නෙත්‍යුවලක්; බිභ්‍රත්, දරන්නාවූ; සඃ, ඒ ශ්‍රීවිෂ්ණුතෙමේ; පුණ්ඩරීකාක්‍ෂඃ ඉති, පුණ්ඩරීකාක්‍ෂය හෙවත් පඬෙරවන් ඇස් ඇත්තේයයි; ස්ඵුටඃ අභවත්, (අන්වර්ථසංඥාවසයෙන්;) ප්‍රස්ඵුටවිය, (පතළවී යයි සේයි)

නිදාඝම් ධාමයස්‍ය සඃ නිදාඝධාමා (තම්) අධිකා දීධිති'ර්‍යස්‍ය සඃ අධිදීධිතිඃ (තම්) අධිශ්‍රිතා (ප්‍රාප්තා) ශ්‍රී'ර්‍යාභ්‍යාම් තෙ අධිශ්‍රිතශ්‍රිණී පුණ්ඩරීකෙ ඉවාක්‍ෂිණී යස්‍යාසෞ පුණ්ඩරීකාක්‍ෂඃ යනු සමාසයි **උපමා නිදර්ශන සඞ්කරාලංකාරයි** (මෙහි මුනිම් අභි යනතන්හි අභිශබ්දය ලක්‍ෂණාර්ථයෙහි වැටෙන හෙයින් කර්මප්‍රවචනීයයි 'කර්මප්‍රවචනීයෙවිතීයා' යනුවෙන් විතීයා වූහැතියි) නාරද කෘෂ්ණදෙදෙන සම්බන්ධවූ වර්ණනාවෙකි.

25. (**අච්‍යුතඃ ශුචිස්මිතාං වාචම'වොචත්** යනු මෙහි ක්‍රි- යි. අවොචත් යන බ්‍රෘඤ් ව්‍යක්තායාම් වාචි ධාතු භූතා විලුඞ්-සය-කර්තෘ පර- ප්‍ර- ඒ- ආ- ක්‍රියා පදයාහට- අච්‍යුතඃ යනු උක්තකර්තෘයි වාචම් යනු අනුක්තකර්මයි ශුචිස්මිතාං යනු අනුක්තකර්ම විශෙෂණයි)

26. හරත්‍ය'ඝං සම්ප්‍රති හෙතුරෙෂ්‍යතඃ
ශුභස්‍ය පූර්වා'චරිතෛඃ කෘතං ශුභෛඃ
ශරීරභාජාං භවදීයදර්ශනං
ව්‍යනක්ති කාලත්‍රිතයෙ පි යොග්‍යතාම්.

---

අථ ඉක්බිතිව (ශ්‍රීනාරද ශ්‍රීකෘෂ්ණ දෙදෙනාගේ තිබිදනයට අනතුරුව යි සේයි) අච්‍යුතඃ, (චුතිරහිත හෙයින් අච්‍යුත යයි සඤ්ඤා ලැබූ) ශ්‍රී කෘෂ්ණතෙම; විසාරිභිඃ, (නිතර) පැතිරෙණ සුලුවූ; විජාවලි ව්‍යාජ, දත්පෙල නමැති කපට ඇති හෙවත් දන්තපංක්තිරූපවූ; නිශාකරාංශුභිඃ, චන්ද්‍රරශ්මීන් කාරණකොටගෙණ; සිතං, (ස්වභාවයෙන්) ශ්වේතවර්ණවූ; මුනෙඃ, ශ්‍රීමත් නාරද මුනිහුගේ; වපුඃ, ශරීරය; සෞධම් ඉව, ප්‍රාසාදයක් මෙන්; සුතරාම්, අතිශයින්; සිතිම්නා, ධවලත්වයෙන් හෙවත් ධවලත්වයලවා; ලම්භයන්, මෙහෙයමින් හෙවත් ඉතා ධවලකරවමින් ශුචිස්මිතාම්, පිවිතුරු සිනාඇති; වාචම්, බස; අවොචත්, කියේය.

(ද්විජානාම් (දන්තානා'මා) වලි'ර්ද්විජාවලිඃ සෛව ව්‍යාජඃ (කපටං) යස්‍ය සඃ ද්විජාවලිව්‍යාජඃ නිශාම් කරොතීති නිශාකරඃ ද්විජාවලිව්‍යාජ ශ්චාසෞ නිශාකරශ්චෙති ද්විජ=නිශාකරඃ තස්‍යා'ංශවඃ- (තෛඃ) ශුචිඃ (පවිත්‍රම්) ස්මිතං යස්‍යාඃ සා ශුචිස්මිතා (තාම්) නාස්තිච්‍යුති'ර්යස්‍යෙති අච්‍යුතඃ යනු සමාසයි) **අතිශයොක්ති අපහ්නුති සංසෘෂ්ටියි** මෙහි ලම්භයන් යන ප්‍රයොජ්‍යකෘදන්තයට සිතිම්නා යනු ප්‍රයොජ්‍යානුක්තකර්තෘපදයි ලභෙර'ත්‍රගත්‍ය'පසර්ජන ප්‍රාප්ත්‍ය'ර්ථෙවෙනා'ගත්‍යර්ථත්වාත්, ගතිබුද්ධි, ඉත්‍යාදිනා- අණිකර්තුර්ණිකර්මත්වම් යනු නි හෙයින් කර්මවිභක්ති නොවිය.

26. (**භවදීය දර්ශනම් අඝම් හරති** යනුද **භවදීයදර්ශනම් යොග්‍යතාම් ව්‍යනක්ති** යනුද මෙහි ක්‍රි- සි, හරති යන හෘඤ් හරණෙ ධාතු වර්තමාන ලට්- සක- කර්තෘ- පර- ප්‍ර- ඒ- ආ- ක්‍රියා පදයාහට භවදීය දර්ශනම් යනු උක්තකර්තෘයි අඝම් යනු අනුක්තකර්මයි ව්‍යනක්ති යන වර්තමානලට් කර්තෘ- පර- ප්‍ර- ඒ- ආ- ක්‍රියා පදයාහට භවදීය දර්ශනම් යනුම උක්තකර්තෘයි යොග්‍යතාම් යනු අනුක්තකර්මයි.)

භවදීයදර්ශනම්, යුෂ්මතුන් පිළිබඳවූ දැකීම; ශරීරභාජාං,(දක්නා) සත්ත්වයන්ට නොහොත් සත්ත්වයන්ගෙ; කාලත්‍රිතයෙ අපි, අතීතාදිතුන් කල්හිම; යොග්‍යතාම්,පවිත්‍රභාවය; ව්‍යනක්ති,ප්‍රකාශකෙරෙයි; කුමක් හෙයින් ද යත්? සම්ප්‍රති, දැන් හෙවත් මේ දර්ශනකාලයෙහි; අඝම් හරති, පාපය දුරුකෙරෙයි; එෂ්‍යතඃ, මතුකාලයෙහි වන්නාවූ; ශුභස්‍ය, යහපතට (සම්පත්තියට යයි සේයි); හෙතුඃ, කාරණවෙයි(එපරිද්

27. ජගත්‍ය'පර්‍ය්‍යාප්තසහස්‍රභානුනා
නයන්නි යන්තුං සමභාවි භානුනා
ප්‍රසහ්‍යතෙජොභි'රසඞ්ඛ්‍යතාං ගතෛ
'රදස්ත්වයා නුන්නමනුත්තමං තමඃ

---

දෙන්ම); පූර්වාචරිතෛඃ, පූර්වජන්මයෙහි රැස් කරණලද්දාවූ; ශුභෛඃ ශොභනවූ කර්මයෙන් හෙවත් කුසලින්; කෘතං, (දූන් ඔබගෙ දැකීම) කරණලද්දේසි; (මෙසේ අතීතාදි කාලත්‍රයෙහිම කාර්‍ය්‍ය කාරණත්ව යෙන් යුෂ්මතුන්ගේ දැකීම පුරුෂයා කෙරෙහි කුසල සම්ප්‍රාප්තය හඟවන හෙයින් කවරෙකු විසින් නොපැතිය යුතුද? සියල්ලන් විසින්ම පැතිය යුතු යයි සේයි)

පූර්වානි ච තානි ආචරිතානිචෙති පූර්වාචරිතානි (තෛඃ) ශරීරං භජන්තීති ශරීරභාජඃ (තෙෂාම්) භවතඃ ඉදමිති භවදීයං භවදීයඤ්ච තත් දර්ශනඤ්චෙති භවදීයදර්ශනම් යනු මෙහි සමාසයි **වාක්‍යාර්ථ හෙතුක කාව්‍ය ලිඞ්ගාලංකාරයි**.

27. (**සහස්‍රභානුනා තමඃ නියන්තුං නසමභාවි** යනුද **ත්වයා අදඃ තමඃ නුන්නම්** යනුද මෙහි ක්‍රි-යි, නසමභාවි යන නඤ් සම් පූර්ව භූසත්තායාම් ධාතු- භූතාර්ථලුඞ්- භාවකාරක පර- ප්‍ර- ඒ- ආ- ක්‍රියා පදයාහට සහස්‍රභානුනා යනු අනුක්තකර්තෘයි. නියන්තුං යන පූර්ව ක්‍රියා පදයාහට තමඃ යනු අනුක්තකර්මයි නුන්නාම් යන නුදක්ෂෙපෙ ධාතුහු කෙරෙන් නිපන් කර්මකාරක කෘදන්තක්‍රියාපදයාහට තමඃ යනු උක්තකර්මයි අදඃ යනු උක්තකර්ම විශෙෂණයි භානුනා යනු අනුක්තකර්තෘයි)

ජගති, ලෙව්හි; අපර්‍ය්‍යාප්තා, පරිච්ඡෙද රහිතවූ; සහස්‍රභානුනා, සහස්‍රරශ්මිඇති; භානුනා, හිරු විසින්; තමඃ, යම් මොහාන්ධකාරයක්; නියන්තුං, වලකන්ට; න සමභාවී, සමර්ථනොවී ද; (නොහැකිවී ද) අනුත්තමම්, (ලාමකත්වයෙන්) සර්වාධිකවූ; අදඃ තමඃ, ඒ මොහාන්ධකාරය; අසඞ්ඛ්‍යතාම් ගතෛඃ, අසඞ්ඛ්‍යබවට පැමිණියාවූ; තෙජොභිඃ, ඔබගේ තේජස්වලින්, ප්‍රසහ්‍ය, මැඩපවත්වා (බලාත්කාරයෙනැයි සේයි); ත්වයා, ඔබවිසින්; නුන්නාම්, සිඳිනලදි, හෙවත් නසනලද්දේය, (මෙසේ කරුණු වසයෙන් සලකා බලනවිට යුෂ්මද්තෙමේ වර්ණනීය දර්ශන ඇත්තෙක් වෙයි සේයි)

(ජගති) අපර්‍ය්‍යාප්තාඃ සහස්‍රං භානවඃ යස්‍යාසෞ සහස්‍රභානුඃ (තෙන) අවිද්‍යමාන'මුත්තමං යස්මාත්තත'දනුත්තමං නසඞ්ඛ්‍යා අසඞ්ඛ්‍යා අසඞ්ඛ්‍යායාඃ භාවො'සඞ්ඛ්‍යතා (තාම්) (මෙහි සූර්‍ය්‍යයාගෙ උපමාන යෙන් මුනිහුගේ ආධික්‍ය ප්‍රතිපාදනය ගම්‍යමාන හෙයින් **ව්‍යතිරෙකාලඞ්කාරයි** නාරදමුනි වර්ණනායි.

28. කෘතඃ ප්‍රජාක්‍ෂෙමකෘතා ප්‍රජාසෘජා
සුපාත්‍රනික්‍ෂෙපනිරාකුලාත්මනා
සදෝ'පයොගෙ පි ගුරුස්ත්ව'මක්‍ෂයො
නිධිඃ ශ්‍රුතීනාං ධනසම්පදා'මිව.

29. විලොකනෙනෛව තවා'මුනා මුනෙ
කෘතඃ කෘතාර්ථො'ස්මි නිබර්හිතාංහසා
තථා'පි ශුශ්‍රෲෂු'රහං ගරීයසී
ර්ගිරෝ'ථවා ශ්‍රෙයසි කෙන තෘප්‍යතෙ.

---

28. **ප්‍රජාසෘජා ත්වම්, ශ්‍රුතීනාම් ගුරුඃ ( නිධිඃ ) කෘතඃ** යනු මෙහි ක්‍රි–සි– කෘතඃ යන– ඩුකෘඤ් කරණෙ ධාතු කර්මකාරක කෘදන්ත ක්‍රියාපදයාහට ප්‍රජාසෘජා යනු අනුක්තකර්තෘයි, ත්වම් යනු උක්ත ප්‍රකෘතිකර්මයි ගුරුඃ යනු හෝ නිධිඃ යනු උක්තවිකෘතිකර්මයි ශ්‍රුතීනාම් යනු අනුක්තසම්බන්ධයි.

ප්‍රජා, ජනයන්ට දේ හෝ නොහොත් දරුවන්ට; ක්‍ෂෙමකෘතා, නිර්භයකාරීවූ; සුපාත්‍ර, යොග්‍ය පුරුෂ සඞ්ඛ්‍යාත ගුණ භාජනවූවන් කෙරෙහි දේ හෝ නොහොත් කටාහාදී දුස්භාජනයෙහි; නික්‍ෂෙප, බහාලීමෙන් දේ හෝ නොහොත් තැන්පත්කොට තැබීමෙන් (නිදන් කිරීමෙනැ යි සේයි); නිරාකුලාත්මනා, නිරවුල් සිත් ඇති; ප්‍රජාසෘජා, බ්‍රහ්මයා විසින් නොහොත් දරුවන් ඇත්තහු විසින්; ත්වම්, නුඹ; සදා උපයොගෙ අපි, හැමකල්හි උපයෝගයෙහිත් හෙවත් දාන පරිභොග යන දෙකින් වියදම් ඇතිකල්හිදු; අක්‍ෂයඃ, ක්‍ෂය නොවන්නාවූ හෙවත් අඩුනොවන්නාවූ; ගුරුඃ, මහත්වූ; ධනසම්පදම්නිධිඃඉව, ධන සම්පත්තීන් සම්බන්ධවූ නිධියක් මෙන්; ශ්‍රුතීනාම්, චතුර්වේදය සම්බන්ධ නිධියක්වූ; (ගුරුඃ) කෘතඃ, ඇදුරෙක් කරණ ලද්දේය.

(ක්‍ෂෙමං කෘතවානිති ක්‍ෂෙමකෘත් ප්‍රජානාම් ක්‍ෂෙම කෘත් ප්‍රජාක්‍ෂෙමකෘත් තෙන–ප්‍රජාන් සෘජ්‍යතෙති–ප්‍රජාසෘග් (තෙන) ශොභනම් පාත්‍රම් සුපාත්‍රම් සුපාත්‍රෙ නික්‍ෂෙපඃ සුපාත්‍රනික්‍ෂෙපඃ නිරාකුලම් ආත්මා (ස්වස්ථචිත්තං) යස්‍යාසෞ නිරාකුලාත්මා සුපාත්‍රනික්‍ෂෙපෙන නිරාකුලාත්මා සුපාත්‍රනික්‍ෂෙපනිරාකුලාත්මා (තෙන) නක්‍ෂයො'ක්‍ෂයඃ ධනස්‍ය ධනානාම් වා සම්පදඃ ධනසම්පදඃ (තාසාම්) යනු සමාසයි **ශ්ලෙෂොපමා ලංකාරයි** නාරදමුනි වර්ණනායි මුක්තකබන්ධනයි.)

29. **මුනෙ අහම් කෘතාර්ථඃ කෘතඃ අස්මි** යනුද **අහම් ගිරඃ ශුශ්‍රෲෂුරස්මි** යනුද **කෙන ශ්‍රෙයසි තෘප්‍යතෙ** යනුද මෙහි ක්‍රි– සි, අස්මි යන අස්භුවි ධාතු වර්ත- කර්තෘ- පර– උත්තම පුරුෂ– එ– ආ– ක්‍රියා පදයාහට අහම් යනුද කෘතඃ යනුද ප්‍රකෘති විකෘති වශයෙන්

30. ගතස්පෘහෝ'ප්‍යාගමනප්‍රයෝජනං
වදේ'ති වක්තුං ව්‍යවසීයතේ මයා
තනොති න'ස්තාමුදිතා'ත්මගෞරවො
ගුරුස්තවෝ'වාගම එෂ ධෘෂ්ටතාම්.

---

උක්තකර්තෘයි ශුශ්‍රූෂුඃ යන ශෲඤ් ශ්‍රවණෙ ධාතු කර්තෘකාරක නාම දන්ත ක්‍රියාපදයාහට ගිරඃ යනු අනුක්තකර්මයි තෘප්‍යසෙ යන තෘප් ප්‍රීණනෙ ධාතු භාවසාධන වර්‍ත- ලට්- ප්‍ර- එ- ආ- ක්‍රියා පදයාහට කෙන යනු අනුක්තකර්තෘයි ශ්‍රෙයසි යනු අනුක්තාධාරයි)

මුනෙ, පින්වත් තපස්විය; නිබර්හිතාංහසා, පහකරණලද පාපී භාවඇති හෙවත් දුරුකළ පව්ඇති; තව, ඔබගේ; අමුනාපිලොක නෙන එව, මේ දැකීමෙන්ම; කෘතාර්ථඃ, නිෂ්පන්නවූ ප්‍රයොජන ඇත්තෙක්; කෘතඃ අස්මි, කරණලද්දේවෙමි; තථාපි, එසේදවුවත්; අහම්, මම; ගරියසීඃ, ගරුතරවූ හෙවත් අතිශයින් අර්ථවත්වූ; ගිරඃ, ඔබගේ තෙපුල්ද; ශුශ්‍රූෂුඃ අස්මි, අසණු කැමැත්තේ වෙමි; අථවා, ඒ එසේ මැයි; කෙන, (මේ ලෙව්හි) කවරෙකු විසින්; ශ්‍රෙයසි, යහපතෙහි හෙවත් සම්පත් විෂයෙහි; තෘප්‍යතෙ, ප්‍රීණනයවේද නොවේමැයි.

කෘතඃ අර්ථඃ යෙනාසෞ කෘතාර්ථඃ නිබර්හිතං (අපහෘතම්) අංහඃ (පාප්මනඃ) යෙනාසෞ නිබර්හිතාංහාඃ (තෙන) යනු සමාසයි **ස්වභාවොක්ති හෝ උදාත්තයි.**

(දූත් වනාහි ආගමන ප්‍රයෝජනය මෙසේ විචාරයි.)

30. (**එවම් ආගමනප්‍රයොජනං වද ඉති වක්තුං යයා ධෘෂ්ටතයා මයා**) **ව්‍යවසීයතෙ** යනුද **තව** (**එෂඃ**) **ආගමඃ තාම් තනොති** යනුද මෙහි ක්‍රි–සි, වද යන බෲඤ් ව්‍යක්තායාම් වාචිධාතු–ආශීඃ ප්‍රෙරණ ලොට් සක කර්තෘ– පර ප්‍ර– එ– ආ– ක්‍රියා පදයාහට එවම් යනු අධ්‍යාහෘත උක්තකර්මයි ආගමන ප්‍රයොජනම් යනු අනුක්තකර්මයි ව්‍යවසීයතෙ යන වි අව පූර්වඅස් භුවි– ධාතු– අක භාවසාධන් වර්‍ත- ප්‍ර– එ– ආත්ම– ආ–ක්‍රියා පදයාහට මයා යනු අධ්‍යාහෘත අනුක්තකර්තෘයි යයා (ධෘෂ්ටතයා) යනු අනුක්ත කරණයි තනොති යන තනු විස්තාරෙ ධාතු සක– කර්තෘ වර්තමානලට්– පර– ප්‍ර– එ– ආ– ක්‍රියා පදයාහට ආගමඃ යනු උක්තකර්තෘයි තාම් යනු අනුක්තකර්මයි එෂඃ යනු උක්ත කර්තෘ විශෙෂණයි.)

ගතස්පෘහඃ අපි, පහවගිය ආසා ඇත්තාවූද හෙවත් විරක්තවූද (ඔබ); ආගමන ප්‍රයොජනං, පැමිණීමෙහි ප්‍රයොජනය; වද ඉති, (අපට)කියවයි; වක්තුං, කියන්ට; යයා(ධෘෂ්ටතයා), යම් ලජ්ජාරහිත බවකින් හෙවත් බුහුටිබවකින්; ව්‍යවසීයතෙ, උත්සාහකිරීමක්වේද;

31. ඉති බ්‍රුවන්තං ත'මුවාච ස ව්‍රතී
න වාච්‍ය'මිත්ථං පුරුෂෝ'ත්තම ත්වයා
ත්වමේ'ව සාක්ෂාත්කරණීය ඉත්‍ය'තඃ
කිමස්ති කාර්‍ය්‍යං ගුරුයෝගිනාම'පි.

---

උදිතාත්මගෞරවඃ, පහළවූ හෝ කියනලද තමාසම්බන්ධ ගරුත්වය ඇති; ගුරුඃ, ශ්ලාඝ්‍යවූ (පූජ්‍යවූ); තව, ඔබගෙ; **එෂඃ ආගමඃ එව**, මේ පැමිණීමම; නඃ, අපට; තාම්, එ බුහුටිබව; තනෝති, පතුරුවයි.

ගතා ස්පෘහා යස්‍යාසෞ ගතස්පෘහඃ ආගමනස්‍ය ආගමනේ වා ප්‍රයෝජනම් ආගමනප්‍රයෝජනම් ගුරෝ'ර්භාවෝ ගෞරවං ආත්මනඃ ගෞරවං ආත්මගෞරවම් උදිතම් ආත්මගෞරවම් යස්‍යාසෞ උදිතාත්මගෞරවඃ යනු සමාසයි **ක්‍රියා ස්වභාවෝක්තියි.**

(මුක්තකයි)

31. (**සඃ ව්‍රතී තම් ඉති උවාච** යනුද **ත්වයා ඉත්ථං න වාච්‍යම්** යනුද **යෝගිනාම් ත්වම් සාක්ෂාත් කරණීයඃ** යනුද මෙහි ක්‍රි- යි. උවාච යන වච් පරිභාෂණෙ- ධාතු පරොක්ෂලිට් සක-ක-පර-ප්‍ර-ඒ- ආ- ක්‍රියා පදයාහට සඃ (ව්‍රතී) යනු උක්තකර්තෘයි තම් යනු අනුක්ත කර්මයි (මේ වච්ධාතුහු ද්විකර්මක බැවින් (අදඃ වචඃ යී) කර්මයක් ගම්‍යමානයි) ඉති යනු ක්‍රියා විශෙෂණයි, නවාච්‍යම් යන කර්මකාරක කෘදන්තක්‍රියා පදයාහට ත්වයා යනු අනුක්තකර්තෘයි, ඉත්ථං යනු ක්‍රියා විශෙෂණයි, සාක්ෂාත් කරණීයඃ යන සොපපද කර්මකාරක කෘදන්ත ක්‍රියා පදයාහට ත්වම් යනු උක්තකර්මයි, යෝගිනාම් යනු කර්තෘ අර්ථ අනුක්ත සම්බන්ධයි.)

ඉති, මෙසේ; බ්‍රුවන්තම්, කියන්නාවූ; තම්, ඒ විෂ්ණුහට; සඃ ව්‍රතී, ඒ ව්‍රතධාරීතෙම; උවාච, මෙසේ කීයේය; (කුමක්ද යත්?) පුරුෂෝත්තම, පුරුෂ ශ්‍රෙෂ්ඨය; ත්වයා, ඔබ විසින්; ඉත්ථං, මෙසේ; න වාච්‍යම්, ගතස්පෘහෝපි යනාදිය නො කියයුතුයි; යෝගිනාම් අපි, යෝගීන් (මුනිවරයන්) විසින්ද; ත්වම් එව, ඔබම; සාක්ෂාත් කරණීයඃ ඉති, ප්‍රත්‍යක්ෂ කටයුත්තෙක් වෙහි යයි; අතඃ, මීටවඩා හෙවත් මෙයින් අන්‍යවූ; ගුරු, මහත්වූ; කිම් කාර්‍ය්‍යම්, කුමන කටයුත්තක්; අස්ති, ඇත්තේද (නැත්තේමැයි සේයි)

(තස්මාත්තත් ප්‍රයෝජනාන්තර ප්‍රශ්නාවකාශ ඉති භාවඃ යද්‍යුක්තං යෝගිනාම'පි ත්වමෙව සාක්ෂාත්කරණීය ඉති තදෙව දර්ශයති යනු ටීකායී- පුරුෂාණාමු'ත්තමඃ පුරුෂශ්චාසා' වුත්තමශ්චෙති වා පුරුෂෝත්තමඃ යනු සමාසයි)

32 උදීර්ණරාගප්‍රතිරෝධකං ජනෛ
රභීක්ෂ්ණ'මක්ෂුණ්ණතයා 'තිදුර්ගමම්
උපේයුෂෝ මෝක්ෂපථං මනස්විනස්
ත්ව'මග්‍රභූමිර්නි'රපායසංශ්‍රයා.

33. උදාසිතාරං නිගෘහීතමානසෛ
ර්ගෘහීත'මධ්‍යාත්මදෘශා කථංචන
බහිර්විකාරං ප්‍රකෘතේඃ පෘථග්විදුඃ
පුරාතනං ත්වාං පුරුෂං පුරාවිදඃ

---

32. (**ත්වම් අග්‍රභූමිඃ භවසි** යනු මෙහි ක්‍රි-සි, භවසි යන වර්ත ලට් කර්තෘ- පර- මධ්‍යම පුරුෂ ඒ අා- ක්‍රියා පදයාහට ත්වම් යනු උක්ත ප්‍රකෘති කර්තෘයි අග්‍රභූමිඃ යනු උක්තාවිකෘති කර්තෘයි)

උදීර්ණ, උද්ගතවූ හෙවත් අධිකවූ; රාගප්‍රතිරෝධකම්, විෂයාභිලාෂ නමැති උපද්‍රව නොහොත් වෛරයන් ඇති; අභීක්ෂ්ණං, නිරන්තරයෙන්; අක්ෂුණ්ණතයා, පුරුදු නොකළ බැවින් නොහොත් අප්‍රතිහතභාවයෙන්; ජනෛඃ, ජනයන් විසින්; අතිදුර්ගමම්, ඉතා දුකසේ යායුතුවූ; මෝක්ෂපථම්, අපවර්ගමාර්ගයට ද්වේ හෝ නොහොත් සාධනාචාර මාර්ගයට; උපේයුෂඃ, පැමිණියාවූ; මනස්විනඃ, මනා සිත් ඇත්තෙකුට ද්වේ හෝ නොහොත් ධීරයෙකුට; ත්වම්, ඔබම; නිරපාය සංශ්‍රයා, පුනරාවෘත්තිනැති, සංශ්‍රය හෙවත් පැමිණීම ඇත්තාවූ; අග්‍ර භූමිඃ, ශ්‍රේෂ්ඨභූමිය හෙවත් ප්‍රාප්‍යස්ථානය වෙහි.

උදීර්ණඃ (උද්‍රික්ත) රාගඃ උදීර්ණරාගඃ ස ඒව ප්‍රතිරෝධකඃ යස්මින් සඃ උදීර්ණරාගප්‍රතිරෝධකඃ (තම්) අතිශයේන දුර්ගමඃ අතිදුර්ගමඃ තම්- මෝක්ෂස්‍ය මෝක්ෂරේ'ව වා පන්ථාඃ මෝක්ෂපථඃ තම්- අග්‍රා ච සා භූමිශ්චේති අග්‍රභූමිඃ නිරපායඃ (පුනරා'වෘත්තිරහිතඃ) සංශ්‍රයඃ යස්‍යාඃ සා නිරපායසංශ්‍රයා යනු මෙහි සමාසයි **ශ්ලේෂාලංකාරයි.**

33. (**පුරාවිදඃ ත්වාං පුරාතනං පුරුෂං විදුඃ** යනු මෙහි ක්‍රි- සි, විදුඃ යන විද් ඥානේ ධාතු වර්ත- සක- කර්තෘ- පර- ප්‍ර- බහු- අා- ක්‍රියා පදයාහට පුරාවිදඃ යනු උක්තකර්තෘයි ත්වාං පුරුෂං යනු ප්‍රකෘති විකෘති වසයෙන් අනුක්ත කර්මයි පුරාතනං යනු අනුක්ත කර්ම විශේෂණයි)

පුරාවිදඃ, පූර්වකාලඥවූ කපිලාදීහු තුමූ; ත්වාම්, යුෂ්මද්හු; නිගෘහීත මානසෛඃ, වසඟකරගත්තාලද සිත්ඇතියන් විසින් හෙවත් යෝගීන් විසින්; අධ්‍යාත්මදෘශා, අධ්‍යාත්ම ඥානයෙන් (තමන් අයත් කොට ඇති දෘෂ්ටිසඞ්ඛ්‍යාත ඥානයෙනැයි සේයි); කථංචන, කෙසේ

34. නිවෙශයාමාසිථ හෙලයො'ද්ධෘතං
ඵණාභෘතාං ඡාදනමේ'කමොකස
ජගත්‍රයෛ'කස්ථපතිස්ත්ව'මුච්චකෛ
රහීශ්වරස්තම්භශිරඃසු භූතලම්.

---

නුමුත්; උදාසිතාරං, උදාසීනයෙකු හෙවත් මධ්‍යස්ථයෙකු කොට; ගෘහීතම්, ප්‍රත්‍යක්ෂකොට ගන්නාලද්දවූ; බහිර්විකාරං, පිටත්හි විකාරවූ හෙවත් මහදාදී විකාර රූපයන්ගෙන් වෙන්වූ; ප්‍රකෘතෙඃ, ත්‍රිගුණාත්මක ප්‍රකෘතියෙන් හෙවත් මූලකාරණයෙන්; පෘථක්, වෙන්වූ; පුරාතනම්, පෞරාණිකවූ; පුරුෂං, පුරුෂයායයි; විදුඃ, දනිත්.

නිගෘහිතං මනඃ යෛඃ තෙ නිගෘහිතමනාඃ තෛඃ ආත්මනි අධි අධ්‍යාත්මං තස්‍ය දෘක් අධ්‍යාත්මදෘක් (තයා) විකාරෙභ්‍යඃ බහිරිති බහිර්විකාරං පුරා භවඃ පුරාතනම් (තම්) පුරා විදන්තීති පුරාවිදඃ

**34. (ත්වම් අහීශ්වරස්තම්භශිරඃසු භූතලම් නිවෙශයාමාසිථ** යනු මෙහි ක්‍රියා- සං- යි, නිවෙශයාමාසිථ යන නි පූර්ව විශ් ප්‍රවෙශෙ ධාතු ආම් ප්‍රත්‍යයුක්ත අස් භූවි ධාතු අනුප්‍රයොග පරොක්ෂලිට් කර්තෘ-පර-මධ්‍යම- ඒ- ආ- ක්‍රියා පදයාහට ත්වම් යනු උක්ත කර්තෘයි භූතලම් යනු අනුක්ත කර්මයි අහීශ්වරස්තම්භශිරඃසු යනු අනුක්තාධාරයි.)

ජගත්‍රයෛ, තුන්ලොවට; ඒකස්ථපති, අසහාය ස්වාමිවූ නොහොත් අද්විතීය ශිල්පීවූ; ත්වම්, ඔබ; හෙලයා උද්ධෘතම්, (වරාහාවතාරසමයෙහි) දසේච්ඡායෙන් උදුරණලද; ඵණාභෘතාම්, ඵණධාරීන්ගේ හෙවත් නාගයන්ගෙ; ඔකසඃ, ආශ්‍රයස්ථානය ද්ද හෝ නොහොත් ගෘහය සම්බන්ධවූ; ඒකම් ඡාදනම්, ඒකම ආවරණයවූ හෙවත් අද්විතීය සෙවිලිවූ; භූතලම්, පෘථිවීතලය; උච්චකෛඃ, උස්වූ; අහීශ්වර, සර්පරාජයාගෙ හෙවත් අනන්තනාගරාජතමැති; ස්තම්භශිරඃසු, ස්තම්භයාගේ මූදුනෙහි (එනම් නාරජුගේ පෙණදහස් මත්තෙහි යයි සේයි); නිවෙශයාමාසිථ, තිබ්බාවෙහලෙහිය හෙවත් පිහිටුවූයෙහිය (වැදූවූයෙහි යයි සේයි)

ත්‍රීණි ජගන්ති සමාහෘතානි ජගත්‍රයම් ජගතාං ත්‍රයමිති වා ජගත්‍රයම් ජගත්‍රයස්‍ය ඒකස්ථපතිඃ ජගත්‍රයෛකස්ථපතිඃ අහිනාම් (නාගානාම්) ඊශ්වරඃ අහීශ්වරඃ අහිශ්වරඃ එව ස්තම්භඃ= තස්‍ය ශිරා සි= (තෙෂු) යනු සමාසයි. **ශ්ලිෂ්ටරූපකයි.**

(එවං භගවතො නිර්ගුණස්වරූප'මුක්ත්වා සම්ප්‍රති ප්‍රස්තුතො'ප යොගිතයා සගුණමා'ශ්‍රිත්‍ය ෂඩ්භිඃ ස්තෞති, යනු ටීකා හෙයින් නිවෙ

35. අනන්‍යගුර්වාස්තවකෙනකෙවලඃ
පුරාණමූර්තේර්මහිමාවගම්‍යතෙ
මනුෂ්‍යජන්මාපි සුරාසුරාන්ගුණෛ
ර්භවාන්භවච්ඡේදකරෛඃ කරොත්‍යධඃ.

---

ශයාමාසිථ යනාදී ශ්ලොකයෙහි පටන්, කරොති කංසාදිමහීභෘතාං යනාදි ශ්ලොකය වනතෙක් නාරද මුනිහු විසින් විෂ්ණුට ස්තුතිකළ බැව් සැලකිය යුතුයි)

35. (**කෙන තාව මහිමා අවගම්‍යතෙ** යනුද භවාන් ගුණෛඃ **සුරාසුරාන් අධඃ කරොති** යනුද මෙහි ක්‍රි- යි. අවගම්‍යතෙ යන අව පූර්ව ගම්ඍ ගතෞ ධාතු වර්ත- ස්ක- කර්ම- ආත්ම- ප්‍ර- එ- ආ- ක්‍රියා පදයාහට කෙන යනු අනුක්තකර්තෘයි මහිමා යනු උක්තකර්මයි තව යනු අනුක්ත සම්බන්ධයි අධඃ කරොති යන සොපපද ඩුකෘඤ් කරණෙ ධාතු වර්ත- ස්ක- කර්තෘ- පර- ප්‍ර- එ- ආ- ක්‍රියා පදයාහට භවාන් යනු උක්තකර්තෘයි සුරාසුරාන් යනු අනුක්තකර්මයි ගුණෛඃ යනු අනුක්තකරණයි)

අනන්‍යගුර්ව්‍යාඃ, අන්‍යවූ ගුරුතරයෙක් නැත්තාවූ හෙවත් සියල්ලන්ට උත්තමවූ; තව, ඔබගෙ; පුරාණමූර්තෙඃ, පුරාණමූර්තිය හෙවත් අමානුෂ ස්වරූපය සම්බන්ධිවූ; කෙවලඃ මහිමා, සකල මහිමය හෙවත් සියලු මහත් භාවය තෙම; කෙන, කවරෙකු විසින්; අවගම්‍යතෙ, දැනගණු ලැබේද (කිසිවෙකු විසින් නොදතහැක්කේ යයි සේයි) කුමක් හෙයින්ද යත්? මනුෂ්‍යජන්මා අපි, මනුෂ්‍යොත්පත්ති ඇත්තාවූද හෙවත් මිනිසෙකුගෙන් ඉපදීම ඇත්තාවූද; භවාන්, පිංවත් තෙම; භවච්ඡේදකරෛඃ, සංසාරවිච්ඡේදය කරන්නාවූ; ගුණෛඃ, ඥානාදි ගුණයන් කරණකොටගෙණ, සුරාසුරාන්, දෙවදානවයන්; අධඃ කරොති, යටත් කෙරේද එහෙයිනි.

(නවිද්‍යතෙ' න්‍යොගුරු'ර්‍යස්‍යාඃ සා අනන්‍යගුර්ව්‍යා (තස්‍යාඃ) පුරාණා වසා මූර්ත්තිශ්චෙති පුරාණමූර්ත්තිඃ (තස්‍යඃ) මනුෂ්‍යා ජන්ම යස්‍ය සඃ මනුෂ්‍යජන්මා සුරාශ්ච අසුරාශ්ච සුරාසුරාඃ (තාන්) භවස්‍ය ඡේදඃ භවච්ඡේදඃ භවච්ඡේදම් කුර්වන්තීති භවච්ඡේදකරාඃ (තෛඃ)(මානුෂ එව තෙ මහිමා දුරවගාහඃ අමානුෂස්තු කිමිති භාවඃ . ඞාඞඃ, විතීයාවේ සකෘද්ව්‍යඤ්ජනාවෘත්ත්‍යා ඡෙකානුප්‍රාසඃ, යනු ටීකා හෙයින් පින්වත් කෘෂ්ණය ඔබගෙ මානුෂික මහිමය දුරවගාහයි, අමානුෂිකය කියනුම කවරේද යනු භාවයි මෙහි දෙවන අර්ථයෙහි නොයෙක්වර බ්‍යඤ්ජනාවෘත්ති හෙයින් **ඡෙකානුප්‍රාස** නමැයි සූචිතයි.

36. ලඝූකරිෂ්‍යන්න'තිභාරභඞ්ගුරා
මමූං කිල ත්වං ත්‍රිදිවාද'වාතරඃ
උදූඪලොකත්‍රිතයෙන සාම්ප්‍රතං
ගුරුර්ධරිත්‍රී ක්‍රියතෙ තරාං ත්වයා.

37. නිජෞ'ජසෝ'ජ්ජාසයිතුං ජගද්ද්‍රුහා
මුපාජිහිථා න මහීතලං යදි
සමාහිතෛ'රප්‍ය'නිරූපිතස්තතඃ
පදං දෘශඃ ස්‍යාඃ කථමී'ශ මාදෘශාම්.

---

36. (**ත්වම් ත්‍රිදිවාද් අවාතාරඃ අසි** යනුද **ත්වයා ධරිත්‍රී ගුරුඃ ක්‍රියතෙතරාං** යනුද මෙහි ක්‍රියා සං- යි. අසි යන අස් භුවි ධාතු වර්‍ත- අක- කර්‍තෘ- පර- මධ්‍යම- එ- අධ්‍යාහෘත- ආ- ක්‍රියා පදයාහට ත්වම් යනුද- අවාතරඃ යනුද- ප්‍රකෘති විකෘති වසයෙන් උක්තකර්‍තෘයි අවාතරඃ යන අව ආඞ්- පූර්‍ව- තෘ පලවනතරණයොඃ යන ධාතු නිෂ්පන්න කර්‍තෘකාරක කෘදන්ත ක්‍රියා පදයාහට ත්‍රිදිවාත් යනු අනුක්තාපාදානයි ක්‍රියතෙතරාම් යන අතිශයාර්ථ නිපාත සහිත කර්‍ම කාරක ආඛ්‍යාත ක්‍රියා පදයාහට ත්වයා යනු අනුක්ත කර්‍තෘයි ධරිත්‍රී යනුද ගුරුඃ යනුද ප්‍රකෘති විකෘති වසයෙන් උක්තකර්මයි.)

ත්වම්, ඔබ; අතිභාර, ඉතා බරින් හෙවත් බලස්වරූපයෙන්; භඞ්ගුරාම්, බිඳෙන සුලුවූ (හෙවත් තමා විසින්ම) බිඳෙනුලබන්නාවූ; අමූං, මේ පොළොව; ලඝූකරිෂ්‍යන් කිල, සැහැල්ලු කරමින්ම; අවාතරඃ, ස්වර්ලොකයෙන් භූලොකයට අවතීර්ණවූයෙ වෙහි; සාංප්‍රතම්, මෙකල්හි; කුක්ෂෞ, ස්වකීය කුක්ෂියෙහි ලා; උදූඪ, උසුලනලද නොහොත් මහත්වූ; ලොකත්‍රිතයෙන, තුන්ලොව ඇති; ත්වයා, ඔබ විසින්; ධරිත්‍රී, පෘථිවිතොම; ගුරුඃ ක්‍රියතෙතරාං, අතිශයින් පිදිය යුතානී නොහොත් බරඇතානී කරණුලැබේවා.

අලඝුං ලඝුං කරිෂ්‍යතී'ති ලඝූකරිෂ්‍යන් අතිශයඃ භාරො'තිභාරඃ අතිභාරෙණ භඞ්ගුරා අතිභාරභඞ්ගුරා (තාං) ත්‍රයඃ දිවාඃ සමාහෘතාඃ ත්‍රිදිවම් (තස්මාත්) ලොකස්‍ය ත්‍රිතයං ලොකත්‍රිතයං උදූඪං ලොකත්‍රිතයං යෙනාසෞ (තෙන) යනු සමාසයි, ආභාසතෙව විරොධස්‍ය විරොධාභාස උච්‍යතෙ, යනු කිහෙයින් **විරොධාභාසනම් අලංකාරය** ශ්‍රීකෘෂ්ණ වර්ණනායි **මුක්තකයි.**

37. (**ත්වම් මහීතලං නඋපාජිහීථාඃ** යනුද **ත්වම් කථම් දෘශඃ ගොචරඃ ස්‍යාඃ** යනුද මෙහි ක්‍රි- යි. නඋපාජිහීථාඃ යන නඤ්උපපූර්‍ව ඕහාඞ් ගතෞ ධාතු- භූතාර්ථලුඞ් සක- කර්‍තෘ- ආත්ම- මධ්‍යම- එ- ආ

38. උපප්ලුතං පාතුම'දෙ මදෝද්ධතෛ
ස්ත්වමේ'ව විශ්වම්භර විශ්ව'මීශිෂේ.
ඍතෙ රවේඃ ක්ෂාලයිතුං ක්ෂමේත කඃ
ක්ෂපාතමස්කාණ්ඩමලීමසං නභඃ.

---

[illegible] ත්වම් යනු උක්තකර්තෘයි මහිතලම් යනු අනුක්ත කර්මයි ස්‍යාඃ යන අස් භුවි ධාතු- වර්ත- අක- කර්තෘ- මධ්‍යම- ඒ- ආ ක්‍රියා පදයාහට ත්වම් යනු උක්ත ප්‍රකෘති කර්තෘයි ගොචරඃ යනු උක්ත විකෘති කර්තෘයි දෘශඃ යනු අනුක්ත සම්බන්ධයි කථම් යනු ක්‍රියා විශේෂණ නිෂ්පන්න නිපාතයි.)

ඊශ, පිංවත් අධිපතිය; නිජෞජසා, සියතෙදින්; ජගද්ද්‍රුහාම්, ලොකයාට ද්‍රොහකරන්නවුන්ට (කංසාදීඅසුරයන්ට); උජ්ජාසයිතුං, හිංසාකරවන්ට; මහිතලම්, පොළෝතලයට; යදි, ඉදින්; නඋපාජිහීථාඃ, ඔබ නොබටුවෙහි නම්; තදා, එකල්හි; සමාධිභිඃ අපි, සමාධියෙහි ඇලුනවුන් විසින්ද නොහොත් සමාධිගත සිත් ඇත්තවුන් විසින්ද; අනිරූපිතඃ, නිරූපනය නොකරණලද්දේ හෙවත් නොදන්නාලද්දේ; මාදෘශාං, මසැස් ඇති මා වැන්නාවුන්ගෙ; දෘශඃ, ඇසට; කථම්, කෙසේ; ගොචරඃ ස්‍යාඃ, විෂයවන්නෙහිද (නොවන්නෙහි යයි සේයි)

නිජස්‍ය (ආත්මනඃ) ඔජඃ නිජෞජඃ (තෙන) ජගන්ති' ද්‍රුහ්‍යන්තීති ජගද්ද්‍රුහඃ (තෙෂාම්) මහ්‍යාඃ තලම් මහීතලම් යනු සමාසයි (යම්හෙයකින් ඔබගෙ ප්‍රත්‍යක්ෂකිරීම වේද? එයම එහෙයින් අපගෙ ආගමන ප්‍රයොජනය වෙයි සේයි) ශ්‍රී කෘෂ්ණ වර්ණනායි **මුක්තකයි ස්වභාවොක්ති අලඞ්කාරයි**.

38. (**ත්වමේ'ව විශ්වං පාතුං ඊශිෂේ** යනුද **රවෙඃ ඍතෙ කඃ ක්ෂපාතමඃ ක්ෂාලයිතුං ක්ෂමෙත** යනුද මෙහි ක්‍රි- යි. ඊශිෂේ යන ඊශ ඓශ්වර්‍ය්‍ය ධාතු වර්ත- අක- කර්තෘ- ආත්ම- මධ්‍යම- ඒ-ආ-ක්‍රියා පදයාහට ත්වම් යනු උක්තකර්තෘයි එව යනු අවධාරණාර්ථ අව්‍යයි පාතුං යන පෙරකිරියට විශ්වං යනු අනුක්තකර්මයි ක්ෂමෙත යන ක්ෂම සහනෙ ධාතු විධි සම්භාවනලිඞ්- කර්තෘ- ආත්ම- ප්‍ර- එ- ආ- ක්‍රියා පදයාහට කඃ යනු උක්තකර්තෘයි ක්ෂාලයිතුං යන පෙරකිරියට නභඃ යනු අනුක්තකර්මයි)

විශ්වංභර, පිංවත සියල්ල පෝෂණය කරන්න; මදෝද්ධතෛඃ, මදයෙන් උඩඟුවූවන් විසින් (කංසාදි අසුරයන් විසින් යයි සේයි); උපප්ලුතං, පීඩාකරණලද; අදඃ විශ්වං, මේ සියලු ලෝකය; පාතුං,

39. කරොති කංසාදිමහීභෘතාං වධා
ජ්ජනො මෘගාණාමිʼව යත්තවස්තවම්
හරෙ හිරණ්‍යාක්‍ෂපුරඃ සරාʼසුර
විපවිෂඃ ප්‍රත්‍යුත සා තිරස්ක්‍රියා.

---

රක්‍ෂාකරන්ට; ත්‍වම් එව, ඒ ඔබම; ඊශිෂෙ, සමර්ථවෙහිය; (ඊට නිදර්ශනය නම්) ක්‍ෂපාතමස්කාණ්ඩ, රාත්‍ර්‍යන්ධකාර සමූහයෙන්; මලීමසම්, කිලිටිවූ; නභඃ, අහස; ක්‍ෂාලයිතුං, නිර්මලකරන්ට (පිරිසුදුකරන්ට); රවෙඃ ඍතෙ, සූර්‍ය්‍යයා හැර; කඃ, කවරෙක්; ක්‍ෂමෙත, සමර්ථවන්නේද නොවන්නේමැයි.

මදෙන උද්ධතාඃ මදොද්ධතාඃ (තෙඃ) විශ්වං බිභර්ත්තී'ති විශ්වංභරඃ (හෙ විශ්වංභර ඉත්‍යර්ථ) තමසඃ තමසාම් වා කාණ්ඩාඃ තමස්කාණ්ඩාඃ ක්‍ෂපායාඃ තමස්කාණ්ඩාඃ (තෛඃ මලීමසං) නම් යනු සමාසයි ශ්‍රීකෘෂ්ණ වර්ණනායි- **මුක්තකයි, ප්‍රතිවස්තූපමාලංකාරයි.**

39. (**ජනඃ නවස්තවං කරොති** යනුද **සා නව තිරස්ක්‍රියා භවති** යනුද මෙහි ක්‍රි-යි. කරොති යන ඩුකෘඤ් කරණෙ ධාතු වර්ත- සක- කර්තෘ- පර- ප්‍ර- එ- ආ- ක්‍රියා පදයාහට ජනඃ යනු උක්ත කර්තෘයි ස්තවං යනු අනුක්ත කර්මයි තව යනු අනුක්ත සම්ප්‍රදානයි භවති යන අධ්‍යාහෘතවර්ත- අක- කර්තෘ- පර-ප්‍ර- එ- ආ- ක්‍රියා පදයාහට සා යනු උක්ත ප්‍රකෘති කර්තෘයි තිරස්ක්‍රියා යනු උක්ත විකෘති කර්තෘයි තව යනු අනුක්ත සම්බන්ධයි.)

ජනඃ, ජනතෙමේ; මෘගාණාම්ඉව, (සිංහයන්ගෙ) මුවන් මැරීම මෙන්; කංසාදිමහීභෘතාං, කංසාදිවූ (අසුර)රජුන්ගේ; වධාත්, මැරීම හෙතුකොට ගෙණ; තව, යුෂ්මද්හට; ස්තවං කරොති, ස්තුතිකෙරෙයි යන; යත්, යමක් වේද; හරෙ, එම්බා ශ්‍රීකෘෂ්ණය නොහොත් සිංහය; සා, එ ස්තුතිතොම; හිරණ්‍යකාක්‍ෂපුරඃසර, එනම් අසුරෙන්ද්‍රයා පෙරටුකොට ඇති; අසුරවිප, අසුරයන් නමැති හස්තීන්; විෂං, නසන්නාවූ; තව, ඔබට; ප්‍රත්‍යුත, විපරීතභාවයෙන්; තිරස්ක්‍රියා, අවමානයෙකි.

(මහීම් බිභ්‍රතී'ති මහීභෘතඃ කංසඃ ආදි'යෙෂාම් තෙ කංසාදයඃ කංසාදය'ශ්ච තෙ මහීභෘතශ්චෙ'ති කංසාදිමහීභෘතඃ (තෙෂාම්) පුරො'ග්‍රෙ සරන්ති ගච්ඡන්තී'ති පුරඃසරාඃ හිරණ්‍යාක්‍ෂඃ පුරඃසරඃ යෙෂාං තෙ හිරණ්‍යාක්‍ෂපුරඃසරාඃ,තෙඑව විපාඃ=හිරණ්‍යාක්‍ෂපුරඃසරවිපානාම් විඩ්=(නස්‍ය) යනු සමාසයි ගජඝාතිනඃ සිංහස්‍ය මෘගවධවර්ණනම්'ව මහාසුරහන්තුස්තෙ'ව කංසාදික්‍ෂුද්‍ර නෘපවධවර්ණනං තිරස්කාර එවෙ ත්‍ය'ර්ථඃ යනු ටීකායි. **ශ්ලිෂ්ටරූපකමිශ්‍ර උපමාලංකාරයි.** (මෙසේ ශ්‍රීවිෂ්ණුහට ස්තුතිකොට එම ශ්‍රීවිෂ්ණුහු අභිමුඛකොට ශ්‍රීනාරද ඍෂි තෙම ආගමන ප්‍රයොජනය කියන්ට ආරම්භකෙරෙයි.

40. ප්‍රවෘත්ත එව ස්වය’මුජ්ඣිතශ්‍රමඃ
ක්‍රමේණ පේෂ්ටුං භුවනද්විෂාම’සි
තථා පි වාචාලතයා යුනක්ති මාං
මිථ’ස්ත්වදාභාෂණලොලුපං මනඃ.

41. තදි’න්ද්‍රසංදිෂ්ටමුපෙන්ද්‍ර යද්වචඃ
ක්ෂණං මයා විශ්වජනීනමු’ච්‍යතෙ
සමස්තකාර්‍ය්‍යේෂු ගතෙන ධූර්‍ය්‍යතා
මහිද්විෂ’ස්තද්භවතා නිශම්‍යතාම්.

---

40. (**ත්වම් භුවනද්විෂාම් පේෂ්ටුම් ප්‍රවෘත්තඃ අසි** යනුද **මනඃ මාං වාචාලතයා යුනක්ති** යනුද මෙහි ක්‍රි- යි. අසි, යන අස්භුවි ධාතු වර්ත- අක- කර්තෘ- පර- මධ්‍යම- ඒ- ආ- ක්‍රියා පදයාහට ත්වම් යනු අධ්‍යා-උක්තප්‍රකෘති කර්තෘයි ප්‍රවෘත්තඃ යනු උක්තවිකෘති කර්තෘයි භුවනද්විෂාම් යනු කර්මාර්ථ අනුක්ත සම්බන්ධයි පේෂ්ටුම් යනු පූර්වක්‍රියායි යුනක්ති යන- යුජ්- යොගෙ ධාතු වර්ත- කර්තෘ- පර- ප්‍ර- ඒ- ආඛ්‍යාත ක්‍රියා පදයාහට මනඃ යනු උක්ත කර්තෘයි මාං යනු අනුක්ත කර්මයි වාචාලතයා යනු සහාර්ථ අනුක්ත තෘතීයායි)

ත්වම්, ඔබ; උජ්ඣිතශ්‍රමඃ, දුරුකරණලද විඩාඇත්තේ; ක්‍රමේණ, පිළිවෙළින්; භුවනද්විෂාම්, ලොව පෙළන්නවුන්ට; පේෂ්ටුම්, හිංසා කිරීම පිනිස (ලොවට හිංසාකරන්නවුන් නසනු පිනිස යයි සේයි); ස්වයම් එව, තෙමේම හෙවත් අනුන් විසින් නොමෙහෙයන ලදුවම; ප්‍රවෘත්තඃ අසි, පැවැත්තේ වෙහිය; තථා’ පි, එසේද වුවත්; මිථඃ, රහසෙහි හෙවත් තනිව; ත්වත්ආභාෂණ, ඔබ හා සංලාපයෙහි; ලොලුපං, ලුබ්ධවූ හෙවත් ලොල්වූ; මනඃ, මාගෙසිත; මාං, අස්මද්හු; වාචාලතයා, දෙඩමලුබැව් සමග යුනක්ති’ සංයුක්ත කෙරෙයි; (මා දෙඩමලු කෙරෙයි සේයි)

උජ්ඣිතඃ ශ්‍රමඃ යෙනාසා’වුජ්ඣිතශ්‍රමඃ භුවනානි ද්විෂන්තී’ති භුවනද්විෂඃ (තෙෂාම්) වාචො බහ්ව්‍යො’ස්‍ය සන්තීති වාචාලඃ තස්‍ය භාවඃ (තයා) ත්වයා සහ ආභාෂණං ත්වදා’භාෂණං ත්වදා’භාෂණෙ ලොලුපං ත්වදාභාෂණලොලුපං යනු සමාසයි. (**ස්වභාවෝක්තියි**) (ඉක්බිතිව ස්වකීය වාක්‍ය ශ්‍රවණය හෙතු සහිතව නාරද ඍෂිතෙම ප්‍රාර්ථනා කෙරෙයි)

41. **මයා වචඃ උච්‍යතෙ** යනුද **භවතා තද්වචඃ නිශම්‍යතාම්** යනුද මෙහි ක්‍රි- යි. උච්‍යතෙ යන වච’ පරිභාෂණෙ ධාතු සක-කර්ම- වර්තමානලට් ආත්ම ප්‍ර- ඒ- ආ- ක්‍රියා පදයාහට මයා යනු අනුක්ත

42. අභූද'භූමිඃ ප්‍රතිපක්‍ෂජන්මනාං
භියාංතනූජ'ස්තපනද්‍යුතිර්දිතෙඃ
ය'මින්ද්‍රශබ්දාර්ථනිසූදනං හරෙර්
හිරණ්‍යපූර්වං කශිපුං ප්‍රචක්‍ෂතෙ.

---

කත්‍රීසි. යච්චඃ යනු උක්තකර්මසි නිශම්‍යතාම් යන නිපූර්ව ශම් ආලොචනෙ ධාතු ආශිඃ ප්‍රෙරණ ලොට් සක- කර්ම- ආත්ම- ප්‍ර- එ- අ - ක්‍රියා පදයාගට භවතා යනු අනුක්ත කත්‍රීසි තවචඃ යනු උක්තකර්මයි.

උපෙන්ද්‍ර, පිංවත් උපෙන්ද්‍රය (ශ්‍රීකෘෂ්ණය); යත්, එහෙයින්; ඉන්ද්‍ර සංදිෂ්ටං, (ශ්‍රවණයක්කටයුතුයයි) ඉන්ද්‍රයා විසින් දක්වනලද; විශ්වජනීනම්, හැමදෙනාට හිතවූ; යච්චඃ යම් බසක්; ක්‍ෂණම්, ඇසිල්ලක්; මයා, (නාරදනම්වූ) මා විසින්; උච්‍යතෙ, උසුරුවනු ලැබේද; (තවච; ඒබස) අභිචිෂඃ, වෘත්‍රනම් අසුර සතෘහුගේ හෙවත් ඉන්ද්‍රයාගේ; සමස්තකාර්‍ය්‍යෙෂු, සියලු කටයුතුවල; ධූර්‍ය්‍යතාම්, ධූරන්ධර බවට; ගතෙන, පැමිණියාවූ; භවතා, භවත්හු විසින්; නිශම්‍යතාම්, ශ්‍රවණය කරණු ලැබේවා.

(ඉන්ද්‍රෙණ සංදිෂ්ටම් ඉන්ද්‍රසංදිෂ්ටම් විශ්වෙභ්‍යො ජනාය හිතම් ඉති විශ්වජනීනම් සමස්තානි ච තානි කාර්‍ය්‍යාණි චේ'ති සමස්තකාර්‍ය්‍යාණි (තෙෂු) ධූරම් වහතීතිධූර්‍ය්‍යඃ තස්‍ය භාවො ධූර්‍ය්‍යතා (තාම්) අභෙඃ චිඩ් අභිචිඩ් (තස්‍ය) යනු විග්‍රහයි සඳුට'මත්‍ර පදාර්ථ හෙතුකං කාව්‍ය ලිඞ්ගමලඞ්කාරඃ යනු කී හෙයින් **කාව්‍යලිඞ්ගාලඞ්කාරයි**

(ඉක්බිති ශිශුපාල නැසියයුතුයයි කියන්ට ඔහුගේ අවශ්‍යයෙන් මැරියයුතු බැව්හි අන්‍යයෙකු විසින් නොමැරිය යුතුබැව් දන්වන උපාය ඇති බැවින් උඩහනාවය ප්‍රකටකිරීමට අන්‍ය ජන්මප්‍රවෘත්තිය ප්‍රථමකොට උපුටා දක්වයි යනු ටීකා වචනයි.)

**42. දිතෙඃ තනූජඃ අභූත්** යනුද **මුනයඃ යං කශිපුං ප්‍රචක්‍ෂතෙ** යනුද මෙහි ක්‍රි- සි. අභූත්, යන භූසා විලුඞ්- අක- කත්‍රී-පර-ප්‍ර-එ- අ- ක්‍රියා පදයාගට තනූජඃ යනු උක්ත කත්‍රීසි දිතෙඃ යනු අනුක්ත සම්බන්ධයි ප්‍රචක්‍ෂතෙ යන ප්‍රපූර්ව චක්‍ෂ කථනෙ ධාතු සක- කත්‍රී- ආත්ම- ප්‍ර- බ- අ- ක්‍රියා පදයාගට මුනයඃ යනු අධ්‍යාහෘත උක්ත කත්‍රීසි කශිපුං යනු අනුක්ත කර්මයි යං යනු කර්මවිශෙෂණයි.

ප්‍රතිපක්‍ෂජන්මනාම්, සතුරගෙන් ඉපදීමඇති; භියාම්, භීතින්ට; අභූමිඃ, භූමිනොවූ හෙවත් නිර්භයවූ; තපනද්‍යුතිඃ, සූර්‍ය්‍යයාට බඳු කාන්ති හෙවත් හිරුගෙන් මෙන් සන්තාප ඇති; දිතෙඃ, දිතිනම් තැනැත්තියගෙ (කාශ්‍යප මුනිහුගෙ භාර්‍ය්‍යාතොම දිතිනම්); තනූජඃ,

43. සමත්සරෙණා' සුරඉත්‍යුපෙයුෂා
චිරාය නාම්නඃ ප්‍රථමා'භිධෙයතාම්
භයස්‍ය පූර්වාවතර'ස්තරස්විනා
මනස්සු යෙන ද්‍යුසදාං න්‍යධීයත.

---

පුත්‍රයෙක් හෙවත් අසුරයෙක්; අභූත්, වූයේය; (හෙ කවරෙක්ද යත්) හරෙඃ, ශක්‍රයාගෙ; ඉන්ද්‍රශබ්දාර්ථනිසූදනං, ඉන්ද්‍ර'යන ශබ්දය සම්බන්ධවූ අර්ථය හෙවත් පරමෛශ්වර්‍ය්‍යය නසන්නාවූ; යං, යම් අසුරයෙකු; හිරණ්‍යපූර්වං, හිරණ්‍ය ශබ්දය පූර්වකොට ඇති; කශිපුං, කශිපුයයි; ප්‍රචක්ෂතෙ, කථනය කෙරෙද්ද; (හෙතෙමේයි)

ප්‍රතිපක්ෂාත් ජනම යාසාං තාඃ ප්‍රතිපක්ෂජන්මාඃ තාෂාම් තපන තස්‍ය ඉව ද්‍යුති'ර්‍යස්‍ය සඃ තපනද්‍යුතිඃ ඉන්දතීති ඉන්ද්‍රඃ ඉදි පරමෛශ්වර්‍ය්‍යෙ ඉන්ද්‍ර ඉති ශබ්දඃ ඉන්ද්‍රශබ්දඃ තස්‍යා'ර්ථො ඉන්ද්‍රශබ්දාර්ථඃ ඉන්ද්‍රශබ්දාර්ථස්‍ය නිසූදනඃ ඉන්ද්‍රශබ්දාර්ථනිසූදනඃ තම් හිරණ්‍යඃ පූර්වඃ යස්‍ය සඃ හිරණ්‍යපූර්වඃ (තම්) යනු විග්‍රහයි **ස්වභාවොක්තියි.**

43. **යෙන ද්‍යුසදාං භයස්‍ය පූර්වාවතරඃ න්‍යධීයත** යනු මෙහි ක්‍රි- යි. න්‍යධීයත යන නිපූර්ව ධාඤ් ධාරණපොෂණයොඃ ධාතු අන ද්‍යතනාතීතලඞ් සක- කර්- ආත්ම- ප්‍ර- එ- ආ- ක්‍රියා පදයාහට යෙන යනු අනුක්ත කර්තෲයි පූර්වාවතරඃ යනු උක්ත කර්මයි ද්‍යුසදාං යනුද භයස්‍ය යනුද අනුක්ත සම්බන්ධයි.

සමත්සරෙණ, මත්සර සහිතවූ හෙවත් අනුන් යහපත නොඉවසන්නාවූ; චිරාය, චිරකාලයක පටන්; අසුර ඉති, අසුර යන; නාම්නඃ, නාමයාගෙ; ප්‍රථමා'භිධෙයතාම්, පළමු කොට; වාච්‍යාර්ථ භාවයට හෙවත් අබ්‍යර්ථභාවයෙන් මුඛ්‍යාර්ථභාවයට; උපෙයුෂා, පැමිණියාවූ; තරස්විනා, බලවත්වූ; යෙන, යම් (හිරණ්‍යකශිපු නම්) අසුරයෙකු විසින්; ද්‍යුසදාං, දෙවියන්ගේ; මනස්සු, චිත්තයන්හි; භයස්‍ය, භය සම්බන්ධවූ; පූර්වාවතරඃ, ප්‍රථම ප්‍රවෙශය; න්‍යධීයත, පිහිටුවන ලද්දේද; (හෙතෙමේයි) (හිරණ්‍යකශිපු කෙරෙන් පළමුකොට දෙවියන්ට භයොත්පත්තිය වීයයි සේයි)

මත්සරෙණ සහ යඃ වර්තතෙ සඃ සමත්සරඃ (තෙන) ප්‍රථමං ච තත් අභිධෙයං චෙති ප්‍රථමාභිධෙයම් තස්‍ය භාවඃ (තාම්) පූර්වශ්ච සඃ අවතරශ්චෙ'ති පූර්වාවතරඃ දිවි සීදන්තී'ති ද්‍යුසදඃ (තෙෂාම්) යනු විග්‍රහයි **ස්වභාවොක්තියි. මුක්තකයි.**

44. දිශාම්'ධීශාං 'ශ්චතුරෝ' යතඃ සුරා
න්'පාස්‍යතං රාගහෘතාඃ ශිෂේවිරේ
අවාපු'රාරභ්‍ය තපාශ්චලා ඉති
ප්‍රවාද'මුච්චෛ' රයශස්කරං ශ්‍රියඃ.

45. පුරාණි දුර්ගාණි නිශාත'මායුධං
බලානි ශූරාණි ඝනාශ්ච කඤ්චුකාඃ
ස්වරූපශෝභෛ'කඵලානි නාකිනාං
ගණෛ'ර්‍යමාශඞ්ක්‍ය තදාදි චක්‍රිරේ.

---

44. **ශ්‍රියඃ සුරාන් අපාස්‍ය තම් ශිෂෙවිරෙ** යනුද **සුරාඃ ප්‍රවාදම් අවාපුඃ** යනුද මෙහි ක්‍රි- සි. ශිෂෙවිරෙ යන ෂෙවෘ ෂෙවනෙ ධාතු පරොක්‍ෂලිට් සක- කතෘ- ආතම- ප්‍ර- බ- ආ- ක්‍රියා පදයාහට ශ්‍රියඃ යනු උක්ත කතෘයි තම් යනු අනුක්ත කර්‍මයි අපාස්‍ය යන පෙරකිරියට සුරාන් යනු අනුක්ත කර්‍මයි අවාපුඃ යන අව පූර්‍ව් අප ප්‍රාපනෙ ධාතු සක- කතෘ- පරොක්‍ෂලිට්- පර ප්‍ර- බ- ආ- ක්‍රියා පදයාහට සුරාඃ යනු අධ්‍යාහෘත උක්ත කතෘයි ප්‍රවාදම් යනු අනුක්ත කර්‍මයි)

ශ්‍රියඃ, සම්පත්තිහුහුමූ; රාගහෘතාඃ, බලයෙන් නොව ඇල්මෙන් ආකර්‍ෂණය කරණලද්දවූ; යතඃ, යම්කලෙක්හි; දිශාමධීශාම්, දික් පතිවූ (දිගුන්ට අධිපතිවූ යයි සේයි); චතුරඃ සුරාන්, ඉන්ද්‍ර වරුණ යම කුවේර යන සිව් දෙවියන්; අපාස්‍ය, අත්හැර; තම්, එ හිරණ්‍ය කශිපු නම් අසුරයා; ශිෂෙවිරෙ, ශෙවනය කළාහුද; තතඃ ආරභ්‍ය, එදපටන්; අයශස්කරං, අපකීර්ත්තියට හෙතුවූ; උච්චෛඃ, බොහෝවූ; චලාඃ ඉති, ස්ථිරනොවෙත්ය යන; ප්‍රවාදම්, ජනාපවාදයට හෙවත් ගර්හාවට; අවාපුඃ, පැමිණියාහුද; ඉන්ද්‍රාදී චතුර් දිශාධිපයන්ගේ සකල ධනය හිරණ්‍යකශිපු විසින් පැහැරගත් හෙයින් උහුගේ ඖද්ධත්‍යය සම්බන්ධ ප්‍රකටභාවය වියයි සේයි.

(රාගෙන හෘතාඃ රාගහෘතාඃ අයශඃ (අපකීර්ත්තිං) කරොතී'ති අයශස්කරඃ (තම්)

45. **දෙවෛඃ පුරාණි දුර්ගාණි චක්‍රිරෙ** යනාදීන් මෙහි ක්‍රියා කාරක පදසම්බන්ධය එකාක්පාසා උක්තානම්මයන්ට අනුව යෙදිය යුතුයි. හැමතැනම දෙවෛඃ යි අනුක්ත කතෘ සම්බන්ධයි චක්‍රිරෙ යන තන්හි ඩුකෘඤ් කරණෙ ධාතු පරොක්‍ෂලිට් සක- කර්‍ම- ආතම- ප්‍ර- බ- ආ- ක්‍රියා පදයි මෙහි ප්‍රකෘති විකෘති වසයෙන් කර්‍මවයක් ගම්‍යමානයි)

46. ස සංචරිෂ්ණු,ර්භුවනාන්තරෙෂු යාං
යදෘච්ඡයා ශිශ්‍රිය'දාශ්‍රයඃ ශ්‍රියඃ
අකාරි තස්‍යෛ මුකුටො'පලස්ඛල
ත්කරෛ'ස්ත්‍රිසන්ධ්‍යං ත්‍රිදශෛ'ර්දිශෙ නමඃ

---

නාකිනාම්, දෙවියන් සම්බන්ධිවූ; ගණෛඃ, සමූහයන් විසින්; යං, යම් හිරණ්‍යකශිපු නමැත්තෙකු; ආශඞ්ක්‍ය, බාධකත්වයෙන් සලකා හෙවත් සැකකොට; තදා, එදා පටන්; සවරූපශොභෛ'ක පලානි, සවරූප ශොභාවම; (දෙවාදීන්ගේ) ප්‍රධාන ප්‍රයෝජනකොට ඇති (මින් ඉහත මෙබඳු අසාධ්‍ය සතුරෙකු නොවූ හෙයිනැයි සේයි) පුරාණි, (දෙවියන්ගේ) පුරයෝතුමූ; දුර්ගාණි, ප්‍රාකාර පරිඛාදීන් කරණකොටගෙණ දුකසේ යායුතු කරණලද්දහුද; ආයුධං, (එසේම ඔවුන්ගේ) ආයුධජාතය; නිශාතම්, (වඤ්‍ර) තියුණු කරණලද්දේද (මුවාත් කරණලදැයි සේයි); බලානි, සෛන්‍යයෝ ශූරාණි (වක්‍රරෙ) ශෞණ්ඩීවත්වූවෝ (දක්ෂවූවෝ) කරණලද්දහුදඃ සාන්ද්‍රකාඃ, සන්නා හයෝ හෙවත් ලොහමය සැට්ට; ඝනාඃ වක්‍රරෙ, ඝනවූවාහු කරණ ලද්දහුද (නොබිඳිය හැක්කාහු කරණ ලද්දහයි සේයි); (මෙබඳුවූ හිරණ්‍යකශිපු අසුරයායි)

(සවරූපා ච සා ශොභාචෙ'ති සවරූපශොභා එකාඤ්ච තත් ඵල ඤ්චෙ'ති එකඵලම් සවරූපශොභෛ'ව එකඵලං යෙෂාං තානි සවරූ පශොභෛකඵලානි ස කාලඃ ආදි'ර්ස්මිං 'සතදා යනු විග්‍රහයි)

46. සඃ (හිරණ්‍යකශිපුඃ) යාම් අශිශ්‍රියත් යනුද ත්‍රිදශෛඃ තස්‍යෛ දිශෙ නමඃ අකාරි යනුද මෙහි ක්‍රි- යි. අශිශ්‍රියත් යන ශ්‍රිඤ් ගතෞ ධාතු භූතාර්ථලුඞ් සක- කර්තෘ- පර- ප්‍ර- ඒ- ආ- ක්‍රියා පදයාහට සඃ යනු උක්ත කර්තෘයි යාම් යනු අනුක්ත කර්මයි අකාරි යන ඩුකෘඤ් කරණෙ ධාතු සක- කර්ම- භූතාර්ථලුඞ්- පර- ප්‍ර- ඒ- ආ- ක්‍රියා පදයාහට ත්‍රිදශෛඃ යනු අනුක්ත කර්තෘයි නමඃ යනු උක්ත කර්මයි දිශෙ යනු අනුක්ත සම්ප්‍රදානයි තස්‍යෛ යනු අනුක්ත සම්ප්‍රදාන විශෙෂණයි.)

භුවනාන්තරෙෂු, අන්‍ය ලොකයන්හි; සංචරිෂ්ණුඃ, හැසිරෙණ සුලුවූ; ශ්‍රියඃ, ලක්ෂ්මියට; ආශ්‍රයඃ, ආශ්‍රයවූ (හෙවත් ලක්ෂ්මියට නිවාස සථානවූ); සඃ, ඒ හිරණ්‍යකශිපුතෙම; යදෘච්ඡයා, සියකැමැත්තෙන්; යාම්, යම්දිගකට; අශිශ්‍රියත්, ගියේද; මුකුටොපල, කිරීට රතන යන්හි; ස්ඛලත් කරෛඃ, පැකිළෙන අත්ඇති (මස්තකයන්හි) බඳැ දිලිඇති යි සේයි); ත්‍රිදශෛඃ, දෙවියන් විසින්; (බාලකෞමාර යෞවන සඞ්ඛ්‍යාත අවස්ථාත්‍රය ඇති හෙයින් හෙවත් එම අවස්ථාත්‍ර

47. සටාච්ඡටාභින්නඝනෙන බිභ්‍රතා
නෘසිංහ සෛංහී'මතනුං තනුං ත්වයා
සමුග්ධකාන්තාස්තනසඞ්ගභඞ්ගුරෛ
'රුරොවිදාරං ප්‍රතිචස්කිරෙ නඛෛඃ.

---

යෙහි සමාතරූපී බැවින් දෙවියෝ ත්‍රිදශනම් වෙත්) තිසංඛ්‍යම්, තුන් සැන්දෑයෙහි; තසෙය දිශෙ, ඒ දිගට; නමඃ, නමස්කාරය; අකා , කරණලද්දේද; (මෙහි චකාහි සංඛ්‍යා නමස්කාරයෙහි) දිඞ්නියමය දුරුකොට හිරණ්‍යකශිපුනුගේ ආගමන භීතියෙන් ඒ දිගටම නම සකාර කරණලදූයි සේයි.)

(අන්‍යෙෂු භුවනෙෂු ඉති භුවනාන්තරෙෂු (අන්තරාණි ච තානි භුවනානි චේ'ති භුවනාන්තරාණි (තෙෂු) මුකුටෙෂු මුකුටානාම් වා උපලාඃ මුකුටොපලාඃ මුකුටොපලෙෂු ස්ඛලන්තඃ කරාඃ යෙෂාං තෙ (තෛඃ) තිස්‍රඃ සඞ්ඛ්‍යාඃ සමාහෘතාඃ ත්‍රිසඞ්ඛ්‍යම් (තම්) තිස්‍රො දශා යෙෂාං තෙ තිදශාඃ ත්‍රිදශපරිමාණමෙෂා'මිති වා ත්‍රිදශාඃ (තෛ) යනු විග්‍රහයි (ඉක්බිතිව ඒ හිරණ්‍යකශිපු අසුරයාද ඔබ විසින් නසන ලදූයි කියයි.)

47. **ත්වයා සඃ ප්‍රතිචස්කිරෙ** යනු මෙහි ක්‍රි- යි. ප්‍රතිචස්කිරෙ යන ප්‍රතිපූර්ව කිර හිංසායාම් ධාතු පරොක්ෂලිට් සහ- කර්ම- ආත්ම- ප්‍ර- බ- ආ- ක්‍රියා පදයාහට ත්වයා යනු අනුක්ත කර්තෘයි සඃ (හිරණ්‍ය කශිපුඃ) යනු උක්ත කර්මයි.)

නෘසිංහ, එංචත් නරසිංහය හෙවත් සිංහ සදෘශවූ නරය; සෛංහිම්, සිංහයා සම්බන්ධිවූ; අතනුං, තුනීනොවූ හෙවත් විස්තීර්ණවූ; තනුං, ශරීරයක්; බිභ්‍රතා, දරන්නාවූ (නෘසිංහාවතාරධාරීවූ යි සේයි) සටාච්ඡටා, (එහෙයින්ම) කෙශර සමූහවලින්; භින්න, බිඳිනලද්දවූ; ඝනෙන, මෙඝඇති හෙවත් අභ්‍රංකෂ විග්‍රහ බැවින් කෙශර සමූහ වලින් බිඳිනලද මෙඝ ඇති (අහස වළාකුළ් [illegible]ශීවන්නාවූ ශරීරය ඇති බැවින් යයි සේයි); ත්වයා, ඔබ විසින්; සඃ, එහිරණ්‍යකශිපුතෙම; මුග්ධකාන්තා, බොළඳවූ හෙවත් අභිනව කාන්තාවන්ගේ; ස්තනසඞ්ග, පියවුරු යුවලෙහි ඇලීමෙන්; භඞ්ගුරෛඃ, කුටිලවූ; නඛෛඃ, නිය වලින්; උරොවිදාරං, ළයපලා; ප්‍රතිචස්කිරෙ, නසනලදි (විදුරක්මෙන් ඝනවූ ශරීරය නියවලින් විදාරණය කරණලදි); (එහෙයින්ම) වාඞ් මනස් දෙකට අවිෂයවූ මහිමඇති ඔබ විසින් කුමක්නම් සිදුකළ නොහේද සියල්ලම සිදුකළ හැක්කේයයි සේයි.)

18. විනොදමිච්ඡන්න'ථ දර්පජන්මනො
'රණෙන කණ්ඩවා 'සත්‍රිදශෛඃ සමං පුනඃ
ස රාවණො නාම නිකාමභීෂණං
බභූව රක්ෂඃ ක්ෂතරක්ෂණං දිවඃ.

---

සටාණාම් ඡටාඃ සටාච්ඡටාඃ සටාච්ඡටාභිඃ භින්නාඃ ඝනාඃ යෙනා 'සෞ-(තෙන) නා වා'සෞ සිංහශ්චෙ'ති නෘසිංහඃ සිංහස්‍යෙ'මා සෛංහී (තාම්) මුග්ධා'ශ්ච තාඃ කාන්තාශ්චෙ'ති මුග්ධකාන්තාඃ තාෂාම් ස්තනෞ මුග්ධකාන්තාස්තනෞ තයොඃ සඞ්ගඃ මුග්ධකාන්තාස්තනසඞ්ගඃ තෙන භඞ්ගුරාඃ මුග්ධ=භඞ්ගුරාඃ (තෛඃ) යනු විග්‍රහයි.

(ඉක්බිති ඔහුගේ ජන්මාන්තර ප්‍රවෘත්තිය දක්වයි.)

18. **සඃ (හිරණ්‍යකශිපුඃ) රක්ෂඃ බභූව** යනු මෙහි ක්‍රි- යි. බභූව යන භූසත්තායාම් ධාතු අක- කර්තෘ- පරොක්ෂලිට් ප්‍ර- එ- ආ- ක්‍රියා පදයාහට සඃ යනු උක්ත ප්‍රකෘති කර්තෘයි රක්ෂඃ යනු උක්ත විකෘති කර්තෘයි.)

අථ, තදනන්තරව; සඃ, ඒ හිරණ්‍යකශිපුනම් අසුරතෙම; පුනඃ නැවතත්; ත්‍රිදශෛඃ, සමං දෙවියන් සමග; රණෙන, යුද්ධයෙන් හෙවත් සටන් කිරීමෙන්; දර්පජන්මනඃ, දර්පයෙන් හෙවත් ඇතුළත ශක්තියෙන් ඉපැද්ම ඇති; කණ්ඩවාඃ, බාහුයුගමය කැසිම්හුගේ; විනොදම්, පහකිරීම හෙවත් දුරුකිරීම; ඉච්ඡන්, කැමැත්තේ; දිවඃ, ස්වර්ගයාගේ; ක්ෂතරක්ෂණම්, නසනලද රැකුම්ඇති හෙවත් නැසිම රක්ෂාකොට ඇති (නසනලද සුරලොව රැකුම් ඇති යනු භාවයි); (මෙයින් දෙවියන් සතු ධනය පැහැරගත්බැව් සූචිතයි) නිකාමභීෂණම්, ඒකාන්තයෙන් බිහිසුණුවූ; රාවණඃ, නාම රවුළුනම්; රක්ෂඃ බභූව, රකුසෙක් වූයේල; (රාක්ෂස යෝනියෙහි උපන් ඒ හිරණ්‍යකශිපු තෙමේ මැයි.)

දර්පාදන්තස්සාරාජ්ජන්ම යස්‍යාඃ සා (තස්‍යාඃ) ත්‍රිස්‍රො දශාඃ යෙෂාම් තෙ ත්‍රිදශාඃ (තෛඃ) භීෂයත ඉති භීෂණඃ නිකාමං භීෂණඃ නිකාමභීෂණඃ (තම්) විශ්‍රවසො'පත්‍යම් පුමාන් රාවණඃ, විශ්‍රවසො විශ්‍රවණ රවණෞ ඉති ප්‍රකෘතෙරවණාදෙශඃ (ලොකාන්)රාවයතී'ති වා රාවණඃ යනුද විග්‍රහයි (ස්වර්ගස්‍ය) ක්ෂතං (නෂ්ටං) රක්ෂණං (රක්ෂා) යෙන තත් ක්ෂතරක්ෂණම්' ඉක්බිති ඒ රාවණගෙ උද්ධතභාවය 18 ශ්ලොක අෂ්ටාදශයකින් දක්වයි.

49. ප්‍රභු'ර්බුභූ'ෂුර්භුවනත්‍රයස්‍ය යඃ
ශිරෝ'තිරාගා'ද්දශමං චිකර්තිෂුඃ
අතර්කය'ච්ඡින්නම්'වෝත්සාහසඃ
ප්‍රසාද'මිච්ඡාසදෘශං පිනාකිනඃ.

50. සමුත්ක්ෂිපන්‍යඃ පෘථිවීභෘතාං වරං
වරප්‍රදානස්‍ය චකාර ශූලිනඃ
ත්‍රසත්තුෂාරා'ද්‍රිසුතා සසංභ්‍රම
ස්වයංග්‍රහා'ශ්ලෙෂසුඛෙන නිෂ්ක්‍රයම්.

---

49. **යඃ පිනාකිනඃ ප්‍රසාදං ඡින්නම්'ව අතර්කයත්** යනු මෙහි ක්‍රි- සි. අතර්කයත් යන තර්ක් විතර්කේ ධාතු අනද්‍යතනාතීත ලඞ්- සක- කර්තෘ - පර- ප්‍ර- එ- ආ- ක්‍රියා පදයාහට යඃ (රාවණඃ) යනු උක්ත කර්තෘයි ප්‍රසාදම් යනු අනුක්ත කර්මයි ඡින්නම්ව යනු තදුප මාන විශෙෂණයි පිනාකිනඃ යනු අනුක්තසම්බන්ධයි.)

යඃ, යම් රාවණ නම් රකුසෙක්තෙම; භුවනත්‍රයස්‍ය, ස්වර්ගමර්ත්‍ය පාතාල සඞ්ඛ්‍යාත ජගත්‍රයට; ප්‍රභුඃ බභූෂුඃ, ස්වාමීවනු කැමැත්තේ; අතිරාගාත්, උත්සාහයෙන් (ඵලප්‍රමාදයට සාලකිරීමක් නැතිහෙයින් යයි සේයි); දශමඃ ශිරං, දශවෙනිවූ ශීර්ෂය; චිකර්තිෂුඃ, සිඳිනු කැමැත්තේ; ඉෂ්ටසාහසඃ, ප්‍රියයා කෙරෙහි දරුණුවූයේ; ඉච්ඡාසදෘශම්, එහෙයින්ම ඉච්ඡානුරූපවූ; පිනාකිනඃ, මෙහෙසුරුගේ; ප්‍රසාදම්, වරය; ඡින්නම් ඉව, උවදුරක් මෙන්; අතර්කයත්, සැලකීද?

(මෙහි යඃ යන පදය සරාවණෝ නාම රක්ෂො බභූව යන්නත් සමග ශ්ලෝක ෂඞ්කයෙහිම යෙදිය යුතුයි. මෙහි සමාස යටකී නයින් සුබොධයි.

50. **යඃ (රාවණඃ) නිෂ්ක්‍රයම් චකාර** යනු මෙහි ක්‍රි- සි. චකාර යන ඩුකෘඤ් කරණෙ ධාතු සක- කර්තෘ- පරොක්ෂලිට් ප්‍ර- එ- ආ- ක්‍රිය පදයාහට යඃ (රාවණඃ යනු උක්ත කර්තෘයි නිෂ්ක්‍රයම් යනු අනුක්ත කර්මයි.)

යඃ, යම් රාවණයෙක් තෙම; පෘථිවීභෘතාං, පර්වතයන් අතුරෙන්; වරම්, උත්තම පර්වතය (හෙවත් කෛලාශය); දර්පාත්, දර්පය හෙතු කොටගෙණ; සමුත්ක්ෂිපන්, ඔසවන්නේ; ශූලිනඃ, මෙහෙසුරුගෙ; වරප්‍රදානස්‍ය, ප්‍රසාදසංඛ්‍යාත වරදීම සම්බන්ධව; ත්‍රසත්, පර්වතචලනය කාරණකොටගෙණ තැතිගත්තාවූ හෙවත් ත්‍රස්තවන්නාවූ; තුෂාරාද්‍රි සුතා, හිමවත් පර්වතය සම්බන්ධ දුහිතෘහුගේ හෙවත් පාර්වතියගෙ; සසංභ්‍රමං, වේගසහිතවූ; ස්වයංග්‍රහ, ස්වකීය කණ්ඨග්‍රහණය හෙවත්

51. පුරී'මවස්කන්ද ලුනීහි නන්දනං
මුෂාණ රත්නානි හරා'මරාඞ්ගනාඃ
විගෘහ්‍ය චක්‍රෙ නමුචිද්විෂාබලී
ය ඉත්ථ'මස්වාස්ථ්‍ය' මහර්දිවං දිවඃ.

---

ප්‍රියයාගේ ප්‍රාර්ථනා නැතිව තමාම කණ්ඨග්‍රහණයෙන්; ආශ්ලෙෂ සුඛෙන, වැලඳගැන්මෙන්වූ සැපයෙන්; නිෂ්ක්‍රයං, ප්‍රත්‍යුපකාරය (හෙවත් එයින් නික්මීම) චකාර, කොළේද; (සරුවණෝ නාම රක්ෂඃ බහුව යනු හා සම්බන්ධ කටයුතු) මෙහි වනාහි නිෂ්ක්‍රයං චකාර යනු වෙන් සුඛද්‍ත වරදත දෙක සම්බන්ධවූ හුවමාරුව හෙතුකොටගෙණ යාඥදෙෂදිනඛය පිරිසුදු කෙළේයයි ටීකාවෙහි නිදර්ශිතයි (මේ සමු ත්ක්ෂිප්තඃ යනාදි පද්‍යයෙන් ඒ රාවණයා විසින් කෛලාශපර්වතය උත්ක්ෂෙපනය කළ ප්‍රවෘත්තිය ප්‍රකාශිතයි.)

(පෘථ්වීං බිභර්ති ධාරයති පාලයති තිවා පෘථ්වීභෘත් තෙෂාම්) වරස්‍ය ප්‍රදත ා වරප්‍රදතම් (තස්‍ය) තුෂාරෝ'ස්‍යඅස්තීති තුෂාරඃ තුෂාරශ්චාසා'වද්‍රිශ්චෙ'ති තුෂාරාද්‍රිඃ තස්‍ය සුතාඃ= ත්‍රසත් ච සා අද්‍රිසුතා චෙ'ති ත්‍රසත්=සුතා තස්‍යාඃ–ස–සංභ්‍රමඃ යඃ ස්වයං ග්‍රහඃ තුෂාරාද්‍රිසුතාස සම්භ්‍රමස්වයංග්‍රහඃ තෙන ආශ්ලෙෂඃ තුෂාරාද්‍රි= ස්වයංග්‍රහා ශ්ලෙෂඃ තෙන (ජනිතම්) යත් සුඛං(තෙන) යනු මෙහි සැකෙවින් විග්‍රහක්‍රමයයි මෙහි සුඛදත වරදත දෙදෙනාගෙ හුවමාරුව හෙතුකොටගෙණ **පරිවෘත්ති අලඞ්කාරයි.**

51. **යඃ පුරිං අවස්කන්ද** යනුද **යඃ නන්දනං ලුනීහි** යනුද **යඃ රත්නානි මුෂාණ** යනුද **යඃ අමරාඞ්ගනාඃ හර** යනුද **යඃ ඉත්ථං දිවඃ අස්වාස්ථ්‍යම් චක්‍ර** යනුද මෙහි වෙන් වෙන් වසයෙන් ක්‍රි– යි. මෙහි සියලුම ක්‍රියා පදයන්ට යඃ රාවණඃ යනු උක්ත කර්තෘයි ඒ ඒ ක්‍රියානුකූලවසයෙන් පුරිම් නන්දනං යනාදිය අනුක්ත කර්මයි ලුඞ් ඡෙදනෙ මුෂ ස්තෙයෙ හෘඤ් හරණෙ ඩුකෘඤ් කරණෙ යනු පිළිවෙළින් ක්‍රියා පදයන්ගේ ධාතුහු වෙති සකර්මකයි කර්තෘකාරකයෙහි සිඬයි)

යඃ, යම් රවුලෙක්හෙම; නමුචිවිෂා, ඉන්ද්‍රයා හා; විගෘහ්‍ය, විරුඬව; පුරිම්, අමරාවතීනම් දෙව්නුවර; අවස්කන්ද, අවහිර කෙළේද හෙවත් වටලාගත්තේද; නන්දනං, නන්දනොද්‍යානය; ලුනීහි, සින්දේද; රත්නානි, මිණිරුවන් හෙවත් ශ්‍රෙෂ්ඨ වස්තූන්; මුෂාණ, සොර කම් කරගත්තේද; අමරාඞ්ගනාඃ, දෙවඟණන්; හර, පැහැරගත්තේද; ඉත්ථං, මේ ප්‍රකාරයෙන්; අහර්දිවම්, දවසක්පාසා; දිවඃ, ස්වර්ලෝකයට; අස්වාස්ථ්‍යම්, සැප රහිතබව හෙවත් උපද්‍රවය; චකාර, කෙළේද; (ඒ රාවණයායි) මෙහි කරුණු කීපයක් පිඩුකොට කී හෙයින් **සමුච්චයාලඞ්කාරය.**

52. ස ලීලයාතානි' න භර්තුරභ්‍රමො
'ර්න චිත්‍රමුච්චෛඃ ශ්‍රවසඃ පදක්‍රමම්
අනුද්‍රුතඃ සංයති යෙන කෙවලං
බලස්‍ය ශත්‍රුඃ ප්‍රශශංස ශීඝ්‍රතාම්.

53. අශක්නුවන් සොඪු'මධීරලොචනඃ
සහස්‍රරශ්මෙ'රිව යස්‍ය දර්ශනම්
ප්‍රවිශ්‍ය හෙමා'ද්‍රිගුහා ගෘහාන්තරං
නිනාය බිභ්‍ය'ද්දිවසානි කෞශිකඃ.

---

52. **සඃ සලීලයාතානි නප්‍රශශංස** යනුද **සඃ පදක්‍රමං නප්‍රශශංස** යනුද **සඃ ශීඝ්‍රතාම් ප්‍රශශංස** යනුද මෙහි ක්‍රි- යි. නප්‍රශශංස යන පරොක්ෂලිට් සක- කර්තෘ- පර- ප්‍ර- ඒ- ආ- ක්‍රියා පදයාහට සඃ යනු උක්ත කර්තෘයි සලීලයාතානි යනුද පදක්‍රම යනුද ශීඝ්‍රතාම් යනුද වෙන වෙනම අනුක්ත කර්මයි.

සංයති, යුඬයෙහි; යෙන, යම්රාවණයෙකු විසින්; අනුද්‍රුතඃ අනුධාවනය කරණලද්දාවූ; බලස්‍ය, බලනම් අසුරයාගේ; ශත්‍රුඃ, සතුරු හෙවත් ශක්‍රතෙම; අභ්‍රමොඃ, බැමනැති සවාමිනුගෙ හෙවත් ඓරාවතයාගෙ; සලීලයාතානි, ලීලා සහිත ගමන් හෙවත් ගමන විලාස යන්ට; නප්‍රශශංස, නොපැසසිද; (එසේම) උච්චෛඃ ශ්‍රවසඃ උච්චෛඃශ්‍රවස්නම්, සවකිය අස්හුගේ, චිත්‍රම්, විසිතුරුවූ හෙවත් නන්වැදෑරුම්වූ; පදක්‍රමං, පාදවික්ෂෙපයට හෙවත් ගමන් විලාසයට; නප්‍රශශංස, නොපැසසිද; කෙවලං, හුදෙක්; සීඝ්‍රතාම්, ශීඝ්‍රගාමිභාවයටම හෙවත් වහායන ගමනට පමණක්ම පැසසිද.

(ස රාවණො නාම රක්ෂො බභූව යනු හා සම්බන්ධ කටයුතු) සහ ලීලයා වර්තනෙත'ති සලීලා'නි සලීලානි ච තානි යාතානි චෙ'ති සලීලයාතානි පදස්‍ය ක්‍රමඃ පදක්‍රමඃ (නම්) ශීඝ්‍රස්‍ය භාවඃ ශීඝ්‍රතා නාම් යනු විග්‍රහයි.

53. (**කෞශිකඃ යස්‍ය දර්ශනං අශක්නුවන් දිවසානි නිනාය** යනු මෙහි ක්‍රි- යි. නිනාය යන නීඤ් ප්‍රාපනෙ ධාතු පරොක්ෂලිට් සක- කර්තෘ- පර- ප්‍ර- ඒ- ආ- ක්‍රියා පදයාහට කෞශිකඃ යනු උක්ත කර්තෘයි දිවසානි යනු අනුක්ත කර්මයි සොඪුම් යන පූර්ව ක්‍රියා පදයාහට දර්ශනම් යනු අනුක්ත කර්මයි යස්‍ය යනු අනුක්ත සම්බන්ධයි අශක්නුවන් යන අක- කෘදන්ත ක්‍රියා පදයාහට කෞශිකඃ යනුම උක්ත කර්තෘයි)

අධීරලොචනඃ, ධීරනොවූ හෙවත් චංචලවූ ඇස් ඇති; කෞශිකඃ, මහෙන්ද්‍රතෙම ද්‍රෝ හෝ නොහොත් බකමූනුතෙම; සහස්‍රරශ්මෙඃ ඉව, සූර්‍ය්‍යයාගේ දර්ශනයමෙන්; යස්‍ය, යම් රාවණයෙකුගේ; දර්ශනම්,

54. බෘහච්ඡිලානිෂ්ඨුරකණ්ඨඝට්ටනා
'විකීර්ණලෝලාග්නිකණං සුරද්විෂඃ
ජගත්ප්‍ර'භොරප්‍රසහිෂ්ණු වෛෂ්ණවං
න චක්‍රමස්‍යා'ක්‍රමතා'ධිකන්ධරම්.

---

දුඃඛම; සොඪුම්, ඉවසන්ට; අසක්නුවන්, නොහැකිවන්නේ; හෙමාද්‍රි ගුහා, රන්ගිරිලෙන් තමැති; ගෘහාභ්‍යන්තරම්, ගේතුලට; ප්‍රවිශ්‍ය, පිවිස; බිභ්‍යත්, එහිදු බියවන්නේ හෙවත් වෙව්ලමින්; දිවසානි, දින යන්; නිනාය, ගෙව්වේද (යැවිද)

(ස රාවණො නාම රක්‍ෂො බභූව යනු හා සම්බන්ධ කටයුතුයි) හෙම චා සා ච'ද්‍රිශ්චෙති හෙමාද්‍රිඃ හෙමාද්‍රෙඃ ගුහා එව ගෘහම් හෙමාද්‍රිගුහාගෘහම් තස්‍යාන්තරඃ (තම්) (මෙහි සෙසු සමාස සුබොධ හෙයින් අනිදර්ශිතයි දතයුතුයි)

54. (**චක්‍රම් යස්‍ය සුරද්විෂඃ අධිකන්ධරං න අක්‍රමත** යනු මෙහි ක්‍රි- යි. න අක්‍රමත යන නඤ් පූර්ව ක්‍රම ගතෞ ධාතු- සක- කර්තෘ- භූතාවූ ලබ්ධ ආත්ම- ප්‍ර- එ- ආ- ක්‍රියා පදයාහට චක්‍රම් යනු උක්ත කර්තෘයි අධිකන්ධරම් යනු ආධාරාවූ අනුක්ත කර්මයි සුරද්විෂඃ යනු අනුක්ත සම්බන්ධයි අස්‍ය යනු සම්බන්ධ විශෙෂණයි.)

බෘහත්, මහත්වූ; ශිලා, ශෛලයක් මෙන්; නිෂ්ඨුර, ඝනබද්ධවූ හෙවත් කර්කශවූ; කණ්ඨ, ග්‍රීවයෙහි; ඝට්ටනාත්, හැපීමෙන් හෙවත් ගැටීමෙන්; විකීර්ණ, විසුරුණාවූ; ලොල, චඤ්චලවූ; අග්නිකණං, ගිනි පුපුරු ඇති; අප්‍රසහිෂ්ණු, එහෙයින්ම නොයිවසිය හැකිවූ; වෛෂ්ණවං, විෂ්ණු සම්බන්ධිවූ; චක්‍රම්, චක්‍රායුධය හෙවත් සුදර්ශන නම් ආයුධය; ජගත්ප්‍රභොඃ, ලොකයාහට ප්‍රභූවූ හෙවත් ස්වාමිවූ; අස්‍යසුරද්විෂඃ, ඒ දෙවසතෘහුගෙ හෙවත් රාවණගෙ; අධිකන්ධරම්, බොටු වෙහි (බෙල්ලෙහි); නඅක්‍රමත, නොපැමිණියේය හෙවත් ප්‍රතිහත නොවූයේය.

(නිෂ්ඨුරශ්ච සඃ කණ්ඨශ්චෙ'ති නිෂ්ඨුරකණ්ඨඃ බෘහත් ශිලෙව නිෂ්ඨුරකණ්ඨඃ බෘහත්ශිලා නිෂ්ඨුරකණ්ඨඃ තස්මින් ඝට්ටනම් වෘහච්ඡිලා- ඝට්ටනං තස්මාත් අග්නීනාම් කණාඃ අග්නිකණාඃ විකීර්ණාඃ ලොලාඃ අග්නිකණාඃ යස්‍ය තත් විකීර්ණලොලාග්නිකණම් (තම්) සුරානාම්විඩ් සුරද්විඩ් (තස්‍ය) ජගතඃ ප්‍රභුඃ ජගත්ප්‍රභුඃ (තස්‍ය) න ප්‍රසහිෂ්ණුඃ අප්‍රසහිෂ්ණුඃ (තම්) විෂ්ණොරිද'මිති වෛෂ්ණවං (තම්) කන්ධරායා'මධි අධිකන්ධරම් විභක්ත්‍යර්ථෙ' බ්‍යයීභාවඃ ඉතිඅබ්‍යයීභාවඃ)

55. විභින්නශඞ්ඛඃකලු'ෂීභවන්මුහු
ර්මදෙනදන්තීවමනුෂ්‍යධර්මණඃ
නිරස්තගාම්භීර්‍ය්‍යමපාස්තපුෂ්පකං
ප්‍රකම්පයාමාස නමානසංනසඃ.

56. රණෙෂු තස්‍ය ප්‍රහිතාඃ ප්‍රචෙතසා
සරොෂහුංකාරපරාඞ්මුඛීකෘතාඃ
ප්‍රහර්තු'රෙවො'රගරාජරජ්ජවො
ජවෙන කණ්ඨඃ සභයාඃ ප්‍රපෙදිරේ.

---

55. **සඃ මනුෂ්‍යධර්මණඃ මානසං න ප්‍රකම්පයාමාස න** යනු මෙහි ක්‍රි- යි. නප්‍රකම්පයාමාසන යන ආඛ්‍යාත නකාරයුක්ත කපිචලනෙ ධාතු හා අස් භුවි ධාතු අනුප්‍රයොග ආම්ප්‍රත්‍යයසහිත පරොක්ෂලිට් සක- කර්තෘකාරක ප්‍රයොජ්‍යක්‍රියා පදයාහට සඃ යනු උක්තකර්තෘයි මානසං යනු අනුක්ත කර්මයි මනුෂ්‍ය ධර්මණඃ යනු අනුක්තසම්බන්ධයි.

සඃ, ඒ රාවණ තෙම; මදෙන, දර්පය කරණකොටගෙණ දේ හෝ නොහොත් හස්තිමදය කරණකොටගෙණ; දන්තී ඉව, හස්තියෙකු මෙන්; විභින්න, විශෙෂයෙන් බිඳුනාලද හෙවත් ගටනාලද; ශඞ්ඛඃ, ශඞ්ඛ නම් නිධි ඇත්තේ දේ හෝ නොහොත් කොපුල් ඇත්තේ; කලුෂීභවන්, කිලිටිවන්නාවූ හෙවත් කැලතුනාවූ (බොරවූයයි සේයි) නිරස්තගාම්භීර්‍ය්‍යම්, පහකළ ගැඹුරුබැව් ඇති දේ හෝ නොහොත් අවිකාරිත්වය ඇති; අපාස්තපුෂ්පකං, පහකළ පුෂ්ප ඇති දේ හෝ නොහොත් විමන් ඇති; මනුෂ්‍ය ධර්මණඃ, මනුෂ්‍ය ස්වභාව ඇත්තහුගෙ හෙවත් කුවේරයාගේ; මානසං, සිත දේ හෝ නොහොත් මානසනම් විල; මුහුඃ, එකණෙහි හෙවත් වරක්; නප්‍රකම්පයාමාසන, කම්පනය නොකරවූයේ නොවෙයි (වෙවුලවූයේම යයි සේයි); කුවෙරයාගෙ වනාහි මිනිසුන්ගේ මෙන් ශ්මශෘලත්වාදිය හෙතුකොට ගෙණ හේ මනුෂ්‍යධර්මීන් නමි.

විභින්නඃ (විඝට්ටිතඃ) ශඞ්ඛඃ යෙනා'සෞ විභින්නශඞ්ඛඃ අකලුෂං කලුෂං භවිෂ්‍යති'ති කලුෂීභවන් දන්තාඃ අස්‍යා'ස්තීති දන්තී මනුෂ්‍යස්‍යෙ'ව ධර්මඃ යස්‍යාසෞ මනුෂ්‍යධර්මා (තස්‍ය) නිරස්තං ගාම්භීර්‍ය්‍යම් (අවිකාරිත්වං අගාධත්වං ච) යස්‍ය තත් නිරතිස්තගාම්භීර්‍ය්‍යම් (අපාස්තානි පුෂ්පාණි පුෂ්පකං විමානංච) යස්මාත් තත් අපාස්තපුෂ්පකං (නම්) **ශ්ලෙෂාලඞ්කාරයි.**

56. (**උරගරාජරජ්ජවඃ ප්‍රහර්තුඃ කණ්ඨම් ප්‍රපෙදිරෙ** යනු මෙහි ක්‍රි- යි. ප්‍රපෙදිරෙ යන ප්‍රපූර්ව පද් ගතෞ ධාතු පරොක්ෂලිට් සක- කර්තෘ-ආත්ම-ප්‍ර-බහු ආ-ක්‍රියාපදයාහට උරගරාජරජ්ජවඃ යනු උක්ත කර්තෘයි කණ්ඨම් යනු අනුක්ත කර්මයි ප්‍රහර්තුඃ යනු අනුක්තසම්බන්ධයි)

57. පරේතභර්තුර්මහිෂෝ'මුනා ධනු
ර්විධාතුමුත්ඛාතවිෂාණමණ්ඩලඃ
හතෙ පි භාරෙ මහත'ස්ත්‍රපාභරා
'දුවාහ දුඃඛෙන භෘශානතං ශිරඃ.

---

රණේෂු, යුඩයන්හි; ප්‍රචේතසා, වරුණ දෙවයා විසින්; ප්‍රහිතාඃ, මෙහෙයන ලදුවූ; උරගරාජරජ්ජවඃ, නාගරාජ නමැති රැහැන්හු (පාශයෝ යි සේයි); තස්‍ය, ඒ රාවණගෙ; සරොෂහුංකාර, කෝප සහිත හුංකාරයෙන්; පරඩිම්බීකෘතාඃ, පරාඩිම්බ කරණලද්දාහු; සභයාඃ, එහෙයින්ම බිය සහිතවූවාහු; ජවෙන, වේගයෙන්; ප්‍රභතීඃ, ප්‍රහාර කර්තෘවූ ප්‍රචෙතස්හුගේම හෙවත් වරුණ දෙවයාගේම; කණ්ඨම්, ග්‍රීවයට; ප්‍රපෙදිරෙ, පැමිණියාහුය.

(රොෂෙණ සහ වර්තත ඉති සරොෂඃ සරොෂශ්චා'සෞ හුංකාර ශ්චේ'ති සරොෂහුංකාරඃ අපරාඩිම්බං පරාඩිම්බං කෘතවන්තඃ ඉති= සරොෂහුංකාරෙණ පරාඩිම්බී කෘතාඃ සරොෂ=කෘතාඃ උරගානාම් රාජා උරගරාජඃ උරගරාජානඃ එව රජ්ජවඃ උරගරාජරජ්ජවඃ භයෙන සහ වර්තන්තෙ ඉති සභයාඃ යනු සමාසයි (**ශ්ලේෂාලංකාරය**)

57. **මහිෂඃ ශිරඃ දුඃඛෙන උවාහ** යනු මෙහි ක්‍රි- යි. උවාහ යන වහ ප්‍රාපනෙ ධාතු පරොක්ෂලිට් ඝත- කර්තෘ පර - ප්‍ර- එ- ආ- ක්‍රියා පදයාහට මහිෂඃ යනු උක්ත කර්තෘයි ශිරඃ යනු අනුක්ත කර්මයි දුඃඛෙන යනු ක්‍රියා විශෙෂණයි)

අමුනා, ඒ රාවණයා විසින්; ධනුං, ශෘඞ්ගවිකෘතවූ දුන්න හෙවත් මැඩනගු දුන්න; විධාතුං, නිර්මාණය කරන්ට; උත්ඛාත, උපුටනලද; විෂාණමණ්ඩලඃ, අං මඩුලුඇති හෙවත් අං නට්ටුව ඇති; පරේත භර්තුඃ, යමයාගෙ; මහිෂඃ, මීමා හෙවත් යමවාහනයවූ මහිෂතෙම; භාරෙ, ශෘඞ්ගභාරය; අපහෘතෙ අපි, හැර සිටි කල්හිද; මහතඃ, මහත්වූ; ත්‍රපාභරාත්, ලජ්ජාභාරයෙන් හෙවත් ර්ටත්වඩා; දුර්ධරවූ, හිතිභාරයෙන් (ඉසිලිය නොහැකි බරඇති බැවින්යයි සේයි); භෘශා නතං, අතිශයින් නම්නවූ; ශිරඃ, ශීර්ෂය; දුඃඛෙන, දුකසේ; උවාහ, උච්හනය කළේය (ඉසුලුවේය).

පරේතස්‍ය භර්තා පරේතභර්තා (තස්‍ය) විෂාණයො'ර්මණ්ඩලං විෂාණමණ්ඩලං උත්ඛාතං විෂාණමණ්ඩලං යස්‍ය (යෙනවා) සඃ උත්ඛාතවිෂාණ මණ්ඩලඃ ත්‍රපායාඃ භරඃ ත්‍රපාභරඃ (තස්මාත්) භෘශම් ආනතම් භෘශානතම් (තම්) යනු සමාසයි **උත්ප්‍රෙක්ෂාලංකාරයි**.

58. ත්‍රසන් සශඞ්කඃ සමයෙ ශුචාව'පි
ස්ථිතඃ කරාග්‍රෛ' රසමග්‍රපාතිභිඃ
අඝර්මඝර්මෝ'දකබින්දුමෞක්තිකෛ
'රලංචකාරා'ස්‍ය වධූර'හස්කරඃ.

59. කලාසමග්‍රෙණ ගෘහානමුඤ්චතා
මනස්විනීරුත්කයිතුං පටීයසා
විලාසින'ස්තස්‍ය විතන්වතා රතිං
න නර්මසාචිව්‍ය'මකාරි නේ'න්දුනා.

---

58. (**අහස්කරඃ අස්‍ය වධූඃ අලංචකාර** යනු මෙහි ක්‍රි- සි. අලංචකාර යන අලම් ශබ්දෝ'පපද ඩුකෘඤ් කරණෙ ධාතු නිෂ්පන්න පරෝක්ෂලිට් ස්‍ථා- කර්තෘ- පර- ප්‍ර- ඒ- ආ- ක්‍රියා පදයාහට අහස්කර යනු උක්ත කර්තෘයි වධූඃ යනු අනුක්ත කර්මයි අස්‍ය යනු අනුක්තසම්බන්ධයි)

අහස්කරඃ, දිනකරතෙමේ හෙවත් සූර්‍ය්‍යතෙම; ශුචෞ, සමයෙ; අපි, ග්‍රීෂ්මකාලයෙහිත් හෙවත් නොනසනලද ආචාරයෙහි; ස්ථිතඃ, සිටියේ; අසමග්‍රපාතිභිඃ, සමග්‍රපාතී නොවූ හෙවත් සම්පූර්ණයෙන් හකුලුවනලද පැවතුම් ඇති; කරාග්‍රෛඃ, රශ්මග්‍රවලින් ද්‍ය හෝ නොහොත් හස්තාග්‍රවලින්; සශඞ්කඃ, සැක සහිතව; ත්‍රසන්, ත්‍රාසි කරන්නේ හෙවත් අවිශ්වාස භය හෙතුකොට ගෙණ සැක සහිතව ත්‍රාසි කරන්නේ; අඝර්ම, උෂ්ණ නොවූ; ඝර්මෝදකබින්දු, ස්වේදජලබින්දු නමැති; මෞක්තිකෛඃ, මුක්තා ඵලවලින්; අස්‍ය, ඒ රාවණගෙ; වධූඃ, කාන්තාවන්; අලංචකාර, සැරසුයේය.

ශඞ්කයා සහ යඃ වර්ත්තතෙ ස සශඞ්කඃ කරාණාමග්‍රාඃ කරාග්‍රාඃ (තෛඃ)න සමග්‍රෝ'සමග්‍රඃ අසමග්‍රස්‍ය පාතඃඅ'සමග්‍රපාතඃ අසමග්‍රපාත ඒ'ෂාම'ස්තීති අසමග්‍රපාතිනඃ (තෛඃ) න ඝර්මෝ'ඝර්මඃ උදකානාම් බින්දවඃ= ඝර්මා'ජ්ජාතාඃ උදකබින්දවඃ ඝර්මෝදකබින්දවඃ අඝර්මාශ්ච තෙ ඝර්මෝදකබින්දවශ්චෙති= තෙ ඒව මෞක්තිකාඃ අඝර්ම=මෞක්තිකාඃ (තෛඃ) මේ පද්‍යය **සාමාන්‍යාකෘති අලඞ්කාරයි.**

59. (**ඉන්දුනා තස්‍ය නර්මසාචිව්‍යම් න අකාරි න** යනු මෙහි ක්‍රි- සි. නඅකාරින යන ආද්‍යන්තයන්හි නඤ් නිපාතප්‍රයුක්ත භූතා ර්ථලුඞ් ස්‍යා- කර්ම- පර- ප්‍ර- ඒ- ආ- ක්‍රියා පදයාහට ඉන්දුනා යනු අනුක්ත කර්තෘයි නර්මසාචිව්‍යම් යනු උක්ත කර්මයි තස්‍ය යනු අනුක්ත සම්බන්ධයි.)

කලාසමග්‍රෙණ, ෂෝඩශ කලාවලින් හා ශිල්පවිද්‍යාවලින්ද සම්පූර්ණවූ; ගෘහානමුඤ්චතා, ගෘහයන් නොමුදන්නාවූ හෙවත් දණ්ඩභයින් හා සෙවා ධර්මයෙන් හැමකල්හිම ඒ ගෘහයන්හි වසන්නාවූ;

60. විදග්ධලීලෝ'චිත–දන්තපත්‍රිකා
විධිත්සයා නූනම්'නෙන මානිනා
න ජාතු වෛනායක'මේකමු'ද්ධෘතං
විෂාණම්'ද්‍යා'පි පුනඃ ප්‍රරොහති.

---

මනස්විනී, අභිමානවත් සත්‍රීන්; උත්කසිතුං, උත්සා[illegible]තාවන් කරන්ට හෙවත් කලකිරුණු තැනැත්තියන් කරන්ට; පටීයසා, අතිශයින් දක්‍ෂවූ; (කුමකින්ද යත්?) රතිං, අභිරතිය හෙවත් ඇල්ම; විතන්වතා, වර්ධනය කරන්නාවූ (සඳකැලුමෙන් හා චතුරොක්තියෙන් රාගය වඩන්නාවූ යයි සේයි) ඉන්දුනා, චන්ද්‍රයා විසින්; විලාසිනඃ, විලසත පුලුවූ; තස්‍ය, එ රවුල්හුගේ; නර්මසාචිව්‍යම්, ක්‍රීඩා සම්බන්ධවූ ඇමතිබව හෙවත් ක්‍රීඩාධිකාරත්වයෙහි චෙෂ්ටා සහිතබව; න අකාරි න නොකරණ ලද්දේ නොවෙයි.

සංභාව්‍ය නිෂෙධ නිවර්තිතතෙ නඤ්ද්වයම් යනු වාමනොක්ති හෙයින් මෙහි නඤ්නිපාතද්වයක් ප්‍රයුක්තයි කලාභිඃ (ශිල්පවිද්‍යාභිශ්ච සමග්‍රඃ කලාසමග්‍රඃ (තෙන) මෙහි අවශෙෂ සමාස සුබොධයි **ශ්ලෙෂාලඞ්කාරයි**.

61. **වෛනායකං ඒකං විෂාණම් අද්‍ය'පි න ප්‍රරොහති** යනු මෙහි ක්‍රි–සි. න ප්‍රරොහති යන නඤ්යුක්ත ප්‍රපූර්ව රුහ ප්‍රාදුර්භාවෙ ධාතු වර්තමානලට් අන කර්තෘ– පර– ප්‍ර– ඒ– ආ– ක්‍රියා පදයාහට විෂාණම් යනු උක්ත කර්තෘයි වෛනායකං යනුද ඒකං යනුද උක්ත කර්තෘ විශෙෂණ යෝයි.

මානිනා, අභිමානවත්වූ; අනෙන, මේ රාවණයා විසින්; විදග්ධ ලීලොචිත, දක්‍ෂවූ විලාසිනීන්ට හෙවත් කාන්තාවන්ට යොග්‍යවූ; දන්තපත්‍රිකා කර්ණාභරණයන්; විධිත්සයා, කරණු කැමැත්තෙන්; නූනම්, ඒකාන්තයෙන්; ජාතු, කිසිකලෙක්හි; උද්ධෘතං, උදුරණලද; වෛනායකම්, ගණෙශ්වරයා සම්බන්ධිවූ: ඒකං විෂාණම්, එකම දත; අද්‍යාපි, අදදක්වාත්; පුනඃ, නැවත; න ප්‍රරොහති, හටනොගණියි; (මෙබඳු වික්‍රමාන්විතවූ රාවණ විසින් නොකටහැකි අන්‍ය කාර්‍ය්‍යය කිමෙක්දැයි යනු භාවයි.)

විදග්ධා'ශ්ච තාඃ ලීලාශ්චෙ'ති විදග්ධලීලාඃ තාෂාම් උචිතාඃ විදග්ධ ලීලෝ'චිතාඃ දන්තාඃ ඉව ශුභ්‍රාඃ පත්‍රිකාඃ (කර්ණාභරණානි) දන්ත පත්‍රිකාඃ– විධාතුම් ඉච්ඡා විධිත්සා විදග්ධලීලොචිතාශ්ච තාඃ දන්ත පත්‍රිකාශ්චෙති විදග්ධ=පත්‍රිකාඃ තාසාං විධිත්සා විදග්ධ=පත්‍රිකාවිධිත්සා (තයා) යනු සමාසයි **උත්ප්‍රෙක්‍ෂායි.**

61. නිශාන්තනාරී පරිධානධූනන
‘ස්ඵුටාගසාප්‍යූ’රුෂු ලොලචක්ෂුෂඃ
ප්‍රියෙණ තස්‍යා ‘නපරාධබාධිතාඃ
ප්‍රකම්පනෙනා’ නු චකම්පිරෙ සුරාඃ.

62. තිරස්කෘත‘ස්තස්‍ය ජනාභි‘භාවිනො
මූහුර්මහිම්නා’ මහසාං මහීයසාම්
බභාර බාෂ්පෛ‘ර්ද්විගුණීකෘතං තනු
‘ස්තනූනපා‘ද්ධූමවිතා නමා‘ධිජෛඃ.

---

61. **ප්‍රකම්පනෙන සුරාඃ අනුචකම්පිරෙ** යනු මෙහි ක්‍රි- සි. අනුචකම්පිරෙ යන අනුපූර්ව කම්පි චලනෙ ධාතු පරොක්‍ෂලිට් සක- කර්- ප්‍ර- බ- ආ- ක්‍රියා පදයාහට සුරාඃ යනු උක්ත කර්මයි අනෙන යනු අනුක්ත කරණය හෝ කර්තෘයි නොහොත් අනුචකම්පිරෙ යන ස්වයම් කර්තෘ ස්වයම් කර්ම ක්‍රියා පදයාහට සුරාඃ යනු ස්වයං කර්තෘ ස්වයං කර්මයි ප්‍රකම්පනෙන යනු අනුක්තකරණයි)

නිශාන්තනාරී, ගෘහයෙහිවූ අඟනන්ගේ හෙවත් අන්තඃපුර ස්ත්‍රීන්ගේ; පරිධාන, යටහඳනා වස්ත්‍රයන්; ධූනන, කම්පාකිරීමෙන් හෙවත් චාලනයෙන්; ස්ඵුටාගසා අපි, ප්‍රකට අපරාධ ඇත්තාවූද (අන්තඃපුරයට ද්‍රොහකිරීම සම්බන්ධවූ මහත් අපරාධවත් බැවින් යයි සේයි); ඌරුෂු, ඒ අන්තඃපුර ස්ත්‍රීන්ගේ ඌරුයුගමයන්හි; ලොලචක්ෂුසා, ලොල්වූ හෙවත් ආසා සහිතවූ ඇස් ඇති; තස්‍ය, ඒ රවු ලාගෙ හෙවත් රවුලාට; ප්‍රියෙණ, ප්‍රියවූ (ප්‍රමොදයට හෙතුවූ යී සේයි) ප්‍රකම්පනෙන, වාතය විසින් හෙවත් වාතය කරණකොට ගෙණ; අනපරාධබාධිතඃ, අපරාධා භාවයෙහි පෙළෙනලද; සුරාඃ, දෙවියෝ; අනුචකම්පිරෙ, අනුගතව කම්පාකරණ ලද්දහුය.

නිශා යාම්‍යතෙ සම ඉති නිශාන්තම් නිශා ශබ්දො‘පපද අම ගත්‍යොඃ නිශාන්තෙන නාර්‍ය්‍යඃ නිශාන්තනාර්‍ය්‍යඃ (ශුද්ධාන්තස්ත්‍රියඃ ඉත්‍යර්ථඃ) තාසාං පරිධානානි (අන්තරීයාණි-) තෙෂාම් ධූනනම් නිශාන්ත-ධූන නම් ස්ඵුටං අගං පාපං යෙෂාම් තෙ- ස්ඵුටාගාඃ නිශාන්තනාරී පරි ධාන ධූනනෙන ස්ඵුටාගාඃ නිශාන්ත=ස්ඵුටාගාඃ (තෙන) ලොලෙ චක්ෂුෂී යස්‍ය සඃ ලොලචක්ෂුඃ (තස්‍ය) අපරාධෙ බාධිතාඃ අපරාධබාධි තාඃ යනු සමාසයි **ස්වභාවොක්ති අලඞ්කාරය**

62. **තනූනපාත් ධූමවිතානං බභාර** යනු මෙහි ක්‍රි- සි. බභාර යන භෘඤ් ධාරණපොෂණයොඃ ධාතු පරොක්‍ෂලිට් සක- කර්තෘ- පර- ප්‍ර- ඒ- ආ- ක්‍රියා පදයාහට තනූනපාත් යනු උක්ත කර්තෘයි ධූමවි තානං යනු අනුක්ත කර්මයි)

63\. පරස්‍ය මර්මාවිධමුජ්ඣතාං නිජං
ද්විජිහ්වතාදෝෂම'ජිහ්මගාමිභිඃ
ත'මිද්ධමාරාධයිතුං සකර්ණකෛඃ
කුලෛර්'නිභේජේ ඵණිනාං භුජඞ්ගතා.

---

තස්‍ය, ඒ රවුල්නුගෙ; ජනාභිභාවිනා, දනන් මැඩලන සුලුවූ; මහීයසාම්, අතිශයින් මහත්වූ; මහසාම්, තේජසුන්ගේ; මහිම්නා, මහිමයෙන්; මුහුඃ, වරක් හෙවත් ක්ෂණ ක්ෂණයෙහි; තිරස්කෘතඃ, පරදවන ලද්දවූ හෙවත් අවුරණලද්දවූ; තනුඃ, (එහෙයින්ම) තුනීවූ; තනූනපාත්, වහ්නි තෙමේ; ආධිජෛඃ, දුකින් උපන්නාවූ; බාෂ්පෛඃ, කඳුලුවලින් හෙවත් නිඃශ්වාසමාරුතයෙන්; විගුණීකෘතම්, දෙගුණකරණලද; ධූමවිතානං, දුම්මඬුල්ල; බභාර, දැරුවේය.

(ජනා'න්‍යභිභවති ශීලෙනා'ති ජනාභිභාවී (තෙන) මහතො භාවඃ මහිම (න්) තෙන අතිශයෙන මහාන්තී'ති=(තෙෂාම්) ද්වෞ ගුණෞ යස්‍ය සඃ විගුණඃ අවිගුණං විගුණං කෘතවාන්'ති විගුණීකෘතං තනුං නපාතයති ජඨරරූපෙන ශරීරං ධාරයතී'ති තනූනපාත් ධූමස්‍ය ධූමානාම් වා විතානඃ ධූමවිතානඃ (තම්) යනු විග්‍රහයි මේ පද්‍යයද **අතිශයෝක්තිනම් අලඞ්කාරයි මුක්තකයි**

63\. **ඵණිනාම් කුලෛඃ භුජංගතා න භෙජෙ** යනු මෙහි ක්‍රි–සි. නභෙජෙ යන නඤ් නිපාතප්‍රයුක්ත භජ සෙවායාම් ධාතු පරොක්ෂලිට් ස ං– කර්‍ම– ආත්ම– ප්‍ර– එ– ආ– ක්‍රියා පදයාහට කුලෛඃ යනු අනුක්ත කර්තෘයි භුජංගතා යනු උක්තකර්මයි ඵණිනාම් යනු අනුක්ත සම්බන්ධයි)

ඉද්ධම්, උග්‍රවූ හෙවත් සමෘද්ධවූ; තම්, ඒ රවුලා; ආරාධයිතුං, වසඟ කරන්ට හෙවත් සතුටුකර ගැණීම පිණිස (සෙවාකරන්නු පිණිස යී සේයි); පරස්‍ය මෙරමාගෙ; මර්මාවිධම්, හෘදයාදි මර්මස්ථාන බිඳින් නාවූ ද්‍රේ හෝ නොහොත් කුලාචාර ව්‍රතයන් බිඳින්නාවූ; නිජම්, ස්වකීයවූ; ද්විජිහ්වතාදෝෂං, සර්පභාවයෙහි දළවිෂ යනාදි දෝෂය ද්‍රේ හෝ නොහොත් කෙලාම් බස් කිනීම් ස්වභාවයාගේ දෝෂය; උජ්ඣතාම්, පහකරන්නාවූ; ඵණිනාම්, නාගයන්ගේ, අජිහ්මගාමිභිඃ, ඍජු ගමන් ඇත්තාවූ ද්‍රේ හෝ නොහොත් කපටචාරිනොවූ (වෞරාචාර නැතිවූ යී සේයි); සකර්ණකෛඃ චක්ෂුඃ ශ්‍රවණත්වය හැර දෙකන් සහිතවූ ද්‍රේ හෝ නොහොත් සියල්ල අසන්නේය යනාර්ථයෙන් යනෘයයි කියනලද නියාමකයන් සහිතවූ (පහළකරගත් කන් ඇත්තාවූ යී සේයි); ඵණිනාම් කුලෛඃ, නාගවර්ගයන්(සමූහයන්)විසින්; භුජඞ්ගතා, සර්පභාවය ද්‍රේ හෝ නොහොත් ධූර්තභාවය (දුදනබව යී සේයි); නභෙජේ, භජනය නොකරණ ලද්දේය (අත්නොහරිනලදූයි සේයි)

64. තදීයමාතඞ්ගඝටා විඝට්ටිතෛඃ
කටස්ථලප්‍රොෂිතදානවාරිභිඃ
ගෘහීතදික්කෛ' රපුනර්නිවර්තිභි
'ශ්චිරස්‍ය යාථාර්ථ්‍යම'ලම්භි දිග්ගජෛඃ.

---

(මර්මාණි කුලාචාරව්‍රතානි ච විධ්‍යන්ති භිනත්තී'ති මර්මාවිත් (තම්) ද්වෙ ජිහ්වෙ යෙෂාම් තෙ විජිහ්වාඃ විජිහ්වානාම් භාවඃ විජිහ්වතා සා එව දෙෂඃ විජිහ්වතාදෙෂඃ (තම්) ජිහ්මං ගච්ඡන්ති ශීලෙනා'ති ජිහ්මගාමිනඃ න ජිහ්මගාමිනඃ අජිහ්මගාමිනඃ (තෛඃ) කර්ණාභ්‍යාම් සහ වර්තන්ත ඉති සකර්ණකාඃ (තෛඃ) ඵණාඃ එ'ෂාමසන්තී'ති ඵණිනඃ තෙෂාම් භුජෛ'ර්ගච්ඡන්තී'ති භුජංගාඃ භුජංගානාම් භාවො භුජංගතා යනු විග්‍රහයි **සමාසොක්තියි**.

64. **දිග්ගජෛඃ යාථාර්ථ්‍යම් අලම්භි** යනු මෙහි ක්‍රි- යි. අලම්භි යන ලභ ලාභෙ ධාතු භූතාර්ථලුඞ් සක- කර්- ආත්ම- ප්‍ර- එ ආ- ක්‍රියා පදයාගට දිග්ගජෛඃ යනු අනුක්ත කර්තෘයි යාථාර්ථ්‍යම් යනු උක්ත කර්මයි.

තදීය, ඒ රවුලා පිළිබඳවූ; මාතඞ්ගඝටා, ගජසමූහයා විසින්; විඝට්ටිතෛඃ, වෙසෙසින් ගටනාලද්දවූ හෙවත් තළනලද්දවූ; කටස්ථල, කපොලස්ථලයන්ගෙන් (කම්මුල් වලින් යයි සේයි); ප්‍රොෂිත, වැගිරෙන්නාවූ; දානවාරිභිඃ, මදදිය ඇත්තාවූ; ගෘහීතදික්කෛඃ, ගත්තාලද දිශාවන් ඇති හෙවත් ඇසුරුකරගත් දිගුන් ඇති; අපුනර්නිවර්තිභිඃ, නැවත ඊමක් නැත්තාවූ හෙවත් භයින් එහිම නැවතී සිටි නසුලුවූ; දිග්ගජෛඃ, දිශාලක්ෂණ හස්තීන් විසින් (දිගැතුන් විසින් යි සේයි); චිරස්‍ය, බොහො කලකට; යාථාර්ථ්‍යම්, යථාර්ථභාවය හෙවත් දික්ෂු ස්ථිතා ගජාඃ දිග්ගජාඃ යන අන්වර්ථනාම ඇතිබව; අලම්භි, ලබන ලද්දේය.

(තස්‍ය ඉදම් තදීයම් මාතඞ්ගානාම් ඝටාඃ මාතඞ්ගඝටාඃ මාතඞ්ගඝටාභිඃ විඝට්ටිතාඃ=(තෛඃ) කටානාම් ස්ථලානි කටස්ථලානි කටස්ථලෙභ්‍යඃ ප්‍රොෂිතානි කටස්ථප්‍රොෂිතානි කටස්ථලප්‍රොෂිතානි ච තානි දානවාරීණි චෙ'ති= (තෛ) ගෘහීතාඃ (සංශ්‍රිතාඃ) දිශො යෛසෙත ගෘහීතදික්කාඃ (තෛඃ) පුනඃ නිවර්තන්ති ශීලෙනා'ති පුනර්නිවර්තිනඃ න පුනර්නිවර්තිනඃ අපුනර්නිවර්තිනඃ (තෛඃ) දිශඃ එව ගජාඃ දික්ෂු ස්ථිතාඃ ගජාඃ වා දිග්ගජාඃ (තෛඃ) යථා ප්‍රවෘත්තඃ අර්ථඃ යථාර්ථඃ තස්‍ය භාවඃ යාථාර්ථ්‍යම් යනු විග්‍රහයි **රූපකසංකීර්ණ ස්වභාවොක්තියි**.

65. අභීක්ෂණමු'ෂ්ණෛර'පි සෝ'ෂ්මණඃ සුරෙ
න්ද්‍රබන්දීශ්වසිතා' නිලෛ ර්‍යථා
ස චන්දනාම්භඃකණකොමලෛ'ස්තථා
වපු'ර්ජලාර්ද්‍රාපවනෛ'ර්න නිර්වවෞ.

66. තපෙන වර්ෂාඃ ශරදා හිමාගමො
වසන්තලක්ෂ්ම්‍යා ශිශිරඃ සමෙත්‍ය ච
ප්‍රසූනක්ලෘප්තිං දධතඃ සද'ර්තවඃ
පුරෙ'ස්‍ය වාස්තව්‍යකු ම්බිතාං යයුඃ.

---

65. **තස්‍ය වපුඃ න නිර්වවෞ** යනු මෙහි ක්‍රි- යි. නිර්වවෞ යන නිර්පූර්ව වා ගතිගන්ධනයොඃ ධාතු පරොක්ෂලිට් අක- නිරුත්සාහගත නොහොත් සවයම් කර්තෘ සවයම් කාම් ප්‍ර- ඒ- අා- ක්‍රියා පදයාහට වපුඃ යනු උක්ත කර්තෘයි තස්‍ය යනු අනුක්ත සම්බන්ධයි.

සොෂ්මණඃ, උෂ්ණසුම් සහිතවූ හෙවත් කාමජ්වර සහිතවූ; තස්‍ය, ඒ රවුලාංගේ; වපුඃ, ශරීරය තෙම; අභීක්ෂණං, නිතර හෙවත් අත්‍යර්ථයෙන්, උෂ්ණෛඃ අපි, ශොකය හෙතුකොටගෙණ උෂ්ණවූද; සුරෙන්ද්‍රබන්දී, ශක්‍ර භාර්‍ය්‍යාවන්ගෙ හෙවත් සුරෙන්ද්‍රයා විසින් වන්දීකරණ ලද ස්ත්‍රීන්ගේ; ශ්වසිතානිලෛඃ, නිඃශ්වාස මාරුතවලින්; යථා, යම් සේ; නිර්වවෞ, නිවුනේද; තථා, එසේ; ස චන්දනාම්භඃකණ, සඳුන් දියබිඳුන් සහිතවූ; කොමලෛඃ, මොලොක්වූ; ජලද්‍රාපවනෛඃ, දියෙන්තෙත්වූ හෙවත් දියඉසින ලද තල්වට පවනින්ද; නනිර්වවෞ, නොනිවුනේය.

සුරාණා'මින්ද්‍රඃ සුරෙන්ද්‍රඃ සුරෙන්ද්‍රස්‍ය වන්ද්‍යඃ (වන්දීකෘතාඃ) (ස්ත්‍රියඃ) සුරෙන්ද්‍රවන්ද්‍යඃ ශ්වසිතාශ්වතෙ අනිලාශ්වෙති = සුරෙන්ද්‍රවන්දීනාම් ශ්වසිතානිලාඃ=(තෛඃ) අම්භසාං කණාඃ අම්භඃ කණාඃ චන්දනෛඃ සහ වර්තන්තෙ ඉති සචන්දනාඃ ස චන්දනාශ්ච තෙ අම්භඃ කණාශ්චෙ'ති- සචන්දනාම්භඃකණාශ්ච තෙ කොමලාශ්චෙ'ති= (තෛඃ) ජලෙන ආර්ද්‍රාඃ ජලාර්ද්‍රාඃ ජලාර්ද්‍රාශ්ච තෙ පවනාශ්චෙ'ති=(තෛඃ) අත්‍ර ස තපනස්‍යා 'ෂ්ණො' පචාරාන්නිර්වෘති'රිති කාරණ විරුද්ධකාර්‍යො'ත්පත්ති රූපොවිෂමා'ලංකාරඃ යනු ටීකා හෙයින් විෂමාලංකාර හෙවත් විරොධාලංකාරයි.

66. **සදර්තවඃ වාස්තව්‍යකුටුම්බිතාම් යයුඃ** යනු මෙහි ක්‍රි- යි. යයුඃ යන යා ප්‍රාපණෙ ධාතු පරොක්ෂලිට් සක- කර්තෘ- පර- ප්‍ර- ඒ- අා- ක්‍රියා පදයාහට සදර්තවඃ යනු උක්ත කර්තෘයි වාස්තව්‍යකුටුම්බිතාම් යනු අනුක්ත කර්මයි.

67. අමානවං ජාතම'ජං කුලෙ මනොඃ
ප්‍රභාවිනං භාවිනමන්තමා'ත්මනඃ
මුමොච ජානන්න'පි ජානකීං න යඃ
සදා'භිමානෛකධනා හි මානිනඃ.

---

**සදා**, හැමකල්හි; **ප්‍රසූනක්ලුප්තිං**, පුෂ්පසම්පත්තිය; **දධතඃ**, දරන්නාවූ; **ඍතවඃ**, ඍතූහු (කෙසේ සම්ප්‍රාප්තවූවාහුද යත්?); **වර්ෂාඃ**, වර්ෂා ඍතූහු හෙවත් ප්‍රාවෘට් ඍතුව; **තපෙන**, ග්‍රීෂ්ම ඍතුව සමගද; **හිමාගමං**, හිමවත් ඍතුව; **ශරද**, ශරත් ඍතුව සමගද; **ශිශිරං**, ශිශිර ඍතුව; **වසන්තලක්ෂ්මයාව**, වසන්ත ඍතුශ්‍රීය සමගදූයි; **සමෙත්‍ය**, මෙසේ එකතුව; **අස්‍ය**, ඒ රවුලාගේ; **පුරෙ**, නගරයෙහි; **වාස්තව්‍ය කුටිම්බිතාං**, වාසයකරණ කෙළෙඹියන් බවට; **යයුඃ**, පැමිණියාහුය.

(හිමස්‍ය ආගමඃ හිමාගමඃ වසන්තස්‍ය ලක්ෂ්මීඃ වසන්ත ලක්ෂ්මීඃ (තයා) ප්‍රසූනානාම් ක්ලුප්තිඃ (සම්පත්තිඃ)–(තාම්) වසන්තී'ති වාස්තව්‍යාඃ 'වසෙස්තව්‍යත්කර්තරිණිච්ච' යන සූත්‍රයෙන් මෙහි තව්‍යත් ප්‍රත්‍යයයි, කුටුම්බමෙ'ෂාමස්තීති කුටුම්බිනඃ වාස්තව්‍යාශ්ච තෙ කුටුම්බිනශ්ච'ති=තෙෂාම් භාවඃ (තාම්) යනු විග්‍රහයි **අතිශයෝක්ති අලංකාරයි.**

67. යඃ (රාවණඃ) **ජානකීං නමුමොච** යනු මෙහි ක්‍රි- යි. න මුමොච යන නඤ් නිපාතප්‍රයුක්ත මුච ත්‍යාගෙ ධාතු පරොක්ෂලිට් සකර්තෘ පර- ප්‍ර- එ- අා- ක්‍රියා පදයාහට යඃ (රාවණ) යනු උක්ත කර්තෘයි ජානකීං යනු අනුක්ත කර්මයි.

**අමානවං**, මනුෂ්‍ය සම්බන්ධි නොවූ හෙවත් අමානුෂවූ; **අජං**, නූපදනාවූ; **මනොඃ**, එසේද වුවත් මනුහුගේ; **කුලෙ**, කුලයෙහි (පරිශුද්ධ මනුරාජ වංශයෙහි); **ජාතං**, රාමස්වරූපයෙන් උපන්නාවූ; **ප්‍රභාවිනං**, මහත් ආනුභාව ඇත්තාවූ භවත්හු; **ආත්මනඃ**, තමාගෙ; **අන්තම්**, කෙළවර හෙවත් මරණය කරන්නහු යයි; **භාවිනං**, මත්තෙහිද වන ස්වභාව ඇත්තහු; **ජානන් අපි**, දන්නාවූද; **යඃ**, යම් රවුලෙක්; **ජානකීං**, ජනකනම් රජුගේ දුව හෙවත් සීතාව; **නමුමොච**, නොමිදුවේද (කුමක් හෙයින්ද යත්?); **හි**, යම් හෙයකින්; **මානිනඃ**, අභිමානය ඇත්තෝ හෙවත් අහංකාරබැව් ඇත්තාහු; **සදා**, සියලු කල්හි (ජීවිත හානිය වන කල්හිදූයි සේයි); **අභිමානෛකධනාඃ**, අභිමානයම ප්‍රධාන වස්තුව කොට ඇත්තෝද? එහෙයිනි.

68. ස්මරත්‍ය'දො දාශරථි'ර්භවන්භවා
'නමූං වනාන්තා' වනිතා'පහාරිණම්
පයොධිමා'බද්ධචලජ්ජලා'විලං
විලඞ්ඝ්‍ය ලඞ්කාං නිකෂා හනිෂ්‍යති.

---

(මනො රයම් මානවඃ න මානවඃ අමානවඃ (නම්) නාස්ති ජෝජනම යස්‍ය සඃ අජඃ න ජායත ඉත්‍ය'ජඃ (නම්) ප්‍රභාවො'ස්‍යාස්ති'ති ප්‍රභාවී (නම්) ජනකස්‍යා'පත්‍යම්'ස්ත්‍රී ජානකී (නාම්) අභිමාන එවෛකං (මුඛ්‍යම්) ධනම් යෙෂාම් තෙ අභිමානෛකධනාඃ මානඑ'ෂාම ස්තීති මානිනඃ **අර්ථාන්තරන්‍යාස නම් අලඞ්කාරයි.**

68. **දශරථිඃ අමුං හනිෂ්‍යති** යනුද **භවාන් අදඃ ස්මරති** යනුද මෙහි ක්‍රි- යි. හනිෂ්‍යති යන හන් හිංසායාම් ධාතු භූතකාලභවිෂ්‍යන් ලෘට් සක කර්තෘ පර- ප්‍ර- ඒ- ආ- ක්‍රියා පදයාහට දශරථිඃ යනු උක්ත කර්තෘයි අමුං යනු අනුක්ත කර්මයි ස්මරති යන ස්මෘ චින්තායාම් ධාතු සක කර්තෘ වර්තමානලට් පර- ප්‍ර- ඒ- ආ- ක්‍රියා පදයාහට භවාන් යනු උක්ත කර්තෘයි අදඃ යනු අනුක්ත කර්මයි.

භවාන්, බබලන්නාවූ; දශරථිඃ භවාන්, (පින්වත් තෙමේ) දශරථ රජුගේ පුත්‍ර වෙමින් (රාමකුමාර වෙමින් යි සේයි): වනාන්තාත්, දණ්ඩකාරණ්‍යයෙන්; වනිතා'පහාරිණං, (ජනකරාජ පුත්‍රීවූ) සීතා කාන්තාව පැහැරගන්නාවූ; අමූං, මේ රවුල්හු; ආබද්ධ, හාත්පසින් බඳනාලද (හෙලූ පර්වතවලින්බඳනාලද හේ ඇති යි සේයි); චලජ්ජල, සැලෙන්නාවූ දියඇති; ආවිලම්, එහෙයින්ම කැළඹුනාවූ; පයොධිම්, මහසයුර; විලඞ්ඝ්‍ය, ඉක්මවා; ලංකාං නිකෂා, ශ්‍රී ලඞ්කාවිප සමීපයෙහිදී; හනිෂ්‍යති, නැසුවේය; අදඃ, ඒ නැසීම; භවාන්, පිංවත්තෙමේ ස්මරති, සිහිකෙරෙයි (කිම ඔබ දන්නෙහිදැයි සේයි.)

දශරථස්‍යා'පත්‍යම් පුමාන් දාශරථිඃ වනමෙ'ව වනාන්තම් (තස්මාත්) වනිතා'මපහරති ශීලෙනා'ති වනිතාපහාරී (නම්) චලන්ති ජලානි යස්‍ය සඃ චලජ්ජලඃ (ප්‍රක්ෂිප්තා'ද්‍රිභිර්බද්ධසෙතු'රිති) ආබද්ධඃ ආබද්ධශ්චා සෞ චලජ්ජලශ්චෙ'ති= (තෙන) අතඑව ආවිලශ්චෙ'ති ආබද්ධ=විලඃ (නම්) (මෙහි හනිෂ්‍යති යනු අතීතාර්ථයෙහි ලෘට් විභක්ති බැව් සැලකිය යුතුයි) අභිඥවචනෙලෘට් ඉති භූතෙ ලෘට් යනු නිදර්ශනයි භවාන් යන්නට භාතීති භවාන් කියා භා දීප්තෞ ධාතුවෙන් ඩවතු ප්‍රත්‍යය වූහෙයින් බබලන්නාවූ යන අර්ථය ගතයුතුය යනු ටීකාමතයි.

69. අථො'පපත්තිං ඡලනාපරෙ පරා
'මවාප්‍ය ශෛලූෂඉවෛ'ෂභූමිකාම්
තිරොහිතාත්මා ශිශුපාලසඥයා
ප්‍රතීයතෙ සංප්‍රති සො'ප්‍යසඃ පරෛඃ.

70. ස බාලආසී'ද්වපුෂා චතුර්භුජෝ
මුඛෙන පූර්ණේ'න්දුනිභ'ස්ත්‍රිලොචනඃ
යුවා කරාක්‍රාන්තමහීභෘ'දුච්චකෛ
'රසංශයං සංප්‍රති තෙජසා රවිඃ.

---

69. **එෂඃ අපරාං උපපත්තිං අවාප්‍ය පරෛඃ අසඃ ප්‍රතීයතෙ** යනු මෙහි ක්‍රි- යි. ප්‍රතීයතෙ යන ප්‍රතිපූර්ව ඉණ් ගතෞ ධාතු වත්- සක- කර්- ආත්ම- ප්‍ර- එ- අා- ක්‍රියා පදයාහට පරෛඃ යනු අනුක්ත කර්තෘයි එෂඃ යනු උක්ත ප්‍රකෘති කර්මයි අසඃ යනු උක්ත විකෘති කර්මයි අවාප්‍ය යන පෙරකිරියට උපපත්තිං යනු අනුක්ත කර්මයි අපරාං යනු අනුක්ත කර්ම විශෙෂණයි එෂඃ යනුම ප්‍රථමාන්ත හෙයින් උක්ත කර්තෘයි.

අථ, ඉක්බිතිව (රාක්ෂස ශරීර ත්‍යාගයට අනතුරුව යී සේයි); සම්ප්‍රති, මේ කාලයෙහි; ඡලනාපරඃ, මෙරමා රැවටීමෙහි තත්පරවූ හෙවත් අනුන් වංචාකිරීමෙහි ඇලෙනලද්දාවූ; එෂඃ, ඒ රවුල් තෙම; ශෛලූෂඃ, (යම් කිසි) නලුවෙක්; භූමිකාම් ඉව, අන්‍ය රූපයකට පැමිණෙන්නාක් මෙන්; අපරාං උපපත්තිං, අන් උපතකට හෙවත් ජන්මාන්තරයකට; අවාප්‍ය, පැමිණ; ශිශුපාලසඥයා, ශිශුපාල යන සඥවෙන් හෙවත් නාමයෙන්; තිරොහිතාත්මා, සිහිතවූ ස්වරූප ඇත්තේ; සඃ අපි, ඒ රවුල්තෙමේ වූයේද; අසඃ, හෙතෙම නොවේයයි හෙවත් අනිකෙක්ම යයි; පරෛඃ, අන්‍යයන් විසින්; ප්‍රතීයතෙ, හඟිනු ලැබේ (දැනගණු ලැබෙයි සේයි) අන්වෙසක්ගත් නලුවෙකු මෙන් ඒ රවුලා නැවත මනුෂ්‍ය ශරීරය ගැණීමෙහිද අනිකෙකුමෙන් හඟවනු ලැබෙයි; උහුගේ එයම දුර්ජනත්වය නුයි ඔබ විසින් දැන් එකාන්තයෙන් හෙතෙම නැසිය යුත්තේ යයි සේයි.

ඡලනායාම් (වඤ්චායාම්) පරඃ (ආශක්තඃ) ඡලනාපරඃ තිරොහිතඃ ආත්මා (ස්වරූපඃ) යස්‍ය සඃ තිරොහිතාත්මා ශිශුපාල ඉති සඥ ශිශුපාලසඥ (තයා) ස තහවතීත්‍ය'සඃ යනු සමාසයි සෙසස සුබොධයි (ඉක්බිති ඒ රවුලාගෙ දුර්ජනත්වය පද්‍යත්‍රයකින් පවසයි.)

70. **සඃ වපුෂා චතුර්භුජඃ ආසීත්** යනු මෙහි ක්‍රි- යි. ආසීත් යන අස් භුවි ධාතු භූතා ඊ ලුඞ් අක කර්තෘ පර ප්‍ර- එ- අා- ක්‍රියා පදයාහට සඃ යනු උක්ත ප්‍රකෘති කර්තෘයි චතුර්භුජඃ යනු උක්ත විකෘති කර්තෘයි වපුෂා යනු අනුක්ත කරණයි සඃ ත්‍රිලොචනඃ ආසීත් යනුද සඃ සම්ප්‍රතිතෙජසා රවිඃ ආසීත් යනුද මෙසේම දතයුතුයි.

> 71. ස්වයං විධාතා' සුරදෛත්‍යරක්‍ෂසා
> 'මනුග්‍රහා'වග්‍රහයො'ර්‍යදෘච්ඡයා
> දශානනාදීන'භිරාධදෙවතා
> විතීර්ණවීර්‍ය්‍යා'තිශයාන් හසත්‍ය'සෞ.

---

සඃ බාලඃ, ඒ ශිශුපාල නම් බාලක තෙමේ; වපුෂා, ශරීරයෙන්; චතුර්භුජඃ ආසීත්, බාහු සතරක් ඇත්තේ වීය (මෙයින් විෂ්ණුවූ බව හෙවත් විෂ්ණු හා සමාන මහිම ඇතිබැව් සූචිතයි); මුඛෙන, මුහුනෙන්; පූර්ණේන්දුනිභඃ, පුන්සඳ වැනිවූ; ත්‍රිලෝචනඃ, තුන් නෙත් ඇත්තේ වීය හෙවත් මෙහෙසුරු වීය; සංප්‍රති, දැන්; යුවා, හෙතෙම තරුණවූයේ; කරාක්‍රාන්ත, අයබද්දෙන් (හෙවත් රාජ බලියෙන්) මඩණලද; මහීභෘත්, මිහිපලුන් ඇත්තේ ද්‍රේ නෝ නොහොත් රශ්මියෙන් ආක්‍රමනය කරණලද පර්වත ඇත්තේ; උච්චකෛඃ, උසස්වූ හෙවත් මහත්වූ; තෙජසා, තෙදින්; රවිඃ, හිරුය යනු; අසංශයං, නිසැකයි(හෙවත් නිසැකයෙන්ම සූය්‍ර්‍යයයි සේයි)ඒශිශුපාලයා විෂ්ණු ඊශ්වර සූය්‍ර්‍යයන් හා සමාන මහිම ඇත්තෙකු බැවින් කිසිවෙකු විසින් දැන් ලංවිය නොහැකි යයි සේයි)

චත්වාරඃ භුජාඃ යස්‍ය සඃ චතුර්භුජඃ පූර්ණශ්චාසෞ ඉන්දුශ්චෙති පූර්ණේන්දුඃ තෙන නිභඃ සදෘශශ්චෙති=ත්‍රීණි ලොචනානි යස්‍ය සඃ ත්‍රිලොචනඃ කරෙණ (බලිනා) ආක්‍රාන්තාඃ කරාක්‍රාන්තාඃ මහීංබිභ්‍රතීති මහීභෘතඃ කරාක්‍රාන්තාඃ මහීභෘතඃ යස්‍ය සඃ කරා'ක්‍රාන්තමහීභෘත් නසංශයංඅසංශයං යනු විග්‍රහයි **ශ්ලේෂෝත්ප්‍රේක්‍ෂා උපමාසංසෘෂ්ටි අලංකාරයී**

71. **අසෞ (ශිශුපාලඃ) දශානනාදීන් හසති** යනු මෙහි ක්‍රි- යි හසති යන=හස හාසෙ ධාතු- වර්ත- සක- කර්තෘ- පර- ප්‍ර- එ- ආ- ක්‍රියා පදයාහට අසෞ (ශිශුපාලඃ) යනු උක්ත කර්තෘයි දශානනාදීන් යනු අනුක්ත කර්මයි.

යදෘච්ඡයා, සිය කැමැත්තෙන්; ස්වයම්, තෙමේම (දෛවානුග්‍රහ බලයකින් නොව ස්වකීය සමර්ථභාවයෙන්ම); සුරදෛත්‍යරක්‍ෂසාම්, දෙවදානව රාක්‍ෂස යන මොවුන්ට; අනුග්‍රහාවග්‍රහයොඃ, අනුග්‍රහ නිග්‍රහ දෙක; විධාතා, කරන්නාවූ; අසෞ, මේ ශිශුපාල තෙමේ; අභිරාධ, අභිරාධනය කරණලද හෙවත් සතුටුකර ගන්නාලද; දෙවතා, මහෙශ්වරාදි දෙවියන් විසින්; විතීර්ණ, දෙනලද; වීය්‍ර්‍යාතිශයාන්, ප්‍රභාවාධික්‍යය ඇති; දශානනාදීන්, රාවණාදීන්ට; හසති, සිනාසෙයි හෙවත් රාවණාදීන් සතුටු කෙරෙයි (අන් කිසිවෙකුගේ ප්‍රසාදයෙන් නොව තමාගේ ඓශ්වය්‍ර්‍ය ඇති මා කෙරෙහි කෙසේනම් යාචකයන් හා සදෘශබව මේ දැයි (කියන්නාක් මෙන්) සිනාසෙයි සේයි.

72. බලාවලෙපාදධුනා'පි පූර්වවත්
ප්‍රබාධ්‍යතෙ තෙන ජගජ්ජිගීෂුණා
සතී'ව යොෂිත්ප්‍රකෘතිඃ සුනිශ්චලා
පුමාංස'මභ්‍යෙති භවාන්තරෙෂ්ව'පි.

---

සුරාශ්ච දෛත්‍යාශ්ච රක්ෂාංශ්ච සුරාසුරදෛත්‍යරක්ෂසාඃ (තේෂාම්) අනුග්‍රහශ්ච අවග්‍රහශ්ච අනුග්‍රහාවග්‍රහෞ (තයොඃ) දශ ආනනානි යස්‍ය සඃ දශානනඃ ස ආදි'ර්යෙෂාම් තෙ දශානනාදයඃ (තාන්) අභිරූඪාශ්ච තාඃ දෙවතාශ්චෙ'ති අභිරූඪදෙවතාඃ ප්‍රභාවානාම් අතිශයඃ ප්‍රභාවාතිශයඃ අභිරූඪ දෙවතාභි'ර්විතීර්ණඃ ප්‍රභාවාතිශයඃ යෙෂාම් තෙ= (තාන්) යනු මෙහි සමාසයි.

72. **තෙන (ශිශුපාලෙන) ජගත් ප්‍රබාධ්‍යතෙ** යනුද **සුනිශ්චලා ප්‍රකෘතිඃ භවාන්තරෙෂු අපි පුමාංසම් අභ්‍යෙති** යනුද මෙහි ක්‍රි- යි. ප්‍රබාධ්‍යතෙ යන ප්‍රපූර්ව බාධ විහතෞ (ව්‍යථනෙ) ධාතු වර්ත- සක- කර්ම- ආත්ම- ප්‍ර- එ- ආ- ක්‍රියා පදයාහට තෙන (ශිශුපාලෙන) යනු අනුක්ත කර්තෲයි ජගත් යනු උක්ත කර්මයි අභ්‍යෙති යන අභි පූර්ව ඉණ් ගතෞ ධාතු වර්ත- සක- කර්තෘ- පර- ප්‍ර- එ ආ- ක්‍රියා පදයාහට ප්‍රකෘතිඃ යනු උක්ත කර්තෲයි නිශ්චලා යනු උක්ත කර්තෲ විශෙෂණයි පුමාංසම් යනු අනුක්ත කර්මයි භවාන්තරෙෂු යනු අනුක්තා ධාරයි අපි යනු සමුච්චයාර්ථ අව්‍යයි.

හස හාසෙ දෛෂදර්ශිත පූර්වකාභාසෙ තු සකර්මකඃ යනු ශබ්ද ස්තොම මහානිධියි.

ජිගීෂුණා, දිනියටිවූ හෙවත් (ජයග්‍රහණයට) නිරන්තරෝ'ත්සාහවත්වූ; තෙන, ඒ ශිශුපාලයා විසින්; බලාව'ලෙපාත්, බලයසම්බන්ධවූ ගර්වය හෙතුකොට ගෙණ; අධුනා අපි, මෙකල්හිදු; පූර්වවත්, පෙර ජාතියෙහි මෙන්; ජගත්, ලොකය තෙම; ප්‍රබාධ්‍යතෙ, ප්‍රකර්ෂයෙන් පෙළනු ලැබේ ඒ එසේ මැයි; සතී, පතිව්‍රතා ඇති; යොෂිත්, ස්ත්‍රීක් (සිය සැමියා වෙත යන්නාක් මෙන්); සුනිශ්චලා, අතිශයින් නිශ්චලවූ හෙවත් ස්ථිරවූ; ප්‍රකෘතිඃ, ප්‍රකෘති තොම (ස්වභාව ධර්මය); භවාන්තරෙෂු අපි, අන්‍ය භවයන්හිදු; පුමාංසම්, පුරුෂයා වෙත; අභ්‍යෙති, පැමිණෙයි මෙහි විග්‍රහ සුබොධයි මේ පද්‍යය **අර්ථාන්තරන්‍යාසාලඞ්කාරයි.**

73. ත'දෙනමුල්ලඞ්ඝිතශාසනං විධෙ
'ර්විධෙහි කීනාශනිකෙතනා'තිථිම්
ශුභෙ'තරාචාරවිපක්ත්‍රිමා'පදො
විපාදනියා හි සතාම'සාධවඃ.

74. හෘදයමරිවධො'දයා'දූ'ඪූඪ
ද්‍රඪිම දධාතු පුනඃ පුරන්දරස්‍ය
ඝනපුලකපුලොමජා කුචා'ග්‍ර
ද්‍රුතපරිරම්භනිපීඩනක්ෂමත්වම්.

---

73. **ත්වම් එනම් කීනාශනිකෙතනාතිථිම් විධෙහි** යනු මෙහි ක්‍රි- යි. විධෙහි යන විධ විධානෙ ධාතු ආශීඃ ප්‍රේරණ ලොට් සක- කත්‍රෘ- පර- මධ්‍යම- ඒ= ආ- ක්‍රියා පදයාහට ත්වම් යනු අධ්‍යාහෘත උක්ත කර්තෘයි එනම් යනු අනුක්ත ප්‍රකෘති කර්මයි කීනාශනිකෙත නාතිථිම් යනු අනුක්ත විකෘති කර්මයි.

තත්, එහෙයින්; විධෙඃ, මහබඹුගේද; උල්ලඞ්ඝිත ශාසනං, ඉක් මවනලද ආඥඇති; එනම්, ඒ ශිශුපාලයා; කීනාශ, යමයාගෙ; නිකෙ තන, ගෘහයෙහි; අතිථිම්, ආගන්තුකයෙකු (අමුත්තෙකු); විධෙහි, කරව (යමගෘහයට පමුණුවනු මැනවයි සේයි); ශුභෙතරාචාර, දුරා චාරවූ; විපක්ත්‍රිම, කාලපරිපාකයෙන් නිෂ්පන්නවූ හෙවත් පැමිණි යාවූ; ආපදඃ, විපත්ති ඇති; අසාධවඃ, අසත්පුරුෂයෝ; සතාම්, ඔබ වැනිවූ සත්පුරුෂයන් විසින්; විපාදනීයාඃහි, නැසියයුත්තාහුමැයි.

(උල්ලඞ්ඝිතං ශාසනං යෙනා'සාවුල්ලඞ්ඝිතශාසනඃ (තම්) කීනා ශස්‍ය නිකෙතනං කීනාශනිකෙතනම් තස්මින් අතිථිඃ කීනාශනිකෙ තනාතිථිඃ (තම්) ශුභා දි'තරඃ ශුභෙතරඃ ශුභෙතරශ්චා'සෞ ආචාර ශ්චෙ'ති ශුභෙතරාචාරඃ තෙන විපක්ත්‍රිමාඃ ආපදඃ යෙෂාම් තෙ ශුභෙ තරාචාරවිපක්ත්‍රිමාපදඃ විපාදිතව්‍යා රි'ති විපාදනීයාඃ න සාධවඃ අසා ධවඃ යනු විග්‍රහයි මෙයද **අර්ථාන්තරන්‍යාසනම් අලඞ්කාරයි**.

(මෙසේ දුෂ්ටනිග්‍රහය ඇති කල්හි ශිෂ්ටානුග්‍රහය වන්නේයයි කියයි)

74. **පුරන්දරස්‍ය හෘදයං ඝනපුලක පුලොමජා කුචාග්‍ර ද්‍රුතපරි රම්භ නිපීඩන ක්ෂමත්වම් දධාතු** යනු මෙහි ක්‍රි- යි. දධාතු යන ධාඤ් ධාරණපොෂණයොඃ ධාතු ආශීඃ ප්‍රේරණ ලොට් සක- කත්‍රෘ- පර- ප්‍ර- ආ- ක්‍රියා පදයාහට හෘදයම් යනු උක්තකර්තෘයි ඝනපුලක- ක්ෂමත්වම් යනු අනුක්ත කර්මයි පුරන්දරස්‍ය යනු අනුක්ත සම්බන්ධයි.

අරිවධො'දයාත්, ශත්‍රු විනාශ ලාභයෙන්; උදූඪ, දරණලද්දවූ; ද්‍රඪිම, දෘඪභාවය ඇති හෙවත් ස්වාස්ථ්‍යය ඇති; පුරන්දරස්‍ය, ශක්‍ර යාගෙ; හෘදයම්, හෘදය (ලය); පුනඃ, නැවතත් (පෙරසේම); ඝනපු

75. ඔමි'ත්‍යුක්තවතෝ'ථ ශාර්ඞ්ගිණ ඉති ව්‍යාහෘත්‍යවාචං නභ
ස්තස්මින් නුත්පතිතෙ පුරඃ සුරමුනා විඉන්දෝඃ ශ්‍රියං බිභ්‍රති
ශත්‍රූණාම්'නිශං විනාශපිශුනඃ ක්‍රුද්ධස්‍ය චෛද්‍යං ප්‍රති
ව්‍යෝම්නී'ව භෘකුටිච්ඡලෙන වදනෙ කෙතු'ශ්ච-
කාර'ස්පදම්.

---

ලභාපුලොමජා, ශක්‍ර භාර්‍ය්‍යාවගෙ (ඉන්ද්‍රානියගෙ ඊ සේයි); කුචාග්‍ර, පයොධරාග්‍ර යුගමය; දෘතපරිරම්භ, ශිඝ්‍රව වැලඳගැණිමෙහි හෙවත් උත්සුක භාවයෙන් යුහුව වැලඳ ගැණිමෙහි; නිපීඩනක්‍ෂමත්වම්, පීඩාව ඉවසනබව හෙවත් පෙළීමේ සමර්ථභාවය; දධාතු, දරාවා.

අරිණාම් වධඃ අරිවධඃ අරිවධස්‍ය උදයඃ අරිවධෝ'දයඃ(තස්මාත්) දෘශ්‍යස්‍ය භාවඃ දෘශිමා උදූඪං දෘඪිම යස්‍ය තත් උදූඪදෘඪිම, පුරඃ (ශත්‍රූ පුරාණි දාරයතීති පුරන්දරඃ) (තස්‍ය) පුලොම්නො ජාතා පුලොමජා (ශචී) කුචයොරග්‍රෙ කුචාග්‍රෙ පුලොමජායාඃ කුචාග්‍රෙ=ස්තනඃපුලකඃ (රොමාඤ්චඃ) යයොස්තෙ= ස්තනපුලකෙ ච තෙ පුලොමජා කුචාග්‍රෙචෙති– තයොඃ=දෘතපරිරම්භඃ=තස්මින් නිපීඩනං,= ක්‍ෂමස්‍ය භාවඃ ක්‍ෂමත්වම් ස්තනපුලකා=නිපීඩනස්‍ය ක්‍ෂමත්වම් ස්ත–ක්‍ෂමත්වම් (තම්) යනු සමාසයි. මේ සමාසයෙහි වාක්‍යය ඉතා දීඝබැවින් සැකෙවින් මෙහි දක්තබැව් සැලකිය යුතුයි.

'ඔජස්සමාසභූයස්ත්වම්' යන ඕජෝගුණය මෙහි පැනෙයි **අතිශයොක්ති අලඞ්කාරයයි** වෘත්‍යනුප්‍රාසද වෙයි මේ පද්‍යය පුෂ්පිතා'ග්‍රා වෘත්තයි 'අයුජි'නයුගරෙඵතො' යකාරො යුජිච 'නජෞජරගාශ්ච' පුෂ්පිතා'ග්‍රා යනු ලක්‍ෂණයි. (පෙර විත්තවිශෙෂයෙන් දුරුකළ සම්පත් ඇති ඉන්ද්‍රයා විසින් දැන් ඔබගේ අනුග්‍රහයෙන් නිරවුල්වූ දිව්‍යරාජ්‍ය සැපය අනුභවකරණු ලැබේවා යනු භාවයි.)

75. (**අථ කෙතුඃ භෘකුටිච්ඡලෙන ආස්පදම්.චකාර** යනු මෙහි ක්‍රි- යි. චකාර යන කෘඤ් කරණෙ ධාතු පරොක්‍ෂලිට් ස්ත– කර්තෘ– පර– ප්‍ර– ඒ– ආ- ක්‍රියා පදයාහට කෙතුඃ යනු උක්ත කර්තෘයි ආස්පදම් යනු අනුක්ත කර්මයි අථ යනු අනන්තරාර්ථ අව්‍යයි භෘකුටිච්ඡලෙන යනු අනුක්ත කරණයි.)

තස්මින් සුරමනෞ, දෙවෘෂිවූ ඒ නාරද තපස්වියා; ඉතිවාචම්, මෙබඳු වදන්; ව්‍යාහෘත්‍ය, ව්‍යවහාර කොට හෙවත් කියා; නභඃ උත් පතිතෙ, අහසට පැනනැගිකල්හි; පුරඃ, ඉදිරියෙහි; ඉන්දොඃ ශ්‍රියම්, චන්ද්‍රයාගේ ශොභාව; බිභ්‍රති, ධරණකල්හි; අථ, ඉක්බිති; ඕම් ඉති,

ඕම් යනු හෙවත් එසේ වේවායි; උකතාවත, කියනු ලබන්නාවූ හෙවත් අධිකාරශාලාවූ; චෛද්‍යම් ප්‍රති, චෛද්‍යයා කෙරෙහි හෙවත් චෛදි ජනපදෙශ්වරවූ ශිශුපාලයා කෙරෙහි; සාඞ්කස්‍ය, කිපුනාවූ; ශාර්ඞ්ගිනඃ, ශ්‍රීවිෂ්ණුහුගෙ; වදනෙ, මුහුනෙහි; ව්‍යොම්නිඉව, අහසෙහි මෙන්; අතිශම්, නිතර; ශත්‍රූණාම්, සතුරන්ගේ; විනාශපිශුනඃ, විනාශය ප්‍රකාශකරන්නාවූ; කෙතුඃ, එනම් උත්පාතලක්ෂණය; භෘකුටිච්ඡලෙන, භ්‍රෲභඞ්ගව්‍යාජයෙන් හෙවත් ඇස්බැම හැකුලුම් විලසින්; ආස්පදම්, පිහිටිම හෙවත් සපිනිය; චකාර, කෙළේය; මෙහි සමාස ක්‍රමය, ටීකාහයින් සුබොධයි නිදර්ශනොපමාලංකාරයි.

'චමත්කාරකාරිතයා මඞ්ගලාචරණරූපතයා ච සර්ගාන්ත්‍ය'ශ්ලොකෙෂු ශ්‍රී ශබ්දප්‍රයොගඃ යනු ටීකායි. එහෙයින් භාෂ්‍යකාරතෙම මෙසේ කියයි. 'මඞ්ගලාදිනි' මඞ්ගලමධ්‍යානි, මඞ්ගලාන්තානි, ශාස්ත්‍රාණි ප්‍රථන්තෙ, වීරපුරුෂාණ්‍යායුෂ්මත්පුරුෂාණිච භවන්ති අධ්‍යෙතාරශ්ච ප්‍රවක්තාරො භවන්ති යනුයි. මේ පද්‍යය ශාර්දූල වික්‍රීඩිත නම් වෘත්තයි. සූර්‍ය්‍යාශ්වෛ'ර්මසජස්තතාඃ ස ගුරවඃ ශාර්දූලවික්‍රීඩිතම්' යනු ලක්ෂණයි. සර්ගාන්තය හෙයින් දර්ශිතවෘත්තවිශෙෂයි.

'සර්ගෛර'නතිවිස්තීර්ණෛඃ ශ්‍රව්‍යවෘත්තෛඃ සුසන්ධිභිඃ
'සර්වත්‍රභින්නවෘත්තාන්තෛ'රුපෙතං ලොකරඤ්ජකම්

යනු දණ්ඩ්‍යාචාර්‍ය්‍යොක්තියි.

මේ පාඨපද්‍යයන්ගේ භාවය සුබොධ හෙයින් නොලීවෙමු.

## ශිශුපාලවධපද්‍යාවභාසිනී

### ප්‍රථමසර්ගව්‍යාඛ්‍යානය

සමාප්තයි.

# ද්විතීයඃ සර්ගඃ.

---

1. යියක්ෂමාණෙනාහූතඃ, පාණ්ඩවෙනා'ථ විෂ්ණුමුරම්
අභිචෛද්‍යං ප්‍රතිෂ්ඨාසු, රාසීත් කාර්ය්‍යද්වයාකුලඃ.

2. සාර්ද්ධමුද්ධවසීරිභ්‍යා ම'ථාසාවාසදත්සදඃ
ගුරුකාව්‍යානුගාං බිභ්‍රච්චාන්ද්‍රී ම'භිනභඃ ශ්‍රියම්.

---

(මේ මහා කාව්‍ය ග්‍රන්ථයෙහි අන්තර්ගතවූ පද්‍යයන්ගේ විශේෂාර්ථ'ව බෝධය පිණිස ප්‍රථම සර්ග ව්‍යාඛ්‍යානයෙහි ක්‍රියාකාරක පද සම්බන්ධ උක්තානුක්ත සමාස විග්‍රහාදිය සැකෙවින් දක්වූයේ නුමුදු මේ ව්‍යාඛ්‍යානය මේ නයින් ඉතා දීර්ඝවන හෙයින් මෙතැන් පටන් අත්‍යාවශ්‍යකත්වයෙන් ගම්‍යමාන කාරුණු ඇතැම් තැන ඉතා ස්වල්ප වශයෙන් දක්වනබැව් සැලකිය යුතුයි.)

1. අථ, ඉක්බිතිව (ඉන්ද්‍රසංදේශ ශ්‍රවනයට අනතුරුව); යියක්ෂමාණෙන, යාගකරණු කැමැත්තාවූ; පාණ්ඩවෙන, පෘථාපුත්‍රවූ යුධිෂ්ඨිරයා විසින්; ආහූතඃ, ආහ්වානය කරණලද්දවූ හෙවත් කැඳවන ලද්දවූ; අභිචෛද්‍යං ප්‍රතිෂ්ඨාසුඃ, ශිශුපාලනම් දනව්වැස්සා බලා පිටත්වනු කැමැත්තාවූ; මුරංවිෂත්, මුරාරි හෙවත් ශ්‍රී විෂ්ණුතෙම; කාර්ය්‍යද්වයාකුලඃ, සුරකාර්ය්‍යය සුහෘද්කාර්ය්‍ය යන සාටයුතු දෙකින් අවුල්වූවෙක්; ආසීත්, වීය.

(එහෙයින් මේ මන්ත්‍රණයට සුදුසු අවසරයයි සේයි.)

**මුරංවිෂත් කාර්ය්‍යද්වයාකුලඃ ආසීත්** යනු මෙහි ක්‍රි–යි. ආසීත් යනු අස් භුවි ධාතු භූතාර්ථ ලුඞ් කර්තෘ සාධනයෙහි 'දිප්' ප්‍රත්‍යයයි ආහූතඃ යන තන්හි 'හ්වයතෙඃ සාමිණි කෙත සම්ප්‍රසාරණදීර්ඝෞ' යනුවෙන් සම්ප්‍රසාරණ දීර්ඝ දෙක වූහ චෛද්‍යම්ප්‍රති අභිචෛද්‍යම් 'ලක්ෂණෙනා'භිප්‍රතිආභිමුඛ්‍යෙ, යනුවෙන් අව්‍යයී භාවයි 'අභිරභාගෙ'ඉති කර්මප්‍රවචනීයත්වෙ, තත් යොගෙ විතීයා වා යනු කී හෙයින් විතීයායි.

(මෙසේ මන්ත්‍රණයට බිජවූ සැකය උපන්‍යස්තකොට දූන් මන්ත්‍රණයට සුදුසු ප්‍රදේශය කියයි.)

2. අථ, සංදේහයට අනතුරුව; අසෞ, ඒ ශ්‍රිවිෂ්ණුතෙම; අභිනභඃ, අහසෙහි; ගුරුකාව්‍යෞ, වෘහස්පති ශුක්‍ර යන දෙදෙන; අනුගාං, අනුව යන්නවුන් කොට ඇත්තාවූ; චාන්ද්‍රීම්, චන්ද්‍රයා පිළිබඳවූ; ශ්‍රියම්, ශොභාව; බිභ්‍රත්, ධරන්නේ; උද්ධවසීරිභ්‍යාම් සාර්ද්ධම්, උද්ධව සීරින් යන දෙදෙනා සමග (මෙහි උද්ධව නම් යදුවංශී දෙවයා නොහොත් විෂ්ණුභාර්ය්‍යාවූ ශ්‍රීකාන්තාවයි; සීරින්, යනු බලරාමයි); සදඃ, (ප්‍රාසාදයෙහිවූ රාජ) සභාවට; ආසදත්, පැමිණියේය.

3. ජාජ්වල්‍යමානා ජගතඃ ශාන්තයෙ සමුපෙයුෂි
ව්‍යද්‍යෝතිෂ්ට සභාවෙද්‍යා ම'සෞ නරශිඛිත්‍රයී.

4. රත්නස්තම්භෙෂු සංක්‍රාන්තප්‍රතිමාස්තෙ චකාශිරේ
එකාකිනො'පි පරිතඃ පෞරුෂෙයවෘතා ඉව.

5. අධ්‍යාසාමාසු'රුත්තුඞ්ග හෙමපීඨානි යාන්‍යමී
තෛරූ'හෙ කෙශරික්‍රාන්ත ත්‍රිකූටශිඛරෝ'පමා.

---

**අසෞ උඩ්ඩයිෂ්‍යාම් සාඞ්ං සදඃ ආසදන්** යනු ක්‍රි- යි. ආඞ් පූර්‍ව සද්ලු ගතෞ ධාත්‍වර්ථ ලුඞ් කර්තෘ සාධනයෙහි 'දිප්' ප්‍රත්‍යයයි.

ගිරිපෘෂ්ඨං සමාරුහ්‍ය ප්‍රාසාදං වා රහොගතඃ
අරණ්‍යෙ නිඃශලාකෙ වා මන්ත්‍රයෙත් භාවභාවිතෞ

යනු මන්ත්‍රොචිතදෙශ දක්වන මනුවචනයි).

3. ජගතඃ, ලෝකයාට; ශාන්තයෙ, ශාන්තිය පිණිස අනුපද්‍රවය පිණිස යයි සේයි; සමුපෙයුෂි, මොනවට උපගතවූ හෙවත් එකතුවූ; ජාජ්වල්‍යමානා, අතිශයින් බබලන්නාවූ; අසෞ නරශිඛිත්‍රයී, මේ පුරුෂ නමැති ගිනිතුන; සභාවෙද්‍යාම්, සභානමැති වේදිකාවෙහි (පිල් කඩෙහි යි සේයි); ව්‍යද්‍යෝතිෂ්ට, බැබලුණේය.

(**අසෞ නරශිඛිත්‍රයී සභාවෙද්‍යාම් ව්‍යද්‍යෝතිෂ්ට** යනු ක්‍රි- යි. විපූර්ව ද්‍යුතඞ් ද්‍යෝතනෙ භූ- ලුඞ් තන් ප්‍රත්‍යයයි (භෘශම් ජ්වලතීති ජාජ්වල්‍යමානා, ධාතො'රෙකාචො'හලාදෙඃ ක්‍රියාසම'භිහාරෙ යඞ්' යනු කි හෙයින් අතිශයාර්ථයෙහි යඞ්ප්‍රත්‍යයයි නරාඃ (පුරුෂා) එව ශිඛිනො '(ගනයඃ) නරශිඛිනඃ තෙෂාම් ත්‍රයී = 'ට්ඩඪාණඤ්' යනාදීන් ඞීප් ප්‍රත්‍යයයි සභා (ආස්ථානී) සෛ'ව වෙදිඃ-(තස්‍යාම්) **රූපකයයි.**

4. රත්නස්තම්භෙෂු, රුවන්ටැම්වල; සංක්‍රාන්තප්‍රතිමාඃ, සංක්‍රමනයකළ පිළිබිඹුඇති; තෙ, ඔව්හු (තිදෙන); එකාකිනඃ අපි, අසහාය වූවාහුද; පරිතඃ, හාත්පස; පෞරුෂෙයවෘතාඃ ඉව, පුරුෂසමූහයෙන් පිරිවරණ ලද්දවුන් මෙන්; චකාශිරෙ, බැබලුණාහුය.

(**තෙ පෞරුෂෙයවෘතාඃ ඉව චකාශිරෙ** යනු ක්‍රි- යි. කාශෘ දීප්තෞ- පරොක්‍ෂලිට්- ඉරෙ ප්‍රත්‍යයයි රත්නානාම් ස්තම්භාඃ = තෙෂු සංක්‍රාන්ත ප්‍රතිමාඃ = පුරුෂාණාම් සමූහඃ පෞරුෂෙයම් තෙන වෘතා ඉති = **උත්ප්‍රෙක්‍ෂාලඞ්කාරයි.**

5. අමී, මේ ශ්‍රිකෘෂ්ණ උද්ධව සීරින් යන තිදෙන; යානි, යම් බඳුවූ; උත්තුඞ්ග, උස්වූ; හෙමපීඨානි, සුවර්ණමය පීඨයන්හි; අධ්‍යාසාමාසු, හිඳිනය කළාහුද; කෙශරි, සිංහයන් විසින්; ක්‍රාන්ත, ආක්‍රමනය කරණලද; ත්‍රිකූට, තිකූට පර්‍වතයන්ගෙ; ශිඛරොපමා, ශෘඞ්ග යන් සම්බන්ධීවූ සදෘශත්‍වය හෙවත් ශෘඞ්ගයන් හා සමානත්‍වය; තෛඃ, ඒ පීඨයන් විසින්; ඌහෙ, උසුලනලද්දේය.

6. ගුරුද්වයාය ගුරුණො 'රුභයො'රථකාර්‍ය්‍යයොඃ
හරිර්විප්‍රතිෂෙධං ත'මාචචක්ෂෙ විචක්ෂණඃ.

7. ද්‍යොතිතාන්තඃසභෛඃ කුන්ද'කුඩ්මලාග්‍රදතඃ ස්මිතෛඃ
ස්නපිතෙ' වා භවත්තස්‍ය ශුද්ධවර්ණා සරස්වතී.

---

**(අපි (යාති) උත්තුඞ්ගහෙම පීඨානි අධ්‍යාසාමාසුඃ යත්‍රද ෙතොඃ කෙශරී = පමා උපෙහ** යනුද මෙහි ක්‍රි- යි. අධ්‍යාසාමාසුඃ යනු අධිපූර්ව ආස උපවෙශනෙ ධාතු ආම් ප්‍රත්‍යයුක්ත අස්භූවි අනුප්‍රයොග පරොක්ෂලිට් කර්තෘ- පර- ප්‍ර- බහු- ආ- ක්‍රියා පදයි උස් ප්‍රත්‍යයි උපෙහ යනු වහ ප්‍රාපනෙ ධාතු පරොක්ෂලිට් කර්ම- ආත්ම- ඒ- ක්‍රි- යි 'ඒ' ප්‍රත්‍යයි මෙහි යාති උත්තුඞ්ග හෙමපීඨානි යන තන්හි 'අධිශීඞ් ස්ථාසාම් කර්ම' යනුවෙන් කර්මත්වයයි. **උපමාලඞ්කාරයි.**

6. අථ, උපවෙශනයට අනතුරුව; විචක්ෂණඃ, බුද්ධිමත්වූ (වක්තෘවූ); හරිඃ, ශ්‍රීකෘෂ්ණ තෙම; ගුරුද්වයාය, ගුරුවූ උද්ධව රාම දෙදෙනාට; ගුරුණොඃ, මහත්වූ; උභයොඃ කාර්‍ය්‍යයොඃ, සුරකාර්‍ය්‍ය සුහෘද් කාර්‍ය්‍ය යයි පූර්වොක්ත) කටයුතු දෙක සම්බන්ධවූ; තං විප්‍රතිෂෙධං, ඒ විරොධය ආචචක්ෂෙ, කියේය (දැන්වූයේ යයි සේයි )

('තුල්‍යබලවිරොධො විප්‍රතිෂෙධඃ' යනු කි හෙයින් විප්‍රතිෂේධය නම් තුල්‍යබලවිරෝධ යයි දත යුතුයි.)

**(හරිඃ ගුරුද්වයාය විප්‍රතිෂෙධං ආචචක්ෂෙ** යනු මෙහි ක්‍රි- යි. ආචචක්ෂෙ යනු ආඞ් පූර්ව චක්ෂිඞ් ව්‍යක්තායාම් වාචි ධාතු පරොක්ෂ ලිට් ආත්ම ප්‍ර- 'එ' ප්‍රත්‍යයි.

7. කුන්දකුඩ්මලාග්‍රදතඃ, කොඳකැකුළුවැනි දත් ඇති; තස්‍ය, ඒ ශ්‍රීවිෂ්ණුහුගෙ සරස්වතී වාක්තොම; ද්‍යොතිතාන්තඃසභෛඃ, ප්‍රකාශ කරණලද අන්තඃ සභා හෙවත් ප්‍රධාන සභා ඇති; ස්මිතෛඃ, මන්ද හාස්‍යවලින්, ස්නපිතා ඉව, නාවනලද්දක් මෙන්; ශුද්ධවර්ණා අභවත්, පිරිසුදු වර්ණ ඇත්තී හෙවත් නිර්මලකාන්ති ඇත්තී විය.

**(තස්‍ය සරස්වතී ශුද්ධවර්ණා අභවත්** යනු මෙහි ක්‍රි- යි. අභවත් යනු භූ සත්තායාම් ධාතු භූවාදිලුඞ්= දිප් ප්‍රත්‍යයි කුන්දනාම් කුඩ්මලානි= තෙෂාමග්‍රානි= කුන්දකුඩ්මලාග්‍රාණි'ව දන්තා යස්‍ය සඃ- (තස්‍ය) 'අග්‍රාන්තශුද්ධ ශුභ්‍රවෘෂවරාහෙභ්‍යශ්ච' යනුවෙන් මෙහි දන්ත ශබ්දයට දතාදෙශයි **උත්ප්‍රෙක්ෂාලඞ්කාරයි.**

8. භවද්භිරම්මවසර ප්‍රදනාය වචාංසිනඃ
පූර්වරඞ්ගඃ ප්‍රසඞ්ගාය නාටකීයස්‍ය වස්තුනඃ.

9. කරදීකෘතභූපාලො භ්‍රාතෘභි'ර්ජිත්වරෛ'ර්දිශාම්
විනාප්‍යස්මදලං භූෂ්ණු'රිජ්‍යායෛ තපසඃ සුතඃ.

---

8. භවත්යිරුම්, යුෂ්මතුන්ගේ වචනයන්ට අවසර; ප්‍රදනාය, අවකාස දීම පිණිස; නඃ, අපගේ; වචාංසි, වචනයෝ; පූර්වරඞ්ගඃ, පූර්වරඞ්ග සඞ්ඛ්‍යාත නෘත්‍යශාලාවෙහි දේ හෝ නොහොත් නාට්‍යකර්මයාගෙ; ප්‍රසඞ්ගාය, ප්‍රකර්ෂයෙන් ඇලීම පිණිස (ප්‍රවර්තනය පිණිස යි සේ යි); නාටකීයස්‍ය, නෘත්‍යයෙහිවූ; වස්තුනඃ, ප්‍රසිද්ධ වස්තුහුගේ; ප්‍රසඞ්ගාය න භවන්ති, වෙන් වෙන් ප්‍රවර්තනය පිනිස නොවෙත්; ; පූර්වං රජ්‍යතෙ 'සම්නාති'ති පූර්වරඞ්ගඃ, (නාත්‍යශාලා) වසනත රාජ්‍ය යෙහි පූර්වරඞ්ගය මෙසේ දක්වතලදී.

'යන්නාට්‍යවස්තුනඃ පූර්වරඞ්ගවිඝ්නොප'පශාන්තයෙ
කුශිලවාඃ ප්‍රකුර්වන්ති පූර්වරඞ්ගප්‍රකීර්තිතඃ (යනුයි.)

නටකස්‍ය ඉදම් නාටකම් නාටකෙ භවං නාටකීයම් තස්‍ය යනු විග්‍රහයි නෘත්‍යය සම්බන්ධ සාමාන්‍ය ලක්‍ෂණය මෙසේ දක්වයි.

'පූර්වරඞ්ගං විධායා'දෞ සූත්‍රධාරෙ විනිර්ගතෙ
ප්‍රවිශ්‍ය තද්වද'පරඃ කාව්‍යමාස්ථාපයෙ'න්නටඃ
ප්‍රථමං පූර්වරඞ්ගශ්ච තතඃ ප්‍රස්තාවනෙ'ති ච
ආරම්භ සර්වනාට්‍යානා'මෙතත් සාමාන්‍යම්'ශ්‍යතෙ' යනුයි

**මේ පද්‍යය වස්තුපමා ලංකාරයි.**

දූන් වනාහි සවමතය මෙසේ කියයි.

9. දිශාං ජිත්වරෛඃ, දිගුන් දිනන සුලුවූ; භ්‍රාතෘභිඃ, භීමාදී සොහොවුරන් විසින්; කරදීකෘතභූපාලඃ, (ෂඩ්භාග ප්‍රමාණ) අයබදු ගෙවන්නන් කරණලද මහීපාලයන් ඇති; තපසඃ සුතඃ, ධර්මපුත්‍ර තෙම; අස්මද් විනාඅපි, අපගෙන් වෙන්වත්; ඉජ්‍යායෛ, යාගය පිණිස; අලංභූෂ්ණුඃ, සමර්ථ වන්නේ වෙයි (එහෙයින් දිග්විජය පිණිසම යායුතුයි යාගය පිණිස නොයා යුතුයි සේයි.

(**තපසඃ සුතඃ ඉජ්‍යායෛ අලං භූෂ්ණුඃ භවති** යනු ක්‍රි- යි. මෙහි අලම් ශබ්දය සමර්ථාර්ථයි අකරදාඃ කරදාඃ සම්පද්‍යමානාඃ කෘතා ඉති කරදීකෘතාඃ කරදීකෘතාඃ භූපාලාඃ යස්‍ය සඃ= අස්මද්විනා යන තන්හි 'පෘථක් විනා නානා' යනාදීන් තෘතීයා විශයුක්ති නුවදූ විකල්පයෙන් අපාදනයි 'ඉජ්‍යායෛ' යන තන්හි ('නමඃ ස්වස්ති') යනාදීන් තදර්ථසම්ප්‍රදනයි.

10. උත්තිෂ්ඨමානස්තුපරො නොපෙක්ෂ්‍යඃ පථ්‍ය'මිච්ඡතා
සමෞ'හි ශිෂ්ටෛ'රාම්නාතෞ වර්ත්ස්‍යන්තාවා'මයඃ ස ච

11. න දූයෙ සාත්වතීසූනු' ර්‍යන්මහ්‍ය'මපරාධ්‍යති
යත්තු දන්දහ්‍යතෙ ලොකම'දෙ දුඃඛාකරොති මාම්.

---

10. උත්තිෂ්ඨමානඃ, වැඩෙන්නාවූ; පරඃතු, ශත්‍රු තෙම වනාහි; පථ්‍යම් ඉච්ඡතා, තමාට හිත කැමත්තාවූ පුහුලා විසින්; නොපෙක්ෂ්‍යඃ, උපෙක්ෂා කටයුත්තේ නොවෙයි (උපෙක්ෂාවසයෙන් සැලකිය යුත්තේ නොවෙයි සේයි) හි යම්හෙයකින්; වර්ත්ස්‍යන්තෞ, වැඩෙන්නාවූ; ආමයඃ, රොගය ද; සඃ ච, ඒ සතුරා ද යන (දෙදෙන); ශිෂ්ටෛඃ, පණ්ඩිතයන් විසින්; සමෞ, තුල්‍යයෝ යයි; ආම්නාතෞ, ප්‍රකාශ කරණ ලද්දාහුද එහෙයිනි.

(ශිෂ්ටෛඃ **සමෞ ආම්නාතෞ** (භවතඃ) යනු ක්‍රි- යි. **උපමාලඞ්කාරයි.**

මෙසේ ඇතිකල්හි ස්වාමිපරත්ව දෝෂය නොවන්නේද? නොවන්නේ මැයි. මේ ප්‍රවෘත්තිය ලොකානුග්‍රහය අපිවත්කොට ඇති බැවින් ය යන අදහසින් මෙසේ කියයි.

11. සාත්වතීසූනුඃ, සාත්වතී නම් නැනැත්තියගේ පුත්‍ර තෙම (ශ්‍රී විෂ්ණුහුගේ පියාගේ සොහොවුරීගේ පුත්‍රවූ චෛද්‍ය තෙමේ යී සේයි); යත්, යම් හෙයකින් නොහොත් යම් කලෙක්හි; මහ්‍යම්, මට; අපරාධ්‍යති, අපරාධ කෙරේද හෙවත් ද්‍රෝහකෙරේද (එහෙයින් නොහොත් එකල්හි); නදූයෙ, නොතැවෙමි, තු, එතකුදු වුවත්; යත්, යම් හෙයකින්; ලොකං, ලොකය; දන්දහ්‍යතෙ, නිඤ්තසේ දවයිද; අදඃ, ඒ ලෝකය නිඤ්තසේ දැවීම; මාං, අසමද්හු; දුඃඛාකරොති, දුඃඛිත කෙරෙයි.

(**සාත්වතීසූනුඃ මහ්‍යම් අපරාධ්‍යති** යනුද **අහම් නදූයෙ** යනුද **සඃ ලොකම් දන්දහ්‍යතෙ** යනුද **අදඃ මාං දුඃඛාකරොති** යනුද මෙහි ක්‍රි- යි. මෙහි අපරාධ්‍යති යනු අපපූර්ව රාධ හිංසායාම් ධාතු වර්තමාන ලට්- තිප් ප්‍රත්‍යයි නදූයෙ යනු නඤ්පූර්ව දූඞ් පරිතාපෙ නොහොත් දූ ඛෙදෙධාතු වර්- ලට්- එ'ප්‍රත්‍යයි දන්දහ්‍යතෙ යනු දහදහෙ (භස්මීකරණෙ)ධාතු වර්තමානලට්- තෙ' ප්‍රත්‍යයි මෙහි ගර්හිතං දහති'ති යන අරුත්හි 'ලුපසදචරජප' යනාදීන් ගර්හාර්ථයෙහි යඞ් ප්‍රත්‍යයි ධාතුහට විත්තයි දුඃඛාකරොති යන තන්හි දුඃඛම් යනු පූර්වකොට ඇති ඩුකෘඤ් කරණෙ ධාතු වර්-ලට්- තිප් ප්‍රත්‍යය හා 'දුඃඛාත් ප්‍රාතිලොම්‍යෙ' යනුවෙන් ඩාච් ප්‍රත්‍යයි

12. මම තාවන්මතමි'දං ශ්‍රූයතා'මඞ්ග වාම'පි
ඥාතසාරෝ'පි ඛල්වේකඃ සන්දිග්ධෙ කාර්‍ය්‍යවස්තුනි.

13. යාවද'ර්ථපදං වාචමේ'වමාදාය මාධවඃ
විරරාම මහීයාංසඃ ප්‍රකෘත්‍යා මිතභාෂිණඃ.

---

12. (දූත් සවමතය නිෂ්කාසකරමින් පරමතය අසණු කැමතිව කරුණු විචාරයි.) අඞ්ග, (එම්බා) පින්වත; තාවත්, ඒතාක් හෙවත් ඔබගේ මතය ඇසීම අවසන්වනතෙක්; ඉදම්, මම; මතම්, මේ මාගේ මතයයි; වාම් අපි, නුඹ දෙදෙනාගෙ මතයත්; ශ්‍රූයතාම්, අසණු ලැබේවා හෙවත් මා විසින් ද ඇසිය යුතුමැයි; ඥාතසාරඃ අපි, දන්නාලද; තත්ත්වාර්ථසඞ්ඛ්‍යාත, සාරයඇත්තාවූද; එකඃ, ඇතැම් අයෙක්; කාර්‍ය්‍යවස්තුනි, කටයුතු අර්ථයෙහිත්; සංදිග්ධෙ, සැක කෙරේමැයි.

**(මයා වාම් මතම් ශ්‍රූයතාම්** යනුද **එකඃ කාර්‍ය්‍යවස්තුනි සංදිග්ධෙ** යනුද මෙහි ක්‍රි- යි. ශ්‍රූයතාම් යනු ශ්‍රු ශ්‍රවණෙ ධාතු ආශීඃප්‍රේරණලොට් - තාම් ප්‍රත්‍යයි සංදිග්ධෙ යනු සංපූර්ව දිහ උපචයෙ වර්තමානලට් - තෙ'ප්‍රත්‍යයි) **අර්ථාන්තරන්‍යාස අලංකාරයි**.

13. මාධවඃ, හරිතෙම; යාවදර්ථපදං, යාවදර්ථ පදඇති හෙවත් අභිධෙයාර්ථයට ප්‍රමාණවූ පදඇති; වාචං, වචනයක්; එවං, උක්ත ප්‍රකාරයෙන්; ආදාය, රැගෙණ හෙවත් කියා; විරරාම, නැවතුනේය; (තූෂ්ණීම්භූතවී යයි සේයි ඒ එසේමැයි) මහීයාංසඃ, මහෝත්තමයෝ; ප්‍රකෘත්‍යා, ප්‍රකෘතියෙන් හෙවත් සවභාව යෙන්; මිතභාෂිණඃ, (කාර්‍ය්‍යෝචිත වසයෙන්) පමණ කොට කථාකරන්නෝ වෙති (වාචාලයෝ නොවෙති) නිෂ්ප්‍රයෝජන කථා ප්‍රතිෂෙධහෙයිනි යි සේයි)

**(මාධවඃ වාචමාදාය විරරාම** යනුද **මහීයාංසඃ මිතභාෂිණඃ භවන්ති** යනුද මෙහි ක්‍රි- යි. විරරාම යනු විපූර්ව රමු ක්‍රීඩායාම් ධාතු පරොක්ෂලිට්- ණප් ප්‍රත්‍යයි 'ව්‍යාඞ්පරිභ්‍යො'රමඃ' යනුවෙන් මෙහි පරසෛමපදය විය) **අර්ථාන්තරන්‍යාස අලඞ්කාරයි**

* (ඉක්බිති ශ්ලෝක අටකින් යුග්මකුලකයකින් ශ්‍රීරාමයා වර්ණනාකරමින් ඒ වාක්‍යය විස්තර වසයෙන් දක්වයි)

---

* යනු ටීකාවෙහි කියනලදී. අන්‍යත්‍රහි:-

වාභ්‍යාන්තු යුග්මක්‍යං ඥෙයම් ත්‍රිභිර්ශ්ලෝකෛ'ර්විශෙෂකම්
චතුර්භිස්තු කලාපං ස්‍යාත් පඤ්චභිර්කුලකම් මතම්- යි.

කියනලදී. පද්‍ය පසෙකින් වැඩිවුවත් කුලකවනබැව් මෙහි නිදර්ශිතයි.

14. තතඃ සපත්නාපනය'ස්මරණානුශයස්ඵුරා
ඔෂ්ඨෙන රාමො රාමොෂ්ඨබිම්බචුම්බනචුඤ්චුනා.

15. විවක්ෂිතා'මවිඥාය තත්ක්ෂණප්‍රතිසංහෘතාම්
ප්‍රාපයන් පවනව්‍යාධෙ'ර්ගිර'මුත්තරපක්ෂතාම්.

16. ඝූර්ණයන් මදිරාස්වාදමදපාටලිතද්‍යුතී
රෙවතීවදනොච්ඡිෂ්ට'පරිපූතපුටෙ දෘශෞ.

---

14. තතඃ, ඉක්බිතිව (රාමඃ ජගාද' යනාදි මතු ශ්ලෝකය සමග සම්බන්ධ කටයුතුයි); රාමඃ, ශ්‍රී කෘෂ්ණ තෙම; සපත්න, සතුරුහට; අපනයන, අපකාර (කිරීම) සම්බන්ධ හෙවත් සතුරු පහකිරීම සම්බන්ධ; ස්මරණ, සිහිකිරීමෙන්වූ; අනුශය, පශ්චාත්තාපයෙන්; ස්ඵුර, පැතිර ගත්තාවූ; රාමොෂ්ඨ, රාමාවගේ හෙවත් සිරිකතගෙ දෙතොල් නමැති; බිම්බ, බිඹුඵල හෙවත් බිඹුඵලවන්දෙතොල; චුම්බනචුඤ්චුනා, සිඹිමෙන් ප්‍රසිද්ධවූ; ඔෂ්ඨෙන, තොලින් යුක්තවූයේය (උපලක්ෂිතවී යයි සේයි.)

සපත්නඃ අපනයඃ (අපකාරඃ)= තස්‍ය ස්මරණෙන (යො)' නුශයඃ (පශ්චාත්තාපඃ)= තෙන ස්ඵුරතීති අනුශයස්ඵුඃ තෙන ස්ඵුරා රාමායාඃ ඔෂ්ඨබිම්බස්‍ය චුම්බනෙන (විත්තෙනා) රාමොෂ්ඨබිම්බචුම්බනචුඤ්චුඃ (තෙන) යනු ටීකාගත සමාස විග්‍රහයි ඉතා සැකෙවිනි (**උපමානුප්‍රාස සංසෘෂ්ටි අලඞ්කාරයි.**)

15. විවක්ෂිතම්, විවක්ෂිතවූ හෙවත් කියනුකැමතිවූ; තත්ක්ෂණ, එකණෙහි හෙවත් විවක්ෂාක්ෂණයෙහිම; ප්‍රතිසංහෘතාම්, ප්‍රතිසංහෘතවූ හෙවත් (රාමානුරොධය හෙතුකොටගෙණ) හකුළුවනලද්දවූ; අවිඥඃ, කාර්‍ය්‍යඥවූ හෙවත් කටයුතු දන්නාවූ; පවනව්‍යාධෙඃ, උද්ධවයාගෙ; ගිරම්, තෙපුල; උත්තරපක්ෂතාම්, සිද්ධාන්ත පක්ෂබවට හෙවත් තමන්ගෙන් උත්තරවූ සිද්ධාන්තයට පක්ෂබවට; ප්‍රාපයන්, පමුණුවන්නේ (තමන් අසත් පක්ෂය අවලම්බනය කරණහෙයිනැයි සේයි)

(විවක්ෂිතාම් යනු වක්තුමිච්ඡතී'ති යනාර්ථයෙහි වච්ධාතුහු කෙරෙන් 'වචෙඃසෙඤ්‍ය වා සන්නන්තාත් කර්මණි ක්තඃ' යනුවෙන් කර්මයෙහි ක්තප්‍රත්‍යයයි)

16. මදිරාස්වාදමද, මද්‍යපානයෙන්වූ මදයෙන්; පාටලිත, මදක් රක්තවර්ණවූ; ද්‍යුතී, කාන්තිඇති; රෙවතීවදන, රෙවතී දෙවියගෙ මුඛයෙහි; උච්ඡිෂ්ට, (මද්‍ය'ලෙපන තාම්බූලාදි) ඉඳුලෙන්; පරිපූත පුටෙ, පවිත්‍රවූ අක්ෂි ගෝල ඇති; දෘශෞ, දෑස; ඝූර්ණයන්, භ්‍රමනය කරවමින්.

17. ආශ්ලෙෂලොලුපවධූ ස්තනකාඨින්‍යසාක්ෂිණීම්
ම්ලාපයන්න'භිමානොෂ්මණා' වනමාලාං මුඛානිලෛඃ

18. දධත් සන්ධ්‍යාරුණව්‍යොම ස්ඵුරත්තාරානුකාරිණීඃ
ද්විෂත්වෙෂො පරක්තාඞ්ගසඞ්ගිනීඃ ස්වෙදවිප්‍රුෂඃ.

19. ප්‍රොල්ලසත් කුණ්ඩලප්‍රොත පද්මරාගදලත්විෂඃ
කෘශානොරුත්තරා සඞ්ගරුචං විදධච්චෙව'තපල්ලවීම්.

---

(මදිරායාඃ ආස්වාදනම් (පානම්) මදිරාස්වාදනං තෙන ජාතඃ මදඃ මදිරාස්වාද මදඃ තෙන පාටලිතා (ඊෂත් රක්තීකෘතා) ද්‍යුතිර්යයොඃ සෞ= රෙවත්‍යාඃ වදනං= රෙවති වදනෙ උච්ඡිෂ්ටං- තෙන පරිපූතෙ (ශුද්ධෙ) පුටෙ'ස්‍ය යොසෞ= යනු සමාස විග්‍රහයි) **විරොධාභාසාලංකාරය**. 'ආභාසත්වෙ විරොධස්‍ය විරොධාභාස උච්‍යතෙ' යනු තල්ලක්ෂණයි.

17. ආශ්ලෙෂ, වැලඳගැන්මෙහි; ලොලුප, ලොල්වූ; වධූ, කාන්තාවගෙ; ස්තන, පියවුරු යුවල සම්බන්ධවූ; කාඨින්‍ය, කඨිනභාවයට; සාක්ෂිණීම්, සාක්ෂ්‍යවූ (නිතර පෙළනු ලබන්නාවූ යී සේයි); වනමාලාම්, වනපුෂ්ප මාලාව; අභිමානොෂ්මණාඃ, අභිමානයෙන් උණුසුම්වූ; මුඛානිලෛඃ මුඛනිඃශ්වාස, මාරුතවලින් ම්ලානයන් මලානික කරමින්.

(ආශ්ලෙෂෙ ලොලුපා= ආශ්ලෙෂෙ ලොලුපායාඃ වධ්වාඃ ස්තනයොඃ කාඨින්‍යම්= තස්‍ය සාක්ෂිණී= තාම්- **අතිශයොක්තියි**

18. සන්ධ්‍යාරුණ, සන්ධ්‍යා කාලයෙහි අරුණුවන්වූ; ව්‍යොම, අහසෙහි; ස්ඵුරත්, පැතිරෙන්නාවූ; තාරානුකාරිණීඃ, තාරකාවන්ට අනුකාරිණීවූ හෙවත් සමානවූ; ද්විෂත්වෙෂ, සතුරාගෙ ක්‍රොධයෙන්; උපරක්තාඞ්ග, උපරඤ්ජනය කරණලද ශරීරයෙහි; සඞ්ගිනීඃ, ආසක්තවූ (ඇලුනාවූ යී සේයි); ස්වෙදවිප්‍රුෂඃ, ඩහදිය බිඳුන්; දධත්, ධරන්නාවූ.

(සන්ධ්‍යායාම් අරුණඃ= සන්ධ්‍යාරුණෙ ව්‍යොම= තස්මින් ස්ඵුරන්තීති සන්ධ්‍යා-ස්ඵුරත්- තාරාඃ අනුකුර්වන්තීති තාරානුකාරිණීඃ ද්විෂතඃ වෙෂඃ ද්විෂත් වෙෂඃ තෙන උපරක්තම් අඞ්ගම්=(තස්මින්) සඞ්ගිනීඃ= ස්වෙදානාම් විප්‍රුෂඃ ස්වෙදවිප්‍රුෂඃ= මේ පද්‍යය **උපමාලඞ්කාරයි**.)

19. ප්‍රොල්ලසත්, ප්‍රකම්පයෙන් බබලන්නාවූ; කුණ්ඩල, කුණ්ඩලාභරණ දෙක්හි; ප්‍රොත, ව්‍යාප්තවූ හෙවත් පැතිරගත්තාවූ; පද්මරාගදලත්විෂා, පද්මරාග (රතුකැට) මාණික්‍ය ඛණ්ඩයන්ගේ කාන්තියෙන්;

20. කකුද්මිකන්‍යාවක්ත්‍රාන්ත'ර්වාසලබ්ධා'ධිවාසයා
මුඛාමොදං මදිරයා කෘතානුව්‍යාධමු'ද්වමන්

21. ජගාද වදනච්ඡද්ම පද්මපර්‍යන්තපාතිනඃ
නයන්මධුලිහඃ ශ්වෛත්‍ය'මුදග්‍රදශනාංශුභිඃ

22. යවාසුදෙවෙනා'දීන'මනාදීනව'මීරිතම්
වචසස්තස්‍ය සපදි ක්‍රියා කෙවලමුත්තරම්.

---

චෛතපල්ලවිම්, මීඅඹ දලු සම්බන්ධවූ; කෘෂ්ණොත්තර සඞ්ගරුචං, නීලවර්ණ උත්තර සාටකයන්ගෙ ශොභාව; විදධත්, වෙසෙසින් දරන්නේ.

(මෙහි ප්‍රොතයනු 'ප්‍රපූජිත් වෙසඃ කාමිණීකාන්තඃ' යනුවේන් කාමී යෙහි කාන්තප්‍රත්‍යයවූතැනි) **නිදර්ශනාලඞ්කාරයි**.

20. කකුද්මිකන්‍යා, රෙවති දෙවියගෙ; වක්ත්‍රාන්තර්වාස, මුඛාභ්‍යන්තරයෙහි විසීමෙන්; ලබ්ධාධිවාසයා, ලබනලද වාසනා හෙවත් සුවඳ කැවීම් ඇති; මදිරයා, සුරාවෙන්; කෘතානුව්‍යාධං, කරණලද සංසර්ග ඇති; මුඛාමොදං, මුඛ සුගන්ධය; උද්වමන්, උද්ගිරණය කර මින්.

(කකුද්මිව සා කන්‍යාචෙති කකුද්මිකන්‍යා තස්‍යාඃ වක්ත්‍රම්= තස්‍ය අන්තඃ;= තස්මින් වාසෙන ලබ්ධො'ධිවාසො යයාඃ සා= (තයා) මුඛස්‍ය මුඛෙවා ආමොදඃ= (තම්) කෘතඃ අනුව්‍යාධඃ (සංසර්ගඃ) යස්‍ය සඃ තම්– යනු සමාසවිග්‍රහයි.

21. වදනච්ඡද්ම, මුඛයම කපටය හෙවත් වැස්මකොට ඇති; පද්මපර්‍යන්ත, පද්මයාගෙ හෙවත් මුඛපද්මයාගෙ ප්‍රාන්ත භාග යෙහි; පාතිනඃ, වැටෙන්නාවූ හෙවත් හැසිරෙනසුලුවූ; මධුලිහඃ, භෘඞ්ගයන්; උදග්‍ර, උසස්වූ හෙවත් පැතිරගත්තාවූ; දශනාංශුභිඃ, දන්තකාන්තිවලින්; ශ්වෛත්‍යම්, ශ්වෙතවර්ණ භාවයට; නයන්, පමුණුවමින්; ජගාද, (මෙසේ) කීයේය.

**රාමඃ එතත් ජගාද** යනු මෙහි ක්‍රි- යි. ජගාද|යනු ගද ව්‍යක්තායාම් වාචිධාතු පරොක්‍ෂලිට් ණප් ප්‍රත්‍යයි ( වදනමෙව ඡද්ම යස්‍ය තත්= තමෙව පද්මං= තස්‍ය පර්‍යන්තං= තස්මින් පතති (සංචරති ශීලෙනාති) වදන– පාතී(තාන්) මධුලිහනිති මධුලිහඃ උදග්‍රාශ්චතෙ දශනාශ්චෙති= උදග්‍රදශනාඃ තාම් අංශවඃ= (තෛඃ) යනු සමාස ක්‍රමයි මේ පද්‍යය **තද්ගුණාලඞ්කාරයි**.

**22.** වාසුදෙවෙන, වාසුදෙවයා විසින්; අදීනං, දීනනොවූ හෙවත් බැගෑපත්නොවූ; අනාදීනවම්, ආදීනව රහිතවූ හෙවත් නිර්දොෂවූ; යත්වචඃ, යම් බසක්; ඊරිතම්, කියනලද්දේද; තස්‍යවචසඃ, ඒ වච

23. නෛතල්ලඝ්වපි භූයස්‍යා වචො වාචාතිශය්‍යතෙ
ඉන්ධනෞඝධගප්‍යග්නිස් ත්විෂා නා'ත්‍යෙති පූෂණම්.

24. සංක්ෂිප්තස්‍යා'ප්‍යතො'ස්‍යෛව වාක්‍යස්‍යාර්ථගරීයසඃ
සුවිස්තරතරා වාචො භාෂ්‍යභූතා භවන්තු මෙ.

---

නය; සපදි, එකෙණෙහි; ක්‍රියා, කිරීම හෙවත් අනුෂ්ඨානය; කෙවලං, එකම; උත්තරම්, උපකාරය වෙයි හෙවත් කෙවලං හුදෙක්; උත්තරම්, උදව්වක් වෙයි නොහොත් උත්තමවෙයි (සිද්ධාන්තයක්ම හි හෙසිතැයි සේයි) එනම් 'උත්තිෂ්ඨමානස්තු පරඃ' යනාදින් හි වචනයි.)

**වාසුදෙවෙන සඤ්ජීතම් තස්‍යවචසඃ ක්‍රියා උත්තරම් භවති** යනු මෙහි ක්‍රි- සි. **සම්භාවොක්තියි.**

23. ලඝුඅපි, ලුහුවූද හෙවත් සංක්ෂිප්තවූද; එතත්වචඃ, මේ වචනය; භූයස්‍යා, බහුතරවූ හෙවත් විස්තෘතවූද; වාචා, වචනයෙන්; නඅතිශය්‍යතෙ, **අති** රික්ත නොවෙයි; ඉන්ධනෞඝධගක්අපි, දර රැශියක් දවන්නාවූද; අග්නිඃ, වහ්නි තෙම; ත්විෂා, කාන්තියෙන් හෙවත් ප්‍රභාවෙන්; පූෂණම්, සූර්යයා; නඅත්‍යෙති, නොඉක්මවයි.

**එතත්වචඃ නඅතිශය්‍යතෙ** යනුද **අග්නිඃ ත්විෂා පූෂණම් නාත්‍යෙති** යනුද මෙහි ක්‍රි- සි. අතිශය්‍යතෙ යනු අතිපූර්ව ශීඞ් ස්වප්නෙ ධාතුකෙරෙන් කර්මයෙහි ලට්= යක් ප්‍රත්‍යයයි 'අයඞ් යි ඞිති' යනුවෙන් අයඞාදෙශයි නාත්‍යෙති යනු අති පූර්ව ඉණ්ගතෞ ධාතු කර්තෘ-ලට් තිප් ප්‍රත්‍යයයි. **දෘෂ්ටාන්තාලඞ්කාරයි.**

24. අතඃ, එහෙයින් (හරිහුගේ වචනය අතිශයින් නොකටයුතු බැවිනැයි සේයි); සුවිස්තරතරාඃ, අතිශයින් විස්තරවූ; මෙවාචඃ, මාගෙ වචනයෝ; සංක්ෂිප්තස්‍යඅපි, සංක්ෂෙප කරණලද්දේ නුමුත් (අල්පාක්ෂර වූ නුමුත්); අර්ථගරීයසඃ, අතිශයින් අර්ථයෙන් මහත්වූ හෙවත් අර්ථයෙන් ගරුතරවූ; අස්‍යඑවවාක්‍යස්‍ය, මේ වාක්‍යය සම්බන්ධවූම; භාෂ්‍යභූතාඃ, භවන්තු ව්‍යාඛ්‍යාන ස්වරූප වූව හු වෙත්වා (ව්‍යාඛ්‍යානයන් හා සමානයෝ වෙත්වායී සේයි.)

(**මෙවාචඃ භාෂ්‍යභූතාඃ භවන්තු** යනු මෙහි ක්‍රි- සි. මෙහි අර්ථගරීයසඃ යනු- අතිශයෙන ගුරුරිති යනාර්ථයෙහි 'තරතමෙයස්විෂ්ඨාඃ ප්‍රකර්ෂේ' යනුවෙන් ඊයසුප්‍රත්‍යය හා ගුරුශබ්දයට' ගුර්වාදෙරිෂ්ඨමෙයස්සු ගරාදිෂ්ට්‍යලොපශ්ච' යනුවෙන් ගරාදෙශයි (අර්ථගරීයසඃ යනු ව්‍යාකරණ සූත්‍ර හා සමාන අරුත් ඇතියයි සේයි) සූත්‍ර ලක්ෂණයනම්-

25. විරොධිවචසො මූකාන්වාගීශාන'පි කුර්වතෙ
ජඩාන'ප්‍යනුලොමාර්ථා'න්ප්‍රවාචඃ කෘතිනාම් ගිරඃ.

26. ෂඩ්ගුණාඃ ශක්තයස්තිස්‍රඃ සිද්ධයශ්චෝ'දයාස්ත්‍රයඃ
ග්‍රන්ථාන'ධීත්‍ය ව්‍යාකර්තු'මිති දුර්මේධසො'ප්‍යලම්.

---

අල්පාක්ෂරමසංදිග්ධං සාරවත් විශ්වතො මුඛම්
* අස්තොභම'නවද්‍යඤ්ච සූත්‍රම් සූත්‍රවිදො විදුඃ-යනුයි.

භාෂ්‍යලක්ෂණයනම්-

සූත්‍රාර්ථං පදමාදාය වාක්‍යෛඃ සූත්‍රානුසාරිභිඃ
ස්වපදානි ච වර්ණ්‍යන්තෙ භාෂ්‍යං භාෂ්‍යවිදො විදුඃ-යනුයි.

භාෂ්‍යනම් සූත්‍රව්‍යාඛ්‍යාන විශෙෂයෙක්මැයි සූචිතයි. මේ පද්‍යය **උපමාලඞ්කාරයි. මුක්තක බන්ධනයි.**

25. කෘතීනාම්, දක්ෂයන්ගේ (හෙවත් පඬුවන්ගේ; ගිරඃ, වචනයෝ තුමූ; විරොධිවචසඃ, ප්‍රතිකූලවාදඇති හෙවත් විරොධිවූ බස් ඇති; වාගීශාන්අපි, වාගීශ්වරයන් පවා; මූකාන්කුර්වතෙ, ගොළුවන් කෙරෙත්; අනුලොමාර්ථාන්, අනුකූලවූ අර්ථඇති හෙවත් අනුකූල වාදීන්; ජඩාන්අපි, මූඪයන්ද; ප්‍රවාචඃ, බුහුටිබස් ඇත්තවුන් හෙවත් ව්‍යක්ත වචන ඇත්තවුන්; (කුර්වතෙ, කෙරෙති.)

**කෘතිනාම් ගිරඃ වාගීශාන් අපි මූකාන් කුර්වතෙ** යනුද **කෘතී නාම් ගිරඃ ජඩාන්අපි ප්‍රවාචඃකුර්වතෙ** යනුද මෙහි ක්‍රි- යි. කෘඤ් කරණෙ ධාතුවෙන් අතෙත ප්‍රත්‍යයි අන් යනාදෙගයි (විරොධිවාක් යෙෂාම් තෙ- විරොධිවචසඃ වාචානාමීශඃ වාගීශඃ (තාන්) අනු ලොමො'ර්ථොයෙෂාම් තෙ= තාන් යනු සමාසයි **විශෙෂාලඞ්කාරයි. මුක්තකයි.**) 'බුධෛඃ ඵලමනාග්‍රහඃ' යන න්‍යායෙන් ආත්මනිතස්වා මිහු විසින් ශාස්ත්‍රඥ වචනය ප්‍රතිකූලවූයේ නමුදු ගතයුතුම නොවන් නේදැයි යන සැකයෙන් (නැවත මෙසේ) කියයි.

26. දුර්මේධසඃඅපි, මඳනුවනැති ජනයෝද; ග්‍රන්ථාන් (ශාස්ත්‍රීයවූ ග්‍රන්ථයන් හෙවත් උසනස් (සිතුරු) ආදීන් විසින් කරණලද ග්‍රන්ථයන්; අධීත්‍ය, හදරා හෙවත් දූතඋගෙණ; ගුණාඃ, ගුණයෝතුමූ; ෂට්, (සන්ධිවිග්‍රහාදී වසයෙන්) සදෙනෙකැයිද; ශක්තයඃ' ශක්තිහු; තිස්‍රඃ, (ප්‍රභාව මන්ත්‍ර උත්සාහ වසයෙන්) තිදෙනෙකැයිද; සිද්ධයඃ, සිද්ධිහු හෙවත් ශක්තීත්‍රයෙන් සාධ්‍යවූ පුරුෂාර්ථ ලාභාත්මික සිද්ධිහු; තිස්‍රඃ, ප්‍රභු සිද්ධාදී වසයෙන් තුනෙකැයිද; උදයාඃ, අභ්‍යුදයෝ හෙවත් අභිවෘද්ධිහු; ත්‍රයඃ, වෘද්ධි ක්ෂය ස්ථාන වසයෙන් තුනෙකැයිද; ව්‍යාකර්තුම්, ප්‍රකාශකරන්ට; අලම්, සමර්ථවෙති.

---

* අස්තොභ'මනවද්‍යඤ්ච' යි ඇතැම් පොත්හි.

27. අනිර්ලෝඩිතකාර්‍ය්‍යස්‍ය වාග්ජාලං වාග්මිනෝ වෘථා
නිමිත්තා'දපරාද්ධෙෂෝ'ර්ධානුෂ්කස්‍යෙව වල්ගිතම්.

28. සර්වකාර්‍ය්‍යශරීරේෂු 'මුක්ත්වා' ඞ්ගස්කන්ධපඤ්චකම්
සෞගතාන'මිවාත්මාන්‍යො නාස්ති මන්ත්‍රො
මහීභෘතාම්.

---

(**දුර්මේධසඃ අපි ශ්‍රුත්වානධීත්‍ය ව්‍යාකර්තුම් අලම් භවන්ති** යනු මෙහි ක්‍රි- සි. භූධාතුවෙන් අනතිප්‍රත්‍යයයි දුෂ්ටා මේධා යේෂාං තෙ දුර්මේධසඃ මෙහි ෂඩ්ගුණයෝ'නම් සන්ධි විග්‍රහ යාන ආසන ද්වෛධීභාව සංශ්‍රය යන මොහුයි තත්‍රාරි විජිගීෂ්වො ව්‍යවස්ථාකරණං මෛත්‍රං සන්ධිඃ විරෝධො විග්‍රහඃ විජිගීෂෝරරිං ප්‍රතියාත්‍රා යානම් තයෝර්මිථඃ ප්‍රතිබන්ධකතයොඃ කාලප්‍රතීක්ෂයා තූෂ්ණීමවස්ථාන' මාසනං දුර්බල ප්‍රබලයෝර්ජීවිත මාත්මසමර්පණං ද්වෛධීභාවඃ අරිණා පීඩ්‍යමානස්‍ය බලවදාශ්‍රයනං සංශ්‍රයඃ කොශදණ්ඩාත්මං තේජඃ ප්‍රභාවඃ කතීව්‍යා ඓර්ෂ්‍ය සෙප්ඨාන් ප්‍රයත්න උත්සාහඃ ෂඩ්ගුණචින්තනං මන්ත්‍රඃ' සිද්ධි ත්‍රයනම් ප්‍රභුසිද්ධි මන්ත්‍රසිද්ධි උත්සාහසිද්ධි යන මොහුයි.) අභිවෘද්ධිත්‍රය නම් වෘද්ධි ක්ෂය ස්ථාන යන තුනයි.

27. අනිර්ලෝඩිතකාර්‍ය්‍යස්‍ය,(බුද්ධියෙන්) නොවිමසනලද කටයුතු ඇති; වාග්මිනඃ, වාග්මීහුගෙ හෙවත් බොහෝවූ වචන ඇත්තහුගෙ; වාග්ජාලං, වාගාඩම්බරය; නිමිත්තාත්, නිමිත්තෙන් හෙවත් ඉලක්ක යෙන්; අපරාද්ධෙෂොඃ, ස්ඛලිතවූ හෙවත් පැකුළුණු ඊ ඇති; ධානුෂ්කස්‍ය, ධනුර්ධරයාගෙ; වල්ගිතම්ඉව, ප්‍රහාර ප්‍රයොගය මෙන් (පහරදීමට උත්සාහය මෙනැයි සේයි); වෘථා, නිෂ්ඵල වෙයි.

(**වාග්මිනො වාග්ජාලං වෘථාස්‍යාත්** යනුද **ධානුෂ්කස්‍ය වල්ගිතම් වෘථාස්‍යාත්** යනුද මෙහි ක්‍රි-සි. (අනිර්ලෝඩිතං (නාලොකිතං) කාර්‍ය්‍යම් යේනාසෞ (තස්‍ය) වාචොස්‍ය සන්තීති වාග්මී (තස්‍ය) වාචාම් ජාලං වාග්ජාලං අපරාද්ධඃ ඉෂුඃයස්‍යාසෞ= ධනුඃ ප්‍රහරණමස්‍යෙති ධානුෂ්කඃ තස්‍ය යනු නිර්වචනයි.

(කාර්‍ය්‍යඥයාගේ වචනය ගත යුතු වෙයි, වාචාලයාගේ කිම නොගත යුතු වේයයි මෙයින් ප්‍රකාශිතයි.)

28. සර්වකාර්‍ය්‍යශරීරේෂු, සියලු සන්ධ්‍යාදි කාර්‍ය්‍ය නමැති ශරීර යන්හි; අඞ්ගස්කන්ධපඤ්චකම්, අවයව නමැති ස්කන්ධ පඤ්චකය; මුක්ත්වා, හැර; සෞගතානාම්, සර්වඥයන් කෙරෙහි භක්ති ඇත්ත වුන්ට හෙවත් බෞද්ධයන්ට; ආත්මා, ආත්මභාවයෙක්; නාස්තිඉව, නැත්තාක්මෙන්; මහීභෘතාම්, එබඳු මහීපාලයන්ට; අන්‍යඃ, අන්‍යවූ; මන්ත්‍රඃ, මන්ත්‍රයක්; (නාස්ති) නැත්තේමැයි.

29. මන්ත්‍රෝ යොධඉවාධීරඃ සර්වාඞ්ගෛඃ සංවෘතෛරපි
චිරං නසහතෙ ස්ථාතුං පරෙභ්‍යො භෙදශඞ්කයා.

30. ආත්මොදයඃ පරජ්‍යානිර්ද්වයං නීති රිතීයතී
තදූරීකෘත්‍ය කෘතිභිර්වාචස්පත්‍යං ප්‍රතායතෙ.

---

(**මණිභානාම් අන්‍යඃ මිනත්‍රඃ නාස්ති** යනු මෙහි ක්‍රි- යි. නාස්ති යනු නඤ්පූර්ව අස්භුවි වතී ලට් තිප් ප්‍රත්‍යයි සර්වාණිච තානි කාර්‍ය්‍යාණිචෙති සර්වකාර්‍ය්‍යාණි= තානි එවශරීරාණි= තෙෂු= අඞ්ගානිඑව ස්කන්ධාඃ= තෙෂාම් පඤ්චකම්= පඤ්ච පරිමාණ මස්‍යෙති පඤ්චකම්-ඩී. තද්ධිතයි සුගතෙ භක්තිර්යේෂාම්තෙ සෞගතාඃ යනු නිර්වචනයි. **උපමාලඞ්කාරයි.**

29. සංවෘතෛඃ, ගුප්තවූ හෙවත් සැඟවුනාවූ; සර්වාඞ්ගෛඃ අපි, (උපායාදීවූද උරඃස්ථලාදිවූද) සියලු අඞ්ගවලින් යුක්තවූද හෙවත් සර්වාඞ්ගසංවෘතවූද; මන්ත්‍රඃ, මන්ත්‍රසඞ්ඛ්‍යාතවූ විචාරතෙම; අධීරඃ, ධීරනොවූ හෙවත් බියවත සුලුවූ; යොධඃඉව, යුද්ධභටයෙකු මෙන්; පරෙභ්‍යඃ, අනුන්ගෙන් දෙහෝ නොහොත් සතුරන්ගෙන්; භෙද ශඞ්කයා, බිඳීම සම්බන්ධවූ සැකයෙන් (දෙහෝ නොහොත් තුන්වැන්නෙකු කරා පැමිණෙනබව යයි කියනලද) සැකයෙන්; චිරම්, දීර්ඝ කාලයක්; ස්ථාතුම්, සිටින්ට; නසහතෙ, සමර්ථ නොවෙයි.

(**මන්ත්‍රඃ අධීරඃ යොධඃඉව’ චිරම්ස්ථාතුම් නසහතෙ** යනු ක්‍රි යි නසහතෙ යනු නඤ් පූර්ව සහමර්ෂණෙ වතී- ලට්- තෙ ප්‍රත්‍යයි. **උපමාශ්‍රි ස්වභාවොක්තියි.**

30. ආත්මොදයඃ, තමාගෙ අභිවෘද්ධියද; පරජ්‍යානිඃ, සතුරාගෙ පරිහානියද; ඉති, යන; ඉයතී, මෙපමණෙක්; නීතිඃ, නීතිය වෙයි හෙවත් නීති සංග්‍රහය වෙයි; තද්වයං, ඒදෙක; උරීකෘත්‍ය, අඞ්ගීකාර කොට හෙවත් පිළිගෙණ (පමණකොට සලකාගෙණ යයි සේයි); කෘතිභිඃ, ව්‍යක්තයන් විසින්; වාචස්පත්‍යම්, වාගීශ්වර භාවය; ප්‍රතායතෙ, විස්තර කරණු ලැබේ.

(**කෘතිභිඃ තත් උරීකෘත්‍ය වාචස්පත්‍යං ප්‍රතායතෙ** යනු මෙහි ක්‍රි- යි. ප්‍රතායතෙ යනු ප්‍රපූර්ව තනුවිස්තාරෙධාතු වතී= කර්ම= ලට් තෙ ප්‍රත්‍යයි ‘තනොතෙර්යකි’ යනුවෙන් ආත්වයයි ආත්මනඃ උදයඃ ආත්මොදයඃ පරස්‍යජ්‍යානිඃ= ඉදම් පරිමාණමස්‍යා ඉති ඉයතී ‘කිමිදංභ්‍යාංවොඝඃ’ ඉති වතුපොවස්‍ය ඝශ්ච- යනුවෙන් වකාරයට ඝත්වයයි ‘උගිතශ්ච’ යනුවෙන් ඞීප් ප්‍රත්‍යයි වාචස්පතුර්භාවඃ වාචස්පත්‍යං යනු විග්‍රහයි.

31. තෘප්තියොගඃ පරෙණා'පි මහිම්නා න මහාත්මනාම්
පූර්ණශ්චන්ද්‍රොදයාකාඞ්ක්ෂී දෘෂ්ටාන්තො'ත්‍ර මහාර්ණවඃ.

32. සම්පදා සුස්ථිරංමන්‍යො භවති ස්වල්පයා'පි යඃ
කෘතකෘත්‍යො විධිර්මන්‍යෙ න වර්ධයති තස්‍ය තාම්.

33. සමූලඝාත'මඝ්නන්තඃ පරාන්නො'ද්‍යන්ති මානිනඃ
ප්‍රධ්වංසිතාන්ධතමසස්තත්‍රො'දාහරණං රවිඃ.

---

31. මහාත්මනාම්, මහාත්මයන්ට; පරෙණ අපි, බොහෝවූද; මහිම්නා, මාහාත්ම්‍යයෙන් හෙවත් ඓශ්වර්‍ය්‍යයෙන්; තෘප්තියොගඃ, සන්තෝෂ ලාභය තෙම; න, නොවෙයි; අත්‍ර, මේ තෘප්ත්‍ය භාවයෙහි; පූර්ණඃ, පරිපූර්ණවූද; මහාර්ණවඃ, මහා සාගරය තෙම; චන්ද්‍රොදයා කාංක්ෂී, වර්ධනය පිණිස චන්ද්‍රයාගේ උද්ගතවීම කැමති වන්නේ; දෘෂ්ටාන්තඃ ඊට නිදර්ශනවෙයි.

මහාත්මනාම් මහිම්නා තෘප්තියොගඃ නභවති යනුද මහාර්ණවඃ චන්ද්‍රොදයාකාංක්ෂී අත්‍ර දෘෂ්ටාන්තඃ භවති යනුද මෙහි ක්‍රි-යි. තෘප්තෙ යොගඃ=මහතඃභාවඃ මහිමා (තෙන) මහාන්ආත්මා යෙෂාම් තෙ මහාත්මානඃ (තෙෂාම්) චන්ද්‍රස්‍යඋදයඃ= චන්ද්‍රොදයම් ආකාංක්ෂති ශීලෙනාති= දෘෂ්ටඃ අන්තො (නිශ්චයො) යස්මින්නිති= මහාංශ්චාසාවර්ණව ශ්චෙති= යනු නිර්වචනයි. උපමාලඞ්කාරයි.

32. යඃ, යමෙක් තෙම; ස්වල්පයාඅපි, ස්වල්පවූද; සම්පදා, සම්පත් තියෙන්; සුස්ථිරං මන්‍යඃ භවති, තමා මොනවට ස්ථිරකොට හඟින් නෙක් වේද; කෘතකෘත්‍යඃ, කරණලද කටයුතු ඇති හෙවත් එපමණෙකින්ම කෘතාර්ථවූ; විධිඃ, දෛවය හෙවත් වාසනාව; තස්‍ය, ඒ ස්වල්ප සන්තුෂ්ටයාගෙ; තාං, ඒ ස්වල්ප සම්පත්තිය; නවර්ධයති, (ඉති) වර්ධනය නොකෙරේ යයි; මන්‍යෙ, මම හඟිමි (සිතමි යයි සේයි)

**(යඃ සුස්ථිරං මන්‍යඃ භවති** යනුද **විධිඃ තාං නවර්ධයති** යනුද අහම් (තත්) මන්‍යෙ යනුද මෙහි ක්‍රි- යි. භවති යනු භූසත්තායාම් ධාතු වර්ත- ලට්- තිප් ප්‍රත්‍යයි වර්ධයති යනු වෘධුඞ් වර්ධනෙධාතු වර්ත- ලට්- තිප් ප්‍රත්‍යයි මන්‍යෙ යනු මනඥානෙධාතු වර්ත- ලට්- එ'ප්‍රත්‍යයි.

33. මානිනඃ, අභිමානීජනයෝ; පරාන්, සතුරන්; සමූලඝාතම්, සමූලඝාතකොට හෙවත් සහමුලින් නැසුම් ඇතිකොට; අඝ්නන්තඃ, නොනසන් සාහු; නඋද්‍යන්ති, උද්‍යමනොකෙරෙත්ද (සතුරන් නසාම උද්‍යම කෙරෙතියි සේයි); තත්‍ර, එහි; ප්‍රධ්වංසිත, ප්‍රධ්වංසනය කරණලද; අන්ධතමසඃ, ගාඪාන්ධකාර ඇති; රවිඃ, සූර්‍ය්‍යතෙම; උදාහරණම් දෘෂ්ටාන්තයි හෙවත් නිදර්ශන වෙයි.

34. විපක්ෂම'ඛිලීකෘත්‍ය ප්‍රතිෂ්ඨා ඛලු දුර්ලභා
අනීත්වා පඞ්කතාං ධූලි'මුදකං නාවතිෂ්ඨතෙ.

35. ධ්‍රියතෙ යාව'දෙකො'පි රිපුස්තාවත්කුතඃ සුඛම්
පුරඃ ක්ලිශ්නාති සොමං හි සෛංහිකෙයො
සුරද්‍රුහාම්.

36. සඛා ගරීයාන් ශත්‍රුශ්ච කෘත්‍රිමස්තෞ හි කාර්යතඃ
ස්‍යාතාම'මිත්‍රෞ මිත්‍රෙ ච සහජප්‍රාකෘතාව'පි.

---

(**මානිනඃ පරාන් අසහමානාඃ නෝද්‍යාන්ති** යනුද **රජඃ නනු උද්ධරණං භවති** යනුද මෙහි ක්‍රි- යි. උද්‍යාන්ති යනු උත්පූර්ව යා ප්‍රාපනෙ ධාතු වනී- ලට්- අන්ති ප්‍රත්‍යයි- භවති යනු භූ, සත්තායාම් ධාතු වනී- ලට්- තිප් ප්‍රත්‍යයි (මානරෙෂාමස්තීති මානිනඃ ප්‍රධ්වංසිතං අන්ධතාමසං යෙන සඃ= මෙහිදු **උපමාලඞ්කාරය** මැයි **නිදර්ශනාලඞ්කාරය** නොවෙයි දතයුතුයි.

34. විපක්ෂං, විපක්ෂවූවහු හෙවත් සතුරා; අඛිලීකෘත්‍ය, උත්සන්න නොකොට හෙවත් නොම උපුටා; ප්‍රතිෂ්ඨා, ප්‍රතිෂ්ඨා තොම; දුර්ලභාඛලු, සුලභ නොවන්නීමැයි; ( කුමක්මෙන්ද යත්? ) උදකං, ජලය තෙම; ධූලිම්, දූවිල්ල; පඞ්කතාම්, මඩබවට; අනීත්වා, නොපමුණුවා; නඅවතිෂ්ඨතෙ, නොසිටීද (එසේමැයි)

(**උදකං ධූලිං පඞ්කතාම් අනීත්වා න අවතිෂ්ඨතෙ** යනු මෙහි ක්‍රි-යි. අවතිෂ්ඨතෙ යනු අවපූර්ව ෂ්ඨා 'ගතිනිවෘත්තෞ' ධාතු වනී ලට්- තෙ' ප්‍රත්‍යයි- **නිදර්ශනාලඞ්කාරයි**

35. එකඃ අපිරිපුඃ, එකද සතුරෙක්; යාවත්, යම්තාක්; ධ්‍රියතෙ, ධරයිද හෙවත් සිටීද; තාවත්, ඒතාක්; සුඛම්, සැපයෙක්; කුතඃ, කොයින්ද සැපයෙක් නම් නොවන්නේයයි සේයි; (ඒ එසේමැයි) සෛංහිකෙයඃ, සිංහිකා පුත්‍රවූ රාහුතෙම; අසුරද්‍රුහාම්, අසුරයන් නසන්නවුන්ගෙ හෙවත් දෙවියන්ගෙ; පුරඃ, ඉදිරියෙහි; සොමං, චන්ද්‍රයා නොහොත් චන්ද්‍රයා හා සූර්යයා; ක්ලිශ්නාති, කෙලෙසාමැයි.

**එකඃ අපි රිපුඃ යාවත් ධ්‍රියතෙ** යනුද **සුඛම් කුතඃ භවති** යනුද **සෛංහිකෙයඃ සොමං ක්ලිශ්නාති** යනුද මෙහි ක්‍රි- යි. ධ්‍රියතෙ යනු ධෘඤ් අවස්ථානෙ- ධාතු වනී- ලට්- තෙ ප්‍රත්‍යයි. ක්ලිශ්නාති- යනු ක්ලිශ විබාධෙධාතු වනී-ලට්-තිප් ප්‍රත්‍යයි (සිංහිකායාඃ අපත්‍යම්) පුමාන් ඉති සෛංහිකෙයඃ **අර්ථාන්තරන්‍යාසාලංකාරයි.**

36. කෘත්‍රිමඃ, ක්‍රියානිර්වෘත්තවූ (හෙවත් උපකාරාපකාර අන්‍යතර ස්වරූපවූ) ක්‍රියායෙන් නිපදවනලද; සඛා, මිතුරුද; ශත්‍රුශ්ච, සතුරුද; ගරීයාන්, ගුරුතරවෙයි හෙවත් අතිශයින් ගරුකටයුතුවෙයි; හි,

37. උපකර්ත්‍රාරිණා සංධි'ර්න මිත්‍රේණා'පකාරිණා
උපකාරාපකාරෞ හි ලක්ෂ්‍යං ලක්ෂණ' මේතයෝඃ.

38. ත්වයා විප්‍රකෘතශ්චෛද්‍යෝ රුක්මිණීං හරතා හරේ
බද්ධමූලස්‍ය මූලං හි මහද්වෛ'රතරෝඃ ස්ත්‍රියඃ.

---

යම්හෙයකින්; තෞ 'කෘත්‍රිමවූ, මිත්‍ර ශත්‍රෘ යන ඔව්හු දෙදෙන; කාර්‍ය්‍යතඃ, උපකාර අපකාර සඞ්ඛ්‍යාත කටයුතුවසයෙන් වෙත්ද එහෙයිනි සහජප්‍රාකෘතෞඅපි, (මාතෘෂ්වසෙය පිතෘෂ්වසෙයාදි වසයෙන්) සහජවූද (පියොවින් සිඬවීම් වසයෙන්) ප්‍රාකෘතවූදූයි; අමිත්‍රෞ, සතුරන් දෙදෙනෙක්ද; මිත්‍රෙව, එහෙයින්ම; සහජප්‍රාකෘතවූ, මිතුරන් දෙදෙනෙක්ද; ස්‍යාතාම්, වන්නාහුය.

**සහජප්‍රාකෘතෞ අපි අමිත්‍රෞ ස්‍යාතාම්** යනුද **මිත්‍රෙ ස්‍යාතාම්** යනුද මෙහි ක්‍රි - යි. ස්‍යාතාම් යනු අස්භුවිධාතු විධිසංභාවන- ලිඞ්- යාතාම් ප්‍රත්‍යයි (ඉදින් මෙසේ ඇති කල්හි අපගෙ පිතෘෂ්වසෙයවූ ශිශුපාල තෙම සහජමිත්‍රත්වයෙන් නොනැසිය යුත්තේද ඔහු නැසීමට නොයායුත්තේදූයි එහෙයින් කියයි.)

37. උපකර්ත්‍රා, උපකාර කරන්නාවූ; අරිණා, සහජවූ හෝ ප්‍රාකෘතවූ හෝ සතුරු සමග; සන්ධිඃ, මිත්‍රසන්ධානයකටයුතුයි; අපකාරිණා, අපකාර කරන්නාවූ; මිත්‍රේණ, සහජවූ හෝ ප්‍රාකෘතවූ හෝ මිතුරු සමග; සන්ධිඃ න, මිත්‍රසන්ධානය නොකටයුතුයි; හි, යම්හෙයකින්; උපකාරාපකාරෞ, උපකාර අපකාර දෙක; එතයෝඃ, ඒ මිත්‍ර ශත්‍රෘ දෙදෙනාගෙ; ලක්ෂණං, ස්වරූපයයි; ලක්ෂ්‍යම්, සැලකිය යුතුවේද එහෙයිනි.

**(උපකර්ත්‍රා අරිණා සන්ධිඃ කර්තව්‍යඃ භවති** යනුද **අපකාරිණා මිත්‍රේණ සන්ධිඃ න කර්තව්‍යඃ භවති** යනුද **බුධෛඃ එතයොඃ ලක්ෂණම් ලක්ෂ්‍යං භවති** යනුද මෙහි ක්‍රි- යි. මෙහි උපකර්ත්‍රා අරිණා යනුද අපකාරිණා මිත්‍රේණ යනුද සහාර්ථ තෘතීයායි- කර්තව්‍යඃ යන අධ්‍යාහෘත කර්මකාරක කෘදන්ත ක්‍රියාපදයාහටද ලක්ෂ්‍යම් යන්නටද බුධෛඃ යනු අනුක්ත කර්තෘවසයෙන් සැලකිය යුතුයි.

38. හරෙ, පිංවත් කෘෂ්ණය; රුක්මිණීං, රුක්මිණීය හෙවත් ශ්‍රීකාන්තාව; හරතා, පැහැරගන්නාවූ හෙවත් ස්වකීය භාර්‍ය්‍යාවකොට ගන්නාවූ; ත්වයා, ඔබ විසින්; චෛද්‍යඃ, චෙදීදනව්වැයි ශිශුපාලතෙම; විප්‍රකෘතඃ, විප්‍රකාරයට පමුණුවන ලද්දේය (අපගතභාර්‍ය්‍යා ඇත්තෙකු බවට පමුණුවනලදියි සේයි); හි, ඒ එසේමැයි; බද්ධමූලස්‍ය, (ස්ථිරව බැඳෙනලද හෙවත්) හටගත් මුල්ඇති; වෛරතරොඃ, වෛරනමැති වෘක්ෂයට; ස්ත්‍රියඃ, ස්ත්‍රීහු; මහත්මූලං, මහත්වූ හෙවත් ප්‍රධානවූ මූලෙක්වෙයි.

39\. තමයි හෞමං ගතො ජෙතු'මරෞත්සීතස පුරී'මිමාම්
ප්‍රොෂිතා'සී මණං මෙරො' රන්ධකාරසතරිමිව

40\. ආලප්‍යාලම්දං බභ්‍රොයී'තස දරුත'පාහරත්
කාථාපි බලු පාපානා'මලමශ්‍රෙයසෙ යතඃ.

---

(**තවයා වෛද්‍යඃ විප්‍රකෘතඅාසීත්** යනුද **සත්‍රිණඃ වෛරතරොඃ මූලංසන්ත්** යනුද මෙහි ක්‍රි- යි. ආසීත් යනු අස්භුවි- භූතා- ලුඞ්- දිප් ප්‍රත්‍යයි. ස්‍යාත් යනු අස්භුවි- විධිසං- ලිඞ්- යාත් ප්‍රත්‍යයි බඩානී මූලානි යස්‍ය සඃ බඩමූලඃ (තස්‍ය) වෛරමෙව තරුඃ= (තස්‍ය) යනු නිර්වචනයි. **රූපකසංසෘෂ්ට අර්ථාන්තරන්‍යාසයි.**

39\. තමි, යුෂ්ම ද් තෙම; හෞමං, භූමි පුත්‍රයා හෙවත් නරක නම් අසුරයා; ජෙතුං, ජයග්‍රහණය කරන්ට; ගතෙ, ගියකල්හි; සං, ඒ ශිශුපාල තෙම; ඉමාම්පුරීම්, මේ වාරකානම් පුරිය; අරෞත්සීත්, වැලහුවේය; (කුමක්මෙන්ද යත්) ප්‍රොෂිත, ප්‍රවාසයට හෙවත් අස්ත යට ගියාවූ; අසීමණඃ, සූර්යයා ඇති; මෙරොඃතටීම්, මහාමෙරු පර්ව යාගෙ සානුප්‍රදෙශය; අන්ධකාරඃඉව; අන්ධකාර තෙමේ යම්සේ වැලහු වේද එසේයි.

(**සඃ ඉමාම් පුරීම් අරෞත්සීත්** යනු මෙහි ක්‍රි- යි. රුධි 'රුවර ණෙ ධාතුවෙන් දිප් ප්‍රත්‍යයි. **උපමාලංකාරයි.**

40\. සඃ, ඒ වෛද්‍ය තෙම හෙවත් වේදීදනච්චැයි ශිශුපාලතෙම; බභ්‍රොඃ, බභ්‍රුහුගෙ හෙවත් එනම් යාදව භෙදයාගේ (ශ්‍රීවිෂ්ණුහුගේ යි සේයි); දරුන්, භාර්‍යාවන්; අපාහරත්, පැහැරගත්තේය යත; යත්, යම් කාරුණක් වීනම්; ඉදම්, මේදරුපහරණය; ආලප්‍යාලම්, නොකිය යුතුයි; යතඃ, යම් හෙයකින්; පාපානාම්, පාපීන්සම්බන්ධිවූ; කථාපි, කථාතොමෝද; අශ්‍රෙයසෙ, අනර්ථය පිණිස හෙවත් අයශ පත පිණිස; අලම්, සමර්ථවන්නිද එහෙයිනි.

ආලප්‍යාලම් යන තන්හි අලංඛලෙවාඃ ප්‍රතිෂෙධයොඃ ප්‍රාචාං ක්ත්වා, යනුවෙන් ක්ත්වාප්‍රත්‍යවිෂයෙහි සමාසය ඇතිකල්හි ල්‍යබා දෙශයි, අශ්‍රෙයසෙ යන තන්හි නමඃ ස්වස්ති යනාදීන් තදර්ථ සම්ප්‍ර දානයි.

**සඃ දරාන් අපාහරත්** යනු මෙහි ක්‍රි-යි. අපාහරත් යනු අපපූර්ව හෘඤ් හරණෙ ධාතු- භූතා- ලුඞ්- දිප් ප්‍රත්‍යයි. **අර්ථාන්තරන්‍යාසා ලංකාරයි.**

41. විරුද්ධඑවං භවතා විරුද්ධාබහුධා, ච නඃ
නිර්ජීයතෝ'රිඃ ක්‍රියයා ස 'ශෘතශ්‍රවසඃ සුතඃ.

42. විධාය වෛරං සාමර්ෂෙ නරෝ'රෞ ය 'උදාසතෙ
ප්‍රක්ෂිප්‍යෝ'දර්චිෂං කක්ෂෙ ශෙරතෙ තෙ' භිමාරුතම්.

43. මනාගනභ්‍යා වෘත්‍යාවා කාමං ක්ෂාම්‍යතු යඃ ක්ෂමී
ක්‍රියා සමභිහාරේණ විරුධ්‍යන්තං ක්ෂමෙත කඃ.

---

41. **එවං**, මෙසේ; භවතා, යුෂ්මද්හු විසින්; විරුද්ධඃ, විප්‍රකෘතවූ හෙවත් විප්‍රකාරයට පමුණුවන ලද්දවූ; බහුධා, බහුප්‍රකාරයෙන් හෙවත් බොහෝ සෙයින්; නඃච, අපටද; විරුද්ධා, විප්‍රකෘතවූ හෙවත් විරුද්ධව ක්‍රියාකරන්නාවූ; ශෘතශ්‍රවසඃ, ශෘතශ්‍රවා නමැත්තිගෙ හෙවත් විෂ්ණුපිතෘ සොහොවුරීගෙ; සුතඃ, පුත්‍රවූ; සඃ, ඒ චෛද්‍ය තෙම (ශ්‍රී විෂ්ණු පිතෘ සොහොවුරිගෙ පුත්‍ර තෙමේ යයි සේයි); ක්‍රියයා, පූර්වෝක්ත අපකාර ක්‍රියායෙන්; අරිඃ, කෘත්‍රිමවූ හතුරෙක්; නිර්ජීයතෙ, නිපදවනු ලැබෙ කරණු ලැබේ යයි සේයි.

(**ක්‍රියයා සඃ අරිඃ නිර්ජීයතෙ** යනු මෙහි ක්‍රි-යි. නිර්ජීයතෙ යනු නිර්පූර්ව වෘතුඞ් වර්තනෙ ධාතු- වර්ත- ලට්- කර්ම, තෙ ප්‍රත්‍යයි.

42. යෙනරඃ, යම්බඳුවූ මනුෂ්‍යයෝ හෙවත් පුරුෂයෝ; සාමර්ෂෙ, (පළමුකොටම කෝපසහිතවූ; අරෞ, සතුරා කෙරෙහි; වෛරං විධාය, වෛරකොට හෙවත් තුමූත් අපකාරකොට; උදාසතෙ, උදාසීනවෙත්ද හෙවත් උපෙක්ෂා කෙරෙත්ද; තෙ, ඔව්හුතුමූ; කක්ෂෙ, කක්ෂයෙහි හෙවත් ජීර්ණපර්ණ ගුල්මාදියෙහි; උදර්චිෂම්, අධිකජ්වාල ඇති වහ්නිය; ප්‍රක්ෂිප්‍ය, බහා හෙවත් තබා; අභිමාරුතං, වාතාභිමුඛයෙහි (යටිසුළඟෙහි); ශෙරතෙ, හොවිත්ද (එබන්දෝ වෙතියි සේයි.)

**යෙනරඃ අරෞ උදාසතෙ** යනුද **තෙ අභිමාරුතං ශෙරතෙ** යනුද මෙහි ක්‍රි- යි. උදාසතෙ යනු උත්පූර්ව ආස්උපවෙශනෙ ධාතු වර්ත-ලට්-අන්තෙ ප්‍රත්‍යයි අන් ආදෙශයි මෙහි නරඃ යනු නරශබ්දය නොව නෘ ශබ්ද ප්‍රථමා බහු වචනයි- ශෙරතෙ යනු ශීඞ් ස්වප්නෙ ධාතු වර්ත- ලට්- අන්තෙ ප්‍රත්‍යයි, අත් ආදෙශයි ශෙරතෙ යන්නට අභිමාරුතං යනු ආධාරාර්ථයෙහි කර්මයයි.

43. යං, යමෙක්තෙම; ක්ෂමී, ඉවසනසුලුවූයේද හෙතෙම; මනාග්, ස්වල්පයක් හෝ; අනභ්‍යාවෘත්‍යාවා, අනල්පත්වයෙන් හෝ; විරුධ්‍යන්තං, අපකාරකරන්නහුට; කාමං, ඒකාන්තයෙන්; ක්ෂාම්‍යතු, ක්ෂමා කෙරේවා; ක්‍රියාසමභිහාරෙණ, ක්‍රියාවන් මොනවට පැමිණවීමෙන්

44. අන්‍යදා භූෂණං පුංසඃ ක්‍ෂමාලජ්ජේ'ව යොෂිතඃ
පරාක්‍රමඃ පරිභවෙ වෛයාත්‍යං සුරතෙෂ්වි'ව.

45. මාජීවන්‍යඃ පරාවඥා දුඃඛදග්ධො' පි ජීවති
තස්‍යා' ජනනිරේ'වාස්තු ජනනී ක්ලෙශකාරිණඃ.

---

හෙවත් අතිශයින්; (පුනඃ, පුනර්භාවයෙන් යයි සේයි); (විරුධ්‍යන්තං, අපකාර කරන්නහුට); කඃ. කවරෙක් තෙම; ක්‍ෂමෙත, ක්‍ෂමා කරන්නේද (අපරාධ කරන්නාහට කවරෙක් ඉවසන්නේද නොඉවසන්නේ යයි සේයි.)

**සඃ කාමං ක්‍ෂාම්‍යතු** යනුද **කඃ විරුධ්‍යන්තං ක්‍ෂමෙත** යනුද මෙහි ක්‍රි- යි. ක්‍ෂාම්‍යතු යනු ක්‍ෂමූ ප්‍රසහනෙ ධාතු- සංභාවනායෙහි- ලොට්- තුප් ප්‍රත්‍යයි- ක්‍ෂමෙත යනු ක්‍ෂමූ ප්‍රසහනෙ ධාතු ශක්‍යාර්ථයෙහි ලිඞ්- ඊත ප්‍රත්‍යයි මේ ධාතුතොම දෛවාදිකද භෞවාදිකද වන්නීය.

(සැමකල්හි ඉවසීම පුරුෂයාහට භූෂණයක් හෙවත් ආභරණයෙක් නොවේද? එහෙයින් අපරාධකාරීහු කෙරෙහිද ඉවසිය යුතු නොවේදැයි එහෙයින් මෙසේ කියයි.)

44. අන්‍යදා, අන්කල්හි හෙවත් රතික්‍රීඩා කාලය හැර අන්‍ය කාලයෙහි; යොෂිතඃ, ස්ත්‍රීහට; ලජ්ජාඉව, ලජ්ජා තොම අබරණ වන්නාක්මෙන්; (අන්‍යදා අන්කල්හි හෙවත් සතුරු උවදුරු නැතිකල්හි) නොහොත් පරිභව නැතිකල්හි; පුංසඃ, පුරුෂයාහට; ක්‍ෂමා, ඉවසීම; භූෂණං, අබරණවෙයි; සුරතෙෂු, රතික්‍රීඩාවන්හි; වෛයාත්‍යං, ස්ත්‍රීයගෙ ලජ්ජාරහිත භාවය; භූෂණංඉව, අබරණ වන්නාක්මෙන්; පරිභවෙ, පරිභවයෙහි හෙවත් සතුරු උවදුරෙහි; පරාක්‍රමඃ,(පෞරුෂය හෙවත් පුරුෂගතියවූ) පරාක්‍රමය තෙම; භූෂණං, අබරණවෙයි.

(**පුංසඃ ක්‍ෂමා භූෂණංභවති** යනුද **යොෂිතඃ ලජ්ජා භූෂණං භවති** යනුද මෙහි ක්‍රි- යි. පරාක්‍රමඃ භූෂණං භවති යනුද **වෛයාත්‍යං භූෂණංභවති** යනුද මෙසේම යොදනු. **විරොධාලංකාරයි.**

45. යඃ, යමෙක් තෙම; පරාවඥා, සතුරාගෙ අවමානයෙන් වූ; දුඃඛදග්ධඃඅපි, දුකින් දනලද්දේත්; මාජීවන්‍යඃ, එහෙයින්ම ගර්හිත ජීවිවූයේ; ජීවති, ජීවත්වෙයිද; ජනනීක්ලෙශකාරිණඃ, උපදවන මව්ට දුඃඛකාරීවූ; තස්‍ය, ඔහුගෙ; අජනනිඃඑව, නොයිපදීමම අස්තු වේවා.

46. පාදාහතං ය'දුත්ථාය මූර්ධාන'මධිරොහති
ස්වස්ථාදෙවාපමානෙ'පි දෙහිනස්තද්වරං රජඃ.

47. අසංපාදයතඃ කංචි'දර්ථං ජාතික්‍රියාගුණෛඃ
යදෘච්ඡාශබ්දවත් පුංසඃ සංඥායෛ ජන්ම කෙවලම්.

---

(**යඃ මාජීවන් ජීවති** යනුද **තස්‍ය අජනනිරස්තු** යනුද මෙහි ක්‍රි- සි. ජීවති යනු ජීව'ප්‍රාණධාරණෙ ධාතු වනී- ලට්- තිප් ප්‍රත්‍යයි- අස්තු යනු අස්භුවි ධාතු ආශීඃප්‍රෙරණ ලොට්- තුප් ප්‍රත්‍යයි- මෙහි අජනනිඃ යනු නඤ්පූර්ව ජනිප්‍රාදුර්භාවෙ යන ධාතුනුකොරෙන් 'අක්‍රොශෙ'නඤ්‍යනිඃ' යනුවෙන් අනිප්‍රත්‍යයයි 'නාං' යන සුතුරෙන් නඤ් හට අකාරාදෙශයි. **ස්වභාවොක්තියි.**

46. යත්රජං, යම් රජසෙක්; පාදාහතං, පයින් ගසනලද්දේද (ඒ රජස); උත්ථාය, උඩටනැගී; මූර්ධානං, ගැසුවහුගෙ ශීර්ෂයට; අධිරොහති, නගීද; (එමෙන්) අවමානෙඅපි, අවමන් ඇති කල්හිද; ස්වස්ථාත් එව, ස්වස්ථවූම හෙවත් සතුටුවූම; දෙහිනඃ, චෙතනා සහිත සත්වයාටවඩා; තත්රජඃ, අචෙතනිකවූ ඒරජස; වරං, උත්තමවෙයි.

(**යත්රජඃ පාදාහතං (සත්)** මූර්ධානං **අධිරොහති** යනුද **තත් රජඃ දෙහිනඃ වරම් ස්‍යාත්** යනුද මෙහි ක්‍රි- රුහ උද්භවෙ ධාතුවෙන් වනී- තිප් ප්‍රත්‍යයි අධිපූර්වයි මූර්ධානං අධිරොහති යන තන්හි මූර්ධානං යනු 'කර්මප්‍රවචනීය යුක්තෙ ද්විතීයා' යනුවෙන් ද්විතීයායි. **ව්‍යතිරෙකාලඞ්කාරයි.**

47. ජාති, බ්‍රාහමණාදි ජාතිය; ක්‍රියා, යාගාදි ක්‍රියාය; ගුණෛඃ, සෞර්‍ය්‍යාදි ගුණය යන මෙයින්; කිංචිත් අර්ථං, කිසිත් අර්ථයක් හෙවත් සුකෘතය කීර්ත්‍යාදිය පුරුෂවික්‍රමය යන මේ ප්‍රයෝජනය; අසම්පාදයතඃ, සම්පාදනය නොකරන්නාවූ; පුංසඃ, පුරුෂයාගෙ; ජන්ම, ඉපැද්ම; යදෘච්ඡාශබ්දවත්, සිය කැමැත්තෙන්වූ ශබ්දයක් මෙන්; (ජාත්‍යාදි ප්‍රවෘත්තියොග නිමිත්ත විරහිත ශබ්දමාත්‍රයක්හුගෙ ඉපැද්ම මෙන් යි සේයි); සංඥායෛකෙවලං. හුදෙක් සංඥ පිණිසම වෙයි (සංඥ ව්‍යවහාරය පිණිස පමණෙක් වෙයි) යනු භාවයි.

(**පුංසඃ ජන්ම සංඥායෛ කෙවලම් භවති** යනු මෙහි ක්‍රි- යි. **උපමාලඞ්කාරයි.**

(මෙසේ අපෞරුෂය හෙවත් පුරුෂ වික්‍රමය නොමැතිබව දූෂණය කරවා දූන් පෞරුෂය හෙවත් පුරුෂවික්‍රමය භූෂණයකරවයි)

48\. තුඞ්ගත්ව'මිතරත්‍රා'ද්‍රෞ නෙදං සින්ධා'වගාධතා
අලඞ්ඝනීයතාහෙතු'රුභයං තන්මනස්විනි

49\. තුල්‍යෙ'පරාධෙ ස්වර්භානු'ර්භානුමන්තං චිරෙණ යත්
හිමාංශුමා'ශු ග්‍රසතෙ තන්ම්‍රදිම්නඃ ස්ඵුටං ඵලම්.

50\. ස්වයං ප්‍රණමතෙ' ල්පෙපි පරවායාවුපෙයුෂි
නිදර්ශනම'සාරාණාං ලඝුර්බහුතෘණං නරඃ.

---

48 අද්‍රෞ, පර්වතයෙහි; තුඞ්ගත්වම්, උස්බව විද්‍යමාන වෙයි; ඉතරා, අනික හෙවත් (සාගරයෙහි මෙන් ගැඹුරුබව; න, විද්‍යමාන නොවෙයි; සින්ධෞ, සාගරයෙහි; අගාධතා, ගැඹුරුබව විද්‍යමාන වෙයි; ඉදම්, (පර්වතයෙහි මෙන්) මේ උත්තුඞ්ගභාවය; න, විද්‍යමාන නොවෙයි;මනස්විනි, ස්ථිර බුද්ධිමත් ජනයා කෙරෙහි හෙවත් වීර ජනයා කෙරෙහි; අලඞ්ඝනීයතාහෙතුඃ, නොඉක්ම වියහැකිබවට හෙතුවූ; තත්උභයං, (උත්තුඞ්ගභාවය අගාධතාය යන) ඒ දෙකම විද්‍යමාන වෙයි.

**(අද්‍රෞ තුඞ්ගත්වම් අස්ති** යනුද **සින්ධෞ අගාධතා අස්ති** යනුද මෙහි ක්‍රි- යි. අස්ති යනු අස් භුවිධාතු වර්ත- ලට්- යි. **ව්‍යතිරෙකාලඞ්කාරයි**.

49\. ස්වර්භානුඃ. රාහුතෙම; අපරාධෙතුල්‍යෙඅපි, අපරාධය සමාන වූකල්හිදු; භානුමන්තං, සූර්යයා; චිරෙණ, බොහෝ කලකින්; ග්‍රසතෙ, ග්‍රාසකොට ගණියි (ගිලගණියි සේයි); හිමාංශුං, චන්ද්‍රයා; ආශු, වහා; ග්‍රසතෙ, ගිලගණියි යන; යත්, යමක්වේද; තත්, එය; ම්‍රදිම්නඃ, මෘදුභාවයාගෙ; ස්ඵුටංඵලම්, ප්‍රස්ඵුට ඵලයයි.

**(ස්වර්භානුඃ භානුමන්තම් ග්‍රසතෙ** යනුද **ස්වර්භානුඃ ආශුහිමාංශුම් ග්‍රසතෙ** යනුද **තත්** ස්ඵුටම් **ඵලම් භවති** යනුද මෙහි ක්‍රි- යි මෙහි ම්‍රදිම්නඃ යනු මෘදෙර්භාවඃ ම්‍රදිමා (තස්‍ය) 'ප්‍රථ්වාදිභ්‍යඃ ඉමනිච්' යනුවෙන් ඉමනිප්‍රත්‍යයෙන් සිද්ධයි. ග්‍රසඉත යනු ග්‍රස භක්‍ෂණෙ ධාතුවෙන් වර්ත- ලට්- තෙ, ප්‍රත්‍යයි භවති යනු භූ සත්තායාම් ධාතුවෙන් වර්ත- ලට්- තිප් ප්‍රත්‍යයි. **අප්‍රස්තුත ප්‍රශංසායි**.

50\. අසාරාණාම්, හරනැත්තවුන්ට හෙවත් දුර්වලයන්ට; නිදර්ශනම්, දෘෂ්ටාන්තනම්; බහුතෘණං, තෘණකල්පයි හෙවත් තෘණසදෘශයි; ලඝුඃ, සැහැල්ලුවූ හෙවත් පුරුෂවික්‍රම නැත්තාවූ; නරඃ, මනුෂ්‍ය තෙම; අල්පෙඅපි, ස්වල්පවූද; පරවායෞ, සතුරු නැමති සුලඟ; උපෙයුෂි, සම්ප්‍රාප්තවූ කල්හි; ස්වයංප්‍රණමතෙ, තෙමේම අවනතවෙයි (යටත්වේයයි සේයි.)

51. තෙජස්විමධ්‍යෙ තෙජස්වි දවීයානපි ගණ්‍යතෙ
පඤ්චමඃ පඤ්චතපස'සතපනො ජාතවෙදසාම්.

52. අකෘත්වා හෙලයා පාදමු'චෛචමූර්ධසු විද්විෂාම්
කථං කාරම'නාලම්බා කීර්ත්තිර්ද්‍යා'මධිරොහති.

53. අඞ්කාධිරොපිතමෘගශ්චන්ද්‍රමා මෘගලාඤ්ඡනඃ
කෙසරී නිෂ්ඨුරක්‍ෂිප්තා'මෘගයූථො මෘගාධිපඃ.

---

ලක්‍ෂ‍්‍යනරඃ **සඩයම් ප්‍රණමතෙ** යනු මෙහි ක්‍රි–යි. ප්‍රණමතෙ යනු නමු ප්‍රහ්ණත්වෙ ධාතු–වර්ත්මානලට්–තෙ, ප්‍රත්‍යයි සවයම් කර්තෘ සවයම් කර්මක්‍රියා පදයි මෙහි 'තදූහස්නුතමාං යක්විණෞ' යනුවෙන් යක් ප්‍රත්‍ය ප්‍රතිෂෙධයි **උපමාලඞ්කාරයි.**

51. දවීයාන්අපි, අතිදූරයෙහිවූද; තෙජස්වී, තෙදඇත්තාවූ තැනැත්තේ; තෙජස්විමධ්‍යෙ, තෙජස්වන්තයන් අතුරෙහි; ගණ්‍යතෙ, ගණන්ගණුලැබේ; පඤ්චතපසඃ, පඤ්චාග්නි මධ්‍යයෙහි හෙවත් පඤ්චාග්නි සාධ්‍යවූ තපස්කරන්නාහට; තපනඃ, සූර්‍ය්‍යතෙම; ජාතවෙදසාම්, වහ්නින් සම්බන්ධිවූ; පඤ්චමඃ, පස්වැන්නාවෙයි.

(බුධෙඃ **තෙජස්විමධ්‍යෙ තෙජස්වී ගණ්‍යතෙ** යනු මෙහි ක්‍රි– යි. ගණ්‍යතෙ යනු– ගණ සඞ්ඛ්‍යානෙ ධාතු– වර්ත්– ලට්– කර්ම්– තෙ, ප්‍රත්‍යයි පඤ්චානාමග්නිනාම් සමාහාරඃ පඤ්චාග්නි පඤ්චාග්නි සාධ්‍යං තපො යස්‍යසඃ=(තස්‍ය) **අර්ථාන්තරන්‍යාසාලංකාරයි.**

52. උච්චෛඃ, උසස්වූ; විද්විෂාම්, සතුරන්ගෙ; මූර්ධසු, මස්තක යන්හි නොහොත් අනාදරයන්හි; හෙලයා, ප්‍රේමසේවනයෙන්; පාදං පාදය; අකෘත්වා, නොකොට හෙවත් පානොතබා; කීර්ත්තිඃ, කීර්ත්ති තොම; අනාලම්බා, අංධාර රහිතවූවා හෙවත් හිතිපෙතිසේ නගින මඟනැතිවූවා; කථංකාරං, කෙසේනම්; ද්‍යාම්අධිරොහති, අහසට නගීද? (නොනගී යයි සේයි.)

**කීර්ත්ති කථං කාරං ද්‍යාම් අධිරොහති** යනු මෙහි ක්‍රි– යි. අධිරොහති යනු අධිපූර්ව රුහඋද්භවෙ ධාතු වර්ත්– ලට්– යි මෙහි කථංකාරං යනු ක්‍රියා විශෙෂණවූ නිෂ්පන්න නිපාතයෙකි කාරම් යන්නෙහි අරුත්නැත 'අන්‍යථෛවං කථම්ඉත්ථං සුසිද්ධාප්‍රයොගශ්චෙත්' යනු කී හෙයින් කථම් යන්න පූර්වකොට ඇති අර්ථරහිත කෘඤ් ධාතුහු කෙරෙන් ණමුල්ප්‍රත්‍යයි **සමාසොක්ති අලංකාරයි.**

53. අඞ්කාධිරොපිතමෘගඃ, ඇකයට නගාගන්නාලද මෘගයා හෙවත් සාවාඇති; චන්ද්‍රමා, චන්ද්‍ර තෙමේ; මෘගලාඤ්ඡනඃ, මෘගයා හෙවත් සාවා සලකුණුකොට ඇත්තේවෙයි හෙවත් මෘගාඞ්කවෙයි;

54. චතුර්ථෝපායසාධ්‍යෙ තු රිපෞ සාන්ත්ව'මපක්‍රියා
සෝවද්‍යාමා'මජ්වරං ප්‍රාඥඃ කෝ'මහසා පරිෂිඤ්චති.

55. සාම වාදාඃ සකෝපස්‍ය තස්‍ය ප්‍රත්‍යුතදීපකාඃ
ප්‍රතප්තස්‍යෙ'ව සහසා සර්පිෂස්තෝයබින්දවඃ.

56. ගුණානාමා'යථාතථ්‍යා'දර්ථං විප්ලාවයන්ති යෙ
අමාත්‍යව්‍යඤ්ජනා රාඥං දූෂ්‍යාස්තෙ ශත්‍රුසඤ්ඥිතාඃ.

---

නිෂ්ධූරක්ෂිප්තමෘගයූථඃ, කෘෘරසේ නසතලද මෘග සමූහයා ඇති කොශරී සිංහතෙම; මෘගාධිපඃ, මෘගරාජන් වෙයි (මෘග සමූහයාට හෙවත් සිව්පාවුන්ට අධිපති වෙයි සේයි.)

**චන්ද්‍රමාඃ මෘගලාඤ්ඡනඃ භවති** යනුද **කෙශරී මෘගාධිපඃ භවති** යනුද මෙහි ක්‍රි- යි. අඞ්කඃ අධිරොපිතඃ මෘගඃ යෙනාසෞ= මෘගාලාඤ්ඡනං යස්‍ය සඃ= කෙශරා අස්‍යසන්තීති කෙශරී- මෘගානාම් යූථඃ= නිෂ්ධූරංක්ෂිප්තො මෘගයූථො යෙනාසෞ= මෘගානාමධිපඃ- යනු නිර්වචනයි **අප්‍රස්තුත ප්‍රශංසාලඞ්කාරයි.**

54. චතුර්ථෝපායසාධ්‍ය, දණ්ඩෝපාය සඞ්ඛ්‍යාත සිව්වැනි උපායෙන් සිඬකටයුතුවූ; රිපෞතු, සතුරා කෙරෙහි වනාහි; සාන්ත්වං, සාන්තභාවය හෙවත් සාමොපාය; අපක්‍රියා, අපකාරවෙයි (ඒ එසේ මැයි); සෝවද්‍යාම්, සෝදකමීාහිවූ (බහගැන්මට සුදුසුවූ යී සේයි); ආමජ්වරං, නොපැසුණු උනරෝගයට; කඃ ප්‍රාඥඃ, කවරනම නුවනැත්තෙක්; අම්භසා, ජලයෙන්; පරිෂිඤ්චති, පරිෂෙකකෙරේද (දියඉසිද නොම ඉසීයයි සේයි)

**රිපෞ සාන්ත්වං අපක්‍රියා භවති** යනුද **කඃ ප්‍රාඥඃ ආමජ්වරම් අම්භසා පරිෂිඤ්චති** යනුද මෙහි ක්‍රි- යි. භවති යනු භූසත්තායාම් ධාතු- වර්ත- ලට්- යි- පරිෂිඤ්චති යනු පරිපූර්- ෂිච ආද්‍රීකරණෙ (ෂෙචනෙ) ධාතු- වර්ත- ලට්- යි තිප් ප්‍රත්‍යයි. **නිදර්ශනාලඞ්කාරයි.**

55. සකොපස්‍ය, කොප සහිතවූ; තස්‍ය, ඒ ශිශුපාලයාට; සාම වාදාඃ, සාමොපාය සම්බන්ධවූ වාදයෝ හෙවත් ප්‍රිය තෙපුල්; සහසා, වහා; ප්‍රතප්තස්‍ය, සන්තප්තවූ; සර්පිෂඃ, ගිතෙලට; තොයබින්දවඃඉව, දියබිඳුන්මෙන්; ප්‍රත්‍යුතඃ, විපරීතත්වයෙන්; දීපකාඃ, ප්‍රජ්වලනකාරිහුයි (ගිනිඇවිලීම කරන්නාහු වෙති යි සේයි.)

**සාමවාදාඃ තස්‍ය දීපකාඃ ස්‍යුඃ** යනු මෙහි ක්‍රි- යි. ස්‍යුඃ යනු විධි සංභාවනලිඞ්යි අස්භුවිධාතුයි යුස් ප්‍රත්‍යයි (**උපමාලඞ්කාරයි.**

56. යෙ, යම් කෙනෙක්; ගුණානාම්, මිත්‍රසන්ධානාදි ගුණයන් සම්බන්ධව; අයථාතථ්‍යාත්, අයථාතථභාවයෙන් හෙවත් යථායොග්‍යනොවූ යථාකාලනොවූ ප්‍රයෝගයෙන්; අර්ථංවිප්ලාවයන්ති,

57. සවශක්‍යාඤ්‍ජවශෙකෙවිත් පරස්‍ය ව්‍යසනෙ පරෙ
යාතමාහුස්තා'දසීතං ත්‍රාංස්‍ය'ත්‍ථාපයන්ති වයම්.

58. ලිලඞ්ඝයිෂතො ලොකාන'ලඞ්ඝ්‍යාන'ලඝීයසඃ
යාදවාමෙහාතිධීන් රුන්ධෙ වෙලෙව භවතඃ ක්‍ෂමා.

---

ප්‍රයෝජනය නැතිකෙරෙත්ද; (එසේවූකල්හි) අමාත්‍යව්‍යඤ්ජනාඃ, ඇමතියන් සම්බන්ධ ලකුණුඇති හෙවත් අමාත්‍යවෙෂධාරිවූ; තෙ, ඒ කූට මන්ත්‍රීහු; රාඥං, රජුන් විසින්; දූෂ්‍යාඃ, දූෂණාගියෝ වෙති හෙවත් ගැරහිය යුක්තාහු වෙති.

**ශෙ අපිං විප්ලාවයන්ති** යනුද **රාඥං ගෙ දූෂ්‍යාඃ භවන්ති** යනුද මෙහි ක්‍රි- යි. විප්ලාවයන්ති යනු- වර්ත- ලට්-යි, විපූර්- ප්ලු, ගතෞ ධාතුවෙන් අන්ති ප්‍රත්‍යයි, භවන්ති යනු භූ ධාතුවෙන් අන්ති ප්‍රත්‍යයි, තථාත්‍වං අනතික්‍රම්‍යෙති යථාතථම් නයථාතථම් අයථා තථම් තස්‍යභාවඃ අයථාතථ්‍යම් (තසමාන්) අමාත්‍යනාම් ව්‍යඤ්ජනා යෙෂාම්තෙ= රාඥං යනු 'කෘත්‍යානාම් කර්තරි වා' යනුවෙන් කර්තෘ කාරක ෂෂ්ඨියි.

57. කෙවිත්, ඇතැම් වෘඩයෝතුමූ; සවශකතිඋපචයෙ, සවකීය ශක්තිය සම්බන්ධවූ උපචිතිය ඇතිකල්හි හෙවත් තමාගේ අතිශය සාමර්ථ්‍යය ඇතිකල්හි; යාතං, ප්‍රයාතය හෙවත් සතුරන් ජයගැණීමට යායුතුයි; ආහුඃ, කියත්; අපරෙ, ඇතම් වෘඩයෝ; පරස්‍ය, සතුරාට; ව්‍යසනෙ, විපත්තිය ඇතිකල්හි; (යාතංආහුඃ), එසේම ප්‍රයාතය කියත්; තත්වයම්, ඒ කාරුණුදෙකම හෙවත් ඒ කියනලද පක්‍ෂවය තෙම; ආසීතං, උන්නාවූ හෙවත් ඒ පක්‍ෂවයටම අනුව යෙදුනාවූ; ත්‍රාං, තා; උත්‍ථාපයති, නැගිටුවයි.

**කෙවිත් යාතම් ආහුඃ** යනුද **තත්වයම් ත්‍රාම් උත්‍ථාපයති** යනුද මෙහි ක්‍රි- යි. ආහුඃ යනු වර්ත- ලට්- යි- බ්‍රූ වාචායාම් ධාතුයි- මෙහි අන්ති ප්‍රත්‍යයට උස්ආදෙශ හා බ්‍රූ ධාතුහට ආහ යනාදෙශයි උත්‍ථාපයති යනුද- වර්තමාන- ප්‍රයොජ්‍යක්‍රියා ලට්- යි- උත්පූර්- ෂ්ඨා ගතිනිවෘත්තෞ ධාතුයි තිප් ප්‍රත්‍යයි.

58. ලොකාන්, ලෝවැස්සන්; ලිලඞ්ඝයිෂතඃ, ඉක්මවනු කැමැත්තාවූ; අලඞ්ඝ්‍යාන්, තමන් නොයික්මවියහැකිවූ; අලඝීයසඃ, ලඝුතර නොවූ හෙවත් අතිශයින් ගරුවූ; යාදවාමෙහානිධීන්, යදුකුලිකයන් නමැති සාගරයන්; භවතඃ, යුෂ්ම ද්හුගෙ; ක්‍ෂමා, ඉවසීම්තොම; වෙලා ඉව, මුහුදුවෙරළමෙන්; රුන්ධෙ, වලකයි.

59. විජයස්ත්වයි සේනායාඃ සාක්ෂිමාත්‍රෝ' පදිශ්‍යතාම්
ඵලභාජි සමීක්ෂ්‍යා'කෙන බුඩෙර්භෝගඉවාත්මනි.

60. හතෙ හිඩිම්බරිපුණා රාඥි වෛමාතුරෙ යුධි
චිරස්‍ය මිත්‍රව්‍යසනී සුදමො දමඝොෂජඃ.

61. නීතිරාපදි යත් ගම්‍යඃ පරස්තන්මානිනො හ්‍රියෙ
විධුර්විධුංතුදස්‍යෙ'ව පූර්ණස්තස්‍යෙ'ත්සවාය සඃ.

---

භවතඃ යුෂ්මා සාදෘශ්‍යමෙභානිධින් රුචෙඩ යනු මෙහි ක්‍රි- යි. රුචෙඩ- යනු- වතී- ලට්යි රුධිරා'වරණෙ ධාතු පරෝක්ෂලිට්- ඵ ප්‍රත්‍යයි ලඬසයිතුම් ඉච්ඡතීති ලිලඬසයිෂත් (තාන්) අතිශයෙන ලස ව රිති ලසියාන්සඃ තලසියාන්සඃ=(තාන්) යාදවාඃඑව අමෙහානිධයඃ= යනු සමාසයි **උපමාලඞකාරයි.**

59. සෙනායඃ, සෙනාවගෙ; විජයඃ, ජයග්‍රහණය හෙවත් දිනුම; සාක්ෂිමාත්‍රෙ, සාක්ෂ්‍යයට ප්‍රමාණවූ හෙවත් උදසීනවූම; ඵලභාජි, ඵල භජනය කරණ සුලුවූ; ත්වයි, ඔබ කෙරෙහි; අපදිශ්‍යතාම්, දක්වනු ලැබේවා හෙවත් ව්‍යවහාර කරණු ලැබේවා; (කෙසේ ද යත්?) සමීක්ෂ්‍යාකෙන, සංඛ්‍යායෙහිකියනලද; ආත්මනි, තමාකෙරෙහි; බුඩෙඃ, මූලප්‍රකෘතවූ බුඩි රූපයාගෙ; භොගඃඉව, සුඛදුඃඛානු භවයමෙනි.

**සෙනායඃ විජයඃ ත්වයි අපදිශ්‍යතාම්** යනු මෙහි ක්‍රි- යි. අප දිශ්‍යතාම් යනු ආශීඃප්‍රේරණ ලොට්- කර්‍ම- තාම් ප්‍රත්‍යයි අපපූර්ව දෘශි ප්‍රේක්ෂණෙ ධාතුයි. **උපමාලඞකාරයි.**

60. හිඩිම්බරිපුණා, හිඩිම්බ නම් රාක්ෂසවගීයාට ශත්‍රුවූ භීමයා විසින්; වෛමාතුරෙ, (දුර්‍ගාචාමුණ්ඩායන) මාතෘන් දෙදෙනෙකුන් විසින් පාලනය කරන ලද හෙයින් වෛමාතුර නම් රජු හෙවත් ගණෙශයා; යුධි, යුඩයෙහි; හතෙ, නැසූකල්හි; චිරස්‍ය බොහෝ කලකින්; මිත්‍රව්‍යසනී, මිතුරන් සම්බන්ධ ව්‍යසන ඇති; දමඝොෂජඃ, (චන්‍ද්‍රවංශීය නරෙන්‍ද්‍රයෙක්වූ) දමඝොෂයාගෙන් උපන් තැනැත්තේ හෙවත් ශිශුපාලතෙමේ; සුදමඃ, පහසුවෙන් දමනයකටහැකිවෙයි.

**හිඩිම්බරිපුණ රාඥි හතෙ දමඝොෂජඃ සුදමඃස්‍යාත්** යනු මෙහි ක්‍රි- යි. ස්‍යාත් යනු විධිසං- ලිඞ්-යාත් ප්‍රත්‍යයි අස්භුවිධාතුයි (හිඩිම්බ ස්‍ය රිපුඃ= (තෙන) වයොඃ මාත්‍රොරපත්‍යම් වෛමාතුරඃ (තස්මින්) මිත්‍රස්‍ය ව්‍යසනං= මිත්‍රව්‍යසනමස්‍යාස්තීති= දමඝොෂාජ්ජාතඃ= සුඛෙන දම්‍යත ඉති සුදමඃ යනු නිර්වචනයි.

61. පරඃ, ශත්‍රු තෙම; ආපදි, විපත්තියෙහි; ගම්‍යඃ, යායුතුයි යනු; නීතිඃ, නිතියවේය යන; යත්, යමක් වේද; තත්, ඒ විපත්ති යෙහිගමන; මානිනඃ, ශූරත්වය සම්බන්ධ අභිමාන ඇත්තහුගෙ; හ්‍රියෙ,

62. අත්‍යුද්වෘත්තබලං සත්ත්වමත්‍යෙත්ශාස්ත්‍රනියන්ත්‍රිතම්
සාමානාධිකරණ්‍යං හි තෙජස්ති'මිරයොඃ කුතඃ.

63. ඉන්ද්‍රප්‍රස්ථගමස්තාවත්කාරි මා සන්තු චෙදයඃ
ආස්මාකදන්තිසාංනිධ්‍යා'චාමනී භූතභූරුහඃ.

---

ලජ්ජාව පිණිස වෙයි; පූර්ණඃ, සම්පූර්ණවූ හෙවත් වැඩුණු ගාත්‍රඇති; සඃ, ඒ සතුරා; තස්‍ය, ඒ ශෞර්‍ය්‍යාදියෙන් යුක්ත මානීහුගෙ; උත්සවාය, උත්සව පිණිස වෙයි; (කෙසේදයත්?) විධුඃ, සම්පූර්ණ චන්ද්‍රතෙම; විධුංතුදස්‍යඉව, රාහුට උත්සව වන්නාක් මෙනි; (යි සේයි) මේ පද්‍යයෙහි අධ්‍යාහෘත, ක්‍රියාවන් යොද සම්බන්ධ කිපයක් වසයෙන් සැලකිය හැකිබැව් දතයුතුයි. පදපාඨානුසාරයෙන් හේ සුබොධවේමැයි.

විධුං තුදති හිනස්ති ති විධුංතුදඃ (රාහුඃ) විධුං යන්න උපපද කොට ඇති තුද් ව්‍යථනෙ, ධාතුහු කෙරෙන්, විධ්වරුෂොස්තුදඃ, යනු වෙන් ඛශ්ප්‍රත්‍යයෙහි මුමාගමයි **උපමාලඞ්කාරයි**

62. උද්වෘත්තබලං, අනගීලවූ හෙවත් බලාත්කාරයෙන් පෙළීමට සමර්ථවූ; සත්ත්වම්, බලය; අත්‍යෙත්, අතිකක්වෙයි; ශාස්ත්‍රනියන්ත්‍රිතම්, මන්වාදි ශාස්ත්‍රයෙන් උදහෘතවූ; සත්ත්වං, බලය හෙවත් පරව්‍යසන කාලයෙහිවූ බලය; අත්‍යෙත්, අතිකක්වෙයි; හි, ඒ එසේමැයි; තෙජස් තිමිරයොඃ, තේජසය අන්ධකාරය යන දෙක්හි; සාමානාධිකරණ්‍යං, සමානවූ අධිකරණ ඇතිබවක් හෙවත් එකාශ්‍රය ඇතිබවෙක්; කුතඃ? කොයින්ද?

(**සත්ත්වම් අත්‍යෙත්භවති** යනුද **ශාස්ත්‍රනියන්ත්‍රිතම් සත්ත්වම් අත්‍යෙත්** භවති යනුද **සාමානාධිකරණ්‍යම් කුතඃස්‍යාත්** යනුද මෙහි ක්‍රි- යි. ක්‍රියා පදසිඞ් පූර්වොක්තනය මැයි (උද්ගතං, ශෘඞ්ඛලං යස්‍ය තත්= ශාස්ත්‍රෙණ නියන්ත්‍රිතම්= සමානං(තුල්‍යං) අධිකරණං යස්‍ය තත්= තස්‍යභාවඃ සාමානාධිකරණ්‍යම් තෙජශ්ච තිමිරංච= (තයොඃ) යනු නිර්වචනයි **නිදර්ශනාලඞ්කාරයි.**

63. ඉන්ද්‍රප්‍රස්ථගමඃ, පාථනගරය සම්බන්ධ ගමන (පාථනගරය නම් දිල්ලියයි ප්‍රසිඞ නගරයයි සේයි); මාකාරි, නොකරණු ලැබේවා; චෙදයඃ, චෙදිදෙශයෝ; ආස්මාක, අපගෙ; දන්තිසාංනිධ්‍යාත්, හස්තීන් සම්බන්ධවූ සන්නිධි හෙතුකොටගෙණ හෙවත් අපගෙ ඇතුන් ලංවීමහෙතුකොටගෙණ; වාමනීභූතභූරුහඃ, ශාඛා භඞ්ගය නිසා මිටිවූ වෘක්ෂ ඇත්තාහු සන්තු; වෙත්වා; (චේදිදෙශයටම ප්‍රයාණය කෙරේවා යනු භාවයි.

64. නිරුද්ධවීවධාසාරප්‍රසාරා ගා ඉව ව්‍රජම්
උපරුන්ධන්තු දශාර්හාඃ පුරීං මාහිෂ්මතීං ද්විෂඃ.

65. යජතාං පාණ්ඩවඃ ස්වර්ගම'වත්වි'න්ද්‍රස්තප'ත්විනඃ
වයං හනාම ද්විෂතඃ සර්වඃ ස්වාර්ථං සමීහතෙ.

---

**භවතා ඉන්ද්‍රප්‍රස්ථගමඃ මාකාරි** යනුද **චෙදයඃ වාමනීභූතභූරුහාඃ සන්තු** යනුද මෙහි ක්‍රි- සි. මාකාරි යන තන්හි ධාතු ප්‍රත්‍යයාදිය පෙරකී නයින් සුබොධයි **සන්තු** යනු අස්භුවි ධාතුවෙන් අන්තු ප්‍රත්‍යයි (ඉන්ද්‍රස්‍ය ප්‍රස්ථ ඉවාති= නස්‍යගමඃ= අස්මාකම්මෙ **'ආස්මාකාඃ** සන්නිධිරෙව සාංනිධ්‍යම් ආස්මාකානාම් දන්තිනාම් සාංනිධ්‍යම්= භූමෞ' රුහන්තීති භූරුහඃ වාමනීභූතාඃ භූරුහො යෙෂාම් තෙ= යනු නිර්වචනයි **පර්‍යායොක්තාලඞ්කාරයි.**

64. දශාර්හාඃ, යාදවයෝ හෙවත් යදුකුලිකයෝ; නිරුද්ධ, වල කතලද; වීවධ, ධාන්‍යාදි ප්‍රාප්තිය; ආසාර, සුහෘද්බලය; ප්‍රසරඃ, තෘණකාෂ්ඨාදීන්ගෙ ප්‍රවේශය යන මේ කාරණයන් ඇත්තාහු; මාහිෂ්මතීංපුරිම්, මාහිෂ්මතීනම්වූ නගරිය; ද්විෂඃ, සතුරුහට; උපරුන්ධන්තු උපරෝධනය කෙරෙත්වා හෙවත් මාහිෂ්මතීනගරයෙහි සතුරන් වලකත්වා; (කෙසේ ද යත්?) (නිරුද්ධවීවධාසාරප්‍රසරඃ වලක්වනලද පර්‍යාහාර නම්වූ සකන්ධවාහ්‍යාදි භාරවිශෙෂයන්ගෙ ප්‍රවේශ නිර්ගම ඇත්තාහු; ව්‍රජම්, ගාළ; ගාඃඉව, ගවයන්ට උපරුන්ධනය කරන්නාක් මෙන් හෙවත් ගාළෙහි ගවයන් වලක්වන්නාක් මෙන්.

**දශාර්හාඃ මාහිෂ්මතීම් පුරීම් උපරුන්ධන්තු** යනු මෙහි ක්‍රි- සි. උපරුන්ධන්තු යනු ආශීඃ ප්‍රෙරණ ලොට්සි උපපූර්ව රුධි'රාවරණෙ'ධාතුවෙන් අන්තු ප්‍රත්‍යයි (වීවධශ්ච ආසාරශ්ච ප්‍රසාරශ්ච= නිරුද්ධාඃ වීවධාසාරප්‍රසාරාඃ යෙෂාන්තෙ= මෙහි ගාඃ, ව්‍රජම් යනු 'දුහියාචිරුධි–' යනාදීන් ද්විකර්මකත්වයයි එහි පුරීම් යනුද ව්‍රජම් යනුද අකථිත කර්මයි අනික හෙවත් ගාඃ යන්න ඊප්සිතකර්මයි) **උපමාලංකාරයි.**

65. පාණ්ඩවඃ, පාණ්ඩුරාජ පුත්‍රවූ යුධිෂ්ඨිර තෙම; යජතාම්, යාග කෙරේවා; ඉනඃ, සූර්‍ය්‍යතෙමෙ; තපතු, ප්‍රතාපකෙරේවා හෙවත් ප්‍රකාශ කෙරේවා; ඉන්ද්‍රඃ, ශක්‍රතෙම; ස්වර්ගම්, දෙව්ලොව; අවතු, රකීවා; වයං අපි; ද්විෂතඃ, සතුරන්; හනාම, නසම්හ; සර්වඃ, හැමදෙනම; ස්වාර්ථං, ස්වකීයාර්ථය හෙවත් තම තමන්ගේ ප්‍රයෝජනය; සමීහතෙ, අනුසන්ධානය කෙරෙයි (ප්‍රයෝජනය අනුව මොනවට උත්සාහ කෙරෙයි සේයි.)

66. ප්‍රාප්‍යතාං විද්‍යුතාං සම්පත් සංපර්කාද’ක්‍ෂීරෙච්ෂාම්
ශස්ත්‍රෛ’ර්විෂච්ඡිරච්ඡේද ප්‍රොච්ඡලච්ඡොණිතො’
ක්‍ෂිතෛඃ.

67. ඉති සංරම්භිනො වාණී’ර්බලස්‍යා’ලෙඛ්‍යදෙවතාඃ
සභාභිත්තිප්‍රතිධ්වානෛ’ර්භියා’ද’න්‍වවදන්නි’ව.

---

**පාණ්ඩවඃ යජතාම්** යනුද **ඉන්ද්‍රඃ සුවර්ගම් අවතු** යනුද **ඉනඃ තපතු** යනුද **වංශං විෂහඃ හනාම** යනුද **සඞ්ඝඃ සංපූර්ණං සම්භතෙ** යනුද මෙහි ක්‍රි- යි. යජතාම්, අවතු, තපතු, යනු ආශීඃ ප්‍රේරණ ලොට්යි යජ, දෙවපූජායාම් අවරක්‍ෂණෙ, තප, සන්තාපෙ, ධාතූන් කෙරෙන්, තාම් ප්‍රත්‍යය හා තුප්, ප්‍රත්‍යයි හනාම යනු හන්හිංසායාම් ධාතුයි–වර්ත–ලට්–ම, ප්‍රත්‍යයි සම්භතෙ යනු සංපූර්ව–ර්භ චෙෂ්ටායාම් ධාතු වර්ත–ලට් තෙ ප්‍රත්‍යයි **අප්‍රාසංගිකාලංකාරයි.**

66. විෂත්, සතුරන්ගෙ; ශිරච්ඡේද, හිස්සිඳීමෙන්; ප්‍රොච්ඡලත්, උද්ගතවන්නාවූ හෙවත් නැගියන්නාවූ; ශොණිත, රුධිරයෙන්; උක්‍ෂිතෛඃ, ඉසිනලද; ශස්ත්‍රෛඃ, ආයුධයන් විසින්; අක්‍ෂීරෙච්ෂාම්, සූර්යරශ්මීන් සම්බන්‍ධිවූ; සංපර්කාත්, සම්බන්‍ධයෙන් හෙවත් හිරුරැස් වැදීම හෙතුකොටගෙණ; විද්‍යුතාම්, විදුලීන්ගේ; සම්පත්, ශ්‍රී තොම; ප්‍රාප්‍යතාම්, පැමිණෙනු ලැබේවා.

**විද්‍යුතාම් සම්පත් ප්‍රාප්‍යතාම්** යනු මෙහි ක්‍රි- යි. ප්‍රාප්‍යතාම් යනු ආශීඃ ප්‍රේරණලොට් කර්මකාරකෛකවචන තාම්, ප්‍රත්‍යයි ප්‍රපූර්ව අප ප්‍රාපනෙ ධාතුයි විෂතාම් ශිරාංශි විෂන්ශිරාංශි තෙෂාම් ඡේදඃ= (තෙන)ප්‍රොච්ඡලත්=‘විෂත් ශිරච්ඡේද ප්‍රොච්ඡලත්ච තත් ශොණිතං චෙති= තෙනඋක්‍ෂිතාඃ=(තෛඃ) අක්‍ෂීස්‍ය (සූර්යස්‍ය) රොච්ෂඃ=(තාසාම්) යනු සමාසයි **නිදර්ශනා ලංකාරයි.**

67. ඉති, මෙසේ; සංරම්භිණඃ, සංරම්භිවූ හෙවත් කැළඹුනාවූ; බලස්‍ය, බලභද්‍රයාගෙ; වාණීඃ, වචනයන්; ලෙඛ්‍යදෙවතාඃ, චිත්‍රලිඛිත දෙවතාවෝ හෙවත් සිතියම්වූ දෙවතාරූපයෝ; සභාභිත්ති, සභා වෙහිවූ භිත්තීන් සම්බන්‍ධ; ප්‍රතිධ්වානෛඃ, ප්‍රතිධ්වනි ව්‍යාජයෙන් හෙවත් ඡේංකාරයන් ලෙසින්; භයාත්, බියෙන්; අන්‍වවදන්ඉව, අනු වාද වසයෙන් කියන්නවුන්මෙන් වූහ.

**ආලෙඛ්‍යදෙවතාඃ බලස්‍යවාණීඃ අන්‍වවදන්ඉව** බභූවුඃ යනු මෙහි ක්‍රි- යි. බභූවුඃ යනු අධ්‍යාහෘත පරොක්‍ෂලිට් යි- භූසත්තායාම් ධාතුවෙන් උස් ප්‍රත්‍යයි (ආලෙඛ්‍ය චිත්‍රකර්මණි) දෙවතාඃ= සභායාඃ භිත්තයඃ= තාසාම් ප්‍රතිධ්වානාඃ=(තෛඃ) යනු නිර්වචනයි **උත්ප්‍රෙක්‍ෂා ලංකාරයි.**

68. නිශම්‍ය තාඃ ශෙෂගවී' රභිධාතු'මධොක්ෂජඃ
ශිෂ්‍යාය වෘහතාං පත්‍යුඃ ප්‍රස්තාව'මදිශද්'ශා.

69. භාරතී'මාහිතභරා' මථානුද්ධතමු'ද්ධවඃ
තථ්‍යාමු'තථ්‍යානුජවජ්ජගාද'ග්‍රෙ ගදග්‍රජම්.

70. සංප්‍රත්‍ය'සාංප්‍රතං වක්තු'මුක්තෙ මුසලපාණිනා
නිර්ධාරිතෙ'ර්ථෙ ලෙඛෙන ඛලූ'ක්ත්වා ඛලූ වාචිකම්.

---

68. අධොක්ෂජඃ, පහත්හි කරණලද ඥානඇති ඒ ශ්‍රී කෘෂ්ණ තෙම; තාඃශෙෂගවීඃ, ශෙෂාවතාරවූ ඒ බලභද්‍රයාගේ වචනයන්; නිශම්‍ය, ශ්‍රවණයකොට; වෘහතාම්පත්‍යුඃ, වාක්පතිහුගෙ හෙවත් වෘහස්පතිහුගෙ; ශිෂ්‍යාය, උද්ධවනම් ශිෂ්‍යයාහට; අභිධාතුං, කියන්ට; දෘශා, දෘෂ්ටි සඥවෙන්; ප්‍රස්තාවම්, අවසරය; අදිශත්, දක්වූයේය හෙවත් දුන්නේය.

**අධොක්ෂජඃ ශිෂ්‍යාය ප්‍රස්තාවම් අදිශත්** යනු මෙහි ක්‍රි- සි. අදිශත් යනු- භූතාර්ථ ලුඞ් සි- දෘඃ දානෙ නොහොත් දිශ උපදෙශෙ ධාතු දිප් ප්‍රත්‍යසි අධඃ කෘතං අක්ෂජං (ඉන්‍ද්‍රියජං ඥානං) යෙන සො ධොක්ෂජඃ ශෙෂස්‍යගාඃ වාචඃ ශෙෂගවීඃ **ඡෙකානුප්‍රාස අලංකාරය.**

69. අථ, ඉක්බිතිව හෙවත් ශ්‍රීකෘෂ්ණගෙ අනුදැනීමට අනතුරුව; උද්ධවඃ, උද්ධව රුමතෙම (හෙවත් බලභද්‍රතෙම); ආහිතභරාං, පිහිටුවනලද අර්ථ ගෞරව ඇති; තථ්‍යාම්, යථාර්ථවූ හෙවත් සත්‍යවූ; භාරතිම්, වචනය; අනුද්ධතං, උද්ධතනොවූසේ; ගදග්‍රජම්, ගදග්‍රජයාට හෙවත් ගදනමැත්තාට; අග්‍රෙ, ජ්‍යෙෂ්ඨවූ ශ්‍රීකෘෂ්ණයාට; උතථ්‍යානුජවත්, උතථ්‍යනම් මහාමුනිහට අනුජයාමෙන් හෙවත් වෘහස්පතිහු මෙන්; අග්‍රෙ, ඉදිරියෙහි; ජගාද කියේය.

**උද්ධවඃ ගදග්‍රජම් භාරතිම් ජගාද** යනු මෙහි ක්‍රි- සි. ජගාද යනු පරොක්ෂ ලිට්සි- ගද ව්‍යක්තායාම් වාචි, ධාතුවෙන් ණප් ප්‍රත්‍යසි ආහිතො භරො (අර්ථගෞරවම්) යස්‍යාං සා= (තාම්) උතථ්‍යස්‍ය (මහර්ෂෙඃ) අනුජඃ (වෘහස්පතිඃ) උතථ්‍යානුජඃ තවත්= යනු සමාස ක්‍රමයි **ඡෙකානුප්‍රාස අලඞ්කාරයි.**

70. සංප්‍රති, දැන්; මුසලපාණිනා, මොහොලක් අත්හිවූ හෙයින් මුසලපාණින් නම්වූ බලභද්‍රයා විසින්; උක්තෙ, (යථොක්තාකාරයෙන්) කී කල්හි; වක්තුං, කියන්ට; අසාංප්‍රතං, අයුතුයි; ලෙඛෙන, ලෙඛ්‍යායෙන් හෙවත් ලියවිල්ලෙන්; නිර්ධාරිතෙඅර්ථෙ, කියයුතු අර්ථය නිශ්චිතකල්හි; වාචිකං, ව්‍යවහෘතාර්ථ ඇති බස හෙවත් පතිවිඩ වචනය; උක්ත්වාඛලූ, නොකිය යුතුයි.

71. තථා'පි යන්මය්‍ය'පි තෙ ගුරුරිත්‍යස්ති ගෞරවම්
තත්ප්‍රයොජනකාතීඃත්ව'මූපෛති මමජල්පතඃ.

72. වර්ණෛඃ කතිපයෛ'රෙව ග්‍රථිතස්‍ය ස්වරෛ'රිව
අනන්තා වාඞ්මයස්‍යාහො ගෙයස්‍යෙ'ව විචිත්‍රතා.

---

**මූකල්පාණ්නා උපෙක්‍ෂා වක්තුං අසාම්ප්‍රතං භවති** යනුද **ඛ්‍යාතා වාචිකං උත්ඛාටලු** යනුද මෙහි ක්‍රි- යි. මෙහි උත්ඛාටලු යනු නවාච්‍යම් යනාදීවන් නෙපාතික ක්‍රියාවෙකි 'අලංඛලෙවාඃ ප්‍රතිෂෙධයොඃ ක්ත්වා' යන සූත්‍රයෙන් ප්‍රතිෂෙධාර්ථයෙහි ක්ත්වා ප්‍රත්‍යයි. **දෘෂ්ටාන්තා ලඞ්කාරයි.**

71. තථාපි, එසේද වුවත්; ගුරුඃඉති, ආචාර්‍යයයි; මයිඅපි, මා කෙරෙහිත්; තෙ, ඔබගෙ; යත්ගෞරවම්, යම් ගරුභාවයක් හෙවත් ආදරයෙක්; අස්ති, ඇත්තේද; තත්, ඒ ගෞරවය; ජල්පතඃ, ජල්පනය කරන්නාවූ හෙවත් කියන්නාවූ; මම, මාගෙ; ප්‍රයොජනකාතීඃත්වං, ප්‍රයොජක කාතීඃබවට හෙවත් දේරුඃ ත්වයට; උපෛති පැමිණෙයි (එහෙයින් කියන්නෙමියි සේයි.)

**යත්ගෞරවම් මය්‍යපි තෙ අස්ති** යනුද **තත් මම ප්‍රයොජක කාතිඃත්වම් උපෛති** යනුද මෙහි ක්‍රි-යි. අස්ති යනුද උපෛති යනුද වතී- ලට්- යි- අස්භුවි- උපපූර්වඉණ්, ගතෞ යන ධාතූන් කෙරෙන් තිප් ප්‍රත්‍යයි. **සම්භාවනාන්ත අලඞ්කාරයි**

(රාමයා විසින්ම සියල්ල විස්තරවසයෙන් කියනලද්දේ නොවේද? දූත් ඔබ විසින් කියයුතු කුමක් ඇත්තේදැයි යන ශංකාතොම නිෂ්ඵලවන්නීය, මේ තත් විස්තරයයි හෘදයෙහිතබා ස්තුතිකරමින් මෙසේ කියයි.)

72. කතිපයෛඃස්වරෛඃ, ස්වරකීපයකින් හෙවත් නිෂාදාදි සප්තස්වරයෙන්ම; ග්‍රථිතස්‍ය, ගොතනලද්දාවූ; ගෙයස්‍යවිචිත්‍රතාඉව, ගායනය සම්බන්ධවූ විසිතුරු භාවය මෙන්; කතිපයෛඃ එව වර්ණෛඃ, වර්ණ කීපයකින්ම හෙවත් පඤ්චාශත් මාතෘකාක්‍ෂර වලින්ම; ග්‍රථිතස්‍ය, ගොතනලද්දාවූ; වාඞ්මයස්‍ය, ශබ්දජාලයාගෙ හෙවත් ශබ්ද සමූහයාගෙ; අනන්තා, රචනාභෙද වසයෙන් අපරිමිතවූ; විචිත්‍රතා, විසිතුරුබව වන්නීය අහො ආශ්චර්‍ය්‍යයි.

**ගෙයස්‍ය විචිත්‍රතා අහො (ආශ්චර්‍යම්) භවති** යනු මෙහි ක්‍රි-යී. භවති යනු අධ්‍යාහෘත- වතී- ලට්යි- භූසත්තායාම් ධාතුවෙන් තිප් ප්‍රත්‍යයි මෙහි වාඞ්මයස්‍ය යන තන්හි 'එකාචො'පිනිත්‍යම් මයටම්වජ් නාහිති, ස්වාථෙර්මයට්, යනු කී හෙයින් මයට් ප්‍රත්‍යයි. වාග්එව වාඞ්මයං යි තන් නිර්වචනයි **අපෙක්ෂෙකොපමා ලඞ්කාරයි.**

73. බහව'පි සේවජ්ඡයා කාමං ප්‍රකීණ්'මහිධීයතෙ
අනුජ්ඣිතාර්ථසම්බන්ධඃ ප්‍රබන්ධො දුරුදහරඃ.

74. ම්‍රදීයසීම'පි ඝනාමතල්පගුණකල්පිතාම්
ප්‍රසාරයන්ති කුශලාශ්චිත්‍රාං වාචං පටී'මිව.

75. විශෙෂවිදුෂඃ ශාස්ත්‍රං යත්තවො'වාහ්‍යතෙ පුරඃ
හෙතුඃ පරිචයස්ථෛර්යෙ වක්තුර්ගුණනිකෛ'ව සා.

---

73. සෙවජ්ඡයා, සියකැමැත්තෙන්; ප්‍රකීණ්ම්, ගැවසීගත්තාවූ; බහු අපි, බොහොමයක්ද; කාමං, කැමතිපරිද්දෙන්; අභිධීයතෙ, හඳුරණුලැබේ; (යලි එකෙක් ඇත) අනුජ්ඣිත, දුරුනොකරණලද් දවූ; අර්ථසම්බන්ධඃ, අර්ථසම්බන්ධයන් ඇති හෙවත් පදාර්ථසඬගම ඇති ප්‍රබන්ධඃ, ප්‍රබන්ධය තෙම; දුරුදහරඃ, (අයහපත් අරුත් එලවන හෙයින්) දුෂ්චස්වෙයි.

**සෙඃ බහුඅපි සෙවජ්ඡයා අභිධීයතෙ** යනුද **ප්‍රබන්ධඃ දුරුද හරඃ භවති** යනුද මෙහි ක්‍රි-සි. අභිධීයතෙ- යනු- වත්- ලට්- කර්ම කාරකයි අභිපූර්ව ඉඩ්,අධ්‍යයනෙ ධාතුවෙන් තෙ, ප්‍රත්‍යයි භවති යනු ප්‍රූපෝක්තනය මැයි **ව්‍යාජස්තුති අලඞකාරයි.**

74. කුශලාඃ, ව්‍යක්තයෝතුවූ; ම්‍රදීයසීම්අපි, ඉතාමෘදුවූම හෙවත් ඉතා සුකුමාරාක්ෂර ඇත්තාවූම; ඝනාම්, ඝනවූ හෙවත් අර්ථ යෙන් බරවූ; අතල්පගුණකල්පිතාම්, ශ්ලෙෂාදී බොහෝ ගුණවලින් රචනාකරණලද්දවූ; චිත්‍රාම්, ශබ්දාලංකාරාදියෙන් විචිත්‍රවූ; වාචං, බස; ම්‍රදීයසීම්, ඉතා සිලුටුවූ; ඝනාම්, ඝනවූ හෙවත් කෙහෙල් දලු සේ ඝනවූ; අතල්පගුණකල්පිතාම්, බොහෝ හුවලින් තතනලද්දවූ; චිත්‍රාම්, විසිතුරුරූපඇත්තාවූ; පටීම්ඉව, සළුවක්මෙන්; ප්‍රසාර යන්ති, විදහාලති හෙවත් ප්‍රකාශ කෙරෙති.

**කුශලාඃ චිත්‍රාම් වාචං ප්‍රසාරයන්ති** යනු මෙහි ක්‍රි- සි. ප්‍රසාර යන්ති යනු- වත්-ලට්-සි- ප්‍රපූර්,සෘ,ගතෞ ධාතුවෙන් අන්ති ප්‍රත්‍යයි අතිශයෙන මෘදු රිති ම්‍රදීයසී (තාම්) තඅල්පාඃඅනල්පාඃ අනල්පාශවතෙ ගුණාශෙචති= තෛඃකල්පිතා=(තාම්) යනු සමාසයි. **ශ්ලෙෂාලංකා රයි** නොහොත් **උපමාලංකාරයි.**

75. විශෙෂ විදුෂඃ, විශෙෂඥවූ හෙවත් විශෙෂ දන්නාවූ; තව, ඔබගෙ, පුරඃ, ඉදිරියෙහි; ශාස්ත්‍රම්, නීතිශාස්ත්‍රය; උද්වාහ්‍යතෙ, උප න්‍යාස කරණුලැබේශ යත; යත්, යමක්වේද; සා, ඕතොම හෙවත් ඒ උපන්‍යාස කිරීම; වක්තුඃ, වක්තෘහුගෙ හෙවත් උපන්‍යාස කරන්

76. ප්‍රඥොත්සාහවතඃ ස්වාමී යතෙ තාධාතු'මාත්මනි
තෞහිමූලමුදෙෂ්‍යන්ත්‍යා ජිගීෂො'රාත්මසංපදඃ.

77 සො'පධානං ධියං ධීරාඃ ස්ථෙයසීං ඛට්වයන්ති යෙ
තත්‍රාතිශං නිෂණ්ණා'සෙත ජානතෙ ජාතු න ශ්‍රමම්.

---

තාහුගෙ; පරිචයස්ථෙයෙ, අභ්‍යාසය සම්බන්ධවූ ස්ථිරභාවයෙහි; හෙතුඃ, හෙතුවූ; ගුණනිකාඑව, ගුණනිකාවම්මවන්නීය හෙවත් ආම්‍රෙඩිත යමැයි.

**ශෙෂ තවජුරඃ ශාස්ත්‍රම් උද්වාහ්‍යතෙ** යනු මෙහි ක්‍රි- යි. උද්වාහ්‍යතෙ යනු වතී- කම්කාරක ලට් යි, උත්පූර්ව වහ්, ප්‍රාපනෙ ධාතුවෙන්, තෙ, ප්‍රත්‍යයි. විශෙෂාන් අවන්තරභෙදාන් වෙත්‍යීති විශෙෂවිචාන් (තස්‍ය) ගුණනිකා යනු ගුණ ආම්‍රෙඩනෙ ධාතුව චෞරාදික බැවින් 'ණ්‍යාසශ්‍රන්ථොයුච්' යනුවෙන් යුච් ප්‍රත්‍යය හා ඔහු කෙරෙන් 'සංඥායාම්කණ්' යනුවෙන් කණ් ප්‍රත්‍යයි, කාත්පූර්වස්‍ය ඉකාරඃ, යනු කිහෙයින් නැවත ඉකාරවූතැනියි. **ස්වභාවොක්ති අලංකාරයි**.

76. අතඃ, එහෙයින්; ස්වාමී, ප්‍රභුතෙම; ප්‍රඥොත්සාහෞ, මන්ත්‍ර උත්සාහ යන ශක්ති දෙක; ආත්මනි, තමා කෙරෙහි; ආධාතුං, සම්පාදනයකරන්ට හෙවත් පිහිටුවාගන්ට; යතෙත, උත්සාහ කරන්නේය; හි, යම්හෙයකින්; තෞ, ඒ ප්‍රඥ උත්සාහ යන දෙක; උදෙෂ්‍යන්ත්‍යාඃ, උද්ගතවන්නාවූ හෙවත් වැඩෙන්නාවූ; ජිගීෂොඃ, දිනනු කැමැත්තහුගෙ; ආත්මසම්පදඃ, ස්වකීය සම්පත්තියට හෙවත් ප්‍රභුශක්තියට; මූලම්, මුල්වේද එහෙයිනි.

**ස්වාමී ප්‍රඥොත්සාහෞ ආත්මනි ආධාතුම් යතෙත** යනුද **තෞ, ජිගීෂොඃ ආත්මසම්පදඃ මූලම්භවතඃ** යනුද මෙහි ක්‍රි- යි. යතෙත යනු යත- 'යතෙන' ධාතුවෙන් ඊත, ප්‍රත්‍යයි. විධිසංභාවන ලිඞ්යි භවතඃ යනු භූධාතුවෙන් 'තස්' ප්‍රත්‍යයි **නිදර්ශනාලංකාරයි.**

77. යෙධීරාඃ, යම් ප්‍රාඥයෝතුමෝ; සොපධානං, යුක්ති යුක්ත හෙයින් විශෙෂ සහිතවූ දේ හෝ නොහොත් උපවහී හෙවත් ශීරො ඝාත සහිතවූ; ස්ථෙයසීම්, අචපල හෙයින් ස්ථිරතරවූ දේ හෝ නොහොත් ඉතා දෘඪවූ; ධියං, (ස්වකීය)බුද්ධිය; ඛට්වයන්ති, පළඟ කර ගණිත්ද හෙවත් ඇසුරු කෙරෙත්ද; තෙ, ඒ ධීරයෝතුමෝ; තත්‍ර, ඒ බුද්ධි පර්යංකයෙහි; අතිශම්, නිරන්තරයෙන්; නිෂණ්ණාඃ, හිඳගත්තාහු හෙවත් අශ්‍රාන්තව හිඳගත්තාහු; ජාතු, කිසිකලෙකත්; ශ්‍රමං, පරිශ්‍රමය හෙවත් වෙදය; නජානතෙ, නොදනිති.

78. ස්පෘශන්ති ශරවත්තීක්ෂ්ණා ස්තොකම'න්තර්විශන්තිච
බහුස්පෘශාපි ස්ථූලෙන ස්ථීයතෙ බහි'රශ්මවත්

79. ආරභන්තෙ 'ල්පමෙවාඥාඃ කාමං ව්‍යාග්‍රා භවන්තිච
මහාරම්භාඃ කෘතධිය'ස්තිෂ්ඨන්ති ච නිරාකුලාඃ.

---

**සෛධිජඃ ධියං ඛට්වයන්ති** යනුද **තෙ අනිශං තත්‍රනිෂ්ණාඃ ශ්‍රමං න ජානතෙ** යනුද මෙහි ක්‍රි- යි. ඛට්වයන්ති යනු වර්තමාන ලට්යි- නාමධාතු ක්‍රියා පදයි අන්ති ප්‍රත්‍යයි, 'ශයනං මඤ්චපර්‍ය්‍යඞ්ක පල්‍යඞ්කාඃ ඛට්වයා සමාඃ' යනු අමරකොෂයි. නජානතෙ යනු වර්ත- ලට්යි නඤ්පූර්ව ඥ,අවබොධනෙ ධාතුවෙන් අනෙත,ප්‍රත්‍යයි අත්,යනා දෙශයි ඥ ධාතුහට ජායනාදෙශයි. **පරිණාමාලඞ්කාරයි.**

78. තීක්ෂ්ණාඃ, තියුණුනුවනැත්තෝ ශරවත් හීයමෙන්; ස්තොකම්, ස්වල්පයක්ම; ස්පෘශන්ති, ස්පර්ශකෙරෙති; අන්තඃ, කාර්‍ය්‍යාභ්‍යන්තරයට හෙවත් කටයුතු ඇතුලට; විශන්තිච, වැදගන්නාහුද වෙත් (ස්වල්පායාශයෙන් බොහෝ කටයුතු කෙරෙති යී සේයි;) බහුස්පෘශාඅපි, බොහෝ ස්පර්ශ කරන්නාවූද; ස්ථූලෙන, මහැවූවහු විසින් හෙවත් මහත්වූ මූඪයා විසින්; අශ්මවත්, පැතිරගන්නාවූ මහත් ශෛලයමෙන්; බහිඃ, කාර්‍ය්‍යා කාර්‍ය්‍ය දෙකින් පිටත්හිම; ස්ථීයතෙ, සිටීමයි.

**තීක්ෂ්ණාඃ ස්තොකං ස්පෘශන්ති** යනුද **තීක්ෂ්ණාඃ අන්තර්විශන්ති** යනුද **ස්ථූලෙන බහිඃ ස්ථීයතෙ** යනුද මෙහි ක්‍රි- යි. ස්පෘශන්ති යනුද විශන්ති යනුද ස්ථීයතෙ යනුද වර්ත- ලට්හුයි ස්පෘශ්, ස්පර්ශනෙ විශ්, ප්‍රවෙශෙ ෂ්ඨා, ගතිනිවෘත්තෞ යන ධාතුන් කෙරෙන් අන්ති ප්‍රත්‍යය හා ස්ථීයතෙ යන තන්හි භාවයෙහි තෙ, ප්‍රත්‍යයි. **උපමාලංකාරයි.**

79. අඥාඃ, අඥයෝ හෙවත් මූඪයෝ; අල්පම්එව, ස්වල්ප වූවක්ම හෙවත් හිස්වූදෙයක්ම; ආරභන්තෙ, පටන්ගණිත්; කාමං, අත්‍යර්ථයෙන් (අතිශයින්); ව්‍යාග්‍රාඃභවන්තිච, ත්වරිතද හෙවත් පුහුපුලුද වෙත්; කෘතධියඃ, ශික්ෂිත බුඩිඇති පණ්ඩිතයෝ; මහාරම්භාඃ, මහත් උද්‍යොග ඇත්තාහු; නිරාකුලාඃ, නිරාකුල ස්වභාව ඇත්තාහු (අවුල් නැත්තාහු යයී සේයි); තිෂ්ඨන්තිච, සිටිත්මැයි (කාර්‍ය්‍යපාරයට යන්නාහු වෙතියි සේයි.)

(**අඥාඃ අල්පම්එව ආරභන්තෙ** යනුද **අඥාඃ කාමං ව්‍යග්‍රාඃ භවන්ති** යනුද **කෘතධියඃ නිරාකුලාඃ තිෂ්ඨන්ති** යනුද මෙහි ක්‍රි- යි. ආරභන්තෙ යනුද භවන්ති යනුද තිෂ්ඨන්ති යනුද වර්තමාන ලට්හුයි

80 උපායමාසාදිතස්‍යා'පි නශ්‍යන්ත්‍යර්ථාඃ ප්‍රමාද්‍යතඃ
හන්ති නෝපශයස්ථෝ'පි ශයාලුර්මෘගයුර්මෘගාන්.

81. උදෙතු ම'ත්‍යජන්නීහාං රාජසු ද්වාදශස්ව'පි
ජිගීෂුරෙකො දිනකෘද'දිත්‍යෙෂ්වෙව කල්පතෙ.

---

ආඞ්පූර්ව රභ, ආරම්භෙ භූ, සත්තායාම්, ෂ්ඨා, ගතිනිවෘත්තෞ යන ධාතූන් කෙරෙන් අන්ති, ප්‍රත්‍යය හා අන්ත, ප්‍රත්‍යයයි, නිදර්ශනානුසාරයෙන් දතයුතුයි. **සම්භාවනාඛ්‍යාති අලඞ්කාරයි.**

80. උපායම්ආසාදිතස්‍යඅපි, උපායෙහි සිටිනුමුත් හෙවත් උපායෙන් කාර්‍ය්‍යසිද්ධිය කරණ නුමුත්; ප්‍රමාද්‍යතඃ, ප්‍රමත්තයාගෙ හෙවත් ප්‍රමාද සහිතවූවහුගෙ; අර්ථාඃ, අර්ථයෝ හෙවත් ප්‍රයෝජනයෝ; නශ්‍යන්ති, නැශෙත්; උපශයස්ථඃඅපි, උපශයෙහි සිටිනාවූද හෙවත් තමා ගුප්ත ස්ථානයෙහි සිටිනාවූද; ශයාලුඃ, නිදනසුලුවූ; මෘගයුඃ, මුවවැද්දෙ තෙමේ; මෘගාන්, මෘගයන්; න, හන්ති, නොනශයි.

**ප්‍රමාද්‍යතඃ අර්ථාඃ නශ්‍යන්ති** යනුද **මෘගයුඃ මෘගාන් න, හන්ති** යනුද මෙහි ක්‍රි- යි. නශ්‍යන්ති යනුද න හන්ති යනුද– වර්ත=ලට්– යි, නශ්, අදර්ශනෙ යන ධාතුවෙන් අන්ති, ප්‍රත්‍ය හා හන්, හිංසායාම් ධාතුවෙන් අන්ති, ප්‍රත්‍යයි, උපශෙරතෙ අස්මින්නිති උපශයඃ උපශයෙ තිෂ්ඨතීති උපශයස්ථඃ ශෙතෙ, ශිලෙනාති ශයාලුඃ මෘගාන්යාතීති මෘගයුඃ යනු නිර්වචනයි. **අර්ථාන්තරන්‍යාසාලඞ්කාරයි,**

81. ද්වාදශසුඅපිරාජසු, දෙළොස් රජුන් අතුරෙහිදු; ජිගීෂුඃ, දිනන සුලුවූ; එකඃ, එකෙක්ම; (ද්වාදශසු) ආදිත්‍යෙෂු, දෙළොස් සූර්‍ය්‍යයන් අතුරෙහි; (එකඃ) දිනකෘත්ඉව, එකම දිනකරයාමෙන්; ඊහාම්, උත්සාහය; අත්‍යජන්, නොහරින්නේ; උදෙතුම්, උද්ගතවන්ට; කල්පතෙ, සමර්ථවෙයි

**රාජසු එකඃඅපි ඊහාම් අත්‍යජන් උදෙතුම් කල්පතෙ** යනු මෙහි ක්‍රි– යි. කල්පතෙ යනු වර්ත– ලට්යි– කල්ප, සාමර්ථ්‍යධාතුවෙන් තෙ, ප්‍රත්‍යයි– 'ප්‍රතිමාස, මාදිත්‍යභෙද ද්වාදශත්වම් තදෛවකස්‍යෛව ද්වාදශාත්මකත්වම්' යනුද 'ද්වාදශාත්මා දිවාකරඃ' යනුද කී හෙයින් එක එක මාසයෙහි සූර්‍ය්‍යයාගෙ ප්‍රභෙදයෙන් ද්වාදශත්වය වෙයි හේ සූර්‍ය්‍ය තෙමේ එකෙක්මැයි යනාදීන් දක්වා තිබෙන දීර්ඝ විස්තරය ටීකානුසාරයෙන් දතයුතුයි.

82. බුද්ධිශස්ත්‍රඃ ප්‍රකෘත්‍යඞ්ගො ඝනසංවෘතිකඤ්චුකඃ
චාරෙක්‍ෂණො දූතමුඛඃ පුරුෂඃ කො'පි පාර්ථිවඃ.

83. තෙජඃ ක්‍ෂමා වා නෛකාන්තං කාලඥස්‍ය මහීපතෙඃ
නෛකමොජඃ ප්‍රසාදො වා රසභාවවිදඃ කවෙඃ.

84. කෘතා'පචාරො'පි පරෛ'රනාවිෂ්කෘතවික්‍රියඃ
අසාධ්‍යඃ කුරුතෙ කොපං ප්‍රාප්තෙ කාලෙ ගදො යථා

---

82. බුද්ධිශස්ත්‍රඃ, බුද්ධියම ආයුධකොට ඇති; ප්‍රකෘත්‍යඞ්ගඃ, ස්වාමීන්ආදි ප්‍රකෘතිය අවයවකොට ඇති; ඝනසංවෘතිකඤ්චුකඃ, දුර්භේද හෙයින් ඝනවූ ගුප්ති නමැති; සන්නාහය හෙවත් යුද්ධසැට්ටය ඇති; චාරෙක්‍ෂණඃ, ගූඪපුරුෂයන් නමැති ඇස්ඇති; දූතමුඛඃ, දූතයන් නමැති වදන් හෙවත් මුවඇති; කඃඅපිපුරුෂඃ, කිසියම් පුරුෂයෙක්; පාර්ථිවඃ, පෘථිවීශ්වරයෙක් වන්නේයි.

**මාදෘශරාජස්‍ය කඃඅපි පාර්ථිවඃ ස්‍යාත්** යනු මෙහි ක්‍රි- යි. ස්‍යාත් යනු- විධිසං- ලිඞ්යි, අස්, භුවි ධාතුවෙන් යාත්. ප්‍රත්‍යයි බුද්ධිරෙව ශස්ත්‍රම්යස්‍ය සඃ= ප්‍රකෘතයඃ (ස්වාම්‍යාදි රාජ්‍යාඞ්ගානි) යස්‍යසඃ= ඝනා (දුර්භේද) සංවෘතිර් (මන්ත්‍රගුප්තිරෙව) කඤ්චුකඃ (කවචො) යස්‍යසඃ= චරතීති චරඃ සඑවචාරඃ- සඑවඊක්‍ෂණං චක්‍ෂුර්‍යස්‍යසඃ-දවති ගච්ඡතීති දූතඃ (සන්දෙශහරඃ) සඑවමුඛං යස්‍යසඃ= යනු නිර්වචනයි. **අතිශයොක්ති සංකීර්ණයි.**

83. කාලඥස්‍ය, යොග්‍යකාලය දන්නාවූ; මහීපතෙඃ, මහිපාලයාහට; තෙජඃ, තේජස හෝ; ක්‍ෂමාවා, ඉවසිම හෝ; නඑකාන්තං, අනෛකාන්තිකවෙයි හෙවත් නියම නොවෙයි; රසභාව විදඃ, ශෘඞ්ගාරාදි රසයන් හා නිර්වේදාදිභාවයන් දන්නාවූ; කවෙඃ, පණ්ඩිතයාහට එකඔජඃ, හුදෙක් ඔජෝගුණය හෙවත් ප්‍රබන්ධ ප්‍රෞඪත්වය හෝ; ප්‍රසාදඃ, එකම ප්‍රසාදය හෙවත් ප්‍රබන්ධ සුකුමාරත්වය හෝ; නඑකාන්තං, නියම නොවෙයි.

**මහීපතෙඃ තෙජඃ ක්‍ෂමා,වා න,එකාන්තං භවති** යනුද **කවෙඃ ඔජඃ ප්‍රසාදොවා නෛකාන්තංභවති** යනුද මෙහි ක්‍රි- යි. භූ, ධාතුවෙන් වතී ලට්- තිප් ප්‍රත්‍යයි **නිදර්ශනාලංකාරයි.**

('ක්‍රියාසමභිහාරෙන විරුධ්‍යන්තං සහෙතුකඃ' යනාදීන් යමක් කියනලදද එහි පිළිතුරු මෙසේ කියයි.)

84. පරෛඃ, සතුරන් විසින්; කෘතාපචාරඃඅපි, කරණලද අපකෘෂ්ටාචාර ඇත්තාවූ ද්‍රෝ හෝ නොහොත් අපථ්‍ය ඇත්තාවූද; අනාවිෂ්කෘත, ප්‍රකාශනොකරණ ලද්දවූ; වික්‍රියඃ, විරුද්ධවූ ක්‍රියාවන් ඇති

85. මෘද්ව්‍යවහිතං තෙජො භොක්තුම'ර්ථාන්ප්‍රකල්පතෙ
ප්‍රදීපඃ ස්නෙහමා'දත්තෙ දශයාභ්‍යන්තරස්ථයා.

86. නාලම්බතෙ දෛෂ්ටිකතාං න නිෂීදති පෞරුෂෙ
ශබ්දාර්ථෞ සත්කවිරිව ද්වයං විද්වා'නපෙක්ෂතෙ.

---

දේ හෝ නොහොත් ඇතුලත සැඟවුණු රෝගයන් ඇති; අසාධ්‍යඃ, (එහෙයින්ම) සුවනොකටහැකිවූ; ගදඃයථා, රෝගතෙම යම්සේද එසේ; කාලෙප්‍රාප්තෙ, සුදුසුකාලය හෙවත් බලක්ෂයාවසරය පැමිණි විට; කොපංකුරුතෙ, කෝපය කෙරෙයි.

**සඃ කාලෙ ප්‍රාප්තෙ කොපං කුරුතෙ** යනු මෙහි ක්‍රි- යි. කුරුතෙ, යනු වර්- ලට්- යි, ඩුකෘඤ්, කරණෙ ධාතුවෙන් තෙ, ප්‍රත්‍යයි කෘතඃ අපචාරඃ යස්‍යසඃ= නආවිෂ්කෘතා අනාවිෂ්කෘතා විරුද්ධාක්‍රියා වික්‍රියා අනාවිෂ්කෘතාඃ වික්‍රියාඃ යස්‍යසඃ= ප්‍රාප්තකාලයෙහි සතුරන් බිඳීම හෙවත් නැසීමගැණ අන්‍යස්ථානයෙක්හි මෙසේ කියනලදී.

'වහෙදමිත්‍රං සකන්ධෙන යාවත් කාලවිපර්‍ය්‍යයඃ
තමෙවචාගතෙකාලෙ භින්ද්‍යාත් ඝටමිවාශ්මණා' යනුයි.

85. මෘදුව්‍යවහිතම්, මොලොක් වස්තුවකින් ව්‍යවහිතවූ හෙවත් වැසුණාවූ; තෙජඃ, තේජස්තෙම; අර්ථාන්, ප්‍රයෝජනයන්; භොක්තුං, බුදින්ට; ප්‍රකල්පතෙ, ප්‍රභුවෙයි (සමර්ථවෙයි සේයි); ප්‍රදීපඃ, ප්‍රදීපය තෙම; අභ්‍යන්තරස්ථයා, ඇතුලත පිහිටියාවූ; දශයා, දවළෙයෙන් හෙවත් පාන්වැටියෙන්; ස්නෙහං, තෛලය; ආදත්තෙ, ගණියි.

**තෙජඃ අර්ථාන් භොක්තුං ප්‍රකල්පතෙ** යනුද **ප්‍රදීපඃ දශයා ස්නෙහම් ආදත්තෙ** යනුද මෙහි ක්‍රි-යි. ප්‍රකල්පතෙ යනුද ආදත්තෙ යනුද වර්- ලට්, යි, ප්‍රපූර්ව, ක්ලෘප, සාමර්ථ්‍යෙ, ආඞ්පූර්ව, ඩුදාඤ්, දානෙ, ධාතුහුයි, තෙ, ප්‍රත්‍යයි මෘදුනා, ව්‍යවහිතං මෘදුව්‍යවහිතං අභ්‍යන්තරෙ තිෂ්ඨතීති අභ්‍යන්තරස්ථා (තයා) යනු නිර්වචනයි. **අර්ථාන්තර න්‍යාස අලංකාරයි**

86. විද්වාන්, පණ්ඩිතතෙම; දෛෂ්ටිකතාම්, දිෂ්ටයෙහි මතිඇති බව හෙවත් දෛවසංඛ්‍යාත පූර්වකර්මයම ප්‍රධානකොට ඇතිබව; නආලම්බතෙ, නොඑල්බගණියි; පෞරුෂෙ, හුදෙක් පුරුෂ වික්‍රමයෙහිමත්; න නිෂීදති, නිෂීදනය නොකෙරෙයි හෙවත් නොඑල්බගණියි; සත්කවිඃ, යහපත් කිවිතෙම; ශබ්දාර්ථෞඉව, ශබ්දය අර්ථය යන දෙකම අපෙක්ෂා කරන්නාක්මෙන්; ද්වයං, දෛවය පෞරුෂය යන දෙකම හෙවත් පූර්ව ප්‍රත්‍යක්ෂ සංඛ්‍යාත වාසනාව හා පුරුෂවීර්‍ය්‍ය යන දෙකම; අපෙක්ෂතෙ, බලාපොරොත්තුවෙයි.

87. සථායි'නො'ථෛ ප්‍රවර්තනෙත භාවාඃ සංචාරිණො යථා
රසස්සෙය'කස්‍ය භූයාංසස්තථා නෙතුර්මහීභෘතඃ.

88. තන්ත්‍රාවාපවිදා යොගෛ'ර්මණ්ඩලාන්‍ය'ධිතිෂ්ඨතා
සුනිග්‍රහා නරෙන්ද්‍රෙණ ඵණීන්ද්‍රා ඉව ශත්‍රවඃ.

---

**විද්වාන් දෛෂ්ටිකතාං නාලම්බතෙ** යනුද **විද්වාන් පෞරුෂෙ නනිෂීදති** යනුද **විද්වාන්ද්වය මපෙක්ෂතෙ** යනුද මෙහි ක්‍රි-යි. නාලම්බතෙ යනුද නනිෂීදති යනුද නාපෙක්ෂතෙ යනුද වනි- ලවිහුයි, නඤ් ආඞ් පූර්, ලබි, ආලම්බතෙ, නඤ්, නි, පූර්, සදවිසරණගත්‍යවසාදනදනෙෂු, නඤ් උපපූර්, ඊක්ෂ, දර්ශනාඞ්කණයොඃ,යන ධාතූන් කෙරෙන් තෙ, ප්‍රත්‍යය හා තිප්, ප්‍රත්‍යයි, ශබ්දාර්ථ දෙදෙන කාව්‍යශරීර බැවින් ඒ දෙක අපෙක්ෂාකිරීම (කිවිහුගෙ) සත්ක විභවයයි. වාමන තෙම එහෙයින් කීහ. 'අදොෂෞ සගුණෞ සාලංකාරෞ ශබ්දාර්ථෞ කාව්‍යම්' යනුයි. **උපමාලංකාරයි.**

87. රසස්‍ය, රසවත්වූ හෙවත් ආස්වාදනය කරණු ලබන්නාවූ; සථායිනඃ, රත්‍යාදි සථායීභාවවූ; එකස්‍ය, එකක්සම්බන්ධිවූ; අථෙ, අර්ථයෙහි හෙවත් ස්වාදුභාවරූපප්‍රයෝජනයෙහි; භූයාංසඃ, ඉතා බොහෝවූ; සංචාරිණඃ, ව්‍යභිචාරකරන්නාවූ; භාවාඃ, නිර්වෙදාදිස්වභාවයෝ; යථාප්‍රවර්තනෙත, යම්සේ පවතිත්ද; තථා, එසේ; සථායිනඃ, ස්ථිරවූ හෙවත් ක්ෂාන්තියෙන් කාලය ප්‍රතීක්ෂ්‍යමානවූ (පරීක්ෂාකාරීවූයී සේයි;) එකස්‍යඑවනෙතුඃ, එකමදිනියට් නැනැත්තාවූවහුගේ හෙවත් අසහාය නායකවූවහුගෙ; අථෙ, වස්තුවෙහි හෙවත් ප්‍රයෝජනයෙහි; භූයාංසඃ, මහීභෘතඃ, බොහෝ මහීපාලයෝ; ප්‍රවර්තනෙත, පවතිත්; (මණ්ඩලපරිවර්තිවූ අන්‍ය රජවරු පරිවාරභාවය පොෂ්‍යය කිරීමට පැමිණෙති ඒ කාර්‍යම සිඞකෙරෙති යි සේයි.)

**භාවාඃ එකස්‍ය අථෙ යථා ප්‍රවර්තනෙත** යනුද **මහීභෘතඃ නෙතුඃ අථෙ තථා ප්‍රවර්තනෙත** යනුද මෙහි ක්‍රි- යි. ප්‍රවර්තනෙත යනු ප්‍රපූර් වෘතුඞ් වර්තනෙධාතු වර්ත-ලට්- තෙ, ප්‍රත්‍යයි රස්‍යතෙ ස්වාද්‍යතෙ ඉති, රසඃ ශෘඞ්ගාරාදිඃ, යනු කී හෙයින් මෙහි රස නම් සථායිභාවසඞ්ඛ්‍යාතවූ රතිහාසාදියමැයි සේයි මෙයද **උපමාලඞ්කාරමැයි.**

88. තන්ත්‍රාවාපවිදා, ස්වපරරාෂ්ට්‍රචින්තන ද්‍යෙ හෝ නොහොත් ශාස්ත්‍රඖෂධ ප්‍රයෝගය දන්නාවූ; යොගෛඃ, සාමාදි උපායවලින් ද්‍යෙ හෝ නොහොත් දෙවතාධ්‍යයන වලින්; මණ්ඩලානි, ස්වරාෂ්ට්‍රපරරාෂ්ට්‍රයන්හි ද්‍යෙ හෝ නොහොත් මහෙන්ද්‍ර දෙවායතනාදි දේවාලයන්හි; අධිතිෂ්ඨතා, සිටිණාවූ; නරෙන්ද්‍රෙණ, විෂවෛද්‍යවැනිවූ නිරිඳු

89. කරප්‍රචෙයා'මුත්තුඞ්ගඃ ප්‍රභුශක්තිං ප්‍රථීයසීම්
ප්‍රඥාබලබෘහන්මූලඃ ඵලත්‍යු'ත්සාහපාදපඃ.

90. අනල්පත්වාත් ප්‍රධානත්වාත් වංශස්‍යෙවෙතරාඃ ස්වරාඃ
විජිගීෂො'ර්නෘපතයඃ ප්‍රයාන්ති පරිවාරතාම්.

---

විසින්; ඵණීන්ද්‍රාඃඉව, සර්පරාජයන්මෙන්; ශත්‍රවඃ, සතුරෝ; සුනිග්‍රහාඃ, සුවසේ නිග්‍රහකටහැක්කාහුවෙති; (පහසුවෙන් යටත්කරගත හැක්කාහු යයි සේයි )

**නරෙන්ද්‍රෙණ ශත්‍රවඃ සුනිග්‍රහාඃ භවන්ති** යනු මෙහි ක්‍රි- යි. තන්ත්‍රාවාපෞ (ස්වපරරාෂ්ට්‍ර චින්තනම්) වෙත්තීති, තන්ත්‍රාවාපවිත් (තෙන) අන්‍යත්‍ර තන්ත්‍රාවාපං (ශාස්ත්‍රෞෂධ ප්‍රයොගං වෙත්තීති= (තෙන) නරාණාම් ඉන්ද්‍ර= (තෙන) ඵණිනාම් ඉන්ද්‍රාඃ ඵණීන්ද්‍රාඃ යනු සමාසයි (මොනවට මන්ත්‍රශාස්ත්‍ර ඖෂධාදිය දත උගත් විෂවෛද්‍යයා විසින් සර්පරාජයන් මොනවට යටත්කරගන්නාක්මෙන් ස්වරාෂ්ට්‍ර පරරාෂ්ට්‍ර චින්තනාදිය දන්නාවූ නරෙන්ද්‍රයා විසින් සතුරන් පහසුවෙන් යටත්කරගත හැක්කේයි සේයි.) **ශ්ලෙෂාලංකාරයි**

89. උත්තුඞ්ගඃ, උස්වූ; ප්‍රඥාබලබෘහන්මූලඃ, මන්ත්‍රශක්ති නමැති මහත් මුල්ඇති; උත්සාහපාදපඃ, උත්සාහ නමැති වෘක්ෂයතෙම; කරප්‍රචෙයාම්, අයබදුවලින් වර්ධනය කටයුතුවූ ද්‍යෙහෝ නොහොත් අතින් ගතයුතුවූ; ප්‍රථීයසීම්, පෘථුතරවූ හෙවත් අතිශයින් මහත්වූ; ප්‍රභුශක්තිං, ස්වාමිබලය හෙවත් තේජෝ විශෙෂය; ඵලති, ඵලදෙයි.

**උත්සාහපාදපඃ ප්‍රභුශක්තිම් ඵලති** යනු මෙහි ක්‍රි- යි. ඵලති යනු වර්ත්-ලට්-යි, ඵල, නිෂ්පත්තෞ ධාතුවෙන් තිප්, ප්‍රත්‍යයි කරෙණ (බලිනා) ප්‍රචෙයා (වර්ධනීයා)= (තාම්) ප්‍රභොඃ ශක්තිඃ= (තාම්) අතිශයෙනපෘථුරිති ප්‍රථීයසී(තාම්)ප්‍රඥාඑව බලම් ප්‍රඥාබලම් තදෙව(ප්‍රධානං) මූලං යස්‍යසඃ= උත්සාහඑවපාදපඃ= යනු විග්‍රහයි. **රූපකාරයි.**

90. අනල්පත්වාත්, ප්‍රඥ උත්සාහදෙකින් මහත්බැවින් ද්‍යෙ හෝ නොහොත් අතිශයින් උස්වූ හෙයින්ද; ප්‍රධානත්වාත්, මණ්ඩලාභිඥ බැවින් ද්‍යෙහෝ නොහොත් ප්‍රධානස්වර බැවින්ද; වංශස්‍ය, කුළල් හඬට; ඉතරෙස්වරාඉව, විණාගායනාදි අන්‍යශබ්දයන් මෙන්; විජිගීෂොඃ, දිනියටිවූ රජුහට; නෘපතයඃ, අන්‍යවූ මාණ්ඩලික නරෙන්ද්‍රයෝ; පරිවාරතාම්, පිරිවරබවට හෙවත් පොෂ්‍යබවට; ප්‍රයාන්ති, පැමිණෙත්.

**නෘපතයඃ පරිවාරතාම් ප්‍රයාන්ති** යනු මෙහි ක්‍රි- යි. ප්‍රයාන්ති යනු වර්ත්- ලට්- යි, ප්‍රපූර්ව යා, ප්‍රාපණෙ, ධාතු වෙන් අන්ති, ප්‍රත්‍යයි **උපමාලඞ්කාරයි. මුක්තකබන්ධනයි.**

91. අප්‍යනාරභමාණස්‍ය විභෝරුත්පාදිතාඃ පරෛඃ
ව්‍රජන්ති ගුණතාමර්ථාඃ ශබ්ද ඉව විහායසඃ.

92. යාතව්‍යපාර්ෂ්ණිග්‍රාහාදිමාලායාමධිකද්‍යුතිඃ
ඒකාර්ථතන්තුප්‍රෝතායාං නායකො නායකායතෙ.

---

91. අනාරභමානස්‍යඅපි, සම්ාරම්භ නොකරන්නාවූද හෙවත් තෙමේ කිසියම් කාර්‍ය්‍යානනයක් පටන්ගැණීම නොකරන්නාවූද; විභොඃ, ප්‍රභූහුගෙ; පරෛඃ, සතුරු රජුන් විසින්; උත්පාදිතාඃ, උපද වනලද හෙවත් සම්පාදනය කරණලද; අර්ථාඃ, අර්ථයෝ හෙවත් ප්‍රයෝජනයෝ; විහායසඃ, අහසසම්බන්ධවූ; ශබ්දඉව, ශඞ්ඛහෙරි ආදියෙන් උපදවනලද ශබ්දයන් මෙන්; ගුණතාම්, විශෙෂණ බවට ද්ධෙහෝ නොහොත් කාරණත්වයෙන් ගුණබවට; ව්‍රජන්ති, පැමිණෙත්.

**විභොඃ අර්ථාඃ ගුණතාම් ව්‍රජන්ති,** යනු මෙහි ක්‍රි- සි. ව්‍රජන්ති, යනු වර්- ලට්- සි, ව්‍රජ, ගතෞ ධාතුවෙන් අන්ති, ප්‍රත්‍යයි. **උපමාලංකාරයි.**

92. ඒකාර්ථතන්තු ප්‍රෝතායාම්, එකම ප්‍රයොජන නමැති සූත්‍රයෙහි හෙවත් හුයෙහි ප්‍රවීතවූ (වියනලදදූවූ සී සේයි); යාතව්‍ය, නැසිය යුතුවූ හෙවත් සතුරුවූ; පාර්ෂ්ණිග්‍රහාදිමාලායාම්, පෘෂ්ඨානුධාවීඅය හෙවත් පිටිපස්සේ එන සතුරුඅය යනාදීන් නමැති රත්න මාලායෙහි; අධිකද්‍යුතිඃ, මහත් තේජස් ඇති; නායකඃ, ශක්ති සම්පන්නාවූ ජගත් නායකතෙම; නායකායතෙ, නායක මාණික්‍යය මෙන් වෙයි හෙවත් මධ්‍යයෙහිවූ ප්‍රධාන මාණික්‍ය රත්නය මෙන් වෙයි.

**ඒකාර්ථතන්තු ප්‍රෝතායාම් නායකඃ නායකායතෙ,** යනු මෙහි ක්‍රි- සි. නායකායතෙ යනු, වර්- ලට්යි, නාමධාතුක්‍රියා පදයි, ආය, ප්‍රත්‍යය හා තෙ, ප්‍රත්‍යයි, නායකඉව ආචරතීති නායකායතෙ 'උපමානාදචාරෙ'යනුවෙන් ආචාරාර්ථයෙහි ක්‍යඞ්,ප්‍රත්‍යයි) පාර්ෂ්ණිං,ගෘහ්ණාතීති පාර්ෂ්ණිග්‍රාහඃ යාතව්‍යශ්ච පාර්ෂ්ණිග්‍රාහශ්ච= තාවාදී යෙෂාම් තෙ=(පූර්වොක්තාඃ ෂඩ්ගුණාඃ සපිතාඃ) තෙඑවමාලා= තස්‍යාම් අධිකාද්‍යුතිර්‍ය්‍යස්‍යසඃ= එකශ්චාසාවර්ථශ්චෙති= ස එවතන්තුඃ= ඒකාර්ථතන්තෞ ප්‍රෝතා=(තස්‍යාම්) යනු සමාසයි. **රූපක උපමා සංසෘෂ්ටි අලංකාරයි.**

93. ෂාඞ්ගුණ්‍ය'මුපයුඤ්ජිත ශක්ත්‍ය'පෙක්ෂා රසායනම්
භවන්ත්‍ය'ස්‍යෛව' මඞ්ගානි ස්ථාස්නූනි බලවන්ති ච.

94. ස්ථානෙ ශමවතාං ශක්ත්‍යා ව්‍යායාමෙ වෘද්ධිරඞ්ගිනාම්
අයථාබල'මාරම්භො නිදානං ක්ෂයසම්පදඃ.

---

93. ශක්ත්‍යපෙක්ෂඃ, ප්‍රභාවාදිත්‍රිවිධශක්ති සඞ්ඛ්‍යාත බලය අපෙක්ෂාකරන්නේ; ෂාඞ්ගුණ්‍යම්, සන්ධිවිග්‍රහාදිෂඩ්ගුණසඞ්ඛ්‍යාතවූ; රසායනම්, රසායන බෙහෙත; උපයුඤ්ජිත, උපයුක්තකරන්නේය (සෙවනය කරන්නේය යී සේයි;) (එවං, එසේ ඇතිකල්හි;) අස්‍ය, ඔහුගෙ හෙවත් ඒ රසායන ප්‍රයොක්තෘහුගේ (ඒ සන්ධිවිග්‍රහාදි ෂඩ්ගුණ නමැති රසායන බෙහෙත සෙවනය කරන්නහුගෙ යයි සේයි;) අඞ්ගානි; අවයවයෝ; ස්ථාස්නූනි, ස්ථිරවූවාහුද; භවන්ති, වෙති; බලවන්තිච, බලසම්පන්නවූවාහුද වෙති.

**ශක්ත්‍යපෙක්ෂා රසායනම් උපයුඤ්ජිත,** යනුද **අස්‍ය අඞ්ගානි ස්ථාස්නූනි භවන්ති,** යනුද **අස්‍ය අඞ්ගානි බලවන්ති ච භවන්ති,** යනුද මෙහි ක්‍රි- සි. උපයුඤ්ජිත, යනු- විධිසං- ලිඞ් 3, භවන්ති යනු වර්ත- ලට්සි, උපපූර්ව යුජ්, යොගෙ ධාතුවෙන් හා භූ,සත්තායාම් ධාතුවෙන්, ඊත, ප්‍රත්‍ය අන්ති ප්‍රත්‍යයෝයි. (මෙහි ෂඩ්ගුණය නම්,) පූර්වොක්ත සන්ධිවිග්‍රහාදිගුණසයමැයි ත්‍රිවිධශක්තිනම් ප්‍රභාව උත්සාහ මන්ත්‍රණ යන තුනමැයි- අඞ්ගයෝ හෙවත් අවයවයෝ නම්

'ස්වාමී ජනපදෝ'මාත්‍යඃ කොශො දුර්ගබලං සුහෘත්
රාජ්‍යම් සප්ත ප්‍රකෘත්‍යඞ්ගම් නීතිඥඃසම්ප්‍රචක්ෂතෙ' යනුවෙන්

ප්‍රකාශිත කරුණු සතමැයි. **ශ්ලිෂ්ට පරම්පරිත, රූපකාලංකාරයි.**

94. ස්ථානෙ, ශක්තිවිෂයවූ ස්ථානයෙහි; ශමවතාම්, ක්ෂමා හෙවත් සංසිඳීම ඇත්තාවූ; අඞ්ගිනාම්, ස්වාම්‍යාදි සප්තාඞ්ග ඇත්තාහුයයි කියනලද රජුන්ගෙ දේහෝ නොහොත් ශරීරින්ගේ (සත්ත්වයන්ගේ යී සේයි,) ශක්ත්‍යා, ප්‍රභාවාදි ත්‍රිවිධ ශක්තියෙන් දේහෝ නොහොත් බලයෙන්; ව්‍යායාමෙ, ව්‍යායාමසංඛ්‍යාත ෂාඞ්ගුණ්‍ය ප්‍රයෝගවූ ව්‍යාපාරය ඇතිකල්හි දේහෝ නොහොත් ගමනාදිය ඇතිකල්හි; වෘද්ධිඃ, රාජ්‍යයාගේ දේහෝ නොහොත් සත්වයාගෙ අභිවෘද්ධිය හෙවත් උපචිතියවෙයි; අයථාබලම්, ශක්තිය ඉක්මවීමෙන්; ආරම්භඃ, ව්‍යායාමය හෙවත් කර්මාන්තයන් පටන්ගැණීම; ක්ෂයසම්පදඃ, ක්ෂය සම්පත්තියට හෙවත් අතිශයින් පිරිහීමට; නිදානං, මූල කාරණය වෙයි.

95. තදශිතාරං වෙදීනාං භවාං'ස්තමවමංස්ත මා
නිහන්ත්‍ය'රීනෙකපදෙ ය උදාත්තස්වරානි'ව.

96. මා වෙදි යදසාවෙකො ජෙතව්‍යශ්චෙදිරාඩිති
රාජයක්ෂ්මෙව රොගාණාංසමූහඃ ස මහීභෘතාම්.

---

**ස්ථානෙ අධිනාම් වෘධිඃස්‍යාත්,** යනුද ආරම්භඃ ක්ෂයසම්පදඃ නිදානං ස්‍යාත්, යනුද මෙහි ක්‍රි- යි. ස්‍යාත් යනු- අධ්‍යාහෘතවිධිසං= ලිඞ්යි, අස්, භුවි, ධාතුවෙන්, යාත්, ප්‍රත්‍යයි **ශ්ලෙෂොපමාලංකාරයි.** බලමනති ක්‍රමෙත්‍යති යථාබලම් නයථාබලම් අයථාබලම්

95. තත්, එහෙයින් හෙවත් අශක්‍යත්‍ය විය නොකටයුතු බැවින්; තම්, චෙදීනාම් ඊශිතාරං, චෙදීජනපදධීශ්වරවූ ඒ ශිශුපාලයාට; භවාන්, යුෂ්මද්තෙම; මාඅවමංස්ත, අවමන් නොකරව; (හේ කෙබඳු ශිශුපාලයෙක්දයත්?) යඃ, යම් වෛද්‍යයෙක් තෙම; උදාත්තඃ, උදාත්ත වූයේ හෙවත් උදාත්තස්වරය තෙම; ස්වරාන්ඉව, අනුදාත්තස්වරයන් මෙන්; අරීන් ශත්‍රූන්, එකපදෙ එක්පියෙහි ඡේහෝ නොහොත් සුප්තිඞන්ත ලක්ෂණ පදයෙක්හි; නිහන්ති, වනසයි නොහොත් පහත්කෙරෙයි.

(**භවාන් (ත්වම්) තම් මාඅවමංස්ත**) යනුද **යඃ එකපදෙ, අරීන් නිහන්ති** යනුද මෙහි ක්‍රි- යි. මාඅවමංස්ත යනු භූතාර්ථ ලුඞ්- යි, අව පූර්ව මන, ඥානෙ ධාතුවෙන් තන්, ප්‍රත්‍යයි. නිහන්ති යනු වර්ත- ලට්යි, නිපූර්ව හන්, හිංසායාම් ධාතුවෙන් අන්ති ප්‍රත්‍යයි **උපමාලංකාරයි.**

96. අසෞචෙදිරාඩ්, මේ වේදී ජනපදධීශ්වරවූ රජතෙම; එකඃ, හුදකලාවූයේ; ජෙතව්‍යඃඉති, දිනියහැක්කේයයි; මාවෙදි, නොදනුව හෙවත් නොදත යුතුයි; යත්, යම්හෙයකින්; සඃ, එ වේදී රජතෙම; රොගානාම්, රොගයන්ට; රාජයක්ෂ්මාඉව, ක්ෂයරෝගය මෙන්; මහීභෘතාම්, මහීපාලයන්ගේ; සමූහඃ, සමූහයෙක් වේද එහෙයිනි.

**ත්වයා චෙදිරාඩ් ජෙතව්‍යඃ ඉති මාවෙදි** යනුද **සඃ මහීභෘතාම් සමූහඃභවති** යනුද මෙහි ක්‍රි- යි. මාවෙදි යනු මාඞ්, යොගයෙහි භූතාර්ථ ලුඞ්- යි, විද්- ඥානෙ, ධාතුයි, භවති යනු අධ්‍යාහෘත, වර්ත- ලට්- යි, භූ, සත්තායාම් ධාතුයි මෙහි රාජයක්ෂ්මාතම් ක්ෂයරෝගයයි හෙ වාක්භටයෙහි මෙසේ කීහ;

'අනෙකරොගානු'ගතො බහුරොගපුරඃසරඃ
රාජයක්ෂ්මා ක්ෂයඃ ශොෂො රොගරාඩිති ච'ස්මෘතඃ
නක්ෂත්‍රාණාම් ද්විජානාං ච රාඥො භූද්යදයං පුරා
යච්චරාජා ච යක්ෂ්මා ච රාජයක්ෂ්මා තතො මතඃ' (යනුයි)

**උපමාලංකාරයි.**

97. සම්පාදිතඵලස්තේන සපක්ෂඃ පරභේදනඃ
කාර්මුකේණේව ගුණිනා බාණඃ සංධානමේෂ්‍යති.

98. යේ චා'න්‍යේ කාලයවනශාල්වරුක්මිද්‍රුමාදයඃ
තමඃස්වභාවා'ස්තේප්‍යේනං ප්‍රදෝෂම'නුයායිනඃ.

99. උපජාපඃ කෘතස්තේන තානා'කෝපවතස්ත්වයි
ආශු දීපයිතා'ල්පෝ'පි සාග්නීනේධානිවා'නිලඃ.

---

97. සම්පාදිතඵලඃ, සපයනලද ලාභඇති දේහෝ නොහොත් ශරාග්‍රඇති; සපක්ෂඃ, සුහෘත් ජනසහිතවූ දේහෝ නොහොත් කඞ්ක පත්‍රාදිය සහිතවූ; (ලෝතුඩු පියාපත් සහිතවූ යී සේයි) පරභේදනඃ, ශත්‍රෘ විදාරණය කරන්නාවූ; බාණඃ, බාණාසුර තෙම දේ හෝ නොහොත් ශරය (ඊය) තෙම; ගුණිනා ශෞර්‍ය්‍යාදිගුණාන්විතවූ දේහෝ නොහොත් අධිජ්‍යවූ; (දුනු දියට නැගුනාවූ යී සේයි) තේන, ඒ චෛද්‍යයා හා, කාර්මුකේනඉව, දුන්න සමග මෙන්; සංධානං, සන්ධියට හෙවත් එකතුවීමට; එෂ්‍යති, පැමිණෙන්නේය.

**බාණඃ තේන සංධානං එෂ්‍යති,** යනු මෙහි ක්‍රි– යි. එෂ්‍යති, යනු භවිෂ්‍යත් කාලලෘට්යි, ඉණ්, ගතෞ ධාතුවෙන්, ස්‍යති, ප්‍රත්‍යයි, සම්පාදිතං ඵලං (බාණාග්‍රංච) යස්‍යසඃ= පක්ෂෛණ සහවර්ත ඉති සපක්ෂඃ භින්දන්තීති භේදනඃ පරේෂාම් භේදනඃ= ගුණඃඅස්‍යාස්තීති ගුණී (තේන) යනු නිර්වචනයි. **උපමාලඞ්කාරයි** නොහොත් **ශ්ලේෂාපමායි.**

98. කාලයවනශාල්වරුක්මිද්‍රුමාදයඃ, කාලය යවනය ශාල්වය රුක්මිය ද්‍රුමය යනාදිවූ; යෙචඅන්‍යෙ, තවත් යම් රජවරු; තමඃ ස්වභාවාඃ, තමෝගුණාත්මකොට ඇත්තාහුවෙත්ද; තෙ, අපි ඔව්හුද; ප්‍රදෝෂං, ප්‍රකෘෂ්ටවූ දෝෂඇති හෙවත් තමස් ගුණාත්මකවූ; එනං, ඒ ශිශුපාලයාට; අනුයායිනඃ, අනුවයන්නෝ වෙත්.

**යෙ අන්‍යෙ තමඃ ස්වභාවාඃ භවන්ති** යනුද **තෙ ප්‍රදෝෂමනුයායිනඃ භවන්ති,** යනුද මෙහි ක්‍රි– යි. භවන්ති, යනු, වර්ත– ලට්– යි, භූ, සත්තායාම් ධාතුවෙන් අන්ති, ප්‍රත්‍යයි (කාලශ්ච යවනශ්ච ශාල්වශ්ච රුක්මිශ්ච ද්‍රුමශ්ච= (තෙ) ආදිර්යේෂාම් තෙ= තමඃ ස්වභාවං යේෂාම් තෙ= අනුයායිෂ්‍යන්තීති අනුයායිනඃ යනු විග්‍රහයි.

99. තේන, ඒ ශිශුපාලයා විසින්; කෘතඃ, කරණලද්දවූ; අල්පඃ අපි, ස්වල්පවූද; උපජාපඃ, භේදයතෙම; ත්වයි, ඔබකෙරෙහි; ආකෝපවතඃ, මදක්කෝපඇති; තාන්, ඒ බාණාසුරාදීන්; ආශු, වහා; දීපයති, දල්වයි; (කෙසේදයත්?) අනිලඃ, වාතයතෙම; සාග්නීන්, ගිනිසහිතවූ එධානිඉව, දරදල්වන්නාක්මෙනි.

100. වෘහත්සහායඃ කාර්‍යාන්තඃ ක්ෂෝදීයානපි ගච්ඡති
සංභූයාම්භොධි'මභ්‍යෙති මහානද්‍යා නගාපගා.

101. තස්‍ය මිත්‍රාණ්‍යමිත්‍රා'ස්තෙ යෙ ච යෙ චොභයෙ නෘපාඃ
අභියුක්තං ත්වයෛනං තෙ ගන්තාරස්ත්වා'මතඃ පරෙ

102. මඛවිඝ්නාය සකලමිත්‍යුත්ථාප්‍ය රාජකම්
හන්ත ජාත මජන්‍යාරෙඃ ප්‍රථමෙන ත්වයා'රිණා.

---

**උපජාපඃ ආශු, නාශ්, දීපයති,** යනු මෙහි ක්‍රි-සි. දීපයති, යනු, වර්ත- ලට්සි, දීප්-දීප්තෞ, ධාතුවෙන් තිප්, ප්‍රත්‍යයසි **උපමාලංකාරයි**

100. වෘහත්සහායඃ, මහත් යහලුවන් ඇත්තේ; ක්ෂෝදීයාන් අපි, ඉතා කුඩාවූයේත්; කාර්‍යාන්තං, කාර්යාගෙ පරතෙරට; ගච්ඡති, පැමිණෙයි; (ඒ එසේමැයි) නගාපගා, ගිරිනදීතොම හෙවත් පර්වත යෙන් ගලාබස්නා ගඞ්ගාතොම; මහානද්‍යා, ගඞ්ගාදිමහානදිය හා; සංභූය, සඞ්ගතව හෙවත් එකතුව; අම්භොනිධිං, මහා සාගරයට; අභ්‍යෙති, එලඹෙයි හෙවත් පැමිණෙයි.

**වෘහත්සහායඃ කාර්‍යාන්තං ගච්ඡති.** යනුද **නගාපගා අම්භොනිධිං අභ්‍යෙති** යනුද මෙහි ක්‍රි- සි. ගච්ඡති, යනුද අභ්‍යෙති, යනුද වර්ත ලට්-සි. ගම්ඝ, ගතෞ අභිපූර්ව ඉණ් ගතෞ ධාතූන් කෙරෙන් තිප්, ප්‍රත්‍යයසි, (වෘහන්තඃ සහායාඃ යස්‍යස = කාර්‍යස්‍ය අන්තඃ-(තම්) මහතීචාසෞ නදීචෙති= (තයා) අපාම්සමූහඃ අපම් 'තස්‍යසමූහඃ' යනු වෙන් අණ් ප්‍රත්‍යයසි නගාත් (නිර්ගතා) ආපගා නගාපගා යනු නිර්වච නයි **අර්ථාන්තරන්‍යාසාලංකාරයි.**

101. තස්‍ය, ඒ ශිශුපාලයාට; මිත්‍රාණි, මිත්‍රවූ; යෙචනෘපාඃ, යම් නරපතීහු වෙද්ද; තෙ, ඔබට; අමිත්‍රාඃ, සතුරුවූ; යෙච, යම් මහීපාල යෝත් වෙද්ද; තෙ උභයෙ, ඒ දෙකොටසම; ත්වයා, ඔබ විසින්; අභියුක්තං, අභියෝග කරණලද හෙවත් අභිගමනය කරණලද; එනං, ඒ ශිශුපාලයාකරා; ගන්තාරඃ යන්නාහුය; අතඃපරෙ, ඒ දෙකොට සින්ම අන්‍යයෝ හෙවත් තුඹගේ මිත්‍රයෝද ඔහුගේ අමිත්‍රයෝද; ත්වාම්, ඔබකරා; (ගන්තාරඃ,) පැමිණෙන්නාහුය.

**උභයෙ නෘපාඃ එනම් ගන්තාරඃ,** යනුද **අතඃපරෙ ත්වාම් ගන්තාරඃ,** යනුද මෙහි ක්‍රි-සි. ගන්තාරඃ, යනු ශ්වස්තන, ලුට් සි ගම්ධාතුහු කෙරෙන් කර්තෘසාධනයෙහි තාරස්, ප්‍රත්‍යයසි **ස්වභාවොක්තියි.**

102. ඉත්‍ථං, මෙසේ හෙවත් උක්තප්‍රකාරයෙන්; මඛවිඝ්නාය, යාගෝපද්‍රව පිණිස (යාග නශනු පිණිස යි සේයි); සකලම්රාජකං, සියලු රජසමූහයා; උත්ථාප්‍ය, නැගිට්ටුවා හෙවත් කලඹවා; අජන්‍ය

103. සංභාව්‍ය ත්වාමතිභාරක්‍ෂමස්කන්ධං ස බාන්ධවඃ
සහායමධ්වරධුරං ධර්මරාජෝ විවක්‍ෂතෙ.

104. මහාත්මානෝ'නුගෘහ්ණන්ති භජමානාන් රිපූන'පි
සපත්නීඃ ප්‍රාපයන්ත්‍යබ්ධිං සින්ධවො නගනිම්නගාඃ.

---

රෙඃ, නොහටගත් සතුරන් ඇති යුධිෂ්ඨිර රජුහට; ත්වයා, ඔබවිසින්; ප්‍රථමෙන අරිණා ජතම්, පළමු සතුරුවීමයි හෙවත් ප්‍රථමෙන අරිණා ත්වයා, පළමු සතුරුවූ ඔබවිසින්; ජතම්, වීමයි; හනන, හේ බේදජනකයි.

**ත්වයා ඉත්ථම් රාජකං උත්ථාප්‍ය, ප්‍රථමෙන අරිණා ජතම් (අභූත්)** යනු මෙහි ක්‍රි- යි. අභූත්, යනු- භූ, ධාතුවෙන් භූතාර්ථ ලුඞ් දිප්, ප්‍රත්‍යයි මෙහි ජතම් යනු- ජනි, ප්‍රාදුර්භාවෙ, යන්නහු කෙරෙන් භාවයෙහි ක්ත, ප්‍රත්‍යයි එහෙයින්ම නපුංසක ලිඞ්ගයි **ස්වභාවොක්ති අලංකාරයි.**

103. බාන්ධවඃ, බන්ධුවූ හෙවත් ඥතිවූ; සඃ ධර්මරාජඃ, ඒ ධර්මරාජ තෙම; අතිභාරක්‍ෂමස්කන්ධං, ඉතා බරඋසුලන්ට පොහොනා ස්කන්ධය හෙවත් කරඇති; ත්වාම්, යුෂ්මද්හු; සහායම්, සංභාව්‍ය සහායකොට සලකාගෙණ; අධ්වරධුරං, යාගධුරය; විවක්‍ෂතෙ, උසුලන්ට කැමැති වෙයි.

**සඃ ධර්මරාජඃ අධ්වරධුරං විවක්‍ෂතෙ** යනු මෙහි ක්‍රි- යි. විවක්‍ෂතෙ, යනු, වොඪුංඉච්ඡතීති යන අර්ථයෙහි වර්ත- ලට්යි, වහ්, ප්‍රාපනෙ ධාතුවෙන් තෙ, ප්‍රත්‍යයි අති. අධිකඃභාරඃ අතිභාරඃ අතිභාරස්‍යක්‍ෂමඃ ස්කන්ධො යස්‍යසඃ=(තම්) අධ්වරස්‍ය ධූඃ= (තාම්) ධර්මශ්චාසෞ රාජා චෙති= ධර්මෙණ යුක්තො රාජෙතිවා ධර්මරාජඃ යනු සමාසයි **ස්වභාවොක්ති අලංකාරයි.**

104. මහාත්මානඃ, මහාත්මන්හු තුමූ හෙවත් නිග්‍රහානුග්‍රහ දෙක්හි සමර්ථයෝ තුමූ; භජමානාන්, තමන් සෙවිනාවූ හෙවත් (තමන්වෙත) සරණගතවූ; රිපූන්අපි, සතුරන්ටත්; අනුගෘහ්ණන්ති අනුකම්පා කෙරෙත්; (ඥතීන්ට කියනුම කවරේදැයි සේයි) සින්ධවඃ, මහානදීහු; සපත්නීඃ, සමානපති ඇති හෙවත් සමුද්‍රසඞ්ඛ්‍යාත එකම ස්වාමියා ඇති; නගනිම්නගාඃ, ගිරිනදීන් හෙවත් පර්වතයෙන් ගලා බස්නා ගඞ්ගාවන්; අබ්ධිං, (තත් ස්වාමීවූ) මහසයුරකරා; ප්‍රාපයන්ති, පමුණුවත්.

**මහාත්මානඃ රිපූන්අපි අනුගෘහ්ණන්ති,** යනුද **සින්ධවඃ නගනිම්නගාඃ අබ්ධිං ප්‍රාපයන්ති,** යනුද මෙහි ක්‍රි- යි. අනුගෘහ්ණන්ති, යනුද ප්‍රාපයන්ති, යනුද වර්ත- ලට්හුයි, අනුපූර්ව ග්‍රහ, උපාදානෙ,

105. චිරාද'පි බලාත්කාරො බලිනඃ සිඬයෙ'රිෂු
ඡන්දානුවෘත්ති දුඃසාධ්‍යාඃ සුහෘදො විමනීකෘතාඃ.

106. මන්‍යසෙ 'රිවධඃ ශ්‍රෙයාන් ප්‍රීතයෙ නාකිනා'මිති
පුරොඩාශභුජාමිෂ්ටමිෂ්ටං කර්තුමලංතරාම්.

---

ප්‍ර, අප, පූර්ව යා, ප්‍රාපනෙ, ධාතුන් කෙරෙන් අනති ප්‍රත්‍යයයි, (සමානඃ එකඃපතිඃ යාසාම් තාඃ සපත්නිඃ නිත්‍යම් සපත්න්‍යාදිෂු' යනුවෙන් ඞීප් ප්‍රත්‍යය හා නකාරාදේශයි නගෙභ්‍යඃ (නිගීතාඃ) නිම්නගාඃ= යනු නිර්වචනයි **අර්ථාන්තරන්‍යාසාලංකාරයි.**

105. බලිනඃ අපි, බලවන්තයාගේද; අරිෂු, සතුරන් විෂයෙහි බලාත්කාරඃ, බලාත්කාරය හෙවත් බලකිරීම (දඬුවම යයි සේයි), චිරාත්අපි, බොහෝකලකිනුදු; සිඬයෙ, සිඬිය පිණිස වෙයි හෙවත් වසංවදභාව සිඬිය පිණිස වෙයි; (එනම් තමන් යටතෙහි පැවත්ම සිඬවීමයි) විමනීකෘතාඃ, විමනස් ඇත්තවුන් කරණලද හෙවත් විරුඬ සිත්ඇතිබවට පමුණුවනලද; සුහෘදඃ, යහපත් සිත්ඇත්තෝ හෙවත් මිතුරෝ; ඡන්දානුවෘත්ති, අභිප්‍රායට හෙවත් කැමැත්තටඅනුව පැවතීමෙනුත්; දුඃසාධ්‍යාඃ, දුකසේ සිදුකටයුක්තාහු වෙති.

**බලිනඃ බලාත්කාරඃ අරිෂු සිඬයෙ භවති,** යනුද **සුහෘදඃ ඡන්දානුවෘත්ති දුඃසාධ්‍යාඃ භවන්ති,** යනුද මෙහි ක්‍රි- යි. භවති, යනුද භවන්ති, යනුද අධ්‍යා- වර්ත- ලට්යි, භූ, සත්තායාම් ධාතුහු කෙරෙන්, තිප් ප්‍රත්‍යය හා අන්ති ප්‍රත්‍යයයි, අවිමනසො විමනසඃ සම්පාද්‍යමානාඃ (කෘතා)ඉති, විමනීකෘතාඃ ශොභනං හෘද් යෙෂාම්තෙ සුහෘදඃ සුහෘද් දුර්හෘදෞ මිත්‍රාමිත්‍රයොඃ' යනුවෙන්- නිපාතයි ඡන්දස්‍ය අනුවෘත්තිඃ= ඡන්දානුවෘත්ත්‍යා දුඃසාධ්‍යාඃ= යනු නිර්වචනයි **ස්වභාවොක්ති අලංකාරයි.**

106. නාකිනාම්, නාකයෙහි නිවාසීන්ගේ හෙවත් දෙවියන්ගේ; ප්‍රීතයෙ, ප්‍රීතිය පිණිස; අරිවධඃ, සතුරන් නැසීම; ශ්‍රෙයාන් ඉති, අතිශයින් ප්‍රශස්තවේ යයි; මන්‍යසෙ, ඔබහඟනෙහිනම්; පුරොඩාශභුජං, හවිර්භුක්වූවන්ට හෙවත් දෙවියන්ට; ඉෂ්ටංකර්තුං අභිමතකරන්ට; ඉෂ්ටං, ඉෂ්ටිය හෙවත් යාගය; අලංතරාම්, අතිශයින් ප්‍රමාණවෙයි.

**තවම් අරිවධඃ ශ්‍රෙයාන් ඉති මන්‍යසෙ** යනුද **ඉෂ්ටංකර්තුං ඉෂ්ටම් අලංතරාම් භවති** යනුද මෙහි ක්‍රි- යි. මන්‍යසෙ, යනුද භවති, යනුද වර්ත- ලට්යි, මන, ඥානෙ භූ, සත්තායාම් ධාතුහුයි, සෙ, ප්‍රත්‍යය, හා තිප්, ප්‍රත්‍යයයි අරීණාම් වධඃ අරිවධඃ පුරොදශ්‍යත ඉති පුරොඩාඃ පුරොඩාශම් භුඤ්ජතෙ ඉති පුරොඩාශභුජ් (තෙෂාම්)= අතිශයෙනඅලම් (ප්‍රමාණමිති) අලංතරාම් යනු නිර්වචනයි **ස්වභාවොක්ති අලංකාරයි**

107\. අමෘතං නාම යත් සන්තො මන්ත්‍රජිහ්වෙෂු ජුහ්වති
ශොභෛව මන්දරක්ෂුබ්ධක්ෂුභිතාම්භොධිවර්ණිතා.

108\. සහිෂ්‍යෙ ශතමාගාංසි සූනොඃසන ඉති යස්ත්වයා
ප්‍රතීක්ෂ්‍යංතත්ප්‍රතීක්ෂ්‍යායෛ පිතෘෂ්වස්‍රෙ ප්‍රතිශෘතම්.

109\. තීක්ෂ්ණො නාරුංතුද බුද්ධිඃ කර්ම ශාන්තං ප්‍රතාපවත්
නොපතාපි මනඃ සොෂ්ම වාගෙකා වාග්මිනඃ සතඃ.

---

107\. අමෘතංනාම, අමාවනම්; සන්තඃ, සජ්ජනයෝතුමූ හෙවත් පණ්ඩිතයෝ; මන්ත්‍රජිහ්වෙෂු, මන්ත්‍ර ජිහ්වාකොට ඇති වහ්නීන් කෙරෙහි; යත්, හෝමසෘතාදි යමක්; ජුහ්වති, පුදත්ද; (එයමැයි) මන්දරක්ෂුබ්ධ, මන්දරපර්‍වත නමැති මථනදණ්ඩන්; ක්ෂුභිත, කලඹන ලද; අම්භොධි, මහසයුර සම්බන්ධිවූ; වර්ණිතා, වර්ණිතා නොමෝ; ශොභාඑව, ශොභාවක්ම වන්නීය (අලංකාරයෙක් මැයි සේයි)

**සන්තඃ මන්ත්‍රජිහ්වෙෂු යත් ජුහ්වති**, යනුද **මන්දර= වර්ණිතා ශොභාඑව භවති**, යනුද– මෙහි ක්‍රි-යි ජුහ්වති, යනුද භවති, යනුද වතී- ලට්- යි හු, දනාදනගවයපදනෙෂු හුසතන්‍යාම් ධාතුහුයි අනති, ප්‍රත්‍යය හා තිප්, ප්‍රත්‍යයි මන්දරඃ එවක්ෂුබ්ධඃ= මන්දරක්ෂුබ්ධෙන ක්ෂුභිතඃ=මන්දරක්ෂුබ්ධ ක්ෂුභිතශ්චාසාවම්භොධිශ්චෙති=(තස්‍ය)වර්ණිතා =යනු විග්‍රහයි **කාව්‍යලිඞ්ගා ලංකාරයි.**

108\. ප්‍රතීක්ෂ්‍යායෛ, පූජ්‍යවූ; පිතෘෂ්වස්‍රෙ, පියාගේ සොහොවුරිට; තෙ සූනොඃ, ඔබගේ පුත්‍රයා සම්බන්ධිවූ; සතමාගාංසි, සිය ගණන් අපරාධයන්; සහිෂ්‍යෙ ඉති, ඉවසන්නෙමියි; යත්, යමක්; ත්වයා, ඔබ විසින්; ප්‍රතිශෘතම්, ප්‍රතිඥ කරණලද්දේද; තත්, ඒ ප්‍රතිඥව; ප්‍රතීක්ෂ්‍යං, ප්‍රතිපාලනය කටයුතුයි හෙවත් රැකගත යුතුයි; මහත්දෙෂසමරණයෙනි, යනු භාවයි.

**අහම් සතමාගාංසි සහිෂ්‍යෙ**, යනුද **ත්වයා යත්ප්‍රතිශෘතම්, යනුද ත්වයා තත් ප්‍රතීක්ෂ්‍යම් භවති**, යනු මෙහි ක්‍රි- යි. සහිෂ්‍යෙ, යනු– වතී– ලට්– යි, සහ, මර්ෂණෙ, ධාතුවෙන්, එ, ප්‍රත්‍යයි. ආසිත්, යනු– අධ්‍යාහෘත භූතාමිලුඞ් යි, අස්භුවිධාතුයි භවති, යනු– අධ්‍යා– වතී– ලට්– යි භූ, සතන්‍යාම් ධාතුයි **ස්වභාවොක්ති අලංකාරයි.**

109\. සතඃ, සත්පුරුෂයාගෙ; බුද්ධිඃ, බුද්ධිතොම; තීක්ෂ්ණා, තියුණුවන්නීයයි දූතගණුව; අරුංතුද න, (එසේවුවද) මර්මච්ඡෙදකරන්නී නොවෙයි; කර්ම, (ඔහුගෙ) ව්‍යාපාරය තෙම; ප්‍රතාපවත්, තෙද ඇත්තේ වෙයි හෙවත් (සතුරන්ට) බියදෙන්නේ වෙයි; ශාන්තං, එසේ

110. ස්වයං කෘතප්‍රසාදස්‍ය තස්‍යා'හ්නො භානුමානි'ව
සමයාවධිම'ප්‍රාප්‍ය නාන්තායාලං භවාන'පි.

111. කෘත්වා කෘත්‍යවිදස්තීර්ථෙ'ෂ්වන්තඃ ප්‍රණිධයඃ පදම්
විදංකුර්වන්තු මහතස්තලං විද්විෂදම්භසඃ.

---

නුමුත් සංයිඳුනේවෙයි; මතඃ, චින්තයතෙම; සොෂ්ම, අභිමානොෂ්ණ සහිතයි; නළපතාපි, අගන්‍යාදියමෙන් අනුත්තවන්නේ නොවෙයි; වාග්මිනඃ, වක්තෘහුගේ; වාක්, බස; එකා, ඒකරූපවන්නිය හෙවත් වාග්මිතෙම සැබවක්කියයි (සේයි.)

**සතඃ බුද්ධිඃ තීක්ෂ්ණා, ස්‍යාත්,** යනුද බුධිඃ **නාරූං තුදස්‍යාත්,** යනුද **කශී, ප්‍රතාපවත්, ස්‍යාත්** යනුදයි- මේ ආදි නයින් එකක් 'පාසා ක්‍රියාකාරක සම්බන්ධය යෙදිය යුතුයි. මෙහි ප්‍රකෘතවූ වාක්‍යහු ගේද අප්‍රකෘතවූ බුඩිකාශීචින්තයන්ගේද සමාන ධර්මයෙන් උපම, භාවය ගම්‍යමානහෙයින් **දීපකාලංකාරයි.**

'ප්‍රකෘතා' ප්‍රකෘතානාං ච සාමෙ‍්‍යති තුල්‍යධර්මතඃ
ඖපම්‍යං ගම්‍යතෙ යත්‍ර දීපකං තන්නිගද්‍යතෙ'

(යනු තල්ලක්ෂණයි.)

110. අහ්නඃ, දිනයට හෙවත් දවලට; භානුමාන්ඉව, සූර්‍ය්‍යයා මෙන්; ස්වයංකෘතප්‍රසාදස්‍ය, තමා විසින් කරණලද අනුග්‍රහඇති; තස්‍ය, ඒ ශිශුපාලයාගේ; අන්තාය, අන්තය පිණිස; (මරණය පිණිස යී සෙයි) සමයාවධිං, නියතකාලාවසානයට; අප්‍රාප්‍ය, නොපැමිණ; භවාන්අපි, යුෂ්මද් තෙමේද; නඅලං, සමර්ථනොවෙයි.

**භවාන්අපි සමයාවධිං අප්‍රාප්‍ය තස්‍ය,අන්තාය නාලං,ස්‍යාත්,** යනු මෙහි ක්‍රි- යි. ස්‍යාත් යනු, අධ්‍යා=විධිසංභාවන ලිඞ්යි, අස්,භුවි ධාතුවෙන් යාත්, ප්‍රත්‍යයි 'ස්වයංකෘතඃ ප්‍රසාදෙ' (නුග්‍රහඃ) (ප්‍රකාශශව) යස්‍යසඃ=(තස්‍ය) සමයස්‍යාවධිඃ සමයාවධිඃ **උපමාලංකාරයි**

111. කෘත්‍යවිදඃ, කටයුතු දන්නාවූ ද්‍යෙහෝ නොහොත් විධි දන්නාවූ; ප්‍රණිධයඃ, ගුප්චාරීහු හෙවත් ගුප්තඅදහස් ඇත්තාහු; තීර්ථෙෂු, තීර්ථසඞ්ඛ්‍යාත මන්ත්‍රාදි; අෂ්ටාදශ, විද්‍යාස්ථානයන්හී ද්‍යෙහෝ නොහොත් ජලාවතරණයන්හි; අන්තඃපදං, ස්ථානය ද්‍යෙහෝ නොහොත් ඇතුලතපානැබීම; කෘත්වා, කොට; මහතඃ, දුරවගාහ ත්වයෙන් මහත්වූ ද්‍යෙහෝ නොහොත් පූජ්‍යවූ; විද්විෂත්අම්භසඃ, සතුරුනමැති ජලයාගෙ; තලං, ස්වරූප සඞ්ඛ්‍යාත තලය ද්‍යෙහෝ නොහොත් ප්‍රමාණය; විදං, කුර්වන්තු, දැනගැණීම කෙරෙත්වා; (දැනගණීත්වා යි සේයි.)

112. අනුත්සූත්‍රපදන්‍යාසා සද්වෘත්තිඃ සන්නිබන්ධනා
ශබ්දවිද්‍යේව නො භාති රාජනීති’රපස්පශා.

---

**ක්‍රාතාවිදඃ විචිකීර්ෂන් අමිත්‍රඃ නාලං විද්‍රංකුචීනතු,** යනු මෙහි ක්‍රි-යි. විද්‍රාංකුචීනතු, යනු, ආශිඃ- ලොට්යි, කෘඤ්, කරණෙ ධාතු අනුප්‍රයොග විද්, ඥානෙ ධාතුවෙන් අනතු, ප්‍රත්‍යයි කෘත්‍යානි විදන්තීති කෘත්‍යවිදඃ ප්‍රණිධියන්තාඃ ඉති ප්‍රණිධයඃ විචිෂන් ශත්‍රෝරෙව අම්භො= (තස්‍ය) යනු නිර්වචනයි **ශ්ලිෂ්ට පරම්පරිත රූපකාලංකාරයි.**

112. අනුත්සූත්‍රපදන්‍යාසා, නීතිශාස්ත්‍ර විරුද්ධව එක්පාතැබීමක් වත් නැත්තාවූ; සද්වෘත්තිඃ, යථාර්ථ කල්පනා වශයෙන් ශොභනවූ භෘත්‍යාමාත්‍යාදීන් සම්බන්ධ ජීවිකා සංඛ්‍යාත වෘත්තිඇති හෙවත් යහපත් දිවිපැවතුම්ඇති; සන්නිබන්ධනා, යහපත්නිබන්ධන සංඛ්‍යාත පාරිතොෂික දානඇති; අපස්පශා, අපගතවූ චාරයන් හෙවත් දූරචාරඇති; රාජනීතිඃ, රාජනීතිතොම; (අනුත්සූත්‍ර පදන්‍යාසා) නොහරණලද සූත්‍රපදන්‍යාස ඇති හෙවත් සූත්‍රාක්ෂරවලින්ම අර්ථප්‍රතිපාදකන්‍යාසසංඛ්‍යාත එනම් මහා ග්‍රන්ථඇති; සද්වෘත්තිඃ, යහපත් කාශිකා සංඛ්‍යාත සූත්‍රව්‍යාඛ්‍යානඇති; සන්නිබන්ධනා, යාපත් නිබන්ධන සංඛ්‍යාත භාෂ්‍ය ග්‍රන්ථඇති; අපස්පශා, අවිද්‍යමානවූ පස්පශ සංඛ්‍යාත උපොද්ඝාත හෙවත් ශාස්ත්‍රාරම්භඇති; ශබ්දවිද්‍යාඉව, ශබ්දශාස්ත්‍ර විද්‍යාවමෙන් හෙවත් ව්‍යාකරණ ශාස්ත්‍රයමෙන්; නඃ, අපට; භාති, වැටහෙයි.

**රාජනීතිඃ නඃ, භාති,** යනු මෙහි ක්‍රි- යි. භාති යනු වර්ත- ලට්යි, භා, දීප්තෞ (ප්‍රතිභානෙ) ධාතුවෙන්, තිප් ප්‍රත්‍යයි නොහොත් භා බුද්ධෞ ධාතුයි, උත්සූත්‍රඃ (උච්ඡාස්ත්‍රී නීතිශාස්ත්‍ර විරුද්ධඃ) පදන්‍යාසඃ (එකපදප්‍රක්ෂෙපොපි) උත්සූත්‍රපදන්‍යාසඃ, ස නාස්ති යස්‍යාම් සා= අන්‍යත්‍රානුත්සූත්‍ර පදන්‍යාසා අනුත්සෘෂ්ට සූත්‍රාක්ෂරඃ ඉෂ්ටියුපසංඛ්‍යානෛරපෙක්ෂ්‍යන සූත්‍රාක්ෂරෛරෙව සර්වාර්ථප්‍රතිපාදකො න්‍යාසො වෘත්තව්‍යාඛ්‍යාන ග්‍රන්ථවිශෙෂො යස්‍යාම් සා= ( යථාර්ථකල්පනයා ) ශොභනා වෘත්තිඃ ( භෘත්‍යා මාත්‍යා දීනාමාජීවිකා ) යස්‍යාම් සා සද්වෘත්තිඃ අන්‍යත්‍ර සතිවෘත්තිඃ කාශිකාඛ්‍ය සූත්‍රව්‍යාඛ්‍යාන ග්‍රන්ථවිශෙෂො යස්‍යාම් සා= සන්ති නිබන්ධනානි (අනුජීව්‍යාදීනාම්) ක්‍රියාවසානෙෂු දාතව්‍යානි ගොහිරණ්‍යාදි ශාශ්වත පාරිතොෂිකදානානි යස්‍යාම් සා සන්නිබන්ධනා (අන්‍යත්‍ර සන්නිබන්ධනං) භාෂ්‍යග්‍රන්ථො යස්‍යාම් සා= අපගතඃ පස්ශඃ (චාරො) යස්‍යාඃ සා අපස්පශා අන්‍යත්‍ර අවිද්‍යමානඃ පස්පශඃ ශාස්ත්‍රාරම්භ සමර්ථකඃ උපොද්ඝාත සංදර්භග්‍රන්ථො යස්‍යාම් සා, අපස්පශා; ශබ්දනාම් ශබ්දඥුවා ( ප්‍රවෘත්තා ) විද්‍යා ශබ්දවිද්‍යා, රාඥම් නීතිඃ රාජනීතිඃ යනු ටීකාගත සමාසක්‍රමයි **ශ්ලෙෂොපමාසංකරාලංකාරයි.**

113. අඥාතදොෂෛ'ර්දොෂඥෛ' රුද්දූෂ්‍යොභයවෙතනෛඃ
භෙද්‍යාඃ ශත්‍රො'රභිව්‍යක්තශාසනෛඃ සාමවායිකාඃ.

114. උපෙයිවාංසි කර්තාරඃ පුරීමා'ජිතශාත්‍රවීම්
රාජන්‍යකාන්‍යුපායඥෛ 'රෙකාර්ථානි චරෛ'ස්තව.

113. අඥාතදොෂෛඃ, අනුන් විසින් නොදන්නාලද දොස්ඇති ද්‍රෝහ නොහොත් තමන් විසින් දන්නාලද අනුන් දොස්ඇති; අභිව්‍යක්තශාසනෛඃ, ප්‍රකටිතවූකූටලිඛිතඇති; උභයවෙතනෛඃ, භෙද්‍යයා කෙරෙහිද ස්වාමියා කෙරෙහිදූයි යන දෙපසෙහිම වෙතන ඇතියන් විසින් හෙවත් දෙපසෙහි ජීවිකාවෘත්තිය ගන්නාවූ චර පුරුෂයන් විසින්; ශත්‍රොඃ, සතුරාගෙ; සාමවායිකාඃ, සමවායෙහි වූවෝ හෙවත් සච්වාදීහු (සමූහයෙහි අනතගීතවූවාහුයි සේසි) උද්දූෂ්‍ය, උසස්ලෙස දූෂණයකොට; භෙද්‍යාඃ, බිඳියයුක්තාහුවෙති.

**උභයවෙතනෛඃ (චරෛඃ) ශත්‍රොඃ සාමවායිකාඃ භෙද්‍යාඃ ස්‍යුඃ.** යනු මෙහි ක්‍රි- යී. ස්‍යුඃ යනු, අධ්‍යා- විධිසං- ලිඞ් යි, අස්, භුවි ධාතුවෙන් යුස්, ප්‍රත්‍යයි භෙද්‍යාඃ යනු භිදිර්, විදාරණෙ ධාතුහුකෙරෙන් කර්මයෙහි ණ්‍යප්, ප්‍රත්‍යයි- න ඥාතාඃඅඥාතාඃ අඥාතාඃ දොෂාඃ යෙෂාං තෙ=(තෛඃ) දොෂාන් (විදනති) ජානන්තීති දොෂඥාඃ (තෛඃ) අභිව්‍යක්තානි (ප්‍රකටිතානි) ශාසනානි (තදමාත්‍යාදීන් විශ්වාසකාරිණී කූටලිඛිතානි) යෙෂාම්තෙ= (තෛඃ) සමවායෙභවාඃ සාමවායිකාඃ යනු විග්‍රහයි- **ස්වභාවොක්ති අලංකාරයි.**

114. උපායඥෛඃ, උපායදන්නාවූ; තව, ඔබගෙ; චරෛඃ, ගුප්තචරයන් විසින් හෙවත් ගුප්තාචාර ඇත්තාවූ අනුචරයන් විසින්; එකාර්ථානි, ඔබ හා සමාන ප්‍රයෝජනඇති; රාජන්‍යකානි, ක්ෂත්‍රියයන්ගේ සමූහයෝ හෙවත් රාජසමූහයෝ; ආජිතශාත්‍රවීම්, හටගත් ශත්‍රුසම්බන්ධ ඇත්තාහු; පුරීම්, ඉන්ද්‍රප්‍රස්ථපුරියට හෙවත් දිල්ලිනගරයට; උපෙයිවාංසි, පැමිණියාහු; කර්තාරඃ, කර්තෘවරයන් කරණුලබන්නාහුය හෙවත් එහි එකතුවිය යුක්තාහුය.

**චරෛඃ රාජන්‍යකානි පුරීම් උපෙයිවාංසිකර්තාරඃ,** යනු මෙහි ක්‍රි- යි. කර්තාරඃ යනු, ශ්වස්තන කර්මකාරක ලුට්යි- ඩුකෘඤ් කරණෙ ධාතුවෙන්, තාරස්, ප්‍රත්‍යයි ආජිතශ්චාසෞ ශත්‍රශ්චෙති= ආජිතශත්‍රොයම්ති- (තාම්) රාජන්‍යානාම් සමූහාඃ රාජන්‍යකානි උපායං ජානන්ති (විදන්තීති) උපායඥාඃ (තෛඃ) එකඃඅර්ථඃයෙෂාම් තානි= චරන්තීති චරාඃ (තෛඃ) යනු විග්‍රහයි **ස්වභාවොක්ති අලංකාරයි.**

115. සවිශෙෂං සුතෙ පාණ්ඩෝඃ කීර්තිං භවති තන්වති
වෛරසිතාරස්තරලාඃ ස්වයම් මත්සරිණඃ පරෙ.

116. යෙ ඉහාත්මවිදෙ විපක්ෂමධ්‍යෙ
සහ සංවෘද්ධියුජෝ'පි භූභුජඃ ස්‍යුඃ
බලිපුෂ්ටකුලාදිවාන්‍යපුෂ්ටෛඃ
පෘථගස්මාදචිරෙණ භාවිතා තෛඃ.

---

115. පාණ්ඩෝඃසුතෙ, පාණ්ඩුරාජපුත්‍රයා හෙවත් යුධිෂ්ඨිරයා, භවති, යුෂ්මද්හු කෙරෙහි; සවිශෙෂං, විශෙෂ සහිතව; කීර්තිං, කීර්තිය; තන්වති, ප්‍රකාශකරණ කල්හි; තරලාඃ, චපලවූ; මත්සරිණඃ, මෙෂඇත්තාවූ; පරෙ, ශත්‍රූහු; ස්වයම්, තුමූම; වෛරසිතාරඃ, වෛර කරන්නාහුය.

**පරෙ, මත්සරිණඃ වෛරසිතාරඃ,** යනු මෙහි ක්‍රි-යි. වෛරසිතාරඃ, යනු ශ්වස්තනලුට්යි, නාමධාතු ක්‍රියායි, තාරස් ප්‍රත්‍යයි, ශබ්ද වෛරකලහ, යනාදී සූත්‍රයෙන්, වෛර, යන්නහු කෙරෙන් ක්‍යඞ් ප්‍රත්‍යයි, ඔහු කෙරෙන් කර්තෘකාරක යෙහි ශ්වස්තන ලුට්- තාරස් ප්‍රත්‍යයි, **ස්වභාවොක්ති අලංකාරයි**.

116. යෙ, යම්කෙනෙක්; ඉහ, මෙහි; විපක්ෂමධ්‍යෙ, සතුරන් මැද; සහසංවෘද්ධියුජඃඅපි, වෛද්‍යයා සමග හෙවත් ශිශුපාලයා එක්ව ඓශ්වර්‍ය්‍යට පැමිණියාහු වෙද්ද; යෙ,භූභුජඃ, යම් මහීපාලයෝතුමූ; ආත්මවිදඃ, ආත්මඥයෝ හෙවත් තමන් දන්නාහු; ස්‍යුඃ, වන්නාහුද (ස්වාභිජන සංඛ්‍යාත ආත්මරූප දන්නාහු වෙත් දැයි සේයි) තෛඃ ඔවුන් විසින් හෙවත් ඒරජුන් විසින්; බලිපුෂ්ටකුලාත්, කාකකුල යෙන්; අන්‍යපුෂ්ටෛඃඉව, පරපුටුවන් විසින් වෙන්වීමමෙන්; අචි රෙණ, නොබෝකලකින්; අස්මාත්, මේ විපක්ෂසමූහයෙන්; පෘථක් භාවිතා, වෙන්වීමයි.

**යෙ ඉහ සහසංවෘද්ධයුජඃ අපි. ස්‍යුඃ,** යනුද **යෙ, භූභුජඃ විදඃ, ස්‍යුඃ,** යනුද **තෛඃ අස්මාත්පෘථක්භාවිතා,** යනුද මෙහි ක්‍රි-යි. ස්‍යුඃ යනු විධිසං- ලිඞ්යි, අස්භුවි ධාතුවෙන්, යුස්, ප්‍රත්‍යයි, භාවිතා යනු භාවයෙහි ශ්වස්තන ලුට්යි. භූ, සත්තායාම් ධාතුයි- ඖපච්ඡන්දසික නම් වෘත්තයි මහාකාව්‍යයන්හි සර්ගපරිසමාප්තියෙහි වෙනස් වෘත්ත වලින් දක්වියයුතු හෙයිනි. එම කිහ:—

සර්ගෝ'රනතිවිස්තීර්ණෛඃ ශ්‍රව්‍යවෘත්තෛඃ සුසන්ධිභිඃ
සර්වත්‍ර භින්නවෘත්තාන්තෛ 'රුපෙතං ලොකරඤ්ජකම්, යනුයි
**උපමාමිශ්‍ර ස්වභාවොක්ති අලංකාරයි.**

117. සහජචාපලදොෂසමුඩතශ්චලිතදුර්බලපක්ෂපරිග්‍රහඃ
තව දුරසදවිසීවිභාවසෞ ශලභතාං ලභතාම,සුභෘද්ගණඃ

118. ඉතිවිශකලිතාර්ථා 'මෞඩවීං චාවමේතා
මනුගතනයමාර්ගා 'මර්ගලාං දුර්නයස්‍ය
ජනිතමුදමුදස්ථා'දුච්චකෛර්'රුච්ජෛතොරාඃ
ස්ථලතිය තතිශ්‍රීකෘෂ්ණශ්‍රීශෘතාං ශුශ්‍රූවාන්සඃ

**ඉති ශ්‍රීමාඝකෘ ෆතෞ ශිශුපාලවධෙ, මහාකාව්‍යෙ,**
**ශ්‍රෘංඛක මන්ත්‍රවර්ණනං, නාම විංශඃ සර්ගඃ.**

---

117. සහජ, ස්වාභාවිකවූ; චාපල, දුර්නීතත්වසංඛ්‍යාතවූ දෝෂෙ-
තොහොත් තමාකෙරෙහි පිහිටිබැවි සංඛ්‍යාතවූ; දොෂසමුඩත, දෝෂ
යෙන් ඉතා උඩඟුවූ; චලිත, චඤ්චලවූ හෙවත් අස්ථිරවූ; දුර්බල, දුබ
ලවූ; පක්ෂපරිග්‍රහඃ, පක්ෂය හාත්පසින් ගැනීම් සංඛ්‍යාත සහායයන්
ඇති දේහෝ තොහොත් පියාපත්ඇති; අසුහෘද්ගණඃ, ශත්‍රුසමූහ
තෙම; තව, ඔබගේ; දුරාසද, මැඩලියනොහෙන්නාවූ හෙවත්
නොමැඩපැවැත්වියහැකිවූ; විසීවිභාවරසෞ, තේජස් නමැති ගින්
නෙහි; සලභතාම්, පලඟැටිබව; ලභතාම්, ලබාවා.

**අසුහෘද්ගණඃ තවදුරාසද විසීවිභාවසෞ සලභතාම් ලභතාම්,**
යනු මෙහි ක්‍රි- යි. ලභතාම්, යනු ආශීඃප්‍රේරණ ලොට් යි, ලභ,ලාභෙ
ධාතුවෙන්, තාම්, ප්‍රත්‍යයි සහජං (ස්වාභාවිකං) චාපලං (දුර්නීතත්වං
අනවස්ථිතත්වංච) සහජචාපලං තමෙවදොෂඃ සහජ=දොෂඃ තෙන
සමුඩතඃ (දෘප්තඃ) පක්ෂඃ සහායොග=රුච්ච, 'චලිතො, (ස්ථිරො) දුර්බල
පක්ෂපරිග්‍රහො යස්‍ය සඃ= දුරාසදංචතත් විසීයොඩ්ති= දුරාසදවිසීමෙව
විභාවසුඃ=(තස්මින්) සලභස්‍යභාවඃ සලභතා (තාම්-) නසුහෘදඃ අසු
හෘදඃ අසුහෘදම්, ගණඃ= යනු විග්‍රහයි.

මෙහි පූර්වාර්ධයෙහි- 'ඔජෝසමාස බාහුල්‍යම්' යනුවෙන් නිදර්ශිත
ඕජස් ගුණය දෘශ්‍යමානවෙයි, සමාස වාක්‍යයෙහි ඛ්‍රකැට්ඇතුලත පද
යන් විස්තරාර්ථයන් දැක්විමට නිදශිත කළහෙයින් සමාසයෙන්
වර්ජිතව්‍යබැව් සැලකිය යුතුයි. සමාස ක්‍රමයද ඉතා සැකෙවින්
මෙහි සන්දර්ශිතයි. යොග්‍යපරිද්දෙන් විමසා දතයුතුයි. **රූලකරයි.**
දෘතවිලම්බිත නම වෘත්තයි.

118. සඃ, ඒ ශ්‍රීකෘෂ්ණතෙම; ඉති, මෙසේ; විශකලිතාර්ථ, විවේච
නය කරණලද අර්ථඇති; අනුගතනයමාර්ගාම්, අනුගමනය කරණලද
නීතිමාර්ගඇති; දුර්නයස්‍ය අර්ගලාම්, බලභද්‍රාදීන් විසින් කියනලද දුර්
නීති වලක්වන්නාවූ; ජනිතමුදම්, ශ්‍රීකෘෂ්ණහට උපදවනලද සන්

තෝෂඇති; උත්ශ්‍රිතඃ, උන්නතවූ; උරඃස්ථල, වක්‍ෂස්ථලයෙහි; නියත නිෂණ්ණ, නියමව නිෂීදනයකළාවූ; ශ්‍රිශ්‍රිතාං, ශ්‍රීකාන්තාව විසින් අසනලද්දවූ; ඖඩවීං, උඩවරුමයා පිළිබඳවූ; එනාම්වාචම්, ඒ පෙරකී වචනය; ශුශ්‍රාවාන්, ඇසූයේ; උච්චෛඃ, උන්නතවූයේ; උදස්ථාත්, හුනස්නෙන් නැගුටුනේය.

**සඃ(හරිඃ)එනාම් වාචං ශුශ්‍රාවාන් උදස්ථාත්,** යනු මෙහි ක්‍රි–සි උදස්ථාත්, යනු උත්පූර්ව ෂ්ඨාගතිනිවෘත්තෞ ධාතුහුකෙරෙන් අනද්‍යතනාතීතාලඞ් සි, දිප් ප්‍රත්‍යයි විශකලිතඃ අරිඃ (විවේචිතාරිඃ) යස්‍යා සා= (තාම්) උඩවස්‍ය ඉයම්ඖඩවී (තාම්) අනුගතඃ නයමාර්ගඃ යස්‍යාඃසා= (තාම්–)දූර'සන්නයඃ දුර්නීයඃ දුෂ්ටුනයඃ වා, දුර්නීයඃ (නස්‍ය)ජනිතඃමුද්‍ යස්‍යාඃ සා (තාම්) උත්ශ්‍රිතංවතත් උරඃස්ථලඤ්චෙති= උච්ඡ්‍රිතොරඃ ස්ථලෙ නියතංනිෂණ්ණා= උච්ඡ්‍රිතොරඃ ස්ථලනියතනිෂණ්ණාච සා ශ්‍රියෙචති= නයාශ්‍රාතා=(තාම්) යනු සමාසක්‍රමයි. (**රූපකානුප්‍රාසාලංකාරයි.** මේ පද්‍යය මාලිනීවෘත්තයෙහි වේ.

'නනමයයයුතෙයං මාලිනී භොගිලොකෛං' යනු තල්ලක්‍ෂණ හෙසිති.

ශ්‍රීමාඝකෘතෞ, ශ්‍රීමත්මාඝ මහාකවිහු විසින් කරණලද; ශිශුපාලවධෙ, ශිශුපාලවධ නම්ඇති; ශ්‍ර්‍යඞ්කෙ, ශ්‍රීඅඞ්කවූ; මහාකාව්‍යෙ, මහා කාව්‍යයෙහි; මන්ත්‍රවර්ණනංනාම, මන්ත්‍රවර්ණනය නම්වූ; ද්විතීයඃ සර්ගඃ, දෙවන සර්ගයතෙම; ඉති, මෙතෙකින් සමාප්තයි.
ප්‍රථම සර්ගාන්තයෙහිදු මේ නයින්ම,

ඉති ශ්‍රීමාඝකෘතෞ ශිශුපාලවධෙ මහාකාව්‍යෙ ශ්‍ර්‍යඞ්කෙ කෘෂ්ණනාරද සංභාෂණං නාම ප්‍රථමඃ සර්ගඃ.

(ශ්‍රීමත්මාඝ මහාකවිහු විසින් කරණලද ශිශුපාලවධ නම්ඇති ශ්‍රීඅඞ්ක මහාකාව්‍යයෙහි ශ්‍රීකෘෂ්ණ ශ්‍රීනාරද සංභාෂණ නම්වූ ප්‍රථම සර්ගය මෙතෙකින් සමාප්තයි, යනුවෙන් වාක්‍යය හා පදාර්ථ ක්‍රමය යෙදිය යුතුබැව් සැලකිය යුතුයි.)

**ශිශුපාලවධනම් මහාකාව්‍යය**

පිළිබඳව ලියනලද

**පද්‍යවභාසිනී ව්‍යාඛ්‍යානයෙහි**

**ද්විතීයසර්ගය සමාප්තයි.**

---

# තෘතීයඃ සර්ගඃ.

1. කෞවෙරදිග්භාග'මපාස්‍ය මාර්ග
මාගස්ත්‍යමුෂ්ණාංශු 'රිවාවතීර්ණඃ
අපේතයුද්ධාභිනිවේශසෞම්‍යෝ
හරිර්හරිප්‍රස්ථ'මථප්‍රතස්ථේ.

2. ජගත්පවිත්‍රෛ'රපි තං න පාදෛඃ
ස්ප්‍රෂ්ටුං ජගත්පූජ්‍යමයුජ්‍යතාර්කඃ
යතෝ බෘහත්පාර්වණචන්ද්‍රචාරු
තස්‍යාතපත්‍රං විභරාංබභූවෙ.

---

(දූත් තෘතීය සර්ගය පටන්ගණු ලැබේ)

1. අථ, ඉක්බිතිව හෙවත් උද්ධවයාගේ වාක්‍යශ්‍රවණයට අනතුරුව; අපේත, අපගතවූ හෙවත් පහවූ; යුද්ධාභිනිවේශඃ, යුද්ධප්‍රවේශ ඇත්තාවූ හෙවත් සංසිඳුනු ක්‍රෝධ ඇති; සෞම්‍යඃ, එහෙයින්ම සෞම්‍යවූ හෙවත් ප්‍රසන්නවූ; කෞවෙරදිග්භාගම්, කුවේරයා සම්බන්ධවූ දිග්භාගය හෙවත් උතුරු දිශාභාගය; (උත්තරායන යයි සේයි) අපාස්‍ය, අත්හැර; ආගස්ත්‍යං, අගස්ති පුත්‍රයා සම්බන්ධවූ; මාර්ගං, මාර්ගයට හෙවත් දක්ෂිණායනයට; අවතීර්ණඃ, බැසගත්තාවූ හෙවත් පැමිණියාවූ; උෂ්ණාංශුඃඉව, සූර්යයාමෙන් සිටියාවූ; හරිඃ, ශ්‍රීකෘෂ්ණතෙම; හරිප්‍රස්ථම්, ඉන්ද්‍රප්‍රස්ථයට හෙවත් දිල්ලිනගරයට; ප්‍රතස්ථේ, යන්ට පිටත්වීය.

**හරිඃ කෞවෙරදිග්භාගම් අපාස්‍ය ඉන්ද්‍රප්‍රස්ථං ප්‍රතස්ථේ,** යනු, මෙහි ක්‍රි- සි. ප්‍රතස්ථේ, යනු පරොක්ෂලිට්යි ප්‍ර පූර්ව ෂ්ඨා,ගතිනිවෘත්තෞ ධාතුවෙන්, එ, ප්‍රත්‍යයි, (දිශඃභාගඃ දිග්භාගඃ කෞවෙරස්‍ය දිග්භාගං = (තම්) අගස්ත්‍යස්‍යායමිත්‍යා 'ගස්ත්‍යඃ= උෂ්ණා'අංශවඃ යස්‍යස = යුද්ධඅභිනිවේශං= අපේතො යුද්ධාභිනිවේශො යස්‍යසඃ= හරෙඃප්‍රස්ථඉවාති හරිප්‍රස්ථම් (තම්) යනු සමාසයි **උපමාලංකාරයි.**

මේ සර්ගයෙහි උපජාති වෘත්තයි, 'අනන්තරෝ' දීරිතලක්ෂ්මභාජෞ පාදෞ යදීයාවු' පජාතයස්තාඃ, යනු තල්ලක්ෂණ හෙයිනි ඉක්බිතිව ඔහුගෙ ප්‍රස්ථාන සංනාහය වර්ණනාකරමින් ආදියෙහි ඡත්‍රවර්ණනය කීයයි.

2. අර්කඃ, සූර්‍යතෙම; ජගත්පූජ්‍යම්, ලෝවැස්සා විසින් පිදිය යුතුවූ; තං, ඒ ශ්‍රීවිෂ්ණුහු; ජගත්පවිත්‍රෛඃඅපි, ලොව පිවිතුරු කරන්නාවූද; පාදෛඃ, රශ්මිවලින්; ස්ප්‍රෂ්ටුං, ස්පර්ශකරන්ට; නඅයුජ්‍යත, නුසුදුසුවීය; යතඃ, යම්හෙයකින්; තස්‍ය, ඒ ශ්‍රීවිෂ්ණුහුගෙ; බෘහත්, මහත්වූ; පාර්වණචන්ද්‍රචාරු, පුරුන් සම්බන්ධවූ චන්ද්‍රයාගෙ හෙවත් පූර්ණමාසී පුරුකෙහිවූ චන්ද්‍රයාමෙන් මනහරවූ; ආතපත්‍රං, ශ්වේත ච්ඡත්‍රය; බිභරාංබභූවෙ, ධරණලද්දේද එහෙයිනි.

3. මෘණාලසූත්‍රාමලමන්තරේණ
ස්ථිතශ්චලච්චාමරයෝර්ද්වයං සඃ
භෙජෙ 'භිතඃ පාතුකසිද්ධසින්ධෝ
රභූතපූර්වාං රුච'මම්බුරාශෙඃ.

4. චිත්‍රාභිරස්‍යෝ'පරි මෞලිභාජාං
භාභිර්මණීනා'මනණීයසීභිඃ
අනෙකධාතුච්ඡුරිතා'ශ්මරාශෙ
ර්ගෝවර්ධනස්‍යාකෘති'රන්වකාරි.

---

ඉක්බිති චාමරධාරණය කියයි.

**අන්‍යඃ පාදෙඃ නම්, ඡත්‍රච්ඡවිම් න, අයුජ්‍යත** යනුද **යෙන(සතඃ) තස්‍ය ආතපත්‍රම් බිභරාංබභූවෙ** යනුද මෙහි ක්‍රි- යි. න, අයුජ්‍යත යනු, අනද්‍යතනාතීතලඞ්යී- නඤ්පූර්ව යුජ්ර්, යොගෙ, ධාතුවෙන්, තන්, ප්‍රත්‍යයි, බිභරාම්බභූවෙ, යනු පරොක්‍ෂලිට්යි භෘ,ධාතුඅනුප්‍රයොග භෘඤ්, ධාරණපොෂණයොඃ ධාතුවෙන්, එ, ප්‍රත්‍යයි, භීහ්‍රීභෘහුවාම්, යනුවෙන් විකල්පයෙන් මෙහි ආම්ප්‍රත්‍යය, විය. **ස්වභාවොක්ති මිශ්‍රවූ රූලකරයි.**

3. මෘණාලසූත්‍රාමලං, නෙළුම්හුසෙයින් නිර්මලවූ; චලච්චාමරයොඃ, සැලෙන්නාවූ සෙමරදෙක්හි; අන්තරේණ, දෙකට අතරින් හෙවත් දෙකට මධ්‍යයෙහි; ස්ථිතඃ, සිටියාවූ; සඃ, ඒ කෘෂ්ණ තෙම; අභිතඃ, ( හාත්පස ) ඉදිරියෙහි හෙවත් දෙපසෙහි; පාතුක වැටෙන්නාවූ; සිද්ධසින්ධොඃ, අහස්ගඟඇති; අම්බුරාශෙඃ, සාගරයාගෙ අභූතපූර්වාං, නොවූවිරූ; රුචං, කාන්තිය හෙවත් ශෝභාව; භෙජෙ, භජනය කෙළේය.

**සඃ** අම්බුරාශෙඃ **රුචං, භෙජෙ,** යනු මෙහි ක්‍රි- යි. භෙජෙ, යනු පරොක්‍ෂ ලිට් යි, භජ, සෙවායාම් ධාතුවෙන්, එ, ප්‍රත්‍යයි, මෘණාලා නාම් සූත්‍රාණි=මෘණාලසූත්‍රාණිවත් අමලං, මෘණාලසූත්‍රාමලං, චලන්ති ච තෙ චාමරෙචෙති චලච්චාමරෙ, (තයොඃ) අභිතඃ පාතුකා (උභය තඃපාතිනී) සිද්ධසින්ධුඃ යස්‍යසඃ= (තස්‍ය) පූර්වමභූතා, භූතාපූර්වා (තාම්) අම්බූනාම්රාශිඃයස්‍යසඃ අම්බුරාශිඃ (තස්‍ය) යනු විග්‍රහයි **අතිශයොක්තියි.**

4. අස්‍ය, ඒ ශ්‍රීකෘෂ්ණයාගේ; උපරි, මත්තෙහි හෙවත් ඌර්ධ්ව දෙශයෙහි; මෞලිභාජාම්, කිරීටය හෙවත් ඔටුන්න භජනයකරන්නාවූ; මණීනාම්, මිණිරුවන් සම්බන්ධිවූ; අනණීයසීභිඃ, අනුතරනොවූ හෙවත් ඉතා ශ්වල්පනොවූ (මහත්වූ යී සේයි;) චිත්‍රාභිඃ, විසිතුරුවූ; භාභිඃ, ප්‍රභාවන් විසින්; අනෙකධාතුච්ඡුරිතා, ගෛරිකාදි නොයෙක්

5. තස්‍යෝ'ල්ලසත්කාඤ්චනකුණ්ඩලාග්‍ර
ප්‍රත්‍යුප්තගාරුත්මතරත්නභාසා
අවාප බාල්‍යෝ'චිතනීලකණ්ඨ
පිච්ඡාවචූඩාකලනාමි' වොරඃ.

---

ධාතුවලින් පැතිරගත්තාලද; අශ්මරාශෙඃ, මැණික්ගල් සමූහඇති; ගොවර්ධනස්‍ය, ගොවර්ධන නම් පර්වතයාගෙ; ආකෘතිං, සංස්ථානය හෙවත් ආකාරය; අනුකාරි, අනුවකරණලද් හෙවත් තත් සමාන කරණලද්දේයි.

**අස්‍ය මණීනාම්, භාභිඃ 'ගොවර්ධනස්‍ය ආකෘතිඃ අනුකාරි,** යනු මෙහි ක්‍රි- යි. අනුකාරි, යනු භූතාර්ථ ලූඩියි, කර්මකාරකයි- අනු පූර්ව කෘඤ් කරණෙ ධාතුවෙන්, තන්, ප්‍රත්‍යයි, මෞලිම් (මුකුටං) භජන්තිති= මෞලිභාජඃ (තෙෂාම්) අතිශයෙනාණුරිති, අණීයසී න අණීයසී අනණීයසී (තාභිඃ) නඑකා'අනෙකාඃ අනෙකාශ්චතාඃ ධාත වශ්චෙති= අනෙකධාතුභිඃ ජුරිතා= අනෙකධාතුච්ජුරිතානාම් අශ්ම නාං, රාශිඃසඃස‍ඃ= යනු නිර්වචනයි **පූර්ණෝපමාලංකාරයි.**

5. තස්‍ය, ඒ ශ්‍රීකෘෂ්ණයාගෙ; උරඃ, වක්ෂස්ථලයෙහි; උල්ලසත්, උසස්ව බබලන්නාවූ; කාඤ්චනකුණ්ඩලාග්‍ර, සවර්ණමය කුණ්ඩලා භරණ කොන්දෙක්හි; ප්‍රත්‍යුප්ත, ප්‍රත්‍යුප්තවූ හෙවත් ඔබ්බවා කරණ ලද්දවූ; ගාරුත්මතරත්නභාසා, මරකත මාණික්‍යයන්ගේ කාන්ති යෙන්; බාල්‍ය, ශිශුභාවයෙහි හෙවත් බාලඅවස්ථාවෙහි; උචිත, අභ්‍යාසකරණලද්දවූ; නීලකණ්ඨපිච්ඡ, මයුරපිච්ඡයෙන් හෙවත් මොනරපිල් කලඹින් කරණලද; අවචූඩාකලනාං, මාලිකාරචනාව කට හෝ මාලිකාවමෝචනයකට; අවාපඉව, පැමිණියාක්මෙන්වීය.

**සඃ (හරිඃ) බාල්‍යොචිතනීලකණ්ඨපිච්ඡාවචූඩාකලනාං අවාපඉව,** යනු, මෙහි, ක්‍රි- යි. අවාප යනු පරොක්ෂලිට්- යි අවපූර්ව අප, ප්‍රාප්ණෙ ධාතුවෙන්, ණප්, ප්‍රත්‍යයි කාඤ්චනෙන (ප්‍රකෘතෙ) කුණ්ඩලෙ= උල්ලසතීචයෙ කුණ්ඩලෙචෙති= තයො'රග්‍රෙ= ගාරුත් මතානිච තානි රත්නානිචෙති= උල්ලසත් කාඤ්චනකුණ්ඩලාග්‍රයොඃ ප්‍රත්‍යුප්තානි (ඛචිතානි)= උල්ලසත් කාඤ්චනකුණ්ඩලාග්‍රප්‍රත්‍යුප්තානි ච තානි ගාරුත්මතරත්නානිචෙති= තෙෂාම්භාසා=(තයා) බාලස්‍ය භාවඃ බාල්‍යම් බාල්‍යෙඋචිතා (අභ්‍යස්තා)= නීලකණ්ඨස්‍ය (මයුරස්‍ය) පිච්ඡම්= බාල්‍යොචිතඤ්චතත් නීලකණ්ඨපිච්ඡඤ්චෙති= තෙන (නිර් මිතා) අවචූඩා (මාලිකා)= බාල්‍යොචිත- අවචූඩායාඃ කලනා (ආමොච නමවමොචනංවා) බාල්‍යොචිත- කලනා (තාම්) යනු සමාස වාක්‍යයි මේ සර්ගයෙහි පද්‍යබොහොමයක්, 'ඔජඃ සමාසබාහුල්‍යම්' යි ප්‍රකාශිත ඔජොගුණ සංඛ්‍යාත ශබ්දාලඞ්කාරයෙන් විචිත්‍රබැව් සැලකිය යුතුයි. **උත්ප්‍රෙක්ෂාලඞ්කාරයි.**

6. තමඞ්ගදෙ මන්දරකූටකොටි
ව්‍යාඝට්ටනොත්තෙජනයා මණීනාම්
බංහීයසා දීප්තිවිතානකෙන
චකාසයාමාසතුරුල්ලසන්තී.

7. නිසර්ගරක්තෛර්වලයාවනද්ධ
තාම්‍රාශ්මරශ්මිච්ඡුරිතෛර්නඛාග්‍රෛඃ
ව්‍යද්‍යෝතතාද්‍යාපි සුරාරිවක්‍ෂෝ
වික්‍ෂෝභජාසෘක්ස්නපිතෛරිවාසෞ.

---

6. **තම්**, ඒ ශ්‍රීකෘෂ්ණයා; මන්දරකූටකොටිව්‍යාඝට්ටන, මන්දර පර්වතකූට මස්තකය වෙසෙසින් ගැටීම් නමැති; උත්තෙජනයා, සාණොල්ලෙඛනායෙන් හෙවත් ගණගලෙහි ඉලීමෙන්; බංහීයසා, අතිශයින් බොහෝවූ; මණීනාම්දීප්තිවිතානකෙන, මාණික්‍යයන්ගේ කාන්තිපටලයෙන් හෙවත් රැස්කඳඹින්; උල්ලසන්තී, උසස්ව බබලන්නාවූ; අඞ්ගදෙ, අඞ්ගාදභරණදෙක; චකාසයාමාසතුඃ, හෙබවූහ.

**අඞ්ගදෙ දීප්තිවිතානකෙන තං චකාසයාමාසතුඃ,** යනු මෙහි ක්‍රි- සි. චකාසයාමාසතුඃ යනු- පරොක්‍ෂලිට්- සි කාසෘ‘දීප්තෞ,ධාතු වෙන් - ණිච්, ප්‍රත්‍යය හා, ආම්, ප්‍රත්‍යයි, අස්භූවි, අනුප්‍රයෝගයි කොටිඃ මන්දරකූටකොට්‍යාඃ ව්‍යාඝට්ටනා=සෛවඋත්තෙජනා ශාණොල්ලෙඛනා) = (තයා) අතිශයෙන බහුරිතිබංහීයාන් (තෙන) දීප්ත්‍යාඃ (දීප්තීනාම්වා) විතානකං (තෙන) යනු විග්‍රහයි: **උත්ප්‍රෙක්‍ෂා අතිශයොක්ති සංකරයි.**

7. අසෞ, ඒ ශ්‍රීකෘෂ්ණතෙම; නිසර්ගරක්තෛඃ, ස්වභාවයෙන් රක්තවර්ණවූ හෙවත් පියොවින් ලේවන්වූ; වලයාවනද්ධ; ස්වර්ණමය වළලුදෙක්හි බඳනාලද; තාම්‍රාශ්මරශ්මි, පියුම්රාමිණිසම්බන්ධවූ කාන්තිවලින්; ඡුරිතෛඃ, පැතිරගන්නාලද්දාවූ; අද්‍යාපි, එහෙයින්ම අද දක්වාත්; සුරාරි, (දෙවශත්‍රුසංඛ්‍යාත' හිරණ්‍යකශිපු අසුරයාගේ; වක්‍ෂොවික්‍ෂොභජ, ළයපැලීමෙන් උපන්නාවූ; අසෘක්, රුධිරයෙන්; ස්නපිතෛඃඉව, නාවනලද්දක්වැනිවූ; නඛාග්‍රෛඃ, නියගින්; ව්‍යද්‍යෝතත, වෙසෙසින් බැබලිණි (වළලුදෙකක් දූරුවේය යනු භාවයි)

**අසෞ (හරිඃ) නඛාග්‍රෛඃ ව්‍යද්‍යෝතත,** යනු, මෙහි ක්‍රි- සි. ව්‍යද්‍යෝතත, යනු භූතාර්ථ ලුඞ්- සි. විපූර්ව ද්‍යුතඞ්- ද්‍යොතතෙ, ධාතු වෙන්, තන්, ප්‍රත්‍යයි නිසර්ගෙන (නිසර්ගාත්වා) රක්තානි=(තෛඃ)වලයෝ’ රවනද්ධාඃ= තාම්‍රාණිවයානි අශ්මානිවෙති= වලයාවනද්ධානිච තානි තාම්‍රාශ්මානිචෙති= තෙෂාම්රශ්මයඃ= තෛඃ ඡුරිතාඃ=(තෛඃ) නඛානාමග්‍රාඃ= (තෛඃ) සුරාණාමරිඃ= සුරාරෙර්වක්‍ෂඃ= සුරාරිවක්‍ෂසඃ වික්‍ෂොභඃ (විදාරණං)= තෙනජාතාඅසෘක්= තයාස්නපිතාඃ (සික්තාඃ) (තෛඃ) යනු විග්‍රහවාක්‍යයි **උත්ප්‍රෙක්‍ෂා ලංකාරයි.**

8. උභෞ යදි ව්‍යොම්නි පෘථක්ප්‍රවාහා
වාකාශගඞ්ගාපයසඃ පතේතාම්
තෙනොප'මීයෙත තමාලනීල
මාමුක්තමුක්තාලතමස්‍ය වක්‍ෂඃ.

9. තෙනා'මහසාං සාරමයඃ පයොධෙ
ර්දධ්‍රෙ මණිර්දීධිතිදීපිතාශඃ
අනන්‍යසන්බිම්බගතස්ත'දඞ්ගෙ
සාක්‍ෂා දි'වාලක්‍ෂ්‍යත යත්‍ර ලොකඃ.

---

8. තමාලනීලම්, තමලුපත්සේ නිල්වන්වූ; ආමුක්තමුක්තාල තාම්, පලඳිනලද මුතුවැල්දෙකඇති; අස්‍යවක්‍ෂඃ, ඒ ශ්‍රීකෘෂ්ණයාගෙ වක්‍ෂඃස්ථලයට; ආකාශගඞ්ගාපයසඃ, අහස්ගඟදිය සම්බන්ධිවූ; උභෞ ප්‍රවාහෞ, ප්‍රවාහදෙක; ව්‍යොම්නි, අහසෙහි; යදි, ඉදින්; පෘථක්පතෙ තාම්, වෙන්වසයෙන් වැටෙන්නාහුනම්; තෙන, ඒ අහස හා; උපමී යතෙ, උපමාකරණු ලැබෙන්නේය. මීට කිසියම් උපමාවක් නොද කුම්හ යනු භාවයි; (තමලුපත්සේ නිල්වන් මනහර මුතුහරක් දරූ වේ යයි සේයි.)

**ආකාශගඞ්ග පයසඃ, ප්‍රවාහෞ යදි පතෙතාම්,** යනුද (බ්‍රූමධෙඃ) **අස්‍යවක්‍ෂඃ තෙන උපමියතෙ,** යනුද මෙහි- ක්‍රි-යි. පතෙ තාම්, යනු විධිසං- ලිඞ්- යි. පත්ඝ, පතනෙ, ධාතුවෙන්, ආතාම් ප්‍රත්‍යයි, උපමීයතෙ, යනුද, විධිසං- ලිඞ්- යි- උපපූව මාඞ්, පරිමා ණෙ, ධාතුවෙන්, ඊත, ප්‍රත්‍යයි, ආකාශගඞ්ගායාඃපයඃ=(තස්‍ය)තමාල වත්නීලම්= ආමුක්තෙන (ආසඤ්ජිතෙ) මුක්තාලතෙ යස්මින් තං= යනු විග්‍රහයි. **අතිශයොක්ති අලංකාරයි.**

9. තෙන, ඒ ශ්‍රීවිෂ්ණුහු විසින්; දීධිතිදීපිතාශඃ, කාන්තිවලින් දීප්තිමත් කරණලද දිගුන්ඇති; පයොදධෙඃ අම්හසාම්, සාගරජලය සම්බන්ධිවූ; සාරමයඃ, සාරයාගේ විකාරයක්වූ හෙවත් සමුද්‍රමථන යෙන් උද්ගතවූ; මණිඃ, කෞස්තුභනම්වූ මිණිරුවන; ධෘතෙ, ධරණ ලද්දේය; යත්‍ර, යම් මිණිරුවනෙක්හි; බිම්බගතඃ, ප්‍රතිබිම්බප්‍රාප්තවූ: ලොකඃ, ලෝකයතෙම; තදඞ්ග, ඒ ශ්‍රීවිෂ්ණුහුගෙ ශරීරයෙහි; සාක්‍ෂාත්, ප්‍රත්‍යක්‍ෂවසයෙන්; අනන්‍යසන්ඉව, ඇතුලත වාසයකරන් නාක්මෙන්; අලක්‍ෂ්‍යත, සලකාණුලැබිද, කුක්‍ෂිස්ථලොකයා ඇත්තාක් මෙන් දෘශ්‍යමානවීද ඒ මිණිරුවන යයි සේයි.

**තෙන(හරිණා) මණිඃධෘතෙ,** යනුද **යත්‍රලොකඃ අනන්‍යසන් ඉව, (ජනෛඃ) අලක්‍ෂ්‍යත,** යනුද මෙහි ක්‍රි- යි. ධෘතෙ, යනු කර්ම කාරක වර්‍ත- ලට්- යි, ධෘඤ්, ධාරණෙ, ධාතුවෙන්, තෙ, ප්‍රත්‍යයි

10. මුක්තාමයං සාරසනාවලම්බි
භාති ස්ම දාමාප්‍රපදීනමස්‍ය
අඞ්ගුෂ්ඨනිෂ්ඨ්‍යූතමි'වොර්ධ්වමුච්චෛ
ත්‍රිස්‍රොතසඃ සංතතධාර'මම්භඃ.

11. සඉන්ද්‍රනීලස්ථලනීලමූර්ති
රරාජ කර්වුරපිශඞ්ගවාසාඃ
විසෘත්වරෛරේ'රම්බුරුහාං රජොභි
යීමස්වසුශ්චිත්‍ර ඉවොදභාරඃ.

---

අලක්ෂ්‍යත යනු භූතාර්ථ ලුඞ්- යි, ලක්ෂ, දර්ශනෙ, ධාතුවෙන්, තන් ප්‍රත්‍යයි, සාරස්‍යවිකාරඃ සාරමයඃ පයාංසි ධියන්තාඅත්‍රෙති පයොධිඃ (තස්‍ය) දිධිතිභිදීපිතා ආශා යෙනසඃ= බිම්බං (ප්‍රතිබිම්බං) ගතඃ=තස්‍ය අඞ්ගම්=(තස්මින්) යනු සමාසයි **උත්ප්‍රෙක්ෂාලංකාරයි**.

10. අස්‍ය, ඒ ශ්‍රීකෘෂ්ණයාගෙ; මුක්තාමයං, මුක්තාඵලයන් බොහෝකොට ඇත්තාවූ; සාරසනාවලම්බි, කටිහුයෙහි එල්බෙන්නාවූ; ආප්‍රපදීනම්, හාත්පසින් පාදාග්‍රය දක්වා ඇත්තාවූ; දාම· මුක්තාදාමය තෙම; අඞ්ගුෂ්ඨනිෂ්ඨ්‍යූතං, මාපටැඟිල්ලෙන් විසර්ජනය කරණලද හෙවත් හරණලද; ඌර්ධ්වං, උඩුකුරුවූ; උච්චෛඃ, උස්වූ; ත්‍රිස්‍රොතසඃ, ස්‍රෝතස් තුනක් ඇත්තීගේ හෙවත් සවනීදීහුගෙ; සංතතධාරං, ව්‍යාප්තවූ දියදහරඇති හෙවත් අවිච්ඡින්නවූ (නිරන්තර ප්‍රවෘත්ත) ජලධාරා ඇති; අම්භඃඉව, ජලයමෙන්; භාතිසම, බැබලීය.

**අස්‍ය දාම අම්භඃඉව භාතිස්ම**, යනු මෙහි, ක්‍රි- යි. භාති යනු වර්තමානලට් යි- ස්ම යන නිපාතයෝගය හෙයින් අතීතකාලිකයි; භා 'දීප්තෞ, ධාතු තිප්, ප්‍රත්‍යයි, තත් ප්‍රකෘතවච්චනෙමයට්, යනුවෙන් මයට් ප්‍රත්‍යයි, (කටිසූත්‍රෙ) අවලම්බත ඉති සාරසනාවලම්බි ආ සමන්තාත් ප්‍රපදම් ප්‍රාප්නොතීති=අඞ්ගුෂ්ඨෙන නිෂ්ඨ්‍යූතං (විසෘෂ්ටම්) අඞ්ගුෂ්ඨනිෂ්ඨ්‍යූතං ත්‍රීණිස්‍රොතාංසි යස්‍යාඃ සා= (තස්‍යාඃ) සංතතා (අවිච්ඡින්නා) ධාරා යස්‍ය තත්= යනු විග්‍රහවාක්‍යයි **උත්ප්‍රෙක්ෂායි**.

11. ඉන්ද්‍රනීලස්ථලනීලමූර්තිඃ, ඉඳුනිල්මිණි ගොඩැල්ලක්මෙන් නිල්වන්වූ මූර්තිඇති; කර්බුරපිශඞ්ගවාසාඃ, රන්සිරියල් සෙයින් පිඟුවන් වස්ත්‍ර ඇත්තාවූ හෙවත් පීතාම්බරවත්වූ; සඃ, ඒ ශ්‍රීකෘෂ්ණතෙමේ; විසෘත්වරෛඃ, විසෘෂ්ටවන්නාවූ හෙවත් ව්‍යාප්තවන්නාවූ; අම්බුරුහාම්, පද්මයන්ගෙ; රජොභිඃ, පරාගවලින් හෙවත් රේණුවලින්; චිත්‍රඃ, විසිතුරුවූ; යමස්වසුඃ, යමුනානම් නදීහුගෙ; උදභාරඃඉව, ජලපූරයක් මෙන්; රරාජ, බැබලීය.

12. ප්‍රසාධිතස්‍යාස්‍ය මධුද්විෂෝ'භූ
දන්‍යෙව ලක්ෂ්මී'රිති යුක්තමේ'තත්
වපුෂ්‍යශෙෂේ'ඛිලලොකකාන්තා
සානන්‍යකාන්තා හ්‍යුරසීතරා තු.

13. කපාටවිස්තීර්ණමනොරමෝරඃ
ස්ථලස්ථිතශ්‍රීලලනස්‍ය තස්‍ය
ආනන්දිතා'ශෙෂජනා බභූව
සර්වාඞ්ගසඞ්ගින්‍යපරෙව ලක්ෂ්මීඃ.

---

**සඃ (හරිඃ) උදභාරඃඉව රරාජ,** යනු මෙහි ක්‍රි- සි. රරාජ යනු-පරොක්ෂලිට් සි. රාජෘ දීප්තෞ ධාතුයි, ණප් ප්‍රත්‍යයි, ඉන්ද්‍රනීලස්‍යස්ථලම්=ඉන්ද්‍රනීලස්ථලම්ව නීලමූර්ත්නිරස්‍යාස්තීති=කර්චූරම් (හරිතාලම්ව) පිශඞ්ගං වාසො යස්‍යසඃ= අම්බුනි, රොහන්ති ( ජායන්තෙති ) අම්බුරුහානි (තෙෂාම්)උදකස්‍ය,භාරඃ උදභාරඃ, යනු විග්‍රහවාක්‍යයි උදභාරඃ යන තන්හි 'මන්ථෞදන- යනාදීන් උදකශබ්දයට උදයනාදෙශයි. **උපමාලඞ්කාරයි.**

12. ප්‍රසාධිතස්‍ය, අබරණ පලඳනාලද්දාවූ හෙවත් අලංකාර කාරණලද්දාවූ; අස්‍යමධුද්විෂඃ, මෙම ශ්‍රීවිෂ්ණුහුගෙ; අන්‍යාඑව, අන්‍ය වූම හෙවත් අසදෘශවූ ද්‍යෙහෝ නොහොත් විහින්නවූ; ලක්ෂ්මීඃ, ශෝභාතොමෝ ද්‍යෙහෝ නොහොත් ශ්‍රීදේවීතොම; අභූත්ඉති, වීය යන; එතත්, මේ කාරණය; යුක්තම්, යුක්ති යුක්ත වෙයි; කුමක් හෙයිනයත්? හි, යම්හෙයකින්; සා, ප්‍රසාධනරූපවූ ඒ ලක්ෂ්මීතොම; අශෙෂෙ,වපුෂි, මුලුශරීරයෙහිවේද; අඛිලලොකකාන්තා, මුලුලොවට කාන්තාවූ හෙවත් ප්‍රියවූ; ඉතරා, අන්‍යවූ හෙවත් නිත්‍යවූ; අනන්‍ය කාන්තා, අනිකෙකුට කාන්තානොවන්නාවූ ශ්‍රීදේවිතොමෝ; උරසි, වක්ෂඃස්ථලයෙහි වෙසේද එහෙයිනි.

**අස්‍යමධුද්විෂඃ ලක්ෂ්මී,ර භූදිති එතත් යුක්තම් එවස්‍යාත්,** යනු මෙහි ක්‍රි- සි. අභූත්, යනු භූතාර්ථලුඞ්සි. භූසත්තායාම්, ධාතුවෙන් දිප්, ප්‍රත්‍යයි, ස්‍යාත්, යන තන්හි, අස්භුවි ධාතුයි, යාත්- ප්‍රත්‍යයි, මධුං නාම්නාමාසුරංවේෂ්ටීති, මධුවිඩ් (තස්‍ය) අඛිලශ්චාසෞ ලොකශ්චෙති= අඛිලලොකස්‍ය කාන්තා= අන්‍යස්‍යකාන්තාප්‍රියා නභවතීත්‍ය නන්‍යකාන්තා, යනු විග්‍රහවාක්‍යයි **අතිශයොක්තියි.**

13. කපාටවිස්තීර්ණ, කවුළුවක්මෙන් පුළුල්වූ; මනොරම, මන රම්වූ; උරඃස්ථල, වක්ෂස්ථලයෙහි; ස්ථිත, සිටියාවූ හෙවත් පිහිටියාවූ; ලලනස්‍ය, ශ්‍රීකාන්තාව ඇති; තස්‍ය, ඒ ශ්‍රීවිෂ්ණුහුගෙ; ආනන්දිතා ශෙෂජනා, සන්තොෂකරණලද සියලුදෙනාඇති; සර්වාඞ්ගසඞ්ගිනී,

14. ප්‍රාණච්ඡිදං දෛත්‍යපතෙර්නඛානා
මුපෙයුෂාං භූෂණතාං ක්ෂතෙන
ප්‍රකාශකාර්කශ්‍යගුණෞ දධානාඃ
ස්තනෞ තරුණ්‍යඃ පරිවව්‍රු'රෙනම්.

15. ආකම්පිතෙ චො'ර්ධ්වමතික්‍රමියා
නතප්‍රණතත්වාත් කුචමණ්ඩලෙන
නතාමමධ්‍යා'ති ගුරුත්වභාජා
නිතාන්තමාක්‍රාන්ත ඉවාඞ්ගනාතාං.

---

සියල්ල පැතිරසිටිනාවූ; අපරාඑව, එහෙයින්ම අන්‍යවූ හෙවත් අසාධාරණවූ; (ශ්‍රීදේවියගෙන් අන්‍යවූම යී සේයි) ලක්ෂ්මීඃ, ශෝභාතොම; බභූව, විය.

**තස්‍ය ( හරෙඃ ) අපරාඑව ලක්ෂ්මීඃ බභූව,** යනු මෙහි ක්‍රි- යි. බභූව යනු පරොක්ෂලිට් යී, භූ, සත්තායාම්, ධාතුවෙන් ණප්, ප්‍රත්‍යයි, කපාටවත් විස්තීර්ණං කපාටවිස්තීර්ණං උරසඃස්ථලම්= මිනොරමක්‍ෂව තත් උරඃස්ථලං යෙෂුවති = කපාට විස්තීර්ණක්‍ෂව, තත් මනොරමොර[8] ස්ථලක්‍ෂෙවති= තස්මින්, ස්ථිතා ශ්‍රි ( රිති )= ලලනා ( කාන්තා ) යස්‍යසඃ ( තස්‍ය හරෙඃ ) ආනන්දිතාඃඅශෙෂජනාඃ යයා, සා = සර්වාණිවතාති අඞ්ගානිවෙති= සර්වාඞෙගෂු සඞ්ගිනී= යනු විග්‍රහවාක්‍යයි. **අතිශයො ක්තිනම් අලඞ්කාරයි.**

14. භූෂණතාම්, අබරණ බවට; උපෙයුෂාම්, පැමිණියාවූ; දෛත්‍යපතෙඃ, හිරණ්‍යකශිපුනම් අසුරරාජයාගෙ; ප්‍රාණච්ඡිදං, පණ නශන්නාවූ; ( විදුරටත්වඩා කයෝරවූ යී සේයි ) නඛානාම්, නිය වලින්වූ ව්‍රණයෙන්; ප්‍රකාශකාර්කශ්‍යගුණෞ, ප්‍රකටවූ කැකිශභාව නමැති ගුණඇති; ස්තනෞ, දෙතන හෙවත් පියයුරුදෙක; දධානාඃ ධරන්නාවූ; තරුණ්‍යඃ, තරුණියෝ; එනම්, ඒ ශ්‍රිකෘෂ්ණයා; පරිවව්‍රුඃ, හාත්පසින් වටකරගත්තාහුය.

**තරුණ්‍යඃ එනම්, පරිවව්‍රුඃ,** යනු මෙහි ක්‍රි- යි. පරිවව්‍රුඃ, යනු පරොක්ෂ ලිට් යි පරිපූර්ව වෘඤ්, වරණෙ, ධාතුවෙන් උස්ප්‍රත්‍යයි, (ප්‍රාණාන්ඡිඥන්තිති ප්‍රාණච්ඡිදඃ ( තෙෂාම් ) දෛත්‍යානාම් පතිඃ= (තස්‍ය)භූෂණස්‍යභාවඃ භූෂණතා (තාම්)ප්‍රකාශො (ව්‍යක්තඃ) කාර්කශ්‍ය මෙවගුණො යයො, සෞ යනු විග්‍රහ වාක්‍යයි **අතිශයොක්ති ලංකාරයි**

15. අතිඋන්නතත්වාත්, අතිශයෝන්නත භාවය හෙතුකොට ගෙණ; ඌර්ධ්වම් ආකම්පිතෙඉව, උඩට ඇදගත්තාක් වැනිවූ; අති ගුරුත්වභාජා, ඉතා බරබව භජනයකරන්නාවූ; අඞ්ගනානාං කුච

16. යාං, යාං, පියඃ ප්‍රෙක්ෂත කාතරාක්ෂි
සා සා හ්‍රියා නම්‍රමුඛී බභූව
නිඃශඞ්කමන්‍යාඃ සමමාහිතෙර්ෂ්‍යා
ස්තත්‍රාන්තරෙ ජඝ්නුරමුං කටාක්ෂෛඃ

---

මණ්ඩලෙන, කාන්තාවන්ගේ පියවුරු මඬලින්; අතික්‍රසියාන්, අත්‍යන්තයෙන් කෘෂවූ ද්‍යෙහෝ නොහොත් තනුතරවූ හෝ වැරුණාවූ; මධ්‍යඃ, මධ්‍යප්‍රදෙශය තෙම; නිතාන්තම්, ඒකාන්තයෙන්; ආක්‍රාන්තං ඉව, ආක්‍රමනය කළාක්මෙන් හෙවත් පීඩිතවූවාක්මෙන්; නනාම, නැමුනේය හෙවත් ප්‍රණතවීය.

**අඞ්ගනානාම් මධ්‍යඃ නනාම,** යනු මෙහි ක්‍රි- යි. නනාම, යනු පරොක්ෂලිට්යි, නමූ, ප්‍රහ්ණත්වෙ, ධාතුවෙන් ණප්, ප්‍රත්‍යයි අත්‍යන්ත කෘශතරඃ ඉති අතික්‍රශියාන්, අතිශයෙනඋන්නතඃ, අත්‍යුන්නතඃ තස්‍ය භාවඃ= (තස්මාත්) කුචයොර්මණ්ඩලම්= (තෙන) ගුරොභ්‍යොවො= අතිශයෙන ගුරුත්වම් අතිගුරුත්වම් අතිගුරුත්වම්භජතීති අතිගුරුත්වභාක් (තෙන) යනු විග්‍රහයි. **සමාසොක්ති උත්ප්‍රෙක්ෂා ලංකාරයි.**

16. ප්‍රියඃ, වල්ලභවූ ශ්‍රීකෘෂ්ණතෙම; යාං, යාං, යම්යම් අඟනක්; ප්‍රෙක්ෂත, බැලුවේද; සාසා, ඒ ඒ කාන්තාතොම; කාතරාක්ෂී, බැගෑපත් ඇස්ඇත්තී හෙවත් භයින් චකිතවූ ඇස්ඇත්තී; හ්‍රියා, ලජ්ජායෙන්; නම්‍රමුඛිබභූව, නැමුනු මුවඇත්තීවීය; (කරබාගත්ති යයි සේයි) අන්‍යාඃ, එයින් අන්‍යවූ කාන්තාවෝ හෙවත් නොබලනලද අඟනෝතුමූ; ආහිතෙර්ෂ්‍යාඃ, පිහිටි ඊර්ෂ්‍යා ඇත්තියෝ හෙවත් නොසිවසුම් ඇත්තියෝ; තත්‍රාන්තරෙ, ඒ අතුරෙහි; නිඃශඞ්කම්, නිසැකව; සමං, එකවිට; කටාක්ෂෛඃ, නේත්‍රාන්ත නිරීක්ෂණවලින්; අමුං, ඒ ශ්‍රිවිෂ්ණුනු; ජඝ්නුඃ, උපඝාතකළාහුය හෙවත් රෝෂසහිතව බැලුවාහුය.

**ප්‍රියඃ (හරිඃ) යාං,යාං, ප්‍රෙක්ෂත,** යනුද **සා,සා,** හ්‍රියා නම්‍රමුඛී බභූව, යනුද **අන්‍යාඃ සමං කටාක්ෂෛඃ අමුං ජඝ්නුඃ,** යනුද මෙහි ක්‍රි- යි. ප්‍රෙක්ෂත, යනු භූතාර්ථ ලුඞ්යි, ප්‍රපූර්ව ඊක්ෂ,දර්ශනාඞ්කනයොඃ, ධාතුවෙන්, තන්, පත්‍යයි, බභූව, යනු පරොක්ෂලිට්යි, භූ;සත්තායාම් ධාතුවෙන්, ණප්, ප්‍රත්‍යයි, ජඝ්නුඃ යනුද, පරොක්ෂලිට්යි, හන්, හිංසායාම්, ධාතුවෙන්, උස් ප්‍රත්‍යයි, (කාතරෙ) අක්ෂිණීයස්‍යාඃසා= නම්‍රං මුඛ යස්‍යාඃසා= නාස්තිශඞ්කාසොත්‍යති= ආහිතාඊර්ෂ්‍යායාභිඃ තාඃ= යනු විග්‍රහ වාක්‍යයි **ස්වභාවොක්ති අලංකාරයි.**

17. දෘෂ්ටෝ'පි ශෛලඃ ස මුහුර්මුරාරේ
රපූර්වවද්විස්මය'මාතතාන
ක්ෂණේ ක්ෂණේ යන්නවතා'මුපෛති
තදේ'වරූපං රමණීයතායාඃ.

18. උච්චාරණඥෝ'ථ ගිරාං දධාන
මුච්චාරණත්පක්ෂිගණාස්තටීස්තම්
උත්කං ධරං ද්‍රෂ්ටු'මවේක්ෂ්‍ය ශෞරි
මුත්කන්ධරං දාරුක ඉත්‍යුවාච.

---

17. මුහුඃ, වරක්; දෘෂ්ටඃඅපි, දක්නාලද්දවූද; සඃ,ශෛලඃ, ඒ (ශෛල) පර්වතය තෙම; මුරාරේඃ, මුරාරිහට හෙවත් ශ්‍රීවිෂ්ණුහට; අපූර්වවත්, අපූර්වයක්මෙන් හෙවත් පෙර නොදක්නාලද්දක්මෙන්; විස්මයංආතතාන, විස්මය කොළේය; ක්ෂණෙක්ෂණෙ, ඇසිල්ලක්පාසා; නවතාම්, අලුත්බවට; උපෛති, පැමිණේය යන; යත්, යමක්වේද; තත්එව, එයම හෙවත් ඒ අලුත්බවට පැමිණීමම; රමණීයතායාඃ, රමණීය ස්වභාවයාගෙ; රූපං, ස්වරූපයයි.

**සඃ ශෛලඃ මුරාරෙඃ විස්මයං ආතතාන**, යනුද **යත්,නවතාම් උපෛති**, යනුද **තදෙව රමණීයතායාඃ,රූපං,භවති,**යනුද මෙහි ක්‍රි- යි. ආතතාන, යනු පරොක්ෂලිට් යි, ආඞ්, පූර්ව, තනු, විස්තාරෙ, ධාතුවෙන්, ණප්, ප්‍රත්‍යයි, උපෛති, යනු වර්තමානලට්යි. උපපූර්ව ඉණ්, ගතෞ, ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි, භවති, යනු අධ්‍යාහෘත වර්තමාන ලට්යි, භූ, සත්තායාම් ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි, මෙහි ක්ෂණෙ ක්ෂණෙ යනු වීප්සාවෙහි විත්තයයි. **වාක්‍යාර්ථහෙතුක කාව්‍යලිඞ්ගාලඞ්කාරයි.**

18. අථ, ඉක්බිතිව හෙවත් හරිහුගේ විස්මයට අනතුරුව; ගිරාං උච්චාරණඥඃ, වාක්‍යොච්චාරණය දන්නාවූ; දාරුකඃ, දාරුකතෙම හෙවත් කෘෂ්ණසාරථිතෙම; උච්චා, උසස්වූ; රණත්පක්ෂිගණාඃ, ශබ්ද පවත්වන පක්ෂිසමූහයා ඇත්තාවූ; තටීඃ,දධානම්, තටප්‍රදෙශයන් දරන්නාවූ; තම්, ඒ පර්වතය; ද්‍රෂ්ටුං, දකින්ට; උත්කං, උත්සුකවූ හෙවත් උත්සාහවත්වූ; උත්කන්ධරං, උත්සුකත්වය හෙතුකොටගෙණ ඔසවනලද බෙල්ලඇති; ශෞරිං, ශෞරියා හෙවත් ශ්‍රීවිෂ්ණුහු; අවෙක්ෂ්‍ය, බලා; ඉති, වක්ෂ්‍යමානාකාරයෙන්; උවාච, කීයේය.

**දාරුකඃ ශෞරිං අවෙක්ෂ්‍ය ඉත්‍යුවාච,** යනු මෙහි ක්‍රි- යි. උවාච, යනු, පරොක්ෂලිට් යි, වච්, පරිභාෂණෙ, ධාතුවෙන්, ණප්, ප්‍රත්‍යයි. **ස්වභාවොක්ති** නොහොත් **කාව්‍යලිඞ්ගාලඞ්කාරයි.**

17. තස්‍යාතසීසූනසමානභාසො
භ්‍රාම්‍යන්මයූඛාවලිමණ්ඩලෙන
චක්‍රෙණ රෙජෙ යමුනාජලෞඝඃ
ස්ඵුරන්මහාවර්තීඉවෛකබාහුඃ.

18. විරොධිනාං විග්‍රහභෙදදක්ෂා
මූර්තේව ශක්තිඃ ක්වචිදස්ඛලන්ති
නිත්‍යං හරෙඃ සන්නිහිතා නිකාමං
කෞමොදකී මොදයති ස්ම චෙතඃ.

---

17. අතසීසූනසමානභාසඃ, ක්ෂූමා නම් මල්වර්ගය හා සමාන කාන්තිඇති හෙවත් ඇගැස්ස මල්වැනි නිල්වන් කාන්තිඇති; තස්‍ය, ඒ ශ්‍රීකෘෂ්ණයාගේ; ඒකබාහුඃ, එක්බාහුවක්; භ්‍රාම්‍යන්, බමන්නේ හෙවත් කරකැවෙන්නේ; මයූඛාවලිමණ්ඩලෙන, මයූඛාවලින් සම්බන්ධවූ මණ්ඩලඇති හෙවත් රශ්මිමාලාඇති; චක්‍රෙණ, සුදර්ශනනම් චක්‍රායුධය කාරණකොටගෙණ; ස්ඵුරන්, බබලන්නාවූ; මහාවර්තීඃ, මහත්වූ ආවර්ත හෙවත් දියසුලිඇති; යමුනාජලෞඝඃ ඉව, යමුනානදියගෙ ජලප්‍රවාහයක්මෙන්; රෙජෙ, බැබලිණි.

**තස්‍ය ඒකබාහුඃ යමුනාජලෞඝඃ ඉව, රෙජෙ,** යනු මෙහි ක්‍රි-සි. රෙජෙ, යනු පරොක්ෂලිට් යි, රාජෘ,දීප්තෞ ධාතුයි, එ, ප්‍රත්‍යයයි, අතසී සූනෙන සමානඃ භාසඃ යස්‍ය සඃ= (තස්‍ය) මයූඛානාමාවලයඃ= මයූඛා වලිනාම් මණ්ඩලං (චක්‍රවාලං) යස්‍යතත්=(තෙන) ජලස්‍යඔඝඃ ජලෞඝඃ යමුනායාඃ ජලෞඝඃ= මහාංශ්චාසාවර්තීශ්චෙති= ඒකශ්චාසෞ බාහු ශ්චෙති= යනු විග්‍රහවාක්‍යයි. **උපමාලංකාරයි.**

18. විරොධිනාම්, වෛරීන්ගෙ; විග්‍රහභෙදදක්ෂා, ශරීරවිදාරණයෙහි දක්ෂවූ; ක්වචිත්අස්ඛලන්තී, කිසිතැනෙක්හිත් නොපැකිලෙන්නාවූ; නිත්‍යං, නිතර; සන්නිහිතා, සමීපස්ථවූ හෙවත් අත්නොහැර සිටිනාවූ; මූර්තා, එහෙයින්ම මූර්තිමත්වූ; ශක්තිඃඉව, ශක්තියවැනිවූ; කෞමොදකී, ගදතොමෝ; නිකාමං, ඒකාන්තයෙන්; හරෙඃ, ශ්‍රීවිෂ්ණුහුගෙ; චෙතඃ, චිත්තය; මොදයතිස්ම, සතුටුකෙළේය.

**කෞමොදකී හරෙඃ චෙතඃ නිකාමං මොදයතිස්ම,** යනු මෙහි ක්‍රි- සි. මුද්, සමාජිතෙ, ධාතුවෙන්- ස්මයොගයෙහි අතීතාර්ථ- වර්ත- ලට්-තිප්, ප්‍රත්‍යයයි විග්‍රහානාම් (ශරීරාණාම්) භෙදඃ=විග්‍රහභෙදදක්ෂා, නස්ඛලන්තී අස්ඛලන්තී කොඃ (පෘථ්ව්‍යාඃ පාලකත්වාත්) මොදකඃ කුමොදකඃ (විෂ්ණුඃ) කුමොදකස්‍යයම් කෞමොදකී (අණ්) (විෂ්ණු ගදායාම්) යනු විග්‍රහයි, මොදයති යනු ස්මයන නිපාත යොගයෙහි අතීත කාලික ක්‍රියායි. **උපමාලංකාරයි.**

19. න කෙවලං යඃ සවතයා මුරාරෙ
රනන්‍යසාධාරණතාං දධානඃ
අත්‍යර්ථමුද්වෙජයිතා පරෙෂාං
නාම්නා පි තස්‍යෛව ස නන්දකො'භූත්.

20. න නීතම'න්‍යෙන නතිං කදාචිත්
කර්ණාන්තිකප්‍රාප්තගුණං ක්‍රියාසු
විධෙය'මස්‍යා භවදන්තිකස්ථං
ශාර්ඞ්ගං ධනුර්මිත්‍රමිව ද්‍රඪීයඃ.

---

19. අනන්‍යසාධාරණතාං, අනන්‍ය සාධාරණ භාවය හෙවත් අනිකකුහට සමානභාවය; දධානඃ, ධරන්නාවූ; යඃ, යම් නන්දක යෙක් හෙවත් සතුටුකරන්නෙක්තෙම; ස්වතයා කෙවලං, ගජාශ්වාදි වස්තුවෙන් පමණක්; මුරාරෙ'න, නන්දකඃ. විෂ්ණු සතුටුකරන්නේ නොවේද? අත්‍යර්ථම්, අතිශයින්; පරෙෂාම්, ශත්‍රූන්, උද්වෙජයිතා, උද්වෙග කරන්නේ හෙවත් බියගන්වන්නේ; නාම්නාඅපි, නාමයෙනුත් හෙවත් අන්වර්ථනාම වසයෙනුත්; තස්‍යඑව, ඒ විෂ්ණුසම්බන්ධිවූම නන්දකඃ, නන්දයිතෘ හෙවත් සතුටුකරන්නෙක් වේද? සඃ, හෙතෙම; නන්දකඃඅභූත්, නන්දක නම් ඛඞ්ගය විය.

**යඃ අත්‍යර්ථම් පරෙෂාම් උද්වෙජයිතා, සඃ නාම්නාපි නන්දකඃ අභූත්,** යනු මෙහි ක්‍රි- යි. අභූත්, යනු භූතාර්ථ ලුඞ්යි. භූ,සත්තායාම් ධාතුයි, දිප්, ප්‍රත්‍යයි, අන්‍යස්‍ය සාධාරණඃ නභවතීති අනන්‍යසාධාරණඃ තස්‍යභාවඃ=(තාම්) යනු විග්‍රහයි. **කාව්‍යලිඞ්ගාලංකාරයි.**

20 අන්‍යෙන, අන්පුරුෂයෙකු විසින්; නතිං, නැමීමට හෙවත් ආකර්ෂණයට හෝ තමාට අනුකූලබවට; නනීතං, නොපමුණුවන ලද්දාවූ; ක්‍රියාසු, ක්‍රියාවන්හි හෙවත් යුධ කර්මයන්හි දෙහෝ නොහොත් හිතාහිත කෘත්‍යයන්හි; කර්ණාන්තිකප්‍රාප්තගුණං, කණ ලඟට පැමිණියාවූ දෙහෝ නොහොත් කොණ ඟට පැමිණියාවූ දුනුදියඇති නොහොත් ආප්තතා ධර්මඇත්තාවූ; විධෙයං, විධාන ව්‍යවූ හෙවත් රණක්‍රියාවන්හි අවශ්‍යවූ; ද්‍රඪීයං, අතිශයින් දෘඪවූ; ශාර්ඞ්ගංධනුඃ, ශෘඞ්ගමයවූ දුන්න; මිත්‍රම්ඉව, මිතුරෙකුමෙන්; අස්‍ය, ඒ ශ්‍රීවිෂ්ණුහට; අන්තිකස්ථංඅභවත්, සන්නිහිතයක් විය හෙවත් ශ්‍රීවිෂ්ණුහු විසින් ධරණලද්දක් විය.

**ශාර්ඞ්ගං, ධනුඃ මිත්‍රංඉව අස්‍ය අන්තිකස්ථම් අභවත්,** යනු මෙහි ක්‍රි- යි. අභවත් යනු අනද්‍ය - ලඞ්යි, භූසත්තායාම් ධාතුයි, දිප් ප්‍රත්‍යයි, (කර්ණාන්තිකං කර්ණගොචරං) ප්‍රාප්තො,ගුණො මෞර්වීආප්තතාධර්මශ්ච) යස්‍ය තත්= ශෘඞ්ගස්‍ය විකාරඃ සාර්ඞ්ගම් (තන්නාමධනුඃ) අතිශයෙන දෘඪමිති ද්‍රඪීයඃ යනු විග්‍රහවාක්‍යයි, **උපමාලංකාරයි.**

21. ප්‍රවෘද්ධමන්ද්‍රාම්බුදධීරනාදඃ
කෘෂ්ණාර්ණවාභ්‍යර්ණචරෛකහංසඃ
මන්දානිලාපූරකෘතං දධානො
නිධ්වාන'මශ්‍රූයත පාඤ්චජන්‍යඃ.

22. රරාජ සම්පාදක'මිෂ්ටසිද්ධෙඃ
සර්වාසු දික්ෂ්වප්‍රතිසිද්ධමාර්ගම්
මහාරථඃ පුෂ්‍යරථඃ රථාඞ්ගී
ක්ෂිප්‍රං ක්ෂපානාථ ඉවාධිරූඪඃ.

---

21. ප්‍රවෘද්ධ, ප්‍රකර්ෂයෙන් වැඩුනාවූ; මන්ද්‍ර, ගම්භීරවූ; අම්බුදධීර නාදඃ, මේඝයක්සේ ධීරවූ හෙවත් මනහරවූනාදඇති; කෘෂ්ණාර්ණව, ශ්‍රීකෘෂ්ණ නමැති සාගරයාගෙ; අභ්‍යර්ණචර, සමීපචාරීවූ; ඒක හංසඃ, අද්විතීය හංසයෙකු බඳුවූ; මන්දානිල, මන්දමාරුතය; ආපූර කෘත, සම්පූර්ණවීමෙන් කරණලද්දවූ; නිධ්වානං, නාදය; දධානඃ, ධරන්නාවූ හෙවත් නොපිඹිනලද්දෙ නුමුදු මන්දමාරුත ප්‍රවේශ යෙන් නාදපවත්වන්නාවූ; පාඤ්චජන්‍යඃ, (ශ්‍රීවිෂ්ණුහුගෙ) පාඤ්ච ජන්‍ය නම්වූ ශඞ්ඛය; අශ්‍රූයත, අසනුලැබීය.

(අන්‍ව) **පාඤ්චජන්‍යමශ්‍රූයත,** යනු මෙහි ක්‍රි- යි. අශ්‍රූයත, යනු භූතාර්ථ ලඞ්යි, ශෘඤ්, ශ්‍රවණෙ ධාතුහු කෙරෙන්, තන්, ප්‍රත්‍යයි, ධියංරාතීති ධීරො (මනොහරඃ) මන්ද්‍රො (ගම්භීරො) අම්බුදස්‍ය (මෙඝස්‍යෙව) ධීරශ්චනාදඃ ප්‍රවෘද්ධො, යෙනසඃ=(උපමා සමාසයි), කෘෂ්ණ එවාර්ණවඃ = කෘෂ්ණාර්ණවස්‍ය අභ්‍යර්ණං (සමීපං) = තස්මින්; චරතීති කෘෂ්ණාර්ණවචරඃ, ඒකශ්චාසෞ හංසශ්චෙති= කෘෂ්ණාර්ණව- චරශ්චා චෛකහංසශ්චෙති= මන්දශ්චා සාවනිලශ්චෙති= මන්දනිලස්‍ය ආපූරඃ (ආපූරණං)= මන්දනිලාපූරෙණකෘතං (ජනිතං)= පඤ්චජනොනාම කශ්චිදසුරස්තත්‍රභවඃ පාඤ්චජන්‍යඃ යනු විග්‍රහයි. **අතිශයොක්ති අලඞ්කාරයි.**

22. මහාරථඃ, මහත් රථඇත්තාවූ; රථාඞ්ගී, රථාවයවවූ චක්‍රය ඇතිහෙයින් රථාඞ්ගීනම් ශ්‍රීකෘෂ්ණතෙමේ; ඉෂ්ටසිද්ධෙඃ සම්පාදකං, අභීෂ්ටාර්ථ සිද්ධිය සම්පාදනය කරන්නාවූ; සර්වාසුදික්ෂු, සියලු දිශා වන්හි; අප්‍රතිසිද්ධමාර්ගම්, නොවලකනලද මාර්ගඇති; ක්ෂිප්‍රං, වහාගත සුලුවූ ජෛහෝ නොහොත් ක්ෂිප්‍රයත නම්ඇත්තාවූ; පුෂ්‍යරථං, ක්‍රීඩා රථයෙහි; අධිරූඪඃ, මොනවට ආරූඪවූයේ හෙවත් නැගුනේ; ක්ෂපා නාථඃඉව, (රියවැනිවූ පුෂ්‍යනැකතට මොනවටආරූඪවූ) චන්ද්‍රයාමෙන් රරාජ, බැබලිණි.

23. ධ්වජාග්‍රධාමා දදෘශෙ'ථ ශෞරෙඃ
සංක්‍රාන්තමූර්තිර්මණිහෙදිනීෂු
ඵණාවතස්ත්‍රාසයිතුං රසායාස්
තලං විවික්ෂන්නිව පන්නගාරිඃ.

24. ශ්‍රියාසතස්තස්‍ය මහීධ්‍රරන්ධ්‍ර
භිදාපටීයාන් පටහප්‍රණාදඃ
ජලාන්තරාණීව මහාර්ණවෞඝඃ
ශබ්දාන්තරාණ්‍යන්තරයාංචකාර.

---

**රථාඞ්ගී (හරිඃ) ක්ෂපානාථඃ ඉව රරාජ,** යනු මෙහි ක්‍රි- සි. රරාජ යනු පරොක්ෂලිට්සි, රාජෘ, දීප්තෞ ධාතුවෙන් ණප්,ප්‍රත්‍යසි, ඉෂ්ටස්‍ය සිද්ධිඃ=ඉෂ්ටා ච සාසිද්ධිශ්චෙති වා=(තස්‍යාඃ)අප්‍රතිෂිද්ධඃ මාර්ගඃ යස්‍යතත්=(තම්) මහාන් රථෝ යස්‍යසඃ= රථාඞ්ගමස්‍යාස්තීති රථාඞ්ගී ක්ෂපායාඃ නාථඃ= යනු සමාසයි, **උත්ප්‍රෙක්ෂා** නොහොත් **උපමාලංකාරයි.**

23. අථ, ඉක්බිතිව හෙවත් රියනැගීමට අනතුරුව; ශෞරෙඃ, ශ්‍රීකෘෂ්ණයාගෙ; ධ්වජාග්‍රධාමා, ධ්වජාග්‍රය ස්ථානකොට ඇති; මණිහෙදිනීෂු, මිණිමුවා කුට්ටිමයන්හි; (ගෘහභූමීන්හියි සේයි) සංක්‍රාන්තමූර්තිඃ, ප්‍රතිබිම්බප්‍රාප්ත ශරීරඇති; පන්නගාරිඃ, ගුරුළුතෙම; ඵණාවතඃ, පෙණඇත්තවුන් හෙවත් නාගයන්; ත්‍රාසයිතුං, පලවා හරින්ට; රසායාස්තලං, පාතාල ලෝකයට; විවික්ෂන්ඉව, ප්‍රවෙශවනු කැමැත්තෙකුමෙන්; දදෘශෙ, පෙනුණෙය.

**පන්නගාරිඃ රසායාස්තලං විවික්ෂන්, ඉව දදෘශෙ,** යනු මෙහි ක්‍රි- සි. දදෘශෙ, යනු පරොක්ෂලිට්යි, දෘශිර්,ප්‍රෙක්ෂණෙ ධාතුවෙන්, එ, ප්‍රත්‍යසි ධ්වජස්‍යාග්‍රං= ධ්වජාග්‍රංධාම (ස්ථානං) යස්‍යසඃ= සංක්‍රාන්තා මූර්තිර්යස්‍යසඃ= මණිමයාඃ මෙදින්‍යඃ (මණිමයකුට්ටිමාඃ)= (තාසු) ඵණා ඒෂාමස්තීති ඵණවන්තඃ (තාන්) ප්‍රවෙෂ්ටුමිච්ඡතීති විවික්ෂන් පන්නගානාමරිඃ= යනු විග්‍රහයි. **උත්ප්‍රෙක්ෂාලංකාරයි.**

24. ශ්‍රියාසතඃ, ප්‍රයාණයකරණු කැමැත්තාවූ; තස්‍ය, ඒ ශ්‍රීකෘෂ්ණයාගෙ; මහීධ්‍රරන්ධ්‍ර, පර්වත කුහරයන්; භිදාපටීයාන්, බිඳීමෙහි අති දක්ෂවූ; පටහප්‍රණාදඃ, එනම් හෙරිවිශෙෂයාගේ නාදයතෙම; (පණාබෙර නාදයයි සේයි) මහාර්ණවෞඝඃ, මහාසාගර ජලප්‍රවාහය තෙම; ජලාන්තරාණිඉව, අන්‍ය ජලයන් අතුරුදහන් කරන්නාක්මෙන්; ශබ්දාන්තරාණි, අන්‍ය ශබ්දයන් හෙවත් නාදයන්; අන්තරයාංචකාර, අන්තර්හිත කෙළේය හෙවත් වැසුවේය.

25. යතඃ ස භර්තා ජගතාං ජගාම
ධර්ත්‍රීං ධරිත්‍ර්‍යාඃ ඵණිනා තතො'ධඃ
මහාභරභුග්නශිරඃසහස්‍ර
සාහායකව්‍යග්‍රභුජං ප්‍රසස්‍රෙ.

---

**තස්‍ය පටහප්‍රණාදඃ ශබ්දාන්තරාණි අනන්‍යානාං චකාර,** යනු මෙහි ක්‍රි- යි. යාතුමිච්ඡතීති සියාසන් (තස්‍ය) මහීංධරන්තීති මහීධ්‍රාඃ (පර්වතාඃ) තෙෂාම් රන්ධ්‍රාණි (බිලානි) භිනත්තීති= භිද, මහීධ්‍රරන්ධ්‍රාණාම් භිද (භෙදනම්)= අතිශයෙන පටුරිති පටීයාන් මහිධ්‍රරන්ධ්‍රභිදා යාම් පටීයාන්= පටහස්‍යප්‍රණාදඃ= අන්‍යානි ජලානි ජලාන්තරාණි මහාංශවාසාවර්ණවශෙචති= තස්‍යඝොෂඃ= අන්‍යානි ශබ්දානි ශබ්දාන්තරාණි, මෙහි අන්තරශබ්දය අන්‍යාර්ථයි අන්තරයා චකාර, යනු අනන්‍යානීවාච් අන්තරශබ්දයා කෙරෙන් ච්‍ෂි, ප්‍රත්‍යය හා ආම්ප්‍රත්‍යයයි, පසුව, කෘ ධාතුයා කෙරෙන් පරොක්ෂලිට්- ණප්, ප්‍රත්‍යයි- ඩු-කෘඤ්, කරණෙ ධාතුයි **උපමා අලංකාරයි.**

25. භර්තා, ජගත්භර්තෘවූ හෙවත් තමන් කුක්ෂියෙහි සව්ලෝකයා ඇති; සඃ, ඒ ශ්‍රීකෘෂ්ණතෙම; යතඃ, යම් මහීමාර්ගයෙකින්; ජගාම, ගියේද; තතඃ, ඒ භූභාගයෙන්; අධඃ, යට හෙවත් පාතාලයෙහි; ධරිත්‍ර්‍යාඃ ධර්ත්‍රීං, පෘථුවිය ධරන්නාවූ; ඵණිනා, ශෙෂනම් නාගයා විසින්; මහාභර,මහත්වූබර කරණකොටගෙණ; ආභුග්න,භාත්පසින් වක්වූ හෙවත් කුදුවූ; ශිරඃසහස්‍ර, ශීර්ෂසහස්‍රයාගෙ හෙවත් දහස් ගණන් ශීර්ෂසමූහයකිවූ; සාහායක, සහායකම්යෙහි; ව්‍යග්‍රභුජං, යුහු සුලුවූ භුජඇතිසේ; ප්‍රසස්‍රෙ, ප්‍රසෘතවීමයි.

**සඃ යතඃ ජගාම,** යනුද. **ගතො ධඃ ඵණිනා මහාභරභුග්න- ව්‍යග්‍රභුජං ප්‍රසස්‍රෙ,** යනුද, මෙහි ක්‍රි- යි. ජගාම, යනු පරොක්ෂලිට්යි ගම්ඍ, ගතෞ ධාතුවෙන් ණප්, ප්‍රත්‍යයි ප්‍රසස්‍රෙ, යනුද පරොක්ෂලිට්යි ප්‍රපූර්ව සෘ,ගතෞ ධාතුවෙන්, ඵ, ප්‍රත්‍යයි, මහාංශවාසෞ භරශෙචති, මහාභරඃ ආ,සමන්තාත් භුග්නම්= මහාභරෙණ ආභුග්නම්= ශිරසාම් සහස්‍රම්= මහාභරාභුග්නඤ්ච තත් ශිරඃසහස්‍රඤ්චෙති=(තස්‍ය) සාහායකෙ (සහායකර්මණි) ව්‍යාග්‍රාඃභුජාඃ යස්මින්තත්= (තථා) මේ ගර්භ සමාස පදය ප්‍රසස්‍රෙ යන භාවක්‍රියා පදයාහට විශෙෂණයි **අතිශයොක්ති අලංකාරයි.**

26. අථො'ච්චකෛර්'ස්තොරණසඞ්ගභඞ්ග
භයාවනම්‍රීකෘතකේතනානි
ක්‍රියාඵලානීව සුනීතිභාජං
සෛන්‍යානි සොමාන්වය'මන්වයුස්තම්.

27. ශ්‍යාමාරුණෛර්'වාරණදානතොයෛ
රාලොඩිතාඃ කාඤ්චනභූපරාගාඃ
ආනේමි මග්නෛඃ ශිතිකණ්ඨපක්ෂ
ක්ෂොදද්‍යුතශ්චුක්ෂුදිරෙ රථෞඝෛඃ.

---

26. අථ, ඒප්‍රසෘතියට හෙවත් විෂ්ණුහුගෙ චලනයට අනතුරුව; උච්චෛස්තොරණ, උස්වූ තොරණෙහි; සඞ්ග, ආශක්තවීමෙන්; භඞ්ග. බිඳුනාවූ හෙවත් වෙන්වූ; භයාවනම්‍රීකෘත, බියෙන් පහතට නැමීම කරණලද; කේතනානි, භවනඇති; සෛන්‍යානි, සෛන්‍යයෝතුමූ; සොමාන්වයං, සොමසන්තානය හෙවත් සොමසන්තානිවූ; (චන්ද්‍රවංශය ඇත්තාවූ යී සේයි) තං, ඒ ශ්‍රීකෘෂ්ණයා; අන්වයුඃ, අනුව ගියාහුය; (කෙසේදයත්?) ක්‍රියාඵලානි, ක්‍රියාවන් සම්බන්ධවූ ඵලයෝතුමූ හෙවත් සාමාදි උපාය ප්‍රයෝගයන්ගේ ඵලයෝතුමූ; සුනීති භාජං, සුන්දරනීතීන් භජනයකරන්හු (අන්වයුඃඉව) අනුව යන්න වුන් මෙනි.

**සෛන්‍යානිතම් අන්වයුඃ,** යනු මෙහි ක්‍රි- යි අන්වයුඃ, යනු පරොක්ෂ ලිට්යි, අනුපූර්ව යා, ප්‍රාපණෙ ධාතුවෙන්, උස්, ප්‍රත්‍යයි තොරණෙ, සඞ්ගඃ = තොරණසඞ්ගන, භඞ්ගඃ = තොරණ සඞ්ගභඞ්ගාත් (ජාතම්) භයං= තොරණසඞ්ගභඞ්ගභයෙන අවනම්‍රීකෘතානි කෙතනානි යෙෂාන්ති= ක්‍රියාණාම් (සාමාද්‍යුපාය ප්‍රයොගානාම්) ඵලානි= සුෂ්ඨුනීතිඃ සුනීතිඃ සුනීතිම්භජතීති සුනීතිභාක්, (තාම්) සොමස්‍යඅන්වයඃ (සන්තානඃ) සොමාන්වයඃ (තම්) යනු විග්‍රහයි- **උපමාලඞ්කාරයි.**

27. ශ්‍යාමාරුණෛඃ, සම්වන්වූද අරුණුවන්වූද; වාරණදාන තොයෛඃ, හස්තීන්ගෙ මදජලයෙන්; ආලොඩිතාඃ, කලතනලද්දවූ; ශිතිකණ්ඨ, (එහෙයින්ම) මොනරුන්ගෙ; පක්ෂක්ෂොදද්‍යුතඃ, පිල් සුණු සෙයින් බබලන්නාවූ; කාඤ්චනභූපරාගාඃ, සවණ්භූමින් සම්බන්ධවූ රජස් හෙවත් පාංශුහු; ආනෙමි, නිම්වළලු පැතිරගෙණ; මග්නෛඃ, නිමග්නවූ හෙවත් ගැලුණාවූ; රථෞඝෛඃ, රියසමූහයන් විසින්; චුක්ෂුදිරෙ, සුණුකරණලද්දහුය.

28. න ලඞ්ඝයාමාස මහාජනානාං
ශිරාංසි නෛවොද්ධති'මාජගාම
ආවෙෂ්ටිතාෂ්ටාපදභූමිරේණුඃ
පදාහතො යත්සදෘශං ගරිම්ණඃ.

29. නිරුධ්‍යමානා යදුභිඃ කථඤ්චින්
මුහු'රුදූච්චික්ෂිපුරග්‍රපාදාන්
ධ්‍රැවං ගුරූන්මාර්ගරුධඃ කරීන්ද්‍රා
නුල්ලඞ්ඝ්‍ය ගන්තුං තුරගාස්තදීප්සුඃ.

---

**රථෞඝභාසඃ කාදම්බනභූපරාගාඃ චුක්ෂුදිරෙ,** යනු මෙහි ක්‍රි- යි. චුක්ෂුදිරෙ, යනු පරොක්ෂ ලිට් යි, ක්ෂුද, පෙෂණෙ ධාතුවෙන්, ඉරෙ ප්‍රත්‍යයි, ශ්‍යාමානිවාරුණානිච=(තෛඃ)(කෘෂ්ණලොහිතෛරිත්‍යර්ථඃ) වාරණානාම් දානතොයානි (මදජලානි)= (තෛඃ) කාදම්බනස්‍යභූඃ, කාදම්බනභූඃ තස්‍යාඃ පරාගාඃ (පාංශවඃ=තෙම් අභිව්‍යාප්‍යෙති ආතෙම් ආඞ්මර්‍යාදාභිවිධ්‍යොඃ, යනුවෙන් අභිවිධි අර්ථයෙහි අව්‍යයීභාවයි ශිතිකණ්ඨානාං (මයූරාණාම්) පක්ෂාඃ= තෙෂාම්ක්ෂොද (මයූරබර්හිචූර්ණ ඉව) ද්‍යොතනානිති= රථානාමොඝාඃ= (තෛඃ) යනු නිර්වචනයි. **ඉති ශබ්දොක්ති අලංකාරයි.**

28. අෂ්ටාපදභූමි, අෂ්ටධාතුන්හි ප්‍රතිෂ්ඨාඇත්තහු සම්බන්ධිවූ හෙවත් ස්වර්ණ සම්බන්ධිවූ භූමිහුගෙ; රේණුඃ, පරාගය; පදාහතඃ, රථාශ්වාදීන්ගෙ පාදවලින් තාඩිතවූයේ; මහාජනානාම්, බොහෝ ජනයන්ගෙ දෙතෝ නොහොත් මහත්ජනයයි කියනලද පූජ්‍යයන්ගෙ; ශිරාංසි, ශීර්ෂයන්; නලඞ්ඝයාමාස, නොඉක්මවූයේය; උද්ධතිං, නැගීයාමට දෙහෝ නොහොත් උද්ධතැගුබවකටත්; නආජගාම, නොපැමිණියේය; යත්, යම්හෙයකින්; ගරිම්ණඃ, ගුරුත්වයට හෙවත් මාහාත්ම්‍යයට; සදෘශං, සුදුසුසේ; අවෙෂ්ටිත, වෙෂ්ටාකෙළේද එහෙයිනි.

**අෂ්ටාපද භූමිරේණුඃ ශිරාංසි නලඞ්ඝයාමාස,** යනුද, **(සඃ) උද්ධතිං නආජගාම,** යනුද, **(සඃ) ගරිම්ණඃ සදෘශං අවෙෂ්ටිත,** යනුද, මෙහි ක්‍රි- යි. නලඞ්ඝයාමාස, යනු පරොක්ෂලිට් යි, තඤ්පූර්ව ලඝි, ගත්‍යාම් ධාතුවෙන්, ණිප්, ප්‍රත්‍යය හා ආම් ප්‍රත්‍යයි අස්භූවී අනුප්‍රයෝගයි නආජගාම යනු නඤ්ආඞ්පූර්ව ගම්ඝ, ගතෞධාතුවෙන්, ණප්, ප්‍රත්‍යයි, අවෙෂ්ටත, යනු භූතාර්ථ ලුඞ්යි වෙෂ්ට, ඊහායාම් ධාතුවෙන්, තන්, ප්‍රත්‍යයි, ගුරොර්භාවො ගරිමා ( තස්‍ය ) මෙහි ගුරුශබ්දයට 'ප්‍රියස්ථිර' යනාදීන් ගරාදෙශයි. **සමාසොක්ති අලංකාරයි.**

29. තුරගාඃ, අශ්වයෝ තුමූ; යදුභිඃ, යදුකුලිකයන් විසින් හෙවත් යදුවංශිකයන් විසින් ආරූඪවූ අශ්වයෝතුමූ; කථඤ්චිත්, කෙසේතුමූත් (ඉතා උත්සාහයෙනැයි සේයි;) නිරුධ්‍යමානඃ, වලකනු

30. අවෙක්ෂිතානායතවල්ගමග්‍රෙ
තුරඞ්ගිභිර්‍යත්‍නනිරුඞ්වාහෛඃ
ප්‍රක්‍රීඩිතාන්‍රෙණුභි'රේත්‍ය තූෂ්ණිං
තිත්‍යුජ්ජිතත්‍යඃ පෘථුකාන්පථිභ්‍යඃ

31. දිදෘක්ෂමාණාඃ ප්‍රතිරථ්‍යමීයු
මුරාරිමාරාදනඝං ජනෞඝාඃ
අනෙකශඃ සංස්තු'තමප්‍යනල්පා
නවං නවං ප්‍රීති'රහො කරොති.

---

ලබන්නාහුද? යත්, යම්හෙයකින්; අග්‍රපාදන්, අක්පා හෙවත් ඉදිරියෙහිවූ පාදයන්; මුහුඃ, වරක් හෙවත් ක්ෂණ ක්ෂණයෙහි; උච්චික්ෂිපුඃ එසෙව්වාහුද; තත්, එහෙයින්; මාගීර්‍රුඪඃ, මංවළහන්නාවූ; ගුරූන්, මහත්වූ නොහොත් පූජ්‍යවූ; කරිඤ්‍ජාන්, හස්තිරාජයන්; උල්ලඞ්ඝ්‍ය, අතික්‍රමනයකොට (ඉක්මවා;) ගන්තුං, යන්ට; ඊෂුඃ ධ්‍රුවම්, කැමතිවූවාක්මෙන්වූහ හෙවත් කැමතිවූහයි සලකනුලැබේ.

**තුරගාඃ අග්‍රපාදන් උච්චික්ෂිපුඃ**, යනුද, **තුරගාඃ කරිඤ්‍ජාන් උල්ලඞ්ඝ්‍යධ්‍රුවම් ගන්තුං ඊෂුඃ**, යනුද මෙහි ක්‍රි- යි. උච්චික්ෂිපුඃ යනු පරොක්‍ෂලිට්යි, උත්පූර්‍ව ක්ෂිප, ප්‍රෙරණෙ ධාතුවෙන්, උස්,ප්‍රත්‍යයි ඊෂුඃ යනුද පරොක්‍ෂලිට්යි, ඉෂු,ඉච්ඡායාම් ධාතුවෙන්, උස්, ප්‍රත්‍යයි, සමාස විග්‍රහවාක්‍ය සුබොධයි, මාගීම්රූඪිනාතීති, මාගීරූඪඃ (මඟගමනෙන මාගීරොධිනඉත්‍යර්ථඃ) **උත්‍ප්‍රෙක්‍ෂා ලඞ්කාරයි**.

30. ආයතවල්ගා, ආකර්ෂණය කරණලද මුවරුහැන් ඇතිසේ; යත්නනිරුඪවාහෛ, උත්සාහයෙන් වළහනලද අසුන්ඇති; තුරඞ්ගිභිඃ, තුරඞ්ගීන් විසින් හෙවත් අශ්වසෙනාවන් විසින්; අග්‍රෙ, ඉදිරියෙහි; අවෙක්ෂිතාන්, නොදක්නා ලද්දවූ; රෙණුභිඃ, පාංශුවලින් හෙවත් රජසින්; ප්‍රක්‍රීඩිතාන්, ප්‍රකර්ෂයෙන් ක්‍රීඩාකරන්නාවූ හෙවත් පාංශුක්‍රීඩාකරන්නාවූ; පෘථුකාන්, බාලකයන්කරු; ජනත්‍යඃ, මව්වරු තූෂ්ණිං, වහා; එත්‍ය, අවුත්; පථිභ්‍යඃ, මාගීවලින්; නිත්‍යුඃ, අපනීත කළාහුය (ඉවත්කරගත්තාහු යයි සේයි)

ආයතා (ආකෘෂ්ටා) වල්ගා (මුඛරජ්ජුර්) යෙසම්න්,තත්=යත්නෙන (අතිප්‍රයත්නෙන) නිරුඪා,වාහාඃ යෛ,සෙනා=( තෛඃ) ප්‍රක්‍රීඩන්තීති ප්‍රක්‍රීඩිතාඃ,(තාන්) මෙහි කර්තෘකාරක ක්ත,ප්‍රත්‍යයි. **ස්වභාවොක්ති අලංකාරයි**

31. අනඝං, නිදොෂවූ; මුරාරිං, ශ්‍රීවිෂ්ණුහු; දිදෘක්ෂමාණාඃ, දකිනු කැමැත්තාවූ; ජනෞඝාඃ, ජනසමූහයෝතුමූ; ආරාත්, සමීපයෙහි; ප්‍රතිරථ්‍යම්, වීථියක්පාසා; ඊයුඃ, ගියාහුය; අනෙකශඃ, නොයෙක්වර;

32. උපෙයුෂො වර්ත්ම නිරන්තරාභි
රසෞ නිරුච්ඡ්වාසමනීකිනීභිඃ
රථස්‍ය තස්‍යාං පුරි දත්තචක්ෂු
ර්විද්වාන් විදාමාස ශනෛර්'නී යාතම්.

මධ්‍යෙ සමුද්‍රං කකුභඃ පිශඞ්ගී
යා කුර්වතී කාඤ්චනවප්‍රභාසා
තුරඞ්ගකාන්තාමුඛහව්‍යවාහ
ජ්වාලෙව භිත්වා ජල'මුල්ලලාස.

---

සංස්තුතංඅපි, පරිචරණය කරණලද්දාවූද හෙවත් පුරුදුකරණ ලද්දාවූද වස්තුව; අනල්පාප්‍රීතිඃ, අධිකවූ ප්‍රීතිතොම; නවංනවංකරොති, අලුත් අලුත් කෙරෙයි; අහො, ආශ්චර්යයි.

**ජනෞඝාඃ ආරාත් ප්‍රතිරථ්‍යම් ඊයුඃ,** යනුද, **අනල්පා,ප්‍රීතිඃ සංස්තුතංඅපි නවංනවංකරොති,** යනුද මෙහි ක්‍රි- යි. ඊයුඃ, යනු, පරොක්ෂලිට්යි, ඉණ්,ගතෞ ධාතුවෙන්, උස්, ප්‍රත්‍යයි, කරොති, යනු වර්ත- ලට්යි, ඩුකෘඤ්, කරණෙ ධාතුවෙන්, තිප් ප්‍රත්‍ය යි, දෘෂ්ටුම්වජන් තිති දිදෘක්ෂමාණාඃ රථ්‍යාම්රථ්‍යාම්ප්‍රති,ප්‍රතිරථ්‍යම්,නාස්තිඅඝම්(පාපං) යස්‍යසා- අනඝා (තාම්) ජනානාමොඝාඃ ජනෞඝාඃ, නඑකශඃ අනෙකශඃ නඅල්පාඅනල්පා යනු විග්‍රහයි. **අර්ථාන්තරන්‍යාසාලංකාරයි**.

32. විද්වාන්, පණ්ඩිතවූ; තස්‍යාම්පුරි, ඒ නුවරෙහි; දත්තචක්ෂුඃ, එහෙයින්ම දෙනලද ඇස්ඇති; අසෞ, මේ ශ්‍රීලක්ෂ්මණතෙම; නිරන්තරාභිඃ, අතරනැත්තාවූ; අනීකිනීභිඃ, සේනාවන් කරණකොටගෙණ නිරුච්ඡ්වාසං, උච්ඡ්වාසරහිතවූ හෙවත් අතිශයින් සඞ්කටවූ (ව්‍යාකුලවූ යි සේයි;) වර්ත්ම, මාර්ගයට; උපෙයුෂඃ, පැමිණියාවූ; රථස්‍ය, රථය සම්බන්ධීවූ; ශනෛඃයාතම්, සෙමින්යාම; නවිදාමාස, නොදත් තේය.

අසෞ, රථස්‍ය, ශනෛඃ, යාතම්, නවිදාමාස, යනු මෙහි ක්‍රි- යි. විදාමාස, යන තන්හි විද්, ඥානෙ ධාතුවෙන්, පරොක්ෂලිට්, ණප්, ප්‍රත්‍යයි, ආම්, ප්‍රත්‍යය හා, අස්, භුවි, අනුප්‍රයොගයි, නාස්තිඅන්තරං යාසාම්, තාඃ= (තාභිඃ) නාස්ති, උච්ඡ්වාසං යස්‍ය, තත්= දත්තෙ,චක්ෂුසී යස්‍ය,යෙනවා,සඃ= යනු විග්‍රහ වාක්‍යයි. **කාව්‍යලිඞ්ගාලඞ්කාරයි.**

33. මධ්‍යෙසමුද්‍රං, මුහුදමැද; කාඤ්චනවප්‍රභාසා, සුවර්ණමය ප්‍රාකාරයන් සම්බන්ධීවූ කාන්තියෙන්; කකුභඃ, දිශාවන්; පිශඞ්ගීඃ, පිඟුවන් කරන්නාවූ; යා, යම් පුරියක්තොම; ජලම්භිත්වා, සමුද්‍ර

34. කෘතාස්පදා භූමිභෘතාං සහස්‍රෛ
රුදන්වදම්භඃ පරිවීතමූර්තිඃ
අනිර්විදා යා විදධෙ විධාත්‍රා
පෘථ්වී පෘථ්ව්‍යාඃ ප්‍රතියාතනෙව.

---

ජලය බිඳගෙණ (නැංගාවූ); තුරඞ්ගකාන්තාමුඛ, වෙළඹගෙ මුඛයෙහිවූ; හව්‍ය, ගින්නසම්බන්ධිවූ හෙවත් වඩබාග්නිහුගෙ; ජ්වාලාඉව, ජ්වාලාවක් මෙන් හෙවත් දැල්ලක්මෙන්; උල්ලලාස, උසස්ව බැබලිණිද.

**සා (පුරී) ජලම් භිත්වා, තුරඞ්ගජ්වාලෙ,ව උල්ලලාස,** යනු මෙහි ක්‍රි- සි. උල්ලලාස, යනු පරොක්‍ෂලිට් සි, උත්පූර්ව,ලස, ශ්ලෙෂණ ක්‍රීඩායාම්, දීප්ත්‍යෞව, යන ධාතුවෙන්, ණප්, ප්‍රත්‍යයසි, සමුද්‍රස්‍ය මධ්‍යෙ, මධ්‍යසමුද්‍රම්, 'පාරෙමධ්‍යෙෂෂ්ඨ්‍යාවා' යනුවෙන් අව්‍යයී භාවයි, තත් සන්නියොග හෙයින් මධ්‍යශබ්දයාගෙ ඒකාරාන්තබවයි, පිශඞ්ග ආසාමයතීති= (තාඃ) කාඤ්චනමයං (ස්වර්ණමයං) වප්‍රං= තැස්‍යභාඃ (දීප්තිඃ)= (තයා) තුරඞ්ගාණාම් කාන්තා= (තස්‍යාඃ) මුඛම් තුරඞ්ග කාන්තාමුඛම් (තස්මින්) හව්‍යම්වහතීති = (තස්‍ය) ජ්වාලා,තුරඞ්ග- ජ්ජාලා: යනු විග්‍රහවාක්‍යයි.

මධ්‍යෙ ශබ්දෙ ධ්‍රුවං නූනං ප්‍රාය ඉත්‍යෙවමාදිභිඃ
උත්ප්‍රෙක්‍ෂා ව්‍යජ්‍යතෙශබ්දෛ 'රිව ශබ්දොපි තාදෘශඃ

යනු කී හෙයින් උපමානොව **උත්ප්‍රෙක්‍ෂාලඞ්කාරයි.**

34. භූමිභෘතාම්, රජුන් සම්බන්ධිවූ දෙහෝ නොහොත් පර්වත යන් සම්බන්ධිවූ; සහස්‍රෛඃ, දහස්ගණනින් හෙවත් දහස්ගණන් මිහිපලුන් විසින් හෝ පර්වතයන් විසින්; කෘතාස්පද, කරණලද අධිෂ්ඨාන ඇති; උදන්වදම්භඃ, සාගරජලයෙන්; පරිවීතමූර්තිඃ, හාත්පසින් වෙළුනාවූ මූර්තිඇති හෙවත් ස්වරූපඇති; පෘථ්වී, පුළුල්වූ හෙවත් මහත්වූ; යා, යම් පුරියක්තොම; අනිර්විදා, නිර්විත්නොවූ හෙවත් ඛෙදප්‍රාප්තනොවූ; විධාත්‍රා, මහබඹු විසින්; පෘථ්ව්‍යාඃ, පෘථිවීහුගෙ; ප්‍රතියාතනාඉව, ප්‍රතිකෘතියක් මෙන් හෙවත් ප්‍රතිච්ඡායාවක් මෙන්; විදධෙ, කරණලදද (ඒ පුරියයි)

**විධාත්‍රා සා(පුරී)පෘථ්ව්‍යාඃ ප්‍රතියාතනෙව,විදධෙ,** යනු මෙහි ක්‍රි- සි. විදධෙ, යනු විපූර්ව ධාඤ්,ධාරණපොෂණයොඃ යන ධාතුහු ෙකාරෙන් පරොක්‍ෂලිට් කර්මකාරක එ ප්‍රත්‍යයෙන් සිඩයි, භූමිං බිභ්‍රතීති භූමිභෘතඃ (තෙෂාම්) කෘතංආස්පදං (ප්‍රතිෂ්ඨා) යයා සා=උදක

35. ත්වෂ්ටුඃ සදභ්‍යාසගෘහීතශිල්ප
විඥානසංපත් ප්‍රසරස්‍ය සීමා
අදෘශ්‍යතාදර්ශතලාමලේෂු
ඡායේව යා ස්වර්ජලධේ'ර්ජලේෂු.

36. රථාඞ්ගභර්ත්‍රේ'භිනවං වරාය
යස්‍යාඃ පිතේව ප්‍රතිපාදිතායාඃ
ප්‍රේම්ණෝපකණ්ඨං මුහුරඞ්කභාජෝ
රත්නාවලී'රම්බුධි'රාබබන්ධ.

---

මස්‍යාසන්තීති උදන්වාන් තස්‍ය, අම්භාංසි= උදකාමෙභාභිඃ පරිවීතා (පරිවේෂ්ටිතා) මූර්තිඃ (ස්වරූපං) යස්‍යාඃ සා= න නිර්විද්‍යතෙ, නබිද්‍යතෙ ඉත්‍යනිර්විත් (තෙන) ප්‍රථතඉති පෘථ්වී, යනු විග්‍රහයි, **උත්ප්‍රේක්ෂා ලඞ්කාරයි.**

35. **ත්වෂ්ටුඃ,** ත්වෂ්ට්‍රෘහුගෙ හෙවත් විශ්වකර්මන්හුගෙ; සදභ්‍යාස සැමකල්හි හෙවත් නිතර පුරුදුකිරීමෙන්; ගෘහීත, ගන්නාලද්දාවූ; ශිල්පවිඥානසංපත්, ශිල්පඥාන සම්පත් සම්බන්ධවූ; ප්‍රසරස්‍ය, ප්‍රකර්ෂයාගෙ; සීමා, හිම්වූ හෙවත් ප්‍රතිමාරහිත ඉම්වූ; යා, යම් පුරියක් තොම; ආදර්ශතලාමලේෂු, දර්පනතලයන් මෙන් නිර්මලවූ; ජලධේඃ ජලේෂු, මහසයුර සම්බන්ධවූ ජලයන්හි; ස්වර්ඡායාඉව, ස්වර්ගීය සම්බන්ධවූ ප්‍රතිබිම්බයමෙන්; අලක්ෂ්‍යත, දක්නාලැබීද (ඒ පුරියයි)

**සා (පුරී) ජලධේඃ ජලේෂු ස්වර්ඡායාඉව, අලක්ෂ්‍යත,** යනු මෙහි ක්‍රි- යි. **අලක්ෂ්‍යත,** යනු භූතාර්ථලඞ්යි, ලක්ෂ, දර්ශනෙ අඞ්කනේච, යන ධාතුවෙන්, තන් ප්‍රත්‍යයි, (සද) භ්‍යාසෙන ගෘහීතඃ (ලබ්ධඃ) = ශිල්පස්‍ය, විඥානං= ශිල්පවිඥානමෙව සංපත්= තස්‍යාඃ ප්‍රසරඃ (ප්‍රකර්ෂඃ)= (තස්‍ය) ආදර්ශානාම් (ආදර්ශස්‍යවා) තලානි= තානිව අමලානි (නිර්මලානි) (තේෂු) යනු විග්‍රහයි, **උත්ප්‍රේක්ෂා ලඞ්කාරයි.**

36. **අම්බුධිඃ,** සාගරය තෙම; පිතාඉව, පියා මෙන්; වරාය, ශ්‍රේෂ්ඨවූ දෙහෝ නොහොත් බෑණාවූ; රථාඞ්ගභර්ත්‍රේ, රථාඞ්ග භර්ත්‍රෘ හට හෙවත් චක්‍රධරයයි කියනලද ශ්‍රීවිෂ්ණුහට; අභිනවං, අලුත්සේ; ප්‍රතිපාදිතායාඃ, ප්‍රතිපාදනය කරණ ලද්දාවූ; අඞ්කභාජඃ, සමීපය නොහොත් ඇකය භජනයකරන්නාවූ; යස්‍යාඃ, යම් පුරියක්හුගෙ; උපකණ්ඨං, සමීපයේ දෙහෝ නොහොත් ග්‍රීවයෙහි; මුහුඃ, වරක්; ප්‍රේම්ණා, ප්‍රේමය කාරණකොටගෙණ; රත්නාවලීඃ, රුවන්දම්; ආබබන්ධ, හාත්පසින් බැන්දේද? (ඒ පුරියයි)

37. යස්‍යා'ශ්චලද්වාරිධිවාරිවීචි
ච්ඡටොච්ඡලච්ඡඞ්ඛකුලාකුලෙන
වප්‍රෙණ පර්‍ය්‍යන්තචරොඩුචක්‍රඃ
සුමෙරුවප්‍රො'න්වහ'මන්වකාරි.

---

**අම්බුධිඃ යස්‍යාඃ උපකණ්ඨං මුහුඃ රත්නාවලීඃ ආබබන්ධ,** යනු මෙහි ක්‍රි- යි. ආබබන්ධ යනු පරොක්‍ෂලිට් යි, ආඞ්පූර්ව බන්ධ,බන්ධනෙ, යන ධාතුවෙන්, ණප්, ප්‍රත්‍යයි මෙහි සම්බන්ධ වාක්‍යාදිය සුබොධයි, උපකණ්ඨං, යන තන්හි අත්‍යන්ත සංයොගයෙහි විභක්තියි, කාලාධ්වනොර් නෛරන්තර්‍ය්‍යෙ' යනුවෙන් ප්‍රකාශිත අර්ථයත් මෙහි ප්‍රකට වශයෙන් නොහැඟෙන නුමුත් ටීකාවචන හෙයින් විමසිය යුතුයි. **ශ්ලෙෂොපමාලංකාරයි.**

37. චලත්, සැලෙන්නාවූ; වාරිධිවාරිවීචි, සමුද්‍රජලය සම්බන්ධවූ තරඞ්ගයන්ගෙ; ඡටොත්ඡලත්, පරම්පරාවන්හි හෙවත් මුහුදුදියෙ (ජල)තරඞ්ගපඞ්ක්තින්හි උත්පතනයකරන්නාවූ; ශඞ්ඛකුලාකුලෙන, ශඞ්ඛසමූහයන් කරණකොටගෙණ හෙවත් සක්පෙලින් ගැවසීගත් නාවූ; යස්‍යාඃ, යම් පුරියක්හුගෙ; වප්‍රෙණ, පව්ර විසින්; පර්‍ය්‍යන්තචර, සමීපයෙහි නොහොත් ප්‍රාන්තයෙහි හැසිරෙන්නාවූ; උඩුචක්‍රඃ, නක්‍ෂත්‍ර මණ්ඩලඇති; සුමෙරුවප්‍රඃ, මහමෙර සම්බන්ධවූ සානුප්‍රදෙශය තෙම; අන්වහං, දිනපතා; අන්වකාරි, අනුකෘතද හෙවත් තත් සදෘශ බවට පමුණුවන ලද්දේද (ඒ පුරියයි)

**යස්‍යාඃ වප්‍රෙණ සුමෙරුවප්‍රඃ අන්වහං අන්වකාරි,** යනු මෙහි ක්‍රි- යි. අන්වකාරි යනු භූතාර්ථලුඞ්යි අනුපූර්ව ඩුකෘඤ්, කරණෙ, ධාතුවෙන්, තන්, ප්‍රත්‍යයි, වාරිණි, ධීයන්තෙස්මින්නිති වාරිධිඃ, වාරිධෙර්වාරීණි = වාරිධිවාරීණාම් වීචයඃ = චලන්ත්‍යශ්ච තාඃ වාරිධිවාරිවීචයශ්චෙති= (තාසාම්) ඡටාඃ= තාසු, උච්ඡලන්තඃ ශඞ්ඛාඃ= ශඞ්ඛානාං කුලානි= වාරිධිවාරිවීචිච්ඡටාසු= උච්ඡලන්තිච තානි ශඞ්ඛකුලානි චෙති= තෛ'රාකුලඃ= (තෙන) මෙහි වාරිධි- ඡටාසු උච්ඡලන්තීති= යි කෘත්සමාසයෙන් පසුව, වාරිධි- ඡටොච්ඡලන්තිච තානි ශඞ්ඛකුලානිචෙති, යි කර්මධාරයද ඉක්බිති කරණවිභක්ති තත් පුරුෂසමාසයද වූබැව් සැලකිය යුතුයි

අර්ථය පැහැදිලිකොට දැක්වීම පිණිස, ටීකායෙහි 'ඡටාසුපරම්පරාසුච්ඡලද්භිරුද්පතත්භිඃ ශඞ්ඛානාම් කුලෛරාකුලෙන' යී වාක්‍ය වශයෙන් නිදර්ශිතයි. පර්‍ය්‍යන්තෙ, චරන්තීති= උඩූනාම් (නක්‍ෂත්‍රාණාම්) චක්‍රම්= පර්‍ය්‍යන්තචරංඋඩුචක්‍රම් (නක්‍ෂත්‍රමණ්ඩලං) යස්‍ය, සඃ= අහන්‍ය හනීත්‍යන්වහම් යනු විග්‍රහයි. **උපමාලඞ්කාරයි.**

38. වණික්පථෙ පූගකෘතානි යත්‍ර
භ්‍රමාගතෛ'රම්බුභිරම්බුරාශිඃ
ලොලෛරලොලද්‍යුතිභාඤ්ජි මුෂ්ණන්
රත්නානි රත්නාකරතා'මවාප.

39. අම්භශ්චුතඃ කොමලරත්නරාශී
නපාංනිධිඃ ජෛනපිනද්ධභාසඃ
යත්‍රාතපෙ දතුමිවාධිතල්පං
විස්තාරයාමාස තරඞ්ගහස්තෛඃ.

---

38. යත්‍ර, යම් පුරියෙක්හි; වණික්පථෙ, වෙළඳමහෙහි; පූග කෘතානි, රැස්කරණලද; අලොලද්‍යුතිභාඤ්ජි, නොසැලෙන්නාවූ හෙවත් සථිරප්‍රභා භජනය කරන්නාවූ; රත්නානි, රත්නයෝ තුමූ; ලොලෛඃ, චංචලවූ; භ්‍රමාගතෛඃ, එහෙයින්ම භ්‍රමයෙන් ආවාවූ හෙවත් ජලනිර්ගමමාර්ගයෙන් ආවාවූ; අම්බුභිඃ, ජලයෙන් හරණකොට ගෙණ; මුෂ්ණන්, සොරකම් කරන්නාවූ හෙවත් පැහැරගන්නාවූ; අම්බුරාශිඃ, සාගරය තෙම; රත්නාකරතාම්, රුවන් ආකරයබවට; අවාප, පැමිණියේද (ඒ පුරියයි)

**අම්බුරාශිඃ රත්නාකරතාම'වාප,** යනු මෙහි ක්‍රි-යි. අවාප, යනු පරොක්ෂලිට් යි අවපූර්ව් අප,ප්‍රාපණෙ, ධාතුවෙන්. ණප්, ප්‍රත්‍යයි, වණිජාං,පන්ථාඃ=(ගසමින්) අපූගාඃ පූගාඃ (සම්පද්‍යමානානි) කෘතානි පූග කෘතානි, භ්‍රමාත් (ජලනිර්ගමමාර්ගාද්) ගතානි= භ්‍රමාගතානිච තානි අම්බූනි චෙති= (තෛඃ) අම්බූනාම්රාශිඃසය යත්‍රෙතිවා= නලොලා අලොලා අලොලාචසා ද්‍යුතිශ්චෙති=අලොලද්‍යුතිං භජන්තීති=රත්නානාමාකරඃ= තස්‍ය භාවඃ=(තාම්) යනු විග්‍රහයි. **අභිෂෙකාකනියි.**

39. යත්‍ර, යම් පුරියෙක්හි; අපාංනිධිඃ, මහසයුර තෙම; අම්භශ් චුතඃ, දිය විසුරුවන්නාවූ; ජෛණපිනද්ධභාසඃ, පෙනින් වැසුනාවූ කාන්තිඇති; කොමලරත්නරාශීන්, උත්කෘෂ්ටවූ රත්නසමූහයන්; ආතපෙ, අව්වෙහි; දතුංඉව, වියලීමට දෙන්ටමෙන් හෙවත් තබන්ට මෙන්; තරඞ්ගහස්තෛඃ, ජලතරඞ්ගනමැති හස්තයන් කරණකොට ගෙණ; අධිතල්පං, තල්පයන්හි හෙවත් අටව්වල; විස්තාරයාමාස, ප්‍රසාරිත කෙළේද (විදහාලූයේදයි සේයි) ඒ පුරියයි.

**අපාංනිධිඃ යත්‍ර කොමලරත්නරාශීන් තරඞ්ගහස්තෛර'ධිතල්පං විස්තාරයාමාස,** යනු මෙහි ක්‍රි- යි. විස්තාරයාමාස, යනු පරොක්ෂලිට්යි විපූර්ව් ස්තෘඤ්, සඞ්ඝාතෙ ධාතුවෙන් ණප්, ප්‍රත්‍යය හා ආම් ප්‍රත්‍යයයි, අස්භූවි අනුප්‍රයෝගයි අම්භශ්,ච්‍යොතන්ති, ක්ෂරන්තීත්‍යම්භ

40. යච්ඡාල'මුත්තුඞ්ගතයා විජේතුං
දූරාදුදස්ථීයත සාගරස්‍ය
මහෝ'ර්මිභිර්ව්‍යාහතවාඤ්ඡිතාර්ථෛර්
ව්‍රීඩාදි'වාභ්‍යාසගතෛ'ර්විලිල්‍යෙ.

41. කුතූහලෙනෛ'ව ජවාදු'පෙත්‍ය
ප්‍රාකාරභිත්ත්‍යා සහසා නිෂිද්ධඃ
රසත්‍යනාරෙ'දීද්භෘශම'ම්බුවෂී
ව්‍යාජෙන යස්‍යාං වහිරම්බුවාහඃ.

---

ශව්ද්‍යුතඃ කොමලානි(උත්ඵුල්ලානි)ච,භානි රත්නානිවෙති= තෙෂාම් ඍෂයඃ=(තාන්)ඵෙනෛඃ පිනඩාං,භාඃ යෙෂාම් තෙ=(තාන්) හලෙපසච 'වෙටෂ්ට'ත්‍ය'බිතල්පා' විභක්ත්‍යාර්ථෙව්‍යයීභාවඃ යනු කිහෙයින් මෙහි අව්‍යයීභාවයි, තරඞ්ගාඑව භස්තාඃ = (තෛඃ) යනු විග්‍රහ වාක්‍යයි. **උත්ප්‍රෙක්ෂා රූපකසංකරයි**.

40. සාගරස්‍ය, සමුද්‍රයාගෙ; මහෝර්මිභිඃ, මහත්වූ තරඞ්ගයන් විසින්; යච්ඡාලම්, යම් පුරියක්හුගෙ ප්‍රාකාරය; උත්තුඞ්ගතයා, උස්වූ බැවින්; විජේතුංඉව,(සතුරන්) දිනන්ටමෙන්; දූරාත්, දුරින්; උදස්ථීයත, නැඟීමවීද; අභ්‍යාසගතෛඃ, සමීපයට පැමිණියාවූ; ව්‍යාහත, නැසුනාවූ; වාඤ්ඡිතාර්ථෛඃ, ශාලවිජය රූපවූ අභිමතාර්ථඇති (දිනිමට අපොහොසත්වූ යී සේයි;) මහෝර්මිභිඃ, මහත්වූ තරඞ්ගයන් විසින්; ව්‍රීඩාත්ඉව, ලජ්ජායෙන් මෙන්; විලිල්‍යෙ, විලීන වීම වීද (ඒ පුරියයි)

**මහෝර්මිභිඃ යච්ඡාලම් විජේතුමිව උදස්ථීයත**, යනුද **මහෝර්මිභිඃ ව්‍රීඩාදිව, විලිල්‍යෙ**,යනුද මෙහි ක්‍රි-යි. උදස්ථීයත, යනු අනද්‍යතනලඞ්යි, උත් පූර්ව ෂ්ඨා,ගතිනිවෘත්තෞ, ධාතුවෙන්.තන්, ප්‍රත්‍යයි, විලිල්‍යෙ යනු විපූර්ව ලීඞ්,ගතෞ ධාතුවෙන් පරව පරොක්ෂලිට් භාව සාධන, එ, ප්‍රත්‍යයෙන් සිඩවූ ක්‍රියා පදයි, යස්‍යාඃ, ශාලඃ= (තම්) උත්තුඞ්ගස්‍යභාවොත්තුඞ්ගතා, (තයා) මහාන්තශ්චතෙ ඌර්මයශ්චෙති= (තෛඃ) වාඤ්ඡිතශ්චාසාවර්ථශ්චෙති= ව්‍යාහතොවාඤ්ඡිතාර්ථඃ (ශාලවිජයරූපො) යෙෂාම්තෙ= (තෛඃ) අභ්‍යාසං (සමීපං) ගතා,අභ්‍යාසගතාඃ (තෛඃ)යනු විග්‍රහවාක්‍යයි. **හෙතුඵලොත්ප්‍රෙක්ෂාසංකරයි.**

41. අම්බුවාහඃ, මේඝයතෙම; කුතූහලෙනඉව, කුහුලින් මෙන්; ජවාත්, වේගයෙන්; උපෙත්‍ය, උපගතව හෙවත් සමීපයට පැමිණ; යස්‍යාඃ, යම්පුරියක්හුගෙ; ප්‍රාකාරභිත්ත්‍යා, පව්රුබිතුවෙන්; සහසා,

42. යදඞ්ගහාරූපසරූපතායාඃ
කාංචිද්ගුණං භේදක'මිච්ඡතීභිඃ
ආරාධිතොඬා මනුරප්සරොභි
ශ්චක්‍රෙ ප්‍රජාඃ ස්වාඃ සනිමෙෂචිහ්නාඃ.

---

වහා; නිෂිඬඃ, වළකනලද්දේ; බහිඃ, පිටත්හි; රසන්, ගර්ජනය කරන්නේ ද්‍යෙහෝ නොහොත් දුකින් හඬන්නේ; අම්බුවර්ෂිව්‍යාජෙන, ජලවර්ෂණ ව්‍යාජයෙන්; භෘශම්, අතිශයින්; අරොදීත්, හැඬීද.

**අම්බුවාහඃ අම්බුවර්ෂව්‍යාජෙන, අරොදීත්,** යනු මෙහි ක්‍රි- සි. අරොදීත්, යනු භූතාර්ථ ලුඞසි, රුදිර්, අශ්‍රුවිමොචනෙ, ධාතුවෙන්, දිප්, ප්‍රත්‍යයසි, අම්බු,වහතීත්‍යම්බුවාහඃ (මෙඝඃ)කර්මයෙහි අණ්, යී අම්බුනාම් වර්ෂිඃ අම්බුවර්ෂිඃ තස්‍ය ව්‍යාජඃ=(තෙන) යනු විග්‍රහයි. **ශ්ලෙෂොත් ප්‍රෙක්ෂාලංකාරයි.**

42. යත්, යම්පුරියෙක්හි; අඞ්ගහාරූප, කාන්තාවන්ගෙ රූපසෞන්දර්යය හෝ ආකාරය සම්බන්ධවූ; සරූපතායාඃ, සරූපත්වයෙන්; (සදෘශාකාරභාවයෙන්යි සේයි) භෙදකං, වෙනස්කරන්නාවූ; කාංචිද් ගුණං, කිසියම් ගුණයක් හෙවත් ධර්මයක්; ඉච්ඡතීභිඃ, කැමත්තාවූ; අප්සරොභිඃ, දෙවඟනන් විසින්; ආරාධිතඃ, ආරාධනයකරණලද්දාවූ හෙවත් පතනලද්දාවූ; මනුඃ, මනුතෙම හෙවත් මානුෂසෘෂ්ටිකර්තෘතෙම; ස්වාඃප්‍රජාඃ, ස්වකීයප්‍රජාවන්; සනිමෙෂචිහ්නාඃ, ඇසිපියගෙළුම් නමැති ලකුණුසහිතවූවන්; චක්‍රෙ,අඩා,(නිර්මිත) කළාක්මෙන් වීද.

**මනුඃ ස්වාඃ ප්‍රජාඃ සනිමෙෂචිහ්නාඃ චක්‍රෙ,**අඩා, යනු මෙහි ක්‍රි–සි. චක්‍රෙ, යනු පරොක්ෂලිට් යි, ඩුකෘඤ්, කරණෙ ධාතුවෙන්, එ ප්‍රත්‍යයසි, යස්‍යාමඞ්ගනාඃ= තාසාමිරූපං (සෞන්දර්යමාකාරොවා)= තස්‍ය,සරූපතා= (තස්‍යාඃ) ඉච්ඡන්තීති ඉච්ඡන්ත්‍යඃ (තාභිඃ) (අපෙක්ෂමානාභිරිත්‍යර්ථඃ) මෙහි, 'ආච්ඡීනද්‍යොර්නුම්' යනුවෙන් විකල්පවසයෙන් නුම්හුගෙ අභාවයයි, නිමෙෂඃ පක්ෂ්මපාත එව චිහ්නං (ව්‍යාවර්තකං)= නිමෙෂචිහ්නෙන සහ වර්තන්තඉති සනිමෙෂචිහ්නාඃ (තාඃ) 'තෙන සහෙති තුල්‍යයොගෙ' යනු කී හෙයින් බහුව්‍රීහියී, **උත්ප්‍රෙක්ෂාලඞ්කාරයි.**

'අත්‍රස්වාභාවිකනිමෙෂස්‍ය අප්සරසඃ ප්‍රාර්ථනාහෙතුකත්වොත් උත්ප්‍රෙක්ෂයා චාරකාඞ්ගනානාං නිමෙෂමාත්‍රභින්න'මමානුෂං සෞන්දර්යවස්තු ව්‍යජ්‍යතෙ' යනු ටීකාපාඨයි.

43. ස්ඵුරත්තුෂාරාංශුමරීචිජාලෛර්
විනිහ්නුතාඃ ස්ඵාටිකසෞධපඞ්ක්තිඃ
ආරුහ්‍ය නාරීඃ ක්ෂණදාසු යත්‍ර
නභොගතා දෙව්‍ය ඉව ව්‍යරාජන්.

44. කාන්තෙන්දුකාන්තොපලකුට්ටිමෙෂු
ප්‍රතික්ෂපං හර්ම්‍යතලෙෂු යත්‍ර
උච්චෛරධඃ පාතිපයොමුචො'පි
සමූහමූහුඃ පයසාං ප්‍රණාල්‍යඃ.

---

43 යත්‍ර, යම් පුරියෙක්හි; ක්ෂණදාසු, රාත්‍රීන්හි; නාරීඃ, කාන්තා, වෝහුමු; ස්ඵුරත්, බබලන්නාවූ; තුෂාරාංශුමරීචිජාලෛඃ, චන්ද්‍රකාන්ති සමූහවලින්; විනිහ්නුතාඃ, අපහ්නුතවූවාහු හෙවත් පහකරණ ලද් දාහු; ස්ඵාටිකසෞධපඞ්ක්තීඃ, පළිඟුමුවා පහපෙලට; ආරුහ්‍ය, ආරූඪව; නභොගතාඃ, ආකාශගතවූ; දෙව්‍යඃඉව, දෙවඟනන් මෙන්; ව්‍යරාජන්, බැබලුණාහුද (ඒ පුරියයි)

**යත්‍ර නාරීඃ ස්ඵාටිකසෞධපඞ්ක්තීඃ ආරුහ්‍ය දෙව්‍යඃඉව ව්‍යරාජන්,** යනු මෙහි ක්‍රි- යි. ව්‍යරාජන්, යනු, අනද්‍යතන—ලඞ්යි, විපූර්ව, රාජෘ, දීප්තෞ, ධාතුවෙන්, අන් ප්‍රත්‍යයයි, තුෂාරඅංශවඃ යස්‍යසඃ තුෂාරාංශුඃ ස්ඵුරච්චාසෞ තුෂාරාංශුශ්චෙති= මරීචිනාම්ජාලාඃ= ස්ඵුරත්තුෂාරාංශුමරීචිජාලාඃ (තෛඃ) ස්ඵටිකානාම් විකාරඃ ස්ඵාටිකාඃ ස්ඵාටිකානාම්සෞධාඃ= ස්ඵාටිකසෞධානාම් පඞ්ක්තයඃ=(තාඃ) ක්ෂණං (යාත්‍රිකාදි මුහුර්තමුත්සවං) දදනීති ක්ෂණදාඃ (තාසු) නභඃගතාඃ, නභොගතාඃ යනු විග්‍රහ වාක්‍යයි **සාමාන්‍යාලඞ්කාර උත්ප්‍රෙක්ෂාලංකාර සංකරයි.**

44. යත්‍ර, යම් පුරියෙක්හි; ප්‍රතික්ෂපං, රාත්‍රියක්පාසා; කාන්තා, මනොරම්‍යවූ; ඉන්දුකාන්තොපල, චන්ද්‍රකාන්ත පාෂාණ සම්බන්ධිවූ; කුට්ටිමෙෂු, බඩහුම් ඇති; හර්ම්‍යතලෙෂු, සඳලුතලවල; උච්චෛඃ, උස්වූ; ප්‍රණාල්‍යඃ, ජලනිර්ගමනමාර්ගයෝ; අධඃපාති, පහතට වැටෙන් නාවූ; පයොමුචඃඅපි, මෙඝ ඇත්තෝද; පයසාංසමූහං, ජලපූරය (දියපිරීම) හෙවත් ජලරාශිය; ඌහුඃ, වහනයකළාහුද (ඒ පුරියයි)

**යත්‍ර ප්‍රණාල්‍යඃ පයසාං සමූහමූහුඃ,** යනු මෙහි, ක්‍රි- යි. ඌහුඃ, යනු, පරොක්ෂලිට්යි, වහ්, ප්‍රාපණෙ, ධාතුවෙන්, උස් ප්‍රත්‍යයයි; කාන්තානි (රම්‍යාණි) ච තානි, ඉන්දුකාන්තොපලානිචෙති= තෙෂාම් කුට්ටිමානි (බඩහුමයඃ) යෙෂු (තානි) = (තෙෂු) ක්ෂපාසු, ප්‍රති ප්‍රතික්ෂපං, හර්ම්‍යාණාම් තලානි =(තෙෂු) අධඃපාතිනො, (ධශ්වරා) පයොමුචඃ (මෙඝා) යාසාං (තාඃ) අධඃපාතිපයොමුචඃ (තාඃ) යනු විග්‍රහවාක්‍යයයි **අතිශයොක්ති අලංකාරයි.**

45. රතෞ හ්‍රියා යත්‍ර නිශාම්‍ය දීපා
ඤ්ජාලාගතාභ්‍යෝ'ධිගෘහං ගෘහිණ්‍යඃ
බිභ්‍යුර්විඩාලේක්‍ෂණභීෂණාභ්‍යෝ
වෛදූර්‍ය්‍යකුඩ්‍යේෂු ශශිද්‍යුතිභ්‍යඃ.

46. යස්‍යාමති ශ්ලක්‍ෂ්ණතයා ගෘහෙෂු
විධාතුමාලේඛ්‍ය'මශක්නුවන්තඃ
චක්‍රුර් යුවානඃ ප්‍රතිබිම්බිතාඞ්ගාඃ
සජීවචිත්‍රා ඉව රත්නභිත්තීඃ.

---

45. යත්‍ර, යම් පුරියෙක්හි; අධිගෘහං, ගෘහයන්හි; ගෘහිණ්‍යඃ කුලාඞ්ගනාවෝ; රතෞ, රතික්‍රීඩායෙහි හෙවත් රතික්‍රීඩා කාලයෙහි හ්‍රියා, ලජ්ජායෙන්; දීපාන්, (උජ්වලිතවූ) ප්‍රදීපයන්; නිශාම්‍ය, නිවා; ජාලාගතාභ්‍යඃ, කවුළුමාගීවලින් (ගෘහාභ්‍යන්තරයට) ආවාවූ; වෛදූර්‍ය්‍යකුඩ්‍යේෂු, වෛරළුමිණිමුවා බිතුවල සංක්‍රාන්තවූ; විඩාලේක්‍ෂණභීෂණාභ්‍යඃ, බළල් ඇස්මෙන් බියකරුවූ; ශශිද්‍යුතිභ්‍යඃ, චන්ද්‍රකාන්ති වලින්; බිභ්‍යුඃ, බියපත්වූවාහුද.

**යත්‍ර ගෘහිණ්‍යඃ ශශිද්‍යුතිභ්‍යඃ, බිභ්‍යුඃ,** යනු මෙහි ක්‍රි–යි. බිභ්‍යුඃ යනු පරෝක්‍ෂලිට්යි, ඤිභීඃ, භයෙ, ධාතුවෙන්, උස්, ප්‍රත්‍යයයි, ජාලෙභ්‍ය ආගතාඃ= * ගෘහෙෂ්වධි, අධිගෘහම් (විභක්ත්‍යර්ථයෙහි අව්‍යයී භාවයි) බිඩාලානාමීක්‍ෂණානි= බිඩාලේක්‍ෂණවත් භීෂයන්තඉති, බිඩාලේක්‍ෂණභීෂණාඃ, (තාභ්‍යඃ) විදූරාත් ප්‍රභවන්තීති, වෛදූර්‍ය්‍යාණි තෙෂාම් කුඩ්‍යාණි =(තෙෂු) ශශෙර්ද්‍යුතයඃ = (තාභ්‍යඃ) යනු විග්‍රහයි, **විෂමාලංකාරයි**.

46. යස්‍යාම්, යම් පුරියෙක්හි; ගෘහෙෂු, ගෘහයන්හි; ශ්ලක්‍ෂ්ණතයා, ඉතා සිලිටුබැවින් හෙවත් රත්නභිත්තීන් අතිශුද්ධ බැවින්; ආලේඛ්‍යම්විධාතුං, සිතුවම් කරන්ට;- අශක්නුවන්තඃ, නොහැකිවූ; යුවානඃ, තරුණයෝතුමූ; ප්‍රතිබිම්බිතාඞ්ගාඃ, ප්‍රතිබිම්බිතවූ මූර්ත්තිඇත්තාහු; රත්නභිත්තීඃ, රුවන්මුවාබිතු; සජීවචිත්‍රාඃඉව, චෙතනා සහිත නොහොත් (ප්‍රාණසහිත) සිතුවම් ඇත්තවුන්මෙන්; චක්‍රුඃ, කළාහුය.

**යස්‍යාම් ගෘහෙෂු රත්නභිත්තීඃ යුවානඃ සජීවචිත්‍රාඉව චක්‍රුඃ,** යනු, මෙහි, ක්‍රි– යි. චක්‍රුඃ, යනු පරෝක්‍ෂලිට්යි, ඩුකෘඤ්, කරණෙ, ධාතුවෙන්, උස්, ප්‍රත්‍යයයි. මෙහි විග්‍රහවාක්‍ය සුබොධයි, **උත්ප්‍රෙක්‍ෂාලඞ්කාරයි.**

---

* මෙහි 'ජාලෛරාගතාඃ' යී, කරණ තත් පුරුෂය වියහැකි නමුදු ජාලෙභ්‍යඃ (නිඃසෘත්‍ය) යී, ල්‍යප්ලොපිතවය ගම්‍යමාන හෙයින් පංචමීතත් පුරුෂයි විමසාබලා යොග්‍යවූවක් ගතයුතුයි.

47. සාවර්ණ්‍යභාජි ප්‍රතිමාගතානාං
ලක්ෂ්‍යෛඃ සමරපාණ්ඩුතයාඞ්ගනානාම්
යස්‍යාං කපෝලෛඃ කලධෞතධාම
ස්තම්භේෂු භේජේ මණිදර්පණශ්‍රීඃ.

48. ශුකාඞ්ගනීලෝපලනිර්මිතානාං
ලිප්තේෂු භාසා ගෘහදේහලීනාම්
යස්‍යාමලින්දේෂු න චක්‍රු'රේව
මුග්ධාඞ්ගනා ගෝමයගෝමුඛානි.

---

47. යස්‍යාම්, යම් පුරියෙක්හි; කලධෞතධාමස්තම්භේෂු, ස්වර්ණාගාරස්තම්භයන්හි; සාවර්ණ්‍යභාජි, සවර්ණත්වයභජනය කරන්නාවූ; ප්‍රතිමාගතානාං, ප්‍රතිබිම්බ ප්‍රාප්තවූ; අඞ්ගනානාං, කාන්තාවන්ගෙ; සමරපාණ්ඩුතයා, අනඞ්ගපාණ්ඩුත්වයෙන් (රාගචේතනාධික්‍යය හෙතු කොටගෙණ හටගත් මඳක් පඬුවන්පැහැයෙනැයි දේසි); ලක්ෂ්‍යෛඃ, ඉලක්කවලින් සැලකියහැකිවූ හෙවත් විභින්න වර්ණත්වය හෙතු කොටගෙණ සැලකියහැකිවූ; කපෝලෛඃ, කොපුල්වලින්; මණිදර්පණශ්‍රීඃ, මිණිමුවාකැටපත් සම්බන්ධිවූ ශොභාවමෙන් ශෝභාව; භේජේ භජනය කරණලද්දේද (ඒ පුරියයි)

**යස්‍යාම් අඞ්ගනානාං කපෝලෛඃ මණිදර්පණශ්‍රීඃ, භේජේ,** යනු, මෙහි, ක්‍රි- යි. භේජේ, යනු, පරෝක්ෂලිට්යි, භජ, සේවායාම් ධාතුවෙන්, එ, ප්‍රත්‍යයයි, (සාවර්ණ්‍යං) භජතීති සාවර්ණ්‍යභාජ්, ප්‍රතිමං ආගතාඃ=(තාසාම්) ආ, ඊෂත් පාණ්ඩුරා'පාණ්ඩුඃ තස්‍යභාව= සමරේණ (ජනිතා) ආපාණ්ඩුතා = (තයා) කලධෞතේන (හෙම්නා) නිර්මිතානි ධාමානි= තේෂාම් ස්තම්භාඃ,=(තේෂු) මණිමයාඃ දර්පණාඃ= තේෂාම්ශ්‍රීඃ යනු විග්‍රහයි, **සාමාන්‍යාලංකාරයි.**

48. යස්‍යාම්, යම් පුරියෙක්හි; මුග්ධාඞ්ගනාඃ, බොළඳ අඟනෝ; ශුකාඞ්ග, ගිරා ශරීරසේ; නීල, නිල්වන්වූ; උපල, ගල්වලින් හෙවත් නිල් මැණික්වලින්; නිර්මිතානාං, මවනලදූවූ හෙවත් කරණලද්දවූ; ගෘහදේහලීනාම්, ගෘහ දෙහලින්ගෙ හෙවත් ගෘහද්වාර සම්බන්ධිවූ ශාඛාධාර දුරුන්ගේ; භාසා, කාන්තියෙන්; ලිප්තේෂු, වැලඳුනාවූ හෙවත් ආලිප්තවූ; ආලින්දේෂු, වාරවහිර්භාගයන්හි හෙවත් දොරපිල් කඩවල; ගෝමයගෝමුඛානි, ගොම අලෙවි; නචක්‍රුඃඑව, නොකළාහු මද; මරකතමාණික්‍යකාන්ති විලෙපන භ්‍රාන්තියෙනි යනු භාවයි.

49. ගොපානසීෂු ක්ෂණ'මාසිතානා
මාලම්බිභිශ්චන්ද්‍රකිණාං කලාපෛඃ
හරින්මණිශ්‍යාමතෘණාභිරාමෛර්
ගෘහාණි නීඩ්‍රෛ'රිව යත්‍ර රෙජුඃ.

50. වෘහත්තුලෙ'රප්‍යතුලෙ'විතාන
මාලාපිනද්ධෙ'රපි චාවිතානෛඃ
රෙජෙ විචිත්‍රෛ'රපි යා සචිත්‍රෛ
ගෘහෛර්විශාලෛ'රපි භූරිශාලෛඃ.

---

**යස්‍යාම් මුඛ්‍යාඞ්ගනාඃ ආලිම්පන්ති ගොමයගොමුඛානි න චන්ද්‍රාඃ**, යනු, මෙහි ක්‍රි- යි. තචන්ද්‍රාඃ, යනු, පරොක්‍ෂලිට්යි, තස්ද්, පූජි-ධ්‍යානයෝඃ, කරණෙ ධාතුවෙන්, උස් ප්‍රත්‍යයි, ශුක්‍රානාමිඞ්ගානි=ශුක්‍රාඞ්ග වත් නීලොපලා (නීලමණයඃ)= තෛර්නිර්මිතා = තෙෂාම් දෙහං (ලෙපනං)ලාති.ගෘහ්ණාතීති දෙහලි, ගෘහාණාම් දෙහල්‍යඃ=(තෙෂාම්) මුඛ්‍යාශ්ච තා'අඞ්ගනාශ්චෙති= ගොඃ (පුරිෂං` ගොමයම් තස්‍ය ගොමු ඛානි විලෙපනානි යනු විග්‍රහ වාක්‍යයි **භ්‍රාන්තිමද ලංකාරයි.**

49. **යත්‍ර**, යම් පුරියෙක්හි; ගෘහාණි, ගෘහයෝතුමූ; ගොපාන සීෂු, ගොනැස්වල; ක්ෂණං, ඇසිල්ලක්; ආසිතානාම්, උපවිෂ්ටවූ හෙවත් උන්නාවූ; චන්ද්‍රකිණාං, මයූරයන්ගෙ; ආලම්බිභිඃ, ලම්බමා නවූ; කලාපෛඃ, පිල්බරවලින්; හරින්මණිශ්‍යාමතෘණ, මරාමිණිසේ සම්වන්වූ තෘණයන් කාරණකොටගෙණ; අභිරාමෛඃ, මනොරම්‍යවූ; නීඩ්‍රෛඃඉව, පටල ප්‍රාන්තවලින් මෙන්; රෙජුඃ, බැබලුණාහුද.

**යත්‍ර ගෘහාණි නීඩ්‍රෛ'රිව,රෙජුඃ,** යනු, මෙහි, ක්‍රි- යි. රෙජු', යනු පරොක්‍ෂලිට්යි, රාජෘ, දීප්තෞ ධාතුවෙන්, උස් ප්‍රත්‍යයි, හරිතශ්ච තෙ මණයශ්චෙති = තචත් ශ්‍යාමානි තෘණානි = තෛරභිරාමාණි, හරින්මණිශ්‍යාමතෘණාභිරාමාණි (තෛඃ) මෙහි සෙසු විග්‍රහවාක්‍ය සුබොධයි, **ජාතිස්වරූපොත් ප්‍රෙක්ෂාලංකාරයි.**

50. **යා**, යම් පුරියක්තොම; වෘහත්තුලෛඃඅපි, මහත්වූ (ගෘහා වයව සඞ්ඛ්‍යාත) තලාද ඇති තුමූත්; අතුලෛඃ, තලාද රහිතවූ හෙවත් අනුපමවූ; විතානමාලා, උඩුවියන් පෙලින්; පිනද්ධෛඃඅපි, ආච්ඡාදිත තුමූත්; අවිතානෛඃ, උඩුවියන් රහිතවූ; (ශූන්‍යනොවූ යනු අවිරොධි අර්ථයි) නොහොත් සමස්ත වස්තු සම්බන්ධවූ; විචිත්‍රෛඃ අපි, විගත චිත්‍රඇති තුමූත් හෙවත් සිතුවම් නැතිතුමූත්; සචිත්‍රෛඃ, සිතුවම් සහිතවූ; විශාලෛඃඅපි, විගතශාලාවන් ඇති තුමූත්; භූරි ශාලෛඃ, බොහෝ ශාලා සඞ්ඛ්‍යාතවූ ගෘහෛක දෙශඇති; ගෘහෛඃ ගෘහයන් කාරණකොටගෙණ; රෙජෙ, බැබලිණිද.

51. වික්‍රංසයා කෘත්‍රිමපත්‍රි පඞ්ක්තෙඃ
කපොතපාලීෂු නිකෙතනානාම්
මාර්ජාරමප්‍යායතනිශ්චලාඞ්ගං
යස්‍යාං ජනඃ කෘත්‍රිමමෙව මෙනෙ.

52. ක්ෂිතිප්‍රතිෂ්ඨෝ'පි මුඛාරවින්දෛ
වධූජනශ්චන්ද්‍ර'මධශ්චකාර
අතීතනක්ෂත්‍රපථානි යත්‍ර
ප්‍රාසාදශෘඞ්ගාණි වෘථාධ්‍යරුක්ෂත්.

---

**සා, ශාලෝඝනභඃ රෙජෙ**, යනු, මෙහි ක්‍රි. සි. රෙජෙ, යනු, පරොක්ෂලිට්සි, රාජෘ, දීප්තෞ, ධාතුවෙන්, එ, ප්‍රත්‍යයයි, විගතාඃතුලාඃයෙෂු-(තෙෂඃ) තානි තුලාඃයෙෂු = (තෙෂඃ) විතානානා (මුලෙලාවානාම්) මාලාඃ= තාභිඃ පිනඞ්ඪානි = (තෙෂඃ) තානි විතානානි යෙෂු= (තෙෂඃ) විගතානි චිත්‍රාණි, යෙෂු = (තෙෂඃ) විශෙෂෙණචිත්‍රාණි විචිත්‍රාණි කියාද පදයෙකි; හේ මෙහි නොයෙදේ, විත්‍රෙඃසභවතීනානඉති සචිත්‍රාණි (තෙෂඃ) විගතාඃශාලාඃයෙෂාම් තානි විශාලානි (තෙෂඃ) භූරයඃ (මහාන්තඃ) ශාලාඃයෙෂාම් තානි=(තෙෂඃ) යනු විග්‍රහ වාක්‍යයි **විරෝධාලංකාරයි**.

51. යස්‍යාම්, යම් පුරියෙක්හි; නිකෙතනානාං, ගෙවල් සම්බන්ධිවූ; කපොතපාලීෂු, කොබෝගෙඩි වළලුවල; කෘත්‍රිමපත්‍රිපඞ්ක්තෙඃ, දූවමුවා පක්ෂිසමූහයා; වික්‍රංසයා, ආක්‍රමනය කරණු කැමැත්තෙන් හෙවත් අල්වාගණු කැමැත්තෙන්; ආයතනිශ්චලාඞ්ගං, දික්වී නැමුනාවූ හෙවත් දිගඇදුනාවූ නිශ්චල ශරීරඇති; මාර්ජාරම්අපි, බළලාත්; ජනඃ, මහාජනතෙම; කෘත්‍රිමංඑව, ක්‍රියානිෂ්පන්නයක්කොටම (වාසනාවයකොට;) මෙනෙ, සිතුවේද?

**ජනඃ යස්‍යාම් මාර්ජාර'මපි, කෘත්‍රිමමෙව මෙනෙ**, යනු මෙහි, ක්‍රි- සි. මෙනෙ, යනු පරොක්ෂලිට්සි, මන, ඥානෙ, ධාතුවෙන්, එ, ප්‍රත්‍යයයි, ක්‍රමිතුම්චඡතීති, වික්‍රංසා, (තයා) කෘත්‍රිමපත්‍රිණාං (දරුමය පක්ෂිණාං) පඞ්ක්තිඃ = (තස්‍යාඃ) කපොතාන් පාලයන්තීති= (තාසු) ආයත' (මානතංවා) නිශ්චලමඞ්ගං, යස්‍යසඃ=(තම්) ක්‍රියානිෂ්පන්නානි කෘත්‍රිමං, යනු විග්‍රහයි. මෙහි 'කෘත්‍රිමපත්‍රිපඞ්ක්තෙඃ' යනු සාමීප්‍යෙයෙහි ෂෂ්ඨියි, **භ්‍රාන්තිමදලංකාරයි**.

52. යත්‍ර, යම් නගරයෙක්හි; වධූජනඃ, කාන්තාජනතෙම; ක්ෂිති ප්‍රතිෂ්ඨඃඅපි, බිමසිටියෙ නුමුදු; චන්ද්‍රං, අහස්හිවූද චන්ද්‍රයා; මුඛාර වින්දෛඃ, මූවපියුම්වලින්; අධශ්චකාර, ( සවකිය සෞන්දර්‍ය්‍ය මහිම

53. රම්‍යා ඉති ප්‍රාප්තවතීඃ පතාකා
රාගං විවික්තා ඉති වර්ධයන්තීඃ
යස්‍යාමසේවන්ත නමවලීකාඃ
සමං වධූභිර්වලභීර්යුවානඃ.

---

යෙන්) පහන් කෙළේද; අතීතනක්ෂත්‍රපථානි, නකත්මග ඉක්මෙව්වාවූ; ප්‍රාසාදශෘඞ්ගාණි, ප්‍රාසාද මස්තකයන්ට; ව්‍යථා, නිෂ්ඵලසේ; අධ්‍යරුක්ෂත්, නැංගේය.

**වධූජනඃ මුඛාරවින්දෛඃ චන්ද්‍රං අධශ්චකාර,** යනුද (සඃ) **ප්‍රාසාද ශෘඞ්ගාණි ව්‍යථා අධ්‍යරුක්ෂත්,** යනුද, මෙහි ක්‍රි- යි. අධශ්චකාර, යනු පරොක්ෂලිට්යි, අධස්, පූර් ඩුකෘඤ්, කරණෙ ධාතුවෙන්, ණප්, ප්‍රත්‍යයි, අධ්‍යරුක්ෂත්. යනු, අධි, පූර් රුහ, ජනනෙ ධාතුවෙන් අනද්‍ය- ලඞ්, දිප්, ප්‍රත්‍යයෙන් නිෂ්පන්නයි.

ක්ෂිතෞ ප්‍රතිෂ්ඨා යස්‍යසඃ = භූමෞනිළුවඅරවින්දති = (යොඃ) වධූනාම්ජනඃ= අතිතානි නක්ෂත්‍රපථ'මතීතනක්ෂත්‍රපථානි, 'අත්‍යාදයඃ ක්‍රාන්තාද්‍යර්ථෙ ද්විතීයයා' යනුවෙන් සමාසයි; ප්‍රාසාදනාම් ශෘඞ්ගාණි= යනු විග්‍රහ වාක්‍යයි, **ශ්ලෙෂවිරොධ සංකීර්ණ කාව්‍යලිඞ්ග හෙද ලංකාරයි.**

53. යස්‍යාම්, යම් පුරියෙක්හි; යුවානඃ, තරුණයෝතුමූ; රම්‍යාඃ ඉති, රමනාහීයි යන හෙතුවෙන්; පතාකාඃප්‍රාප්තවතීඃ, ඔසවනලද කොඩිවලටපැමිණියාවූ හෙවත් ප්‍රසිඩියටගියාවූ ද්‍රෙහෝ නොහොත් රමනාහීයි යන මෙයින් කොඩිවලට පැමිණියාවූ; විවික්තාඃ ඉති, ජන යන් රහිතයයි නොහොත් නිර්මලයයි යන මේ හෙතුවෙන්; රාගංවර්ධ යන්තීඃ, අනුරාගය වඩන්නාවූ; නමවලිකාඃ, නැමෙන්නාවූ පටල ප්‍රාන්තයෝ ද්‍රෙහෝ නොහොත් නැමෙන්නාවූ (වලිතුනසඞ්ඛ්‍යාත) මධ්‍ය රෙඛාතුනඃ ඇති; වලභීඃ, කූටාගාරයන්; වධූභි සමං, කාන්තා වන් සමග; අසෙවන්ත, සේවනය කළාහුය.

**යුවානඃ වධූභිඃ සමංවලභීඃ, අසෙවන්ත,** යනු. මෙහි ක්‍රි- යි. අසෙවන්ත, යනු අනද්‍ය-ලඞ්යි, සෙවෘ, සෙවනෙ, ධාතුවෙන්, අන්ත, ප්‍රත්‍යයි, මෙහි විග්‍රහ වාක්‍යාදිය සුබොධයි. **තුල්‍යයොගිතානම් අලංකාරයි**. (ශ්ලෙෂනොවෙයි)

'ප්‍රස්තුතානාං තථාන්‍යෙෂාම් කෙවලං තුල්‍යධර්මතඃ
ඖපම්‍යං ගම්‍යතෙ යත්‍ර, සා මතා තුල්‍යයොගිතා'

යනු තල්ලක්ෂණයි.

54. සුගන්ධිතාමප්‍රතියත්නපූර්වාං
බිභ්‍රන්ති යත්‍ර ප්‍රමදාය පුංසාම්
මධූනි වක්ත්‍රාණි ච කාමිනීනා
මාමෝදකර්මව්‍යතිහාර'මීයුඃ.

55. රතාන්තරෙ යත්‍ර ගෘහාන්තරේෂු
විතර්දිනිර්ව්‍යූහවිටඞ්කනීඩඃ
රුතානි ශෘණ්වන්වයසාං ගණෝ'න්තෙ
වාසිත්ව'මාප ස්ඵුට'මඞ්ගනානාම්.

---

54. යත්‍ර, යම් පුරියෙක්හි; අප්‍රතියත්නපූර්වාං, ප්‍රතියත්න පූර්වකොට නැත්තාවූ හෙවත් ස්වභාව සිඩවූ; සුගන්ධිතාං, සුවඳවත්බව; බිභ්‍රන්ති, ධරන්නාවූ; මධූනි, මධුහුද හෙවත් මද්‍යයෝද; කාමිනීනාම්, (මනොඥ) කාන්තාවන්ගේ; වක්ත්‍රාණිච, මුඛයෝද; පුංසාම්, තරුණ පුරුෂයන්ගෙ; ප්‍රමදාය, ප්‍රකෘෂ්ට මදය පිණිස හෙවත් ප්‍රීතිය පිණිස; ආමෝදකර්මව්‍යතිහාරං, සුවඳවත්කරගැණීමට හෙවත් සුවඳ සාවාගැණීමට; ඊයුඃ, පැමිණියාහුද.

**යත්‍ර මධූවක්ත්‍රාණිච ආමෝදකර්මව්‍යතිහාරං, 'මීයුඃ,** යත්‍ර, මෙහි ක්‍රි- සි. ඊයුඃ, යත්‍ර පරොක්ෂලිට්සි, ඉණ්, ගතෞ, ධාතුවෙන් උස්, ප්‍රත්‍යසි, ශොභනො ගන්ධො යෙෂාම් තෙ= සුගන්ධිනාම්. භාවසත්‍ත තතාසුගන්ධිතා.(තාම්) ප්‍රතියත්නඃ (සංස්කාරඃ)පූර්වොයස්‍යාඃ සා=(තාම්) කාමඅාසාමස්තීති කාමින්‍යඃ (තාසාම්) ආමෝදකර්මණෝ (වාසනාධානස්‍ය) ව්‍යතිහාරං (පරස්පරකරණං) ආමෝදකර්මව්‍යතිහාරං(තම්)යත්‍ර විග්‍රහයි. **තුල්‍යයොගිතා භෙදයි.**

55. යත්‍ර, යම් පුරියෙක්හි; ගෘහාන්තරේෂු, ගෙවල් අතරෙහි; විතර්දි, කෙළි පිල්කඩ සම්බන්ධවූ; නිර්ව්‍යූහ, අපාශ්‍රයන්ගෙ; විටඞ්කනීඩඃ, කොබෝ්ගෙඩි වළලු නමැති කැදලි හෙවත් කූඩුඇති; වයසාං ගණඃ, පක්ෂීන්ගෙ සමූහ තෙමේ; අඞ්ගනානාම්, කාන්තාවන්ගේ; රතාන්තරෙ, රතික්‍රීඩා අතරෙහිවූ; රුතානි, රතිකූජිතයන් හෙවත් රමනජනිතශබ්දයන්; ශෘණ්වන්, අසන්නේ; අන්තෙවාසිත්වං, (ඔවුන්) අතවැසිබවට; ආප, පැමිණියේය;(යත්‍ර) ස්ඵුටං, එහෙයින්ම ස්ඵුටයි.

**වයසාංගණඃ අඞ්ගනානාම් රතාන්තරෙ රුතානි ශෘණ්වන් අන්තෙවාසිත්වංආප,** යත්‍ර, මෙහි ක්‍රි- සි. ආප, යත්‍ර පරොක්ෂලිට්සි, අප, ප්‍රාපණෙ, ධාතුවෙන්, ණප්, ප්‍රත්‍යසි, රතෙ'රන්තරඃ =(තස්මින්) ගෘහාණාමන්තරාණි= (තෙෂු,) විතර්දීනාම් (විහාරවෙදිකානාම්) නිර්

56. ශ්‍රෝණීෂ්ව'පි ස්පෂ්ටතරේෂු යත්‍ර
ස්වච්ඡානි නාරීකුචමණ්ඩලේෂු
ආකාශසාම්‍යං දධුරම්බරාණි
න නාමතඃ කේවල'මර්ථතෝ'පි.

57. යස්‍යාමජිහ්මා මහතී'මපඞ්කාඃ
සීමානමත්‍යායතයෝ'ත්‍යජන්තඃ
ජනෛ'රජාතස්ඛලනෛ'ර්න ජාතු
ද්වයේ'ප්‍යමුච්‍යන්ත විනීතමාර්ගාඃ

---

යුතා (මත්තවාරණාඛ්‍යාඅපාශ්‍රයාඃ)= තේෂාම් විටඞ්කාඃ (කපෝතපාලිකාඃ) = න එවනිඩාඃ යස්‍යසඃ = අන්තසමීපෙ වසන්ත ඉත්‍යන්තෙ වාසිනඃ, තෙෂාම්භාවඃ අන්තෙවාසිත්වම්, (තම්) යනු විග්‍රහ වාක්‍යයි; **උත්ප්‍රේක්ෂා ලඞ්කාරයි**.

56. යත්‍ර, යම් පුරියෙක්හි; ශ්‍රෝණීෂුඅපි, ආච්ඡාදනය කරණ ලදනුමුත්; ස්පෂ්ටතරේෂු, අති ස්පෂ්ටවූ හෙවත් සුව්‍යක්තව පෙනෙන් නාවූ; නාරීකුචමණ්ඩලේෂු, කාන්තාවන්ගෙ පියවුරු මඬුලුවල; **ස්වච්ඡානි, අති ප්‍රසන්නාවූ; අම්බරාණි, වස්ත්‍රයෝතුමූ; නනාමතඃකෙව ලම්, අම්බර යන නමින් පමණක් නොව; අර්ථතඃ අපි, අර්ථ වසයෙ නුත්; ආකාශසාම්‍යං, ආකාශසදෘශත්වය; දධුඃ, දැරුවාහුය.**

**යත්‍ර නාරීකුචමණ්ඩලේෂු අම්බරාණි ආකාශසාම්‍යං දධුඃ,** යනු මෙහි ක්‍රි- සි. දධුඃ, යනු පරොක්ෂලිට්සි, ධාඤ්, ධාරණපොෂණ යොඃ, ධාතුවෙන් උස්, ප්‍රත්‍යයි, අතිශයෙන ස්පෂ්ටානීති ස්පෂ්ටත රාණි (තෙෂු) සු, ශොභනානි අච්ඡානි (ප්‍රසන්නානි)චෙති= නාරීණාම් කුචමණ්ඩලානි=(තෙෂු) සමස්‍යභාවඃ සාම්‍යං ආකාශෙනසාම්‍යං (සදෘශත්වං) ආකාශසාම්‍යං, යනු විග්‍රහවාක්‍යයි. **උපමා ලඞ්කාරයි.**

57. යස්‍යාම්, යම් පුරියෙක්හි; අජිහ්මා, ජිහ්මනොවූ හෙවත් වක්‍රනොවූ ද්‍වෙහෝ නොහොත් කපටනොවූ; අපඞ්කාඃ, කදීම රහි තවූ ද්‍වෙහෝ නොහොත් පව්නැත්තාවූ; මහතීංසීමාන·, මහත්වූ සීමාව හෙවත් රාජකල්පිත ක්‍ෂෙත්‍ර මර්‍යාදාව ද්‍වෙහෝ නොහොත් කුලාඞ්ගනානුෂ්ඨානමර්‍යාදාව; අත්‍යජන්තඃ, නොහරින්නාවූ; අත්‍යායතයඃ, ඉතා ආයාම ඇත්තාවූ ද්‍වෙහෝ නොහොත් ඉතා උත්තර කාල හෙවත් අනාගතකාල ඇත්තාවූ; ද්වයෙඅපි, දෙවරූපඇති නුමුත්; විනීතමාර්ගාඃ, මොනවට කරණලද නගරවීථිහු ද්‍වෙහෝ නොහොත් සුශික්ෂිතාචාර මාර්ගයෝ; අජාතස්ඛලනෛඃ, නොහටගත් පාෂාණාදි ප්‍රතිඝාතඇති ද්‍වෙහෝ නොහොත් නොහටගත් විරුද්ධා චාරඇති; ජනෛඃ, දනන්විසින්; ජාතු, කිසිකලෙකත්; නඅමුච්‍යන්ත නොමුදනලද්දාහුද.

58. පරස්පරස්පර්ධිපරාර්ධ්‍යරූපාඃ
පෞරස්ත්‍රියො යත්‍ර විධාය වෙධාඃ
ශ්‍රීනිර්මිතප්‍රාප්තඝුනක්ෂතෛක
වර්ණෝපමාවාච්‍ය'මලං මමාර්ජ.

59. ක්ෂුණ්ණං යදන්තඃකරණෙන වෘක්ෂාඃ
ඵලන්ති කල්පොපපදස්තදෙව
අධ්‍යූෂුෂො යාමභවඤ්ජනස්‍ය
යාඃ සම්පදස්තාමතසො'ප්‍යගම්‍යාඃ.

---

**යත්‍ර ජනෛඃ විනිනමාගීඃ න අඩිචන්නත,** යතු, මෙහි ක්‍රි- යි. අඩිචන්නත, යතු අනද්‍ය, ලඩ්යි, ඩිච, ත්‍යාගෙ, ධාතුවෙන් කර්මකාරක යෙහි අනත, ප්‍රත්‍යයි, (මේ පද්‍යය අර්ථශ්ලෙෂයෙන් යුක්තකොට විර චිත හෙයින් ඒ ඒ පදයන් සම්බන්ධව අර්ථයෙක් ගම්‍යමානවෙයි) විග්‍රහවාක්‍ය සුබොධයි. **ශ්ලෙෂාලංකාරයි.**

58. යත්‍ර, යම් පුරියෙක්හි; පරස්පරස්පර්ධි, ඔවුනොවුන්ට ස්පර්ධා කරන්නාවූ හෙවත් තිඤුකරන්නාවූ හෝ අනුකාරිවූ; පරාර්ධ්‍යරූපාඃ, ශ්‍රෙෂ්ඨවූ රූපලාවණ්‍යය ඇති; පෞරස්ත්‍රියඃ, පුරවාසී ස්ත්‍රීන්; විධාය, නිර්මිතකොට; වෙධාඃ, නිර්මාණකර්තෘ සඞ්ඛ්‍යාත මහබඹතෙම; ශ්‍රීනිර්මිති, ශ්‍රීදෙවිය මැවීමෙන්; ප්‍රාප්ත, පැමිණියාවූ; ඝුනක්ෂත, ගුල්ලන් ගැසීම සම්බන්ධවූ; එකවර්ණ, එකඅකුරට; උපමාවාච්‍යම්, සමානත්වයෙන් කිය යුත්ත හෙවත් කියයුතුවූ අපවාදය; අලං, අත්‍යර්ථයෙන්; මමාර්ජ, ශුඩකොළේද (ඒ පුරියයි)

**වෙධාඃ පෞරස්ත්‍රියඃ, විධාය ශ්‍රීනිර්මිති = වාච්‍යමලං මමාර්ජ,** යතු මෙහි, ක්‍රි–යි. මමාර්ජ, යතු පරෙස්මෛලිට්යි, මෘජ, ශොධනෙ ධාතු වෙන් ණප්, ප්‍රත්‍යයි, පරශ්ච පරශ්ච පරස්පරම් පරස්පරං ස්පර්ධන්තීති පරස්පරස්පර්ධීනි, පරාර්ධ්‍යානි, (ශ්‍රෙෂ්ඨානි)රූපාණි යාසාම්තාඃ=පුරෙ භවාඃ පෞරාඃ, පෞරාශ්ච තාඃ ස්ත්‍රියශ්චෙති = (තාඃ) ශ්‍රියාඃ නිර්මිතිඃ= ශ්‍රීනිර්මිත්‍යා ප්‍රාප්තං යත් ඝුනෙන (වජ්‍රකීටෙන) ක්ෂතස්‍යොත්කීර්ණ ස්‍යෛකවර්ණස්‍යොපමයා ( සාම්‍යෙන ) වාච්‍යමපවාදඃ, යතු ටීකා හෙයින් ඉතා දීඝීවූ සමාස ක්‍රමය, ඊට අනුව යොද දතයුතුයි. **අතිශයොක්තියි.**

59. යත්, යමක්; අන්තඃකරණෙන, ( ස්වකීය ) චිත්තයෙන්; ක්ෂුණ්ණං, අභ්‍යස්තද හෙවත් මෙය මටවන්නේයයි නැවත නැවත සංකල්පිතද; කල්පොපපදඃ, කල්පයන්න උපපදකොට ඇත්තාවූ; වෘක්ෂාඃ, වෘක්ෂයෝ හෙවත් කප්රුක්; තත්එව, ඒ ස්වකීය චිත්ත

60. කල්පාද්ධානාඃ සකලාඃ සවනාභි
රුද්භාසයන් සෞධසිතාභිරාශාඃ
යාං රෙවතීජානිරියෙෂ හාතුං
තරෞහිණෙයො න ච රෞහිණීශඃ.

---

යෙන් **සංකල්පිතවූ** දෙයම; එලනානි, නිපදවත්ද; යාං, යම් පුරියෙක්හි; අධ්‍යුෂුෂඃ, අධිවාසයකළාවූ; ජනස්‍ය, ජනයාගෙ; යාඃසම්පදඃ, යම් සම්පත්තිහු; අභවන්, වූවාහුද; තාඃ, ඒ සම්පත්තීහු; මනසඃඅපි, සිතටත්; අගම්‍යාඃ, නොපැමිණිය හැක්කාහුවෙති.

**(යෙන) සංකල්පිතං භවති,** යනුද **වෘක්ෂාඃ නාදෙව, ඵලනානි,** යනුද **ජනස්‍යසම්පදඃසත්‍යඃ,** යනුද **තාඃ අගම්‍යාඃසත්‍යඃ,** යනුදයි (මෙහි වෙන් වෙන් වසයෙන්) ක්‍රි- යි. ඵලනානි, යනු වර්ත- ලට්යි. ඵල නිෂ්පත්තෞ ධාතුවෙන්, අනානි, ප්‍රත්‍යයි, (කල්පඉත්‍යුපදංයෙෂාං තෙ, කල්පොපපදාඃ, අධිඋෂිතවාන්ති, අධ්‍යුෂුඃ, තස්‍ය, යනු විග්‍රහයි, මෙහි යාම්, යනු 'උපාන්වධ්‍යාඞ්වසඃ' යනුවෙන් අධිපූර්ව වස්, ධාතු යොගයෙහි ආධාරාර්ථයෙහි කර්මයයි, (ඉහකල්ප ඉත්‍යුපපදං) **සර්වසංකල්පදෙශො** යෙෂාමිති ව්‍යාඛ්‍යාතෙ හිරණ්‍යපූර්වකශිපුමිත්‍යාදි වද් වාච්‍යවචනදොෂාවකාශඃ, යනු ටීකායි, **අතිශයොක්තියි.**

60. සකලාඃ, සියලු; කලාඃ, චතුඃෂෂ්ටිකලාවන්; දධානාඃ, දරන්නාවූ; සෞධසිතාභිඃ, සුධාවලිප්තවූ ප්‍රාසාදයන්මෙන් ශ්වෙතවර්ණවූ; සවනාභිඃ, සවනිය කාන්තිවලින්; ආශාඃ, දිගුන්; උද්භාසයන්, උසස්කොට බබුලුවන්නාවූ; රෙවතීජානිඃ, රෙවතිය භාර්‍ය්‍යාකොට ඇති; රෞහිණෙයඃ, රෝහිණී පුත්‍රතෙම හෙවත් බලභද්‍රතෙම; යාම්, යම් පුරියක්; හාතුං, අත්හරින්ට; නඉයෙෂ, නොකැමැතිවීද; රොහිණීශඃ, චන්ද්‍රතෙමේත්; හාතුංනඉයෙෂ, අත්හරින්ට නොකැමැතිවූයේද (ඒ පුරියයි)

**රෙවතීජානිඃ යාං හාතුං නඉයෙෂ,** යනුද **රොහිණීශඃ යාං හාතුං නඉයෙෂ,** යනුද මෙහි ක්‍රි- යි. නඉයෙෂ, යනු, පරොක්ෂලිට්යි නඤ්, පූර්ව, ඉෂු, ඉච්ඡායාම් ධාතුවෙන්, ණප්, ප්‍රත්‍යයි, (සවස්‍යආත්මනඃනාඃ සවනාඃ(තාභිඃ) සුධයාඅවලිප්තං සෞධං, තවත්සිතාඃ=(තාභිඃ) රෙවතී කකුද්මිකන්‍යාභූෂ්කාංහංච ජායා යස්‍යසඃ=රොහිණ්‍යාඃඅපත්‍යං පුමාන් රෞහිණෙයඃ රොහිණ්‍යාඊශඃ=යනු, විග්‍රහයි, **තුල්‍යයොගිතාලංකාරයි.**

61. බාණාහවව්‍යාහතශම්භුශක්තෙ
රාසත්ති'මාසාද්‍ය ජනාදීනස්‍ය
ශරීරිණා ජෛත්‍රශරෙණ යත්‍ර
නිඃශඞ්ක'මූෂෙ මකරධ්වජෙන.

62. නිෂෙව්‍යමාණෙව ශිවෛර්මරුද්භි
රධ්‍යාස්‍යමානා හරිණා චිරාය
උද්‍රශ්මිරත්නාඞ්කුරධාම්නි සින්ධෞ
වාහවාසත මෙරුවමරාවතීං යා.

---

61. යත්‍ර, යම් පුරියෙක්හි; බාණාහව, බාණාසුර යුද්ධයෙහි; ව්‍යාහත, නැසුණාවූ; ශම්භුශක්තෙඃ, ඊශ්වරයා සම්බන්ධිවූ ශක්තිඇති, ජනාදීනස්‍ය, ජනයන් විසින් ආදරකාරණ ලබන හෙයින්; ජනාදීන, නම්වූ ශ්‍රීවිෂ්ණුහුගෙ; ආසත්තිං, ප්‍රත්‍යාසත්තියට හෙවත් ඇල්මට; ආසාද්‍ය, පැමිණ හෙවත් පුත්‍රබවට පැමිණ; ශරීරිණා, මූර්තිමත්වූ; ජෛත්‍රශරෙණ, දිනනසුලු ඊඇත්තාවූ; මකරධ්වජෙන, මකරවිහ්නිතවූ ධ්වජය ඇත්තහු විසින් හෙවත් අනඞ්ගයා විසින්; (ප්‍රද්‍යුම්න රූපඇති අනඞ්ගයා විසින් යයි සේයි) නිඃශඞ්කං, නිසැකව; ඌෂෙ, විසීද (විසීමවී යයි සේයි)

**මකරධ්වජෙන යත්‍රනිඃශඞ්ක'මූෂෙ,** යත්‍ර, මෙහි ක්‍රි-යි. ඌෂෙ, යත්‍ර පරොක්ෂලිට්යි, වස, නිවාසෙ ධාතුවෙන්, භාවයෙහි එ ප්‍රත්‍යයි, බාණෙන (සාර්ධංප්‍රවෘත්තං) ආහවං (යුද්ධඃ)= බාණාහවෙ, ව්‍යාහතා, ශම්භුශක්තිර්යෙන සඃ= (තස්‍ය) ජනෛරර්ද්‍යතෙ යාච්‍යතෙ, සර්වාභීෂ්ට'මසෞ, ජනාදීනඃ (තස්‍ය)ජෙතාරඑව ජෛත්‍රා, ජෛත්‍රා ශරා යස්‍යසඃ= (තෙන) නාස්තිශඞ්කාසෙය්‍යති= මකරඃධ්වජඃ යස්‍යසඃ= (තෙන) යත්‍ර, නිර්වචනයි. **කාව්‍යලිඞ්ගභෙදයි.**

62. ශිවෛඃ, මරුද්භිඃ; මන්දමාරුතවලින් හෙවත් මඳපවනින් දෝහෝ නොහොත් එකාදශ රුද්‍රයන් විසින්ද මරුත් ගණයන් විසින්ද; චිරාය, බොහෝකල්; නිෂෙව්‍යමාණා, සෙව්නාලබන්නාවූ; හරිණා, ශ්‍රීකෘෂ්ණයා විසින් දෝහෝ නොහොත් ශක්‍රයා විසින්; අධ්‍යාස්‍යමානා, අධිෂ්ඨිත කාරණ ලබන්නාවූ; උද්‍රශ්මි, උද්ගතවූ හෙවත් නැගුනු රශ්මිඇති; රත්නාඞ්කුර, රත්නාඞ්කුරයන්ට ස්ථානවූ හෙවත් රත්නශෘඞ්ගස්ථානවූ; සින්ධෞ, සමුද්‍රයෙහි සිටියාවූ; (සමුද්‍රසන්නාසෙහි වූයී සේයි) යා, යම් පුරියක්තොම; මෙරෞ, මෙරුපර්වත මස්තකයෙහි පිහිටියාවූ; අමරාවතීං, අමරාවතී පුරියට; ආහ්වාසත ඉව, ආහ්වානය කළාක්මෙන්විද; (නින්දාකරන්නාක්මෙන් කැඳවූවාදැයි සේයි)

63. සතිඬ්ඛාඤ්ජනශ්‍යාමරුචිඃ සුවෘත්තො
වඪ්වා ඉවා'ධ්වංසිතවර්ණකාන්තෙඃ
විශෙෂකො වා විශිශෙෂ යස්‍යාඃ
ශ්‍රියං ත්‍රිලොකීතිලකඃ ස එව.

64. තාමී'ක්ෂමාණඃ ස පුරං පුරස්තාත්
ප්‍රාපත්ප්‍රතොලී'මතුලප්‍රතාපඃ
වජ්‍රප්‍රභොද්භාසිසුරායුධශ්‍රී
ර්‍යා දෙවසෙනෙ'ව පරෛ'රලඞ්ඝ්‍යා.

---

**සා අමරාවතීං ආත්මවාසන,** යනු, මෙහි, ක්‍රි- සි. ආත්මවාසන, යනු භූතාර්ථලුඞ්සි, ආඞ්, පූර්ව, භූ, ආත්මවාසනෙ ධාතුවෙන් තන්, ප්‍රත්‍යයි, උද්ගතාඃ රශ්මයඃ උද්‍රශ්මයඃ, රත්නානාමඞ්කුරාඃ = (රත්නානිඑවවා අඞ්කුරාණි=) උද්‍රශ්මයශ්චතෙ රත්නාඞ්කුරාශ්චෙති = තෙෂාම්ධාම= (තස්මින්) අමරා විද්‍යන්තෙ'ස්‍යාමිති, අමරාවතී, (තාම්) යනු විග්‍රහයි. **ශෛලෂානුප්‍රාණිත උපමාලඞ්කාරයි.**

63. සතිඬ්ඛාඤ්ජනශ්‍යාමරුචිඃ, සිතිඳු අඳුන්සේ සම්වන් කාන්ති ඇති හෙවත් සිතිඳු අඳුනෙන් සම්වන් දීප්තිඇති; සුවෘත්තඃ, මනා පැවතුම් ඇති නො හො ත් වටවූ; ත්‍රිලොකීතිලකඃ, තුන්ලොවට තිලකාභරණයක්වූ; සඃඑව, ඒ ශ්‍රීවිෂ්ණු තෙමේම; විශෙෂකඃ, වෙසෙසන්නාවූ හෙවත් තිලකාභරණය මෙන්; අධ්වංසිතවර්ණකාන්තෙඃ, නොනැසුනු බ්‍රාහමණාදි වර්ණයන් සම්බන්ධ උජ්වලතාඇති; යස්‍යාඃ, යම් පුරියක්හුගෙ නොහොත් අධ්වංසිතවර්ණකාන්තෙඃ, නොනැසුණාවූ ගෛරිකාදි වර්ණ හා කාන්තිඇති; වඪ්වාඃඉව, කාන්තාවගෙ මෙන්; ශ්‍රියං, ශෝභාව; විශිශෙෂ, වෙසෙසුවේද.

**සඃ ශ්‍රියං විශිශෙෂ,** යනු මෙහි, ක්‍රි= සි. විශිශෙෂ යනු, විපූර්ව, ශිෂ, විශෙෂෙ, ධාතුවෙන්, පරව පරොක්ෂලිට්, ණප්, ප්‍රත්‍යයෙන් සිඬයි, සතිඬ්ඛංචතත් අඤ්ජනඤ්චෙති,= තවත් ශ්‍යාමරුචිර්‍යස්‍යසඃ= සු ශොභනං වෘත්තිර්‍යස්‍යසඃ= අධ්වංසිතා වර්ණානාම් (බ්‍රාහමණාදීනාම්) කාන්තිර්‍යස්‍යාඃසාඃ= (තස්‍යාඃ) අධ්වංසිතො වර්ණො (ගෛරාදිඃ) කාන්ති ශ්චවර්ණ්‍යංච යස්‍යාඃ, සා= ත්‍රයාණාම් ලොකානාම් සමාහාරස්ත්‍රිලොකී, 'සත්‍රියාම්ෂ්‍යතෙ, ඉතිසත්‍රිතෙව, විගොඃ, ඉතිඞීප්, යනු කීහෙයින්, ඞීප්, ප්‍රත්‍යයි, තස්‍යාඃතිලකඃ= යනු විග්‍රහයි. **අනෙකොපමා** නොහොත් **ශෛලෂොපමායි.**

64 අතුලප්‍රතාපඃ, අතුල්‍ය තෙජස් ඇත්තාවූ; සඃ, ඒ ශ්‍රීවිෂ්ණු තෙම; තාම්පුරං, ඒ නුවර; ඊක්ෂමානඃ, බලන්නේ; පුරස්තාත්, පෙර දික්හිවූ; ප්‍රතොලීම්, වීථියට; ප්‍රාපත්, පැමිණියේය; වජ්‍ර, තොරණාදි

65. ප්‍රජා ඉවාඞ්ගාදරවින්දනාභෙඃ
ශම්භොර්ජටාජූටතටාදිවාපඃ
මුඛාදිවාථ ශ්‍රුතයො විධාතුඃ
පුරාන්නිරීයුර්මුරජිද්ධ්වජින්‍යඃ.

66. ශ්ලිෂ්‍යද්භිරන්‍යොන්‍යමුඛාග්‍රසඞ්ග
ස්ඛලත්ඛලීනං හරිභිර්විලොලෛඃ
පරස්පරොත්පීඩිතජානුභාගා
දුඃඛෙන නිශ්චක්‍රමුරශ්වවාරාඃ.

---

යෙහිවූ දියමනති සම්බන්ධිවූ; ප්‍රභාද්භාසි, කාන්තිවලින් උසස්ව බබලනසුලුවූ; සුරායුධශ්‍රීඃ, ඉන්ද්‍රචාප ශොභාඇති නොහොත්; වජ්‍ර, කුලිසායුධය, ( විදුරවිය ) සම්බන්ධිවූ; ප්‍රභොද්භාසි, කාන්තිවලින් උසස්ව බබලන සුලුවූ; සුරායුධශ්‍රීඃ, අනික් දෙවියන්ගේ ආයුධ සම්බන්ධ ශෝභාඇති; යා, යම් රථ්‍යාවක්තොම; දෙවසෙනාඉව, දෙවි සෙනඟ මෙන්; පරෛඃ, සතුරන් විසින්; අලඞ්ඝ්‍යා, දුඃප්‍රදර්ශ්‍යද හෙවත් දුකසේ ලඞ්ඝනය (ඉක්මවීම) කටයුත්තිද.

**සඃ පුරං ඊක්ෂමාණඃ ප්‍රතොලිං ප්‍රාපත්,** යනුද, **යා පරෛඃ අලඞ්ඝ්‍යා භවති,** යනුද මෙහි, ක්‍රි- යි. ප්‍රාපත්, යනු අනද්‍ය-ලඞයි, පතඝ, ගතෞ ධාතුවෙන්, දිප්, ප්‍රත්‍යයි (මෙහි විග්‍රහාදිය සුබොධයි) **උපමාලංකාරයි.**

65. අරවින්දනාභෙඃ, පද්මගර්භයාගේ හෙවත් ශ්‍රී විෂ්ණුහුගෙ; අඞ්ගාත්, අඞ්ගයෙන් හෙවත් ශරීරයෙන්; ප්‍රජාඃඉව, ප්‍රජාවන් උප දින්නාක්මෙන්ද; ශම්භොඃ, මෙහෙසුරුගෙ; ජටාජූටතටාත්, දළ මඬුල්ලෙන්; ආපඃඉව, ගඞ්ගාජලය නික්ම්‍රාන්ත වන්නාක්මෙන්ද; විධාතුඃ, මහබඹුගෙ; මුඛාත්, මුඛයෙන්; ශ්‍රුතයඃඉව, වේදයන් මෙන්ද; මුරජිත්ධ්වජින්‍යඃ, ශ්‍රීවිෂ්ණුහුගේ සේනාවෝ; පුරාත්, ඒ නුව රින්; නිරීයුඃ, නික්මුනාහුය.

**මුරජිත්ධ්වජින්‍යඃ පුරාන්නිරීයුඃ,** යනු, මෙහි, ක්‍රි-යි. නිරීයුඃ, යනු පරොක්ෂලිට්යි, නිර්, පූර්ව ඉණ්, ගතෞ ධාතුවෙන්, උස් ප්‍රත්‍යයි, මෙහි විග්‍රහවාක්‍ය සුබොධයි. **මාලොපමාලඞ්කාරයි.**

66. අන්‍යොන්‍යමුඛාග්‍ර, ඔවුනොවුන්ගේ මුඛාග්‍රයන්හි; සඞ්ග, ආසක්තියෙන් හෙවත් ඇලීමෙන්; ස්ඛලත්, පැකිලෙන්නාවූ; ඛලී නං, කටකලියාවන් ඇතිසේ; ශ්ලිෂ්‍යද්භිඃ, ශ්ලිෂ්ටවන්නාවූ හෙවත් සඞ්ඝටිතවන්නාවූ; විලොලෛඃ, චපලවූ; හරිභිඃ, අශ්වයන් කාරණ කොටගෙණ; අශ්වවාරාඃ, අසුන් වලකන්නෝ හෙවත් අස්ගොව්වෝ

67. නිරන්තරාලෙ'පි විමුච්‍යමානෙ
දූරං පථි ප්‍රාණභෘතාං ගණෙන
තෙජෝමහද්භිස්තමසෙව දීපෛර්
විපෛ'රසම්බාධමයාං බභූවෙ.

68. ශනෛ'රනීයන්ත රයාත්පතන්තො
රථාඃ ක්ෂිතිං හස්තිනඛාදඛෙදෛඃ
සයත්නසූතායත රශ්මිභුග්න
ග්‍රීවාග්‍රසංසක්තයුගෛ ස්තුරඞ්ගෛඃ.

---

(අශ්වාරෝහකයෝයි) පරස්පරෙත්පීඩිත, එකිනෙකින් පෙළෙන ලද්දවූ; ජානුභාගාඃ, ජානුභාගයන් හෙවත් දනහිස් ඇත්තාහු; දුඃඛෙන, ආයාසයෙන් හෙවත් දුකසේ, නිශ්චක්‍රමුඃ, නික්මගියාහුය.

**අශ්වවාරාඃ දුඃඛෙන නිශ්චක්‍රමුඃ**, යනු, මෙහි ක්‍රි-යි. නිශ්චක්‍රමුඃ යනු පරොක්ෂලිට්යි, නිර්පූර්ව ක්‍රමු, ගතෞ ධාතුවෙන්, උස්, ප්‍රත්‍යයයි, **අන්‍යශ්ච අන්‍යශ්ච අන්‍යෝන්‍යානි**; මුඛානාමග්‍රාණි= අන්‍යෝන්‍යේෂාම් මුඛාග්‍රාණි= තෙෂු **සඞ්ගඃ**= තෙන සබලග්නාඃ බලිතාඃ යස්මින් තත්= (තම්) පරශ්ච පරශ්ච පරස්පරම් ජානූනාම්භාගාඃ= පරස්පරෙන උත්පීඩිතාඃ ජානුභාගාඃ යෙෂාං තෙ පරස්පරොත්පීඩිත ජානුභාගාඃ, **අශ්වාන්වාරයන්තීති, අශ්වවාරාඃ** (අශ්වාරොහාඃ) යනු මෙහි, විග්‍රහ වාක්‍යයි. **ස්වභාවොක්ති අතිශයොක්ති සංකරයි.**

67. තමසාඉව, අන්ධකාරයෙන් මෙන්; ප්‍රාණභෘතාංගණෙන, **සත්වවර්ගයා** විසින්; නිරන්තරාලෙඅපි, අතරනැත්තාවූද; පථි, මාර්ගය; දූරං, දුරින්ම; විමුච්‍යමානෙ, මුදනුලබන කල්හි හෙවත් දීප හයින් හෝ හස්තිභයින් මුදනුලබන කල්හි; තෙජෝමහද්භිඃ, ප්‍රභාසම්පන්නවූ; දීපෛඃ, ප්‍රදීපවලින්ද; තෙජෝමහද්භිඃ, බලාධිකවූ; විපෛඃ, හස්තීන්ගෙන්ද; අසම්බාධමයාං බභූවෙ, අසංබාධමයවීය හෙවත් අසංකීර්ණභාවයට පැමිණියේය; මාර්ගයෙහි (අසංකීර්ණව (සම්බාධ රහිතව) හස්තීහු ගියාහුයි) සේයි.

**පන්ථාඃ දීපෛඃ විපෛඃ අසම්බාධමයාං බභූවෙ**, යනු මෙහි, ක්‍රි- යි. බභූවෙ, යනු පරොක්ෂලිට්යි භූ, සත්තායාම්, ධාතුවෙන්, එ, ප්‍රත්‍යයයි **ස්වභාවොක්තියි**.

68. රයාත්, වේගයෙන්; පතන්තඃ, දුවන්නාවූ හෙවත් පැන යන්නාවූ; රථාඃ, රථයෝ; සයත්න, උත්සාහ සහිතවූ; සූත, සාරථින් හෙවත් රියැදුරන් විසින්; ආයත, අදිනලද; රශ්මි, රැහැන් වලින්; භුග්න, වක්වූ; ග්‍රීවාග්‍ර, ගෙලගෙහි; සංසක්තයුගෛඃ, හැපුනාවූ විය

69. බලෝර්මිභි'ස්තත්ක්ෂණහීයමාන
රථ්‍යාභුජායා වලයෛ'රිවාස්‍යාඃ
ප්‍රායේණ නිෂ්ක්‍රාමති චක්‍රපාණෞ
නේෂ්ටං පුරෝ ද්වාරවතීත්ව'මාසීත්.

---

දබු ඇති; අබෙදෛඃ, බෙදරහිතවූ; තුරඞ්ගෛඃ, අශ්වයන් විසින්; හස්තිනඛාත්, හස්තිනඛයෙන් හෙවත් ඉදිරි දොරවූ මෘත්කූටයෙන්; සන්තෛඃ, සෙමින්; ක්ෂිතිං, පොළොවට; අනීයන්ත, පමුණුවනු ලැබූහ.

**තුරඞ්ගෛඃ, රථ්‍යාඃශනෛඃක්ෂිතිං, අනීයන්ත,** යනු මෙහි, ක්‍රි- යි. අනීයන්ත, යනු අනද්‍ය-ලඞ්, නී, ප්‍රාපණෙ ධාතුවෙන්, කර්මයෙහි අන්ත, ප්‍රත්‍යයි, හස්තීනාම් නඛඃ= (නඛමාත්) තාස්මිඃඛදෙ යෙෂාම්, තෙ අබෙද්‍යාඃ (තෛඃ) යතෙනාන සහ වර්තනෙන, ඉති සයන් තාඃ සංයතනාශ්චතෙ සූතාශ්චෙති=තෛඃ ආයතා (ආකෘෂ්ටාඃ)රසමයඃ= තෛ භ්‍රීගනාති= ග්‍රීවාණාමග්‍රාණි,= සංයතනසූතායත භුගනානිවතානි ග්‍රීවාග්‍රානිශ්චෙති= තෙෂු සංසක්තා ප්‍රුගා යෙෂාම් තෙ,= (තෛඃ) යනු සමාස වාක්‍යයි, මෙහිදු යථාවචස්තුවර්ණනය හෙයින් **ස්වභාවොක්තියි.**

69. බලොර්මිභිඃ, සෙනඟ නමැති තරඞ්ගයන් විසින්; වලයෛඃ ඉව, වළලු විසින් මෙන්; තත්ක්ෂණ, එහරිනිෂ්ක්‍රමණක්ෂණයෙහි හෙවත් ශ්‍රීවිෂ්ණුහු නික්මීයන ක්ෂණයෙහි; හීයමාන, අපරිච්‍යමානවූ හෙවත් හිස්කරණු ලබන්නාවූ; රථ්‍යාභුජායාඃ, වීථිනමැති බාහුඇති; අස්‍යාඃපුරඃ, ඒ පුරියගෙ හෙවත් ඒ අමරාවතී නම් නුවරේ; ද්වාරවතීත්වං, දොර ඇතිබව; චක්‍රපාණෞ, ශ්‍රීවිෂ්ණුහු; නිෂ්ක්‍රාමති, ඉන් නික්මයනකල්හි; ප්‍රායේණ, බෙහෙවින්; නඉෂ්ටං ආසීත්, අභිමත නොවීය.

**චක්‍රපාණෞ නිෂ්ක්‍රාමති පුරඃද්වාරවතීත්වං නෙෂ්ටමාසීත්,** යනු මෙහි, ක්‍රි- යි. ආසීත්, යනු භූතාර්ථ ලුඞ්-යි, අස්, භුවි ධාතුවෙන් දිප්, ප්‍රත්‍යයයි, බලානි, එවඋර්මය ඉවෙති,=(තෛඃ) තත්ක්ෂණෙ(එව) හීයමානා (අපරිච්‍යමානා) රථ්‍යාභුජෙව'යස්‍යාඃ සා= (තස්‍යාඃ) ද්වාරම ස්‍යාස්තීති ද්වාරවතී, තස්‍යාඃභාවඃ = යනු විග්‍රහයි, **උපමාසංකීර්ණ උත්ප්‍රෙක්ෂාලංකාරයි.**

70. පාරෙජලං නිරනිධෙ'රපශ්‍යත්
මුරරිපු'නිලපලාශරාශිඃ
වනාවලි'රුත්කලිකාසහස්‍ර
ප්‍රතික්ෂණොත්කුලිතශෛවලාභාඃ.

71. ලක්ෂ්මීභෘතො'මෙහාධිතටාධිවාසාන්
ද්‍රුමාහසෞ නිරදනිලභාසඃ
ලතාවධූසංප්‍රයුජෝ'ධිවෙලං
බහුකෘතාන් ස්වාතිව පශ්‍යති සම.

---

70. මුරරිඃ, ශ්‍රීකෘෂ්ණතෙම; නිරනිධෙඃ, මහාසමුද්‍රයාගෙ; පාරෙ ජලං, ජලපාරයෙහි හෙවත් පරතීරයෙහි; අානිල, හාත්පසින් නිල් වත්වූ; පලාශරාශිඃ, පත්‍රසමූහ ඇති; උත්කලිකාසහස්‍ර, ඌර්මි සම්බන්ධවූ දහසින් හෙවත් දහස්ගණන් තරඞ්ගවලින්; ප්‍රතික්ෂණ, ඇසිල් ලක්පාසා; උත්කුලිත, ඉවිරට පමුණුවන ලද්දවූ, ශෛවලාභාඃ, සෙවල්සම්බන්ධ ශොභාවැනි ශොභාඇති; වනාවලීඃ, උද්‍යානපඞ්කතීන්; අපශ්‍යත්, දුටුවේය.

**මුරාරිඃ වනාවලීඃ අපශ්‍යත්,** යනු මෙහි ක්‍රි- සි. අපශ්‍යත්, යනු අනද්‍යතන ලුඞ්සි, දෘශිර්, ප්‍රෙක්ෂණෙ ධාතුවෙන් දිප්, ප්‍රත්‍යයි, දෘශාදෙඃ, පශ්‍යාදිඃ, යනුවෙන් දෘශිර්, ධාතුහට පශ්‍යාදෙශයි ජලානාම් පාරෙ, පාරෙජලං, පාරෙමධ්‍යෙ ෂෂ්ඨ්‍යාවා, යනුවෙන් අව්‍යයි භාවයි නීරාණාම් (ජලානාම්) නිධිඃ, නිරනිධිඃ, (තස්‍ය) පලාශානාම් රාශයඃ= අා ස් මන්තාත් නීලාපලාශරාශයඃ යාසාම් තාඃ = වනානාමාවල්‍යඃ = (තාඃ) උත්කලිකානාම් සහස්‍රාණි= ක්ෂණංප්‍රති, ප්‍රතික්ෂණං ප්‍රතික්ෂණං උත් කුලිතානාම් ශෛවාලානාම් ආභාඉව අාභායාසාම්, තාඃ= යනු විග්‍රහ වාක්‍යයි, **උපමා උත්ප්‍රෙක්ෂා සංදෙහ සංකරයි**.

71. අසෞ, ඒශ්‍රීකෘෂ්ණතෙම; ලක්ෂ්මීභෘතඃ, ශොභාධරවූ හෙවත් ශ්‍රීදෙවිය ධරන්නාවූ; අමෙහාධිතටාධිවාසාන්, සමුද්‍රතටයෙහි විසීම ඇත්තාවූ; නිරදනිලභාසඃ, මෙඝයන්සේ නිල්වන් කාන්තිඇති; ලතාවධූ, කාන්තාවන් නමැති ලතාවන් හා හෙවත් ලියවැනි කාන්තාවන් හා; සංප්‍රයුජඃ, සඞ්ගතවූ; අධිවෙලං, මුහුදුවෙරළෙහිවූ; ද්‍රුමාන්, වෘක්ෂයන්; බහුකෘතාන්, බහුකෘතවූ හෙවත් අනෙකකරණලද්දවූ; ස්වාන්ඉව, ස්වකීය ශරීරයන් මෙන්; පශ්‍යතිසම, දුටුවේය.

**අසෞ ස්වාන්ඉව අධිවෙලං ද්‍රුමාන්, පශ්‍යති සම,** යනු මෙහි ක්‍රි- සි. පශ්‍යති සම, යනු සමනිපාත යොගයෙහි අතීතකාලාර්ථ වර්තමානලට්සි, දෘශිර්, ප්‍රෙක්ෂණෙ ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි, පශ්‍ය, යනා

72. ආශ්ලිෂ්ටභූමිං රසිතාරමුච්චෛ
ර්ලොලද්භුජාකාරවෘහත්තරඞ්ගම්
ඵේනායමානං ප්‍රතිමා'පගානා
මසාවපස්මාරිණ'මාශශඞ්කෙ.

73. පීත්වා ජලානාං න්ධිනා'තිගාර්ධ්‍යාත්
වෘද්ධිං ගතෙ'ප්‍යාත්මනි නෛවමාන්තීඃ
ක්ෂිප්තා ඉවෙන්දොඃ ස රුචොධිවෙලා
මුක්තාවලී'රාකලයාංචකාර.

---

දෙශය මූලකිතයින්මැයි, ලක්ෂ්මීං බිභ්‍රතීති,= (තාන්) අම්භොධිතටෙ ඃධිවාසො යෙෂාම් තෙ= (තාන්) නිරදවන්තිලභාසො යෙෂාම් තෙ= (තාන්) ලතාඉව වධ්වඃ= තානිඃ සංප්‍රයුජ්‍යන්තාඉති,= වෙලාශාමධි, අධිවෙලං, විභක්ත්‍යර්ථයෙහි අව්‍යයී භාවයි, බහු (අනෙකී) ක්‍රතාඉති බහුක්‍රතාඃ (තාන්) යනු නිර්වචනයි, **ශ්ලෙෂසංකීර්ණ උත්ප්‍රෙක්ෂායි**.

72. ආශ්ලිෂ්ටභූමිං, වැලඳගත්තාලද භූතල ඇති; උච්චෛඃ, උස්වූ; රසිතාරං, ශබ්දපවත්වන්නාවූ; ලොලත්, චංචලවන්නාවූ; භුජාකාර, භුජසම්බන්ධ අයුරුඇති; වෘහත්තරඞ්ගම්, මහත් රළඇති; ඵේනායමානං, පෙනවමාරන්නාවූ හෙවත් පෙනනගන්නාවූ; ආපගානාම් පතිම්, මහසයුර; අසෞ, ඒ ශ්‍රීකෘෂ්ණතෙම; අපස්මාරිණං, අපස්මාරරොගඇත්තෙකු කොට; ආශශඞ්කෙ, සැකකෙළේය.

**අසෞ ආපගානාම් පතිම් අපස්මාරිණං ආශශඞ්කෙ**, යනු මෙහි, ක්‍රි- යි. ආශශඞ්කෙ, යනු, පරොක්ෂලිට්යි, ආඞ්, පූර්, ශඞ්, ශංසයෙ ධාතුවෙන්, එ, ප්‍රත්‍යයි, ආශ්ලිෂ්ටා භූමිඃ යෙනාසාවාශ්ලිෂ්ට භූමිඃ (තම්) ලොලන්තශ්ච තෙ භුජ්ගශ්චති= ලොලත් භුජගාමාකාර ඉවාකාරො යෙෂාම් තෙ=ලොලත්භුජාකාරාඃ වෘහත්තරඞ්ගාඃ යස්‍යසඃ= (තම්) ඵේනමුද්වමතීති ඵේනායමානඃ (තම්) අපස්මාරො'ස්‍යාස්තීත්‍ය පශමාරී (තම්) යනු විග්‍රහයි, **උත්ප්‍රෙක්ෂාලංකාරයි**.

73. ජලානාම්නිධිනා, ජලනිධිය විසින්; අතිගාර්ධ්‍යාත්, ඉතාගෘධ්‍රභාවයෙන් හෙවත් ගිජුබැවින්; වෘද්ධිංගතෙඅපි, නැවත වැඩීමට පැමිණියාවූද; ආත්මනි, තමාකෙරෙහි (ශරීරයෙහි;) නෛවමාන්තීඃ, නොමපමිණ සාරන්නාවූ හෙවත් අතිරිච්‍යමානවූ; ක්ෂිප්තාඃ, ක්ෂෙපනයකාරණලද්දාවූ හෙවත් පතුරුවන ලද්දාවූ; ඉන්දොඃරුචඃඉව, චන්ද්‍රමරීචීන්මෙන්; සඃ, ඒ ශ්‍රිවිෂ්ණුතෙම; අධිවෙලං, මුහුදුඉව්රෙහිවූ; මුක්තාවලීඃ, මුක්තාපඞ්ක්තීන්; (මුතුපෙල) ආකලයාංචකාර, ආකලනය (හාත්පසින් ගිණීම) කෙළේය.

74. සාටොපමුර්වී'මනිශං නදන්තො
යෛඃ ප්ලාවයිෂ්‍යන්ති සමන්තතො'මී
තානෙකදෙශාන්නිභෘතං පයොධෙඃ
සො'ම්භාංසි මෙඝාන් පිබතො දදර්ශ.

75. උද්ධෘත්‍ය මෙඝෛස්තත එව තොය
මර්ථං මුනීන්ද්‍රෛරිව'සම්ප්‍රණීතාඃ
ආලොකයාමාස හරිඃ පතන්තී
ර්නදීඃ ස්මෘතීර්වේද'මිවා'ම්බුරාශිම්.

---

**සඃ මුක්තාවලිඃ ආකලයාංචකාර.** යනු, මෙහි ක්‍රි- යි. ආකලයාංචකාර, යනු පරොක්ෂලිට්යි, ආඞ් පූර්ව, කල, සංඛ්‍යානෙ අනුප්‍රයොග, කෘඤ්, කරණෙ ධාතුන් කෙරෙන්, ණප්, ප්‍රත්‍යයෙන් හා ආම්,ප්‍රත්‍යයෙන් සිඬයි, ගඬීඑව ගාඪයීම් අතිමාත්‍රම් ගාඪයීම්=තසමාත් වෙලායාමධ්‍යධිවෙලං = විභක්ත්‍යර්ථෙ ව්‍යයීභාවඃ, යනුවෙන් අව්‍යයීභාවයි, මුක්තානා ාවල්‍යඃ=(තාඃ) **උත්ප්‍රෙක්ෂායි.**

74. අමී, මේ මේඝයෝතුමූ; සාටොපං, ආටොපසහිතව හෙවත් සම්භ්‍රම සහිතව; අනිශං, නිතර; නදන්තඃ, ගුගුරන්නාහු; යෛඃ, යම් ජලවලින්; උර්වීං, පෘථිවිය; සමන්තතඃ, හාත්පසින්; ප්ලාවයිෂ්‍යන්ති, ඉල්පවන්නාහුද; තාන්අම්භාංසි, ඒ ජලයන්; පයොධෙඃ, සමුද්‍රයාගෙ; එකදෙශාත්, එක් දෙශකින්; නිභෘතං, නිශ්චලසේ; පිබතඃ, බොන්නාවූ; මෙඝාන්, මේඝයන්; සඃ, ඒ ශ්‍රීවිෂ්ණු තෙම; දදර්ශ, දුටුවේය.

**අමී උර්වීං ප්ලාවයිෂ්‍යන්ති**, යනුද, **සඃ මෙඝාන් දදර්ශ**, යනුද මෙහි, ක්‍රි- යි. ප්ලාවයිෂ්‍යන්ති, යනු, භවිෂ්‍යත්කාලලෘට්යි, ප්ලව, ප්ලවනෙ ධාතුවෙන් ෂ්‍යන්ති, ප්‍රත්‍යයි, දදර්ශ, යනු දෘශිර්, ප්‍රෙක්ෂණෙ ධාතුවෙන් පරොක්ෂලිට්, ණප්, ප්‍රත්‍යයෙන් සිඬයි, ආටොපෙන (සංභ්‍රමෙන) සහවර්තත ඉති සාටොපම්, පයාංසි, ධීයන්තෙත්‍රෙති පයොධිඃ, (තස්‍ය) මෙහි සාටොපං, යනුද අනිශං යනුද නිභෘතං යනුද ක්‍රියා විශෙෂණයි.

**එතෙන සමුද්‍රස්‍යාපරිච්ඡින්නරූපත්වං ව්‍යජ්‍යතෙ, යනු ටීකායෙහි කී හෙයින්, මෙයින් සමුද්‍රයාගේ අපරිච්ඡින්න රූපත්වය ප්‍රකාශවෙයි** සේයි, **ස්වභාවොක්ති අලංකාරයි.**

75. මුනීන්ද්‍රෛඃ, මුනීන්ද්‍රයන් විසින් හෙවත් ඍෂිවරුන් විසින්; අර්ථංඉව, වේදාර්ථය මෙන්; මෙඝෛඃ, මේඝයන් විසින්; තතඃඑව, ඒ සමුද්‍රයෙන්ම; තොයං, ජලය; උද්ධෘත්‍ය, උඬරණයකොට; සංප්‍රණී

76. වික්‍රිය දිශ්‍යානි ධනාන්‍යුරූණි
වෛප්‍යානසාවු'ත්තමලාභභාජඃ
තරීෂු තත්‍රත්‍ය'මඵල්ගු භාණ්ඩං
සාංයාත්‍රිකානාවපතෝ'භ්‍යනන්දත්.

---

තාඃ, මොනවට පමුණුවනලද්දාවූ; අම්බුරාශිං, සමුද්‍රයට; පතන්තීඃ, වැටෙන්නාවූ හෙවත් ප්‍රවිෂ්ටවන්නාවූ; නදීඃ, ගඞ්ගාවන්; වේදං, වේදයට; පතන්තීඃ, වැටෙන්නාවූ; ස්මෘතීඃ, ස්මෘතිශාස්ත්‍රයන් මෙන් හෙවත් මන්වාදිසංහිතාවන් මෙන්; හරිඃ, ශ්‍රීවිෂ්ණුතෙම; ආලොකයාංචකාර, දුටුවේය.

**හරිඃ නදීඃ ආලොකයාමාස,** යනු මෙහි, ක්‍රි- යි. ආලොකයාමාස, යනු පරොක්ෂලිට්හි, ලොච, දර්‍ශනෙ ධාතුවෙන් ආම්, ප්‍රත්‍යය හා අස්, භූවි අනුප්‍රයෝගයි, ණප්, ප්‍රත්‍යයි, මුනිනාම් ඥාඃ=(තෙඃ) අම්බුනාම් රාශිඃ=(තම්) යනු සමාස වාක්‍යයි. **අනෙකොපමාලඞ්කාරයි.**

76. දිශ්‍යානි, දිශාජනවූ; උරූණි, මහත්වූ; ධනානි, ධනයන් හෙවත් නානාද්‍රව්‍යයන්; වික්‍රිය, විකුට; උත්තමලාභභාජඃ, උතුම්වූ ලාභයන් භජනයකරන්නාවූ; තත්‍රත්‍යම්, තත්‍රජනවූ හෙවත් ඒප සඤ්ජාතවූ; අඵල්ගු, නොසිස්වූ හෙවත් සාරවත්වූ; භාණ්ඩං, බඩු හෙවත් මූලධනය; තරීෂු, නෞකාවන්හි; ආවපතඃ, දරාසිටින්නාවූ; වෛප්‍යාන්, සමුද්‍රවිපවාසීවූ; සාංයාත්‍රිකාන්, සාංයාත්‍රිකයන් හෙවත් එකතැඬෙහියාත්‍රාකිරීමප්‍රයෝජනකොට ඇත්තන් හෝ නැව්හි වෙළෙදාම් කරන්නන්; අසෞ, ඒ ශ්‍රීකෘෂ්ණතෙම; අභ්‍යනන්දත්, සතුටින් පිළිගත්තේය.

**අසෞ සාංයාත්‍රිකාන් අභ්‍යනන්දත්,** යනු මෙහි, ක්‍රි- යි. අභ්‍යනන්දත්, යනු, අනද්‍යතන- ලඞ්යි, අභිපූර්‍ව, නද, සමෘද්ධෞ, ධාතුවෙන්, දිප්, ප්‍රත්‍යයි, දික්ෂුභවානීති, දිශ්‍යානි වීපෙෂු නිවාසිනඃ, වෛප්‍යාඃ (තාන්) උත්තමශ්වාසෞලාභශ්චෙති= උත්තමලාභං (වෛගුණ්‍යාදිකං) භජන්තීති උත්තමලාභභාජඃ (තාන්) තත්‍රභවං තත්‍රත්‍යං, න ඵල්ගුඅඵල්ගු සංයාත්‍රා, (සංභූයයාත්‍රා) සා ප්‍රයොජනමෙෂාමස්තීති සාංයාත්‍රිකාඃ (තාන්) ආවපතන්ති (ආදදන්තීති) ආවපතඃ (තාන්) යනු විග්‍රහයි, **ස්වභාවොක්තියි.**

77. උත්පිත්සවෝ'න්තර්නදභර්තුරුච්චෛ
ගරීයසා නිඃශ්වසිතානිලේන
පයාංසි භක්ත්‍යා ගරුඩධ්වජස්‍ය
ධ්වජා'ඉවෝච්චික්ෂිපිරේ'හීන්ද්‍රාඃ.

78. තමාගතං වීක්ෂ්‍ය යුගාන්තබන්ධු
මුත්සඞ්ගශය්‍යාශයමම්බුරාශිඃ
ප්‍රත්‍යුජ්ජගාමේව ගුරුප්‍රමෝද
ප්‍රසාරිතෝත්තුඞ්ගතරඞ්ගබාහුඃ.

---

77. නදභර්තුඃ, සමුද්‍රයාගෙ; අන්තඃ, ඇතුළින්; උත්පිත්සවඃ, උත්පතනය කරණුකැමැත්තාවූ; අහීන්ද්‍රාඃ, නාගරජයෝ; භක්ත්‍යා, භක්තිය කාරණකොටගෙණ; ගරුඩධ්වජස්‍ය, ගුරුළුදදගෙ හෙවත් ශ්‍රීකෘෂ්ණයාගෙ; ධ්වජාන්ඉව, ධ්වජයන්මෙන්; ගරීයසා, ගරුතරවූ හෙවත් ඉතා මහත්වූ; නිඃශ්වසිතානිලේන, නිඃශ්වාසමාරුතයෙන්; පයාංසි, ජලයන්; උච්චෛඃ, උසස්කොට; උච්චික්ෂිපිරේ'ඉව, උත් ක්ෂේපකළවුන් මෙන්වූහ.

**අහීන්ද්‍රාඃ නිඃශ්වසිතානිලේන පයාංසි උච්චික්ෂිපිරේ, ඉව,** යනු මෙහි ක්‍රි- යි උච්චික්ෂිපිරේ, යනු පරෝක්ෂලිට්යි, උත් පූර්ව ක්ෂිප, ප්‍රේරණේ, ධාතුවෙන්, ඉරේ, ප්‍රත්‍යයයි, (උත්පතිතුමිච්ඡන්තීති= නදස්‍ය භර්තා නදභර්තා) (තස්‍ය) අතිශයේනගුරුරිති ගරීයාන් (තේන) නිඃශ්වසිතශ්වාසාවනිලශ්චේති=(තේන) ගරුඩඃ ධ්වජේ යස්‍යසඃ=(තස්‍ය) අහීනාමින්ද්‍රාඃ අහීන්ද්‍රාඃ, යනු නිර්වචනයි, **උපමාලංකාරයි**.

78. අම්බුරාශිඃ, සමුද්‍රයතෙම; යුගාන්තබන්ධුඃ, යුගාවසානයෙහි බන්ධුවූ හෙවත් විපතෙහි මිත්‍රයාවූ; උත්සඞ්ගශය්‍යාශයං, ඇක නැමති ශය්‍යායෙහි හෝනාවූ; ආගතං, ඉදිරියට ආවාවූ; තං, ඒ ශ්‍රීවිෂ්ණුහු; වීක්ෂ්‍ය, දැක; ගුරුප්‍රමෝද, මහත් සන්තෝෂයෙන්; ප්‍රසාරිත, දිගුකරණලද; උත්තුඞ්ගතරඞ්ගබාහුඃ, උස්වූතරඞ්ගනමැති බාහු ඇත්තේ; ප්‍රත්‍යුජ්ජගාමඉව, ප්‍රත්‍යුද්ගමනය (ඉහලට නැගීම) කළාක්මෙනි.

**අම්බුරාශිඃ තං වීක්ෂ්‍ය ප්‍රත්‍යුජ්ජගාම, ඉව,** යනු මෙහි, ක්‍රි- යි, ප්‍රත්‍යුජ්ජගාම, යනු පරෝක්ෂලිට්යි, ප්‍රතිඋත්පූර්ව ගම්ලෘ, ගතෞ ධාතුවෙන්, ණප්, ප්‍රත්‍යයයි, උත්සඞ්ග එව ශය්‍යා = තස්‍යාම් ශෙත ඉති,= (තම්) අම්බූනාම්රාශිඃ= ගුරුඃ (මහාංශ්චාසෞ) ප්‍රමෝදශ්චේති= තේන ප්‍රසාරිතා= උත්තුඞ්ගාශ්ච තෙ තරඞ්ගාශ්චේති= ගුරුප්‍රමෝදප්‍රසාරිතා උත්තුඞ්ගතරඞ්ගා එව බාහවෝ යස්‍යසඃ = යනු විග්‍රහ වාක්‍යයි, **ක්‍රියා ස්වරූපෝත්ප්‍රේක්ෂායි.**

79. උත්සඞ්ගිතා'ම්භඃකණකො නභස්වා
නුදඤ්චතඃ ස්වෙදලවාන් මමාර්ජ
නභස්‍ය'නුවෙලං ව්‍රජතො'ධිවෙල
මෙලාලතාස්ඵාලනලබ්ධගන්ධඃ.

80. උත්තාලතාලීවනසංප්‍රවෘත්ත
සමීරසීමන්තිතකෙතකීකාඃ
ආසෙදිරෙ ලාවණසෛන්ධවීනාං
චමූචරෛඃ කච්ඡභුවාං ප්‍රදෙශාඃ.

---

79. උත්සඞ්ගිතාම්භඃකණකඃ, සංසර්ගීඇතිකරණලද දියපොද ඇති; එලාලතාස්ඵාලන, එන්සාල්වැල් සංඝට්ටණයෙන්; ලබ්ධගන්ධඃ, ලබනලද සුවඳ ඇති; උදඤ්චත', සමුද්‍රයාගෙ; නභස්වාන්, වාතයතෙම; අධිවෙලං, වෙරළෙහි; ව්‍රජතඃ, යන්නාවූ; නභස්‍ය, ඒ ශ්‍රීභූෂණයාගෙ; ස්වෙදජලාන්, ඩහදිය බිඳුන්; අනුවෙලං, නිතර; මමාර්ජ, ශුද්ධ කෙළේය හෙවත් සංසිඳෙව්වේය.

**නභස්වාන් නභස්‍ය ස්වෙදජලාන් අනුවෙලං මමාර්ජ,** යනු මෙහි ක්‍රි- සි. මමාර්ජ, යනු පරොක්‍ෂලිට්යි, මෘජ, ශුද්ධෞ ධාතුවෙන්, ණප්, ප්‍රත්‍යයි, උත්සඞ්ගිනඃ (සංසර්ගිණඃ) කෘතාඉති උත්සඞ්ගිතාඃ, උත්සඞ්ගිතා අම්භඃකණා, යෙනෙති,- ස්වෙදනාම් ලවාඃ=(තාන්) වෙලායාමධ්‍ය'ධිවෙලං, එලාලතානාම් ආස්ඵාලනං= තෙනලබ්ධගන්ධඃ= යනු විග්‍රහ වාක්‍යයි, **කාව්‍යලිඞ්ගාලඞ්කාරයි.**

80. චමූචරෛඃ, සෙනාවෙහිහැසිරෙන්නවුන් විසින් හෙවත් සෙනඞ්ගයන් විසින්; උත්තාලතාලීවන, උස්වූ තල්වන පෙත්හි; සංප්‍රවෘත්ත, මොනවට පැවැත්තාවූ; සමීරසීමන්තිත, වාතයෙන් සීමන්තිනිකරණලද හෙවත් (මාසිම් ඇත්තියක් කරණලද) කෙතකීකාඃ, වැටකේ ඇති; ලාවණසෛන්ධවීනාම්, ලවණ සින්ධුන්ගේ; කච්ඡභුවාංප්‍රදෙශාඃ, ජල බහුල භූමිප්‍රදෙශයෝ; ආසෙදිරෙ, පැමිණෙන ලද්දාහුය.

**චමූචරෛඃ කච්ඡභුවාං ප්‍රදෙශාඃ ආසෙදිරෙ,** යනු මෙහි ක්‍රි-සි. ආසෙදිරෙ, යනු, පරොක්‍ෂලිට්යි, ආඞ් පූර්ව, සිද, ගත්‍යෞ ධාතුවෙන් කර්මයෙහි, ඉරෙ, ප්‍රත්‍යයි, චමූෂු චරන්තීති චමූචරාඃ (තෛඃ) උත්තතාඃ තාලාඃ උත්තාලාඃ තාලීනාම්වනානි= උත්තාලානිච තානි තාලීවනානි චෙති= තෙෂු සංප්‍රවෘත්තඃ= උත්තාල- සම්ප්‍රවෘත්තශ්චාසෞ සමීරශ්චෙති= තෙන සීමන්තිතාඃ කෙතක්‍යො යෙෂු තෙ= ලවණසින්ධොරිමාඃ ලාවණසෛන්ධව්‍යඃ (තාසාම්) කච්ඡෙන (ප්‍රකාරා) භූඃ, කච්ඡභූඃ, (තාසාම්) යනු විග්‍රහයි, **ස්වභාවොක්ති අනුප්‍රාසාලංකාරයෝයි.**

81 ලවඞ්ගමාලාකලිතාවතංසා
ස්තෙ නාරිකෙලාන්තරපඃ පිබන්තඃ
ආසවාදිතාර්ද්‍රක්‍රමුකාඃ සමුද්‍රා
දභ්‍යාගතස්‍ය ප්‍රතිපත්තිමීයුඃ.

82. තුරගශතාකුලස්‍ය පරිතඃ පරමෙකතුරංගජන්මනඃ
ප්‍රමථිත භූභෘතඃ ප්‍රතිපථං මථිතස්‍යභෘශං මහීභෘතා
පරිචලතො බලානුජබලස්‍ය පුරඃ සතතං ධෘතශ්‍රිය
ශ්චිරවිගතශ්‍රියො ජලනිධෙශ්ච තදාභවදන්තරං මහත්.

**ඉති ශ්‍රී මාඝකාව්‍යෙ ශිශුපාලවධෙ මහාකාව්‍යෙ ශ්‍ර්‍යඞ්කෙ හරිප්‍රස්ථානො නාම තෘතීයඃ සර්ගඃ.**

---

81. ලවඞ්ගමාලාකලිතාවතංසාඃ, කරාබුමල්මාලාවලින් කරණ ලද අවතංස හෙවත් අබරණ ඇති; නාරිකෙලාන්තරපඃ, පොල් ඵල තුළෙහිවූ ජලය; පිබන්තඃ, බොන්නාවූ, ආසවාදිත, භක්‍ෂණය කරණ ලද; ආර්ද්‍රක්‍රමුකාඃ, අමුපුවක් ඇති; තෙ, ඒ සෛනිකයෝ තුමූ; සමුද්‍රාත්, මහසයුරෙන්; අභ්‍යාගතස්‍ය, අභ්‍යාගතවූවෙකුගෙ හෙවත් මුහුදින්ආඅමුත්තෙකුගෙ; ප්‍රතිපත්තිම්, ප්‍රතිපත්තියට හෙවත් සත්කාරයට; ඊයුඃ, පැමිණියාහුය.

**තෙ අභ්‍යාගතස්‍ය, ප්‍රතිපත්ති'මීයුඃ,** යනු මෙහි ක්‍රි- යි. ඊයුඃ, යනු පරොක්‍ෂලිට්යි, ඉණ් ගතෞ, ධාතුවෙන්, උස්, ප්‍රත්‍යයි, ලවඞ්ගානාම්, මාලාඃ= තාභිඃ, කලිතාඃ අවතංසාඃ යෙෂාම් තෙ= මෙහි නාරිකෙලාන්තඃ යනු අව්‍යයි, අපඃ යනු පෘථක්පදයි, ආසවාදිතා භක්‍ෂිතා ආද්‍රක්‍රමුකා (ආද්‍රපූගීඵලානි) යෛස්තෙ= යනු සමාස වාක්‍යයි, **කාව්‍යලිඞ්ගාලඞ්කාරයි**

82. පරිතඃ, හාත්පසින්; තුරගශතාකුලස්‍ය, සියගණන් අසුන්ගෙන් ගැවසුණාවූ; ප්‍රතිපථං, පෙරමඟ; ප්‍රමථිතභූභෘතඃ, ප්‍රකර්ෂයෙන් මථනයකරණලද රජුන් හෝ පර්වතඇති; සතතං, නිතර; ධෘතශ්‍රියඃ, දරණලද ශොභා හෝ ලක්‍ෂ්මීඇති; පුරඃ, ඉදිරියෙහි හෝ නුවරින්; පරිචලිතඃ, පරිගමනය කරන්නාවූ; බලානුජබලස්‍ය, රාමානුජයා සම්බන්ධවූ; හෙවත් රාමටපසුවඋපන් ශ්‍රීහරි සම්බන්ධ සෛන්‍යයාගේද; පරං, හුදෙක්; එකතුරඞ්ගජන්මනඃ, එකම අශ්වයෙකුගෙ උත්පත්තිමාත්‍රඇති; මහීභෘතා, මන්දරපර්වතය විසින් හෝ රජ විසින්; මථිතස්‍ය මථනය කරණලද්දාවූ; සතතං, නිරන්තරයෙන්; විගතශ්‍රියඃ, පහවූ ශ්‍රීඇති; ජලනිධෙශ්ච, සමුද්‍රයාගෙද; මහත්අන්තරං, මහත් අතරක්; තදා, ඒ ප්‍රස්ථාන සමයෙහි; අභවත්, වූයේයි.

ශ්‍රීමාඝකෘතෞ, ශ්‍රීමන්මාඝ මහාකවිහු විසින් රචනාකරණලද; ශිශුපාලවධෙ, ශිශුපාලවධ නම් ඇති; ශ්‍රයඞ්කෙ, ශ්‍රී අඞ්කවූ; මහාකාව්‍යෙ, මහාකාව්‍යයෙහි; පුරීප්‍රස්ථානො නාම, නගරප්‍රස්ථාන (නුවරින් පිටත්වීම) නම්වූ; තෘතීයඃසර්ගඃ, තුන්වන සර්ගය; ඉති, මෙතෙකින් සමාප්තයි.

**බලානුජබලස්‍ය ජලනිධෙශ්ච මහද්‘නතරම්’ භවත්,** යනු මෙහි ක්‍රි- යි. අභවත් යනු අනද්‍ය- ලඞ්යි, භූ, සත්තායාම් ධාතුවෙන් දිප්, ප්‍රත්‍යයි, මෙහි සමාස වාක්‍යාදිය ටීකානයින් සුබොධයි, ව්‍යතිරෙකාලඞ්කාරයි. පඤ්චකාවලීනම් වෘත්තයි, නභජජජරෛ නර්පිතෙ කාපිතා භුවි, පඤ්චකාවලී, යනු තල්ලක්ෂණයි, ධෘතශ්‍රීවෘත්තය සිද සමහරු කියත්, නභජපුරස්කෘතා ජජජරා රචිතා භුවි රුද්‍රදික් පතිඃ, යනු තල්ලක්ෂණයි.

## ශිශුපාලවධ නම් මහාකාව්‍යය

පිළිබඳව ලියනලද

**පඤ්චහාසිනී ව්‍යාඛ්‍යායෙහි**

**තෘතීයසර්ගය සමාප්තයි.**

# අථ චතුර්ථඃ සර්ගඃ.

1. නිඃශ්වාසධූමං සහරත්නභාභි
භිත්වොත්ථිතං භූමිමිවොරගාණාම්
නීලොපලස්‍යූතවිචිත්‍රධාතු
මසෞගිරිං රෛවතකං දදර්ශ.

2. ගුර්වීං රජස්‍රං දෘෂදඃ සමන්තා
දුපර්‍ය්‍යුපර්‍ය්‍යම්බුමුචාං විතානෛඃ
වින්ධ්‍යායමානං දිවසස්‍ය භර්තු
ර්මාර්ගං පුනාරොද්ධුමිවොන්නමද්භිඃ.

---

(තෘතීය සර්ගයට අනතුරුව) චතුර්ථ සර්ගය කියනු ලැබේ.

1. නීලොපල, ඉඳුනිල් මැණික්වලින්; ස්‍යූත, බැඳුනාවූ හෙවත් මෙහෙයන ලද්දාවූ; විචිත්‍රධාතුං, විසිතුරුවූ හෙවත් නානා වර්ණ ගෛරිකාදි ධාතූන්ඇති; රත්නභාභිඃ, එහෙයින්ම මැණික් කාන්තීන් සමඟ; භූමිං, බිම; භිත්වා, පලාගෙණ; උත්ථිතං, නැංගාවූ හෙවත් නික්මආවාවූ; උරගාණාම්, නාගයන්ගේ; නිඃශ්වාසධූමංඉව, නිඃශ්වාස ධූමයමෙන් සිටියාවූ; රෛවතකං, එනම් පර්වතය; අසෞ, ඒ ශ්‍රී හරිතෙම; දදර්ශ, දුටුවේය.

**අසෞ (හරිඃ) රෛවතකං දදර්ශ,** යනු මෙහි, ක්‍රි-සි. දදර්ශ යනු පරොක්ෂලිට්සි, දෘශිර්; ප්‍රෙක්ෂණෙ ධාතුවෙන්, ණප්, ප්‍රත්‍යයයි, නිඃශ්වා ශශ්වාසෞධූමශ්චෙති – (තම්) නීලාශ්චතෙඋපලාශ්චෙති = නීලො පලෛඃ ස්‍යූතා (ප්‍රොතා) නීලොපලස්‍යූතා විචිත්‍රා ධාතවොයස්‍යස = (තම්) යනු සමාසයි, **ගුණනිමිත්තජාතිස්වරූප) උත්ප්‍රෙක්ෂාලංකා රයි.** මේ සර්ගයෙහි නොයෙක් වෘත්තයෝවෙති, එහි මූලඅෂ්ටාදශ ශ්ලෝකයෝ උපජාතිවෘත්තයෙහි වෙති.

(නැවතත් කෙබඳුවූ රෛවතක පර්වතයෙක් ද යත්? )

2. ගුර්වීං, මහත්වූ; දෘෂදඃ, දෘෂද්හුගෙ; උපරිඋපරි, මතුමත්තෙහි හෙවත් ගල්තලයන්ගෙ උපරිප්‍රදෙශයන්හි; සමන්තාත්, හාත්පසින්; අජස්‍රං, නිතර; උන්නමද්භිඃ, උද්ගතවනම්‍රවූ හෙවත් උත්පතිත වන්නාවූ; අම්බුමුචාංවිතානෛඃ, මේඝමාලාවන් කරණකොටගෙණ; දිවසස්‍යභර්තුඃ, දිනපතිහුගෙ හෙවත් සූර්‍ය්‍යයාගෙ; මාර්ගං, ගමනමාර්ගය; පුනාරොද්ධුං, පුනර්නිරුද්ධනයකරන්ට හෙවත් නැවත වලකාලන්ට; වින්ධ්‍යායමානං, වින්ධ්‍යපර්වතයමෙන් හැසිරෙමින් සිටියාවූ හෙවත් වින්ධ්‍යාපර්වතය වැනි වෙමින් සිටියාවූ; (ඒ රෛවතක පර්වතය දුටුවේ යයි සේයි)

3. ක්‍රාන්තං රුචා කාඤ්චනවප්‍රභාජා
නවප්‍රභාජාලභෘතාං මණීනාම්
ශ්‍රිතං ශිලාශ්‍යාමලතාභිරාමං
ලතාභිරාමන්ත්‍රිතෂට්පදාභිඃ.

4. සහස්‍රසංඛ්‍යෛර්ගගනං ශිරොභිඃ
පාදෛර්භුවං ව්‍යාප්‍ය විතිෂ්ඨමානං
විලොචනස්ථානගතොෂ්ණරශ්මි
නිශාකරං සාධු හිරණ්‍යගර්භම්.

---

(මෙහි ක්‍රියාකාරක සම්බන්ධය මුලින් දක්වූ විධියමැයි)

මෙහි, උපරිඋපරි යනු, උපර්‍ය්‍යධ්‍යධසඃ සාමීප්‍යෙ, යනු කිහෙයින් ද්විරුක්තයි, එහෙයින් වාමන මෙසේකියයි, උපර්‍ය්‍යාදිෂු සාමීප්‍යෙද්විරුක්තෙෂු ද්විතීයා යනුයි, වින්ධ්‍යාචලවර්තීති, විත්ධ්‍යායමානඃ, නම්. (නවත්වඞ්මානමිව සවිහමිත්‍යර්ථඃ) **ක්‍රියානිමිත්ත ක්‍රියාස්වරූපොත් ප්‍රෙක්ෂායි**

3 නව, අභිනවවූ; ප්‍රභාජාලභෘතාං, කාන්තිසමූහයන් දරන්නාවූ; මණීනාම්, මාණික්‍යයන්ගෙ; කාඤ්චනවප්‍රභාජා, සවර්ණශානු භජනය කරන්නාවූ; රුචා, දීප්තියෙන්; ක්‍රාන්තං, ආක්‍රාන්තවූ හෙවත් පැතිරගන්නාලද්දාවූ; ශිලාශ්‍යාමලතාභිරාමං, ඉන්ද්‍රනීල මාණික්‍ය සම්බන්ධිවූ ශ්‍යාමලතායෙන් මනරම්වූ; ආමන්ත්‍රිතෂට්පදාභිඃ, කැඳවන ලද භෘඞ්ගයන් ඇති; ලතාභිඃ, වැල්වලින්; ශ්‍රිතං, ඇසුරුකරණ ලද්දාවූ (රෛවතක පර්වතය දුටුවේයයි සේයි) මෙහිද ක්‍රියාකාරක සම්බන්ධය මුලින් දක්වූ විධියමැයි.

කාඤ්චනවප්‍රං,භජතීති= (තයා) (පුනඃ) නවානි ප්‍රභාජාලානි බිභ්‍රතීති, නවප්‍රභාජාලභෘතඃ (තාසාම්) ශිලානාම් (මෙචකොපලානාං ඉන්ද්‍රනීලානාම්වා) ශ්‍යාමලතා= තයාභිරාමඃ= (තම්) ෂට්පාදඃ යෙෂාම් තෙ= ආමන්ත්‍රිතා' ආහූතාඃ ෂට්පදඃ යාභිස්තාඃ= (තාභිඃ,) යනු සමාස වාක්‍යයි.

ඉතඃපරං ව්‍යන්තරමෙකාං යමකාංවක්ෂ්‍යති තත්‍ර තදෙවාලඞ්කාරඃ, අර්ථාලඞ්කාරස්ත්වභ්‍යූහ්‍යඑව ය ඉති, යථාසම්භවමූහ්‍යම් යනාදිය විකාගතයි– එහි භාවය සුබොධයි, **ස්වභාවොක්තියි.**

4. සහස්‍රසංඛ්‍යෛඃ, දහස්ගණන් ඇති; ශිරොභිඃ, ශිඛරවලින් නොහොත් ශීර්ෂවලින්; ගගනං, අහසද; පාදෛඃ, දහස්ගණන් පාදවලින් නොහොත් ප්‍රත්‍යන්තපර්වතවලින්; භුවං, පොළොවද; ව්‍යාප්‍ය, පැතිරගෙණ; විතිෂ්ඨමානං, සිටිනාවූ; විලොචනස්ථාන, දෑස

5. ක්වචිජ්ජලාපායවිපාණ්ඩුරාණි
ධෞතොත්තරීයප්‍රතිමච්ඡවීනි
අභ්‍රාණි බිභ්‍රාණමුමාඞ්ගසඞ්ග
විභක්තභස්මාන'මිව ස්මරාරිම්.

6. ඡායාං නිජස්ත්‍රීචටුලාලසානාං
මදෙන කිඤ්චිච්චටුලාලසානාම්
කුර්වාණමුත්පිඤ්ජලජාතපත්‍රෝ'
විහඞ්ගමානාං ජලජාතපත්‍රෛඃ.

---

සම්බාධ සුදුසු තැනට; ගත, පැමිණියාවූ; උෂ්ණරශ්මිනිශාකරං, හිරු සඳු දෙදෙන ඇති; සාධුහිරණ්‍යගර්භම්, සැබවින් බ්‍රහ්මයාමෙන් සිටියාවූ නොහොත් නිධිගර්භයක් මෙන් සිටියාවූ; (රෛවතක පර්වතය දුටුවේයයි සේසි) මෙහිදු කිරියකරු පදසබඳ මූලකි නයමැයි.

(සහස්‍රමිති සඞ්ඛ්‍යා යෙෂාම් තෙ (තෛඃ) නිශාංකරෛරිතීති නිශාකරඃ උෂ්ණරශ්මිශ්ච නිශාකරශ්ච උෂ්ණරශ්මිනිශාකරෞ විලොචනයොඃ ස්ථානං (යොග්‍යස්ථානං) (යොග්‍යදෙශඃ) = විලොචනස්ථානං ගතෞ උෂ්ණරශ්මිනිශාකරෞ, යස්‍යසඃ= (තම්) හිරණ්‍යං (සුවර්ණම යාණ්ඩං) ගර්භ (උත්පත්තිස්ථානමස්‍යෙති හිරණ්‍යගර්භඃ) (තම්) යනු නිර්වචනයි, **සමාසොක්ති අලංකාරයි**

5. ක්වචිත්, කිසියම් තැනෙක්හි; ජලාපාය, දිය පහවීමෙන්; විපාණ්ඩුරාණි, වෙසෙසින්පාණ්ඩුරවර්ණවූ හෙවත් ශ්වෙතවර්ණවූ; ධෞතොත්තරීය, ධෝවනය කළාවූඋතුරුසළුවකට; ප්‍රතිම, සමානවූ; ඡවීනි, කාන්තිඇති; අභ්‍රාණි, මෙඝයන්; බිභ්‍රාණං, ධරන්නාවූ; උමාඞ්ගසඞ්ග, පාර්වතියගෙඅර්ධභාගයෙන්; විභක්ත, බෙදනලද හෙවත් එක්කොටසක තබනලද; භස්මානං, අළුඇති; ස්මරාරිම්ඉව, මහෙශ්වරයා මෙන් සිටියාවූ (රෛවතක පර්වතය දුටුවේයයි සේසි) මෙහිදු කිරියකරු පදසබඳ මූලකීනයින් දතයුතුයි.)

(ජලානාමපායඃ) (අපගමනං) ජලාපායඃ, තෙන විපාණ්ඩුරාණි= ධෞතඤ්චතත් උත්තරීයඤ්චෙති ධෞතොත්තරීයං, තත්ප්‍රතිමා නත් සමාඡවිශේෂාමිතානි= උමායා'අඞ්ගම්= උමාඞ්ගස්‍යසඞ්ගඃ (අර්ධභාගඃ)= තෙනවිභක්තං (එකභාගස්ථාපිතං) භස්ම යස්‍යසඃ = (තම්) ස්මරස්‍යා(නඞ්ගස්‍ය) අරිඃ ස්මරාරිඃ, යනු සමාස වාක්‍යයි, **උපමාලංකාරයි.**

6. නිජස්ත්‍රී, සිය බිරිඳගෙ; චටුලාලසානාං, චාටුබස්හි ලොල්වූද; මදෙන, මදය (මත්වීම) කාරණකොටගෙණ; කිඤ්චිත්, ස්වල්පයක්; චටුලාලසානං, චපලවූද අලසවූද; විහඞ්ගමානාං, හංසාදි

7. සකන්ධාධිරූඪෝජ්වලනීලකණ්ඨා
නුර්වීරුහඃ ශ්ලිෂ්ටතනූනහීන්ද්‍රෛඃ
ප්‍රනර්තිතානෙකලතාභුජාග්‍රාන්
රුද්‍රානනෙකානිව ධාරයන්තම්.

---

පක්ෂීන්ගේ; උත්පිඤ්ජලජාතපත්‍රෛඃ, හටගත් පිඤ්ජලතාඇති හෙවත් උත්පිඤ්ජරීභූත පියාපත් ඇති; ජලජාතපත්‍රෛඃ, පියුම් කුඩ වලින්; ඡායාංකුර්වාණං, සෙවනකරන්නාවූ; (සඃ, හරිඃ,රෛවතකං දදර්ශ, යනු හා සම්බන්ධ කටයුතුයි. මෙහිදු කිරියකරු පදසබඳ මූලකිනයමැයි.

නිජස්‍ය, (ආත්මනඃ) සත්‍රියඃ නිජසත්‍රියඃ නිජසත්‍රීණාම් වටවඃ= නිජසත්‍රීවටූෂු,(ප්‍රියවචනෙෂු) ලාලසා (ලොලුපාඃ=)(තෙෂාම්) කිඤ්චිදී සත්, වටූලා (ශබ්දලාසෙන'ලශාශව) කිඤ්චිත්වටූලාලසාඃ, (තෙෂාම්) උත්පිඤ්ජලානි ජාතානි, උත්පිඤ්ජලජාතානි, තානිපත්‍රාණියෙෂාම් තෙ= (තෛඃ) විහායසා ගච්ඡන්තීති විහඞ්ගමාඃ (පක්ෂිණඃ)(තෙෂාම්) ජලෙෂු, ජාතානි ජලජානි (පද්මානි) ජලජානාං'වා පත්‍රාණි ජලජාත පත්‍රාණි (තෛඃ) යනු නිර්වචනයි, **සමස්තරූපකාලංකාරයි.**

7. සකන්ධාධිරූඪ, සකන්ධයට හෙවත් ප්‍රකාණ්ඩයට නැගුනාවූ; උජ්වලනීලකණ්ඨාන්, උසස්වබබලනමයූරයන් ඇති නොහොත් සකන්ධාධිරූඪ; අංශසම්පිතවූ, උජ්වල, උසස්වදිලිසෙන්නාවූ; නීල, නිල්වන්වූ; කණ්ඨ, ග්‍රීවයන් ඇති; අහීන්ද්‍රෛඃ, සර්පරාජයන් විසින්; ශ්ලිෂ්ටතනූන්, පැතිරගත්තාලදදෙහයන් ඇති; ප්‍රනර්තිත, ප්‍රකම්පයෙන් නටවනලද; අනෙකලතාභුජාග්‍රාන්, නොයෙක් වැල්නමැති බාහුන්ගෙ අගවැනි අගඇති; අනෙකානිරුද්‍රානිඉව, නොයෙක් රුද්‍රයන් මෙන් සිටියාවූ; උර්වීරුහඃ, වෘක්ෂයන්; ධාරයන්තම්, ධරන්නාවූ (රෛවතක පර්වතය දුටුවේයයි සේයි,) (මෙහිදු කිරියකරු පදසබඳ මූලකී නයමැයි.)

සකන්ධංඅධිරූඪා = සකන්ධාධිරූඪා උජ්වලා නීලකණ්ඨා (මයූරා) යෙෂාම් තෙ = (තාන්) (අන්‍යත්‍ර) සකන්ධාධිරූඪා, (අංශසම්පිතා) (උජ්වලා) නීලාඃකණ්ඨාඃයෙෂාම් තෙ= (තාන්) උර්ව්‍යාම්රොහන්තීති= (තාන්) ශ්ලිෂ්ටාඃ තනවඃ යෛසෙන,= (තාන්) අහීනාම්න්ද්‍රාඃ= (තෛඃ) අනෙකාශ්වතාඃලතාශෙචති= ප්‍රනර්තිතාශ්ච තාඃ අනෙකලතාශෙචති= ප්‍රනර්තිතානෙකලතානාමෙව භුජානාං ලතානාම්වච භුජානාමග්‍රාණි, යෙෂාම්තෙ= (තාන්) තළුකානි, අනෙකානි, (යනු විකාගත) විග්‍රහ වාක්‍යයි, **උත්ප්‍රේක්ෂා ලංකාරයි.**

8 විලම්බිනීලොත්පලකර්ණපූරා
කපොලභිත්තීරිව ලොධ්‍රගෞරීඃ
නවොලපාලංකෘතසෛකතාභාඃ
ශුචිරපඃ ශෛවලිනීර්දධානම්.

9. රජීවරජීවශලොලභෘඞ්ගං
මුෂ්ණන්තමුෂ්ණං තතිභිස්තරූණාම්
කාන්තාලකාන්තා ලලනාඃ සුරාණාං
රක්ෂොභිරක්ෂොභිතමුද්වහන්තම්.

---

8. විලම්බි, වෙසෙසින් එල්බෙන්නාවූ; නීලොත්පලකර්ණපූරා, නිලුපුල්නමැති කර්ණාවතංස ඇති; ලොධ්‍රගෞරීඃ, ලොත්සුන්තෙන් ශ්වෙතවර්ණවූ; කපොලභිත්තීඃඉව, ස්ත්‍රීන්ගෙකොපුල්බිතුමෙන් සිටියාවූ; නවොලප, අලුත්වූ බබුස්තණින්; අලංකෘත, හෙබියාවූ; සෛකතාභාඃ, වැලිතලාසම්බන්ධකාන්ති ඇත්තාවූ; ශුචීඃ, පවිත්‍රවූ; ශෛවලිනීඃ, සෙවෙල් ඇත්තාවූ; අපඃදධානම්, ජලය ධරන්නාවූ (රෛවතකනම් පර්වතය දුටුවේයයි සේසි,) මෙහිද කිරියකරු පද සබඳ මූලකි නයමැයි.

විලම්බිතො නීලොත්පලාතෙ‍්‍යව කර්ණපූරාඃ (කර්ණවතංසා යාසාං) (තාඃ) කපොලා එව භිත්තයඃ, (තාඃ) ලොධ්‍රෙණගෞර්‍ය්‍යඃ= (තාඃ) නවාශ්වෙත උලපාශ්වෙති=(බලවජතෘණානි) තෛරලංකෘතානාම්සෛකතානාමාභා=නවොලපාලංකෘතා සෛකතාභා යාසාම්(තාම්)=ශෛවලමස්‍යාඃඅ'ස්තීති ශෛවලිනී (තාඃ)යත්‍ර තිර්වචනයි, **උපමාලඞ්කාරයි.**

9. රජීවරජීවශ, පද්මපඞ්ක්තීන්ට වසහවූ හෙවත් යටත්වූ හෝ ආයත්තවූ; ලොලභෘඞ්ගං, සැලෙන්නාවූ බඹරුන්ඇති; තරූණාම්, වෘක්ෂයන්ගෙ; තතිභිඃ, සන්තතීන් හෙවත් පඞ්ක්තීන් කරණකොට හෙණ; උෂ්ණංමුෂ්ණන්තං, උෂ්ණය හෙවත් අව්වදුරුකරන්නාවූ (උෂ්ණය නැතිකරන්නාවූයි සේසි;) කාන්තා, මනොරම්‍යවූ; අලකාන්තා, චූර්ණකුන්තලාග්‍රඇති; සුරාණාම්, දෙවියන් සම්බන්ධීවූ; ලලනාඃ, ස්ත්‍රීන්; රක්ෂොභිඃ රාක්ෂසයන් විසින්; අක්ෂොභිතං, අනභිභූත සේ; උද්වහන්තං, ධරන්නාවූ; (රෛවතක පර්වතය දුටුවේයයි සේසි) මෙහිද කිරියකරු පදසබඳ මූලකි නයමැයි.

රජීවානාංරජී= රජීවරජීනාම්වශා (අධිනා) ලොලා (ශවලා) භෘඞ්ගා යස්මිං තත්, = කාන්තා රම්‍යා අලකාන්තාශ්චූර්ණකුන්තලාග්‍රාණි'යාසාං තාඃ කාන්තාලකාන්තාඃ, යත්‍ර සමාස වාක්‍යයි, **ශබ්දාලොක්ති** නොහොත් **උපමාරූපකයි.**

10. මුදෙ මුරා‘රෙ’රමරෛඃ සුමෙරො
රානීය යස්‍යොපචිතස්‍ය ශෘඞ්ගෛඃ
භවන්ති නොද්දාමගිරාං කවීනා
මුච්ඡ්‍රායසෞන්දර්‍ය්‍යගුණා මෘෂොද්‍යාඃ.

11. යතඃ පරාර්ධ්‍යානි භෘතාන්‍යනූනෛඃ
ප්‍රස්ථෛ‘ර්මුහුර්භූරිභි’රුච්ඡිඛානි
ආඪ්‍යාදිවප්‍රාපණිකාදජස්‍රං
ජග්‍රාහ රත්නාන්‍ය‘මිතානි ලොකඃ.

---

10. මුරාරෙඃ, මුරාරිහුගෙ හෙවත් ශ්‍රීවිෂ්ණුහුගෙ; මුදෙ, සන්තොෂය පිණිස; අමරෛඃ, දෙවියන් විසින්; සුමෙරොඃ, මෙරු පර්වතයාගෙ; ශෘඞ්ගෛඃ, ශිඛරවලින්; ආනීය, ආනයනයකොට හෙවත් පමුණුවා; උපචිතස්‍ය, වඩනාලද හෙවත් ගෙණෙලද; යස්‍ය, යම් පර්වතයක්හුගෙ; උච්ඡ්‍රායසෞන්දර්‍ය්‍යගුණාඃ, උන්නතභාවය හා සෞන්දර්‍ය්‍යභාවය යන මේ සම්බන්ධ ගුණයෝ හෙවත් උත්කෘෂ්ටයෝතුමූ; උද්දාමගිරාං, බුහුවිබස් ඇති; කවීනාං, පඬුවන්ට; මෘෂොද්‍යාඃ, මිථ්‍යාවාක්‍යයෝ හෙවත් කිවීන් විසින් බොරුවෙන් කියනුලබන්නෝ; නභවන්ති, නොවෙත්ද; (ඒ රෛවතක පර්වතයයි සේයි)

කවීනාංමෘෂොද්‍යාඃ න භවන්ති යනු, මෙහි ක්‍රි- යි. න භවන්ති, යනු, වර්තමානලට්යි, භූ,සත්තායාම් ධාතුවෙන් අන්ති ප්‍රත්‍යයයි, මෘෂා උද්‍යන්තා ඉති,මෘෂොද්‍යාඃ (මිථ්‍යාවාච්‍යාඃ) මෙහි සෙසු විග්‍රහවාක්‍ය සුබොධයි, **අතිශයොක්ති අලංකාරයි.**

11. ලොකඃ, ලෝවැසිතෙම; පරාර්ධ්‍යානි, ශ්‍රෙෂ්ඨවූ; අනූනෛඃ, ඌනනොවූ; භූරිභිඃ, බොහෝවූ; ප්‍රස්ථෛඃ, නැලිවලින්; භෘතානි, සම්භෘතවූ නොහොත් පමණ කරණලද්දවූද; උච්ඡිඛානි, උද්ගතවූ ශිඛාවන් ඇති හෙවත් නැඟුනුරශ්මින් ඇති; අමිතානි රත්නානි, අපරිමිතවූ රුවන්; යතඃ, යම් රෛවතකනම්පර්වතයෙකින්; ආඪ්‍යාත්, වස්තුවෙන්; අජස්‍රං, නිතර; මුහුඃ, ක්ෂණක්ෂණයෙහි; ජග්‍රාහ, ගත්තේද; (ඒ රෛවතක පර්වතයයි)

**ලොකඃ යතඃ රත්නානි අජස්‍රං ජග්‍රාහ,** යනු මෙහි, ක්‍රි- යි ජග්‍රාහ, යනු, පරොක්ෂලිට්යි, ග්‍රහ, උපාදානෙ, ධාතුවෙන්, ණප්, ප්‍රත්‍යයයි, උද්ගතාඃ ශිඛාඃ යෙෂාම් තානි උච්ඡිඛානි, ප්‍රපණඃ (ව්‍යවහාරඃ ප්‍රයොජනමස්‍යෙති, ප්‍රාපණිකඃ (තස්මාත්) න මිතානි අමිතානි, යනු නිර්වචනයි, **උපමාලංකාරයි.**

12. අවිච්ඡින්නාසන්නාමුදග්‍රාතපං
රවිං දධානෝ'ප්‍යරවින්දධානෙ
භෘඞ්ගාවලීර්යස්‍ය තටෙ නිපීත
රසා නාතිතාමරසා න මත්තා.

13. යත්‍රාධිරූඪේන මහීරුහොච්චෛ
රුන්නිද්‍රපුෂ්පාක්ෂිසහස්‍රභාජා
සුරාධිපාධිෂ්ඨිතහස්තිමල්ල
ලීලාං දධෞ රජතගණ්ඩශෛලඃ.

---

12. ආසන්නං, උන්නතභාවය හෙතුකොටගෙණ ආසන්නවූ හෙවත් ලංවූ; උදග්‍රාතපං, එහෙයින්ම උග්‍රවූ සන්තාපඇති; රවිංදධානෙඅපි, සූර්‍ය්‍යයා ධරන්නාවූද; අරවිංදධානෙ, අරවිංදධානයෙ ාවූ (හෙවත් විරොධ පරිහාර වශයෙන්) පද්මයන්ට නිධානවූ හෝ පද්ම සන්නිහිත ස්ථානවූ; යස්‍ය, යම් පර්‍වතයක්හුගෙ; තටෙ, තටයෙහි; (ප්‍රාන්තයෙහි නොහොත් මස්තකයෙහි යයි සේයි) නිපීතරසා, අතිශයින්බොනලදමකරන්දරසඇති; නමත්තාමරසාඃ, බරබැවින් නැමෙනතඹුරුඇති; මත්තාඃ, එහෙයින්ම මත්වූ; භෘඞ්ගාවලීඃ, භෘඞ්ග පඞ්ක්තීතොම; නඅවිච්ඡින්න, ඡෙදප්‍රාප්ත නොවීද; (ඒ රෛවතක පර්‍වත යයි)

**භෘඞ්ගාවලීර්යස්‍ය තටෙ න අවිච්ඡින්නා.** යත්‍ර, මෙහි, ක්‍රි යි. න අවිච්ඡින්න, යනු, අභාව-ලඞ්යී, ඡිද, ද්වෛධ්‍ය ධාතුවෙන්, තන් ප්‍රත්‍යයා නඤ් පූර්‍වයි, ආසන්නාඃ, උදග්‍රාතපඃ යස්‍යා'සාවුදග්‍රාතපඃ, (තම්) අරවින්දනාම් ධානං (නිධානං) අරවින්දධානම් (නයමින්,) භෘඞ්ගාණාම් ආවලිඃ,= නිතරාං පීතඃ රසඃ (මකරන්දඃ) යෛස්තෙ, නිපීතරසා, නමන්ති තාම්‍රසානි (පත්‍රෙකරුහාණි, භාරභූතයා) යයා, සා, නාතිතාමරසා, යනු විග්‍රහවාක්‍යයි, **විරොධාලඞ්කාරයි**.

13. යත්‍ර, යම් පර්‍වතයෙක්හි; රජතගණ්ඩශෛලඃ, රජත විකාරවූ; ගණ්ඩපොල, ශෛලයතෙම; උන්නිද්‍ර, විකශිතවූ; පුෂ්පාක්ෂිසහස්‍ර, මල්නමැති ඇස්දහස; භාජා, භජනයකරන්නාවූ; අධිරූඪේන, ආරූඪවූ හෙවත් නැගුනාවූ; උච්චෛඃ, උස්වූ; මහිරුහා, වෘක්ෂය කාරණකොටගෙණ; සුරාධිප, දෙවෙන්ද්‍රයා විසින්; අධිෂ්ඨිත, අධිෂ්ඨිතකරණ ලද්දාවූ; හස්තිමල්ල, හස්තිමල්ලයාගෙ හෙවත් අභ්‍රමාතඞ්ගයාගෙ; (වලාහක නමැති හස්තිහුගෙ යයි සේයි) ලීලාං, ශෝභාව; දධෞ, දැරුවේද; (ඒ රෛවතක පර්‍වතය යයි සේයි)

14. විභින්නවර්ණා ගරුඩාග්‍රජේන
සූර්‍ය්‍යස්‍ය රථ්‍යාඃ පරිතඃ ස්ඵුරන්ත්‍යා
රත්නෛඃ පුනර්‍යත්‍ර රුචාරුචං ස්වා
මානින්‍යිරෙ වංශකරීරනීලෛඃ.

15. යත්‍රොජ්ඣිතාභිර්මුහුරම්බුවාහෛඃ
සමුන්නමද්භිර්න සමුන්නමද්භිඃ
වනං බබාධෙ විෂපාවකොත්ථා
විපන්නගානා'මවිපන්නගානාම්.

---

**රජතගණ්ඩශෛලඃ, යත්‍ර, සුරාධිපාධිෂ්ඨිතහස්තිමල්ලලීලාං දධෞ,** යනු මෙහි ක්‍රි-සි. මහ්‍යාම්,රොහන්තීති, මහීරුහඃ (තෙන)උන්නිද්‍රානි (විකාශිතානි) ච,තානි පුෂ්පානි චෙති= උන්නිද්‍රපුෂ්පානි අක්ෂීණි චෙති= තෙෂාම් සහස්‍රං= භජතීති=(තෙන) සුරාණාමධිපඃ= සුරාධිපෙනාධිෂ්ඨිතඃ යෙ, හස්තී,මල්ල ඉචෙති= (තස්‍ය) ලීලා (තාං) රජතස්‍ය විකාරො රාජතඃ, රාජතශ්චාසෞ ගණ්ඩශෛලශ්චෙති = යනු මෙහි සමාස වාක්‍යයි, **නිදර්ශනාලංකාරයි.**

14. ගරුඩාග්‍රජේන, අරුණයාවිසින්; විභින්නවර්ණ, වෙනස් කරණලද වර්ණඇති හෙවත් අරුණ වර්ණභාවයට පමුණුවනලද්දාවූ; සූර්‍ය්‍යස්‍ය රථ්‍යාඃ, හිරුගෙ රථාශ්වයෝතුමූ; යත්‍ර, යම් පර්වතයෙක්හි; වංශකරීරනීලෛඃ, වංශාඞ්කුර සමාන නිල්වන්වූ හෙවත් නොමැලවීම් හෙතුවෙන් අඞ්කුරයක්සේ නිල්වන්වූ; රත්නෛඃ, රුවන්වලින් හෙවත් මරාමිණී විසින්; පරිතඃ, හාත්පස; ස්ඵුරන්ත්‍යා, පැතිරෙන්නාවූ; රුචා, සවකීය කාන්තිය කරණකොටගෙණ; පුනඃ, නැවතත්; ස්වාංරුචං, සවකීය දීප්තියට හෙවත් සවකීයහරිතවර්ණයට; ආනින්‍යිරෙ, පමුණුවන ලද්දාහුද; (එබඳුවූ රෛවතකනම් පර්වතය දුටුවේයයි සේයි)

යත්‍රරථ්‍යාඃ වංශකරීරනීලෛඃ, ස්වාං රුචං ආනින්‍යිරෙ, යනු මෙහි ක්‍රි-සි. ආනින්‍යිරෙ, යනු, පරොක්ෂලිට්යි, ආඞ්පූර්ව,නී, ප්‍රාපණෙ ධාතුවෙන් කර්මයෙහි, ඉරෙ, ප්‍රත්‍යයි න්‍යාදින් විකර්මක හෙයින් තද්යොගයෙහි, ප්‍රධාන කර්මය උක්තයයි කිහෙයින්, රථ්‍යාඃ යන තන්හි ප්‍රථමායි, ස්වාංරුචං, යනු අප්‍රධාන හෙයින්, කර්මයෙහි විතීයායි, **තද්ගුණ සජාතීය සංකරයි.** මෙහි විග්‍රහ වාක්‍යාදිය ටීකා නයින් සුබොධයි.

15. යත්‍ර, යම් පර්වතයෙක්හි; සමුන්නමද්භිඃ, අතිශයින් උත්පතිතවන්නාවූ; අම්බුවාහෛඃ, මේඝවලින්; උජ්ඣිතාභිඃ, වර්ජිතවූ හෙවත් අත්හරිනලද්දාවූ; අද්භිඃ, ජලයෙන්; මුහුඃ, වරක්; සමුන්නං,

16. ඵලද්භිරුෂ්ණාංශුකරාභිමර්ශාත්
කාර්ශානවං ධාම පතඞ්ගකාන්තෛඃ
ශශංස යඃ පාත්‍රගුණාද් ගුණානාං
සංක්‍රාන්තිමාක්‍රාන්තගුණාතිරේකාම්.

---

අතිශයින් ක්ලිෂ්ටවූ හෙවත් ඉසිනලද්දවූ; අවිපන්නාගානාම්, පහවූ සර්පයන් ඇති නොවන්නාවූ හෙවත් පන්නග සහිතවූ; නගානාම්, වෘක්ෂයන් සම්බන්ධිවූ; වනං, අරණ්‍යය; විෂපාවකෝත්ථා, විෂාග්නි යෙන් නැංගාවූ; විපත්, විපත්තොම; නබබාධෙ, නොපෙළුවේද; (ඒ පර්වත යයි)

**යත්‍ර විපත් වනං නබබාධෙ,** යනු මෙහි, ක්‍රි- යි. නබබාධෙ, යනු, පරෝක්ෂලිට්යි, නඤ්පූර්ව, බාධ, විහතෞ ධාතුවෙන්, එ, ප්‍රත්‍යයි, අම්බූනි, වහන්තීති, අම්බුවාහාඃ (තෛඃ) විපන්නාගා (විගතසර්පා) න, භවන්තීත්‍යවිපන්නාගාඃ, සපන්නගා ඉත්‍යර්ථඃ, මෙහි, වනං, නබබාධෙ, යන්න සම්බන්ධව, නිත්‍යං වර්ෂානුසඞ්ගා'විෂාග්නිකෝපාතො වෘක්ෂාණා මකිඤ්චිත්කරඃ ඉතිභාවඃ, යනු ටිකාහෙයින් නිතර වර්ෂානුසඞ්ගයෙන් විෂාග්නිකෝපයතෙම වනවෘක්ෂයන්ට කිසිත් පීඩාවක් නොකරන් නේයයි සේයි, **ස්වභාවොක්තියි.**

16. යඃ, යම් පර්වතයෙක් තෙම; උෂ්ණාංශුකරාභිමර්ශාත්, සූර්‍ය රශ්මිසම්පර්කය හේතුකොටගෙණ; කාර්ශානවං, කෘශානු සම්බන්ධිවූ හෙවත් වහ්නි සම්බන්ධිවූ; ධාම, තේජස; ඵලද්භිඃ, උද්ගිරණය කරන්නාවූ; පතඞ්ගකාන්තෛඃ, දෘෂ්ටාන්තවූ සූර්‍යකාන්තයන් හෙවත් හිරුකාන්තමිණිකරණ කොටගෙණ; ගුණානාම්, (දයාදාක්ෂිණ්‍යාදි) ගුණයන්ගෙ; සංක්‍රාන්තිං, අන්තන්හි සංක්‍රමනය; පාත්‍රගුණාත්, ගුණබද්ධන හේතුකොටගෙණ හෙවත් ආධාරගුණ සහකාරයා කොරෙන්; ආක්‍රාන්ත, පැමිණෙනලද්දවූ; ගුණාතිරේකාම්, කාර්‍ය විශෙෂාධාන රූපවූ ගුණොත් කර්ෂය ඇත්තක්කොට; ශශංස, ප්‍රති පාදනය කෙළේද; (ඒ පර්වතයයි)

**යඃ පතඞ්ගකාන්තෛඃ, ගුණානාම් සංක්‍රාන්තිං, ආක්‍රාන්ත ගුණාතිරේකාම්, ශශංස,** යනු, මෙහි ක්‍රි- යි. ශශංස, යනු පරෝක්ෂ ලිට්යි, ශංස, ගතෞ ධාතුවෙන්, ණප්, ප්‍රත්‍යයි, **වෘත්‍යනුප්‍රාසාලංකාරයි.**

17. දෘෂ්ටෝ'පි ශෛලඃ ස මුහුර්මුරාරෙ
රපූර්වවිස්මය'මාතතාන
ක්ෂණෙ ක්ෂණෙ යන්නවතා'මුපෛති
තදේ'වරූපං රමණීයතායාඃ.

18. උච්චාරණඥේ'ථ ගිරාං දධාන
මුච්චාරණත්පක්ෂිගණාස්තටීස්තම්
උත්කං ධරං ද්‍රෂ්ටු'මවෙක්ෂ්‍ය ශෞරි
මුත්කංධරං දාරුක ඉත්‍යුවාච.

---

17. මුහුඃ, වරක්; දෘෂ්ටෝ'අපි, දක්නාලද්දවූද; සඃ'ශෛලඃ, ඒ (ශෛල) පර්වතය තෙම; මුරාරෙඃ, මුරාරිහට හෙවත් ශ්‍රීවිෂ්ණුහට; අපූර්වවත්, අපූර්වයක්මෙන් හෙවත් පෙර නොදක්නාලද්දක්මෙන්; විස්මයං'ආතතාන, විස්මය කොළේය; ක්ෂණෙක්ෂණෙ, ඇසිල්ලක්පාසා; නවතාම්, අලුත්බවට; උපෛති, පැමිණේය යන; යත්, යමක්වේද; තත්'එව, එයම හෙවත් ඒ අලුත්බවට පැමිණීමම; රමණීයතායාඃ, රමණීය ස්වභාවයාගෙ; රූපං ස්වරූපයයි.

**සඃ ශෛලඃ මුරාරෙඃ විස්මයං ආතතාන,** යනුද **යත්, නවතාම් උපෛති,** යනුද **තදේව රමණීයතායාඃ, රූපං, භවති** යනුද මෙහි ක්‍රි- යි. ආතතාන, යනු පරොක්ෂලිට්යි, ආඞ්, පූර්ව, තනු, විස්තාරෙ, ධාතුවෙන්, ණප්, ප්‍රත්‍යයයි, උපෛති, යනු වර්තමානලට්යි, උපපූර්ව ඉණ්, ගතෞ, ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයයි, භවති, යනු අධ්‍යාහෘත වර්තමාන ලට්යි, භූ, සත්තායාම් ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයයි, මෙහි ක්ෂණෙක්ෂණෙ යනු වීප්සාවෙහි ද්විත්වයයි. **වාස්තවාර්ථහේතුක කාව්‍යලිඞ්ගාලඞ්කාරයි.**

18. අථ, ඉක්බිතිව හෙවත් හරිහුගේ විස්මයට අනතුරුව; ගිරාං උච්චාරණඥඃ, වාක්‍යොච්චාරණය දන්නාවූ; **දාරුකඃ,** දාරුකතෙම හෙවත් කෘෂ්ණසාරථිතෙම; උච්චා, උස්වූ; රණත්පක්ෂිගණාඃ, ශබ්ද පවත්වන පක්ෂිසමූහයා ඇත්තාවූ; තටීඃ'දධානාම්, තටප්‍රදෙශයන් දරන්නාවූ; තම්, ඒ පර්වතය; ද්‍රෂ්ටුං, දකින්ට; උත්කං, උත්සුකවූ හෙවත් උත්සාහවත්වූ; උත්කංධරං, උත්සුකත්වය හෙතුකොටගෙණ ඔසවනලද බෙල්ලඇති; ශෞරිං, ශෞරියා හෙවත් ශ්‍රීවිෂ්ණුහු; අවෙක්ෂ්‍ය, බලා; ඉති, වක්ෂ්‍යමානාකාරයෙන්; උවාච, කියේය.

**දාරුකඃ ශෞරිං අවෙක්ෂ්‍ය ඉත්‍යුවාච,** යනු මෙහි, ක්‍රි- යි. උවාච, යනු, පරොක්ෂලිට් යි. වච්, පරිභාෂණෙ, ධාතුවෙන්, **ණප්,** ප්‍රත්‍යයයි. **ස්වභාවොක්ති** නොහොත් **කාව්‍යලිඞ්ගාලංකාරයි.**

19. ආවර්ජිතායතදිගම්බරමුච්චකෛර්ගා
මාක්‍රම්‍ය සංස්ථිතමුදග්‍රවිශාලශෘඞ්ගම්
මූර්ධ්නි සඛලත්තුහිනදීධිතිකොටිමෙත
මුර්වීක්ෂ්‍ය කො භුවි න විස්මයතෙ නගෙශම්.

---

(මෙතැන් පටන් යමකානන්තර ශ්ලොකයන්හි, වසන්තතිලකා වෘත්තය නියමයෙන් කියයි. මේ සර්ගයෙහි මුලපටන්ම පද්‍යවයකට අතර පද්‍යයක්. යමකාබන්ධන නම් ශබ්දාලඞ්කාරයෙන් යුක්තබැව් වෙසෙසින් සැලකිය යුතුයි.)

19 **ආවර්ජිත**, ආවෘත්තවූ හෙවත් ආවර්ජනය කරණලද්දාවූ; **ආයත**, දික්වූ; **දිගම්බරං**, දිශාසම්බන්ධිවූ ආකාශය ඇති නොහොත් **ආවර්ජිතායතදිගම්බරං**, අඳනාලද දික්වූ දිශා නමැති වස්ත්‍ර ඇති; **උච්චකෛඃ**, උස්වූ; **ගාම්**, පොළොව; **ආක්‍රම්‍ය**, ආක්‍රමනය කොට හෙවත් පැතිරගෙණ; **සංස්ථිතම්**, සිටියාවූ; **උදග්‍රවිශාලශෘඞ්ගම්**, උස් මහත් ශිඛර ප්‍රදෙශ ඇත්තාවූ; නොහොත්, **උදග්‍ර**, උග්‍රවූ; **විශාල ශෘඞ්ගම්**, මහත්වූ ශෘඞ්ගවයක් ඇති; **උච්චකෛඃ**, උස්වූ; **ගාම්**, වෘෂභයා; **ආක්‍රම්‍ය**, නඟාගෙණ; **සංස්ථිතම්**, සිටියාවූ; **මූර්ධ්නි**, ශිඛර ප්‍රදෙශයෙහි නොහොත් මස්තකයෙහි; **සඛලත්**, ප්‍රසඛලනය වන්නාවූ හෙවත් පැතිරෙන්නාවූ; **තුහිනදීධිතිකොටිං**, චන්ද්‍ර රශ්මි ඇති නොහොත් චන්ද්‍රකලාවන් ඇති; **එනම් නගෙශම්**, ඒ මේ පර්වතරාජයා නොහොත් කෛලාශපර්වතයට නායකවූ මහෙශ්වරයා; **උර්වීක්ෂ්‍ය**, දැක; **භුවි**, පොළොවෙහි; **කඃ**, කවරෙක් තෙමේ; **නවිස්මයතෙ**, මවිත නොවේද (සියල්ල විස්මයටපත් වේමැයි සේයි.)

**කඃ භුවි එනම් නගෙශම් උර්වීක්ෂ්‍ය නවිස්මයතෙ,** යනු මෙහි ක්‍රි-යි. මෝ, තුල්‍යයොගිතාත් නොවෙයි සමාසොක්ති හෝ ශ්ලෙෂත් නොවේ. කාව්‍ය ප්‍රකාශයෙහි කියනලද

අනෙකාර්ථස්‍ය ශබ්දස්‍ය වාචකත්වෙ නියන්ත්‍රිතෙ
සංයොගාද්‍යෛරවාච්‍යාර්ථධීකෘද්ව්‍යාපෘතිරඤ්ජනම්, යන

මෙයින් දක්වනලද ලක්ෂණඇති **ව්‍යඞ්ජනාලඞ්කාරයෙකි.**

"උක්තා වසන්තතිලකා තභජා ජගෞ ගඃ" යන වෘත්තලක්ෂණ ඇති හෙයින් වසන්තතිලකායි, මෙහි න විස්මයතෙ, යනු නඤ් පූර්ව නාම ධාතු වර්තමානලට් කර්තෘකාරක ක්‍රියාපදයි.

20. උදයති විතතෝර්ධ්වරශ්මි-
රජ්ජාවමහිමරුචෞ හිමධාම්නි යාති චාස්තම්
වහති ගිරිරයං විලම්බි-
ඝණ්ටාද්වයපරිවාරිතවාරණේන්ද්‍රලීලාම්.

21. වහති යඃ පරිතඃ කනකස්ථලීඃ
සහරිතාලසමානනවාංශුකඃ
අචල එෂ භවාන්'ව රාජතෙ
ස හරිතාලසමානනවාංශුකඃ.

---

20. විතත, පතළාවූ; ඌර්ධ්වරශ්මිරජ්ජෞ, ඌර්ධ්වගතවූ රශ්මි රජ්ජුඇති හෙවත් උඩට නැගුණු රශ්මි නමැති රැහැන්ඇති; අහිම රුචෞ, සූර්ය්‍යයා; උදයති, උදාවනකල්හි; (විතත, පතළාවූ; ඌර්ධ්වරශ්මි රජ්ජෞ, ඌර්ධ්වගතරශ්මි රජ්ජුඇති;) හිමධාම්නිච, චන්ද්‍රයාත්; අස්තම් යාති, අස්ගිරටයනකල්හි; අයංගිරිඃ, මේපර්වතයතෙම; විලම්බි, වෙසෙසින් ලම්බමානවූ; ඝණ්ටාද්වය, ඝණ්ටා දෙකකින්; පරිවාරිත, පරිවෘතවූ හෙවත් වෙළනලද; වාරණේන්ද්‍රලීලාම්, හස්තිරාජයකුගෙ ශෝභාව; වහති, උම්හනයකොරෙයි (උසුලයි සේයි.)

**අයංගිරිඃවිලම්බි= වාරණේන්ද්‍රලීලාම්වහති,** යනු මෙහි ක්‍රි-යි. වහති, යනු, වර්තමානලට්යි, වහ්, ප්‍රාපණෙ, ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයයි, විතතා ඌර්ධ්වාශ්ච රශ්මිරජ්ජවො (රශ්මයො) රජ්ජවඉවයස්‍යසඃ= (තස්මින්) හිමාඃ රුචයඃ යස්‍යාසෞහිමරුචිඃ නහිමරුචිඃ අහිමරුචිඃ (තස්මින්) හිමං ධාම යස්‍යසඃ හිමධාමා (තස්මින්) ඝණ්ටයොර්ද්වයම් ඝණ්ටාද්වයම් විලම්බිචතත් ඝණ්ටාද්වයඤ්චෙති= විලම්බිඝණ්ටාද්වයෙන පරිවාරිතඃ= වාරණානාමින්ද්‍රඃ= විලම්බිඝණ්ටාද්වයපරිවාරිතශ්චාසෞ වාරණේන්ද්‍රශ්චෙති= තස්‍යලීලා=(තාම්) යනු සමාස වාක්‍යයි **නිදර්ශනා ලඞ්කාරයි,** ‘අයුජි නයුගරෙඵතො යකාරෙ යුජිච නජෞ ජරගාශ්ච පුෂ්පිතාග්‍රා’ යනු ලක්ෂණ හෙයින් **පුෂ්පිතාග්‍රා වෘත්තයි.**

21. ලසමාන, බබලන්නාවූ; නවාංශුකඃ, අභිනව රශ්මිඇති; යඃ, යම් පර්වතයෙක්තෙම; සහරිතාඃ, හරිත් සහිතවූ හෙවත් ඊතණ සහිතවූ; කනකස්ථලීඃ, ස්වර්ණභූමීන්; පරිතඃ, හාත්පස; වහති, උසුලයිද; සඃඑෂඃඅචලඃ, ඒ මේ පර්වත තෙම; හරිතාලසමාන, හිරියල් සමානවූ; නවාංශුකඃ, අලුත් වස්ත්‍රඇති හෙවත් පීතාම්බරධාරීවූ; භවාන් ඉව, යුෂ්මද්හුමෙන්; රාජතෙ, බබලයි.

22. පාශ්චාත්‍යභාගමිහ සානුෂු සංනිෂණ්ණාඃ
පශ්‍යන්ති ශාන්තමලසාන්ද්‍රතරාංශුජාලම්
සංපූර්ණලබ්ධලලිතාලපතොපමාන
මුත්සඞ්ගසඞ්ගිහරිණස්‍ය මෘගාඞ්කමූර්තෙඃ.

23. කෘත්වා පුංවත් පාත'මුච්චෛර්භෘගුභ්‍යො·
මූර්ධ්නි ග්‍රාව්ණාං ජර්ජරීභූතා නිර්ඣරෞඝාඃ
කුර්වන්ති ද්‍යා'මුත්පතන්තාඃ ස්මරා–
ර්තීසවංලේඛාසස්ත්‍රීගාත්‍රතිපීණ'මත්‍ර

---

**සඃ කනකසථලීඃ වහති,** යනුද **සඃ භවාන් ඉවරාජතෙ,** යනුද මෙහි ක්‍රි-යි. වහති යනුද රාජතෙ, යනුද වර්තමානලවිභූයි, වහති යන තන්හි, වහ්, ප්‍රාපණෙ, ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි, රාජතෙ යන තන්හි රාජෘ, දීප්තෞ ධාතුවෙන්, තෙ, ප්‍රත්‍යයි, කනකස්‍ය ස්ථල්‍යඃ= (තාඃ) **හරිතෛඃ සහ යාඃ** වර්තන්තෙ, තාඃ සහරිතාඃ ලසමානාඃ නවාංශවො යස්‍යසඃ= හරිතාලෙන (හර්චුරෙණ) සමානං නවාංශුකං (වාසො) යස්‍යසඃ = යනු සමාස වාක්‍යයි, **උපමා ලඞකාරයි.** දෘතවිලම්බිත වෘත්තයි, දෘතවිලම්බිතමාහනභෞභරෞ යනු තල්ලක්ෂණයි,

22. ඉහ, මේ රෛවතකනම් පර්වතයෙහි; සානුෂු, සානුප්‍රදෙශ යන්හි හෙවත් මස්තක ප්‍රදෙශයන්හි; සංනිෂණ්ණාඃ, උන්නාවූ ජනයෝ; ශාන්තමල, සාසුම්මලඇති හෙවත් නිෂ්කලඞකවූ; සාන්ද්‍ර තර, අතිශයින් ඝනවූ; අංශුජාලම්, රශ්මිකදම්බඇති; සංපූර්ණ, මොන වට පිරුණාවූ; ලබ්ධ, ලබනලද; ලලනාලපනඋපමානය, ස්ත්‍රීමුඛසදෘ ශත්වය ඇති; උත්සඞග, උත්සඞග ප්‍රදෙශයෙහි; සඞගිහරිණස්‍ය, ආශ කනාවූ මෘගයාඇති; මෘගාඞකමූර්තෙඃ, මෘගාඞකය මූර්තිකොට ඇත්ත හුගෙ හෙවත් චන්ද්‍රයාගෙ; පාශ්චාත්‍යභාගම්, පශ්චිමයෙහිවූ භාගය හෙවත් පෘෂ්ඨභාගය (පිටිපස;) පශ්‍යන්ති, දකිත්.

**ඉහ සානුෂු සංනිෂණ්ණාඃ මෘගාඞකමූර්තෙඃ පාශ්චාත්‍යං පශ්‍ය න්ති.** යනු මෙහි ක්‍රි-යි. පශ්‍යන්ති යනු වර්තමාන ලවියි, දෘශිර්, ප්‍රෙක්ෂ ණෙ ධාතුවෙන්, අන්ති, ප්‍රත්‍යයි, මෙහි දෘශිර් ධාතුහට, දෘශාදෙඃ පශ්‍යාදිඃ, යන සූත්‍රරෙන් පශ්‍ය යනාදෙශයි. **අතිශයොක්ති අලං කාරයි,** වසන්තතිලකා වෘත්තයි, උක්තාවසන්ත තිලකා තභජා ජගෞගඃ, යනු තල්ලක්ෂණයි.

23. අත්‍ර, මේ රෛවතක නම් පර්වතයෙහි; නිර්ඣරෞඝාඃ, ගඟු ලැලි සමූහයෝතුමූ; පුංවත්, පිරිමින්මෙන්; උච්චෛඃ, උස්වූ; භෘගු භ්‍යඃ, තටප්‍රදෙශවලින් හෙවත් ප්‍රපාතවලින්; ග්‍රාව්ණාං, ශෛල

24. ස්ථගයන්ත්‍යමූඃ ශමිතචාතකාර්තස්වරා
ජලදාස්තඩිත්තුලිතකාන්තකාර්තස්වරාඃ
ජගතීරිහ ස්ඵුරිතචාරුචාමීකරාඃ
සවිතුඃ ක්වචිත් කපිශයන්ති චාමීකරාඃ.

---

යන්ගෙ; මූර්ධ්නි, මස්තකයෙහි හෙවත් මස්තකයෙන්; පාතං, වැටීම හෝ පැනීම; කෘත්වා, කොට; ජර්ජරාඃ, දුදුරුවූවාහු; ඌර්ධ්වප්‍රතන්නාඃ, අහසට නගින්නාහු; ස්මරාර්තී, කාමාතුරවූ; ස්වලෝකස්ත්‍රී, දෙවඟනන්ගෙ; ගාත්‍රනිර්වාණම්, ශරීරාවයව නිවීම; කුර්වන්ති, කෙරෙත්.

**අත්‍ර නිර්ඣරරෞඝාඃ ස්වලෝකස්ත්‍රී ගාත්‍රනිර්වාණං කුර්වන්ති** යනු මෙහි ක්‍රි-යි. කුර්වන්ති, යනු වර්තමාන ලට්යි, කෘඤ්, කරණෙ, ධාතුවෙන්, අන්ති, ප්‍රත්‍යයයි, නිර්ඣරාණාමොඝාඃ නිර්ඣරෞඝාඃ ස්මරෙණ(අනඞ්ගෙන) අර්තාඃ (පීඩිතාඃ)= ස්වලෝකෙ ස්ත්‍රියඃ= ස්මරාර්තී, ස්මරාර්තාඃ ස්වලෝකස්ත්‍රියශ්චෙති= තාසාම් ගාත්‍රාණි= තෙෂාම් නිර්වාණම්, (නිර්වෘතිං)= යනු සමාස වාක්‍යයි. **උපමාලඞ්කාරයි.** ශාලිනී වෘත්තයි, ශාලින්‍යුක්තා, මතෞ, තගෞ, ගො'බ්ධිලොකෛඃ, යනු තල්ලක්ෂණයි.

24. ඉහ, මේ පර්වතයෙහි; ක්වචිත්, කිසිතැනෙක්හි; අමූඃ ජගතීඃ, ඒ භූමීන්; ශමිත, සංසිඳුවනලද; චාතකාර්තස්වරාඃ, සැඩැත්තන්ගෙ පීඩිතවූ හඬඇති; තඩිත්තුලිත, විදුලිය හා සමානවූ; කාන්ත, මන රම්වූ; කාර්තස්වරාඃ, රත්‍රන්ඇති; ජලදාඃ, මේඝයෝතුමූ; ස්ථගයන්ති, ආච්ඡාදනය කෙරෙත්; (ක්වචිත්, කිසිතැනෙක්හි;) ස්ඵුරිත, උසස්ව බබලන්නාවූ; චාරු, මනොඥවූ; චාමීකරාඃ, රත්‍රන්ඇති; සවිතුඃ, සවිතෘහුගෙ හෙවත් සූර්යයාගෙ; අමීකරාඃ, ඒ ආතපයෝ හෙවත් රශ්මිහු; කපිශයන්ති, කිඹුල්වන් කෙරෙත්; (කිසිතැනෙක වැස්සද කිසිතැනෙක අව්දයි මෙසේ මහදශවර්ෂී වීයයි යේයි.)

**ඉහ ක්වචිත්, ජලදාඃ, ස්ථගයන්ති,** යනුද, **සවිතුඃ කරාඃ (ක්වචිත්) කපිශයන්ති,** යනුද, මෙහි ක්‍රි-යි ස්ථගයන්ති යනුද, කපිශයන්ති යනුද, වර්තමාන ලට්හුයි, ස්ථග, ආච්ඡාදනෙ ධාතුවෙන් හා, කපිශ, යන නාම ධාතුවෙන්, අන්ති ප්‍රත්‍යයයි. **උපමාසංකීර්ණ ස්වභාවොක්තියි.** පෘථ්වීවෘත්තයි, 'සජසා යලෞ ව සුඝ ගෙන පෘථ්වී මතා' යනු තල්ලක්ෂණයි.

25. උත්ක්ෂිප්තා'ම්බුවජ්‍රිතසිතාංශුකරාවලම්බෛ
රුත්තම්භිතෝඩුභිරතිවතරාං ශිරෝභිඃ
ශ්‍රද්ධෙයනිර්ඣරජලව්‍යපදේශමස්‍ය
විෂ්වක් තටේෂු පතති ස්ඵුට'මන්තරීක්ෂම්.

26. එකත්‍ර ස්ඵටිකතටාංශුභින්නනීරා
නීලාශ්මද්‍යුතිභිදුරාම්භසෝ'පරත්‍ර
කාලින්දීජලජනිතශ්‍රියඃ ශ්‍රයන්තේ
වෛදග්ධී'මිහ සරිතඃ සුරාපගායාඃ.

---

25. උත්ශ්‍රිත, ඔසවනලද්දාවූ; සිතාංශු, චන්ද්‍රයාගෙ; කරාවලම්බෛඃ, රශ්මි අවලම්බඇති හෙවත් ලම්බමාන රශ්මිඇත්තාවූ හෝ ලම්බිත හස්තඇති; උත්තම්භිතෝඩුභිඃ, උත්තම්භනය කරණලද තාරකාවන් ඇති නොහොත් උත්තම්භිතවූ ජලයඇති; ශිරෝභිං, ශිඛරවලින් නොහොත් මස්තකවලින්; අතිවතරාං, අතිශයින්ම; උත්ක්ෂිප්තං, ඔසවනලද්දවූ හෙවත් උඩමකොට ධරණලද්දවූ; අන්තරීක්ෂම්, අහස; ශ්‍රද්ධෙය, සද්දහනය හෙතුකොටගෙණ ඇදහියයුතුවූ; නිර්ඣරජලව්‍යපදෙශම්, ගඟුලැලිදිය සම්බන්ධ ව්‍යවහාර ඇති; (ගඟුලැලිදියයි ව්‍යවහාර ඇතිවූ යී සේයි) අස්‍ය, මේ පර්වතයාගෙ; තටේෂු තටප්‍රදෙශයන්හි හෙවත් ප්‍රපාතයන්හි; විෂ්වක්, හාත්පසින්; පතති, වැටේය යනු; ස්ඵුටං, සත්‍යයි.

**අන්තරීක්ෂම් අස්‍යතටෙෂු පතති ( ඉති ස්ඵුටං භවති, )** යනු මෙහි, ක්‍රි- යි. පතති, යනු, පතඝ, පතනෙ, ධාතුවෙන් සිඬයි, වර්තමානලට්, තිප්, ප්‍රත්‍යයි, සිතාඃඅංශවඃ යස්‍යසඃ= සිතාංශොඃකීරාඃ= උත්ශ්‍රිතාඃ (උත්ක්ෂිප්තාඃ) සිතාංශුකරාඃ (හස්තාශවා) වලම්බො යෙෂාම් තෙ= (තෛඃ) උත්තම්භිතානි, උඩූනිඃයෙශෙන = (තෛඃ) ශ්‍රද්ධෙයඃ (සාදෘශ්‍යාච්ශවසනීයො) නිර්ඣරජලමිති ව්‍යපදෙශො (ව්‍යවහාරො) යස්‍ය තත්= යනු, සමාස වාක්‍යයි. **උත්ප්‍රෙක්ෂාලංකාරයි**.

26. එකත්‍ර, එක්භාගයෙක්හි (එක්කොටසෙක්හියී සේයි;) ස්ඵටිකතටාංශු, පළිඟුතට සම්බන්ධිවූ රශ්මිවලින්; භින්න, සංභින්නවූ හෙවත් මිශ්‍රවූ; නීරාඃ ජලඇති හෙවත් ශුභ්‍රවර්ණ ජලාන්විතවූ; අපරත්‍ර, අන් කොටසෙක්හි; නීලාශ්මද්‍යුති, ඉඳුනිල්මිණි සම්බන්ධිවූ කාන්තිවලින්; භිදුරාම්භසඃ, මිශ්‍රවූ දියඇති හෙවත් නිල්වන් ජලය ඇති; ඉහ, මේ පර්වතයෙහි; සරිතඃ, ගඞ්ගාවෝතුමූ; කාලින්දී, කාලින්දී පුත්‍රියගෙ හෙවත් යමුනා නදීහුගෙ; ජලජනිතශ්‍රියඃ, දියෙන් උපදවනලද ශොභා ඇත්තියෝ; සුරාපගායාඃ, ස්වර්නදීහුගෙ; වෛදග්ධීං, ශොභාව; ශ්‍රයන්තෙ, ඇසුරු කෙරෙත්.

27. ඉතස්තතො'ස්මින් විලසන්ති මෙරොඃ
සමානවප්‍රෙ මණිසානුරාගාඃ
ස්ත්‍රියශ්ච පත්‍යෞ සුරසුන්දරීභිඃ
සමා නවප්‍රෙමණි සානුරාගාඃ.

28. උච්චෛ'ර්මහාරජතරාජිවිරාජිතාසෞ
දුර්වර්ණභිත්තිරි'හ සාන්ද්‍රසුධාසවර්ණා
අභ්‍යෙති භස්මපරිපාණ්ඩුරිතස්මරාරෙ
රුද්වහ්නිලොචනලලාමලලාටලීලාම්.

---

**ඉහ, සපිනඃ සුරපගාඝඃ, තෙවදග්ධිං ශ්‍රයන්තෙ,** යනු මෙහි ක්‍රි- සි. ශ්‍රයන්තෙ, යනු වර්තමාන ලට්සි= ශ්‍රිඤ්, සෙවායාම් ධාතුවෙන් අන්තෙ, ප්‍රත්‍යයයි, **නිදර්ශනාලඞ්කාරයි, ප්‍රහර්ෂිණී නම් වෘත්තයි,** ම්නෞ ජ්‍රෞ ගස්ත්‍රිදශයතිඃ ප්‍රහර්ෂිණීයම්, යනු තල්ලක්ෂණයි.

27. මෙරොඃ, මෙරුපර්වතයට; සමානවප්‍රෙ, සදෘශවූ පව්රුඇති; අස්මින්, මේ පර්වතයෙහි; ඉතස්තතඃ, ඔබිනොබ; මණිසානුරාගාඃ, මැණික්සම්බන්ධ තටප්‍රදෙශයන්හිවූ කාන්තීහු; විලසන්ති, පැතිරෙත්; නවප්‍රෙමණි, අලුත්පෙම්ඇති; පත්‍යෞ, හිමියාකෙරෙහි; සානුරාගාඃ, අනුරාග සහිතවූ; සුරසුන්දරීභිඃ, දෙවඟණන් හා; සමාඃ, සමවූ; ස්ත්‍රියඃ ස්ත්‍රීහුතුමූ (ඉතස්තතඃ, ඔබිනොබ) විලසන්ති, ක්‍රීඩාකෙරෙත්.

**අස්මින් මණිසානුරාගාඃ ඉතස්තතඃ විලසන්ති,** යනුද, **සානුරාගාඃ ස්ත්‍රියශ්ච ඉතස්තතඃ විලසන්ති,** යනුද, මෙහි ක්‍රි- සි. විලසන්ති, යනු, වර්තමාන ලට්සි, ලස, ශ්ලෙෂෙ ක්‍රීඩායාම් දීප්තෞච යන ධාතුවෙන්, අන්ති, ප්‍රත්‍යයයි, (ඔවුනොවුන් කෙරෙහි අනුරාග ඇති අඹුසැමියෝද, තදනුරූපවූ විහරණස්ථලයෝද මේ රෛවතක නම් පර්වතයෙහි හෙවත් කන්දෙහි විද්‍යමානවෙති යි සේයි.) **උපමාලඞ්කාරයි.**

28. ඉහ, මේ පර්වතයෙහි; සාන්ද්‍ර, ඝනවූ; සුධාසවර්ණා, සුණු අලෙව්වට හෝ අමාවට සමාන වර්ණඇති; මහාරජතරාජිවිරාජිතා, ස්වර්ණරෙඛාවලින් හෙබියාවූ; උච්චෛඃ, උස්වූ; අසෞ දුර්වර්ණභිත්තිඃ, මේ රජතමය භිත්තිතොම; භස්මපරිපාණ්ඩුරිත, අලුවලින් හාත් පසින් හටගත් ශුභ්‍රවර්ණඇති; (අළුවෙන් හාත්පසින් හටගත් සුදු පැහැඇති යී සේයි) ස්මරාරෙඃ, අනඞ්ගශත්‍රුහුගෙ හෙවත් මෙහෙසුරුගෙ; උද්වහ්නි, උද්ගතවූ ගිනිඇති; ලොචනලලාම, ඇසම අබරණකොටඇති; ලලාටලීලාම්, නළලසම්බන්ධවූ ශොභාවට; අභ්‍යෙති, පැමිණෙයි.

29. අයමතිජරඨාඃ ප්‍රකාමගුර්වී
රලඝුවිලම්බිපයොධරොපරුද්ධාඃ
සතත'මසුමතාමගම්‍යරූපාඃ
පරිණතදික්කරිකාඃ තටීර්බිභර්ති.

---

**ඉහ අසෞ දුර්වණ්ණභිත්තිඃ සමරුණ්ඩරඃ, උවහ්නි= ලලාමලීලාම් අධත්ත,** යනු මෙහි, ක්‍රි- යි. අහොත්ති, යනු වනී ලව් යි, අභි පූර්ව ඉණ්, ගතෞ ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි, සමාතඃ වර්ණ්ණඃයස්‍යාඃ සා සවර්ණා සාන්ද්‍රාවසාසුධාවෙති= සාන්ද්‍රසුධයා (ලෙපවිශෙෂෙණාමෘතෙනවා) සවර්ණ්ණා= දුර්වණ්ණිත (රජතෙන නිර්මිතා) භිත්තිඃ= මහාරජතස්‍ය (සුවර්ණ්ණස්‍ය) රජීඃ = මහාරජතරාජ්‍යාවිරාජිතා = භස්මනාපරිපාණ්ඩුරිතඃ= භස්මපරිපාණ්ඩුරිතශවාසෞ සමරුරිපුශවනි = (තස්‍ය) උද්ගතොවහ්නිර්යස්‍යතත් = උද්වහ්නිවනත් ලොචනඤ්චති = උවහ්නිලොචනමෙව ලලාමංභූෂණං, යස්‍යතත්= උද්වහ්නිලොචනලලාමඤ්චහත් ලලාටඤ්චති= තස්‍යලීලා=(තාම්)= යනු මෙහි සමාසවාක්‍යයි, **නිදර්ශනා ලංකාරයි.**

29. අයං, මේ පර්වතයතෙම; අතිජරඨාඃ, ඉතා සාරශවූ හෙවත් ඉතාදිරන්නාවූද; ප්‍රකාමගුර්වීඃ, ඒකාන්තයෙන් ශ්‍රෙෂ්ඨවූ නොහොත් සථූලත්වය හෙතුකොටගෙණ දුර්භර බැවින් ප්‍රකාමගුර්වීවූ; අලඝු, සැහැල්ලුනොවූ හෙවත් බරවූ; විලම්බි, වෙසෙසින් එල්බෙන්නාවූ; පයොධර, මේඝවලින් දෙහෝ නොහොත් පියවුරුවලින්; උපරුද්ධාඃ,ආවරණය කරණලද්දුවූ; සතත, නිරන්තරයෙන්; අසුමතාම් ප්‍රාණධාරීන් විසින්; අගම්‍යරූපාඃ, අත්‍යුන්නතබැවින් නොපැමිණිය හැකි සවරූප ඇත්තාවූ නොහොත් මහලුබැවින් උපගමනයට නුසුදුසු ශරීරඇත්තාවූ; පරිණත, පැසුණාවූ හෙවත් තිර්යක්දන්තප්‍රහාර ඇති; දික්කරිකාඃ, දිගැතුන්ඇති; නොහොත් උරිණත, ව්‍රණභාවයෙන් පැසවීගියාවූ; දික්කරිකාඃ, දික්යයි කියනලද දන්තක්ෂත විශෙෂ හා නඛව්‍රණද ඇත්තාවූ; තටීඃ, තටප්‍රදෙශයන් හෙවත් තටප්‍රදෙශ නමැති වෘද්ධාඞ්ගනාවන්; බිභර්ති, පෝෂණය කොරෙයි.

**අයම් පරිණතදික්කරිකාඃ තටීඃ බිභර්ති,** යනු මෙහි ක්‍රි- යි. බිභර්ති, යනු වනී- ලට්යි, ඩුභෘඤ් ධාරණ පොෂණයොඃ ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි, සමාසොක්තියි, පුෂ්පිතාග්‍රා වෘත්තයි.

'අයුජි නයුගරෙඵතො නකාරෙ
යුජි ච නජෞ ජරගාශ්ච පුෂ්පිතාග්‍රා' යනු තල්ලක්ෂණයි.

30. ධූම්‍රාකාරං දධති පුරඃ සෞවර්ණේ
වර්ණේනාග්නෙඃ සදෘශි තටෙ පශ්‍යාමී
ශ්‍යාමීභූතාඃ කුසුමසමූහෙ'ලීනාං
ලීනාමාලීමිහ තරවො බිභ්‍රාණාඃ.

31. ව්‍යෝමස්පෘශඃ ප්‍රථයතා කලධෞතභිත්තී
රුන්නිද්‍රපුෂ්පචණචම්පකපිඞ්ගභාසඃ
සෞමෙරවී'මධිගතෙන නිතම්බශොභා
මෙතෙන භාරතමිලාවෘතවද්විභාති.

---

30. ඉහ, මේ පර්වතයෙහි; පුරඃ, ඉදිරියෙහි; වර්ණේන, වර්ණයෙන්; අග්නෙඃ සදෘශි, ගින්නට සමානවූ; සෞවර්ණේතටෙ, සුවර්ණ විකෘත තටයෙහි; කුසුමසමූහෙ, පුෂ්පරාශියෙහි; ලීනාම්, සිටියාවූ; අලීනාම්ආලිඃ, භෘඞ්ගාවලින්; බිභ්‍රාණාඃ, ධරන්නාවූ; ශ්‍යාමීභූතාඃ, එහෙයින්ම සම්වන්වූ; අමීතරවඃ, මේ වෘක්ෂයෝතුමූ; ධූම්‍රාකාරං, ධූම්‍ර සදෘශත්වය; දධති, ධරත්; පශ්‍ය, නුඹද එය බලව.

**අමීතරවඃ ධූම්‍රාකාරං, දධති,** යනුද **[illegible] ත්වං පශ්‍ය,** යනුද මෙහි ක්‍රි- යි. දධති, යනු වර්ත- ලට් යි, පශ්‍ය, යනු, ආශීඃ, ප්‍රේරණ ලොට්යි දධති යන තන්හි ඩු- ධාඤ් ධාරණ පොෂණයොඃ ධාතුවෙන්, අන්තිප්‍රත්‍යයි, ආතොනොනාදනතඃ, යනුවෙන්, අන්ත්‍යන්නට අත් ආදෙශයෙන් දධති කියා බහුවචනය සිඬයි, පශ්‍ය, යන තන්හි දෘශිර් ප්‍රේක්ෂණෙ ධාතුහට, දෘශාදෙඃ පශ්‍යාදිඃ යනුවෙන් පශ්‍ය, යනාදෙශයි **උපමාලංකාරයි. ජලධරමාලා [illegible]යි,** අබ්ධ්‍යඞ්ගෛඃ ස්‍යාජ්ජලධරමාලාම්භෞ ස්මෞ, යනු තල්ලක්ෂණයි.

31. ව්‍යෝමස්පෘශඃ, අහසපගස්නාවූ; උන්නිද්‍ර, විකශිතවූ; පුෂ්ප චණ, මල්වලින් ප්‍රසිඬවූ; චම්පකපිඞ්ගභාසඃ, සපුමල්මෙන් පිඟුවන්වූ; කලධෞතභිත්තීඃ, සවර්ණමය භිත්තීන්; ප්‍රථයතා, ප්‍රකටකරන්නාවූ; සෞමෙරවීං, සුමෙරුපර්වතයසම්බන්ධවූ; නිතම්බශොභාං, කටකශ්‍රියට හෙවත් උකුල්හුගෙ ශොභාවට; අධිගතෙන, පැමිණියාවූ; එතෙන, මේ රෛවතකනම් පර්වතයකාරණකොටගෙණ; භාරතං, භරත රජු සම්බන්ධිවූභූඛණ්ඩය; ඉලාවෘතවත්, ඉලාවෘතනම් වර්ෂයමෙන් හෙවත් මධ්‍යම භූඛණ්ඩයමෙන්; විභාති, භ්‍රාජමානවෙයි (බබලයි සේයි)

**එතෙන භාරතං, ඉලාවෘතවත් විභාති,** යනු මෙහි ක්‍රි- යි. විභාති යනු, වර්තමාන ලට් යි, විපූර්ව භා, දීප්තෞ ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි, මෙහි ඉලාවෘතවර්ෂයගැණ, නවඛණ්ඩස්‍ය ජම්බුද්වීපස්‍ය හිමාද්‍රේ දක්ෂිණභූඛණ්ඩං, හෛමවතාපරනාමකං, භාරතවර්ෂං සුමෙරුයොගාත්, සෞමෙරවාපරාඛ්‍යං, මධ්‍යමඛණ්ඩමිලාවෘතවර්ෂම්(යනුද අතඑව)

32. රුචිරචිත්‍රතනූරුහශාලිභිර්
ප්‍රචලිතෛඃ පරිතඃ ප්‍රියකව්‍රජෛඃ
විවිධරත්නමයෛ'රභිභාත්‍යසා-
ව්‍යවයවෛරිව ජඞ්ගමතාං ගතෛඃ.

33. කුශෙශයෛ'රත්‍ර ජලාශයොෂිතා
මුදා රමන්තෙ කලභා විකස්වරෛඃ,
ප්‍රගීයතෙ සිඬගණෛශ්ච යොෂිතා
මූදුරමන්තෙ කලභාවිකස්වරෛඃ.

---

නාම්නෙදං භාරතං වර්ෂං හිමාද්‍රෙස්තච්ච දක්ෂිණෙ,
තෙන හෛමවතං නාම පරෙෂ්වප්‍යෙවමූහ්‍යතාමෙත්,
ඉලාවෘතං සෞමෙරවං සුමෙරොඃ පරිතො හි තත්,

යනුදු ටීකාගත බැවින් විස්තර දතයුතුයි. මෙහි භාවය සුබොධයි, **උපමාලඞ්කාරයි.**

32. අසෞ, මේපර්වතයතෙම; රුචිර, සිත්කළුවූ; චිත්‍ර, විසිතුරුවූ; තනූරුහ, ලොම්වලින්; ශාලිභිඃ, සාරවත්වූ හෙවත් හොබනාවූ; පරිතඃ, හාත්පස; ප්‍රචලිතෛඃ, පැතිරසිටිනාවූ; ප්‍රියකව්‍රජෛඃ, සාම්බල ප්‍රකෘතවූ මෘගසමූහයා කරණකොටගෙණ; ජඞ්ගමතාං, ජඞ්ගමබවට නොහොත් ඇවිදින සතුන් බවට; ගතෛඃ, පැමිණියාවූ; විවිධරත්නමයෛඃ, නානාවිධ රත්නමයවූ හෙවත් නන්වැදෑරුම් රුවනින් නිපදවනලදුවූ; අවයවෛඃඉව, ස්වකීයඅවයවවලින්මෙන් හෙවත් ස්වකීය අවයවවලින් යුක්තවූවාක්මෙන්; අභිභාති, මොනවට වැටහෙයි.

**අසෞ විවිධරත්නමයෛඃ අවයවෛරිව අභිභාති,** යනු මෙහි ක්‍රි-යි. අභිභාති, යනු, වර්තමාන ලට්යි, අභිපූර්ව භා,දීප්තෞ ධාතුවෙන් තිප්.ප්‍රත්‍යයි, **උත්ප්‍රෙක්ෂා ලඞ්කාරයි. ද්‍රුතවිලම්බිතනාම වෘත්තයි,** ද්‍රුතවිලම්බිතමාහ නභෞ, භරෞ, යනු තල්ලක්ෂණයි.

33. **අත්‍ර**, මේ රෛවතකනම් පර්වතයෙහි; ජලාශයොෂිතාඃ, ජලාශය ස්ථානයන්හි වසන්නාවූ; කලභාඃ, තිස්හවිරුදුපමණ ඇත්තාවූ හස්තීහු; විකස්වරෛඃ, පුබුදිතා සුලුවූ; කුශෙශයෛඃ, ශතපත්‍රවලින්; මුදා, සන්තොෂයෙන්; රමන්තෙ, ක්‍රීඩාකෙරෙති; කලභාවික, අව්‍යක්ත මධුරවූ මනොවිකෘතිය ප්‍රයෝජනකොට ඇත්තාවූ හෙවත් උද්දීප්තවූ; ස්වරෛඃ. ෂඩ්ජාදිසප්තස්වරඇති; සිඬගණෛශ්ච, (සිඬනම්වූ) දෙවසමූහයා විසින්ද; යොෂිතාම්, ස්වකීය දිව්‍යස්ත්‍රීන්ගෙ; අන්තෙ, සමීපයෙහි; උදරං, උසස්කොට; ප්‍රගීයතෙ, ගැයීමයි (ගායනය කිරීම වීයයි යේයි.)

34. ආසාදිතස්‍ය තමසා නියතේර්නියොගා
දාකාඞ්ක්‍ෂතඃ පුන'රපක්‍රමණෙන කාලම්,
පත්‍යුස් ත්විෂාමිහ මහෞෂධයඃ කලත්‍ර
ස්ථානං පරෛ රනභිභූත'මමූර්වහන්ති.

---

**අත්‍ර කලහාඃ, කුශෙශයශයෙ: වුද රමණෙන,** යනුද, **සිධගන්ධර්ශව, උදාරං, ප්‍රගීයතෙ,** යනුද මෙහි, ක්‍රි- යි. රමන්තෙ, යනුද, ප්‍රගීයතෙ, යනුද, වර්‍තමානලට් හුයි, රමු, ක්‍රීඩායාම්, ධාතුවෙන් කර්‍තෘ සාධනයෙහි අන්තෙ, ප්‍රත්‍යය හා, ගෛ, ශබ්දෙ, ධාතුවෙන්, භාවයෙහි, තෙ, ප්‍රත්‍යයවූ තැනියි, කුශෙ, (ජලෙ) ශෙරත ඉති, කුශෙශයානි, (තෛඃ) ජලානාමාශයාඃ ජලාශයාඃ (ජලාශයෙෂු) (හෘදෙෂු) උෂිතා ඉති= වස. නිවාසෙ, ධාතුවෙන් කර්‍තෘයෙහි, ක්ත ප්‍රත්‍යයයි, සංප්‍රසාරණයි, "මතිබුද්ධිපූජාර්ථෙභ්‍යශ්ච" යනුවෙන්, වර්‍තමානාර්ථ භාවයයි, සිඩානාම්ගණාඃ,(සිඩාශ්චතෙ ගණාශ්චෙති වා)=(තෛඃ)කලා(අව්‍යක්ත මධුරඃ)=(විසාරෙමානසො) භාවඃ, ස ප්‍රයොජනමෙෂාමිති භාවිකාඃ උද්දීපකා ඉත්‍යර්ථඃ, කලභාවිකාශ්ච ස්වරාඃ, යෙෂාම්තෙ=(තෛඃ) යනු නිර්වචනයි, **ස්වභාවොක්තියි.**

34. ඉහ, මේ පර්වතයෙහි; අමූ මහෞෂධයඃ, ඒ මහෞෂධීහු; නියතෙඃ නියොගාත්, නියමය සම්බන්ධීවූ නියෝගය හෙතුකොට ගෙණ හෙවත් මේ වේය යන දෛවශාසනය හෙතුකොටගෙණ; තමසා, අඳුරෙන් නොහොත් අඳුර බොහෝකොට ඇති ව්‍යසනයෙන්; ආසාදිතස්‍ය, ආක්‍රමණය කරණලද්දවූ; පුනඃ, නැවත; අපක්‍රමණෙන, අපක්‍රමණයෙන් හෙවත් (නැවත) පෙරලා ඊමෙන්; කාලම්, සමාගම් කාලය; ආකාඞ්ක්‍ෂතඃ, කැමතිවන්නාවූ; ත්විෂාම්පත්‍යුඃ, ප්‍රභාපතිහුගෙ හෙවත් සූර්‍යයාගෙ; පරෛඃ, අන්‍ය තේජස් වලින්ද නොහොත් අන්‍ය පුරුෂයන් විසින්ද; අනභිභූතම්, පරස්නොකරණලද්දවූ නොහොත් උපඝාතනොකරණලද්දවූ; කලත්‍රස්ථානං, කලත්‍රවූ කාන්තාවන්ගේ ස්ථානය; වහන්ති, උසුලත්; (ස්ත්‍රීන්ගෙ රක්‍ෂණය ස්ත්‍රීන් කෙරෙහිම කටයුතුයයි සේයි.

**ඉහ මහෞෂධයඃ, කලත්‍රස්ථානං වහන්ති,** යනු, මෙහි ක්‍රි=යි. වහන්ති, යනු, වර්‍තමාන ලට්යි, වහ්, ප්‍රාපණෙ, ධාතුවෙන් අන්ති ප්‍රත්‍යයයි, **සමාසොක්ති අලංකාරයි.**

35. වනස්පතිස්කන්ධනිෂණ්ණබාල
ප්‍රබාලහස්තාඃ ප්‍රමදා ඉවාත්‍ර,
පුෂ්පෙක්ෂණෛ'ර්ලම්භිතලොචකෛශ්ච
මධුව්‍රතව්‍රාතවෘතෛර්ව්‍රතත්‍යඃ.

36. විහගාඃ කදම්බසුරභාවිහ ගාඃ
කලයන්ත්‍යනුක්ෂණ'මනෙකලයම්,
භ්‍රමයන්නුපෛති මුහුරභ්‍රමයං
පවනශ්ච ධූතනවනීපවනඃ.

---

35. අත්‍ර, මේ පර්වතයෙහි; වනස්පති, වන දෙව්රුක් සම්බන්ධිවූ; ස්කන්ධ, ප්‍රකාණ්ඩයන්හි නොහොත් ඇසායන්හි; නිෂණ්ණ, උන්නාවූ; බාලප්‍රවාලහස්තාඃ, ළපලුනමැති අත්ඇති; මධුව්‍රතව්‍රාත, භෘඞ්ග සමූහයාවිසින්; වෘතෛඃ, ආවරණයකරණලද්දාවූ හෙවත් වසන ලද්දාවූ; ලම්භිත, පමුණුවනලද; ලොචකෛඃවා, තාරකා නොහොත් කජ්ජල ඇත්තාවූ; හෙවත් ලම්භිතලොචකෛඃවා, පමුණුවනලද තාරකා නොහොත් කජ්ජල ඇත්තවුන්මෙන් සිටියාවූ; පුෂ්පෙක්ෂණෛඃ, මල්වැනිවූ ඇස්වලින් උපලක්ෂිතවූ; ව්‍රතත්‍යඃ, ව්‍රතතීහු හෙවත් ලතාවෝ; ප්‍රමදාඃඉව, ප්‍රකෘෂ්ට මද ඇත්තියන්මෙන් හෙවත් ස්ත්‍රීන් මෙන්; (ලක්ෂ්‍යන්තෙ, සලකනු ලැබෙත්.

අත්‍ර ව්‍රතත්‍යඃ ප්‍රමදා ඉව, (ලොකෛන) සංලක්ෂ්‍යන්තෙ, යනු මෙහි, ක්‍රි-යි. සංලක්ෂ්‍යන්තෙ යනු, දිති- ලවියි, සම්පූර්, ලක්ෂ, දර්ශනෙ අඞ්කනෙච, යන ධාතුවෙන් කර්මයෙහි, අන්තෙ, ප්‍රත්‍යයයි, (මේ ක්‍රියාපදය, අධ්‍යාහෘතයි)

වනස්පතිඃ=වනස්පතීනාම්ස්කන්ධාඃ, වනස්පතිස්කන්ධෙෂු (අංශෙෂුච) නිෂණ්ණාඃ,= වනස්පතිස්කන්ධනිෂණ්ණ බාලප්‍රවාලාහස්තාඉව හස්තායාසාං තාඃ= පුෂ්පානීවෙක්ෂණානි=(තෛඃ) ලම්භිතාඃ (ප්‍රාපිතාඃ) ලොචකානි තාරකානි කජ්ජලානිච) යෛසෙතා= (තෛඃ) මධූනිව්‍රතයන්ති, භුඤ්ජතෙඉතිමධුව්‍රතාඃ, තෙෂාම්ව්‍රාතඃ (වෘන්දඃ)= තෙනවෘතාඃ (තෛඃ) යනු සමාස වාක්‍යයි, උත්ප්‍රෙක්ෂා ලංකාරයි

36. කදම්බසුරභෞ, කදම්බ සුරභිවූ හෙවත් කොලොම් කරණකොටගෙණ සුවඳැත්තාවූ; ඉහ, මේ පර්වතයෙහි; විහගාඃ, පක්ෂීහු; අනුක්ෂණං, ඇසිල්ලක්පාසා; අනෙකලයම්, නන්වැදෑරුම් විච්ඡේද ඇතිසේ; ගාඃ, බස් හෙවත් ශබ්දයන්; කලයන්ති, කථනය කෙරෙත්; (උසුරුවතියි සේයි) ධූත, (මඳපවනින්) කම්පිතවූ; නවනීපවනඃ, අභිනව බක්මීවනඇති; අයංපවනශ්ච, මේ වාතය තෙමේද; මුහුඃ, වරක් අභ්‍රමයං, මේඝය; භ්‍රමයන්, සිසාරවමින්; උපෛති, එළඹෙයි.

37. විවද්භි'රාගමපරෛ'ර්විවෘතං කථංචි-
ච්ඡෘත්වා'පි දුර්ග්‍රහමනිශ්චිතධීභි'රන්‍යෛඃ
ශ්‍රේයාන් විජතිරි'ව හන්තු'මඝානි දක්ෂං
ගූඪාර්ථ'මේෂ නිධිමන්ත්‍රගණං බිභර්ති.

38. බිම්බෝෂ්ඨං බහු මනුතෙ තුරඞ්ගවක්ත්‍ර-
ශ්චුම්බන්තං මුඛ'මිහ කින්නරං ප්‍රියායාඃ
ශ්ලිෂ්‍යන්තං මුහුරිතරෝ'පි'තං නිජස්ත්‍රී-
මුත්තුඞ්ගස්තනභරභඞ්ගභීරුමධ්‍යාම්.

---

**ඉගවිහගාඃ අනුක්ෂණං, ගාඃ, කථයන්ති** යනුද, **අසංපවනශව මුශුඃ අභ්‍රවයං භ්‍රමයන්, උපෛති,** යනුද මෙහි, ක්‍රි- යි. කථයන්ති, යනුද, උපෛති, යනුද, වර්තමාන ලවිහුයි, කථයන්ති, යනු, කථ, කථනෙ, ධාතුවෙන්, අන්ති, ප්‍රත්‍යයයි- උපෛති, යනු- උපපූර්ව, ඉණ්, ගතෞ ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයයි, **ස්වභාවොක්තියි. ප්‍රමිතාක්ෂරා වෘත්තයයි,** ප්‍රමිතාක්ෂරා සජසසෛරු'දිතා, යනු තල්ලක්ෂණයි.

37. එෂඃ, මේ පර්ෂතය තෙම්; ශ්‍රේයාන්, ශ්‍රේෂ්ඨවූ; විජතිඃඉව, බමුණෙකුමෙන්; ආගමපරෛඃ, නිධිකල්ප නොහොත් මන්ත්‍රශාස්ත්‍ර ප්‍රධානකොට ඇති; විවද්භිඃ, පණ්ඩිතයන් විසින් හෙවත් නිධාන හෝ මන්ත්‍ර සම්බන්ධ සාධන විධි දන්නාවූ පණ්ඩිතයන් විසින්; කථං චිත්, කෙසේ නුමුත්; විවෘතං, ස්වරූපයෙන් ප්‍රකාශකරණ ලද්දාවූ; අනිශ්චිතධීභිඃ, නිශ්චයරහිත බුද්ධිඇති; අන්‍යෛඃ, සෙස්සන් විසින් හෙවත් අශාස්ත්‍රඥයන් විසින්; ශෘත්වාඅපි, මෙහි නිධිඇතැයි යනාදීන් ශ්‍රවණයකොටද; දුර්ග්‍රහම්, සිද්ධකරගත නොහැක්කාවූ; අඝානි, දුඃඛයන් නොහොත් පාපයන්; හන්තුං, නසන්ට; දක්ෂං, සමර්ථවූ; ගූඪාර්ථං, සැඟවුණු ධන නොහොත් අභිධෙය ඇති; නිධිමන්ත්‍රගණං, මන්ත්‍රවැනි නිධාන හෝ නිධානවැනි මන්ත්‍ර සම්බන්ධ සමූහය; බිභර්ති, ධරයි.

**අසෞ නිධි, මන්ත්‍රගණං බිභර්ති,** යනු මෙහි ක්‍රි- යි. බිභර්ති, යනු වර්තමාන ලවියි, ඩුභෘඤ් ධාරණ පොෂණයොඃ, ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයයි, **උපමාලඞ්කාරයි.**

38. ඉහ, මෙ පර්ෂතයෙහි; තුරඞ්ගවක්ත්‍රඃ, අශ්වයෙකුගෙ මූඛය වැනි මූඛඇති දෙවයොනි විශෙෂය තෙම; බිම්බොෂ්ඨං, බිඹුපලවැනි තොල් ඇති; ප්‍රියායාඃ, ප්‍රියාවගෙ හෙවත් බිරින්දගෙ; මුඛං, මූහුන; චුම්බන්තං, සුඹුනාවූ; කින්නරං, කිඳුරා; බහු, බොහෝසේ; මනුතෙ, දූනගණියි; ඉතරඃඅපි, අනික් කිඳුරාද; උත්තුඞ්ග, උස්වූ; ස්තනභර, පියවුරුබරින්වූ; භඞ්ග, බිඳීමෙන්; භීරු, බනසුළුවූ; මධ්‍යාම්, මධ්‍ය

39. යදේතදස්‍යානුතටං විභාති
වනං තතානේකතමාලතාලම්
න පුෂ්පිතාත්‍ර ස්ථගිතාර්කරශ්මා
වනං තතානේ කතමා ලතාලම්.

40. දන්තෝජ්ජ්වලාසු විමලෝපලමේඛලාන්තාඃ
සද්‍රත්නචිත්‍රකටකාසු බෘහන්නිතම්බාඃ
අස්මින් භජන්ති ඝනකෝමලගණ්ඩශෛලා
නාසෝ'නුරූප'මධිවාස'මධිත්‍යකාසු

---

ප්‍රදේශය හෙවත් ඉහවිය ඇති; නිජසද්‍මිම්, සියකිරින්ද; මුහුඃ, වරක්; ශලිෂ්‍යන්තං, වැලඳගන්නාවූ; තං, ඒ අශ්වමුඛ දෙවයොනි විශෙෂය; බහු, බොහෝසේම; මනුතෙ, දනගණියි; (අශ්වදහයවැනි දෙහ ඇති කිඳුරාගෙ වැලඳගැණිම සම්භාවනොවන හෙයිනැයි සේයි)

**ඉහ තුරඞ්ගවක්ත්‍රඃ කිංනරං, බහු, මනුතෙ**, යනුද, **ඉතරඃ බහු, තං මන්‍යතෙ**, යනුද, මෙහි ක්‍රි- යි. මනුතෙ, යනු, වර්තමාන ලටියි, මන, ඥානෙ, ධාතුවෙන්, තෙ, ප්‍රත්‍යයි, **අතිශයොක්ති උපමා සංසෘෂ්ටි අලංකාරයි. ප්‍රහර්ෂිණී වෘත්තයි** ම්නෞ ජ්‍රෞ ගස්ත්‍රිදශයතිඃ ප්‍රහර්ෂිණීයම්, යනු, තල්ලක්ෂණයි.

39. අස්‍ය, මේ පර්වතයාගෙ; අනුතටං, තටයක්පාසා හෙවත් තට ප්‍රදෙශයන්හි; තත, ව්‍යාප්තාවූ හෙවත් පැතුරුණාවූ; අනෙකත මාලතාලම්, නොයෙක් තමලුගස් හා තල්ගස්ඇති; යත්වනං, යම් වනයෙක්; විභාති වෙසෙසින් බබලාද; ස්ථගිතාර්කරශ්මිං, වැසුණාවූ හිරුරැස් ඇති; අනන්තතානෙ, අන්තරහිතවූ හෙවත් අපමණ විස්තාරඇති; අත්‍ර, මේ වෙනෙහි; කතමාලතා, කිනම් වැලක්; අලම්, අත්‍යර්ථයෙන්; න පුෂ්පිතා, නොපිපියාද හෙවත් මල්හට නොගත්තීද (සියලුලතාජාතිතොම මල් හටගත්තීයයි සේයි)

**අස්‍ය, යත්වනං, විභාති**, යනුද, **අත්‍ර, කතමාලතා, න, පුෂ්පිතා අභවත්**, යනුද, මෙහි, ක්‍රි-යි. විභාති, යනු, වර්ත, ලටියි, විපූර්ව,භා, දීප්තෞ ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි, තවෙෂ්වන්ත්‍යනුතටං, තතා (විස්තෘතා,) අනෙකෙ (බහව) තමාලාතාලාශ්ච, යස්මිංස්තත්,= ස්ථගිතඃ අර්කරශ්මිර්‍යස්මිංස්තත්= (තස්මින්) න අන්තඃ අනන්තඃ අනන්තඃ තතඃ යස්මින් තත්, )තස්මින්) යනු සමාස වාක්‍යයි **ස්වභාවොක්ති අලංකාරයි.**

40 අස්මින්, මේ පර්වතයෙහි; දන්තොජ්ජ්වලාසු, තිකුණුභාග වලින් නොහොත් දත්වලින් උසස්ව බබලන්නාවූ; සද්‍රත්නවිචිත්‍ර, මහාමිණිරුවන්වලින් විසිතුරුවූ; කටකාසු, සානුප්‍රදෙශ නොහොත්

41. අනතිචිරෝජ්ඣිතස්‍ය ජලදෙන චිර
ස්ථිතබහුබුද්බුදස්‍ය පයසෝ'නුකෘතිම්
විරලවිකීර්ණවජ්‍රශකලා සකලා
මිහ විදධාති ධෞතකලධෞතමහී.

42. වර්ජයන්ත්‍යා ජනෛඃ, සංගමෙකාන්තත
ස්තර්කයන්ත්‍යා සුඛං සඞ්ගමෙ කාන්තතඃ
යොෂයෛෂ ස්මරසන්නතාපාඞ්ගයා
සෙව්‍යතෙ'නෙකයා සංතතාපාඞ්ගයා.

---

වළලු ඇත්තාවූ; අධිත්‍යකාසු, ඌර්ධ්වභූමීන්හි; විමලොපල, නිර්මලවූ ගල් හෙවත් නිර්මල මැණික්ගල් හා; මෙඛලාන්තාඃ, මෙවුල්දමින් නොහොත් නිතම්බ භූමිවලින් රමනාහීවූ; වෘහන්නිතම්බාඃ, මහත්වූ ජඝනස්ථල ඇති ද්‍රෝහෝ නොහොත් මහත්වූ ශිඛර ප්‍රදෙශඇති; ඝන, සාන්ද්‍රවූ හෙවත් මහත්වූ; කොමල, මොලොක්වූ; ගණ්ඩශෛලාඃ, කපොලස්ථල ඇති ද්‍රෝ හෝ නොහොත් මහත්වූ ගල්ඇති; නාර්‍යඃ, ස්ත්‍රීහු; අනුරූපං, කැමැතිසේ නොහොත් තම තමන්ට සුදුසුවූ; අභි වාසං, විසීම; භජන්ති, භජනය කෙරෙත්.

**අත්‍ර, නාර්‍යඃ අනුරූපං, අභිවාසං, භජන්ති**, යනු, මෙහි ක්‍රි- සි. භජන්ති, යනු, වර්ත- ලට්සි, භජ, සෙවායාම්, ධාතුවෙන්, අන්ති, ප්‍රත්‍යයි, **ශෛලසොපස්ථාපිතවූ තුල්‍යයොගිතාලංකාරයි.** එහෙයින්ම උභය විශෙෂණයෙන්, දෙතන්හිම, විභක්ති විපරිනාමවස යෙන් පදයෝජ් යෙදිය යුත්තාහුයි.

41. ඉහ, මේ පර්වතයෙහි; විරලං, තුනීසේ; විකීර්ණ, විසිර්ණවූ හෙවත් පැතුරුණාවූ; වජ්‍රශකලා, වජ්‍රඛණ්ඩඇති; ධෞත, ශ්වෙත වර්ණවූ; කලධෞතමහී, රජතමයබිම්තොම; ජලදෙන, මෙඝයවිසින්; අනතිචිරොජ්ඣිතස්‍ය, එකල මුදහලද්දවූ හෙවත් ශුභ්‍රවූ; චිරස්ථිත, බෝකල්සිටිනාවූ; බහුබුද්බුදස්‍ය, බොහෝදියබුබුළුඇති; පයසඃ, ජලය සම්බන්ධිවූ; සකලාංඅනුකෘතිං, සියලු සදෘශත්වය; විදධාති, කෙරෙයි.

**ඉහ, ධෞතකලධෞතමහී, පයසඃ අනුකෘතිං, විදධාති,** යනු, මෙහි, ක්‍රි- සි. විදධාති, යනු, වර්ත- ලට්සි, විපූර්, ධාඤ්, ධාරණ පොෂණයොඃ ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි, **අතිශයොක්ති අලංකාරයි කුරරීරුතා වෘත්තයි,** කුරරීරුතා, නජභජජල්ගයුත්, යනු තල්ලක්ෂණයි.

42. එකාන්තතඃ, එක්පසෙක්හි හෙවත් රහසෙහි; කාන්තතඃ, වල්ලභයා සමග; සඞ්ගමෙ, සඞ්ගමය ඇතිකල්හි; සුඛංතර්කයන් ත්‍යා, සැපයසලකන්නාවූ හෙවත් විස්‍රබ්ධවිහරණයකැමැත්තාවූ;

43. සංකීර්ණකීචකවනස්ඛලිතෛකබාල-
විච්ඡේදකාතරධියශ්චලිතුං චමර්‍ය්‍යඃ
අස්මින් මෘදුශ්වසනගර්භිතදීයරන්ධ්‍ර
නිර්‍ය්‍යත් ස්වනශ්‍රුතිසුඛාදිව'නොත්සහන්තෙ.

---

ජනෞඝ, ජනයන් හා; සඞ්ගමං, සඞ්ගමය හෙවත් එකතුවීම; වර්ජයන්ත්‍යා, දුරුකරන්නාවූ; සමර, අනඞ්ගයා කරණකොටගෙණ; ආසන්න, ලංවූ; තාපාඞ්ගයා, තැවිලිඇති හෙවත් කාමජ්වර සන්තාප යෙන්යුත් ශරීරාවයව ඇත්තාවූ; සංනත, මොනවට නැමුනු; අපාඞ්ගයා, කටාක්ෂ නිරීක්ෂණ ඇත්තාවූ හෙවත් නෙත්කොණින් බැලීම් ඇත්තාවූ; අනෙකයා, බහුවිධවූ; යොෂයා, ස්ත්‍රීසමූහයා විසින් (මෙහි ජාත්‍යා එකෙහි එකත්වයයි) නොයෙක් ස්ත්‍රීන් විසින් යනු භාවයි එෂ, මේ පර්වතයතෙම; සෙව්‍යතෙ, සෙවිනාලැබේ; (මෙහි ඉවර්ජාවිහරණ ස්ථානයෝ ඇත්තාහයි සේයි)

**අනෙකයා, යොෂයා එෂඃ සෙව්‍යතෙ,** යනු මෙහි, ක්‍රි-සි. සෙව්‍යතෙ, යනු, වර්ත- ලට්සි, සෙවෘ, සෙවනෙ, ධාතුවෙන්, කර්මයෙහි, තෙ, ප්‍රත්‍යයි, **සුග්විනී වෘත්තයි,** රෛශ්චතුර්භිර්‍යුතා, ස්‍රග්විනී, සම්මතා, යනු තල්ලක්ෂණයි.

43. අස්මින්, මේ පර්වතයෙහි; සංකීර්ණ, සංමිශ්‍රණයවූ හෙවත් එකට බැඳුනාවූ; කීචකවන, රනබටවෙනෙහි; ස්ඛලිත, ප්‍රස්ඛලිතවූ හෙවත් පැතුරුණාවූ; එකලොම, එක් රෝමයක්හුගෙ; විච්ඡේද, සිඳීමෙන් හෙවත් කැඩීමෙන්; කාතර, දිනවූ හෙවත් බැගෑපත්වූ නොහොත් බියපත්වූ; ධියඃ, බුඞිඇත්තාවූ; චමර්‍ය්‍යඃ, සෙමරු; මෘදුශ්වසන, මන්දමාරුතය; ගර්භ, ගැබෙහි ඇති; තදීයරන්ධ්‍ර, ඒ රනබට සම්බන්ධවූ සිදුරුවලින්; නිර්‍ය්‍යත්, නික්ම යන්නාවූ; ස්වනශ්‍රුති, හඬසම්බන්ධශ්‍රුතියෙන්වූ හෙවත් හඬඇසීමෙන්වූ; සුඛාත්ඉව්, සැපය හෙතුකොටගෙණ මෙන්; චලිතුං, සැලෙන්ට හෙවත් නැගීයන්ට; නඋත්සහන්තෙ, උත්සාහ නොකෙරෙත්.

**අස්මින්, චමර්‍ය්‍යඃ, සුඛාදිව, චලිතුං, නඋත්සහන්තෙ,** යනු, මෙහි, ක්‍රි- සි. නඋත්සහන්තෙ, යනු, වර්ත- ලට්සි, නඤ්, උත්, පූර්ව, සහ, මර්ෂණෙ, ධාතුවෙන්, අන්තෙ, ප්‍රත්‍යයි, **ගෙහාත්ප්‍රෙක්ෂාලංකාරයි,** සංකීර්ණාශ්චතෙ, කීචකාශ්චෙති= තෙෂාම්, වනං= ස්ඛලිතස්ඩතත්, බාලශ්චෙති= සංකීර්ණකීචකවනෙ, ස්ඛලිතබාලං= තස්‍යවිච්ඡේදඃ= තස්මාත් කාතරා (ත්‍රස්තා) ධීර්‍යාසාම්තාඃ, මෘදුශ්වාසෞ ශ්වසනශ්චෙති= මෘදුශ්වසනො'ගර්භේයෙෂාම්තෙ= තස්‍ය ඉදම් තදීයම් (තානි

44. මුක්තං මුක්තාගෞරමිහ ක්ෂීරමිවාභ්‍රෛ-
ර්වාපීෂ්වන්තර්ලීනමහානීලදලාසු-
ශස්ත්‍රීශ්‍යාමෛ'රංශුභි'රාශු ද්‍රුත'මම්භ-
ශ්ඡායාමච්ඡාමෘච්ඡති නීලීසලිලස්‍ය.

45. යා න යයෞ ප්‍රිය මන්‍යවධූභ්‍යඃ
සා රතරාගමනා යත මානම්,
තෙන සහෙහ බිභර්ති රහඃ ස්ත්‍රී
සා රතරාගමනායතමානම්

---

ත්‍රාදීයානි) මෘදුශ්වසනගන්ධීනිව තානි තදීයරන්ධ්‍රාණිචෙති = තෙභ්‍යඃ නිර්යත්=මෘදුශ්වසනගන්ධිතදීයරන්ධ්‍ර නිර්ගච්ඡාසෞ ශ්වසනශ්චෙති=තස්‍ය ශෘති =තයා (ජිතංයත්) සුඛං, තස්මාත්, යනු සමාසවාක්‍යයි.

44. ඉහ, මේ පර්වතයෙහි; අන්තර්ලීන, ඇතුලත සැඟවුණාවූ; මහානීලදලාසු, ඉන්ද්‍රනීලමාණික්‍යඛණ්ඩඇති; වාපීෂු, වැව්වල; අභ්‍රෛඃ, මේඝවලින්; මුක්තං මුක්තවූ හෙවත් වර්ෂණය කරණලද; මුක්තාගෞරං, මුතුසේ ගෞරවර්ණවූ හෙවත් ශුභ්‍රවූ; ක්ෂීරංඉව, එහෙයින්ම කිරිමෙන් සිටියාවූ; ශස්ත්‍රීශ්‍යාමෛඃ, ඡුරිකාවන් හෙවත් කිරිච්චිමෙන් සම්වන්වූ; අංශුභිඃ, රශ්මිවලින් හෙවත් ඇතුලත සිටිනා ඉඳුනිල්මිණි කැලුම්වලින්; ආශු, වහා හෙවත් එකෙණෙහිම; ද්‍රුතං, පැතිරගන්නා ලද්දවූ; අම්භඃ, ජලයතෙම; නීලීසලිලස්‍ය, අවරිකොළයුෂ සම්බන්ධිවූ; අච්ඡාම්. නිර්මලවූ හෙවත් ප්‍රසන්නවූ; ඡායාම්, කාන්තියට; ඍච්ඡති, පැමිණෙයි හෙවත් අවරියකොල යුෂවැනි ශොභාවට පැමිණෙයි.

**අභ්‍ර, අම්භඃ, අච්ඡාම්, ඡායාම්, ඍච්ඡති**, යනු, මෙහි, ත්‍රි- සි. ඍච්ඡගතෞ ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයයි, ('තීදශීඝාලංකාර සංකීර්ණ', පදඇති හෙතුක, **කාවෑලිඞ්ගා ලඞ්කාරයි**, මත්තමයූර වෘත්තයි) 'වෙදෛ' රන්ධ්‍රෛඃ, ම්භෞ, යසගා, මත්තමයූරම් යනු තල්ලක්ෂණයි.

45. ඉහ, මේ පර්වතයෙහි; අන්‍යවධූභ්‍යඃ, අන් අඟනන්ටවඩා, සාරතරාගමනා, ඉතා සාරවූආගමනඇති හෙවත් පැසසියයුතු සඞ්ගමඇති; යා, යම් අඟනක්තොමෝ; යතමානං, තමන් පැමිණීම පිණිස ප්‍රයත්නකරන්නාවූ; ප්‍රියං, වල්ලභයාකරා; නයයෞ, නොගියාද; සාස්ත්‍රී, ප්‍රතිකූලවූද ඒ ස්ත්‍රීතොම; රහඃ, අප්‍රකාශයෙහි හෙවත් අප්‍රකාශයේ; තෙනසහ, ඒ ප්‍රියයා සමග; අනායතමානම්, දික්වූමාන නැතිසේ හෙවත් දික්වූ කෝපනැතිසේ; රතාරාගං, සුරතාභිලාෂය; බිභර්ති, ධරයි.

46\. භින්නෙෂු රත්නකිරණෛඃ කිරණේෂ්විහෙන්දො
රුච්චාවචෛරුපගතෙෂු සහස්‍රසංඛ්‍යාම්,
දෙෂා'පි නූනමහිමාංශු'රසෞ කිලෙති
ව්‍යාකොචකොකනදතාං දධතෙ නලින්‍යඃ.

47\. අපශඞ්කමඞ්කපරිවර්තිනො විතාශවලිතාඃ
පුරඃ පතිමුපෙතුමාත්මජාඃ,
අනුරොදිතිව කාරුණෙන පත්‍රිණාං
විරුතෙන වත්සලතයෙෂ නිම්නගාඃ.

---

**ඉන, යා, ප්‍රියං, හා, යාසෑ, යනුද, සා, ජහඃ, තෙනසඟ, රත රාගං, බිභර්ති,** යනුද, මෙහි, ක්‍රි- යි. නයසෞ, යනු, පරොක්‍ෂලිට්යි, තස්ප්‍රුති, යා, ප්‍රාපණෙ, ධාතුවෙන්, ණප්, ප්‍රත්‍යයි, ආතො, ණප්, ඖ, ච, යනුවෙන්, ඖ ආදෙශයි, අන්‍යාශ්වතාඃ වධවශ්වති = (තාභ්‍යඃ) සාරතරං (ශ්‍රෙෂ්ඨාගමනං) යස්‍යාඃසා= රතෙ, රාගඃ රත රාගඃ (තම්) තඅායතමානම්, අතායතමානං, යනු, සමාස වාක්‍යයි; **සමනාසොක්ති නම් ජගවද ලංකාරයි. දෙධකවෘත්තයි,** දෙධක වෘත්තමිදං, භභභා, ගෞ, යනු, තල්ලක්‍ෂණයි.

46\. ඉහ, මේ පර්වතයෙහි; ඉන්දොඃ, චන්ද්‍රයාගෙ; කිරණේෂු, රශ්මීන්; උච්චාවචෛඃ, කුදුමහත්වූ; රත්නකිරණෛඃ, මාණික්‍යරශ්මීන් හා; භින්නෙෂු, සංමිශ්‍රණයවූ කල්හි (මුසුවූකල්හි යයි සේයි); සහස්‍ර සංඛ්‍යාම්, එසෙයින්ම සහස්‍රසංඛ්‍යාවට; උපගතෙෂු, පැමිණිකල්හි; නලින්‍යඃ, පද්මිනීහු හෙවත් පද්මතඩාගයෝතුමූ; අසෞ, මේ පෙනෙන්නේ; අහිමාංශුඃකිලඉති, සූර්යායයි; දොෂාඅපි, රාත්‍රියෙහිදු; ව්‍යාකොචකොකනදතාම්, පිපි පියුම් ඇතිබව; දධතෙ, ධරත් යයි; නූනම්, ඒකාන්තයි (**උත්ප්‍රෙක්‍ෂායි**) (මෙහි දොෂාපි, යන තන්හි, දොෂා, යනු සප්තම්‍යර්ථයෙහි,-නිපාතයෙකි.)

**ඉහ නලින්‍යඃ, දොෂාපි, ව්‍යාකොචකොකනදතාං, දධතෙ,** යනු මෙහි, ක්‍රි- යි. දධතෙ, යනු වර්ත- ලට්යි, ධාඤ්, ධාරණපොෂණයොඃ, ධාතුවෙන්, අන්‍තෙ, ප්‍රත්‍යයි, ආතො'න්තා'දන්තඃ, යනුවෙන් අන්ත්, යන්හට, අත්, ආදෙශයි, **අතිශයොක්ති ප්‍රෙක්‍ෂා භ්‍රාන්ති මත් අලංකාරයි.**

47\. අපශඞ්කං, නිසැකව; අඞ්කපරිවර්තිනොචිතාඃ, අඞ්කපරිවර්තනයන්හි පුරුදුවූ හෙවත් ඔඩොක්කුලිහිම්හි පුරුදුවූ; පතිං, හිමියා කරා; උපෙතුං, එලඹෙන්ට; පුරඃ, ඉදිරියට; වලිතාඃ, ගියාවූ; ආත්මජාඃ, සවසම්භවවූ හෙවත් දූහිතෘවූ; නිම්නගාඃ, ගඞ්ගාවන්ට අනුව;

48. මධුකරවිටපානමිතාස්තරූ
පඞ්ක්තිර්බිභ්‍රතො'ස්‍ය විටපානමිතාඃ,
පරිපාකපිශඞ්ගලතාරජසා
රොධශ්චකාස්ති කපිශං ගලතා.

---

කාරුණ්‍යෙන, බැගෑපත්වූ; පත්‍රිණාං, පක්ෂීන්ගෙ; විරුතෙන, විරාව යෙන් හෙවත් හඬලන ශබ්දයෙන්; එෂඃ, මේ රෛවතක නම්වූ පර්වතය තෙම; වත්සලතයා, වාත්සල්‍යයෙන් හෙවත් සෙනහය කරණ කොටගෙණ; අනුරොදතීව, අඬන්නාක් මෙන්; (හඬගාවන්ට අනුව ශබ්ද පවත්වන්නාක්මෙනිසි සේසි.)

**එෂඃ, වත්සලතයා, අනුරොදිති. ඉව.** යනු මෙහි, ක්‍රි- සි. අනු රොදිති, යනු, වර්ත- ලට්සි, අනුපූර්ව, රුදිර්'ශ්‍රුවිමොචනෙ නොහොත්, රුද, රොදනෙ, ධාතුවෙන්, තිප් ප්‍රත්‍යසි, ඉව යනු, උපමාර්ථාව්‍යයසි.

48. මධුකර, භෘඞ්ගනමැති; විට, ධූර්තයන්ගෙ; පානං, පීමට හෙවත් සිඹීමට; ඉතාඃ, පැමිණියාවූ; විටපානමිතාඃ, වෙළෙප්වලින් හෙවත් ශාඛා විස්තාරවලින් හාත්පසින් නැමුනාවූ; තරුපඞ්ක්තිඃ, වෘක්ෂපඞ්ක්තින්; බිභ්‍රතඃ, ධරන්නාවූ; අස්‍ය, මේ පර්වතයාගෙ; රොධඃ, නිතම්බ ප්‍රදෙශතෙම; ගලතා, ගිලිහී වැටෙන්නාවූ; පරිපාක, මේරීමෙන්; පිශඞ්ග, පිඟුවන්වූ; ලතාරජසා, වැල්සම්බන්ධ මල්රේණින්; කපිශං, පිශඞ්ගවර්ණය හෙවත් පිඟුවන් පැහැය; චකාස්ති, ප්‍රකාශ කෙරෙයි.

**අස්‍ය, රොධඃ, කපිශං, චකාස්ති,** යනු, මෙහි, ක්‍රි- සි චකාස්ති යනු, වර්ත- ලට්සි, කාසෘ, දීප්තෞ, ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යසි, මධු, කුර්වන්තීති, මධුකරාඃ, මධුකරා එව විටාඃ= තෙෂාම්, පානං, (චුම්බනං) තරූණාම්, පඞ්ක්ත්‍යඃ,= (තාඃ) විටපෛඃ ආනමිතාඃ, විටපානමිතාඃ (තාඃ) පිශඞ්ගීශ්ච, තාඃ, ලතාශ්චෙති= පරිපාකෙන, පිශඞ්ගිලතාඃ= තාසාම්, රජඃ, (තෙන) යනු, මෙහි, සමාස වාක්‍යයි, **රූපක ලඞ්කාරයෝක්ති සංකීර්ණයි.**

**ආශීගිතියි,** (අඩෙ, වසුගණආශීාගිතිඃ, යනුද)
'ආශීා, ද්වීතීයං යදි, ගුරුණෛකෙනාධිකෙන, නිධනෙ, යුක්තං,
ඉතරත්‍ර්‍යාවත්‍ර්‍ර්‍යා බිලංදලං, යදීයමුදිතෙය, මාශීාගීතිඃ,
යනුද තල්ලක්ෂණයි.

49. ප්‍රාග්භාගතඃ පතදි‘භෙද’මුපත්‍යකාසු
ශෘඞ්ගාරිතායතමහෙභකරාභමභ්‍රඃ,
සංලක්ෂ්‍යතෙ විවිධරත්නකරානුවිද්ධ
මූර්ධ්වප්‍රසාරිතසුරාධිපචාපචාරුඃ.

50. දධති ච විකාසවිචිත්‍රකල්ප
ද්‍රුමකුසුමෛරභිගුම්ඵිතානිවෛතාඃ,
ක්ෂණමලඝුවිලම්බිපිච්ඡදම්නඃ
ශිඛරශිඛාඃ ශිඛිශෙඛරානමුෂ්‍ය.

---

49 ඉහ, මේපර්වතයෙහි; ප්‍රාග්භාගතඃ, ඉදිරිපෙදෙසින් හෙවත් උඩපෙදෙසින්; උපත්‍යකාසු, යටපෙදෙස්හි; පතත්, වැටෙන්නාවූ; ශෘඞ්ගාරිත, සටගත් සිඳුරාදි ශෘඞ්ගාරඇති හෙවත් හටගත් අබරණ ඇති; ආයත, දිගිවූ; මහෙභ, මහත් ඇතෙකුගෙ; කරාභං, සොඬ වැනි ශෝභාඇති; විවිධ, නන්වැදෑරුම්වූ; රත්නකරානුවිද්ධං, මිණි රුවන් සම්බන්ධවූ රශ්මිවලින් රඳනාලද; ඉදම්අභ්‍රඃ, මේ ජලයහෙම; ඌර්ධ්වප්‍රසාරිත, උඩට දිගුකරණලද; සුරාධිපචාපචාරුඃ, දෙව්දුන්නමෙන් මනහරවූයේ; සංලක්ෂ්‍යතෙ, සලකනුලැබේ.

**ඉහ (පර්වතෙ) අභ්‍රඃ, ඌර්ධ්වප්‍රසාරිත සුරාධිපචාපචාරුඃ සංලක්ෂ්‍යතෙ,** යනු, මෙහි ක්‍රි-සි. සංලක්ෂ්‍යතෙ, යනු, වර්ත- ලට්සි, සම් පූර්වලක්ෂ, දර්ශනෙ, අඞ්කනෙ, ච, යන ධාතුවෙන් කර්මයෙහි තෙ, ප්‍රත්‍යයි, **අතිශයෝක්ති** නොහොත් **අභූතොපමාලංකාරයි**.

50 අමුෂ්‍ය, මේ පර්වතයාගෙ; එතාඃශිඛරශිඛාඃ, මේ ශෘඞ්ග නමැති කෙශපාශයෝ; විකාසත්, පුබුදින්නාවූ; විචිත්‍ර, විසිතුරුවූ; කල්පද්‍රුමකුසුමෛඃ, කප්රුක්මල්වලින්; අභිගුම්ඵිතාහිඉව, ගොතන ලද්දවුන්මෙන් සිටියාවූ; අලඝු, සැහැල්ලුනොවූ; විලම්බි, එල්බෙන සුලුවූ; පිච්ඡදම්නඃ, පිල්නමැති මල්දම් ඇත්තාවූ; ශිඛිශෙඛරාන්, මොනරුන් නමැති ශෘඞ්ගයන්; ක්ෂණං, ඇසිල්ලක්; දධතිව ධරත් මැයි (හෙවත් ධරන්නාක්මෙන්තියයි සේයි.)

**අමුෂ්‍ය, ශිඛරශිඛාඃ, ශිඛිශෙඛරාන් ක්ෂණං දධතිච,** යනු මෙහි ක්‍රි-සි. දධති, යනු, වර්තමානලට්සි, ධාඤ්, ධාරණෙ, ධාතුවෙන්, කර්තෘ සාධනයෙහි. අන්ති, ප්‍රත්‍යයි, ආතොනෙතාදන්තඃ, යනුවෙන්, අන්ත්, යන්නට අත් ආදෙශයි, විචිත්‍රාශ්චතෙ කල්පද්‍රුමාශ්චෙති= විකාසන්ත ශ්චතෙ, කල්පද්‍රුමාශ්චෙති = තෙෂාම්කුසුමානි = (තෛඃ) අලඝූනි, විලම්බිනි, (ලම්බමානානිච) පිච්ඡානිඑවදමානි (ස්‍රජෝ) යෙෂුතානි=

51. සවධූකාඃ සුඛිනො'ස්මින්න'නවරතමමරා [illegible]
නාසෙවන්ත රසවන්න නවරත [illegible]

52. ආච්ඡාද්‍ය පුෂ්පපටමෙෂ මහාන්තමන්ත
රාවර්තිභිර්ගෘහකපොතශිරොධරාභිඃ,
ස්වාඞ්ගානි ධූමරුචිමාගුරවං දධානෛ
ධූපායතීව පටලෛර්නවනීරදානාම්.

---

(තාන්) ශිඛරාණි (ශෘඞ්ගානි) එවශිඛාඃ= ශිඛිනඃ (යොනිනඃ) එව ශෛඛරාඃ = (තාන්) යනු සමාස වාක්‍යයි, **රූපකෝත්ප්‍රෙක්ෂා සංකරයි, පුෂ්පිතාග්‍රාවෘත්තයයි**- තල්ලක්ෂණය පූර්වොක්තාමැයි.

51 අස්මින්, මේ පර්වතයෙහි; අනවරතම්ං, අවරතව නොවූ හෙවත් අති ශ්‍රෙෂ්ඨවූ; මන්දරාගත, මන්දර පර්වතයට පැමිණියාවූ; අමරසදෘශඃ, දෙවියන් හා සමානවූ; අමන්දරාග, අතිරක්තවූ; තාම්රස, තඹුරුවැනිවූ; දෘශඃ, ඇස්ඇති; සුඛිනඃ, සම්භොගසැප ඇත්තාහු; සවධූකාඃ, ප්‍රියාවන් සහිතවූවාහු; රසවත්, අනුරාග රසසහිතවූ; නව රතං, නූතනසුරතය හෙවත් අභිනව මෛථුනය; නසෙවන්තෙ'න, නහමක් සේවනය නොකෙරෙත් (සේවනය කොරත්මැයි සේයි)

**අස්මින, සවධූකාඃ, සුඛිනඃ, නවරතං නාසෙවන්තෙ'න**, යනු මෙහි ක්‍රි- යි. නසෙවන්තෙ, න, යනු, ආඥාන්ත නාඞ් නිපාත ප්‍රයුක්ත වර්තමාන ලට්යි, සෙවෘ, සෙවනෙ, ධාතුවෙන්, අනෙන, ප්‍රත්‍යයයි,(මෙහි, සංභාව්‍යනිෂෙධනිවර්තනාය හෙයින්) 'සංභාව්‍යනිෂෙධ නිවර්තනෙ' වෙද, ප්‍රතිෂෙධෙව, යනු, වාමනොක්තියි, **උපමාලංකාරයි, ආර්‍යාගීතියි**- තල්ලක්ෂණය, පූර්වොක්තයි.

52. **එෂඃ**, මේ **පර්වතයතෙම**; මහාන්තං, මහත්වූ; පුෂ්පපට, මල් නමැති වස්ත්‍රය; ආච්ඡාද්‍ය, ඇඳ හෙවත් වසාගෙණ; අන්තඃආව ර්තිභිඃ, පුෂ්පපටලයතුල භ්‍රමනයකරන්නාවූ; ගෘහකපොත, (ගෙහි) පරෙවියන්ගෙ; ශිරොධරාභිඃ, ග්‍රීවාසම්බන්ධිවූ කාන්තිවැනි කාන්ති ඇති; ආගුරවං, කළුඅගිල් සම්බන්ධිවූ; ධූමරුචිං, ධූමකාන්තිය හෙවත් කළුඅගිල් ධූමවැනි කාන්තිය; දධානෛඃ, ධරන්නාවූ; නවනීරද නාම්, අභිනව මෙඝයන් සම්බන්ධිවූ; පටලෛඃ, පටලවලින්; ස්වාඞ්ගා නි, ස්වකියාවයවයන්; ධූපායතීව, ධූපායනය කරන්නාක් මෙනි; (දුම්ගසන්නාක්මෙන් වීයයි සේයි.)

53. අන්‍යොන්‍යව්‍යතිකරචාරුභිර්විචිත්‍රෛ
රත්‍රස්තනවමණිජන්මභිර්මයූඛෛඃ,
විස්මෙරාන් ගගනසදඃ කරොත්‍යමුෂ්මි
න්නාකාශෙ රචිත'මභිත්ති චිත්‍රකර්ම.

54. සමීරශිශිරඃ ශිරඃසු වසතාං
සතාං ජවනිකා නිකාමසුඛිනාම්,
බිභර්ති ජනයන්නයං මුදමපා
මපායධවලා බලාහකතතීඃ.

---

**එෂඃ, නවනිරද්‍රනාම්, පටමඩලඃ, ධූපායති, ඉව**, යනු, මෙහි ක්‍රි–යි. ධූපායති, යනු, වර්තමාලවිසි, ධූප, සන්තාපෙ, ධාතුවෙන්, 'ගුපූධූපවිච්ඡපණිපනිභ්‍යඃ ආයඃ' යනුවෙන් ආය ප්‍රත්‍යය හා තිප් ප්‍රත්‍යයි, **උත්ප්‍රෙක්ෂාරූපක උපමානිදර්ශන සංකීර්ණයි**

53. අමුෂ්මින්, මේ පර්වතයෙහි; අන්‍යොන්‍ය, ඔවුනොවුන්ගෙ; ව්‍යතිකර, මිශ්‍රණයෙන්; චාරුභිඃ, මනහරවූ; විචිත්‍රෛඃ, (එහෙයින්ම) විසිතුරුවූ හෙවත් නානාවර්ණ ඇති; අත්‍රස්නත්, ත්‍රසනනොවන්නාවූ හෙවත් ත්‍රාසදෝෂයෙන් දූෂිතනොවන්නාවූ; නවමණිජන්මභිඃ, අභිනවමැණික්වලින් ඉපදීම් ඇත්තාවූ; මයූඛෛඃ, රශ්මිවලින්; ආකාශෙ, අහස්හි; රචිතං, කරණලද; අභිත්ති, බිතුරහිතවූ; චිත්‍රකර්ම සිතුවම් තෙම; ගගනසදඃ, ආකාශචාරීන්; විස්මෙරාන්කරොති, මවි තාවන සුල්ලන් කෙරෙයි.

**අමුෂ්මින්, චිත්‍රකර්ම, ගගනසදඃ, විස්මෙරාන්, කරොති**, යනු, මෙහි, ක්‍රි–යි. කරොති යනු, වර්ත–ලවිසි, ඩුකෘඤ්, කරණෙ ධාතු වෙන්, තිප්, ප්‍රත්‍යයි, **භ්‍රාන්තිමදලංකාර විභාවනා සංකරයි**.

'කාරණෙන, විනා, කාර්‍යොත්පත්තිඃ, ස්‍යාද්විභාවනා' යනු තල්ලක්ෂණයි, **ප්‍රහර්ෂිණී වෘත්තයි, ම්නෞ, ජ්‍රෞ, ගස්ත්‍රිදශයතිඃ** ප්‍රහර්ෂිණීයම්–යනු වෘත්තරත්නාකරගත ලක්ෂණයි.

54. සමීරශිශිරඃ, වාතයකාරණකොටගෙණ සිහිල්වූ; ශිරඃසු, ශිඛර ප්‍රදෙශයන්හි; වසතාං, වාසයකරන්නාවූ; නිකාමසුඛිනාම්, අතිශයින් සැපඇත්තාවූ; සතාං, සාධූන්ට; මුදං, සන්තොෂය ජන යන් උපදවන්නාවූ; අයං, මේ පර්වතය තෙම; අපාම්, දියසම්බන්ධිවූ; අපායධවලා. අපගමයෙන් ධවලවූ හෙවත් ජලනිගීමනාදියෙන් ධවලවූ; බලාහකතතීඃ, මේඝ පඞ්ක්තීන්; ජවනිකාඃබිභර්ති, ජවනිකා

55. මෛත්‍ර්‍යාදිචිත්තපරිකර්මවිදො විධාය
ක්ලෙශප්‍රහාණ'මිහ ලබ්ධසබීජයොගාඃ,
ඛ්‍යාතිං ච සත්ත්වපුරුෂාන්‍යතයාධිගම්‍ය
වාඤ්ඡන්ති තාම'පි සමාධිභෘතො නිරොද්ධුම්.

---

වන් හෙවත් කඩතුරාවන් කෙරෙයි. (අනාවෘතවූද පර්වතශිඛරයන්හි ක්‍රීඩනයෙහි මේඝයන් කරණකොටගෙණම ආවරණභාවයට පැමිණ ප්‍රීතිය උපදවයි සේයි.)

**අයම්, වලාහකඃ, ජවනිකාඃ, බිභර්ති,** යනු, ක්‍රි- යි. බිභර්ති, යනු වර්ත-ලට්යි, ඩුභෘඤ්, ධාරණපොෂණයොඃ, ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි, **පරිණාමාලංකාරයි. ජලොද්ධතගති නම් ඡන්දසයි.** රසෙජ්සජසා, ජලොද්ධතගතිඃ, යනු, තල්ලක්ෂණයි.

55. ඉහ, මේ පර්වතයෙහි; සමාධිභෘතඃ, සමාධිය ධරන්නාහු හෙවත් යෝගීහු; මෛත්‍ර්‍යාදි, මෛත්‍රිය ආදිකොට ඇත්තාවූ; චිත්තපරිකර්මවිදඃ, චිත්ත සම්බන්ධිවූ පිරියම් ලබන්නාහු; ක්ලෙශප්‍රහාණම්, රාග ද්වෙෂාදී කෙලෙසුන් නැසීම; විධාය, කොට; ලබ්ධ, ලබන ලද්දාවූ; සබීජයොගාඃ, ආලම්බනසහිත යොගඇත්තාහු; සත්ත්වපුරුෂ, ප්‍රකෘති පුරුෂ යන දෙදෙන සම්බන්ධිවූ; අන්‍යතයා, අන්‍යභාවයෙන් හෙවත් ප්‍රකෘතිය පුරුෂය යන දෙදෙනාගෙන් වෙන්ව බිඳුනුබැවින්; ඛ්‍යාතිංච, ප්‍රසිද්ධියද හෙවත් ඥානයද; අධිගම්‍ය, විඳිනයකොට හෙවත් ලබාගෙණ; (ප්‍රකෘතිය පුරුෂය යන දෙදෙනාගෙන් වෙනව වට දැනගෙණ යි සේයි) තාං, ඒ ඛ්‍යාතියද හෙවත් ප්‍රකාශයද; නිරොද්ධුම්, වලකන්ට; වාඤ්ඡන්ති, කැමතිවෙත්; (ඒ ප්‍රසිද්ධිය තවතා තෙමේම ප්‍රකාශත්වයෙන්; පවසන්ට කැමැත්තේයයි සේයි.)

**ඉහ, සමාධිභෘතඃ, ඛ්‍යාතිං, ච, අධිගම්‍ය, තාං, නිරොද්ධුම් වාඤ්ඡන්ති,** යනු, මෙහි, ක්‍රි- යි. වාඤ්ඡන්ති, යනු වර්ත- ලට්යි, වඡි, කාමෙ, ධාතුවෙන්; අන්ති, ප්‍රත්‍යයි, මෛත්‍රිආදිශේෂාම්, තානි, චිත්තස්‍ය පරිකර්මාණි = මෛත්‍ර්‍යාදීනිච තානි, චිත්තපරිකර්මාණිචෙති= තානි, විදන්ති, ලභන්තෙ, ඉති = මෛත්‍රී, කරුණා, මුදිතා, උපෙක්ෂෙති චතස්‍රශ්චිත්තවෘත්තයඃ, තත්‍ර. පුණ්‍යකෘත්සු, මෛත්‍රී, දුඃඛිෂු කරුණා. සුඛිෂු, මුදිතා, (අනුමොදනං,) පාපිෂු, උපෙක්ෂා, යනු, ටීකායි (භාවය සුබොධයි) පුරුෂං, ක්ලිශ්‍යන්තීති ක්ලෙශාඃ, අවිද්‍යා ස්මිතාරාග ද්වෙෂාභිනිවෙශාශ්චෙති පඤ්චක්ලෙශාඃ, තත්‍රානිත්‍යෙෂු, නිත්‍යත්වාභිමානඃ, අනාත්මනිච දෙහෙන්ද්‍රියාදවාත්ම ධිරිත්‍යා දිවිද්‍යා මො'ඥා අස්මිතා, අහංකාරඃ, රාගො'භිමතවිෂයාභිලාෂඃ, ද්වෙෂො

56\. මරකතමයමේදිනීෂු භානෝඃ
තරුවිටපාන්තරපාතිනෝ මයූඛාඃ,
අවනතශිතිකණ්ඨකණ්ඨලක්ෂ්මී
මිහ දධති ස්ඵුරිතාණුරේණුජාලාඃ.

57\. යා බිභර්ති කලවල්ලකීගුණ
ස්වානමානමතිකාලිමාලයා,
නාත්‍ර කාන්තමුපගීතයා තයා
ස්වානමා නමති කාලි'මාලයා.

---

නාභිමතෙෂු, රොෂඃ, අභිනිවෙශඃ, කාඞ්ක්ෂායේ ස්වාග්‍රහඃ, යනුද ටීකාගතයි; ක්ලෙශානාම්, ප්‍රහාණිම්, (ක්ෂයඃ) ක්ලෙශප්‍රහාණිම්, ලබ්ධඃ, සබීජඃ (සාවලම්බනො) යොගො, යෛයෙසො= අභ්‍යාසස්‍ය, භාවො තස්‍යතා. සත්වංච, පුරුෂශ්ච, සත්වපුරුෂෞ, තයො'රන්‍යතා,= (තයා) සමාධිං, බිභ්‍රතීති, සමාධිභෘතඃ, යනු විග්‍රහවාක්‍යයි. **සම්භාවොක්තියේ උදාහරණයි.**

56\. ඉහ, මේ පර්වතයෙහි; මරකතමයමෙදිනීෂු, මරාමිණිමුවා බිම්හි; තරුවිටපාන්තර, රුක්වෙළෙප් අතරෙන්; පාතිනඃ, වැටෙන්නාවූ; ස්ඵුරිත, ව්‍යාප්තවූ හෙවත් පැතුරුණාවූ; අණුරේණුජාලාඃ, සියුම්වූ ධූලිරාශිඇති; භානොඃ, සූර්‍ය්‍යාගෙ; මයූඛාඃ, රශ්මිහුතුම්; අවනත නැමුනාවූ; ශිතිකණ්ඨකණ්ඨලක්ෂ්මීඃ, මයූරග්‍රීවාසම්බන්ධිවූ ශෝභාව; දධති, ධරත්.

**ඉහ. මයූඛාඃ, අවනතශිතිකණ්ඨකණ්ඨලක්ෂ්මීං, දධති,** යනු මෙහි, ක්‍රි- සි. දධති, යනු, වතී- ලට්සි, ධාඤ්, ධාරණපොෂණයොඃ යන ධාතුහු කෙරෙන්, අන්ති, ප්‍රත්‍යයි, අන්ත්, යන්තට, අත්, යනා දෙශයි. **නිදර්ශනාලංකාරයි, පුෂ්පිතාග්‍රාවෘත්තයි.**

57 අත්‍ර, මේ පර්වතයෙහි; අතිකාලිමා, අතිශයින් කෘෂ්ණත්වය ඇති; අලයා, අවස්ථිතිරහිතවූ හෙවත් සිටීමක් නැතිව භ්‍රමනය කරන්නාවූ; යා, යම්බඳුවූ; අලිමාලා, භෘඞ්ගශ්‍රෙණියක්තොම කල අව්‍යක්ත මධුර නාදඇති; වල්ලකීගුණස්වානමානං, වීණාවක් සම්බන්ධිවූ තන්ත්‍රිශබ්දයට සමාන භාවය; බිභර්ති, ධරත්; උපගීතයා, සමීපයෙහි ගායනයකලාවූ; තයාඅලිමාලයා, ඒ භෘඞ්ගමාලාව කරණකොටගෙණ; ස්වානමා, පහසුවෙන් නුමූත් නමන්ට හැකිවූ; කා, කිනම් අඟනක් නොමෙෝ; කාන්තං, වල්ලභයා; නනමති, නොනම සිද; හැම අඟනෝම යෞවනාභිමානය හැරදමා එකාණෙහි හිමියන් වෙත නැමෙතිසි සේයි.)

58. සායං ශශාඞ්කකිරණාහතචන්ද්‍රකාන්ත
නිස්‍යන්දිනීරනිකරෙණ කෘතාභිෂේකාඃ,
අර්කෝපලෝල්ලසිතවහ්නිභි'රහ්නිතප්තා
ස්තීව්‍රං මහාව්‍රත'මිවාත්‍ර චරන්ති වප්‍රාඃ.

59. එතස්මින්නධිකපයඃ ශ්‍රියං වහන්ත්‍යඃ
සංක්ෂෝභං පවනභුවා ජවෙන නීතාඃ,
වාල්මීකෙරරහිතරාමලක්ෂ්මණානාං
සාධර්ම්‍යං දධති ගිරාං මහාසරස්‍යඃ.

---

**අත්‍ර, අලිමාලා, කලවල්ලකිගුණ ස්වානමානං, බිභර්ති,** යනුද, **කා, ස්වානනං, නනම්ති,** යනුද, මෙහි, ක්‍රි- යි. බිභර්ති, යනුද, න, නමති, යනුද, වර්ත- ලට්හුයි, බිභර්ති, යනු, භෘඤ්, ධාරණ පොෂණයොඃ, ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි, න, නමති, යනු, නඤ්, ප්‍රහ්‍වත්වෙ, ධාතුවෙන් තිප්, ප්‍රත්‍යයි, **ස්වභාවොක්තියි. රථෝද්ධතා නම් වෘත්තයි,** රෝ, නරාවිති, රථෝද්ධතා, ලගෞ, යනු- තල්ල ක්ෂණයි.

58. අත්‍ර, මේ පර්වතයෙහි; වප්‍රාඃ, පර්වතසානුහුනූමු; සායං, සවස් භාගයෙහි; ශශාඞ්කකිරණ, චන්ද්‍රරශ්මීන් කාරණකොටගෙණ; ආහත, තැළුණාවූ; චන්ද්‍රකාන්ත,සඳකාන්තමිණිවලින්; නිස්‍යන්දි,වැස්සෙන්නාවූ; නීරනිකරෙණ, ජලපූරයෙන් හෙවත් දියරැසින්; කෘතාභිෂේකාඃ, කරණලද අභිෂේකය හෙවත් සනාන ඇත්තාහු; අහ්නි, දවල්කාල යෙහි; අර්කෝපල, සූර්‍ය්‍යකාන්තපාෂාණවලින්; උල්ලසිත, උසස්ව නැංගාවූ හෙවත් උසස්ව බබලන්නාවූ; වහ්නිභිඃ, ගිනිවලින්; තප්තාඃ, තැව්නාහු; තීව්‍රං, තියුණුවූ හෙවත් උග්‍රවූ; මහාව්‍රතම්, දුෂ්කරවූ (මහා) ව්‍රතයක්; චරන්තිඉව, හැසිරෙන්නවුන්මෙන් වෙති.

**අත්‍ර, සානවඃ, තීව්‍රං, මහාව්‍රතම්, චරන්ති, ඉව,** යනු, මෙහි, ක්‍රි- යි. චරන්ති, යනු, වර්ත- ලට්යි, චර, ගතිභක්ෂණයොඃ, ධාතුවෙන් අන්ති, ප්‍රත්‍යයි, **උත්ප්‍රෙක්ෂාලඞ්කාරයි.**

59. එතස්මින්, මේ පර්වතයෙහි; අධිකපයඃශ්‍රියම්, අධිකවූ ජල සමෘද්ධිය; වහන්ත්‍යඃ, උසුලන්නාවූ දෝහෝ නොහොත්; අධිකාපයඃ, අධිකවූ සුග්‍රීවාදිකපීන්ඇති; ශ්‍රියං, ගුණාලංකාරාදි ශොභාව; වහන් ත්‍යඃ, උසුලන්නාවූ; පවනභුවා, වායුජන්‍යවූ හෙවත් වාතයෙන් ජනිතවූ; ජවෙන, වේගයෙන්; සංක්ෂෝභං, කැළඹීමට; නීතාඃ, පමුණුවන ලද්දාවූ දෝහෝ නොහොත්; ජවෙන, වේගවත්වූ; පවනභුවා, හනුමත් විසින්; සංක්ෂෝභං, උද්ධතභාවයට; නීතාඃ, පමුණුවනලද්

60. ඉහ මුහුර්මුදිතෛඃ කලභෛ රවඃ
ප්‍රතිදිශං ක්‍රියතෙ කලභෛ රවඃ,
ස්ඵුරති චානුවනං චමරීචයඃ
කනකරත්නභුවාං ච මරීචයඃ.

61. ත්වක්සාරරන්ධ්‍රපරිපූරණලබ්ධගීති
රස්මින්නසෞ මෘදිතපක්ෂ්මලරල්ලකාඞ්ගඃ,
කස්තූරිකාමෘගවිමර්දසුගන්ධි'රෙති
රඞ්ගීව සක්ති'මධිකාං විෂයෙෂු වායුඃ.

---

දවූ; මහාසරස්‍යඃ, මහත් තඩාගයෝතුමූ; අරහිතරුමලක්ෂ්මණානාම්, තොරතොවූ රුම ලක්ෂ්මන් යන දෙදෙනා ඇති දෙහෝ නොහොත් තොරතොවූ විල්ලිහිණියා හා විල්ලිහිණි කිරිල්ලිය ඇති; වාල්මීකෙඃ, වාල්මීකි ඍෂිහුගෙ; ගිරං, වචනයන්ට; සාධර්ම්‍යං, සමාන ධර්ම ඇතිබව; දධති, ධරත්.

**අත්‍ර, සරස්‍යඃ, වාල්මීකෙඃ, ගිරාං, සාධර්ම්‍යම්, දධති,** යනු, මෙහි, ක්‍රි- සි. දධති, යනු, වර්ත- ලට්සි, ධාඤ්, ධාරණෙ, ධාතුවෙන්, අන්ති, ප්‍රත්‍යසි, අන්ත්, යන්නට, අත් යනාදෙශයි, **උපමාලංකාර උභය ශ්ලේෂාලංකාරයි.**

60. ඉහ, මේ රෛවතක පර්වතයෙහි; මුදිතෛඃ, (සෛවරීවිහරණයෙන්) සතුටුවූ; කලභෛඃ, ඇත්පැටවුන් විසින්; ප්‍රතිදිශං, දිශාවක්පාසා; කලභෛරවඃ, මධුරවූද භයජනකවූද; රවඃ, බෘංහණවූ නාදය තෙම; ක්‍රියතෙ, කරණලැබේ; අනුවනං, වනයක්පාසා; චමරීචයශ්ච, සෙමරමුව සමූහයාද; ස්ඵුරති, බබලයි; කනකරත්නභුවාං, රන්රුවන් භූමීන්ගෙ; මරීචයශ්ච, රශ්මීහුද; ස්ඵුරන්ති, බබලත්.

**ඉහ, කලභෛඃ, ප්‍රතිදිශං, රවඃ, ක්‍රියතෙ,** යනුද, **චමරීචයඃ, අනුවනං, ස්ඵුරති,** යනුද, **කනකරත්නභුවාංමරීචයශ්ච, ස්ඵුරන්ති** යනුද, මෙහි, ක්‍රි- සි. ක්‍රියතෙ, ස්ඵුරති ස්ඵුරන්ති, යනු- වර්තමානලට් හුයි- ක්‍රියතෙ, යනු- කෘඤ්, කරණෙ; ධාතුවෙන්- කර්මකාරකයෙහි, තෙ, ප්‍රත්‍යසි- ස්ඵුරති, යනු, ස්ඵුර, සඤ්චලනෙ, ධාතුවෙන් කර්තෘසාධනයෙහි තිප්, ප්‍රත්‍යසි, **යමකාලංකාරයි.**

61. අස්මින්, මේ පර්වතයෙහි; ත්වක්සාර, වංශදණ්ඩයන්ගේ හෙවත් හුණවෘක්ෂයන්ගෙ; රන්ධ්‍රපරිපූරණ, සිදුරු හාත්පසින් පිරීමෙන්; ලබ්ධ, ලබනලද්දවූ; ගීතිඃ, ගායනය ඇති; මෘදිත, මදිනලද්දවූ; පක්ෂ්මල, ලෝමයන් ඇත්තාවූ; රල්ලක, කම්බලනම් මෘග විශෙෂයාගෙ නොහොත් කම්බල වස්ත්‍රයන්ගෙ; අඞ්ගඃ, ශරීර ඇත්තාවූ;

62. ප්‍රීතෛ‍්‍ය යූනාං ව්‍යවහිතතපනාඃ
ප්‍රෞඪධ්වාන්තං දිනමිහජලදාඃ;
දෝෂාමන්‍යං විදධති සුරත
ක්‍රීඩායාසශ්‍රමශමපටවඃ.

63. භග්නො නිවාසො 'යමිහාස්‍ය පුෂ්පෛඃ
සදානතො යෙන විෂාණිනා'ගඃ,
තීව්‍රාණි තෙජෙ'ස්ඩති කොපිතො'සෞ
සදානතො යෙන විෂාණි නාගඃ.

කස්තූරිකාමෘග, කස්තූරි මුවන්ගේ; විමර්දී, වෙසෙසින් ගැටීමෙන්; සුගන්ධිඃ, සුවඳඇත්තාවූ; වායුඃ, වාතයතෙම; රාගීඉව, කාමීජනයෙකු මෙන්; විෂයෙෂු, ප්‍රදෙශයන්හි නොහොත් රූපාදි කාමයන්හි; අධිකාං, අධිකවූ; සක්තිං, ඇලීමට; එති, පැමිණෙයි.

අසක්තිං, වායුඃ, රාගීව, විෂයෙෂු, සක්තිං, එති, යනු, මෙහි, ක්‍රි- සි. එති, යනු, වත්- ලට්යි, ඉණ්, ගතෞ, ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි, **උපමාලංකාරයි.**

62. ඉහ, මේ පර්වතයෙහි; යූනාං, තරුණ තරුණීයන්ගෙ; ප්‍රීතෛ‍්‍ය, ප්‍රීතිය පිණිස; ව්‍යවහිතතපනාඃ, මුවාකළ හිරුඇත්තාවූ; සුරත ක්‍රීඩායාස, රතික්‍රීඩා ව්‍යායාමයෙන්වූ; ශ්‍රමශම, විඩාසංසිඳවීමෙහි පටවඃ, දක්‍ෂවූ; ජලදාඃ, මේඝයෝ; ප්‍රෞඪධ්වාන්තං, ගාඪාන්ධකාරය ඇත්තාවූ; දිනං, දවල්කාලය; දෝෂාමන්‍යං, තමා රාත්‍රියයි සිතන් නකු; විදධති, කෙරෙත්.

(ඉහ, යූනාං, දොෂාවදිවාපි, විස්‍රම්භාඃ; විහාරාඃ, සංභවන්තීති, භාවඃ, යනු, ටීකායි.)

**ඉහ**, **ජලදාඃ**, **දිනං**, **දෝෂාමන්‍යං**, **විදධති**, යනු, මෙහි, ක්‍රි- සි. විදධති, යනු, වත්- ලට්යි, වි, විපූර්ව, ධාඤ්, ධාරණ පොෂණයොඃ, ධාතුවෙන්, අන්ති, ප්‍රත්‍යයි, අන්ත්, යන්නට, ආතොනෙතාදන්තඃ, යනුවෙන්, අත්ආදෙශයි, දෝෂාමන්‍යං, යන තන්හි රාත්‍රිඑවාවිවූ, දෝෂා යන, අව්‍යය උපපදකොටඇති, මන, ඥානෙ, ධාතුහුකෙරෙන්, 'ආත්මමානෙඛශ්ච' යනුවෙන්- ඛස්, ප්‍රත්‍යයි, **උපමාලංකාරයි**, භ්‍රමර **විලසිත නම් වෘත්තයි**, ම්භෞ, න්ලෞ, ගඃ, ස්‍යාත්, භ්‍රමරවිලසිතම්, යනු තල්ලක්‍ෂණයි.

63. ඉහ, මේ පර්වතයෙහි; අස්‍ය, මේ නාගයාගෙ; නිවාසඃ, වාස ස්ථානයවූ; සදා, සැමකල්හි; පුෂ්පෛඃ, මල්වලින්; ආනතඃ, නැමුනාවූ; අයංඅගඃ, මේ වෘක්‍ෂයතෙම; සදානතොයෙන, මද දියසහිතවූ හෙවත් මත්වූ; යෙනවිෂාණිනා,(ශෘඞ්ගවත්වූ හෙවත් දංෂ්ට්‍රාසහිතවූ)

64. ප්‍රාලෙයශීතමචලෙශ්වරමීශ්වරො'පි
සාන්ද්‍රෙභචර්මවසනාවරණො'ධිශෙතෙ,
සර්වර්ද්ධිනිර්වෘතිකරෙ නිවසන්නුපෛති
නද්වන්ද්වදුඃඛමිහ කිංචිදකිංචනො'පි.

65. නවනගවනලෙඛාශ්‍යාමමධ්‍යාභිරාභිඃ
ස්ඵටිකකටකභූභිර්නාටයත්‍යෙෂ ශෛලඃ,
අහිපරිකරභාජො භාස්මනෝ'ර්ධගෞරෛ-
රධිගතධවලිම්නඃ ශූලපාණෙරභිඛ්‍යාම්.

---

යම් ඇතෙකු විසින්; භග්නඃ, බිඳිනලද්දේද; තෙන, ඒ ඇතු විසින්; කොපිතඃ, කෝපයට පමුණුවනලද්දවූ; අසෞනාගඃ, මේ සර්පතෙම; තීව්‍රාණි, දරුණුවූ; විෂාණි, විෂයන්; උජ්ඣති, වමාරයි; (පරප්‍රතීකාර යෙහි අසමර්ථයාගෙ ක්‍රොධයතෙම) ස්වීයාශ්‍රයම නසයි සේයි.

**අසෞ, නාගඃ, විෂාණි, උජ්ඣති,** යනු. මෙහි, ක්‍රි–යි. උජ්ඣති යනු, වර්ත– ලට්සි, උජ්ඣ, ත්‍යාගෙ, ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි.

64. ඊශ්වරඃඅපි, මෙහෙසුරුපවා; සාන්ද්‍ර, ඝනවූ; ඉභචර්ම, ඇත් සම නමැති; වසනාවරණඃ, වස්ත්‍රාවරණය හෙවත් පෙරවීම ඇත්තේ; ප්‍රාලෙයශිතං, පිනිනෙන් සිහිල්වූ; අචලෙශ්වරං, කෛලාශ පර්වත යෙහි; අධිශෙතෙ, වාසයකෙරෙයි; සර්වර්ද්ධිනිර්වෘතිකරෙ, සියලු සත්තුන්හි සුඛදායකවූ; ඉහ, මේ පර්වතයෙහි; නිවසන්, වාසයකරන් නාවූ; අකිඤ්චනඃඅපි, නිර්ධනයා පවා; කිංචිත්, කිසියම්; ද්වන්ද්වදුඃඛං, සීතෝෂ්ණ දුකකට; නඋපෛති, නොපැමිණෙයි.

(අචලෙශ්වරං අධිශෙතෙ, යන තන්හි, අධිශීඞ්ස්ථාසාං කර්ම,යනු වෙන්, ආධාරය, කර්ම සංඥවිය.)

**ඊශ්වරඃඅපි අචලෙශ්වරං, අධිශෙතෙ,** යනුද, **ඉහ අකිංචනඃ, අපි, ද්වන්ද්වදුඃඛං නඋපෛති,** යනුද මෙහි, ක්‍රි–යි. අධිශෙතෙ, යනුද නඋපෛති, යනුද වර්ත– ලට්හුයි, අධිපූර්ව, ශීඞ්, ස්වප්නෙ, ධාතුවෙන් හා– නඤ් උප, පූර්ව, ඉණ් ගතෞ ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි, අත්‍රොපමානාද්ධිමාචලාදුපමෙයස්‍යාධික්‍යවර්ණනාව්‍යතිරෙකඃ, යනු කී හෙයින්, **ව්‍යතිරෙකාලංකාරයි.**

65 **එෂඃ ශෛලඃ,** මේ රෛවතක නම් පර්වතය තෙම; නව, අලුත්වූ; නගවනලෙඛා, තරුවන පඞ්ක්තියෙන්; ශ්‍යාම, සම්වන්වූ හෙවත් නිල්වන්වූ; මධ්‍යාභිඃ, මැදපෙදෙස් ඇත්තාවූ; ආභිඃ, මෙබඳු වූ; ස්ඵටිකකටකභූභිඃ, පළිඟුතීරභූමීන් කාරණකොටගෙණ; අහිපරි කරභාජඃ, සර්පනමැති කැසපට ඇත්තාවූ; භාස්මනෛඃ, භස්මමයවූ

66. දධද්භිරභිතස්තටෞ විකචවාරිජාම්බූනදෛ-
විනොදිතදිනක්ලමාඃ කෘතරුචශ්ච ජාම්බූනදෛඃ,
නිෂෙව්‍ය මධු මාධවාඃ සරසමත්‍ර කාදම්බරම්
හරන්ති රතයෙ රහඃ ප්‍රියතමාඞ්ගකාදම්බරම්.

---

හෙවත් අලුවෙන් කරණලද්දාවූ; අඞ්ගරාගෛඃ අනුලෙපනවලින්; අධිගත, පැමිණියාවූ; ධවලිම්නඃ, සුදුවන්බැව් ඇත්තාවූ; ශූලපාණෙඃ, මෙහෙසුරුගෙ; අභිඛ්‍යාම්, ශෝභාව; නාටයති, පහළ කෙරෙයි; (මෙහෙසුරුගෙ ශෝභාවට සමානවේයයි සේයි)

**එෂඃ ශෛලඃ, ශූලපාණෙඃ, අභිඛ්‍යාම්, නාටයති,** යනු, මෙහි, ක්‍රි- යි. නාටයති යනු, වතී- ලට්යි, නට, භ්‍රංශෙ, ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි, **නිදර්ශනාලංකාරයි.** මාලිනී නම් වෘත්තයි.

"නනමයයයුතෙයං, මාලිනීභොගිලොකෛඃ"

යනු තල්ලක්ෂණයි.

66. අත්‍ර, මේ පර්වතයෙහි; මාධවාඃ මාධවයෝ, එනම් දනව් වැස්සෝ; විකච, විකශිතවූ හෙවත් පිපියාවූ; වාරිජ, පියුම් ඇති; අම්බු, ජලය ඇත්තාවූ; අභිතඃ, හාත්පස හෙවත් දෙපස; තටෞ, ඉව්රුදෙක; දධද්භිඃ, ධරන්නාවූ; නදෛඃ, හ්‍රදවලින් හෙවත් හොය වලින්; විනොදිත, වෙසෙසින් පහකරණලද්දවූ; දිනක්ලමාඃ, දවල් අව්පීඩා ඇත්තාවූ; ජාම්බූනදෛඃ, ස්වර්ණාභරණයෙන්; කෘතරුචශ්ච, කරණලද කාන්ති ඇත්තෝම; සරසං, රස සහිතවූ හෙවත් රස වත්වූ; කාදම්බරං, උක්පැනියෙන් කළාවූ; මධු, මද්‍යය හෙවත් සුරා විශෙෂය; නිෂෙව්‍ය, පානයකොට; රතයෙ, සුරතය පිණිස හෙවත් මෛථුන සෙවනය පිණිස; රහඃ, රහසෙහි; ප්‍රියතමාඞ්ගකාත්, කාන්තාවන්ගෙ ශරීරයෙන්; අම්බරං, වස්ත්‍රය; හරන්ති, අපහරණය කෙරෙත් (පහකෙරෙතියි සේයි.)

**අත්‍ර, මාධවාඃ මධු, නිෂෙව්‍ය රහඃ, රතයෙ, ප්‍රියතමාඞ්ගකාත්, අම්බරං, හරන්ති,** යනු, මෙහි, ක්‍රි- යි. හරන්ති යනු, වතී- ලට්යි, හෘඤ්, හරණෙ, ධාතුවෙන්- අන්ති, ප්‍රත්‍යයි, **රසවද ලංකාරයි. පෘථ්වී වෘත්තයි,**'ජසෞජසයලා, වසුග්‍රහයතිශ්ච, පෘථ්වීගුරුඃ' යනු තල්ලක්ෂණයි.

67. දක්‍ෂිණතිමිලාසු පතිතෙ ඝනතිමිරමුෂි
ජ්‍යොතිෂු රෞප්‍යභිත්තිෂු පුරඃ ප්‍රතිඵලති මුහුඃ,
ව්‍රීඩමසංමුඛො'පි රමණෛ'රපහෘතවසනාඃ
කාඤ්චනකන්දරාසු තරුණීරිහ නයති රවිඃ.

68. අනුකෘතශිඛරෞඝශ්‍රීභි'රභ්‍යාගතො'සෞ
ත්වයි සරභසමභ්‍යුත්තිෂ්ඨතීවාද්‍රිරුච්චෛඃ,
දූතමරුදුපනුන්නෛරුන්නමද්භිඃ සහෙලං
හලධරපරිධානශ්‍යාමලෛ'රම්බුවාහෛඃ.

**ඉති ශ්‍රීමාඝකාව්‍යෙ ශිශුපාලවධෙ**
**මහාකාව්‍යෙ, ශ්‍රයඞ්කෙ,**
**රෛවතක වර්ණනංනාම චතුර්ථඃ සර්ගඃ**

---

67. ඉහ, මේ පර්වතයෙහි; රවිඃ, සූර්‍ය්‍යතෙම; දක්‍ෂිණතිමිලාසු, කැට පත්සේ නිමල්වූ; පුරඃ, ඉදිරියෙහිවූ; රෞප්‍යභිත්තිෂු, රිදීමුවාබිත්තිවල; පතිතෙ, වැටුනාවූ; ඝනතිමිරමුෂි, ගාඪාන්ධකාරය පහකරන්නාවූ; ජ්‍යොතිෂි, රශ්මිය; කාඤ්චනකන්දරාසු, රන්කඳුරුවල; මුහුඃ, එකණෙහි; ප්‍රතිඵලති, ඕ විදුනකල්හි හෙවත් ව්‍යාප්තවූකල්හි; අසංමුඛඃඅපි, තමා නොහමුවූයේද; රමණෛඃ, වල්ලභයන් විසින්; අපහෘතවසනාඃ, පැහැරගන්නාලද හෙවත් අපහරණයකරණලද වස්ත්‍ර ඇත්තාවූ; තරුණීඃ, තරුණාඞ්ගනාවන්; ව්‍රීඩං, ලජ්ජාවට; නයති, පමුණුවයි.

**ඉහ, රවිඃ, අසම්මුඛඃ, අපි, තරුණීඃ** ව්‍රීඩං, **නයති,** යනු මෙහි ක්‍රි- සි. නයති, යනු වර්ත- ලට්යි, නීඤ්, ප්‍රාපණෙ, ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි, දක්‍ෂිණ(තලානි)වත්, නිමීලාඃ, තාසු, ඝනංච, තත්තිමිරංචෙති,= තන්මුෂ්ණාති, හරතීති, ඝනතිමිරමුට්, තස්මින්, රෞප්‍යෙන, නිර්මිතාඃ භිත්තයඃ= තාසු, නසංමුඛො සංමුඛඃ, අපහෘතානි, වසනානි, යාසාම්, තාඃ= කාඤ්චනමයාඃ කන්දරාඃ,= තාසු, යනු, සමාස වාක්‍යයි, **අතිශයොක්ති අලඞ්කාරයි. වංශපත්‍රපතිත වෘත්තයි,** දිඞ්මූනි, වංශපත්‍රපතිතං, භරනභනලගෛඃ, යනු තල්ලක්‍ෂණයි.

68. උච්චෛඃ, උස්වූ; අසෞඅද්‍රිඃ, මේ පර්වතයතෙම; ත්වයි, නුඹවහන්සේ; අභ්‍යාගතෙ, අමුතුව පැමිණිකල්හි; අනුකෘත, සමාන කරණලද; ශිඛරෞඝ, පර්වතකූට සමූහයාගෙ; ශ්‍රීභිඃ, ශෝභාව ඇත්තාවූ; දූතමරුත්, ශීඝ්‍රවාතයෙන්; උපනුන්නෛඃ, මෙහෙයනලද්දාවූ; සහෙලං, ලීලාසහිතව; උන්නමද්භිඃ, උඩට නගින්නාවූ; හලධර, බලභද්‍රයාගෙ; පරිධාන, (යටහඳනා) වස්ත්‍රයසේ; ශ්‍යාමලෛඃ, සම්වන්වූ

හෙවත් නිල්වන්වූ; අම්බුවාහෛඃ, මේඝයන්ගෙන්; සරභසං, වේග සහිතව හෙවත් වේගවත්සේ; අභ්‍යුත්තිෂ්ඨතීඉව, පෙර ගමන්කරන් නාක් මෙන්.

ශ්‍රීමාඝකෘතෞ, ශ්‍රීමත්මාඝ මහාකවිහු විසින් රචනාකරණලද; ශිශුපාලවධෙ, ශිශුපාලවධ නම්ඇති; ශ්‍රාඞ්කෙ, ශ්‍රීඅඞ්කවූ; මහාකාව්‍යෙ, මහාකාව්‍යයෙහි; රෛවතකපර්වතවර්ණනංනාම, රෛවතක පර්වත වර්ණනය නම්වූ; චතුර්ථඃ සර්ගඃ, සිව්වන සර්ගය; ඉති, මෙතෙකින් සමාප්තයි.

**අශෙෂෞ, අද්‍රිඃ, අම්බුවාහෛඃ, සරභසං, අභ්‍යුත්තිෂ්ඨතීඉව**, යනු මෙහි, ක්‍රි- යි. **අභ්‍යුත්තිෂ්ඨති**, යනු, වර්ත- ලට්යි, අභිඋත්පූර්- ෂ්ඨා, ගතිනිවෘත්තෞ, ධාතුවෙන්, තිප්, ප්‍රත්‍යයි.

ශිඛරණාමෙෂඃ= අනුකෘතා ශිඛරෙෂානාම් ශ්‍රියෛසෙන = (තෛඃ) රභසාසහවර්තතඉතිසරභසං, ද්‍රුතශ්වාසෙෂමරුත්වෙති= ද්‍රුත මරුතා උපනුන්නාඃ= තෛඃ) එලයා (ලීලයා) සහවර්තත ඉති, සහෙලං ධරතීති, ධරඃ, හලස්‍යධරඃ හලධරඃ (බලභද්‍රඃ) තස්‍ය පරිධානානි (අම්බරාණි)= තවත් ශ්‍යාමලාඃ,=(තෛඃ) අම්බුංවහන්තීති, අම්බුවාහාඃ (තෛඃ) යනු සමාස වාක්‍යයි, **භ්‍රාන්තිමාන් උත්ප්‍රෙක්ෂා නිදර්ශනා සඞ්කරාලඞ්කාරයි, මාලිනීවෘත්තයි.**

'නනමයයයුතෙයං, මාලිනී භොගිලොකෛඃ'

යනු තල්ලක්ෂණයි.

## ශිශුපාලවධ නම් මහාකාව්‍යය

පිළිබඳව ලියනලද

**පඤ්චහාසිනි ව්‍යාඛ්‍යායෙහි**

**චතුර්ථසර්ග සමාප්තයි.**

# පඤ්චමඃ සර්ගඃ.

1. ඉත්ථං ගිරඃ ප්‍රියතමා ඉව සො'ව්‍යලීකාඃ
ශුශ්‍රාව සූතතනයස්‍ය තදා ව්‍යලීකාඃ,
රන්තුං නිරන්තරමියෙෂ තතොවසානෙ
තාසාං ගිරෞ ච වනරාජිපටං වසානෙ

2. තං සච්පෙන්ද්‍රතුලිතා'තුලතුඞ්ගශෘඞ්ග
මභ්‍යුල්ලසත්කදලිකාවනරාජි'මුච්චෛඃ,
විස්තාරරූඪවසුධො'චලං චචාල
ලක්ෂ්මීං දධත් ප්‍රතිගිරෙරලඝුබිලෞඝඃ.

(පඤ්චමසර්ගයේ ව්‍යාඛ්‍යානය.)

1 සඃ, ඒ හරිතෙම හෙවත් ශ්‍රීකෘෂ්ණ තෙමේ; ඉත්ථං, මෙසේ; අව්‍යලීකාඃ, අප්‍රිය රහිතවූ හෙවත් ප්‍රියබැව් සහිතවූ; ප්‍රියතමාඉව, ඉතා ප්‍රිය අඟනක්මෙන් සිටියාවූ; ව්‍යලීකාඃ, සත්‍යවූ; සූතතනයස්‍ය, සාරථි කුමාරයාගෙ; ගිරඃ, තෙපුල්; තදා, එකල්හි; ශුශ්‍රාව, ඇසුවේය. තතඃ, ඉක්බිති හෙවත් එවදන්ඇසීමට අනතුරුව; තාසාං, ඒ වචනයන්ගෙ; අවසානෙ, සමාප්තියෙහි; නිරන්තරං, අතුරුනැතිව; වන්රාජි, වනරේඛාවම; පටංවසානෙ, හන්සළුසොට ඇන්දාවූ; ගිරෞ, ඒ රෛවතක නම්වූ පර්වතයෙහි; රන්තුං, අභිරමනයකරන්ට; (ක්‍රීඩණය පිණිස යී සේයි) ඉයෙෂ, කැමැතිවීය; (එහි විසීමකරන්ට කැමැතිවීය, යනු භාවයි.)

**සඃ, සූතතනයස්‍ය, ගිරඃ, ශුශ්‍රාව,** යනුද, **සඃ. (හරිඃ) ගිරෞ, රන්තුමියෙෂ**, යනුද, මෙහි ක්‍රි- සි. ශුශ්‍රාව, යනුද, ඉයෙෂ, යනුද, පරොක්ෂලිට්යි, ශෘඤ්. ශ්‍රවණෙ, ඉෂු ඉච්ඡායාම්, ධාතූන් කෙරෙන්, කර්තෘසාධනයෙහි, ණප්, ප්‍රත්‍යයයි, **උපමායමක සංසෘෂ්ටියි**. මේ සර්ගයෙහි **වසන්තතිලකා වෘත්තයයි**, උක්තා, වසන්තතිලකා, තභජජගෞ, ගඃ, යනු තල්ලක්ෂණයි.

2. අභ්‍යුල්ලසත්, ඉතා බබලන්නාවූ; කදලිකාවනරාජි, රම්භා වනරාජියක්ම වැනිවූ නොහොත් කෙහෙල් වනරොදඇති; උච්චෛඃ, උස්වූ; විස්තාරරූඪ, විතරින් අවුරණලද හෙවත් පුළුලින් ව්‍යාප්තවූ; වසුධඃ, භූමිඇති; ප්‍රතිගිරෙඃ, එහෙයින්ම; පිළිපව්වක්නුගෙ (ප්‍රතිවිරුඪ පර්වතයක්හුගෙ යී සේයි;) ලක්ෂ්මීං, ශෝභාව; දධත්, ධරන්නාවූ; අලඝුඃ, ලඝුනොවූ හෙවත් මහත්වූ; සඃබිලෞඝඃ, ඒ බිලාමුලු

3. භාසවත්කරව්‍යතිකරෝ'ල්ලසිතාම්බරාන්තාඃ
සාපත්‍රපා ඉව මහාජනදර්ශනෙන,
සංවිව්‍යූරංබ රවිකාසි චමූසමූහං
පෘථ්වීරජඃ කරභකණ්ඨකඩාරමාශාඃ.

---

තෙම; (හටසෙනග යයි සේයි;) විපෙනද්‍රතුලිත, හස්තිරාජයන් හා සමග; අතුල, අප්‍රතිමවූ හෙවත් අසදෘශවූ; තුඞ්ගශෘඞ්ග තුහුසිහුඇති, නංඅචලං, ඒ රෛවතකනම් පර්වතයට; අනුවවාල,(පිටත්ව)ගියේය.

**සඃ** (**බලෞඝඃ**) **තං** (**අචලංඅනු**) **වවාල**, යනු, මෙහි ක්‍රි-යි අනුවවාල, යනු, පරොක්‍ෂලිට්යි, අනුපූර්ව, වල. ගතෞ, ධාතුවෙන්, **ණප්**, ප්‍රත්‍යයි. විපානාමීන්ද්‍රාඃ= * විපෙන්ද්‍රෛද්‍රසතුලිතානි= තුඞ්ගානිවතානි, ශෘඞ්ගානිවෙති= අතුලානිවතානි, තුඞ්ගශෘඞ්ගානිවෙති= විපෙනද්‍රතුලිතානි, අතුලතුඞ්ගශෘඞ්ගානි, යස්‍ය, (පර්වතස්‍ය) සඃ= (තම්) අභ්‍යුල්ල සන්තාඃ, කදල්‍යො (වෛජයන්ත්‍යො, වනරාජය, ඉව යස්‍යසඃ,) අත්‍යත්‍ර, රම්භාවනපඞ්ක්ත්‍යා, යස්‍ය, සඃ, (තම්) විස්තාරෙණ, රූඪා,= විස්තාරරූඪා, වසුධා, යස්‍යසඃ, විස්තාරරූඪවසුධඃ, බලානාමෞඝඃ, බලෞඝඃ, යනු මෙහි සමාසක්‍රමයි, **උත්ප්‍රෙක්‍ෂාලංශලක්‍ෂානුප්‍රාසයි නි සංකරයි**

3. ආශාඃ, දිශාවෝතුමූ; භාසවත්කරව්‍යතිකර, හිරුරැස් පැතිරිමෙන්; උල්ලසිතාම්බරාන්තාඃ, ප්‍රකාශිතවූ හෙවත් උසස්ව බබලන අහස්පෙදෙස් ඇත්තාහු නොහොත්; භාසවත්, අභිරූපවූ; කර, හස්තීහුගෙ; ව්‍යතිකර, සපර්ශයෙන්; උල්ලසිතාම්බරාන්තාඃ, ස්‍රස්තවූ හෙවත් අපගතවූ හෝ ගිලිහුනාවූ වස්ත්‍රබන්ධන ඇත්තාහු; මහාජනදර්ශනෙන, එහෙයින් මහජනයාගෙ දැකීමෙන්; සාපත්‍රපාඉව, විලියෙන් මෙන්; අම්බරවිකාසි, අහස්හි ව්‍යාප්තවූ නොහොත් වස්ත්‍රයන් මෙන් හොබනාවූ; චමූසමූහං, සේනාවෙන් නැංගාවූ; කරභ, ඔටුපොව්වන්ගෙ; කණ්ඨ, ග්‍රීවයන්මෙන්; කඩාරං, පිඟුවන්වූ; පෘථ්වීරජඃ, මිහිරජස; සංවිව්‍යූඃ, ආච්ඡාදනය කළහ; (ස්ත්‍රීහුවනාහි, වස්ත්‍රාපහාරයෙහි හෙවත් වස්ත්‍රය උදුරාගත්කල්හි, යම්කිසිවක් ආච්ඡාදනය කෙරෙති යී සේයි.)

---

* ස, විපෙන්ද්‍ර- යන තන්හි, සෛෂාද්ධසෙ, යනුවෙන්, විසර්ගයට ලොපශ්, යන්තෙන්, ලොප්වීයයි, සැලකිය යුතුයි, අනුවලං, වවාල, යන තන්හි, අනු, ලීක්‍ෂණෙ, යනුවෙන් කර්මප්‍රවචනීයත්වයෙන් තත් යොගයෙහි, වීතීයායි.

4. ආවර්තිනඃ ශුභඵලප්‍රදශුක්තියුක්තාඃ
සංපන්නදෙවමණයො භෘතරන්ධ්‍රභාගාඃ,
අශ්වාඃ ප්‍යධුර්වසුමතීමතිරෙචමානා
ස්තූර්ණං පයොධය ඉවොර්මිභි'රාපතන්තඃ.

---

**ආශාඃ, පාර්ථිවරජඃ, සංවිව්‍යුඃ,** යනු මෙහි, ක්‍රි- යි. සංවිව්‍යුඃ, යනු, පරොක්ෂලිට්සි, සම්පූර්වී, ව්‍යෙඤ්, සංවරණෙ, ධාතුවෙන්, උස් ප්‍රත්‍යයයි, ලිට් විභක්තිය, කිත් හෙයින්, සංප්‍රසාරණයෙහි, විගීවයි **සමාසොක්ති උත්ප්‍රෙක්ෂා සංකරයි.**

4. **ආවර්තිනඃ,** ධ්‍රැවනම්වූ දශවිධරොමාවර්ත ඇත්තාවූ ද්‍යේ හෝ නොහොත් දියසලාඇති; ශුභඵලප්‍රද, රාජ්‍යලාභාදි ශුභඵල දෙන්නාවූ; ශුක්තියුක්තාඃ, වක්ෂස්ථවූ ශුක්ති නම් රොමාවර්ත විශෙෂයෙන් යුක්තවූ ද්‍යේහෝ නොහොත්; ශුභඵලප්‍රද, ශුභවූ මුක්තාඵල ප්‍රදානය කරන්නාවූ; ශුක්තියුක්තාඃ, මුක්තාසෙළුව යන්ගෙන් යුක්තවූ; සම්පන්න දෙවමණයඃ, සියලුම තිගාලනම් රොමාවර්ත විශෙෂ ඇති (ගෙළසමීපයේ රෝමාවර්ත විශෙෂයම නිගාලනම්) ද්‍යේහෝ නොහොත් කෞස්තුභාදි දෙව්මිණිඇති; භෘත, පරිපූර්ණවූ; රන්ධ්‍රභාගාඃ, දුලවර ඇත්තාවූ ද්‍යේහෝ නොහොත් සුසිරප්‍රදෙශඇති; අතිරෙචමානාඃ, (ග්‍රීවයෙහි අතිශයින් හටගත්) රොචනම් රොමාවර්ත විශෙෂය ඇතිවූ ද්‍යේහෝ නොහොත් අතිශයින් බබලන්නාවූ; ඌර්මිභිඃ, එනම් ගතිවිශෙෂයෙන් ද්‍යේහෝ නොහොත් තරඞ්ගවලින්; ආපතන්තඃ පතනයවන්නාවූ නොහොත් දුවන්නාවූ; අශ්වාඃ, අශ්වයෝ තුමූ; පයොධයඃඉව, සමුද්‍රයන්මෙන්; වසුමතීං, පොළෝ තලය; ප්‍යධුඃ, වැසූහ.

**අශ්වාඃ, වසුමතීං, ප්‍යධුඃ,** යනු, මෙහි, ක්‍රි- යි. ප්‍යධුඃ, යනු, භූතාවිලුඞ්සි, අපිපූර්වී, ධාඤ් ධාරණ පොෂණයොඃ, ධාතුවෙන්, අන්, ප්‍රත්‍යයයි, උස් ආදෙශයි, වෂ්ටි, භාගුරිරල්ලොප'මවාප්‍යො' රුපසර්ගයොඃ, යනු, කී හෙයින් අපි ශබ්දයාගේ අකාරලෝපයයි, වක්ෂස්ථාඃ, ශුක්තයස්, තිස්‍ර, ඌර්ධ්වරොමා ජයාවහාඃ, යනුද, කණ්ඨජෝ, රොචමානශ්ච, ස්වාමිසෞභාග්‍යවර්ධනඃ, යනුද,

පඞ්ක්තීකෘතාත්'මශ්වානාම්, නමතො'න්නමතාකෘතිඃ
අතිවෙග සමායුක්තා, ගතිරූර්මි රුදාහෘතා,

යනුද අශ්වයන්ගෙ, විශෙෂ ශුභලක්ෂණයන්ගැණ ටීකායෙහි, නිදර්ශිතයි. මෙම පද්‍යය, **අර්ථශ්ලෙෂ උපමාසංකාරයි,**

5\. ආරක්ෂමග්නමවමත්‍ය සෘණිං ශිතාග්‍ර
මේකඃ පලායත ජවේන කෘතාර්තනාදඃ,
අන්‍යඃ පුනර්මුහුරුදප්ලවතාස්තභාර
මන්‍යෝන්‍යතඃ පථි බතාබිහිතාමිභෝෂ්ට්‍රෞ.

6\. ආයස්තමෛක්ෂත ජනශ්චටුලාග්‍රපාදං
ගච්ඡන්ත'මුච්චලිතචාමරචාරුමශ්වම්,
නාගං පුනර්මෘදු සලීලනිමීලිතාක්ෂං
සර්වඃ ප්‍රියඃ ඛලු භවත්‍යනුරූපචේෂ්ටඃ.

---

5\. පථි, මාර්ගයෙහි; ඉභෝෂ්ට්‍රෞ, ඇත් ඔටු දෙදෙන; අන්‍යෝන්‍යතඃ, ඔවුනොවුන් කෙරෙන්; අබිහිතාම්, බියපත්වූහ; බත, විස්මයෙක; ඒකඃ, එකෙක් හෙවත් හස්තියෙක් තෙම; ආරක්ෂමග්නාං, කුම්භයට ප්‍රවිෂ්ටවූ; ශිතාග්‍රං, තියුණු තුඩ ඇති; සෘණිං, අඞ්කුස; අවමත්‍ය, අවමන්කොට හෙවත් නොසලකා; කෘතාර්තනාදඃ, කරණ ලද බැගෑපත් හඬ ඇත්තේ; ජවේන, වේගයෙන්, පලායත, පැන දිව්වේය; පුනඃ, යලි; මුහුඃ, එකෙණෙහි; අන්‍යඃ, අනිකා හෙවත් අන්‍යවූ ඔටුතෙම; අස්තභාරං, හැරදමනලද බර ඇතිව; උදප්ලවත, පැනගියේය.

**ඒකඃ, සෘණිං අවමත්‍ය, ජවේන, පලායත**, යනුද, **අන්‍යඃ, මුහුඃ, අස්තභාරං, උදප්ලවත**, යනුද, **ඉභෝෂ්ට්‍රෞ, පථි, අන්‍යෝන්‍යතඃ, අබිහිතාම්**, යනුද, මෙහි, ක්‍රි- සි. පලායත, යනු පරාපූර්ව, අය, ගතෞ ධාතුවෙන්, තන්, ප්‍රත්‍යසි, උපසර්ගස්‍යාය අනද්‍යතනාතීතලඞ් තෞ, යනුවෙන් පරා, යන්නෙහි, රෙඵයට, ලත්වයයි, උදප්ලවත, යන තන්හි, උත් පූර්ව ප්ලු, ගතෞ, ධාතුවෙන්, අනද්‍යතනාතීත, ලඞ්-තන්, ප්‍රත්‍යසි, අබිහිතාම්, යන තන්හි, ඤිභී, භයෙ, ධාතුවෙන්, අනද්‍යතනාතීතලඞ්- තාම්, ප්‍රත්‍යසි, **ස්වභාවෝක්ති අලංකාරයි**.

6\. ජනඃ, (මහා) ජනතෙම; චටුල, චඤ්චලවූ; අග්‍රපාදං, අක්පා ඇතිව; ගච්ඡන්තං, ශීඝ්‍රවයන්නාවූ; උච්චලිත, ඉතාලෙලෙන; චාමර, සෙමෙරින්; චාරු, මනොඥවූ; අශ්වං, අශ්වයා; ආයස්තම්, උත්සාහ සහිතව; ඓක්ෂත, බැලුවේය; පුනඃ, නැවත; සලිල, ලීලාසහිතව; නිමීලිතාක්ෂං, මඳක් පියවූ නුවන් ඇතිව; මෘදුගච්ඡන්තං, ලැසිගමන් ඇත්තාවූ; නාගං, ඇතෙකු; ආයස්තාං, උත්සාහ සහිතව; ඓක්ෂත, බැලීය; සර්වඃ, සකල සත්වතෙම; අනුරූපචේෂ්ටඃ, ස්වජාත්‍යනුකූලවූ හෙවත් සුදුසුවූ ව්‍යාපාර ඇත්තේ; ප්‍රියඃ, භවති; ඛලු, ප්‍රියවේමැයි.

7. ත්‍රස්තඃ සමස්තජනහාසකරඃ කරේණො
ස්තාවත් ඛරඃ ප්‍රඛර'මුල්ලලයාංචකාර,
යාවච්චලාසනවිලොලනිතම්බබිම්බ
විස්‍රස්තවස්ත්‍ර'මවරොධවධූඃ පපාත.

8. ශෛලොපශල්‍යනිපතද්‍රථනෙමිධාරා
නිෂ්පිෂ්ටනිෂ්ඨුරශිලාතලචූර්ණගර්භාඃ,
භූරේණවො නභසි නද්ධපයොදචක්‍රා
ශ්චක්‍රීව'දඹගරුහධූම්‍රරුචො විසස්‍රුඃ

---

**ජනඃ, අගච්ඡමාගස්ත මෙක්ෂත**, යනුද, **ජනඃ, නාගච්ඡමාගස්ත මෙක්ෂත**, යනුද, **සර්වඃ අනුරූපචේෂ්ටඃ ප්‍රියඃ භවති**, යනුද, මෙහි, ක්‍රි–යි. ඓක්ෂත, යනු, ඊක්ෂ, දර්ශනාඞ්කණයොඃ, ධාතුවෙන්, අනද්‍යතනාතීතලඞ්– තත්, ප්‍රත්‍යයි, භවති, යනු–භූ, සත්තායාම් ධාතු වෙන්, වර්ත– ලට්– තිප්, ප්‍රත්‍යයි, **අර්ථාන්තරන්‍යාසාලංකාරයි.**

7. කරේණොඃ, කෙණෙරගෙන් හෙවත් ඇතින්න ගෙන්; ත්‍රස්තඃ, තැතිගත්තාවූ; ඛරඃ, කොටළු තෙම; සමස්තජන, සියලු දෙනාගෙ; හාසකරඃ, සිනාවඇතිකරන්නේ; තාවත්, ඒතාක්; ප්‍රඛරං අතිශයින්; උල්ලලයාංචකාර, උත්පතිතවීය හෙවත් උන්මුඛව වැටු නේය; යාවත්, යම්තාක්; චලාසන, චංචලවූ හෙවත් ස්ථානයෙන් ගිලිහුණාවූ ආසන ඇත්තී; විලොල, වෙසෙසින් සැලුණු; නිතම්බ බිම්බ, කටිපශ්චාත්භාගයෙන්; විස්‍රස්තවස්ත්‍රං, ගිලිහුණු සළුඇතිව; අවරොධවධූඃ, අන්තඃපුර ස්ත්‍රීසක්තොම; පපාත වැටුනීය.

**ඛරඃ, ප්‍රඛරං, උල්ලලයාං, චකාර**, යනුද, **අවරොධවධූඃ, චලාසන–විස්‍රස්තවස්ත්‍රං, පපාත**, යනුද, මෙහි, ක්‍රි–යි. උල්ලලයාංචකාර යනු, පරොක්ෂලිට්යි, උත්පූර්, ලය, ගතෞ ධාතුවෙන්, ආම්, ප්‍රත්‍යය හා කෘඤ් කරණෙ ධාත්වනු ප්‍රයොගයෙහි ණප්, ප්‍රත්‍යයි, පපාත, යනු පත්ඃ, පතනෙ, ධාතුවෙන්, පරොක්ෂලිට්– ණප්, ප්‍රත්‍යයි, **ස්වභාවොක්ති අලංකාරයි.**

8 ශෛල, රෛවතකපර්වතයාගෙ; උපශල්‍ය, ප්‍රාන්තභාගයෙහි; නිපතත්, ධාවනයකරන්නාවූ; රථනෙමිධාරා, රියනිම් වළලුධාරා යෙන්; නිෂ්පිෂ්ට, චූර්ණිතවූ හෙවත් ඇඹරෙණ ලද්දාවූ; නිෂ්ඨුර ශිලාතල, කැකුළුගල්තලාවන්ගෙ; චූර්ණගර්භාඃ, සුණුගැබ්කොටඇති; නභසි, අහස්හි; නද්ධ, චලඳනාලද; පයොදචක්‍රාඃ, මේඝාකාර මණ්ඩල ඇති; චක්‍රීවත්, කොටළුවන්ගෙ; අඞ්ගරුහ, රෝමයන්මෙන්; ධූම්‍ර රුචඃ, ධූම්කාන්තිඇති; භූරේණවඃ, මිහිරජස් හෙවත් ධූලිහු; විසස්‍රුඃ, ව්‍යාප්තවූහ (විසුරුණාහුයයි සේයි.)

9. උද්ධූතෝක්‍රශානුකූශලෙෂු ඛුරාභිඝාතා
ද්භූමිසමායතශිලාඵලකාචිතෙෂු,
පර්යන්තවර්ත්මසු විචක්‍රමිරෙ මහාශ්වාඃ
ශෛලස්‍යදර්දුරපුටානිව වාදයන්තඃ.

10. තෙජෝනිරොධසමතාවහිතෙන යන්ත්‍රා
සම්‍යක්කශාත්‍රයවිචාරවතා නියුක්තාඃ,
ආරට්ටජශ්චටුලනිෂ්ඨුරපාත'මුච්චෛ
ශ්චිත්‍රං චකාර පදමර්ධපුලායිතෙන.

---

**ගුරෙණවඃ, නාභෂි, විසසුඃ,** යනු. මෙහි ක්‍රි- යි. විසස්‍රුඃ, යනු, පරොක්ෂලිට්යි, විපූර්ව, සෘ, ගතෞ, ධාතුවෙන්. උස්, ප්‍රත්‍යයි, **උපමා ලඞ්කාරයි.**

9. ඛුරාභිඝාතාත්, කුරපහරින්; උද්ධූත්, උත්ගතවූ හෙවත් උඩටනැංගාවූ; ක්‍ෂෝශානුකූශලෙෂු, පුලිඟු හෙවත් ගිනිපුපුරු ඇත්තාවූ; භූමිසම, භූමියෙහි සමවූ හෙවත් සමතලාවූ; ආයත දික්වූ; ශිලාඵලක, ගල්පුවරු; ආචිතෙෂු, අතුරණලද; ශෛලස්‍ය, රෛවතකපර්වතයාගෙ; පර්යන්ත වර්ත්මසු ප්‍රාන්තමාර්ගයන්හි; මහාශ්වාඃ, මහ අස්හු; දර්දුර, එනම් භෙරිවිශෙෂයන්ගෙ; පුටාන්, පුටයන් හෙවත් මූහුණු; වාදයන්තඃඉව, වයන්නවුන්මෙන්; විචක්‍රමිරෙ, ගියාහුය.

**මහාශ්වාඃ, පර්යන්තවර්ත්මසු, විචක්‍රමිරෙ,** යනු, මෙහි, ක්‍රි-යි විපූර්ව, ක්‍රමු, ගතෞ, ධාතුවෙන්, පරොක්ෂලිට්- ඉරෙ, ප්‍රත්‍යයි, **උත්ප්‍රෙක්ෂා ලංකාරයි**

10. තෙජෝනිරොධ, තේජස හෙවත් වේගය වැලකීමෙහිද, සමතා, සංසිඳීමෙහිද; ආවහිතෙන, එලවනලද්දවූ හෙවත් වල්ගාදි විභාගයෙහි දක්ෂවූ; කශාත්‍රය, කශාත්‍රය සම්බන්ධවූ; විචාරවතා, විචාරය ඇත්තාවූ හෙවත් (මෙබඳුවූ ගමනෙහි මෙසේ තැළිය යුතුය යනාදි) විභාගය දන්නාවූ; යන්ත්‍රා, රියැදුරු විසින්; සම්‍යක්නියුක්තඃ, මොනවට යොදනලද; උච්චෛඃ, උන්නතවූ; ආරට්ටජඃ, ආරට්ට දෙශයෙහි ජනිතවූ අශ්වතෙම; චටුල, චංචලවූ හෙවත් චපලවූ; නිෂ්ඨුර, කර්කශවූ; පාතං, ප්‍රක්ෂෙපයඇති; අර්ධපුලායිතෙන, එනම් මණ්ඩලගති විශෙෂයෙන්; චිත්‍රම්, විසිතුරුවූ; පදං, පදක්‍රමය හෙවත් ගමන; චකාර, කොළේය.

**ආරට්ටජඃ,** (අශ්වඃ) **චිත්‍රංපදං, චකාර,** යනු, මෙහි, ක්‍රි- යි. චකාර, යන තන්හි, ඩුකෘඤ්, කරණෙ, ධාතුවෙන්, පරොක්ෂලිට්- ණප්, ප්‍රත්‍යයි, **ස්වභාවොක්ති අලඞ්කාරයි.**

11. නීහාරජාලමලිනඃ පුනරුක්තසාන්ද්‍රාඃ
කුර්වන් වධූජනවිලොචනපක්ෂ්මමාලාඃ,
ක්ෂුණ්ණඃ ක්ෂණං යදුබලෛර්දිවමාතිතාංසුඃ
පාංශුර්දිශාං මුඛමතුත්ථදුත්ථිතො'ද්‍රෛඃ.

12. උච්ඡිද්‍ය විද්විෂ ඉව ප්‍රසභං මෘගෙන්ද්‍රා
නින්ද්‍රානුජානුචරභූපතයො'ධ්‍යවාත්සුඃ,
වන්‍යෙභමස්තකනිඛාතනඛාග්‍රමුක්ත
මුක්තාඵලප්‍රකරභාඤ්ජි ගුහාගෘහාණි.

---

(10 මේ ශ්ලොකය සම්බන්ධ ටීකායෙහි අශ්වයන්ගෙ, ගතිවිශෙෂාදිය සම්බන්ධව ඉතා දීර්ඝ විස්තරයක් තිබෙන නමුත් ග්‍රන්ථබාහුල්‍ය භීතියෙන් මෙහි නොලිවෙමු,ටීකාවබලා දතයුතුයි.)

11. නීහාරජාල, හිමසමූහයක්මෙන්; මලිනඃ, කිලිටිවූ; වධූජන, කාන්තාවන්ගෙ; විලොචනපක්ෂ්මමාලාඃ, ඇසිපිය පඞ්කතීන්; පුනරුක්තසාන්ද්‍රාඃ, දෙගුණයක් ඝනවූවන්; කුර්වන්, කරන්නේ; ක්ෂණං, ඇසිල්ලක්; යදුබලෛඃ, යදුභටයන් විසින් හෙවත් යදුසෛන්‍යයන් විසින්; ක්ෂුණ්ණඃ, සුණුකරණලද; අද්‍රෛඃ, පර්වතයෙන්; උත්ථිතඃ, උත් ගතවූ හෙවත් උඩට නැංගාවූ; දිවම්, අහස්හි; ආතිතාංසුඃ, පැතිරෙණු කැමැතිවූ; පාංශුඃ, රජස්තෙමේ; දිශාංමුඛං, දිඞ්මුඛය හෙවත් දිගුන්ගෙ වාරය; අතුත්ථයත්, වැසීය.

**අද්‍රෛඃ, පාංශුඃ, දිශාංමුඛමතුත්ථයත්**, යනු, මෙහි, ක්‍රි–සි. අතුත්ථයත්, යනු, තුත්ථ, ආච්ඡාදනෙ, ධාතුවෙන්, අනද්‍යතනාතීතලඞ්–දිප්, ප්‍රත්‍යයයි, **ස්වභාවොක්ති අලංකාරයි**.

12. ඉන්ද්‍රානුචර, උපෙන්ද්‍රයාගෙ හෙවත් ශ්‍රීවිෂ්ණුහුගෙ සෙවකවූ; භූපතයඃ, මහීපාලයෝ; මෘගෙන්ද්‍රාන්, සිංහයන්; විද්විෂඃඉව, සතුරන් මෙන්; ප්‍රසභං, ලාහෙලා හෙවත් බලාත්කාරයෙන්; උච්ඡිද්‍ය, නසා; වන්‍යෙභ, වනැතුන්ගේ නොහොත් දඞැතුන්ගේ; මස්තකනිඛාත, ශීර්ෂයන්හි නිඃක්ෂිප්තවූ; නඛාග්‍ර, නියගින්; මුක්ත, මිදුනාවූ හෙවත් විසුරුණාවූ; මුක්තාඵලප්‍රකර, මුතුඇට සමූහයන්; භාඤ්ජි, සෙවුනාවූ; ගුහාගෘහාණි, ගිරිගුහා ගෙවල්හි; අධ්‍යවාත්සුඃ, විසූහ.

**ඉන්ද්‍රානුචරභූපතයඃ, ගුහාගෘහාණි, අධ්‍යවාත්සුඃ**, යනු, මෙහි ක්‍රි–සි. අධ්‍යවාත්සුඃ, යන තැන, අධිපූර්ව, වස, නිවාසෙ, ධාතුවෙන්, භූතාර්ථලුඞ්– අන්, ප්‍රත්‍යයයි, උස්, යනාදෙශයි, ගුහාගෘහාණි යන තන්හි, 'උපාන්වධ්‍යාඞ්වසඃ' යනුවෙන් ආධාරාර්ථයෙහි කර්මත්වයයි, සිච්, ප්‍රත්‍යය විෂයෙහි වෘද්ධිය හා, 'සඃ ස්‍යාර්ධධාතුකෙ' යනුවෙන් තකාරභාවයයි, **උපමාමිශ්‍ර ස්වභාවොක්තියි**.

13. බිභ්‍රාණයා බහලයා වකපඞ්කපිඞ්ග
පිඤ්ඡාවචූඩමනුමාධවධාම ජග්මුඃ,
චඤ්ච්වග්‍රදෂ්ටචටුලාහිපතාකයාන්‍යෙ
ස්වාවාසභාගමුරගාශනකෙතුයෂ්ට්‍යාඃ.

14. ඡායාමපාස්‍ය මහතී'මපි වර්තමානා
මාගාමිනීං ජගෘහිරෙ ජනතාස්තරූණාම්,
සර්වෝ හි නොපගතම'ප්‍ය පචීයමානං
වර්ධිෂ්ණු'මාශ්‍රය'මනාගතම'භ්‍යුපෛති.

---

13. අන්‍යෙ, අනික් මිගිපල්හු; බහල, සාන්ද්‍රවූ හෙවත් ඝනවූ; යාවකපඞ්කපිඞ්ග, ලතුකළල්සේ පිඟුවන්වූ; පිඤ්ඡාවචූඩං, යට එල්බෙන පිල්කලඹ; බිභ්‍රාණයා, ධරන්නාවූ; චඤ්ච්වග්‍ර, තුඩුඅගින්; දෂ්ට, ඩහනලද; චටුල, චඤ්චලවූ හෙවත් චපලවූ; අහිපතාකයා, සර්පයාම කෙහෙළිකොට ඇති; උරගාශන, ගුරුළාගෙ; කෙතුයෂ්ට්‍යා, කොඩිමිට සලකුණෙන්; අනුමාධවධාම, ශ්‍රීවිෂ්ණුහුගෙ සිවිගෙය අනුව; ස්වාවාසභාගං, ස්වකීය නිවෙසන ප්‍රදෙශයට; ජග්මුඃ, ගියාහුය.

**අන්‍යෙ, ස්වාවාසභාගං, ජග්මුඃ,** යනු, මෙහි, ක්‍රි- යි. ජග්මුඃ, යන තැන, ගම්ඏ, ගතෞ, ධාතුවෙන්, පරොක්‍ෂලිට්- උස්, ප්‍රත්‍යයි, **ස්වභාවොක්ති අලඞ්කාරයි.**

14. ජනතාඃ ජනසමූහයෝතුමූ; තරූණාම්, වෘක්‍ෂයන්ගෙ; වර්තමානාං, පවත්නාවූ හෙවත් විද්‍යමානවූ; මහතීංඅපි, මහත්වූද; ඡායාං, සෙවණ; අපාස්‍ය, දුරුකොට; ආගාමිනීං, මතු පැමිණෙන ඡායාවට; ජගෘහිරෙ, එලඹුනාහ; හි, ඒ එසේමැයි; සර්වඃ, සකල ජනතෙම; උපගතංඅපි, උපස්ථිතවූද හෙවත් තමාවෙත පැමිණියාවූද; අපචීයමානං, පිරිහෙන්නහු; ආශ්‍රයං, ඇසුරුකිරීමට; නඅභ්‍යුපෛති, නොපැමිණේමැයි; අනාගතංඅපි, අනුපස්ථිතවූද හෙවත් තමන්වෙත නොපැමිණියාවූද; වර්ධිෂ්ණුං, වැඩෙනසුල්ලහු; ආශ්‍රයං, ඇසුරුකිරීමට; අභ්‍යුපෛති, එලඹේමැයි.

**ජනතාඃ ආගාමිනීං (ඡායාං) ජගෘහිරෙ,** යනුද, **සර්වඃ (උපගතං අපි) අපචීයමානං, ආශ්‍රයං, න අභ්‍යුපෛති,** යනුද, **වර්ධිෂ්ණුං, අනුපාගතංපි, අභ්‍යුපෛති,** යනුද, මෙහි, ක්‍රි- යි. ජගෘහිරෙ, යන තන්හි, ග්‍රහ, උපාදානෙ, ධාතුවෙන්, පරොක්‍ෂලිට්- ඉරෙ, ප්‍රත්‍යයි, අභ්‍යුපෛති, යන තන්හි, අභිඋපපූර්ව, ඉණ්, ගතෞ, ධාතුවෙන්, වර්තමානලට්- තිප්, ප්‍රත්‍යයි, **අර්ථාන්තරන්‍යාසාලඞ්කාරයි.**

15\. අග්‍රෙ ගතෙන වසතිං පරිගෘහ්‍ය රම්‍යා
මාපාත්‍යසෛනිකනිරාකරණාකුලෙන,
යානෙනා'න්‍යතඃ ප්ලුතකෘතස්වර'මාශුදූරා
දුද්බාහුනා ජුහුවිරෙ මුහු'රාත්මවර්ගීයාඃ.

16\. සික්තා ඉවාමෘතරසෙන මුහුර්ජනානාං
ක්ලාන්තිච්ඡිදො වනවනස්පතයස්තදානීම්,
ශාඛාවසක්තවසනාභරණාභිරාමාඃ
කල්පද්‍රුමෛඃ සහ විචිත්‍රඵලෛර් විරෙජුඃ.

---

15\. අග්‍රෙ, ඉදිරියෙහි; ගතෙන, ගියාවූ; රම්‍යාම්, මනරම්වූ; වසතිං, නිවාසය; පරිගෘහ්‍ය, පරිග්‍රහණයකොට හෙවත් ලබාගෙණ; අපාත්‍යසෛනික, තමන් මඩණට එන සේනාවන්; නිරාකරණ, වැලැක්වීමෙහි හෙවත් දුරුකිරීමෙහි; ආකුලෙන, අවුල්වූ; උද්බාහුනා, ඔසවනලද අත්ඇත්තෙකු විසින්; අන්‍යතඃ, අන්තැනකට; යාන්තඃ, යන්නාවූ; ආත්මවර්ගීයාඃ, ස්වකීය වර්ගිකයෝ හෙවත් සිය සෙන් සමූහයෝ; ප්ලුතකෘතස්වරං, ප්ලුතයෙන්කල හඬක් අස්වා නොහොත් ප්ලුතයෙන්කල ශබ්දය ඇතිසේ; ආශු, වහා; දූරාත්, දුරසිට; මුහුඃ, එකණෙහි; ආජුහුවිරෙ, ආහ්වානය කරණලද්දහ; (කැඳවනලද්දහයි සේයි.)

**උද්බාහුනා, ආත්මවර්ගීයාඃ, ආශු, මුහුඃ, ආජුහුවිරෙ,** යනු, මෙහි, ක්‍රි- සි. ආජුහුවිරෙ, යනතන්හි, ආඞ්පූර්‍ව, හූ, ආහ්වානෙ, ධාතුවෙන්, පරොක්‍ෂලිට්, කර්‍ම- ඉරෙ, ප්‍රත්‍යයි, 'අභ්‍යස්තස්‍යච' යනුවෙන්, සංප්‍රසාරණයෙහි, විභාවය හා උවඞාදෙශයි, **ස්වභාවොක්තියි.**

16\. අමෘතරසෙන. අමාරසයෙන්; සික්තාඃඉව, අභිෂෙකකරණලද්දවුන්මෙන් හෙවත් ඉසිනලද්දවුන්මෙන්; මුහුඃ, එකණෙහි; ජනානාං, ජනයන්ගෙ; ක්ලාන්තිච්ඡිදඃ, මාර්ගපරිශ්‍රමය හෙවත් ගමන් විඩාව හරණාවූ; ශාඛාවසක්ත, ශාඛාවන්හි බැඳෙනලද හෙවත් ඇලෙනලද; වසනාභරණ, වස්ත්‍රාභරණයෙන්; අභිරාමං, සිත්කළුවූ; වනවනස්පතයඃ, වනයෙහිවූ ප්‍රධාන වෘක්‍ෂයෝ; විචිත්‍රඵලෛඃ, විසිතුරු ඵල ඇත්තාවූ හෙවත් වස්ත්‍රාභරණාදි අනෙක ඵලයෙන් යුක්තවූ; කල්පද්‍රුමෛඃසහ, කප්රුක් හා සමානව; තදානීම්, එකල්හි; විරෙජුඃ, බැබළුහු.

**වනවනස්පතයඃ, තදානීම්, කල්පද්‍රුමෛඃ, සහ, විරෙජුඃ,** යනු මෙහි, ක්‍රි- සි. විරෙජුඃ, යන තැන්හි, විපූර්‍වරාජෘ, දීප්තෞ, ධාතුවෙන්, පරොක්‍ෂලිට්-උස්, ප්‍රත්‍යයි, **උත්ප්‍රෙක්‍ෂා උපමාලංකාරයි.**

17. යානාජ්ජනඃ පරිජනෛ'රවතාර්‍යමාණා
රාඥීර්නිරූපනයනාකුලසෞවිදල්ලාඃ,
ස්‍රස්තාවගුණ්ඨනපටාඃ ක්ෂණලක්ෂ්‍යමාණ
වක්ත්‍රශ්‍රියඃ සභයකෞතුක'මීක්ෂතෙ ස්ම.

18 කණ්ඨාවසක්තමෘදුබාහුලතාස්තුරඞ්ගා
ද්‍රාජාවරොධනවධූරවතාරයන්තඃ,
ආලිඞ්ගනාන්‍යධිකෘතාඃ ස්ඵුටමාපුරෙව
ගණ්ඩස්ථලීඃ ශුචිතයා න චුචුම්බුරාසාම්.

---

17. පරිජනෛඃ, පිරිවර ජනයන් විසින්; යානාත්, වාහන යෙන්; අවතාර්‍යමාණාඃ, බස්වනු ලබන්නාවූ; නරූපනයන, (දක්නා) මිනිසුන්ගේ පහකිරීමෙහි; ආකුල, ව්‍යාකුලවූ; සෞවිදල්ලාඃ, අන්තඃ පුර පාලකයන් ඇති; ස්‍රස්ත, බැසීමෙන් ගිලිහුණාවූ; අවගුණ්ඨන පටාඃ මූවවස්නා සාඩඇති; ක්ෂණලක්ෂ්‍යමාණ ඇසිල්ලෙක්හි ලකුණු කරණු ලබන; වක්ත්‍රශ්‍රියඃ මූබ ශෝභා ඇත්තාවූ; රාඥ්‍යඃ, රජමෙහෙසියන්; ජනඃ, ජනතෙම; සභයකෞතුකං, බිය කුහුල් සහිතවැ; ඊක්ෂතෙස්ම, බැලීය; (තාඩණයෙන් බියද, කාමයෙන් කුහුල්බවද වන්නේයි.

**ජනඃ, රාඥ්‍යඃ, සභයකෞතුකං, ඊක්ෂතෙ, ස්ම,** යනු, මෙහි. ක්‍රි- සි. ඊක්ෂතෙ, ස්ම, යනතන්හි. ඊක්ෂ, දර්ශනාඞ්කනයොඃ, ධාතුවෙන් වර්ත- ලට්- තෙ, ප්‍රත්‍යයි. ස්ම, යනු, නිපාතයෝගය බැවින්- "මාස්මයොගෙච" යනුවෙන්, ඊක්ෂතෙ, යනු, අතීතකාලිකයි, **ස්වභාවොක්තියි.**

18. තුරඞ්ගාත්, අසුපිටින්; රාජාවරොධනවධූඃ, රජුන්ගෙ අතෝවුරන්; අවතාරයන්තඃ, බිමටබස්වන්නාවූ; අධිකෘතාඃ, අන්තඃපුරාධිකාරීහු; කණ්ඨාවසක්ත ( ස්ව කීය ) ග්‍රීවයෙහි ඇලුණාවූ; මෘදු, මොලොක්වූ; බාහුලතාඃ, හස්තලතාවන් ඇත්තාහු; ස්ඵුටං, ව්‍යක්තවූ පරිදි හෙවත් ප්‍රකටවූසේ; ආලිඞ්ගනානි, ආලිඞ්ගනයන්ට (වැලඳගැණීම්වලට යී සේයි); ආපුඃඑව, පැමිණියාහුමැයි; ආසාම්, ඒ ස්ත්‍රීන්ගෙ; ගණ්ඩස්ථලීඃ, කොපුල්තල; ශුචිතයා, (තමන්) පිරිසුදු බැවින්; නචුචුම්බුඃ, නොසිඹියාහුය; (කටයුතුවල නියුක්ත ශිෂ්ටාචාර සම්පන්නයෝ අශීලාචාරකම් නොකෙරෙති, යි සේයි.)

**අධිකෘතාඃ, ස්ඵුට'මාලිඞ්ගනානි, ආපුඃ,** යනුද, **න, ආසාම් ගණ්ඩස්ථලීඃ, ශුචිතයා, නචුචුම්බුඃ,** යනුද, මෙහි, ක්‍රි- සි. ආපුඃ, යන තන්හි අප, ප්‍රාපණෙ, ධාතුවෙන්, පරොක්ෂලිට්- උස්, ප්‍රත්‍යයි, නචු, චුම්බුඃ, යන තන්හිද, චුබ, චුම්බනෙ, ධාතුවෙන්, පරොක්ෂලිට්- උස් ප්‍රත්‍යයි, **ස්වභාවොක්ති අලංකාරයි.**

19. දෘෂ්ට්වෛව නිර්ජිතකලාපභරාමධස්තා
ව්‍යාකීර්ණමාල්‍යකබරාං කබරීං තරුණ්‍යාඃ,
ප්‍රාද්‍රවත්සපදි චන්ද්‍රකවාන් ද්‍රුමාග්‍රාත්
සංසර්පිණා සහ ගුණාභ්‍යධිකෛර්දුරාසම්.

20. රෙවිෂ්ණුකාඤ්චනවයාංශුපිශඞ්ගිතාශා
වංශධ්වජෛර්ජලදසංහතිමුල්ලිඛන්ත්‍යඃ,
භූභෘත්පුරායතනිරන්තරසංනිවිෂ්ටාඃ
පාදා ඉවා'භිබභුරචලයො රථානාම්.

---

19. අධස්තාත්, තුරුයට; නිර්ජිත, දිනනලද; කලාපභරාං, පිල්බරඇති; ව්‍යාකීර්ණ, විසුරුණාවූ; මාල්‍ය, මල්දමින්; කබරාං, කබු රුවන්වූ; තරුණ්‍යාඃ, තරුණියගෙ; කබරීං, හිසකේවැටිය; දෘෂ්ට්වා එව, දුටුම; සපදි, එකෙණෙහි; චන්ද්‍රකවාන් මයුරතෙම; ද්‍රුමාග්‍රාත්, තුරුඅගින්; ප්‍රාද්‍රවත්, ඉගිල ගියේය; හි, ඒ එසේමැයි; සංසර්පිණා, ඉසිවතා විසින්; ගුණාභ්‍යධිකෛඃ සහ, ගුණයෙන් වැඩිසිටියවුන් සමග; දුරාසම්, (එකතැන)විසියනොහැක්කේයි; පරාජිතයන් විසින් දිනුවහුගෙ ඉදිරියෙහි සිටීම සුදුසු නොවෙයි සේයි.

චන්ද්‍රකවාන්, සපදි, ද්‍රුමාග්‍රාත්, ප්‍රාද්‍රවත්, යනුද, සංසර්පිණා ගුණාභ්‍යධිකෛඃ, සහ, දුරාසම්, යනුද, මෙහි, ක්‍රි- යි. ප්‍රාද්‍රවත්, යන තන්හි, ප්‍රඅාඞ්පූර්ව, ද්‍රු, ගතෞ ධාතුවෙන්, 'ර්‍යඞහර' යනාදීන්, භාවයෙහි, බල්, ප්‍රත්‍යයි, අර්ථාන්තරන්‍යාසෝත්ප්‍රෙක්ෂා ලඞ්කාරයි.

20. රෙවිෂ්ණු බබලන සුලුවූ; කාඤ්චනවයාංශු, සවණි සමූහ යාගෙ රශ්මියෙන්; පිශඞ්ගිත, පිඟුවන්වූ; අාශාඃ, දිගුන්ඇති; වංශ ධ්වජෛඃ, තත්තත් රාජවංශිකයන්ගෙ කොඩිවලින් නොහොත් වේණුසඞ්ඛ්‍යාත ධ්වජවලින්; ජලදසංහතිං, මේඝපඞ්ක්තිය හෙවත් මේඝසමූහය; උල්ලිඛන්ත්‍යඃ, උල්ලිඛනය කරන්නාවූ හෙවත් ලියන් නාවූ; ආයත, දීඝීව; නිරන්තර, අතුරුනැතිව හෙවත් සිදුරුනැතිව; සංනිවිෂ්ටාඃ, මොනවට සිටියාවූ හෙවත් තවතාතුබූ; රථානාම්, අාව ලයඃ, රියපඞ්කතිහු; භූභෘතඃ, රෛවතක පර්වතරාජයාගෙ; පාදාඃ ඉව, පාදයන්මෙන් හෙවත් ප්‍රත්‍යන්ත පර්වතයන්මෙන්; අභිබභුඃ, වෙසෙ සින් බැබළුහු.

රථානා'මාවලයඃ, භූභෘතඃ, පාදාඉව, අභිබභුඃ, යනු, මෙහි. ක්‍රි- යි අභිබභුඃ, යන තන්හි, අභිපූර්ව, භා, දීප්තෞ, ධාතුවෙන්, පරොක්‍ෂලිට්- උස්, ප්‍රත්‍යයි, මෙහි වනාහි, දිගුන් පිඟුවන්කිරීම් ආදි ක්‍රියාවන් නිමිතිකොටඇති ජාතිස්වරූපවූ උත්ප්‍රෙක්‍ෂා ලඞ්කාරයි.

21. ඡායාවිධායිභි'රනුජ්ඣිතභූතිශොභෛ
රුච්ඡ්‍රායිභිර්බහලපාටලධාතුරාගෛඃ,
දූෂ්‍යෛ'රිව ක්ෂිතිභෘතාං විරදෙ'රුදාර
තාරාවලීවිරචනෛ'ර්ව්‍යරුචන්නිවාසාඃ.

22. උත්ක්ෂිප්තකාණ්ඩපටකාන්තරලීයමාන
මන්දානිලප්‍රශමිතශ්‍රමඝර්මතොයෛඃ,
දූෂ්‍යප්‍රතානසහජාස්තරණෙෂු හෙජේ
නිද්‍රාසුඛං වසනසද්මසු රාජදාරෛඃ.

---

21. ක්ෂිතිභෘතාං, මහීපාලයන්ගෙ; නිවාසාඃ, වාසස්ථානයෝ; ඡායාවිධායිභිඃ, කාන්තිකරවූ හෙවත් අනාතප සම්පාදකවූ; අනුජ්ඣිත, නොහරණලද; භූතිශොභෛඃ, භස්මරචනාඇති අහෝ ෆනාහොත් සම්පතුන්ගෙ ශොභාඇති; උච්ඡ්‍රායිභිඃ, උද්ගතව නැමුනාවූ හෙවත් උන්නතවූ; බහල, ඝනවූ හෙවත් ඝනවූ; පාටල, පලොල්වන්වූ; ධාතුරාගෛඃ, ගෛරිකාදීන්කළ රඤ්ජන ඇති; උදර තාරාවලී, (මහත්වූ) ශුධ මුක්තාවලීන්ගෙ; විරචනෛඃ, භූෂණඇති; විරදෛඃ, හස්තීන් කාරණකොටගෙණ, දූෂ්‍යෛඃඉව, පිළිසෙන්කළ මඩුලුවලින් මෙන්; ව්‍යරුචන්, වෙසෙසින් බැබලූහ.

**ක්ෂිතිභෘතාං, නිවාසාඃ විරදෛඃ දූෂ්‍යෛ'රිව, ව්‍යරුචන්,** යනු මෙහි, ක්‍රි-සි. ව්‍යරුචන්, යන තන්හි, විපූර්ව, රුච, දීප්තෞ. ධාතුවෙන්, භූතාර්ථලුඞ්- අන්, ප්‍රත්‍යසි, **තුල්‍යයොගිතාලංකාරසි.**

22. උත්ක්ෂිප්ත, ඔසවනලද්දාවූ; කාණ්ඩපටක, ජවනිකාවන්ගෙ හෙවත් පඩකාවන්ගෙ; අන්තරලීයමාන, අභ්‍යන්තරයෙහි සැඟවෙනුලබන; මන්දානිල, මඳපවනින්; ප්‍රශමිත, සංසිඳෙනලද; ශ්‍රම, මාර්ගපරිශ්‍රමයෙන් හටගත්; ඝර්මතොයෛඃ, සෝදියඇති; රාජදාරෛඃ, රජුන්ගෙ ඇතොවුරන් විසින්; දූෂ්‍යප්‍රතාන, තිතණප්‍රතානයෙහි හෙවත් තීතණරාසෙහි; සහජාස්තරණෙෂු, අකෘතිමවූ ආස්තරණයන් ඇති; වසන සද්මසු පිළීගෙවල්හි හෙවත් ඉටිරෙදිවලින් කළ ගෘහයන්හි; නිද්‍රාසුඛං, නිදිසුවය; හෙජේ, භජනයකරණලද්දේය.

**රාජදාරෛඃ, වසනසද්මසු, නිද්‍රාසුඛං, හෙජේ,** යනු මෙහි, ක්‍රි-සි. හෙජේ, යන තන්හි, භජ, සෙවායාම්, ධාතුවෙන්, පරොක්ෂලිට්- කර්ම-එ, ප්‍රත්‍යසි, **ස්වභාවොක්ති අලඞ්කාරසි.**

23. ප්‍රස්වේදවාරිසවිශේෂවිෂක්ත'මඞ්ගෙ
කූර්පාසකං ක්‍ෂතනඛක්‍ෂත'මුත්ක්‍ෂිපන්තී,
ආවිර්භවද්ඝනපයෝධරබාහුමූලා
ශාතෝදරී යුවදෘශාං ක්‍ෂණ'මුත්සවෝ'භූත්.

24. යාවත්ස එව සමයඃ සමමේව තාව
දව්‍යාකුලාඃ පටමයාන්‍යභිතෝ විතත්‍ය,
පණ්‍යාපතත්ක්‍රයිකලෝක'මගණ්‍යපණ්‍ය
පූර්ණාපණා විපණිනෝ විපණීර්විභේජුඃ.

---

23. **අඞ්ගෙ**, ශරීරයෙහි; **ප්‍රස්වේදවාරි**, ස්වේදජලයෙන් හෙවත් ඩහදියෙන්; **සවිශේෂ**, විශේෂ සහිතවූ හෙවත් ඉතා අධිකවූ; **විෂක්තං**, වෙසෙසින් ඇළුණු; **කූර්පාසකං**, සැට්ටය හෙවත් චෝළිය; **උත්ක්‍ෂිපන්තිං**, ඔසවන්නීවූ හෙවත් මුදන්නීවූ; **ක්‍ෂතනඛක්‍ෂතං**, නිය ගින් තුවාලකරණද වණඇතිව; **ආවිර්භවත්**, එහෙයින්ම ප්‍රකාශවන්නාවූ; **ඝනපයොධර**, ඝනවූ හෙවත් මහත්වූ පියවුරු හා; **බාහුමූලා**, කිසිලිඇති; **ශාතොදරී**, ප්‍රියවූ කාන්තාතොමෝ; **යුවදෘශාං**, යොවුන් ඇස් ඇතියන්ට; **ක්‍ෂණම්**, ඇසිල්ලක්; **උත්සවඃ අභූත්**, උත්සව යෙක් හෙවත් ෂණකෙළියක්විය.

**ශාතොදරී, යුවදෘශාං, ක්‍ෂණ'මුත්සවෝ'භූත්**, යනු, මෙහි ක්‍රි- සි. අභූත් යන තන්හි, භූ, සත්තායාම්, ධාතුවෙන්, භූතාර්‍ථද්‍යතනී- දිප්, ප්‍රත්‍යයසි, **ස්වභාවොක්ති අලංකාරයි.**

24. **විපණිනඃ**, වෙළෙන්දෝ; **යාවත්**, යම්තාක්; **සඃඑවසමයඃ**, සෙනාතිවේශ ලක්‍ෂණවූ එම කාලයවේද; **තාවත්එව**, ඒතාක්ම හෙවත් එකෙණෙහිම; **සමං**, සමව හෙවත් එකවිට; **අව්‍යාකුලාඃ**, ව්‍යාකුල නොවූවාහු හෙවත් නිරවුල්වූවාහු; **පටමයානි**, වස්ත්‍රමයවූ මණ්ඩප යන්; **අභිතඃ**, හාත්පස; **විතත්‍ය**, විස්තීර්ණකොට හෙවත් ගහණව පතුරුවා; **ක්‍රයිකලොකං**, විකිණීයයුතු බඩුගන්නා මිනිසුන් වෙත; **පණ්‍යාපතත්**, හාත්පසින් යන්නාවූ හෙවත් දුවන්නාවූ; **අගණ්‍ය**, ගණන් නොතැබිය හැකිවූ; **පණ්‍යපූර්ණ**, විකිණියයුතු බඩුවලින් පිරුණු; **ආපණාඃ**, අවන්හල්ඇති; **විපණීඃ**, වෙළඳ වීථීන්; **බිභෙජුඃ**, භජනය කළහ.

**විපණිනඃ, විපණීඃ විභේජුඃ**, යනු මෙහි ක්‍රි- සි. විභෙජුඃ, යනතන්හි, විපූර්ව, භජ, සෙවායාම්, ධාතුවෙන්, පරොක්‍ෂලිට්- උස්, ප්‍රත්‍යයසි, මෙහි, 'ලොපඃ, පඤ්චං, කිතෙ‍්‍යවාස්‍ය' යනුවෙන් අකාරයට, ඒ ත්වය හා පූර්වලොපයයි, **ස්වභාවොක්තානුප්‍රාසසංකරයි.**

25. අල්පප්‍රයොජනකෘතොරුතරප්‍රයාසෛ
රුද්ගූර්ණලොෂ්ටලගුඩෛඃ පරිතො'නුවිද්ධම්.
උද්ධූත'මුද්ද්‍රුත'මනොකහජාල'මධ්‍යා
දන්‍යඃ ශශං ගුණ'මනල්පමවන්නවාප.

26. ත්‍රාසාකුලඃ පරිපතන් පරිතො නිකෙතාන්
පුංභිර්න කෛශ්චිදපි ධන්විභි'රන්වබන්ධි,
තස්ථෞ තථාපි න මෘගඃ ක්වචිදඞ්ගනානා
මාකර්ණපූර්ණනයනෙෂුහතෙක්ෂණශ්‍රීඃ.

---

25. අල්පප්‍රයොජන, ස්වල්ප ඵලයක් නිමිති කොටගෙණ; කෘත, කරණලද්දවූ; උරුතරප්‍රයාසෛඃ, ඉතා මහත් ප්‍රයත්නයෙන් යුක්තවූ; උද්ගූර්ණ, උද්ධූතවූ හෙවත් ඔසවාගන්නාලද; ලොෂ්ටලගුඩෛඃ, කැටකැබිලිති හා දඬුමුගුරු ඇති; පුංභිඃ, පුරුෂයන් විසින්; පරිතඃ, හාත්පසින්; අනුවිද්ධම්, අවුරණලද; අනොකහජාලමධ්‍යාත්, වෘක්ෂ සමූහ මධ්‍යයෙන් හෙවත් තුරුපෙත මැදින්; උද්ධූතං, උද්ගතවූ හෙවත් නැංගාවූ; උද්ද්‍රුතං, පැනදුවන්නාවූ; ශශං, සාවෙකු; අන්‍යඃ, අන් පුරුෂයෙක් තෙම; අවන්, රක්ෂාකරන්නේ; අනල්පංගුණං, බොහෝවූ ගුණයට; අවාප, පැමිණියේය නොහොත්; අන්‍යඃ, අනිකෙක්; ගුණං, පාශය; අවන්, යොදන්නේ; අවාප, ගත්තේය.

**අන්‍යඃ, ශශං, අවන්, අනල්පං, ගුණමවාප,** යනු මෙහි ක්‍රි-සි. අවාප, යන තන්හි, අවපූර්ව, අප, ප්‍රාපණෙ ධාතුවෙන්, පරොක්‍ෂලිට්, ණප්, ප්‍රත්‍යයයි, **අර්ථාන්තරන්‍යාසාලංකාරයි.**

26. ත්‍රාසාකුලඃ, ( මිනිසුන් දක්නා ) බියෙන් අවුල්ව; පරිතඃ, හාත්පසින්; නිකෙතාන්, නිවාසයන්ට; පරිපතන්, දුවන්නාවූ; මෘගඃ, මුවතෙම; ධන්විභිඃ, දුනුගත් අත්ඇති; කෛශ්චිත්අපිපුංභිඃ, යම්කිසි පුරුෂයන් විසින්; නඅන්වබන්ධි, නොමලුහුබඳනාලදී; තථාපි, එසේද වුවත්; අඞ්ගනානාම්, අඟනන්ගෙ; ආකර්ණපූර්ණ, කණදක්වා පිරුණාවූ; නයනෙෂු, නෙත්‍රනමැති හීයෙන්; හතෙක්ෂණශ්‍රීඃ, නසනලද දර්ශන ශ්‍රී ඇත්තේ; ක්වචිත්අපි, කිසිතැනෙකත්; නතස්ථෞ, නොසිටියේය; (වීරයන්ගෙ විශිඛාපාතය නැතිකල්හිදු අඟනන්ගේ කටාක්‍ෂ නිරීක්‍ෂණ නමැති හීපහනයෙන් බියපත්ව පලාගියේ යයිසේයි.)

**ධන්විභිඃ, මෘගඃ, නාන්වබන්ධි,** යනුද, **තථාපි, මෘගඃ, ක්වචිත්, න, තස්ථෞ,** යනුද, මෙහි, ක්‍රි- සි. අන්වබන්ධි යන තන්හි, අනුපූර්ව, බන්ධ, බන්ධනෙ, ධාතුවෙන්, ලුඞ්- කර්ම- තන්, ප්‍රත්‍යයයි, තස්ථෞ යන තන්හි, ෂ්ඨා, ගතිනිවෘත්තෞ, ධාතුවෙන්, **පරොක්‍ෂලිට්- ණප්,** ප්‍රත්‍යයයි, **'ආතො, ණප්, ඖව'** යනුවෙන්, ඖ- ආදෙශයි, **කාව්‍ය ලිඞ්ග සඞ්කර උත්ප්‍රෙක්‍ෂායි.**

27. ආස්තීර්ණතල්පරචිතාවසථඃ ක්ෂණෙන
වෙශ්‍යාජනඃ කෘතනවප්‍රතිකර්මකාම්‍යඃ,
ඛින්නානඛින්න'මති'රාපතතො මනුෂ්‍යාන්
ප්‍රත්‍යග්‍රහීච්චිරනිවිෂ්ට ඉවොපචාරෛඃ.

28. සස්නුඃ පයඃ පපුර'නෙනිජු'රම්බරාණි
ජක්ෂුර්බිසං ධෘතවිකාසිවිස ප්‍රසූනාඃ,
සෛන්‍යාඃ ශ්‍රියාමනුපභොගනිරර්ථකත්ව
දොෂප්‍රවාදමමෘජන්නගනිම්නගානාම්.

---

27. ක්ෂණෙන, ඇසිල්ලකින්; ආස්තීර්ණතල්ප, යහන්අතුළ; රචිතාවසථඃ, රචනාකළ නිවාස ඇති; කෘතනවප්‍රතිකර්ම, කරණලද අලුත් පළඳනා පිළියමින්; කාම්‍යඃ, මිනිසුන් කැමතිකරවන්නාවූ; අඛින්නමතිඃ, අශ්‍රාන්තවූ හෙවත් විඩාවට නොපැමිණි සිත්ඇති; වෙශ්‍යාජනඃ, ගණිකා ජනතෙම; ඛින්නාන්, ඛෙද ප්‍රාප්තවීමෙන් හෙවත් මාර්ග පරිශ්‍රමයෙන්; ආපතතඃ, එන්නාවූ; මනුෂ්‍යාන්, මිනිසුන්; චිරනිවිෂ්ටඃඉව, බොහෝකල් නවතින ලද්දක්මෙන්; උපචාරෛඃ, ශීතාම්බු තාම්බූලදනාදී උපචාර විධිවලින්; ප්‍රත්‍යග්‍රහීත්, වශඟකර ගත්තේය; (සිත් ගත්තේයයි සේයි.)

**වෙශ්‍යාජනඃ, මනුෂ්‍යාන්, උපචාරෛඃ, ප්‍රත්‍යග්‍රහීත්,** යනු මෙහි, ක්‍රි- සි. ප්‍රත්‍යග්‍රහීත්, යන තන්හි, ප්‍රතිපූර්ව, ග්‍රහ, උපාදනෙ, ධාතුවෙන්, භූතාර්ථ ලුඞ්- දිප් ප්‍රත්‍යයි, **උත්ප්‍රෙක්ෂාලංකාරයි.**

28. සෛන්‍යාඃ, සෙනාවෙහිවූ ජනයෝ; නගනිම්නගානාම්, ගිරිනදීන්ගෙ; ශ්‍රියාම්, ශොභාවන්; අනුපභොග, නොවැලඳීමෙන් වන්නාවූ; නිරර්ථකත්වදොෂ, නිෂ්ප්‍රයෝජනත්ව දොෂයමවූ; ප්‍රවාදම්, ජනාපවාදය හෙවත් නින්දාව; අමෘජන්, නොපිරිමදින්නේ හෙවත් නිගාවට නොපැමිණෙමින්; සස්නුඃ, ස්නානයකළහ; පයඃපපුඃ, (එසේම) පැන්පීහු; අම්බරාණි, නිවාසනපාරුපනාදි සාටකයන් හෙවත් වස්ත්‍රයන්; අනෙනිජුඃ, සේදූහ; ධෘත, ධරණලද; විකාසි, ප්‍රබුද්ධවූ; විසප්‍රසූනාඃ, පියුම් ඇත්තාහු; බිසං, නෙළුඹල; ජක්ෂුඃ, භක්ෂණයකළහ.

**සෛන්‍යාඃ, සස්නුඃ,** යනුද, **පයඃපපුඃ,** යනුද, **අම්බරාණි අනෙනිජුඃ,** යනුද, **බිසං, ජක්ෂුඃ,** යනුද, මෙහි, ක්‍රි- සි. හැමතැනම, සෛන්‍යාඃ, යනු ම උක්තකර්තෘපදයි සස්නුඃ, යන තන්හි, 'ස්නා' ශෞචෙ, ධාතුවෙන් පරොක්ෂලිට්-උස්, ප්‍රත්‍යයි, පපුඃ, යනතන්හි, පාඞ්, පානෙ ධාතුවෙන් එසේම, උස්, ප්‍රත්‍යයි, ජක්ෂුඃ, යන තන්හි, ඝස, අදනෙ (භක්ෂණෙ,) ධාතුවෙන්, එසේම, උස්, යි, අනෙනිජුඃ, යන තන්හි, නිජිර්, ශෞචෙ, ධාතුවෙන් එසේම, උස් ප්‍රත්‍යයි, **වාක්‍යාර්ථහෙතුකකාව්‍යලිඞ්ගාලංකාරයි.**

29. නාභිහ්‍රදෛඃ පරිගෘහීතරයාණි නිම්නෛඃ
ස්ත්‍රීණාං වෘහජ්ජඝනසේතුනිවාරිතානි,
ජග්මුර්ජලානි ජලමණ්ඩුකවාද්‍යවල්ගු
වල්ගද්ඝනස්තනතටස්ඛලිතානි මන්දම්.

30. ආලොලපුෂ්කරමුඛොල්ලසිතෛ'රභීක්ෂ්ණ
මුක්ෂාංබභූවු'රභිතො වපුරම්බුවර්ෂෛඃ,
ඛෙදායතශ්වසිතවෙගනිරස්තමුග්ධ
මූර්ධන්‍යරත්නනිකරෛ'රිව හාස්තිකානි.

---

29. යත්‍ර, යම් ගිරිනදියෙක්හි; ස්ත්‍රීණාං, කාන්තාවන්ගෙ; නාභිහ්‍රදෛඃ, නැබ නමැති තඩාගවලින්; පරිගෘහීත, අවුරණලද්දවූ; රයාණි, වේගඇති; වෘහජ්ජඝනසේතු, මහත් දුවන් නමැති හෙයින්; නිවාරිතානි, වළකනලද ගමන්ඇති; ජලමණ්ඩුකවාද්‍ය, ජලමණ්ඩුක ප්‍රහාර වාද්‍යයෙන්; වල්ගු, මනොඥවූ; වල්ගද්, සැලෙන්නාවූ; ඝන ඝාඪවූ; ස්තනතටස්ඛලිතානි, තන තෙලෙහි පැකිලෙනලද; ජලානි, ජලයෝතුමූ; මන්දම්, මඳව; ජග්මුඃ, ගියාහුය.

**ජලානි, මන්දං, ජග්මුඃ,** යනු මෙහි, ක්‍රි- යි. ජග්මුඃ, යනතන්හි ගම්ඎ, ගතෞ, ධාතුවෙන්, පරොක්ෂලිට්, උස්, ප්‍රත්‍යයි, ජලමණ්ඩුක වාද්‍ය, යන්න සම්බන්ධව, ටීකායෙහි, 'ජලමෙවමණ්ඩුකවාද්‍යම්' වාද්‍ය විශෙෂඃ, ජලමෙකෙන පාණිනොත්ථාපිතමපරෙණ, තාඩිතං, මණ්ඩුක වද්ධ්වනතීතිප්‍රසිද්ධම්, යනු කී හෙයින්, එක් අතකින් ජලය ඔසවන ලදුව අනික් අතින් තළනලද්දේ, මඬුවෙකුමෙන් ශබ්දකෙරේ යයි ප්‍රසිද්ධ එනම් වාද්‍ය විශෙෂයයි දතයුතුයි. **කාව්‍යලිඞ්ගාලඞ්කාරයි.**

30. හාස්තිකානි, හස්තිසමූහයෝතුමූ; ආලොල, අලලන ලද්දවූ පුෂ්කරමුඛ, ශුණ්ඩාමුඛයෙන්; උල්ලසිතෛඃ, විසුරුවනලද; අම්බුවර්ෂෛඃ, දියවැසි කාරණකොටගෙණ; ඛෙද, මංවිඩායෙන්හට ගත්තාවූ; ආයතශ්වසිතවෙග, දික්වූ සුසුම් වේගයෙන්; නිරස්ත, නික්මෙනලද; මුග්ධ, සොඳුරුවූ; මූර්ධන්‍යරත්නනිකරෛඃ ඉව, මස්තකයෙහිවූ රුවන් සමූහයෙන් මෙන්; වපුඃ, ශරීරයන්; අභීක්ෂ්ණං, නිරන්තරයෙන්; උක්ෂාංබභූවුඃ, සෙවනය කළහ.

**හාස්තිකානි අභීක්ෂ්ණං, වපුඃ, උක්ෂාංබභූවුඃ,** යනු, මෙහි, ක්‍රි- යි උක්ෂාංබභූවුඃ, යන තන්හි, උක්ෂ, සෙචනෙ, ධාතුවෙන්, ආම් ප්‍රත්‍යය හා, භූධාතුවනු ප්‍රයොගයෙහි, පරොක්ෂලිට්- උස් ප්‍රත්‍යයි **උත්ප්‍රේක්ෂාලඞ්කාරයි.**

31. යෙ පක්ෂිණඃ ප්‍රථමමම්බුනිධිං ගතාස්තෙ
යෙ'පීන්ද්‍රපාණිතුලිතායුධලූනපක්ෂාඃ,
තෙ ජග්මුරද්‍රිපතයඃ සරසීර්විගාඪුං
මාක්ෂිප්තකෙතුකුථසෛන්‍යගජච්ඡලෙන.

32. ආත්මානමෙව ජලධෙඃ ප්‍රතිබිම්බිතාඞ්ග
මූර්මෞ මහත්‍යභිමුඛාපතිතං නිරීක්ෂ්‍ය,
ක්‍රොධාදධාවදපභීරභිහන්තුමන්‍ය
නාගාභියුක්ත ඉව යුක්තමහො මහෙභඃ.

---

31. **පක්ෂිණඃ**, පක්ෂපත්‍ර ඇත්තාවූ; **යෙ**, යම් පර්වත කෙනෙක් වූද; **තෙ**, ඔව්හු; **ප්‍රථමං**, පළමුකොට; **අම්බුනිධිං**, මහසයුරකරා; **ගතාඃ**, ගියාහුය; **යෙඅපි**, යම් පර්වත කෙනෙකුත්; **ඉන්ද්‍රපාණි**, ශක්‍රයාගෙ හස්තයෙන්; **තුලිත**, ප්‍රේරිතවූ; **ආයුධ**, අවියෙන්; **ලූනපක්ෂාඃ**, සිඳිනලද පියාපත් ඇත්තාහුද; **තෙඅද්‍රිපතයඃ අපි**, ඒ පර්වතරාජයොත්; **ආක්ෂිප්ත**, අපනීතවූ හෙවත් පහකරණලද්දවූ; **කෙතුකුථ**, කෙහෙලි හා පිට අතුරණ පලස්ඇති; **සෛන්‍යගජච්ඡලෙන**, සෙන්හි වූ හස්තීන්ගේ ව්‍යාජයෙන්; **සරසීඃ**, තටාකයන්ට; **විගාඪුං**, බස්නාපිණිස; **ජග්මුඃ**, ගියාහ.

**තෙඅද්‍රිපතයඃ, අපිසෛන්‍යගජච්ඡලෙන, සරසීඃ, ජග්මුඃ,** යනු, මෙහි, ක්‍රි- සි. **ජග්මුඃ**, යන තන්හි, ගම්ඍ, ගතෞ, ධාතුවෙන්, පරොක්ෂලිට්- උස්, ප්‍රත්‍යසි, **අපහ්නුති උත්ප්‍රෙක්ෂාසංකරයි.**

32. **මහෙභඃ**, හස්තිරාජතෙමේ; **ජලධෙඃ**, සාගරයාගෙ; **මහති ඌර්මෞ**, මහත්වූ තරඞ්ගයෙහි; **ප්‍රතිබිම්බිතාඞ්ගම්**, පිළිබිඹුපත් අවයවඇති; **අභිමුඛාපතිතං**, ඉදිරියට පැමිණි; **ආත්මානංඑව**, තමාම; **නිරීක්ෂ්‍ය**, බලා; **අන්‍යනාග**, ප්‍රතිවිරුද්ධ හස්තියෙකු හා; **අභියුක්තඃ ඉව**, අභිමුඛව යෙදුනෙකුමෙන් හෙවත් ප්‍රතිවිරුද්ධ වූවෙකුමෙන්; **අපභීඃ**, පහවූ බියඇත්තේ; **ක්‍රොධාත්**. කෝපයෙන්; **අභිහන්තුං** නසනු පිණිස; **අධාවත්**, දිවී; **අහො**, මේ පුදුමයෙක; **යුක්තං**, හෙද මහෙභයාට යොග්‍යවෙයි.

**මහෙභඃ, ක්‍රොධාත් (නම්) අභිහන්තු'මධාවත්,** යනු, මෙහි, ක්‍රි- සි. **අධාවත්**, යන තන්හි, ධාව, ජවෙ, (ශීඝ්‍රගතෞච) යන ධාතුවෙන්, අනද්‍යතනාතීතලඞ්, දිප්, ප්‍රත්‍යසි, **උත්ප්‍රෙක්ෂා භ්‍රාන්තිමදලංකාර සංකරය.**

33. නාදත්තුමන්‍යකරිමුක්තමදාම්බුතික්තං
ධූතාඞ්කුශෙන න විහාතුමපීෂ්‍යතාම්භඃ,
රුද්ධෙ ගජේන සරිතඃ සරුෂාවතාරෙ
රික්තොදපාත්‍රකරමාස්ත චිරං ජනෞඝඃ.

34. පන්ථාන'මාශු විජහීහි පුරඃ ස්තනෞ තෙ
පශ්‍යන් ප්‍රතිවිරදකුම්භවිශඞ්කිචෙතාඃ,
ස්තම්බෙරමඃ පරිණිනංසුරසාවුපෛති
ෂිඞ්ගෛ'රගද්‍යත සසංභ්‍රමමෙව කාචිත්.

---

33. අන්‍යකරි, අන්‍ය ඇතා විසින් හෙවත් ප්‍රතිගජයා විසින් මුක්ත, මුදනලද නොහොත් ඉසිනලද; මදම්බු, මදජලයෙන්; තික්තං, සුගන්ධවත්වූ; අම්භඃ, ජලය; ආදත්තුං, ගන්නටද; විහාතුං, හරින්නටද; නඉෂ්‍යතා, නොකැමැතිවූ; ධූතාඞ්කුශෙන, හරනලද අඞ්කුශ ඇති; සරුෂා, කෝප සහිතවූ; ගජේන, හස්තියා විසින්; සරිතඃ, ජලාශයාගෙ; අවතාරෙ අවතරණස්ථානය හෙවත් තීර්ථය; රුද්ධෙ, ආවරණය කළකල්හි; ජනෞඝඃ, ජනසමූහතෙම; රික්තොද පාත්‍රකරං, හිස්වූ පැන්බඳුන්ගත් ඇතිව; චිරං, බොහෝ වේලාවක්; ආස්ත, හුන්නේය.

**ගජේන, සරිතඃ, අවතාරෙ, රුද්ධෙ, ජනෞඝඃ, රික්තොද පාත්‍රකරං, චිරමාස්ත,** යනු මෙහි, ක්‍රි-සි. ආස්ත, යන තන්හි, ආස, උපවෙශනෙ, ධාතුවෙන්, අනද්‍යතනාතීත, ලඞ්- තන්, ප්‍රත්‍යයි. **ස්වභාවොක්ති අලංකාරයි.**

34. පන්ථානං, මාර්ගය; විජහීහි, හරුව; පුරඃ, ඉදිරියෙහිවූ; තෙ, තීගෙ; ස්තනෞ පියවුරුදෙක; පශ්‍යන්, දක්නේ; ප්‍රතිවිරද, ප්‍රතිවිරුද්ධ හස්තියෙකුගෙ; කුම්භවිශඞ්කිචෙතාඃ, කුම්භයයි සැකකළ සිත් ඇති; අසෞ ස්තම්බෙරමඃ, ඒ හස්තිතෙමේ; පරිණිනංසුඃ, සරසටපහරණු කැමතිව; උපෛති, එළඹේයයි; ෂිඞ්ගෛඃ, කාමුකයන් විසින්; කාචිත්, කිසියම් අඟනක්තොම; සසංභ්‍රමංඑව, යුහුසුළුවම; අගද්‍යත, කියනලද්දීය.

**[illegible], පන්ථානං, විජහීහි,** යනුද, **අසෞ ස්තම්බෙරමඃ, පරිණිනංසුඃ, උපෛති,** යනුද; **ෂිඞ්ගෛඃ, කාචිත්, සසංභ්‍රමං, එව, අගද්‍යත,** යනුද මෙහි, ක්‍රි- සි. විජහීහි, යන තන්හි, විපූර්ව, ඔහාක්, ත්‍යාගෙ; ධාතුවෙන්, ආශීඃ ප්‍රෙරණලොට්, හි, ප්‍රත්‍යයි, උපෛති, යන තන්හි, උප, පූර්ව, ඉණ්, ගතෞ, ධාතුවෙන්, 'යාවත්පුරානිපාතයොර්ලට්' යනුවෙන්, භවිෂ්‍යදර්ථයෙහිලට්- තිප්, ප්‍රත්‍යයි, අගද්‍යත, යන තන්හි, ගද, ව්‍යක්තායාම්, වාචි, ධාතුවෙන්, අනද්‍යතනාතීතලඞ්- තන්, ප්‍රත්‍යයි, **කාව්‍යලිංගාලංකාරයි.**

35. කිණ්ණිං ගතෝ'රනුකපොලමනෙකපානාං
හස්තෛර්විගාඪමදතාපරුජඃ ශමාය,
ආකර්ණමුල්ලසිත'මම්බුවිකාසිකාශ
නීකාශමාප සමතාං සිතචාමරස්‍ය.

36. ගණ්ඩූෂ'මුජ්ඣිතවතා පයසඃ සරොෂං
නාගෙන ලබ්ධපරවාරණමාරුතෙන,
අම්භොධිරෝධසි පෘථුප්‍රතිමානභාග
රුද්ධොරුදන්තමුසලප්‍රසරං නිපෙතෙ.

---

35. අනෙකපානාං, හස්තීන්ගෙ; විගාඪ, ප්‍රරූඪවූ හෙවත් නැගූනාවූ; මදතාපරුජඃ, මදසන්තාපරොගයාගෙ; ශමාය, ශමනය පිණිස හෙවත් සංසිඳීම පිණිස; ගතොඃ,සෙමින්; අනුකපොලං, කොපුල්හි; හස්තෛඃ, අත්වලින්; කිණ්ණං, ප්‍රක්ෂිප්තවූ හෙවත් බහනලද; ආකර්ණ, කර්ණාන්තය දක්වා; උල්ලසිතං, උත්පතිතවූ නොහොත් උසස්ව බබලන්නාවූ; විකාසි, විකසිතවූ; කාශනීකාශං, කශමල් වැනිවූ; අම්බු, ජලයතෙම; සිතචාමරස්‍ය ශ්වෙතචාමරයක්හුගෙ; සමතාං, සදෘශබවට; ආප, පැමිණියේය,

**අම්බු, සිතචාමරස්‍ය, සමතා'මාප,** යනු මෙහි, ක්‍රි- සි. ආප, යන තන්හි, අප. ප්‍රාපණෙ, ධාතුවෙන්, පරොක්‍ෂලිට්- ණප්, ප්‍රත්‍යසි, **උපමා ලංකාරයි**

36. ලබ්ධ, ලබනලද; පරවාරණ, විරුඬ හස්තීහුගෙ හෙවත් රිපුගජයාගෙ; මාරුතෙන, මද සුවඳවත් සුලංඅැ ධි; සරොෂං, එහෙයින්ම කෝපසහිතවූ; පයසඃ, ජලයාගෙ හෙවත් දියපිළිබඳවූ; ගණ්ඩූෂං, මුඛපූරණය; උජ්ඣිතවතා, හරණලද; නාගෙන, හස්තිරාජයා විසින්; අම්භොධිරෝධසි, මහාසාගර තීරයෙහි; පෘථු, මහත්වූ; ප්‍රතිමානභාග, දෙදළමැදපියසින්; රුඬාඃ, අවුරණලද්දේ; උරු, විසාලවූ දන්තමුසල, මොහොල්වැනි දන්තයන්ගෙ; ප්‍රසරං, පැතිරීම් ඇතිව; නිපෙතෙ, වැටීමයි (වැටීමවී යයි සේයි.)

**නාගෙන, අම්භොධිරෝධසි, පෘථු- ප්‍රසරං, නිපෙතෙ,** යනු; මෙහි, ක්‍රි- සි. නිපෙතෙ, යන තන්හි, නිපූර්ව, පත්ඝ, පත්නෙ, ධාතුවෙන්, පරොක්‍ෂලිට්- භාවයෙහි, එ, ප්‍රත්‍යසි, ක්‍රොධවෙගාදලබ්ධරොධාඃ, ප්‍රභෘත්‍ය, පාරවශ්‍යාත්, සවයං, චාධොමුඛාඃ, පපාතෙන්‍ය ඊඃ, ක්‍රොධාන්‍ධාඃ, කිං, න කුර්වන්තීතිභාවඃ, යනු ටීකායි. (මෙහි භාවය සුබොධයි.) **රූපකමිශ්‍ර ස්වභාවොක්ති අලංකාරයි.**

37. දානං දදත්‍යපි ජලෛඃ සහසාධිරූඪෙ
කො විද්‍යමානගතිරාසිතු'මුත්සහෙත,
යද්දන්තිනඃ කටකටාහතටාන්මිමඞ්ක්ෂො
ර්මඞ්ක්ෂූදපාති පරිතඃ පටලෛ'රලිනාම්.

38. අන්තර්ජලෞඝ'මවගාඪවතඃ කපොලෞ
හිත්වා ක්ෂණං විතතපක්ෂතිරන්තරීක්ෂෙ,
ද්‍රව්‍යාශ්‍රයෙෂ්වපි ගුණෙෂු රරාජ නීලො
වර්ණඃ පෘථග්ගත ඉවාලිගණො ගජස්‍ය.

---

37. දානං, ධනය දෝහෝ නොහොත් හස්තිමදය, දදතිඅපි, දෙනකල්හිදු; සහසා, නිකරුණේ; ජලෛඃ. නීචයන් විසින් දෝහෝ නොහොත් ජලයන් විසින්; අධිරූඪෙ, ආක්‍රාන්තවූ කල්හි; විද්‍යමාන ගතිඃ, ගත්‍යන්තරවත්වූ දෝහෝ නොහොත් සමර්ථවූ; කඃ කවරනම් පුරුෂයෙක් තෙම; ආසිතුං, හිඳිනට; උත්සහෙත, උත්සාහකරන්නේද,යත්; යම්හෙයකින්, මිමඞ්ක්ෂොඃ, දියෙහි ගැලෙනු කැමතිවූ; දන්තිනඃ, හස්තිහුගෙ; කට, කොපුල්තල නමැති; කටාහතටාත්, එනම් බඳුන් වෙසෙසින් (කටාරමින් යයි සේයි) අලිනාම් පටලෛඃ, භෘඞ්ගපන්තීන් විසින්; පරිතඃ, හාත්පසින්; මඞ්ක්ෂු, වහා; උදපාති, ඉගිලයාමයි.

**ජලෛ'රධිරූඪෙ, කඃආසිතු'මුත්සහෙත,** යනුද, **අලිනාං පටලෛඃ,** කටකටාහතටාත්, මඞ්ක්ෂූදපාති, යනුද, මෙහි, ක්‍රි- සි. උත්සහෙත, යන තන්හි, උත්පූර්ව, සහ, මර්ෂණෙ, ධාතුවෙන්, විධි සංභාවන ලිඞ්- ඊත, ප්‍රත්‍යයි, උදපාති, යන තන්හි, උත්පූර්ව, පත්ඣ, පතනෙ, ධාතුවෙන් භූතාර්ථලුඞ්- භාවයෙහි, තන්, ප්‍රත්‍යයි, **සාමාන්‍ය සමර්ථනරූපවූ අර්ථාන්තරන්‍යාසයි**

38. අන්තර්ජලෞඝම්, ජලප්‍රවාහාභ්‍යන්තරයෙහි; අවගාඪවතඃ, ප්‍රවිෂ්ටවූ හෙවත් බැසගැලුණාවූ; ගජස්‍ය, හස්තිහුගෙ; කපොලෞ, කොපුල්දෙක; හිත්වා, හැර; ක්ෂණං, ඇසිල්ලක්; අන්තරීක්ෂෙ, අහසෙහි; විතතපක්ෂතිඃ, පතුරුවනලද පියාපත් සමූහඇති; අලිගණඃ, භෘඞ්ග සමූහතෙම; ගුණෙෂු, ගුණයන්; ද්‍රව්‍යාශ්‍රයෙෂුඅපි, රූපාදිද්‍රව් ඇසිරුකල්හිදු; නීලඃවර්ණඃ, නීලවර්ණයතෙම; පෘථග්ගතඃඉව, වෙන්වී ගියාක්මෙන්; රරාජ, බැබලී.

**නීලඃවර්ණඃ පෘථග්ගතඃඉවඅලිගණඃරරාජ,** යනු මෙහි, ක්‍රි-සි රරාජ, යන තන්හි, රාජෘ, දීප්තෞ ධාතුවෙන්, පරොක්ෂලිට්- ණප්, ප්‍රත්‍යයි, **උත්ප්‍රෙක්ෂාලංකාරයි**

39. සංසර්පිභිඃ පයසි ගෛරිකරේණුරාගෛ-
රම්භොජගර්භරජසාඞ්ගනිෂඞ්ගිණා ච,
ක්‍රීඩොපභොග'මනුභූය සරින්මහෙභා
වන්‍යොන්‍ය : ස්ත්‍රපරිවර්තමිව ව්‍යධත්තාම්.

40. යාං චන්ද්‍රකෛර්මදජලස්‍ය මහානදීනාම්
නෙත්‍රශ්‍රියං විකසතො විදධුර්ගජෙන්ද්‍රාඃ,
තාං ප්‍රත්‍යවාපුරවිලම්බිත'මුත්තරන්තො
ධෞතාඞ්ගලග්නනවනීලපයොජපත්‍රෛඃ.

---

39. සරින්මහෙභෞ, ගඞ්ගා ගිජිඳු යන දෙදෙන; පයසි, දියෙහි සංසර්පිභිඃ, ඇතුකෙරෙන් පැතිරෙණ; ගෛරිකරේණුරාගෛඃ, ගෛරික රජස් සමූහය කාරණකොට ගෙණද; අඞ්ගනිෂඞ්ගිණාච, ශරීරසක්තවූ හෙවත් ඇඟ ඇලෙණාවූ; අම්භොජගර්භරජසාව, පියුම් ගැබිහිවූ රජස් කාරණකොට ගෙණද හෙවත් පියුම්රේණු කාරණකොට ගෙණද; ක්‍රීඩොපභොගං, ලීලා සංභෝගය; අනුභූය, අනුභවකොට; අන්‍යොන්‍ය, ඔවුනොවුන්ගෙ; වස්ත්‍රපරිවර්තං, වස්ත්‍රයන් පෙරළා ගැණීම; ව්‍යධත්තාමිව, කළවුන් මෙනි.

**සරින්මහෙභෞ, අන්‍යොන්‍යවස්ත්‍රපරිවර්තං, ව්‍යධත්තාමිව,** යනු මෙහි, ක්‍රි- සි. ව්‍යධත්තාම්, යන තන්හි, විපූර්ව ධාඤ්, ධාරණපොෂණයොඃ, ධාතුවෙන්- අනද්‍යතනාතීතපරස්මෛපදිකද්විවචන තාම්, ප්‍රත්‍යසි, **උත්ප්‍රෙක්ෂා ලඞ්කාරයි.**

40. ගජෙන්ද්‍රාඃ, හස්තිරාජයෝ තුමූ; විකසතඃ, හාත්පස දියෙහි පැතිරෙන්නාවූ; මදජලස්‍ය, මදජලයාගෙ; චන්ද්‍රකෛඃ, සඳැස් පිල් වැනි මඬුලුවලින්; මහානදීනාම්, මහාගඞ්ගාවන්ගෙ; යාංනෙත්‍රශ්‍රියං, යම් නෙත්‍ර ශෝභාවක්; විදධුඃ, කළාහුද; තාං, ඒ නෙත්කැළුමට; උත්තරන්තඃ, දියෙන් එතරවන්නාහු හෙවත් දියෙන් ගොඩට නගින්නාහු; ධෞතාඞ්ග, දෙවිනාලද ඇඟෙහි; ලග්න, ඈසක්තවූ හෙවත් ඇළුණාවූ; නවනීලපයොජපත්‍රෛඃ, අලුත් මානිල්මල්පෙති කාරණකොටගෙණ; අවිලම්බිතං, සීඝ්‍රවම; ප්‍රත්‍යවාපුඃ, පෙරළා පැමිණියාහ.

**ගජෙන්ද්‍රාඃ, අවිලම්බිතං, ප්‍රත්‍යවාපුඃ,** යනු මෙහි, ක්‍රි- සි. ප්‍රත්‍යවාපුඃ, යන තන්හි, ප්‍රතිඅවපූර්ව, අප, ප්‍රාපණෙ, ධාතුවෙන්, පරොක්ෂ ලිටි- උස්, ප්‍රත්‍යසි, **පරිවෘත්ති අලංකාරයි**

'සමත්‍යූනාධිකානාංච් යදවිනිමයො භවෙත්,
සාකාංසමාධිකන්‍යූනෛඃ පරිවෘත්ති'රලඞ්කෘතා'

යනු තල්ලක්ෂණයි.

41. ප්‍රත්‍යත්‍යදන්ති නිශිතාඞ්කුශදූරභින්න
නිර්‍යාණනිර්‍යදසෘජං චලිතං නිෂාදී,
රොද්ධුං මහෙභමපරිවෘඪිමානභාගා
දක්‍රාන්තිතො න වශමෙති මහාන්පරස්‍ය.

42. සෙව්‍යොපි සානුනය'මාකලනාය යන්ත්‍රා
නීතෙන වන්‍යකරිදනකෘතාධිවාසඃ,
නාභාජි කෙවලමභාජි ගජෙන ශාඛී
නාන්‍යස්‍ය ගන්ධ'මපි මානභෘතඃ සහන්තෙ.

---

41. ප්‍රත්‍යත්‍යදන්ති, ප්‍රතිවිරුඬ හස්තියා කෙරෙහි; චලිතං, දුවන්නාවූ; නිශිතාඞ්කුශ, එහෙයින්ම තියුණු අකුස්සෙන්; දූර භින්න. දුඹකොට බිඳිනාලද; නිර්‍යාණ, අපාඞ්ග දෙශයෙන් හෙවත් කණ්මූලයෙන්; නිර්‍යත්, නික්මෙන්නාවූ; අසෘජං, ලෙහෙඇති; මහෙභං, ඇත්රජු; රොද්ධුං, වළක්වාගන්ට; නිෂාදී, ඇත්ගොව්තෙම; අපරිවෘඪිමානං, අසමර්ථභාවයට; අගාත්, පැමිණියේය; හි, ඒ එසේ මැයි; මහාන්, මහත් තැනැත්තේ හෙවත් බලවත් තෙමේ; ආක්‍රාන්තිතඃ, බලාත්කාරයෙන්; පරස්‍ය, මෙරමාගෙ; වශං, වශභයට; නඑති, නොපැමිණෙයි.

**නිෂාදී, මහෙභං, රොද්ධුං, අපරිවෘඪිමානං, අගාත්,** යනුද, **මහාන්, පරස්‍ය වශම්, න, එති,** යනුද, මෙහි, ක්‍රි- සි. අගාත්, යන තන්හි, ඉණ්, ගතෞ ධාතුවෙන්, භූතාර්, ලුඞ්- දිප්, ප්‍රත්‍යයි, 'ඉණො ගාලුඞි' යනුවෙන්, ඉණ් ධාතුහට ගාදෙශයි, නඑති යන තන්හි, ඉණ් ගතෞ, ධාතුවෙන්, වර්ත- ලට්- තිප්, ප්‍රත්‍යයි, **අර්ථාන්තරන්‍යාසාලංකාරයි.**

42. යන්ත්‍රා, ඇත්ගොව්වා විසින්; ආකලනාය, ඇතුබඳිනය පිණිස; සානුනයං; සමීපයට; නීතෙන, පමුණුවනලද්දවූ; ගජෙන, හස්තියා විසින්; වන්‍යකරි, වලැතුන්ගේ හෙවත් වෙනෙහිවූ ඇතුන්ගෙ; දන, මදජලයෙන්; කෘතාධිවාසඃ, කරණලද සුගන්ධ ඇති; ශාඛී, වෘක්ෂතෙම; නාභාජි, නොසෙවුනලදී; කෙවලං, හුදෙක්; අභාජි, බිඳිනලද්දේය; හි, ඒ එසේමැයි; මානභෘතඃ, අභිමානධාරීහු හෙවත් අහඞ්කාර ඇත්තාහු; අන්‍යස්‍ය, අනිකෙකුගෙ; ගන්ධංඅපි, ගන්ධයපවා; නසහන්තෙ, නොයිවසති; (අනිකක් කියනුම කවරේ දැයි සේයි

**ගජෙන, ශාඛී, නාභාජි,** යනුද, (**නෙනුගජෙන**) **ශාඛී, අභාජි** යනුද, **මානභෘතඃ, අන්‍යස්‍ය, ගන්ධමපිනසහන්තෙ,** යනුද, මෙහි, ක්‍රි- සි. නාභාජි, යන තන්හි, භජ, සෙවායාම්, ධාතුවෙන්, භූතාර්

43\. අද්‍රීන්ද්‍රකුඤ්ජචරකුඤ්ජරගණ්ඩකාෂ
සංක්‍රාන්තදන්තපයසො වනපාදපස්‍ය,
සේනාගජේන මථිතස්‍ය නිජප්‍රසූනෛ
ර්මේලෙ යථාගතමගාමි කුලෛරලීනාම්.

44\. නොචෛව ඡිද තරුතලෙෂු මමූසතදන්ති
මාධොරණෛ'රභිහිතාඃ පෘථුමූලශාඛා,
බන්ධාය විච්ඡිදුරිභාස්තරසා තමෛව
නෛවාත්මනීන'මථවා ක්‍රියතෙ මදාන්ධෛඃ.

---

ලුඞ්- කම්, තන්, ප්‍රත්‍යසි, අභාජි, යන තන්හි, හඤ්ජ්‍ය, ආමර්දනෙ, ධාතුවෙන්, භූතාර්ථලුඞ්- කම්- තන්, ප්‍රත්‍යසි, නසභනෙන, යනතන්හි සහ, මජ්ජණේ ධාතුවෙන්, වර්ත- ලට්- කර්තෘ- අනෙන, ප්‍රත්‍යසි, **අර්ථාන්තරන්‍යාස ලඞ්කාරයි.**

43\. අද්‍රීන්ද්‍ර, රෛවතක පර්වතරාජයාගෙ; කුඤ්ජචර, නිකුඤ්ජ යන්හි හැසිරෙන්නාවූ; කුඤ්ජර, හස්තීන්ගෙ; ගණ්ඩකාෂ, කොපුල් කැසීමෙන්; සංක්‍රාන්ත, සංක්‍රමනයවූ හෙවත් පැමිණි; දන්තපයසඃ, මදදියඇති; සේනාගජේන, සෙනඟෙහි ඇතු විසින්; මථිතස්‍ය, අලලනලද හෙවත් බිඳිනලද; වනපාදපස්‍ය, වන වෘක්ෂයාගෙ; නිජප්‍රසූනෛඃ, සියකුසුම් කාරණකොටගෙණ; මම්ලෙ, මිලානවීමයි(මැලවීමයයි සේයි ; අලීනාම්කුලෛඃ, භෘඞ්ග සමූහයන් විසින්; යථාගතම්, පැමිණි පරිද්දෙන්; අගාමි, ප්‍රයානය කරණලදී (යනලද්දේ යයි සේයි.)

**සේනාගජේන, නිජප්‍රසූනෛඃ, මම්ලෙ,** යනුද, **අලිනාම්කුලෛඃ, යථාගතම්, අගාමි,** යනුද, මෙහි, ක්‍රි- යි. මම්ලෙ, යන තන්හි, ම්ලෛ, කාන්තික්ෂයෙ, ධාතුවෙන්, පරොක්ෂලිට්, භාවයෙහි, එ, ප්‍රත්‍යසි, අගාමි, යන තන්හි, ගම්ඝ, ගතෞ, ධාතුවෙන්, භූතාර්ථ ලුඞ්- තන්, ප්‍රත්‍යසි, **සමාසොක්ති අලංකාරයි.**

44\. ඉභාඃ, හස්තීහු; යද, යම්කලෙක්හි; උච්චෛඃ, උන්නතවූ; තරුතලෙෂු. වෘක්ෂතලයන්හි හෙවත් තුරුයට; නමමුඃ, නොසිටියාහුද; තදනීම්, එකල්හි; ආධොරණෛඃ, හස්තිපාලකයන් විසින්; අභිහිතාඃ, මේ සිඳුවියයි කියනලද; පෘථු, මහත්වූ; මූලශාඛා, මුල්හිවූ අතු; බන්ධාය, තමා බඳනා පිණිස; තරසා, බලවත්වූ; ආත්මනාඑව, තමා විසින්ම; විච්ඡිදුඃ, සිඳිනාලදහ; අථවා, ඒ එසේමැයි; මදාන්ධෛඃ මදයෙන් අන්ධවූවන් විසින්; ආත්මනීනං, තමහට හිතයක්; නෛව ක්‍රියතෙ, නොකරණු ලැබේමැයි.

45. උෂ්ණොෂ්ණශීකරසෘජඃ ප්‍රබලොෂ්මණො'න්ත
රුත්ඵුල්ලනීලනලිනොදරතුල්‍යභාසඃ,
එකාන්විශාලශිරසො හරිචන්දනෙෂු
නාගාන්බබන්ධු'රපරාන් මනුජා නිරාසුඃ.

46. කණ්ඩූයතඃ කටභුවං කරිණොමදෙන
ස්කන්ධං සුගන්ධිමනුලිප්තවතා නගස්‍ය,
ස්ථූලෙන්ද්‍රනීලශකලාවලිකොමලෙන
කණ්ඨෙගුණත්ව'මලිනාං වලයෙන භෙජෙ.

---

**ඉභාඃ, නරානාලෙභු, න, ජමුඃ,** යනුද, **නදනිම්, ශෛලාඃ, ජරද්ද්‍රුමශාඛාඃ, චිච්ඡිදුඃ,** යනුද, **මදසෛකාඃ, ආතමනීනං, නෛවක්‍රියන්තෙ,** යනුද, මෙහි, ක්‍රි- යි. න, මමුඃ, යන තන්හි, මා, මානෙ, ධාතුවෙන්, පරොක්ෂලිට්- උස්, ප්‍රත්‍යයි, චිච්ඡිදුඃ, යන තන්හි, ඡිදිර්, ද්වෛධීකරණෙ, ධාතුවෙන්, පරොක්ෂලිට්- උස්, ප්‍රත්‍යයි, නෛවක්‍රියතෙ, යන තන්හි, ඩුකෘඤ්, කරණෙ, ධාතුවෙන්, වර්ත- ලට්- කර්මතෙ, ප්‍රත්‍යයි. '**ආතමනීනං**' යන තන්හි, '**ආත්මන්**' විශ්වජනභොගොත්තරපදත්ඛඃ, යනුවෙන්, හිතාර්ථයෙහි, ඛ, ප්‍රත්‍යයි, **අර්ථාන්තරන්‍යාසාලඞ්කාරයි.**

45. මනුජාඃ, මනුෂ්‍යයෝ තුමූ; උෂ්ණොෂ්ණ, උෂ්ණප්‍රකාරවූ; ශීකරසෘජඃ, දියබිඳු මුදන්නාවූ; **අන්තඃ,** ඇතුළත; ප්‍රබලොෂ්මණඃ, ප්‍රකර්ෂයෙන් වැඩුණු තැවිලිඇති; උත්ඵුල්ල, සුත්ඵුල්ලවූ; **නීලනලිනොදරතුල්‍යභාසඃ, මහනෙල්මල්ගැබ්වැනිකාන්තිඇති;** විශාලශිරසඃ **මහත් හිස්ඇති; එකාන්නාගාන්, සමහර හස්තීන්;** හරිචන්දනෙෂු, රත්සඳුන් තුරුහි; බබන්ධුඃ, බැන්ඳුහ; **අපරාන්, අන්‍යවූ; නාගාන්;** නාගයන් **හෙවත් සර්පයන්; නිරාසුඃ,** නෙරපූහ; **(විසිය නුදුන්නාහයි සේයි.)**

**මනුජාඃ, එකාන් නාගාන්, හරිචන්දනෙෂු,** බබන්ධුඃ, යනුද, **මනුජාඃ අපරාන්, නාගාන්, නිරාසුඃ,** යනුද, **මෙහි,** ක්‍රි- යි. බබන්ධුඃ, යන තන්හි, බධ, බන්ධනෙ, ධාතුවෙන්, පරොක්ෂලිට්- උස්, ප්‍රත්‍යයි, නිරාසුඃ, යන තන්හි, නිර් ආඞ්පූර්ව, **අස්,** භුවිධාතුවෙන්, උස්, ප්‍රත්‍යයි **ශ්ලෙෂාලංකාරයි.**

46. කටභුවං, ගණ්ඩස්ථලය **හෙවත්** කොපුල්තලය; කණ්ඩූයතඃ, කසන්නාවූ; කරිණඃ, ඇතුගෙ; **මදෙනසුගන්ධිං, මදයෙන් සුවඳවත්වූ;** නගස්‍ය, වෘක්ෂයාගෙ; ස්කන්ධං. ප්‍රකාණ්ඩයෙහි **හෙවත්** කඳෙහි; අනුලිප්තවතා, ආසක්තවූ **හෙවත් ඇලීම** ඇත්තාවූ; ස්ථූල, **මහත්වූ;** ඉන්ද්‍රනීලශකලාවලි, ඉඳුනිල්මිණිකඩ රැසක්මෙන්; කොම

47. නිර්ධූතවීතමපි බාලක'මුල්ලලන්තං
යන්තා ක්‍රමේණ පරිසාන්ත්වනතර්ජනාභිඃ,
ශික්ෂාවශෙන ශනෛර්වශ'මානිනාය
ශාස්ත්‍රං හි නිශ්චිතධියාං ක්ව න සිද්ධි'මෙති.

48. සන්වහං මහාන්තමුචිතං සහසා මුමොච
දන්තං දදවතිතරං සරසාග්‍රහස්තඃ,
බන්ධාපරාණි පරිතො නිගඩාන්‍යලාවීත්
ස්වාතන්ත්‍ර්‍යමුජ්වල'මවාප කරේණුරාජඃ.

---

ලෙන, මෑදුවූ හෙවත් මනහරවූ; අලිනාං වලයෙන, බමරවැල විසින් කණෙඃ, ශ්‍රිවයෙහි; ගුණත්වං, ගුණබව හෙවත් වළලුබව; හෙජේ, භජනය කරණලදී.

**අලීනාං, වලයෙන, කණ්ඨෙ, ගුණත්වං, භෙජෙ,** යනු, මෙහි, ක්‍රි- යි. භෙජෙ, යන තන්හි, භජ,සෙවායාම්, ධාතුවෙන්, පරොක්‍ෂලිට් එ, ප්‍රත්‍යයි, 'ලොපඃපවාං කිතෙ‍්‍ය, වාස්‍ය, යනුවෙන් එත්වපූර්වලොප යයි, **රොෂාදූෂකාලඞ්කාරයි.**

47. යන්තා, යන්තෘතෙම හෙවත් ඇත්ගොව්වා; නිර්ධූතවීතාං, පහකළ පාවිදිනා අකුසුඇති; උල්ලලන්තංඅපි, උත්පලවමාතවූද හෙවත් ඔබිනොබ පැන කෙළණාවූද; බාලකං, පස්හැවිරිදි ඇත් බිළිඳු; ශික්‍ෂාවශෙන, ස්වකීය ගජශාස්ත්‍රාභ්‍යාස වසයෙන්; ක්‍රමෙණ, පිළිවෙළින්; පරිසාන්ත්වනතර්ජනාභිඃ, උපලාලන හෙවත් නැලවීම් වලින් හා තර්ජනවලින්; ශනෛඃ, සෙමින්; වශං, තමන් වසඟ යට; ආනිනාය, පැමිණවීය; හි, ඒ එසේමැයි; නිශ්චිතධියාං, නිශ්චිත බුඩි ඇත්තන්ගෙ හෙවත් පඬුවන්ගෙ; ශාස්ත්‍රං, ශාස්ත්‍රඃතෙම; ක්ව, කොතන්හිනම්; සිද්ධිංනඑති, අභිමත කාර්‍ය්‍ය සිඩියට නොපැමිණේද හැමතන්හි කාර්‍ය්‍ය සිඩියට පැමිණේමැයි සේයි.

**යන්තා, බාලකං, ශික්‍ෂාවශෙන, ක්‍රමෙණ, ශනෛඃ, වශමානිනාය,** යනුද, **නිශ්චිතධියාං, ශාස්ත්‍රං, ක්ව, සිඩිං, න, එති,** යනුද, මෙහි. ක්‍රි- යි. ආනිනාය, යන තන්හි, ආඞ්පූර්‍ව, නී, ප්‍රාපණෙ. ධාතුවෙන්, පරොක්‍ෂලිට්- ණප්, ප්‍රත්‍යයි, නඑති, යන තන්හි, නඤ් පූර්‍ව ඉණ්, ගතෞ, ධාතුවෙන්, වර්ත- ලට්, තිප්, ප්‍රත්‍යයි. **අර්ථාන්තර න්‍යාසයි.**

48. කරේණුරාජඃ, හස්තිරාජ තෙම නොහොත් රජ තෙමේ; උජ්වලං, සිදිනාලද හැකිලිඇති දේහෝ නොහොත් බැබලීම්ඇති; ස්වාතන්ත්‍ර්‍යම්, සෙරිවාරිබවට හෙවත් සියකැමැත්තෙන් හැසිරෙණ සුලුබවට; අවාප, පැමිණීයේය; උචිතං, චිරපරිචිතවූ හෙවත්

49. ජඥෙ ජනෛර්මුකුලිතාක්ෂමනාදදානෙ
සංරබ්ධහස්තිපකනිෂ්ඨුරචොදනාභිඃ,
ගම්භීරවෙදිනි පුරඃ කවලං කරීන්ද්‍රෙ
මන්දෙ'පි නාම න මහානවගෘහ්‍ය සාධ්‍යඃ.

---

යොග්‍යවූ; මහානනංසනම්භං, මහත්වූ ආලානය ඇහෝ නොහොත් ජඩබව; සහසා, යුහුව; මුමොච, මිදුවේය (හළේයයි සේයි); **සරස,** රස සහිතවූ හෙවත් තෙත්වූ; අග්‍රහස්තඃ, සොඬඇත්තේ ඇහෝ නොහොත් ශ්‍රෙෂ්ඨවූ හස්තය ඇත්තේ; දන්තං, මදජලය ඇහෝ නොහොත් ධනය; අතිතරාං, අතිශයින්; දදෞ, දුන්නේය; පරිතඃ, හාත්පස්හි; බන්ධපරාණි, බඳනාලදපශ්චිමපාදඇති ඇහෝ නොහොත් අනුන් බඳනාලද; නිගඩාණි, හස්තිදමයන් ඇහෝ නොහොත් හැකිලි; අලාවීත්, සින්දේය.

**කරේණුරජඃ, සනම්භං, මුමොච,** යනුද, **සඃ, අතිතරාංදන මදදෞ,** යනුද, **සඃ, නිගඩානි, අලාවීත්,** යනුද, **සඃ, සඛානන් න්‍යාමවාප,** යනුද, මෙහි, ක්‍රි- යි. මුමොච, යන තන්හි, මුච්ලෘ, මොචනෙ, ධාතුවෙන්, පරොක්ෂලිට්- ණප්, ප්‍රත්‍යයි, අදදෞ යන තන්හි, ඩුදාඤ්, දානෙ, ධාතුවෙන්, පරොක්ෂලිට්- ණප්, ප්‍රත්‍යයි, අලාවීත්, යන තන්හි, ලූඤ්, ඡේදනෙ, ධාතුවෙන්, භූතාවිලුඞ් - දිප්, ප්‍රත්‍යයි, අවාප යන තන්හි, අවපූර්වී, අප, ප්‍රාපණෙ, ධාතුවෙන්, පරොක්ෂලිට්, ණප්, ප්‍රත්‍යයි, **ශ්ලෙෂාලඞ්කාරයි.**

49. ගම්භීරවෙදිනි, මදදුනුම්ඇති; කරීන්ද්‍රෙ, ඇත්රජු; සංරබ්ධ, නිපුණවූ; හස්තිපක, ඇත්ගොව්වාගෙ; නිෂ්ඨුරචොදනාභිඃ, කර්කශවූ තර්ජනවලින්; මුකුලිතාක්ෂං, වසනලද ඇස්ඇතිව; පුරඃ, ඉදිරියෙහි; කවලං, තණකබලය හෙවත් තෘණපිණ්ඩය; අනාදදානෙ, නොගන්නාකල්හි; මන්දෙ'පි, මුස්වූයේද; මහාන්, බලාධික තැනැත්තේ; අවගෘහ්‍ය, නිගාකොට; නසාධ්‍යඃනාම, නොසෑදිය හැක්කේ නමැයි; ජනෛඃ, ජනයන් විසින්; ජඥෙ, දන්නාලදී.

**මන්දෙ'පි, මහාන්, අවගෘහ්‍ය, න, සාධ්‍යඃනාම, ජනෛඃ, ජඥෙ,** යනු, මෙහි, ක්‍රි- යි. ජඥෙ, යන තන්හි, ඥා, අවබොධනෙ, ධාතුවෙන්, පරොක්ෂලිට්- කම්- එ, ප්‍රත්‍යයි, **කාව්‍යලිඞ්ගාලංකාරයි නොහොත් අර්ථාන්තරන්‍යාසයි.**

50. ක්ෂිප්තං පුරෝ න ජගෘහෙ මුහුරික්ෂුකාණ්ඩං
නාපෙක්ෂතෙ සම නිකාමොපගතාං කරෙණුම්,
සස්මාර වාරණපතිඃ පරිමීලිතාක්ෂ
මීච්ඡාවිහාරවනවාස මහොත්සවානාම්.

51. දුඃඛෙන භොජයිතු'මාශසිතා ශශාක
තුඞ්ගාග්‍රකායමනමන්ත'මනාදරෙණ,
උත්ක්ෂිප්තහස්තතලදත්තවිසාරපිණ්ඩ
ස්නෙහස්‍රුතිස්නපිතබාහුරිභාධිරාජම්.

---

50. වාරණපතිඃ, ගජරාජතෙම; පුරඃ, ඉදිරියෙහි; ක්ෂිප්තං, බහා තලද්; ඉක්ෂුකාණ්ඩං, උක්දණ්ඩ; නජගෘහෙ, නොපිළිගත්තේය; නිකාමොපගතාං, තමා වෙත එළඹසිටියාවූ; කරෙණුං, ඇතිනියද; නොපෙක්ෂතෙ'සම, අපේක්ෂා නොකෙළේය; (අථ, යළිදු;) පරිමීලිතාක්ෂං, වසා පියනලද නුවන් ඇතිව; ඉච්ඡාවිහාර, ස්වෙච්ඡා විහරණයෙන් හෙවත් සිය කැමැත්තෙන් විසීමෙන්; වනවාස, වෙනෙහි විසීමවූ; මහොත්සවානාම්, සණකෙළි; සස්මාර, සිහිකෙළේය.

**වාරණපතිඃ, ඉක්ෂුදණ්ඩං, නජගෘහෙ,** යනුද, **වාරණපතිඃ, කරෙණුං, නොපෙක්ෂතෙ,** යනුද, **වාරණපතිඃ, ඉච්ඡාවිහාරවනවාසමහොත්සවානාම්, සස්මාර,** යනුද, මෙහි, ක්‍රි- යි. ජගෘහෙ, යන තන්හි, ග්‍රහ, උපාදානෙ, ධාතුවෙන්, පරොක්ෂලිට්- එ, ප්‍රත්‍යයි, නොපෙක්ෂතෙ සම යන තන්හි, නඤ්උප, පූර්ව, ඊක්ෂ, දර්ශනාඞ්කණ යොඃ, ධාතුවෙන්, සම යන නිපාත යොගය හෙයින් අතීතකාලික ලට්- තෙ, ප්‍රත්‍යයි, සස්මාර, යන තන්හි, ස්මෘ, චින්තායාම්, ධාතුවෙන්, පරොක්ෂලිට්- ණප්, ප්‍රත්‍යයි, **කාව්‍යලිඞ්ගාලඞ්කාරයි.**

51. උක්ෂිප්ත, ඔසවනලද; හස්තතල, අත්තෙලෙහි; දත්ත, දෙනලද හෙවත් නිහිතවූ; විසාරපිණ්ඩ, හස්තිගෝචර පිණ්ඩයාගෙ; ස්නෙහස්‍රුති, ඝෘතාදි තෙල නිඃස්‍යන්දයෙන් හෙවත් ගිතෙල් ආදිය වැගිරීමෙන්; ස්නපිතබාහුඃ, නැවෙනලද අත්ඇති හෙවත් තෙමුණු අත්ඇති; ආශසිතා, කවන තැනැත්තේ; තුඞ්ගාග්‍රකායං, ස්වභාවයෙන් උන්නතවූ පූර්ව ශරීරය; අනාදරෙණ, අනදරින්; අනමන්තං, කබලග්‍රහණයට නොනමන්නාවූ; ඉභාධිරාජං, ඇත්රජු; දුඃඛෙන, දුකසේ; භොජයිතුං, අනුභවකරවන්ට; ශශාක, උත්සාහකෙළේය; (හස්තිතෙම ඇත්ගොව්වා කෙරෙහි කෝපයෙන් අහරගැන්මපිණිස වත් ශරීරය නොනමා අහඞ්කාරයෙන් සිටියේය යනු භාවයි.)

52. ශුක්ලාංශුකොපරචිතානි නිරන්තරාභිර්
වෙශ්මානි රශ්මිවිතතානි නරාධිපානාම්,
චන්ද්‍රාකෘතීනි ගජමණ්ඩලිකාභි'රුච්චෛර්
නීලාභ්‍රපඞ්ක්තිපරිවෙෂමිවාධිජග්මුඃ.

53. ගත්‍යූනමාර්ගගතයො'පි ගතොරුමාර්ගාඃ
සෛවරං සමාචකෘෂිරෙ භුවි වෙල්ලනාය,
දර්පොදයොල්ලසිතඵෙනජලානුසාර
සංලක්ෂ්‍යපල්‍යයනවර්ධ්‍රපදාස්තුරඞ්ගාඃ.

---

**ආශසිතා, ඉභාධිරාජං, දුඃඛෙන. භොජසිතාං; ශශාස, යනු** මෙහි, ක්‍රි- යි. ශශාස, යන තන්හි, ශාස්ඝ, ශාසෙතෟ, ධාතුවෙන්, පරොක්ෂලිට්- ණප්, ප්‍රත්‍යයි, **ස්වභාවොක්ති නොහොත් කාව්‍ය ලිඞ්ගාලංකාරයි.**

52. ශුක්ලාංශුකෛඃ, ශ්වෙත වස්ත්‍රයෙන්; උපරචිතානි, කරණ ලද්දවූ ඇහෝ නොහොත් සියුම් තෙජෝවයවයෙන්; උපරචිතානි. ව්‍යාප්තවූ; රශ්මි. රැහැනින් ඇහෝ නොහොත් රශ්මියෙන්; විතතානි, පතළාවූ; චන්ද්‍රාකෘතීනි, සඳමඬල බඳුවූ; නරාධිපානාම්, නිරිඳුන්ගෙ; වෙශ්මානි, ගෘහයෝතුමු; නිරන්තරාභිඃ, අතුරු නැත්තාවූ; උච්චෛඃ, උස්වූ; ගජමණ්ඩලිකාභිඃ, ඇත්මඬුලුවලින්; නීලාභ්‍රපඞ්ක්ති පරිවෙෂං, නිල්වලා පෙළින්වූ පිරිවෙස් මඬල ඇත්තන් බවට හෙවත් නිල්වලාපෙළින්වූ පරිවෙෂාතයට; අධිජග්මුඃ ඉව, ගියවුන් මෙන්වූහු.

**නරාධිපානාම්, වෙශ්මානි, ගජමණ්ඩලිකාභිඃ, නීලාභ්‍රපඞ්ක්තිපරිවෙෂං, අධිජග්මුරිව.** යනු, මෙහි, ක්‍රි- යි. අධිජග්මුඃ, යන තන්හී, අධිපූර්ව, ගම්ඝ, ගතෞ, ධාතුවෙන්, පරොක්ෂලිට් - උස්, ප්‍රත්‍යයි, ඉව, යනු- උපමාර්ථාව්‍යයි, **උත්ප්‍රෙක්ෂාලංකාරයි.**

53. ගත්‍යූන, විශිෂ්ටගමනින් හීනවූ; මාර්ගගතයඃ අපි, මාර්ගගමන් ඇත්තාහුද; ගතොරුමාර්ගාඃ, ගියාවූ දූරගමන් ඇත්තාහුද; දර්පොදය, එහෙයින්ම එඩිඋදාවෙන්; උල්ලසිත, නැංගාවූ හෝ උසස්ව බබලන්නාවූ; ඵෙනජලානුසාර, පෙනනැඟිසෝදියඅනුසරින්; සංලක්ෂ්‍ය, සැලකියයුතුවූ; පල්‍යයනවර්ධ්‍රපදාඃ, ආසනබන්ධ වර්මවරයන්ගේ අපගමයෙන්වූ සලකුණුඇති; තුරඞ්ගාඃ, අශ්වයෝ; භුවි, භූමියෙහි; වෙල්ලනාය, අඞ්ගපරිවර්තනය පිණිස; සෛවරං, මන්දවැ; සමාචකෘෂිරෙ, අදනා ලදහ; (අශ්වයන්ගෙ විඩා දුරුකිරීම පිණිස යී සේයි).

54. ආජිඝ්‍රති ප්‍රණතමූර්ධනි බාහ්ලිජෙ ශෙව
තස්‍යාඞ්ගසඞ්ගමසුඛානුභවොත්සුකායාඃ,
නාසාවිරෙකපවනොල්ලසිතං තනීයො
රොමාඤ්චතාමිව, ජගාම රජඃ පෘථිව්‍යාඃ

55. හෙම්නඃ ස්ථලීෂු පරිතඃ පරිවෘත්‍ය වාජී
ධූන්වන්වපුඃ ප්‍රවිතතායතකෙශපඞ්ක්තිඃ,
ජ්වාලාකණාරුණරුචා නිකරෙණ රෙණොඃ
ශෙෂෙණ තෙජස ඉවොල්ලසතා රරාජ.

---

**(සාරථිඃ) තුරඞ්ගාඃ භුවි, වෙල්ලනාශ, ශෛඛරං, සමාචකෘෂිරෙ**, යනු, මෙහි, ක්‍රි-.සි. සමාචකෘෂිරෙ, යන තන්හි, සංආඞ්පූර්, කෘෂ; ආකර්ෂණෙ, විලෙඛනෙච, යන ධාතුවෙන්, පරොක්‍ෂලිට්- කම්- ඉරෙ, ප්‍රත්‍යයි, **විරොධාභාසාලඞ්කාරයි**.

54. බාහ්ලිජෙ, එනම් ප්‍රදෙශයෙහි ජාතවූ; ප්‍රණමිතමූර්ධනි, ප්‍රණමිතවූ හෝ අවනතවූ හිස ඇති හෙවත් කෘතප්‍රණාමඇති; අශෙව. අශ්වයා; ආජිඝ්‍රති, ගඳගන්නාකල්හි හෙවත් සුඹුනාකල්හි; නාසාවිරෙක, නාසිකා සිදුරපිළිබඳවූ; පවන, නිඃශ්වාසමාරුතයෙන්; උල්ලසිතං, උත්කම්පිතවූ; තනීයඃ, ඉතා සිහින්වූ; රජඃ,රජස; තස්‍ය, ඒ අසුගෙ; අඞ්ගසඞ්ගම, ශරීර සංසර්ගයෙහි; සුඛානුභව, සුවවිඳීමෙහි; උත්සුකායාඃ, උකටලිවූ; පෘථිව්‍යාඃ, මිහිකතගෙ; රොමාඤ්චතාං, රොමෝද්ගමයට; ජගාම්ඉව, ගියාක්වැනි විය.

**රජඃ, පෘථිව්‍යාඃ, රොමාඤ්චතාං, ජගාම, ඉව,** යනු. මෙහි, ක්‍රි- සි. ජගාමඉව, යන තන්හි. ගම්ඤ, ගතෞ ධාතුවෙන්, පරොක්‍ෂ ලිට්, **ණප්**, ප්‍රත්‍යයි, ඉව යනු උත්ප්‍රෙක්‍ෂා ද්‍යොතකයි, **උත්ප්‍රෙක්‍ෂාලංකාරයි.**

55. හෙම්නඃස්ථලීෂු, ස්වර්ණ භූමීන්හි; පරිතඃ, හාත්පස; පරිවෘත්‍ය, පෙරළී; වපුඃ, ශරීරය; ධූන්වන්, රජස් හරණාපිණිස කම්පා කරන්නේ; ප්‍රවිතත, එහෙයින්ම විශ්ලිෂ්ටවූ; ආයතකෙශපඞ්ක්තිඃ, දික්වූ රෝම සමූහඇති; වාජී අශ්වතෙම; ජ්වාලාංකණ, පුලිඟුසේ හෙවත් ගිනිපුපුරුමෙන්; අරුණරුචා, රන්පැහැඇති; රෙණොඃ නිකරෙණ, රජස් සමූහයෙන්; උල්ලසතා, උසස්ව බබලන හෙවත් අතිශයින් උත්කටභාවයෙන් පිටතට නික්මෙන්නාවූ; තෙජසඃ, තේජස්හුගෙ; ශෙෂෙණඉව, අතිරෙකයෙන් මෙන්; රරාජ, බැබලී.

**වාජී, තෙජසඃ, ශෙෂෙණ, ඉව, රරාජ,** යනු, මෙහි ක්‍රි- සි. රරාජ, යන තන්හි, රාජෘ, දීප්තෞ, ධාතුවෙන්; පරොක්‍ෂලිට්, **ණප්**, ප්‍රත්‍යයි, **උත්ප්‍රෙක්‍ෂාලංකාරයි.**

56. දන්තාලිකාධරණනිශ්චලපාණියුග්ම
මර්ධොදිතො හරිරිවොදයශෛලමූර්ධ්නඃ,
ස්තොකෙන නාක්‍රමත වල්ලභපාල'මුච්චෛඃ
ශ්‍රීවෘක්ෂකී පුරුෂකොන්නමිතාග්‍රකායඃ.

57. රෙජෙ ජනෛඃ ස්නපනසාන්ද්‍රතරාර්ද්‍රමූර්ත්තිර්
දෙවෛරිවානිමිෂදෘෂ්ටිභිරීක්ෂ්‍යමානඃ,
ශ්‍රීසංනිධානරමණීයතරො'ශ්ව උච්චෛ
රුච්චෛඃශ්‍රවා ජලනිධෙ'රිව ජායමානඃ.

---

56. පුරුෂක, පුරුෂකනම් ස්ථානයෙහි ජනහෙයින් එනම් අසුන්ගෙ; උන්නමිත, උස්වැ සිටිනලද; අග්‍රකායඃ, ඉදිරි කයඇති; උදයශෛලමූර්ධ්නඃ, උදගිරි මුදුනෙන්; අර්ධොදිතඃ, අඩක් නැංගාවූ හෙවත් අඩක් උදවූ; හරිඃඉව, හිරුමෙන් සිටියාවූ; ශ්‍රීවෘක්ෂකී, ළය ග්‍රීවාදෙක්හි පිහිටි රොන් සළාඇති එනම් අශ්වතෙම; දන්තාලිකා ධරණ, මුවරැහැණ දැරීමෙහි; නිශ්චලපාණියුග්මං, නහවුරු අතුල් යුවලඇති; වල්ලභපාලම්, උතුම් අස්ගොව්වා; ස්තොකෙන, ස්වල්පය කින්; නාක්‍රමත, නොමැඩීය; (අභිභවනයකරන්ට නොහැකිවී යයි සේයි)

**ශ්‍රීවෘක්ෂකී, වල්ලභපාලං, ස්තොකෙන, නාක්‍රමත,** යනු මෙහි ක්‍රි-යි. නාක්‍රමත, යන තන්හි, නඤ් ආඞ්පූර්වී, ක්‍රම්, ගතෞ,ධාතුවෙන් අනද්‍යතනාතීතලඞ්- තන්, ප්‍රත්‍යයි, **උපමාලංකාරයි.**

මෙහි වනාහි ශ්‍රීවෘක්ෂකීනම් අසුගැණ ටීකායෙහි:- "අර්ධොදිත විශෙෂෙණ ද්‍රුවෙච්චරුන්නතඃ' ශ්‍රීවෘක්ෂඑව, ශ්‍රීවෘක්ෂකඃ, ආවර්තවිශෙෂඃ තවානශ්වඃ, ශ්‍රීවෘක්ෂකී,

'වක්ෂොභවාවර්තචතුෂ්ටයං ච කණ්ඨෙ භවෙද්‍යස්‍ය ච රොචමානඃ
ශ්‍රීවෘක්ෂකී නාම හයඃ සභර්තුඃශ්‍රීපුත්‍රපෞත්‍රාදි විවෘද්ධයෙ,ස්‍යාත්'

යනාදිය ලක්ෂණ වසයෙන්, සන්දර්ශිතයි.

57. ස්නපන, අභිෂිඤ්චනයෙන් හෙවත් ජලාභිෂෙකයෙන්; සාන්ද්‍රතරාර්ද්‍රමූර්ත්තිඃ, ඉතා ඝනවූ තෙත්ගතිඇති; අනිමිෂදෘෂ්ටිභිඃ, විශ්මයෙන් ඇසිපිය හෙළුම්රහිත නුවන්ඇති; ජනෛඃ, ජනයන් විසින්; දෙවෛඃඉව, දෙවියන් විසින් මෙන්; ඊක්ෂ්‍යමානඃ, බලනු ලබන්නාවූ; ශ්‍රීසංනිධාන, ශෝභාහුගෙ නොහොත් සිරිකතගෙ පිහිටීමෙන්; රමණීයතරඃ, ඉතා සිත්කළුවූ; උච්චෛඃ, උන්නතවූ; අශ්වඃ, අසුතෙම; ජලනිධෙඃ, සමුද්‍රයාගෙ; ජායමානඃ, උපන් ඇසිල් ලෙක්ඇති; උච්චෛඃශ්‍රවාඃඉව, උන්නතකීර්ත්තියක්මෙන් නොහොත් ශක්‍රයාගෙ එනම් අසුමෙන්; රෙජෙ, බැබලිණි.

58. අශ්‍රාවි භූමිපතිභිඃ ක්‍ෂණවීතනිද්‍රෛ
රශ්නන් පුරො හරිතකං මුද'මාදධානඃ,
ග්‍රීවාග්‍රලොලකලකිඞ්කිණිකානිනාද
මිශ්‍රං දධත්දශනචර්චුරශබ්දමශ්වඃ.

59. උත්ථාය දර්පචලිතෙන සහෙව රජ්ජ්වා
කීලං ප්‍රයත්නපරමානවදුර්ග්‍රහෙණ,
ආකුල්‍යකාරි කටකස්තුරගෙණ තූර්ණ
මශ්වෙති විද්‍රුතමනුද්‍රවතාශ්ව'මන්‍යම්.

---

**උච්චෛ'රශ්ව, උච්චෛඃශ්‍රවාඃ ඉව, රෙජෙ,** යනු මෙහි, ක්‍රි- සි. රෙජෙ, යන තන්හි, රාජෘ, දීප්තෞ, ධාතුවෙන්, පරොක්‍ෂලිට්- එ, ප්‍රත්‍යයි, **ස්වභාවොක්ති අලංකාරයි.**

58. පුරඃ, ඉදිරියෙහි; හරිතකං, නිල්තණ; අශ්නන්, බුදින්නාවූ ග්‍රීවාග්‍රලොල, එහෙසින්ම; ගෙලගලෙලෙනාවූ; කල, අව්‍යක්ත මධුරනාදඇති; කිඞ්කිණිකානිනාදමිශ්‍රං, කිකිණිහඬින්මුසුවූ; දශන, දන්තයන්ගෙ; චර්චුරශබ්දං, චර්චුර යන අනුකරණ ශබ්දය; දධත්, ධරන්නාවූ; මුදංආදධානඃ, සන්තොෂ ජනකවූ; අශ්වඃ, අශ්වතෙම; ක්‍ෂණවීතනිද්‍රෛඃ, එකෙණෙහි පහකළ නිදිඇති; භූමිපතිභිඃ, පෘථිවීශ්වරයන්ලවා; අශ්‍රාවි, ශෘතය හෙවත් හඬ ඇසීය (රජුන් විසින් අසුගෙ හඬ අසනලදූයි සේයි.)

**අශ්වඃභූමිපතිභිඃ, ශබ්දම'ශ්‍රාවි,** යනු මෙහි, ක්‍රි-සි ආශ්‍රාවි,යන තන්හි, ශෘඤ් ශ්‍රවණෙ, ධාතුවෙන්, භූතාර්ථලුඞ්- ණජ්, ප්‍රත්‍යය හා ප්‍රයොජකව්‍යාපාරාර්ථයෙහි 'ධාතොඃප්‍රෙරණෙ' (ණිඃ) යනුවෙන් ණි, ප්‍රත්‍යයි, **ස්වභාවොක්ති අලංකාරයි.**

59. දර්පචලිතෙන, ගර්වයෙන් සැලෙනාවූ; රජ්ජ්වාසහඑව, රැහැණ සමගම; කීලං, කණුව; උත්ථාය, උපුටා, තූර්ණං, වහා; විද්‍රුතං, දුවන්නාවූ; අන්‍යම්අශ්වම්, අන්අසෙකු; අශ්වාඉති, වෙළඹයයි; අනුද්‍රවතා, අනුව හෙවත් පසුපස්සේ දිවන්නාවූ; ප්‍රයත්නපර, අල්වාගැනීමෙහි තත්පරවූ; මානව, මිනිසුන් විසින්; දුර්ග්‍රහෙණ, අල්වාගත නොහැකිවූ; තුරඞ්ගෙණ, අසු විසින්; කටකං, කඳවුර; ආකුල්‍යකාරි, අවුල්කරණලදි.

**තුරඞ්ගෙණ, කටකං, ආකුල්‍යකාරි,** යනු මෙහි, ක්‍රි-සි. ආකුල්‍යකාරි, යන තන්හි, කෘඤ්, කරණෙ, ධාතුවෙන්, භූතාර්ථලුඞ්- කර්මි, තන්, ප්‍රත්‍යය හා ධාතුවෙන් පූර්වයෙහි, අභූතතද් භාවයෙහි, ච්වි, ප්‍රත්‍යයි, **ස්වභාවොක්තියි.**

60. අව්‍යාකුලං ප්‍රකෘත'මුත්තරධෙයකර්මි
ධාරාඃ ප්‍රසාධයිතු'මව්‍යතිකීර්ණරූපාඃ,
සිද්ධං මුඛෙ නවසු වීථිෂු කශ්චිදශ්වං
වල්ගාවිභාගකුශලො ගමයාංබභූව.

---

60 වල්ගාවිභාගකුශලඃ, තුදුස් වැදෑරුම් මුවරැහැන් හෙවත් කටකලියා විභාගයෙහි දක්‍ෂවූ; කශ්චිත්, කිසියම් වාහකයෙක් හෙවත් අස්ගොව්වෙක් තෙම; අව්‍යාකුලං, ත්‍රස්තනොවූ හෙවත් තැතිනොගත්තාවූ; ප්‍රකෘතං, ප්‍රකෘතියෙන් කරණලද්දවූ හෙවත් අබරණින් සරසනලද්දවූ; මුඛෙ, මුඛකර්මයෙහි; සිද්ධං, සිද්ධයඇති (චතුෂ්කනම් ගමන්වෙසෙසෙහි මුඛසංස්ථාන විශෙෂණාදීන් විශිෂ්ටවූ සි සේසි), අශ්වං, අශ්වයා; උත්තරධෙයකර්මි, යුද්ධොත්තරකාලයෙහි යෙද වියයුතු ක්‍රියායෙහි; අව්‍යතිකීර්ණරූපාඃ, අසංකීර්ණරූපවූ; ධාරාඃ ධාරානම් පඤ්චප්‍රකාරවූ ගතිවිශෙෂයන්; ප්‍රසාධයිතුං පුරුදුකරණු පිණිස; නවසුවීථිෂු, නවවැදෑරුම් සඤ්චාරස්ථානයන්හි; ගමයාංබභූව, ගමන්කැරැවීය.

**කශ්චිත්, (වාහකඃ) නවසු, වීථිෂු, අශ්වං, ගමයාංබභූව,** යනු මෙහි, ක්‍රි- යි. ගමයාංබභූව, යන තන්හි, ගම්ඝ, ගතෞ, ධාතුවෙන්, ආම්ප්‍රත්‍යය හා භූධාතුවනු ප්‍රයොගයෙහි පරොක්‍ෂලිට්, ණප්, ප්‍රත්‍යයි, **කාව්‍යලිඞ්ගාලඞ්කාර** හෝ **සඞ්භාවෝක්තියි.**

අසුන්ගති සම්බන්ධවූ ටීකායෙහි,

"අශ්වානාන්තු ගතිර්ධාරා විභින්නා සා ච පඤ්චධා
ආස්කන්දිතං ධෞරිතකං රෙචිතං වල්ගිතං ප්ලුතම්,
ගතිඃ පුලාවතුෂ්කං ච නවනාමධ්‍යජවාපරා
පූර්ණවෙගා තථා ඛ්‍යාතා පංච ධාරා ප්‍රකීර්ත්තිතාඃ,
එකෛකා ත්‍රිවිධා ධාරා හයශික්‍ෂාවිධෞ මතා
ලඝ්වී මධ්‍යා තථා දීර්ඝා ඥනෛවතා යොජයෙත් ක්‍රමාත්,

(යනුද) එසේම වීථින් හෙවත් සංචාරණ ස්ථානයන්ගැණ,

වීථ්‍යස් තිස්‍රොථ ධාරාණං ලඝ්වී මධ්‍යොත්තමාඃ ක්‍රමාත්
තාසාං ස්‍යාත් ධනුෂාං මානං ශීතිර්නවතිඃ ශතම්.
ලඝ්වීමධ්‍යොත්තමානාං තු වාජිනාං වීථිකාඃ ස්මෘතාඃ
නවානාං කථිතා වීථ්‍යො දුෂ්ටානාං ක්‍රමණක්‍රමෙ
අනෙ‍්‍යෂා'මපි සර්ව්‍ය ගතිදර්ශ්‍යාථි'මීරිතා.

සමොන්නතාසා විෂමාම්බුකීර්ණා ශුෂ්කාතතාග්‍රා තෘණවීරුදස්‍යා
ස්ථාණුප්‍රකීර්ණොපලසංප්‍රකීර්ණ පාශ්චාත්‍යතාඛ්‍යානවධෙතිවීථ්‍යා
යනුද සන්දර්ශිතයි.

ආලීඪඃ ශොභනෛරඞ්ගෛඃ ප්‍රත්‍යාලීඪඃ තථාපරඃ
උපධෙනවඋක්තාංච පාදතාලීච සර්ගඃ
නිර්දිෂ්ටා වීථයස්ත්‍වෙතාඃ,- යනාදිය අන්‍යමතයි.

61. මුක්තාස්තෘණානි පරිතඃ කවකං වරන්තස්
තෘට්‍යවිතානතතිකාව්‍යතිෂඞ්ගභාජඃ,
සස්‍රුඃ සරොෂපරිවාරකවාගීමානා
දමාඤ්චලස්ඛලිතලොලපදං තුරඞ්ගාඃ.

62. උත්තීර්ණභාරලඝුතාප්‍යලඝූලපෙශස
සෞහිත්‍යනිඃසහතරෙණ තරො'රධස්තාත්,
රොමන්ථමන්ථරචලද්ගුරුසාස්නමාසාං
චක්‍රෙ නිමීලදලසෙක්ෂණමෞක්ෂකෙණ.

---

61. මුක්තාඃ, ක්‍රීඩාවිහරණය පිණිස මුදනලද්දවූ; කවකං, කාද වුරෙහි; පරිතඃ, හාත්පස; තෘණානිචරන්තඃ, තණ බුදින්නාවූ; තෘට්‍යත්, සිඳිනලද; විතානතතිකා, පිළිමඬුලුරැහැන්හී; (වස්ත්‍රමය මණ්ඩපයන්හිවූ රැහැන්හි යයි සේයි) ව්‍යතිෂඞ්ගභාජඃ, පරස්පරමේලනය සෙවිනාවූ හෙවත් වෙසෙසින් ඇලීම සෙවිනාවූ; සරොෂ, එහෙයින්ම කෝපසහිතවූ; පරිවාරක, මෙහෙකරුවන් විසින්; වාගීමානාඃ, වළකනු ලබන්නාවූ; තුරඞ්ගාඃ, අශ්වයෝ තුමූ; දමාඤ්චල, පාදපාශයන්හි; ස්ඛලිත, ප්‍රස්ඛලනය වීමෙන් හෙවත් පැකිලීමෙන්; ලොලපදං චංචලවූ පාදය ඇතිසේ; සස්‍රුඃ, අපගතවූහ.

**තුරඞ්ගාඃ, දමාඤ්චලස්ඛලිතලොලපදං, සස්‍රුඃ,** යනු, මෙහි, ක්‍රි- යි. සස්‍රුඃ, යන තන්හි, සෘ, ගතෞ, ධාතුවෙන්, පරොක්ෂලිට්, උස්, ප්‍රත්‍යයි, දමාඤ්චලෙෂු (පාදපාශෙෂු,) ස්ඛලිතෙන, ලොලානි, පදනි යස්මින් කර්මණි, තද්‍යථා තථා, යනු. දමාඤ්චලස්ඛලිතලොල පදං, යන්නෙහි, නිර්වචනයි, **ස්වභාවොක්ති අලංකාරයි.**

62. උත්තීර්ණභාර, බහා තබනලද ( සූත්‍ර යන්ත්‍ර ) භාරයඇති; ලඝුතා, ලඝුවූ; අපි, එසේදවුවත්; අලඝු, බරවූ; උලපෙශස, මුදුතණ රැසින්; සෞහිත්‍ය, පිනාගියාවූ; නිඃසහතරෙණ, ඉතා නොයිවසිය හැකිවූ; ඖක්ෂකෙන, වෘෂභසමූහයා විසින්; තරොඃඅධස්තාත්, තුරු යට; රොමන්ථ, චර්විතචර්වණයෙන් හෙවත් වමාරා කෑමෙන්; මන්ථර චලත්, මඳක් සැලෙනාවූ; ගුරුසාස්නං, බරවූ ගෙරිකර එලෙන සම ඇති හෙවත් තැල්ල ඇති; නිමීලත්, මුකුලිතවන්නාවූ; අලසෙක්ෂණම්, මඳලස බැලුම්ඇතිව; ආසාංචක්‍රෙ, හිඳීමයි.

**ඖක්ෂකෙන, තරොඃ, අධස්තාත්, නිමීලදලසෙක්ෂණං, ආසාංචක්‍රෙ,** යනු මෙහි, ක්‍රි- යි. ආසාංචක්‍රෙ, යන තන්හි, ආස්, උපවෙශනෙ, ධාතුවෙන්, ආම් ප්‍රත්‍යය හා කෘඤ්, කාරණෙ ධාතුවනු ප්‍රයොග යෙහි, පරොක්ෂලිට්, භාව සාධනයෙහි, එ, ප්‍රත්‍යයි. **ස්වභාවොක්ති අලංකාරයි.**

63. මෘත්පිණ්ඩශෙඛරිතකොටිනි'රඞ්ඝ්‍රිඤ්ජං
ශෘඞ්ගෛඃ ශිඛාග්‍රගතලක්ෂ්මමලං නදද්භිඃ,
උච්ඡෘඞ්ඛිතාත්‍යවෘෂභාඃ සරිතාං නදන්තො
රොධාංසි ධීරමපවප්‍රසකාරිරෙ මහොක්ෂාඃ.

64. මෙදස්විනඃ සරභසොපගතානභීකාන්
භඞ්ක්ත්වා පරාන්නනඩ්වහො මුහුරාහවෙන,
ඌර්ජස්වලෙන සුරභීරනු නිඃසපත්නං
ජග්මෙ ජයොද්ධුරවිශාලවිෂාණ'මුක්ෂණා

63. මෘත්පිණ්ඩ, වප්‍රක්‍රීඩායෙන් ඇලුණු මැටිපිඩු කරණකොට ගෙණ; ශෙඛරිත, හටගත් ශෙඛරඇති; කොටිනිඃ, කෙළවරින් යුක්තවූ; ශිඛාග්‍රගත, සිළුඅගට පත්වූ; ලක්ෂ්මමලං, සලකුණම මලකොට ඇත්තාවූ; අඞ්ඝ්‍රිච ඤ්ජම් භසද්භිඃ, අඩසඳට සෙත්තාවූ; ශෘඞ්ගෛඃ, අං වලින්; උච්ඡෘඞ්ඛිත, අංඑසවූ; අත්‍යවෘෂභාඃ, ප්‍රතිවිරුඬ වෘෂභයන් ඇති; ධීරං නදන්තඃ, ගැඹුරුසේ ගර්ජනාකරන්නාවූ; මහොක්ෂාඃ, මහා වෘෂභයෝ තුමූ; සරිතාං, ගංගාවන්ගෙ; රොධාංසි, ඉව්රු; .අව වසකාරිරෙ, ඉරූහ බිඳුහු යයි සේයි.

**මහොක්ෂාඃ, සරිතාං, රොධාංසි, අවචස්කාරිරෙ,** යනු, මෙහි, ක්‍රි- සි. අවචස්කාරිරෙ, යන තන්හි, අවපූර්ව, කෘශ, විසෙෂපෙ, ධාතුවෙන්, පරොක්ෂලිට්- කර්තෘ- ඉරෙ, ප්‍රත්‍යයි, **ස්වභාවොක්ති අලංකාරයි.**

64. ඌර්ජස්වලෙන, බලසම්පන්නාවූ; උක්ෂණා, වෘෂභයා විසින්; මෙදස්විනඃ, මේදස් ඇත්තාවූ හෙවත් මසින්තරවූ; සරභසා, වේග සහිතව හෙවත් වහාම; උපගතාන්, සමීපස්ථවූ හෙවත් ළඟටපැමිණි යාවූ; අභීකාන්, කාමුකවූ; පරාන්නනඩුහඃ, අන්ගවයන්; මුහුඃ, එකොණෙහි; ආහවෙන, යුඬයෙන්; භඞ්ක්ත්වා, බිඳ; විශාලවිෂාණං, මහත් ශෘඞ්ගඇති; නිඃසපත්නං, සතුරන් නැතිව; සුරභීඃඅනු, කාමධෙනූන් වෙත හෙවත් කාමධෙනූන් පසුපස්සේ; ජග්මෙ, යාමයි උහුගෙ යාමවී යයි සේයි.

**උක්ෂණා, පරාන්නනඩුහඃ, භඞ්ක්ත්වා, සුරභීරනු, ජග්මෙ,** යනු, මෙහි, ක්‍රි- සි. ජග්මෙ, යන තන්හි, ගම්ඣ, ගතෞ, ධාතුවෙන්, පරොක්ෂලිට්- භාව- එ, ප්‍රත්‍යයි, මෙහි සුරභීඃ අනු යන තන්හි 'කර්මප්‍රවචනීයෙර්ද්විතීයා' යනුවෙන්- කර්මසංඥවූ හෙයින් විතීයාවී යයි සැලකියයුතුයි. වීරරසයගම්‍යමාන හෙයින්, **රසවදලංකාරයි.**

56. බිභ්‍රාණමායතිමතිමවෘථා ශිරෝධිං
ප්‍රත්‍යග්‍රතාමතිරසා ‘මධිකං දධන්ති,
ලොලොෂ්ඨමෞෂ්ට්‍රක’මුදග්‍රමුඛං තරූණා
මභ්‍රං ලිහාති ලිලිහෙ නවපල්ලවානි.

66. සාධිං කථංචිදුච්චිතෛඃ පිචුමර්දපත්‍රෛ
රාස්‍යාන්තරාලගතමාම්‍රදලං ම්‍රදීයඃ,
දාසෙරකඃ සපදි සංවලිතං නිෂාදෛ
විප්‍රං පුරා පතගරාඩිව නිර්ජගාර.

---

65. ආයතිමතිම්, දික්බැව්ඇති; අවෘථ, නොසිස්වූ; ශිරෝධිං, ග්‍රීවය; බිභ්‍රාණම්, ධරන්නාවූ; උදග්‍රමුඛම්, ළපලුගැන්මට එසවූ මුව ඇති; ඖෂ්ට්‍රකම්, ඔටුසමූහතෙම; අතිරසාං, ඉතා රසවත්වූ; ප්‍රත්‍යග්‍රතාං, අභිනවත්වය හෙවත් අලුත්බව; අධිකං, අධිකව; දධන්ති, උසුලන්නාවූ; අභ්‍රංලිහාති, වළාලෙවිනාවූ; තරූණාම්, වෘක්ෂයන්ගෙ; නවපල්ලවානි, බාලපත්‍රයන් හෙවත් ළපලු; ලොලොෂ්ඨම්, සලතොල් ඇතිව; ලිලෙහෙ, ආස්වාදනය කොළේය හෙවත් කෑවේය.

**ඖෂ්ට්‍රකං, තරූණම්, නවපල්ලවානි, ලිලෙහෙ,** යනු මෙහි, ක්‍රි-සි. ලිලෙහෙ, යන තන්හි, ලිහ, ආස්වාදනෙ, ධාතුවෙන්, පරොක්‍ෂ ලිට්- එ, ප්‍රත්‍යයසි, **ස්වභාවොක්ති අලංකාරයි.**

66. උච්චිතෛඃ, අභ්‍යස්තවූ හෙවත් සුදුසුවූ; පිචුමර්දපත්‍රෛඃ, සාධිම්, කොසඹපත් හා සමග; කථංචිත්, කෙසේ නුමුත් හෙවත් යම්කිසි පමාවකින්; ආස්‍යාන්තරාලගතම්, මුවතුළට ගියාවූ; ම්‍රදීයඃ, ඉතා මොලොක්වූ; ආම්‍රදලම්, අඹදලුව; දාසෙරකඃ, ඔටුතෙම; පුරා, පෙර; නිෂාදෛඃ, මිලෙච්ඡයන් හා; සංවලිතං, එකතුවූ; විප්‍රම්, බමුණා; පතගරාඩිව, ගුරුළුරාජයාමෙන්; සපදි, එසැණෙහි; නිර්ජගාර, උද්ගිරණය කොළේය; වැමැරුවේ යයි සේයි.

**දාසෙරකඃ, ආම්‍රදලං සපදි, නිර්ජගාර,** යනු මෙහි, ක්‍රි-සි. නිර්ජගාර, යන තන්හි, නිර්පූර්ව, ගෘ නිගරණෙ, ධාතුවෙන් පරොක්‍ෂලිට්, ණප්, ප්‍රත්‍යයසි, පුරා කිල කෘතශචිත් කාරණාත්, මෙලච්ඡභක්‍ෂණෙ, ගෛතඃ, සභාන්තඃ, ප්‍රවිශ්‍ය, ගලං, දහන්තං, විප්‍රං, ගරුඩ, උජ්ජගාරෙති, පෞරාණිකී, කථාත්‍රානුසංධෙයා, යනු ටීකාපාඨයි, භාවය සුබොධයි, **නිදර්ශනාලංකාරයි.**

67. සප්‍රෂටං බහිඃ සපිතවතෝ'පි නිවෙදයන්ත
ශෙවෂ්ටාවිශෙෂ'මනුජීවිජනාය රාඥම්,
වෛතාලිකාඃ ස්ඵුටපදප්‍රකටාර්ථ මුච්චෛර්
භොගාවලීඃ කලගිරො'වසරෙෂු පෙඨුඃ.

68. උන්නම්‍රතාම්‍රපටමණ්ඩපමණ්ඩිතං ත
දානීලනාගකුලසංකුලමාබභාසෙ,
සන්ධ්‍යාංශුභින්නඝනකර්බුරිතාන්තරීක්ෂ
ලක්ෂ්මී විඩම්බි ශිබිරං ශිවකිතීනස්‍ය.

---

67. බහිඃසපිතවතෙඅපි, පිටතසිටියාවූද; අනුජීවිජනාය, සෙවක ජනයාහට; රාඥම්, රජුන්ගෙ; චෙෂ්ටාවිශෙෂං, තත්තත් කාලොචිත චරිත්‍ර විශෙෂය; සප්‍රෂටං, පතලාවූ හෙවත් දන්වන්නාවූ; කලගිරඃ, මිහිරි තෙපුල්ඇති; වෛතාලිකාඃ, මඞගල පාඨකයෝ; අවසරෙෂු, ප්‍රාප්තාවසරයන්හි හෙවත් තත්තත් වේලාවෙහි; ස්ඵුට, ව්‍යක්තවූ; පදප්‍රකටාර්ථම්, පදයෙන් ප්‍රකාශවූ අරුත්ඇති; උච්චෛඃ, උසස්වූ; භොගාවලීඃ, ප්‍රබන්ධයන්; පෙඨුඃ, හදාළෝ.

**වෛතාලිකාඃ, අවසරෙෂු, භොගාවලීඃ, පෙඨුඃ,** යනු මෙහි, ක්‍රි- සි. පෙඨුඃ, යන තන්හි, පඨ්, ව්‍යක්තායාම්, වාචි, ධාතුවෙන්, පරොක්ෂලිට්- උස් ප්‍රත්‍යයි, මෙහිද, 'ලොපඃපවාංකිතො'වාස්‍ය' යනු වෙන්- එත්වපූර්වලොපයවිය, * **ස්වභාවොක්ති අලංකාරයි.**

68. උන්නම්‍ර, උන්නතවූ; තාම්‍රපටමණ්ඩප, තඹවන් පිළීමඩු වෙන්; මණ්ඩිතම්, හෙබියාවූ; ආනීල, හාත්පසින් නිල්වූ; නාගකුල සංකුලම්, හස්ති සමූහයාගෙන් ගැවසීගත්තාවූ; සන්ධ්‍යාංශුභින්න, සන්ධ්‍යාකාන්තියෙන් භින්නවූ හෙවත් මිශ්‍රවූ; ඝනකර්බුරිත, මේඝ යෙන් විචිත්‍රකෘතවූ; අන්තරීක්ෂ, අහස්හුගෙ; ලක්ෂ්මීවිඩම්බි, සිරිවෙළ පත්නාවූ; ශිවකිතීනස්‍ය, ශ්‍රී කෘෂ්ණයාගෙ; තත්ශිබිරං, ඒ කඳවුර; ආබභාසෙ, හාත්පසින් බැබලී; මනහරවී යයි සේයි.

**ශිවකිතීනස්‍ය, තත්ශිබිරං, ආබභාසෙ,** යනු මෙහි, ක්‍රි- සි. ආබභාසෙ, යන තන්හි ආඞ්, පූර්ව, භාස, දීප්තෞ ධාතුවෙන්, පරොක්ෂලිට්, එ, ප්‍රත්‍යයි, නිරුත්සාහක ක්‍රියායි, මෙහි වනාහි, සන්ධ්‍යා කාන්තියෙන් භින්නවූ මෙඝ විචිත්‍ර ආකාශශ්‍රිය වෙළපන්නාවූ, යනු කී හෙයින්, **උපමාලංකාරයි.**

---

* පාණිනීය මතයෙහි, එත්වපූර්වලොපය සම්බන්ධවූ සූත්‍රය මීට වඩා වෙනස්වෙයි. මෙහි දක්වනලද්දේ, සාරස්වත ව්‍යාකරණොක්ත සූත්‍රයයි.

69. ධරස්‍යොද්ධර්තා'සි ත්වමිති නනු සර්වත්‍ර ජගති
ප්‍රතීතස්තත්කිං මාමතිභරමධඃ ප්‍රාපිපයිෂුඃ;
උපාලබ්ධෙවොච්චෛර්ගිරිපතිරිති ශ්‍රීපතිමසෞ
බලාක්‍රාන්තඃ ක්‍රීඩද්විරදමථිතොර්වීරුහරවෛඃ.

**ඉති ශ්‍රීමාඝකෘතෞ**
**ශිශුපාලවධෙ මහාකාව්‍යෙ, ශ්‍ර්‍යඞ්කෙ පඤ්චමඃ සර්ගඃ.**

---

69. බලාක්‍රාන්තඃ, සෙන් විසින් මඩනාලද; අසෞගිරිපතිඃ, **ඒ** රෛවතකනම් පර්වතරාජ තෙම; ක්‍රීඩද්භිඃ. සෙල්ලනාවූ; ද්විරද, හස්තීන් විසින්; මථිත, බිඳිනලද, උර්වීරුහ, වෘක්ෂයන්ගෙ; රවෛඃ, නාදයන් කරණකොටගෙණ; ශ්‍රීපතිම්, මාධවහට; ත්වම්, ඔබ; ධරස්‍ය උද්ධර්තා, පර්වතය උද්ධරන්නේ; නනුඉති, නොවෙහිද්‍යයි; සර්වත්‍රජගති, මුලුලෙව්හි; ප්‍රතීතඃ, ප්‍රසිද්ධවූයේ; තත්කිම්, ඒ කිමෙක්ද හෙවත් **හේ කුමක් පිණිසද**; අතිභාරම්, ඉතා බරඇති; මාම්, මා; අධඃ, යටට; ප්‍රාපිපයිෂුඃ, පමුණුවනු කැමැත්තේව හියයි; ඉති, මෙසේ; උච්චෛඃ, උසස්කොට හෙවත් මහත්සේ; උපාලබ්ධාඉව, හඬන්නාක් වැනිවිය නොහොත් ඝම්පව ලැබුවාක්මෙන් වීයයි සේයි

ශ්‍රී මාඝකෘතෞ, ශ්‍රී මනමාඝ මහා කවිහු විසින් කරණලද්; ශිශුපාලවධෙ, ශිශුපාලවධ නම් ඇති ශ්‍ර්‍යඞ්ක මහාකාව්‍යෙ, ශ්‍රී අඞ්කවූ මහාකාව්‍යයෙහි පංචමඃ සර්ගඃ, (ශ්‍රීකෘෂ්ණ ගමන; * රෛවතකාභි ගමන නම්වූ;) පස්වෙනි සර්ගය, ඉති, මෙතෙකින් සමාප්තයි.

**ත්වම් ධරස්‍ය, උද්ධර්තා,** නනු, **අසි,** යනුද, ත්වම්, **මාම්, අධඃ, ප්‍රාපිපයිෂුඃ, අසි,** යනුද, **සඃ, උච්චෛඃ උපාලබ්ධාඉව,** යනුද මෙහි, ක්‍රි- යි. අසි, යන තන්හි, අස්, භුවි, ධාතුවෙන්, වර්‍ත, ලට්- සිප්, ප්‍රත්‍යයි, උපාලබ්ධා, යන තන්හි, උප, ආඞ්පූර්‍ව, ලභ, ලාභෙ, ධාතුවෙන් භූතාර්‍ථලුඞ්- තන්, ප්‍රත්‍යයි, 'ඣෂස්තථොර්ධොධඃ' යනුවෙන්. තකාරයට, ධකාරාදෙශයි, 'ධි, ච' යනුවෙන්, සිච්ප්‍රත්‍යයාගෙ, සකාර ලොපයි, **'උත්ප්‍රෙක්ෂා ලංකාරයි, ශිඛරිණී නම් වෘත්තයි**

'රසෛ රුද්‍රෛශ්ඡින්නා යමනසභලා ගඃ ශිඛරිණී'
යනු තල්ලක්ෂණයි.

## ශිශුපාලවධනම් මහාකාව්‍යය
### පිළිබඳව ලියනලද
### පදූවනාසිනි ව්‍යාඛ්‍යායෙහි පඤ්චනසර්ගය සමාප්තයි.

---

* රෙවත්‍යා නක්ෂ්‍යා අදූරෙ දෙශඃ රෛවතඃ ස එව රෛවතකඃ (රෛවත පර්වතෙ) යනු කී හෙයින් දඹදිව රෙවතීනම් නදියට නුදුරුවූ ප්‍රදෙශය හා තත් සමීපවර්‍තිවූ පර්වතයද උපචාර හෙයින් රෛවතක නම්.



